ෂර්ලොක් හෝම්ස්ගේ රහසිගත ලිපිගොනු 9

THE SECRET FILES OF SHERLOCK HOLMES - 9

# THE DEATHTRAP

# මර උගුල

සහ තවත්

ෂර්ලොක් හෝම්ස් කථා



චන්දන මෙන්ඩිස්

# මරු උගුල

සහ

තවත් ෂර්ලොක් හෝම්ස් කථා

## චන්දන මෙන්ඩිස්ගේ නිර්මාණ හා පරිවර්තන

**නවකතා** - නිශ්චල චංචල දේපළ          All That Glitters

**විද්‍යා ප්‍රබන්ධ** - ජුරාසික් දඩයම

**කෙටි කතා** - චීන යෙහෙළිය

**යොවුන් නවකථා** - අබිරහස් දූපතේ නිධානය, නිල් දියමන්ති අභිරහස

**පරිවර්තන (ෂර්ලොක් හෝම්ස් කථා)**
බැස්කවිල් රුදුරු බල්ලා
සිව් රහස් සලකුණ
බිහිසුණු නිමිනය
මළගිය ඇත්තෝ සාක්ෂි දෙති
ලේ සලකුණ
අන්තරාය අඩවියක
මහ රෑ ආ මාරයා
ඉන්ද්‍රනීල මාණික්‍යය
දියමන්ති ඔටුන්න
ලෝහිත පරීක්ෂණය
ඔබෙන් සමුගනිමි
ෂර්ලොක් හෝම්ස් ආපසු එයි
පුද්ගලිකයි රහසිගතයි
ඩිරැකියුලාට එරෙහිව ෂර්ලොක් හෝම්ස්
භයානක මිනිහා
කළු වහලුයා
රතුවත හැදි කත
ප්‍රදීපාගාරයේ වික්‍රමය
අබිරහස් දොස්තර
හින්දර සමග සෙල්ලම්
සමුදුරේ සටන
හිෂණයක්
රුසියානු ඔත්තුකාරයා
මර උගුල

**පරිවර්තන (අනෙක්)**
සැඟවුණු ලොවේ සවාරියක්
ඇලන් ක්වාටමේන්ගේ වීරචාරිකාව
වීයරු විද්‍යාඥයා
යකාගේ නවාතැන
හරිම පුදුමයි!
සිහිනයක රැඳි රහසක්
චාලි සහ අරුම පුදුම චොකලට් කම්හල
මෝරා
රහස් පරීක්ෂකයා අතුරුදන්
ගැටකපන පුංචා
ගිනිකන්දක් හරහා........ලෝකය වටේ අසූ දවසකින්
ශ්‍රේෂ්ඨ ලේඛකයන්ගේ විශිෂ්ට කෙටිකතා - I(රාජ්‍ය සාහිත්‍ය සම්මාන - 2008)
ශ්‍රේෂ්ඨ ලේඛකයන්ගේ විශිෂ්ට කෙටිකතා II - සොඳුරු සිතුවම්
- (රාජ්‍ය සාහිත්‍ය සම්මාන - 2009)
ශ්‍රේෂ්ඨ ලේඛකයන්ගේ විශිෂ්ට කෙටිකතා III - සඳ දියේ පාවී ගියා
ශ්‍රේෂ්ඨ ලේඛකයන්ගේ විශිෂ්ට කෙටිකතා IV - මුතු ඇටය
- (රාජ්‍ය සාහිත්‍ය සම්මාන - 2011)
ශ්‍රේෂ්ඨ ලේඛකයන්ගේ විශිෂ්ට කෙටිකතා V - කෝකිල මැදුර

# මර උගුල

සහ

තවත් ෂර්ලොක් හෝම්ස් කථා

සම්පූර්ණ

අසංක්ෂිප්ත පරිවර්තනය

**චන්දන මෙන්ඩිස්**

**චන්දන මෙන්ඩිස් ප්‍රකාශන**

# මර උගුල සහ තවත් ෂර්ලොක් හෝම්ස් කථා

හිමිකම් ඇවිරිණි

© චන්දන මෙන්ඩිස් 2012

ISBN 978-955-1262-19-8

පළමු මුද්‍රණය - 2012

මෙම නිවේදනය වංචනික පොත් මුද්‍රණකරුවන් සහ
හොර පොත් බෙදා හරින්නන්, අලෙවිකරන්නන් වෙතය.

වංචනික ලෙස පොත් මුද්‍රණය කිරීම හා ඒවා අලෙවි කිරීම දැඩි දඬුවම් ලැබෙන නීතිවිරෝධී කටයුතු බව දැනුම් දීමට කැමැත්තෙමු.

2003 වර්ෂයේ අංක 360 F දරණ දේපළ හිමිකම් පනත අනුව වයාජ පොතක් මුද්‍රණය කිරීම, විකිණීම, වෙළඳසැලක තබාගැනීම රුපියල් පන් ලක්ෂයක (රු: 500,000) දඩයක් හෝ මාස හයක සිර දඬුවමක් හෝ ඒ දෙකම දඬුවම් ලෙස ලැබිය හැකි වරදක් වන්නේය.

**Permission has not been granted to any personnel or company to convert, transfer or publish this book electronically or as an e-book. Display of pages for promotional purposes is permitted up to page no 14 only. Display beyond this point is a criminal offence and is strictly prohibited.**

**Any person or website doing any unauthorised act in relation to this publication may be liable to criminal prosecution and civil claims for damages, in accordance with the provisions of the Copyright Act 2003 (as amended)**

පිටකවරයේ චිත්‍රය
බන්ධුල හරිශ්චන්ද්‍ර

පිටකවරය නිමැවුම
හා අක්ෂර සංයෝජනය
ප්‍රසාද් සමරසේකර

මුද්‍රණය
**කේ.එස්.යූ. ග්‍රැෆික් පුද්ගලික සමාගම**
**නො: 510, රාජගිරිය පාර,**
**රාජගිරිය.**

ප්‍රකාශනය
**චන්දන මෙන්ඩිස් ප්‍රකාශන**
141/2, ද්‍රුව පාර
බැද්දගාන, කෝට්ටේ

# පටුන


| | | |
|---|---|---|
| 1. | එක් නිමේෂයකදී | 9 |
| 2. | රුසියානු කුමරිය පිළිබඳ ගැටලුව | 45 |
| 3. | පුරාවිද්‍යාඥයාගේ අභිරහස් මරණය | 75 |
| 3. | රක්ෂණ අභිරහස | 115 |
| 4. | මර උගුල | 144 |
| 5. | දුම්රිය අනතුර | 204 |



ශ්‍රීමත් ආතර් කොනන් ඩොයිල්



ෂර්ලොක් හෝම්ස්

මෙම පොතේ ඇතුළත් වන්නේ පහත සඳහන් කථාන්තරවල සිංහල පරිවර්තන ය.

1. The Adventure of Vamberry the Wine Merchant
2. The Adventure of the Old Russian Princess
3. The Mysterious Death of an Archaeologist
4. A Puzzle in Insurance
5. The Deathtrap
6. The Railway Accident

# එක් නිමේෂයකදී

විස්මයජනක චාරිත්‍රය නමින් මා ඔබ වෙත ඉදිරිපත් කළ කතන්දරය ඔබට තවමත් මතක ඇතැයි විශ්වාස කරමි. ඒ රෙජිනෝල්ඩ් මස්ග්‍රේව් සහ ඔහුගේ පවුලේ අය පිළිපැදි, අතිශයින් විස්මයජනක චාරිත්‍රයක් පිළිබඳ කථාන්තරයයි.* සාමාන්‍යයෙන් තම ලිපි ලේඛන හා පොත්පත් පිළිවෙළට තබා ගන්නා මගේ මිත්‍ර ෂර්ලොක් හෝම්ස්ගේ, එක් "අඩුපාඩුවක්" ගැන මම එහි සඳහන් කළෙමි. එනම් දීර්ඝ කාලයක් තිස්සේ ඔහු යෙදුණු පරීක්ෂණවලට අදාළ ලිපිලේඛන විනාශකර දැමීමට ඔහු දැක්වූ භීතියයි. මේ නිසාම එවැනි ලේඛන අඩංගු ලිපිගොනු, කවර, කාඩ්බෝඩ් පෙට්ටි සහ සුන්බුන් අඩංගු ට්‍රන්ක පෙට්ටි කීපයක්. අපේ විසිත්ත කාමරයේ එක් කෙළවරක ගොඩගසා තිබිණි. මේවා එළියට ඇද අවශ්‍ය දේ තෝරා බේරාගෙන, අනෙක් දෑ විනාශ කර දැමීමට, මම විටෙක ඔහුට යෝජනා කළෙමි. එහෙත් ඒවා සනකට නොගත් හෝම්ස්, තම විවේක කාලය ගතකළේ වයලීන වාදනයේ යෙදෙමිනි. එසේත් නැතහොත් හාන්සිපුටුවේ වැතිරී පයිප්පය ද දල්වාගෙන, අහස පොළොව ගැටලන කල්පනාවලට වැටෙමිනි. එවැනි එක් වෙලාවක මම ඔහු ඇමතුවෙමි.

"ඇත්තමයි හෝම්ස්. මං පාඨකයන්ට ඉදිරිපත් කරන ඔබේ පරීක්ෂණත් දැන් අවසන් වේගනයි යන්නෙ. ඔබ තවමත් විවෘත නොකළ, ආදි කාලයේ සිදුවීම් අඩංගු ලිපිගොනු කීපයක් විවෘත කරමුද? තව කොයිතරම් කාලයක් අපට මේව කරන්න පුළුවන් වේවිද කියල කවුද දන්නෙ? බරපතළ අසනීපයක් නැති කාලෙ අපි මේවා සුවිගතකරල, විස්තර ලියා තැබුවොත් හොඳයි. එහෙම නේද?"

"ඔබ කියන දේත් ඇත්තයි වොට්සන්" ඔහු කීවේ මෙතෙක් වේලා මුවේ තිබූ පයිප්පය ඉවතට ගනිමිනි. "අද අපි විවේක සුවයෙන්, කිසි කරදරයක් නැතුව ඉන්න බව ඇත්තයි. නමුත් හෙට වෙන

* අප මෙය ඔබ වෙත ඉදිරිපත් කරන ලද්දේ සුනඛ ශාපය සහ හොඳම ෂර්ලොක් හෝම්ස් කථා ග්‍රන්ථයෙනි.

කොට මාරයා අපව හොයාගෙන නො ඒවිද කියල අපි කොහොමද දන්නෙ. මං වහාම මගේ කටයුත්තට බහිනවා."

එසේ කියූ ඔහු වහාම ට්‍රන්ක පෙට්ටි හා ලිපි ලේඛන ගොඩගසා තිබූ තැන වෙත ගියේය. උඩින් තිබූ ලේඛන මිටි හා කාඩ්බෝඩ් පෙට්ටි ඉවතින් තැබූ හෝම්ස්, යටින්ම තිබූ එක් ලොකු ට්‍රන්ක පෙට්ටියක් විසිත්ත කාමරයේ මැදටම ඇදගෙන ආවේය. එයට දමා තිබූ ඉබ්බා ඉවත්කොට, පෙට්ටිය තුළ රතු ටේප් පටිවලින් ගැටගසා තිබූ ලියවිලි කිහිපයක්ම ඔහු ඉවතට ඇම්මේය.

"මේ හැම එකක්ම, මට ඔබ හමුවෙන්න කලින් මා සිදුකළ පරීක්ෂණ." හෝම්ස් කීවේ ඒවා වැසී තිබූ දූවිලි ඉවත් කරමිනි. "ඒවා හැම එකක්ම ඉතා සාර්ථක ලෙස විසඳූ ඒව කියල මං කියන්නෙ නෑ. ඒ කොහොම වුණත් ඒවා හරි අපූරු සිදුවීම්. ඔබ කැමැතිද ඒවා ගැන අහල සටහන් කරගන්න? මේ තියෙන්නේ වැම්බරි නම් වයින් වෙළෙන්දා මා වෙත ගෙන ආ ගැටලුවට අදාළ විස්තර. මේකත් ඒ කාලයේම, ඒ කියන්නේ 1879 – 80 කාලයේ විය යුතුයි. මේක රුසියානු ජාතික මහලු කාන්තාවක්- ඇය කුමාරිකාවක්, ලන්ඩනයේදී ඝාතනයට ලක්වීම ගැන මා කළ පරීක්ෂණය. මේ අර ඇලුමිනියම් කිහිලිකරුව ගැන කතාව. මේ නිල්පාට ටේප්පටියකින් ඔතලා තියෙන්නේ ටිකක් පහුකාලයක කතාවක්. මේක මේ විදිහට තිබෙන එකෙන් පෙනෙන්නේ, මේක ඔබ සහභාගි නොවී මං තනියෙන් කළ එකක් බවයි........ ආ ඔව්. මේ අර මාවතේ ඝාතකයා හියුරේ සම්බන්ධ පරීක්ෂණය......"

"මොහොතක් ඔහොම ඉන්න හෝම්ස්. මං කැමතියි ඕවා එකින් එක අරගෙන විස්තර සටහන් කරගන්න. ඉස්සර වෙලා අපි කෝපි පෝච්චියක් ගෙන්වා ගෙන කෝපි ටිකක් බීලා ඉඳිමු."

මම සීනුව නාදකර අපේ නිවහනේ සේවකයා වූ බිලී කැඳවීමි. හැකි ඉක්මනින් කෝපි සූදානම් කරගෙන එන මෙන් ඔහුට දැනුම් දුන්නෙමි.

"මං කැමතියි හෝම්ස් ඔබ අද දවසේ කතන්දර දෙකක් හෝ තුනක් පමණක් කියනවා නම්. අද තිබෙන අඳුරු වැසි සහිත කාලගුණයේ හැටියට, ඔබේ අනුග්‍රාහකයෙක් අද මෙහේ ඒවි කියල හිතන්නත් අමාරුයි."

මගේ අනාවැකිය අනුමත කිරීමට මෙන්, බේකර් වීදියේ එක් කෙළවරකින් හෙණ පුපුරන හඬක් ඇසිණ. මීළඟට අහස ගුගුරන

ශබ්දය නොනවත්වාම ඇසුණේ විදුලි කෙටීමත් සමගිනි. අනතුරුව ධාරානිපාත වර්ෂාවක් ඇද හැළෙන්නට පටන්ගත්තේය.

"ඔබ තෝරාගත්තද අහන්න උවමනා කරන කථා?"

"මං කැමතියි මෙන්න මේක- ඔබ කිව්වේ වයින් වෙළෙන්දා ගෙන ආ ගැටලුව කියලා. අන්න ඒක කියමු මුලින්ම."

"මේ පරීක්ෂණය මට ලැබෙද්දී මං පදිංචි වෙලා හිටියේ මොන්ටේගු වීදියේ නිවසේ" හෝම්ස් කථාව ඇරඹීය. "මම ඒ කාලයේ දැන් තරම් කාර්යබහුල වුණේ නෑ. ඒ නිසා මොන්ටේගු වීදිය අනෙක් පැත්තේ තිබුණු බ්‍රිතාන්‍ය කෞතුකාගාරයේත් මං හුඟක් කාලය ගතකළා. මේ වැම්බරි මහත්මයා එක් සවස්වරුවක මා හමුවෙන්න ආවා. ඔහුගේ පෙනුමත්, කථා විලාසයත් මට අද වගේ මතකයි.

"හෝම්ස් මහත්මයා. මට මෙහේට එන්න කියලා ඇතුම් දුන්නෙ ස්කොට්ලන්ඩ්යාඩ් පොලීසියෙන්. මගේ ගැටලුව ගැන ඔවුනට තවත් කළ හැකි දෙයක් නැහැලු. ඒ ගැන කාලය යොදවන්නත් මහන්සි වෙන්නත් ඔබට හැකිවේවි කියල ඔවුන් කිව්වා."

"මහත්මයා. වැම්බරි කියන නමෙන් එංගලන්තයට වයින් ආනයනය කරන සමාගමක් තිබෙනවා. ඔබ එහි අධ්‍යක්ෂක මණ්ඩලයේ කෙනෙකු බව මට විශ්වාසයි. ඒ හැරෙන්න ඔබේ ගැටලුව ගැන මට කළ හැක්කේ අනුමාන කිරීමක් පමණයි. මෙය විසඳීමට මගේ සම්පූර්ණ උත්සාහයත්, කාලයත් යොදවන බවට මං පොරොන්දු වෙන්නම්. කරුණාකර මට හැමදෙයක්ම කියන්න. කිසිම දෙයක් හංගන්නේ නැතුව සම්පූර්ණ විස්තරයම කියන්න."

"මහත්මයා මගේ නම චාල්ස් වැම්බරි. එංගලන්තයට වයින් ආනයනය කරන වැම්බරි සහ පුත්‍රයින් ගැන ඔබ කළ සඳහන නිවැරදියි. ඒක මගේ සීයා වූ ක්‍රිස්ටෝෆර් වැම්බරි ආරම්භ කළ ව්‍යාපාරයක්. ඔහුගෙන් ඒක උරුමවුණේ මගේ පියා වූ විලියම් වැම්බරිට. ඔහු මීට අවුරුදු කිහිපයකට පෙර මියගියා. ඒ නිසා මා සමාගමේ තනි අයිතිකරු බවට පත්වුණා. දැන් මගේ වයස අවුරුදු 35යි. විවාහ වෙන වයස පසුකරමින් හිටියත්, මගේ විවාහය පමාවුණා. මගේ සිත් ඇදගත් තරුණියක් සැහෙන කලකට මට හමුනොවීමයි ඒකට හේතුවුණේ. කොහොම වුණත් මීට අවුරුදු තුනකට පමණ පෙර, විවාහ කරගැනීමට සුදුසු යයි මට සිතුණු කෙනෙකු හමුවුණා. දැන් මං ඒ ගැන විස්තර ඔබට කියන්නම්.

මගේ ව්‍යාපාරයේ ස්වභාවය අනුව මට නිතර නිතර විදේශ රටවල්වලට යන්න සිදුවෙනවා. ප්‍රංශය, ඉතාලිය, ස්පාඤ්ඤය සහ ස්විට්සර්ලන්තය තමා එයින් ප්‍රධාන. ඇය මට හමුවුණේ ස්විට්සර්ලන්තයේදි. ඒ 1877 වසන්ත සෘතුවේදි. මං එහෙම විවාහ කරගත් මගේ ආදරණීය බිරිඳ, මීට සති දෙකකට කලින් හිසට වැදුණු වෙඩිපහරකින් මරණයට පත්වුණා.

මේක සිදුවුණේ උදේවරුවේ මං ගෙදර නොහිටි මොහොතක. අධිකරණ වෛද්‍යවරයා කිව්වෙ, මෙය සියදිවි නසාගැනීමක් කියලයි. හෝම්ස් මහත්මයා. මට ඒක කොහොමටවත් විශ්වාස කරන්න අමාරුයි. සියදිවි නසා ගැනීමකට කිසිම හේතුවක් ඇයට තිබුණෙ නෑ. ඔබ මේ ගැන පුවත්පත්වල දකින්න ඇති......"

"ඔව්. පුවත්පත්වල පළවුණු තොරතුරු හැම එකක්ම මං කියෙව්වා." මං කිව්වා. "නමුත් ඒ හැමදෙයක්ම මං දැන් මගේ හිතෙන් බැහැර කරනවා. මං කැමතියි ඊට අදාළ හැමදෙයක්ම ඔබේ කටින්ම දැනගන්න. ඒ නිසා, හැමදෙයක්ම මට පිළිවෙළින් කියන්න මහත්මයා. ඔබට ඇය හමුවුණු දවසෙන්ම පටන්ගන්න."

"හොඳයි" වැම්බරි කිව්වේ මා ඔහු වෙත ගෙන්වා තිබූ තේ කෝප්පය පානය කරමින්. "විවාහයට පෙර ඇගේ නම ජේන් පාකර්. ඇගේ මාපියන් දෙදෙනාම ඇය කුඩා කාලයේ මිය ගිහින්. ඒ නිසා ඇය ස්විට්සර්ලන්තයේ පදිංචිව සිටියේ, ඇගේ අවිවාහක නැන්දනිය වූ, හැරියට් පාකර් මෙනෙවිය සමග. මෙම නැන්දා වයස අවුරුදු හැටපහක - හැත්තෑවක පමණ ආබාධිත තැනැත්තියක්."

"මොන වගේ ආබාධයකටද ඇය ලක්වෙලා හිටියේ?"

"දණහිස් දෙකම ඔස්ටියෝ ආතරයිටිස් නම් රෝගයට ලක්වීම නිසා, ඇවිදීමට අපහසු තත්ත්වයේ. ඔවුන් පදිංචි වී සිටියේ ස්විට්සර්ලන්තයේ ලොසාන් නගරයේ. ඒ නිවසේ හිටියේ වැඩිහිටි පාකර් මෙනෙවිය, ජේන් පාකර් හා සේවිකාවන් දෙදෙනෙකු පමණයි.

"ඔබට කොහොමද ඇය හමුවුණේ?"

"ස්විට්සර්ලන්තයේ පදිංචි මා හඳුනන ඉංග්‍රීසි ජාතික පවුල් දෙක තුනක් තියෙනවා. එවැනි එක් නිවසක පැවැත්වුණු උපන්දින උත්සවයකට මේ දෙදෙනා ඇවිත් හිටියා. එතැනදියි ජේන්ව මට අඳුන්වා දෙනු ලැබුවේ. හඳුනාගත් ඉක්මනින්ම, මගේ හිතේ ඇය ගැන පැහැදීමක් ඇතිවුණා. ඒ වුණත් විවාහ යෝජනාවක් කරන්න

මං ඉක්මන් වුණේ නැහැ. මට උවමනා වුණා ඇගේ පවුල් පසුබිම හොයා බලන්න. ඒ නිසා මං ඒ ගැන ඇයගෙන් විමසුවා.

තමන්ගේ දෙමව්පියන් ගැන කිසිම දෙයක් ජේන්ට මතක තිබුණේ නැහැ. ඇයගේ දෙමාපියන් මියගිහින් තියෙන්නේ ඇය ඉතාම කුඩා අවදියේලු. ඒ නිසා ඇය පියාගේ බාල සොහොයුරිය වුණු, හැරියට් පාකර් මෙනෙවියගේ භාරයට පත්වුණාලු. පවුලේ මුදලය සම්පූර්ණයෙන්ම හැරියට් මෙනෙවියට හිමිවුණාලු. එය ඉතා විශාල මුදලක් බව මට හිතාගන්න හැකිවුණා. මං ඒ ගැන වැඩිදුර විමසුවේ නැහැ. නමුත් ඒ මුදල් ඔවුන් ස්විට්සර්ලන්තයේ බැංකුවල ආයෝජනය කරන්න ඇති කියා මට හිතුණා. ස්විට්සර්ලන්තයට වෙලා රැකියාවක් නොකර, සුඛෝපභෝගී ජීවිතයක් ගතකරන එක, ධනවතෙකුට වුණත් අමාරුයි. නමුත් මේ දෙදෙනාට ඒක ප්‍රශ්නයක් වුණු බවක් පෙනුණේ නැහැ. කොහොම වුණත් ඔවුන්ගේ මුදල් හදල් හෝ ආර්ථික තත්ත්වය මගේ අවධානය යොමුවුණු කරුණක් නෙමෙයි.

දින කිහිපයක් ළඟින් ආශ්‍රය කරද්දී, මගේ හිතේ ඇය ගැන ආදරයක් ඇතිවුණා. ඇගේ රූමත් බවේ අඩුවක් තිබුණේ නැහැ. ඒ වගේමයි. කාරුණික සහ ප්‍රසන්න බවත්, ඉවසිලිවන්ත බවත් ඇයට උරුම වී තිබුණා. ඒ ගැනයි මං වැඩියෙන්ම පැහැදුණේ. ඒ වෙනකොට ඇගේ වයස අවුරුදු තිස් එකයි. යුරෝපයේ දැන් කාලේ තරුණියන් විවාහ වෙනවා, වයස අවුරුදු විසිපහ වෙන්න කලින්. ජේන්ට විවාහවීමට සුදුසු වයසේ ඉංග්‍රීසි ජාතික හෝ වෙනත් ජාතිකයෙකු හමුවෙන්නේ, ඉතාම කලාතුරකින් බව මට සිතාගැනීමට හැකිවුණා. නමුත් මාව විවාහයකට කොටුකර ගැනීමට ඇය කිසිම උනන්දුවක් දැක්වූවේ නැහැ. ඊට උවමනාවක් ඇගේ නැත්දාට තිබුණු බවක් වත් මට පෙනුණේ නැහැ. ඇයගේ සිතේ ඒ දිනවල මා ගැන ආදරයක් ඇතිවුණු බව, මට දැනගන්න ලැබුණේ විවාහ වුණාටත් පස්සේ."

"ඊළඟට ඔබ විවාහ යෝජනාවක් ඉදිරිපත් කළාම මොකද වුණේ?"

"හැරියට් පාකර් මෙනෙවිය සතුටෙන් ඊට එකඟ වුණා. ජේන් ඊට එකඟවුණත්, ඇයගෙන් පෙනුණේ ලැජ්ජාශීලී බවක්. විවාහය ස්විට්සර්ලන්තයේදීම තවත් මාසයකින් සිදුකිරීමට දින නියම කරගෙන මං එංගලන්තයට ආවා. මගේ ව්‍යාපාරික කටයුතු සඳහා සති තුනක පමණ කාලයක් ගතවුණා. ඊළඟට මං ආපහු ස්විට්සර්ලන්තයට ගියේ ඇය විවාහ කරගෙන කැඳවාගෙන ඒමට."

"වැම්බරි මහත්මයා. මට තියෙනවා ප්‍රශ්නයක්." මං කිව්වා. "ජේන් පාකර්ට සහ ඇගේ නැන්දාට මුදල් ලැබුණේ, ජේන්ගේ පියාගෙන් පවුලේ බූදලය උරුමවීමෙන් බව ඔබ කිව්වා. එතකොට ජේන් පාකර් මෙනෙවියට අයත් මුදල් ගැන, ඇගේ විවාහයෙන් පසු එයට සිදුවන්නේ කුමක්ද යන්න ගැන, ඇගේ නැන්දනිය විමසුවේ නැද්ද?"

"ඇගේ නැන්දනිය කවදාවත් විවාහ නොවුණු කෙනෙක්. ඇයට වෙනත් ආදායම් මාර්ගයක් තිබුණෙත් නෑ. ඒ නිසා ජේන් සතු යම් මුදලක් ඔවුන්ගේ හවුල් ගිණුමක තිබෙනවා වුණත්, එය භාරගැනීම මං ප්‍රතික්ෂේප කළා. මටත් ජේන්ටත් ජීවත්වීමට ප්‍රමාණවත් තරම් ධනයක් මා සතුව තිබෙනවා. මං එසේ ප්‍රතික්ෂේප කිරීම ගැන ජේන්ගේ නැන්දා බොහොම සතුටුවුණා. එපමණක් නොවෙයි. ඇයට අමතර සේවිකාවක ගැනීම සඳහා, ඇයට මාස්පතා මුදලක් එවන්නත් මං කැමතිවුණා."

"ස්විට්සර්ලන්තයේ නොරැඳී ආපහු එංගලන්තයට එන්න ඇගේ නැන්දා කැමැතිවුණේ නැද්ද? විශේෂයෙන්ම ඇය ආබාධිත කාත් කවුරුවත් නොමැති කෙනෙකු නිසා?"

"ආපහු එංගලන්තයට එන්න කියා, අපි දෙදෙනාම ජේන්ගේ නැන්දාගෙන් ඉල්ලා හිටියා. නමුත් ඇය ඊට කැමැතිවුණේ නැහැ. ස්විට්සර්ලන්තය හැරදමා යාම ඇය ප්‍රතික්ෂේප කළා. ස්විට්සර්ලන්තයේ සනීපවත් දේශගුණයට ඇය දැක්වූයේ ඇඩි කැමැත්තක්. ඇය ඉතා දීර්ඝ කාලයක් එහි ජීවත්වී තිබුණා. නිතර වැසි සහිත එංගලන්තයේ දේශගුණයට, හැරියට් මෙනෙවිය දැක්වූයේ ඇඩි අකමැත්තක්. එංගලන්තයේ කෙටි කාලයකට හෝ පදිංචි වුණොත්, තෙත් දේශගුණයෙන් ඇගේ යටපත්ව තිබූ ඇදුම රෝගය යළිත් මතුවීමට ඉඩ ඇතැයි, ඇය බියට පත්වුණා. එපමණක් නොවෙයි. එංගලන්තයේ සම්ප්‍රදායික කෑමබීමට පවා ඇය දැක්වූයේ ඇඩි අකමැත්තක්. විවාහවුණාට පසු මමත් ජේනුත් නැන්දණිය දැකීමට හතර පස් වතාවක් ලොසාන් වෙත ගියා."

"වැම්බරි මහත්මයා" මං කිව්වා. "ඔබේ බිරිඳගේ මේ ඛේදජනක මරණය ගැන, ඔබ ඇගේ නැන්දණියට දැන්නුවද? ඒ ගැන ඇය මොනවද කියල තිබුණේ?"

"විදුලි පුවතක් මගින් මං ඇයට වහාම දැන්නුවා." වැම්බරි කිව්වා. "ආබාධිත තත්ත්වය නිසා හැරියට් මෙනෙවියට මෙහි පැමිණීමට

අපහසුයි නේ. පුවත්පත් මගිනුත් ඇයට තොරතුරු දැනගන්න ලැබී තිබුණා. ඇය දැඩි කම්පාවකට පත්වුණාලු. තමන්ගේ ජීවිතය විනාශකරගන්න තරම් හේතුවක් ජේන්ගේ හිතේ ඇතිවුණේ කොහොමද? ඒක තමා හැරියට් මෙනෙවිය අහල තිබුණු ප්‍රශ්නේ.

පුවත්පත්වලට හෙළි නොකළ, ප්‍රසිද්ධියට පත් නොවුණු කාරණාවකුත් මං දැන් ඔබට කියන්නම්. අපි විවාහවුණු කාලයේ ඉඳන්ම ජේන්ට උවමනා වුණේ ඉක්මනින්ම දරු සුරතල් බලන්න. නමුත් අවුරුදු දෙකහමාරක් පමණ කාලයක් ඇයට එවැනි සලකුණු පහළ වුණේ නැහැ. ඒ ගැන ඇය සිටියේ කණගාටුවෙන්. නමුත් මීට මාස හතරකට පමණ කලින්, දරුවකු පිළිසිඳගත් සලකුණු පහළ වුණා. ඉන්පසු පවුලේ වෛද්‍යවරයාගේ උපදෙස් අනුව, මම ඇය කැඳවාගෙන ගියා විශේෂඥ වෛද්‍යවරයෙකු ළඟට. ඒ වික්ටෝරියා කාන්තා රෝහලේ ඒ අංශයේ විශේෂඥයෙකු වන, මහාචාර්ය විලියම් ඩේවිඩ්සන් ළඟට. ඔහුගෙන් අපට අහන්න ලැබුණේ සතුටුදායක ආරංචියක්. නිසි කාලයට නිරෝගී දරුවෙකු බිහිකිරීමේ වාසනාව ඇයට ලැබී ඇති බව ඔහු කිව්වා.

එයින් පස්සේ ජේන් හිටියේ අප්‍රමාණ සතුටකින්. ළඟ එන දරුවා පිළිගන්න ඇය හරියට සූදානම් වුණා. ඒ ගැන දන්නා හඳුනන අයගෙන් උපදෙස් ගනිමින්, පොත්පත් කියවමින් ඇය සූදානම් වුණා. මේ ඛේදජනක සිදුවීමට දින දෙකකට කලින්, මං ජේන්ව යළිත් වරක් මහාචාර්යතුමා ළඟට කැඳවා ගෙන ගියා. දරුවාගේ මේරීම සාමාන්‍ය අයුරෙන් සිදුවී ඇති බව ඔහු කිව්වා. ඇගේ රුධිර පීඩනය ආදී කරුණු සියල්ලම සාමාන්‍ය තත්ත්වයෙන් තිබෙන නිසා, කිසිම ප්‍රශ්නයක් ඇති නොවෙන බවයි ඔහු කිව්වේ. ඒක අපේ සිත්වලට ලොකු සැනසීමක් වුණා.

අලුත් අමුත්තා පිළිගන්න ඇය වෙන සූදානම ගැනත්, අනික් සන්තෝෂදායක තොරතුරුත් සමග, ජේන් තම නැන්දණියට ලිපියක් ලියා තිබුණා. ඇයට ඒ ලිපිය ලැබෙද්දී ජේන් මෙලොව හැර ගිහින්. හැරියට් මෙනෙවිය ඒ ලිපිය මා වෙත ආපසු එවා තිබුණා. ඒ ලිපියේ තිබූ කරුණු කියෙව්වාම, ජේන් මෙහෙම දෙයක් කරගන්නාද කියල විශ්වාස කරන්නත් අමාරුයි. හෝම්ස් මහත්මයා. මං ඒ ලිපිය අරගෙන ආවා. ඔබටම පුළුවනි කියවා බලන්න" වැම්බරි මා අතට ලියුමක් දුන්නා.

"වැම්බරි මහත්මයා. අවුරුදු 3කට කලින් ඔබට ඔවුන් හමුවෙද්දී මේ කාන්තාවන් දෙදෙනා ගතකළේ බොහොම නිශ්ශබ්ද ජීවිතයක්. එහෙම නේද?"

"ඔව් හෝම්ස් මහත්මයා." වැම්බරි කිව්වා. "නිශ්ශබ්ද එහෙත් සැපවත් ජීවිතයක්. ස්විට්සර්ලන්තයටම වෙලා කාලය ගත කළත්, අවුරුද්දකට දෙවතාවක් ඔවුන් ඉතාලියට හා ඩෙන්මාර්කයට ගිහිං තිබුණා. ජේන්ට ජීවිතයේ වෙනසක් උවමනා නිසා, ඒ විදියට ගිය බවයි හැරියට් මෙනෙවිය කිව්වේ. ඇයගේ පෙණහලුවලත් මොකක් හෝ ආබාධයක් තිබුණා. නමුත් එය රෝහලක නැවතී ප්‍රතිකාර ගන්න තරම් බරපතළ එකක් නෙමෙයි. තම නැන්දණිය ගැන ජේන් කටයුතු කළේ ඇඩි කැපවීමකින්. වයසට ගිය බොහෝ දෙනෙක් සුළු දේටත් ඉක්මනින් කේන්තිගන්න, ඉවසීමක් නැති අය. හැරියට් මෙනෙවියගේත් මේ දුර්වල කම තිබුණා. නමුත් ඒ වෙලාවට ජේන්ගෙන් දක්නට ලැබුණේ හරිම කාරුණික ඉවසිලිවන්ත බවක්. මගේ හිත ජේන් කෙරෙහි හුඟක්ම ඇදී ගියේ ඒ කාරණය නිසයි."

"තමන්ට ආශ්‍රය කරන්න සම වයසේ යහළු යෙහෙළියන් නොමැති ජීවිතයක් තමයි, ඇය ගත කරන්න ඇත්තේ. ඒ ගැන ජේන්ගේ හිතේ කැලඹීමක්, පසුතැවීමක් ඇතිවෙලා තිබුණේ නැද්ද?"

"කොහොමටවත් නෑ. තමන්ගේ ජීවිතය ගැන ඇය තෘප්තිමත්ව හිටියා."

"ඉතාම කුඩා කාලයේ ඉඳලම ඇය ගෙවල තියෙන්නේ මෙවැනි ජීවිතයක්?"

"ඔව්. හැරියට් මෙනෙවිය තමා ජේන්ට හිටි එකම ඥාතියා. දෙමාපියන් මියයද්දී ජේන් ඉතාම කුඩා දැරියක්ලු"

"ඔබ සමග විවාහ වෙද්දී ඇගේ වයස කීයද?"

"තිස් එකයි"

"මීට කලින් මොකක් හරි ප්‍රේම සම්බන්ධයක් හෝ විවාහ ගිවිස ගැනීමක් තිබිල නැද්ද?"

"එහෙම කිසිවක් නැහැ හෝම්ස් මහත්මයා. ඇය කියන්නේ බොරු බව කියමින්, මං ඇයව හාස්‍යයට ලක් කළා. ඒ ගැන ඇයට උසුළු විසුළු කළ වාර අප්‍රමාණයි. නමුත් ජේන් කිව්වෙ, ඇයට එහෙම සිත්අදිනා කෙනෙක් කවදාවත් හමුනොවුණු බවයි. හැරියට් මෙනෙවිය කිව්වෙත් එයයි. අපි දෙන්නා විවාහ ගිවිසගත් වෙලාවෙ හැරියට් මෙනෙවිය මෙහෙම කිව්වා.

"ජේන් වගේ ශීලාචාරව ජීවිතය ගෙවූ කෙල්ලක්, අද කාලේ හමුවෙන්නේ ඉතාම කලාතුරකින්. ඇය ඉතාම රූමත් තැනැත්තියක බව ඔබ දකින්න ඇති. ඇය ඒ ගැන දන්නෙත් නෑ; ඇයට ඒකෙ අගයකුත් නෑ. වැම්බරි මහත්මයා. ඔබ හරි වාසනාවන්තයෙක්" හැරියට් මෙනෙවිය කියූදේ සම්පූර්ණ සත්‍යයක් බව මට පෙනුණා."

"වැම්බරි මහත්මයා. මෙන්න මේ ප්‍රශ්නය මං ඇසිය යුතුමයි. ඔබේ බිරිඳගේ සිත බරපතළ ලෙස කලඹරවන යමක්, ඔබේ අතින් සිදුවුණේ නැහැ කියල ඔබට හොඳටම විශ්වාසද? වෙනත් ප්‍රේම සම්බන්ධයක්.....?"

"කොහොමටවත් නැහැ හෝම්ස් මහත්මයා. එහෙම පටළැවිල්ලක් තිබුණා නම්, මේ ගැන හොයන්න කියලා මං ඔබෙන් ඉල්ලා හිටින්නෙ නැහැනේ. මට මුදල් යහමින් තිබෙන බව ඇත්තයි. අවුරුදු තිස්දෙකක් වනතුරු අවිවාහකව සිටි බවත් ඇත්ත. නමුත් මට ප්‍රේම සම්බන්ධයක් හෝ, ආශ්‍රයට තරුණියක හෝ නොසිටි බව කිව්වොත්, ඔබ විශ්වාස කරන එකක් නෑ. ජේන්ගේ හදිසි මරණය මට මේ තරම් තදින් දැනෙන්නේ අන්න ඒ නිසාමයි. ඇය සිහිකරමින් මං තවමත් වැලපෙන්නෙත්, ඇගේ මරණයට සැබෑ හේතුව මං හොයන්නෙත් ඒ නිසාමයි."

"ඇය කළේ සියදිවිනසා ගැනීමක් නම්, ඒ කුමක් නිසා කියලද වෛද්‍යවරයා කිව්වේ?"

"ඇගේ මනසේ, සිතේ අභ්‍යන්තරයේ, ක්ෂණිකව සිදුවූ තදබල විපර්යාසයක් කියලයි ඔහු කිව්වේ" වැම්බරි කිව්වා.

"නමුත් එය පිළිගන්න ඔබ සූදානම් නැහැ?"

"කොහොමටවත් නැහැ හෝම්ස් මහත්මයා. මේකෙ ගැඹුරේ තේරුම් ගන්න අමාරු හේතුවක් තියෙනවා කියලයි මට හිතෙන්නේ. ඒ වෙනුවෙන් ඕනෑම මුදලක් වියදම් කරන්න මම සූදානම්. මං මේ කටයුත්ත ඔබට භාරදෙන්නේ අන්න ඒ නිසයි."

"හොඳයි වැම්බරි මහත්මයා. මං ඒ කටයුත්ත භාරගන්නම්"

"ඔබ මොනවද මුලින්ම කරන්න බලාපොරොත්තු වෙන්නෙ?" වැම්බරි ඇහුවා.

"මට මුලින්ම උවමනා කරන්නේ මේ සිද්ධිය වුණු තැනට යන්න" මං කිව්වා. "මෙයට සම්බන්ධවුණු ගෘහසේවකයන් ආදී පිරිස හමුවෙලා, ඇසින් දුටු සාක්ෂිකරුවන් හැටියට, ඔවුනට කියන්න තියෙන්නේ මොනවාද කියා විමසන්න"

"බොහොම හොඳයි. මං ඊට පහසුකම් සලස්වන්නම්. මං නොමැති වෙලාවක වුණත් ඔබට පුළුවනි, මගේ ගෙදරට ගිහින් පරීක්ෂා කර බලන්න; සේවකයන්ගෙන් කාරණා විමසන්න."

"ඊට පසුව ස්විට්සර්ලන්තයට ගිහිං, හැරියට් පාකර් මෙනෙවිය හමුවෙන්න මං බලාපොරොත්තු වෙනවා"

"බොහොම හොඳයි හෝම්ස් මහත්මයා. ඔබට සම්පූර්ණ සහයෝගය දෙන්න කියලා මං ඇයට දන්වා යවන්නම්."

ඉතින් වොට්සන්. පසුවදා මම කෙන්සිංටන්හි චාල්ස් වැම්බරිගේ මන්දිරය වෙත ගියා. එය තරමක් ලොකු අලංකාර උද්‍යානයක් මැද ඉදිකළ මන්දිරයක්. ඔහුගේ පියාවූ විලියම් වැම්බරි ඉදිකළ එකක් වුණත්, එය ඉතාමත් හොඳින් නවීකරණය කොට තිබුණා. සිද්ධිය ගැන පුවත්පත්වල සඳහන්ව තිබූ තොරතුරු මගේ මොළයෙන් ඉවත් කරලා, මං සේවකයන්ගෙන් ප්‍රශ්න කළා. එතකොට මට මවාගන්න හැකිවුණේ මෙන්න මේ වගේ චිත්‍රයක්.

කලින් සඳහන් කළා වගේ සිද්ධිය වුණු දිනයේ, චාල්ස් වැම්බරි ගෙදර ඉඳලා නැහැ. උදේ එකොළහමාරට පමණ වැම්බරි මහත්මිය සිය නිවසේ අවි ආයුධ කාමරයට ගිහින් තියෙනවා. එහි ලාච්චුවක තිබූ සැමියාගේ රිවෝල්වරය අතට ගෙන, එහි උණ්ඩපුරවා තමාටම වෙඩි තබාගෙන තියෙනවා. ගෙදර ප්‍රධාන ගෘහ සේවකයා රිචඩ් නම් මැදිවියේ අයෙක්. කුස්සියට යාබද පැන්ට්‍රි කාමරයේ සිටි ඔහුට අහන්න ලැබුණාලු වෙඩි ශබ්දය. ඔහු වහාම දුවගෙන ආවාලු. වැම්බරි මහත්මයා ගෙදර නොහිටි නිසා, ඒ වෙලාවෙ ආයුධ කාමරය ඇතුළට කිසිකෙනෙකුට යන්න හේතුවක් නෑ.

රිචඩ්ට දකින්න ලැබුණේ වැම්බරි නෝනාමහත්මිය කාමරයේ මැද ලේ විලක ඇදවැටී සිටි හැටි. ඇය මියගොස් සිටි බව ඔහුට වැටහුණා.

ගෙදර ප්‍රධාන ගෘහසේවිකාව ලෝරන්ස් මහත්මිය. මේ වෙනකොට ඇයත් මෙතැනට දුව ඇවිත්. ඔවුන් දෙදෙනා ඉක්මනින් කතාබහ කර තීරණයකට ආවා, කළයුත්තේ කුමක් ද යන්න ගැන. ඔවුන් වහාම පොලීසියටත් වෛද්‍යවරයාටත් දුරකතනයෙන් දැන්නුවා. චාල්ස් වැම්බරිට ඔවුන් ඇනුම් දුන්නේ අන්තිමට.

පොලීසියට හා වෛද්‍යවරයාට ඔවුන් කිව්වේ මෙහෙමයි.

"වැම්බරි මහත්මිය හදිසි අනතුරකට මුහුණදීලා. වෙඩිල්ලකින් හිසට ඇතිවුණු බරපතළ තුවාල සමග, ඇය අවිආයුධ කාමරයේ වැටිල ඉන්නවා. ඇය මරණයට පත්වෙලා වගෙයි."

චාල්ස් වැම්බරි මහත්මයා මේ වෙලාවෙ තමන්ගේ කාර්යාලයේ වැදගත් සාකච්ඡාවක යෙදිලයි හිටියේ.

"වැම්බරි මහත්මිය අනතුරකට මුහුණදීලා. මහත්මයාට පුළුවන්ද වහාම ගෙදර එන්න?" එයයි ඔහුට දුන් පණිවුඩය.

වැම්බරි මහත්මිය පත්ව සිටි තත්ත්වය ගැන ඇගේ ස්වාමියාට කියන්න වෛද්‍යවරයාට සිදුවුණා. එය ඇසූ වැම්බරි මහතා ක්ලාන්තවුණාලු. මං වෛද්‍යවරයා සමග කථාකළා.

මේක හරිම අවාසනාවන්ත සිදුවීමක් බවයි ඔහු කිව්වේ. වැම්බරි මහත්මයාගේ සහ ඔහුගේ බිරිඳගේ පෞද්ගලික වෛද්‍යවරයා වීම නිසා, මේක ඔහුට වඩාත් වේදනාකාරී අත්දැකීමක් බව ඔහු කිව්වා. වැම්බරි මහත්මිය මහාචාර්ය විලියම් ඩේවිඩ්සන් වෙත යොමුකර තිබුණෙත්, මේ වෛද්‍යවරයා. ළඟදීම ඒමට නියමිතව සිටි සිඟිති අමුත්තා එනතුරු, මේ ජෝඩුව මඟ බලාගෙන හිටියේ හරිම ආශාවෙන්ලු. ඒ නිසා සියදිවි නසාගැනීමක් ගැන ඔහුට හිතන්නවත් බැහැලු. මේක කවුරුහරි සැලසුම් සහගතව කළ මිනීමැරුමක් විය නොහැකිද කියා මං ඔහුගෙන් විමසුවා. එහෙම දේකට කිසිම සාක්ෂියක් තිබිල නැහැ. අවි ආයුධ කාමරයේ සටහන් පොතක මෙහෙම දෙයක් ලියා තිබී හමුවුණාලු.

"ආදරවන්තයාණනි. මට සමාවෙන්න"

මෙය ජේන් වැම්බරි මහත්මියගේ අත්අකුරු බවට කිසිම සැකයක් නැහැලු.

මෙම රිවෝල්වරය චාල්ස් වැම්බරි මහත්මයාට අයත් එකක්. ඔහු කිසි විටෙකත් ඒකෙ උණ්ඩපුරවා තබන්නෙ නැහැලු. වැම්බරි මහත්මිය අවිආයුධ කාමරයට ගිහිං, රිවෝල්වරයට උණ්ඩ පුරවා හිසට වෙඩිතබාගෙන තියෙනවා. පශ්චාත් මරණ පරීක්ෂණය කළ වෝහාරික වෛද්‍ය කීත් ෆ්රැන්සිස් හමුවෙන්නත් මං ගියා. මෙය සියදිවි නසාගැනීමක් බවට ඔහුට සියයට සීයක් සහතිකයිලු. ඇයගේ මරණය ක්ෂණිකව සිදුවූ එකක්. නමුත් ඉතාම හොඳ මානසික තත්ත්වයකින් හිටි ඇය, මෙහෙම දේකට යොමුවෙන්න පුළුවන්ද? ගර්භණී තත්ත්වය නිසා, ඉතාම ක්ෂණිකව මනසේ විපර්යාසයක් වීමට ඇති ඉඩ බැහැර කරන්න බැහැලු.

වැම්බරි මහත්මයා මා සමග කියූදේ මං වෛද්‍යවරයාට කිව්වා. කලින්දා හැන්දෑවෙත් ඇය හිටියේ ඉතාම සන්තෝෂයෙන්. එදා

උදේ තේ පානය කරද්දිත් එහෙමයි. වැම්බරි මහත්මයා කාර්යාලයට ගියේ, එදා හැන්දෑවෙ ඇය සමග අශ්වකරත්තයෙන් හැතැක්ම හතඅටක සංචාරයක යන්න පොරොන්දුවෙලා. ඇයි එක්වරම මෙහෙම දෙයක් වුණේ?

ඊළඟට මං ප්‍රශ්න කළේ ගෙදර සේවක සේවිකාවන්ගෙන්. වැම්බරි මහත්මියගේ පෞද්ගලික සේවිකාව මිල්ඩ්‍රඩ් සමග මං කථා කළා. මහත්මියට එදා උදේ තැපෑලෙන් මොනවා හරි ලැබුණද කියල මං විමසුවා.

"ඔව්. ඇයට පාර්සලයක් ලැබුණා. ඒ ඔවුන් ඇණවුම් කළ ඇඳුම වගයක්."

"කාගෙ ඇඳුම්ද?"

"අලුත උපන් දරුවෙකුට සුදුසු ඇඳුම්. වැම්බරි මහත්මිය ඒවා දැකලා හරියට සන්තෝෂ වුණා. එහි තිබුණා රෝස පාට සහ ළා නිල් පාට ඇඳුම්. ඒ දෙවර්ගයම තමන් තියාගන්නවා කියල ඇය කිව්වේ අප්‍රමාණ සන්තෝෂයෙන්. ඇය ඒ තරම් සතුටකින් සිටි දවසක් මෑතක මං දැකල නෑ"

"ඒ කියන්නේ ඇය අසතුටෙන්, කණගාටුවෙන් සිටි දවස් ඔබ දැකල ඇති?"

"මං මේ ගෙදර රැකියාවට ඇවිත් අවුරුදු එකහමාරකට වැඩියි" මිල්ඩ්‍රඩ් කිව්වා. "නමුත් ඇය කණගාටුවෙන් හිටි දවසක්, කඳුළු හෙළූ දවසක් මං දැකල නැහැ, කිව්වොත් ඔබ පුදුමවේවි."

"හොඳයි. එදා උදේ තේ පානයේ ඉඳල ඇය දවස ගතකළ ආකාරය මට කියන්න."

"පහුගිය ටිකේම තේ පානය කළ වහාම ඇය කළේ සඟරා කියවීම. ඒ කුඩා දරුවන් වෙනුවෙන් ඇඳුම් පැළඳුම්, ගැබිණි මව්වරුන්ට උපදෙස් හා, කාමර පිළියෙල කිරීම ගැන උපදෙස් අඩංගු සඟරා. ඒ අතරෙදි තමයි මං කලින් සඳහන් කළ ඇඳුම් පාර්සලය තැපෑලෙන් ලැබුණේ. ඒ දහයමාරට විතර.

ඊළඟට එකොළහට විතර වෙළඳ අලෙවි ප්‍රවර්ධකයෙක් ගෙදරට ආවා. ඒ ගෙවල්වල උද්‍යානයේ තැබීම සඳහා, පුටු සහ බංකු නිෂ්පාදනය කරන සමාගමකින්."

"ඔහු ගේ ඇතුළේ විසිත්ත කාමරයට ගියාද?"

"නැහැ මහත්මයා. ඔහු ඉඳගත්තේ ඔබ දැන් හිඳගෙන ඉන්න ඔය පුටුවේ. වැම්බරි මහත්මිය ඉස්තෝප්පුවට ඇවිත් මේ පුටුවේ

හිඳගත්තා. මේ වෙළඳ අලෙවිකරුවන් හැමවිටම තමන් අලෙවි කරන දේවල් ගැන, තොරතෝංචියක් නැතුව දොඩවනවා නේ. නමුත් මොහු එහෙම කළේ නැහැ. ඔහු මිනිත්තු දෙකක් පමණ නිශ්ශබ්දව වැම්බරි මහත්මිය දිහා බලාගෙන හිටියා."

"ඔහු වයස කීයක විතර කෙනෙක්ද?"

"මං හිතන්නේ අවුරුදු දහඅටක නැත්නම් විස්සක කොලු ගැටයෙක්. මේ රස්සාවට අලුත් ඇති. ඉස්කෝලෙදි විභාග පාස් වෙන්න බැරිවෙලා එළියට ආපු, දුප්පත් ඉලන්දාරියෙක් වෙන්න ඇති."

"ඔහුගේ පෙනුම කොහොමද?"

"හරිම කෙට්ටුයි. ඒ වගේම අඩි හයක් විතර උසයි. මුහුණේ පෙනුම කඩවසම්. කොණ්ඩය රතුම රතුයි. එය ඉහළට විහිදී තිබුණේ ඉත්තෑකූරු වගේ. ටයිපටියක් පැළඳ හිටියත් කබායක් ඇඳ හිටියේ නැහැ. ආර්ථික අතින් හුඟක් අගහිඟකම් තියෙන පවුලක තරුණයෙක් වෙන්න ඇති. මට හිතුණේ ඔහු ලැජ්ජාශීලී කෙනෙකු කියලයි. තමන් කියන්න ඕන මොනවද කියල හිතාගන්න බැරුව වගේ ටිකක්වෙලා බලාගෙන හිටියා"

"ඊළඟට මොකක්ද වුණේ?"

"තමන්ගේ ආයතනයේ නිෂ්පාදනය කරන උද්‍යාන බංකුවල අනර්ඝත්වය, ඔහු එක්වරම කියවන්න පටන් ගත්තා. වැම්බරි මහත්මිය ඒ දිහා බලාගෙන හිටියේ පුදුමයට පත් මුහුණෙන්. ඊළඟට ඔහුගේ කතාව එක්වරම ඇණ හිටියා. කටපාඩම් කරගෙන ආ දේ ඔහුට අමතක වෙන්න ඇති. තවත් යමක් කියන්න ඔහු උත්සාහ කළා. නමුත් එයත් නැවතී ඔහු ගොතගහන්න පටන්ගත්තා. වැම්බරි මහත්මිය ඔහු දිහා බලාගෙන හිටියේ හරිම සානුකම්පිත මුහුණකින්.

ඊළඟට ඔහු තමන් ළඟ තිබුණු කැටලොග් පොත් දෙකක් ඇය අතට දුන්නා. ඇය එයින් උද්‍යාන බංකු දෙකක් තෝරා ගත්තා. මං හිතන්නේ ඇය ඒක මිලට ගත්තේ ඔහුට උදව්වක් හැටියට වෙන්න ඇති."

"ඒ උද්‍යාන බංකු තේරීමට ඇයට කොච්චර වෙලා ගතවුණාද?"

"ඔබ දැන් ඇහූ නිසා මට ඒ කරුණ මතක් වෙනවා. කැටලොග් පොත උකුල උඩ තබාගෙන, උද්‍යානයේ ඈත කෙළවර දිහා බලාගෙන ඇය කල්පනාවකට වැටී සිටියා. මං හිතන්නේ මිනිත්තු දහයක් විතර ගතවෙන්න ඇති. මං හිතන හැටියට මේ වෙලාවේ ඇයට උද්‍යාන බංකු මිලට ගන්න කිසිම උවමනාවක් තිබුණෙ නෑ"

"හොඳයි ඊළඟට මොකද වුණේ?"

"මහත්මිය ඇගේ ඇණවුමට මුදල් ගෙවූ පසු, වෙළෙන්දා ඇයට ස්තුති කොට රිසිට් පතක් දී යන්න ගියා" කියා මිල්ඩ්‍රඩ් ඇගේ කතාව අවසන් කළා. ඊළඟට මේ ගෙදර ගෘහසේවක රිචඩ් තමා මට තොරතුරු කිව්වේ.

"වැම්බරි මහත්මිය දැන් කොහේ හරි යන්න බලාපොරොත්තු වෙනවද" කියල මං ඇයගෙන් ඇහුවේ, අර අලෙවි ප්‍රවර්ධකයා පිටවී ගියාට පසු. "අශ්වකරත්තය සූදානම් කරන්න කියලා රියැදුරාට මං දැනුම් දෙන්නම්?" මං කිව්වා. නමුත් ඇය කිව්වේ තමන් දැන් එළියට නොයන බව. වැම්බරි මහත්මයා හවසට ගෙදර ආවම ඔහු සමග එළියට යන බව ඇය කිව්වා."

"ඊට පසු ඔබ මොනවද දුටුවේ?"

"මිල්ඩ්‍රඩ් ගෙන ආ කිරි වීදුරුවක් පානය කළ ඇය කාමරයට ගියා. ඒ ඇගේ නිදන කාමරයට. එවිට මං එතැනින් පිටවී පැන්ට්‍රියට ගියා."

"අන්තිමවරට ඇය පණ පිටින් දකින්න ලැබුනේ ඔබට?"

"ඔව් මහත්මයා"

"එතකොට වෙලාව කීයද?"

"මං හිතන්නේ එකොළහයි විස්සයි හෝ විසිපහයි"

ඉතින් වොට්සන් ඊළඟට මං ඔවුන්ගෙන් විමසා බැලුවේ, ජේන් වැම්බරි මහත්මියට පසුගිය සති කිහිපයේ ලැබුණු, ලියුම් සහ දුරකතන ඇමතුම් ගැන. නමුත් ඒ අංශයෙන් වත් වැදගත් යමක් හොයාගන්න මට හැකිවුණේ නැහැ.

මේ දෙදෙනා විවාහවුණු දවසේ පටන්, එකිනෙකාට ආදරයෙන් කැපවී සිටි දෙදෙනෙක්. සේවක සේවිකාවන් ඒ බව නැවත නැවතත් තහවුරු කළා. චාල්ස් වැම්බරි මහත්මයා කොහොමටත් කාරුණික ඉවසිලිවන්ත කෙනෙක්. ඔහු තමන්ගේ සේවකයෙකුටවත් සැරපරුෂ වචනයක් කියන කෙනෙකු නෙමෙයිලු. ඔහුගේ බිරිඳත් ඒ ආකාරයේම කෙනෙක්. ඒ දෙදෙනා බහින්බස් වෙන වචනයක් කිසිම දවසක කාටවත් අහන්න ලැබිල නැහැ. මේ දෙන්නා විවාහවෙලා එන්නත් කලින් ඉඳන් මේ ගෙදර සේවය කළ තුන්දෙනෙක් ඉන්නවා. ඒ මුළුතැන්ගෙයි සේවිකාව බ්‍රවුන්රිග් මහත්මිය, ප්‍රධාන ගෘහසේවකයා රිචඩ් සහ එක් අශ්වකරත්තයක රියැදුරා වන ක්ලයින්. එක් නපුරු

වචනයක්වත් හුවමාරු නොවුණු වැම්බරි යුවළගේ ආදරය ගැන මේ තුන්දෙනා සහතික වුණා.

මීළඟට මම, මේ වෙනකොට ගෙදර ඇවිත් හිටි වැම්බරි මහත්මයාගෙන් අවසර අරගෙන, ඔහුගේ බිරිඳගේ පෞද්ගලික ලියන මේසය පරීක්ෂා කළා. ඇය ඉතාම පිළිවෙළකට වැඩ කළ කෙනෙක්. ඇයට ලැබුණු ලියුම් හා ඒවාට පිළිතුරු සැපයූ දින ගැන, එක් පොතක සටහන් කර තිබුණා. ඊළඟට ඇය යැවූ ලියුම් ගැනත් සඳහන් දිනපොතක් මට දකින්න ලැබුණා. නමුත් ඇගේ හදිසි මරණයට අදාළ එක වචනයක් මට දකින්න ලැබුණෙ නෑ. අන්තිමේදී මං ස්විට්සර්ලන්තයට යන්න තීරණය කළා.

ඔවුන් දී තිබූ ලිපිනය අනුව හැරියට් පාකර් මෙනෙවියගේ නිවස හොයාගැනීම මට අපහසු වුණේ නෑ. එය ප්‍රමාණයෙන් කුඩා, එහෙත් ලස්සනට තබා ගත් නිවසක්. අමුත්තන් හමුවෙන තැන වුණේ එහි සඳළුතලය. එතැනට රෝන් මිටියාවත ඉතා අලංකාරව දිස්වුණා.

වයස්ගත කාන්තාව හිඳගෙන සිටියේ රෝද පුටුවක. මං චාල්ස් වැම්බරි මහතාගේ මිත්‍රයෙකු ලෙසයි, ඇයට මාව හඳුන්වාදුන්නෙ. ඇය ප්‍රමාණයෙන් කුඩා සිරුරක් තිබූ, කෙස්වැටිය සම්පූර්ණයෙන්ම සුදුවුණු, කළු පැහැ ඇස් තිබූ වයස අවුරුදු හැත්තෑවක පමණ තැනැත්තියක්.

"ඉතින් කොහොමද චාල්ස්ගෙ සැපසනීප? ජේන්ගේ ඛේදජනක මරණය ගැන, අලුතෙන් මොනවා හරි හොයාගන්න ඔහුට හැකි වුණාද?" ඇය ඇසුවා.

"කණගාටුයි කියන්න. අලුතෙන් කිසිවක් හොයාගන්න හැකිවුණේ නෑ." මං කිව්වා. "මේ ගැන ගැඹුරටම හොයන්න වැම්බරි මහත්මයා තීරණය කරගෙනයි ඉන්නෙ. ඇත්ත කියනවා නම් මං මේ විශේෂයෙන්ම ගමනක් මෙහේට ආවෙත් ඒකට. ඇය ගැන ඉතාමත් හොඳින් දන්නෙ ඔබ. ඇගේ සැමියාටත් වඩා තොරතුරු ඔබ දන්නවා ඇති. වැම්බරි මහත්මයා හිතන්නේ මෙහෙමයි. ජේන් මහත්මිය මේ විදිහට දිවි තොර කරගන්න හේතුවුණේ ඇයි කියන එකට, අදාළ යමක් ඔබ දන්නවා ඇති"

"ඇයි මං චාල්ස්ට ලියුමක් ලියුව නේ" පාකර් මෙනෙවිය කිව්වා.

"සිදුවුණු දේ අහල මං ක්ලාන්ත වුණා. දෙවියනේ මෙහෙම දෙයක්! මට එය අදහාගන්න බැරිවුණා. ජේන් මට එවූ අන්තිම ලියුම මං චාල්ස්ට යැව්වා. ඔහු ඒක ඔබට කිව්වෙ නැද්ද?"

"ඒක මං දුටුවා. ඇය එවූ අනෙක් ලියුම් ඔබ ළඟ තියෙනවාද?"

"ජේන් එවූ ලියුම් හැම එකක්ම මං පරෙස්සම් කරල තියෙනවා. ඇය විවාහ වෙලා එංගලන්තයේ පදිංචියට ගියානේ. ඊට පස්සේ හැම සතියකම මට ලියුමක් එවන්න අමතක කළේ නෑ. චාල්ස් තමන්ට දක්වන ආදරය, සැලකිල්ල ගැනත්, තමන්ගේ හිතේ චාල්ස් කෙරෙහි තියන ආදරය ගැනත්, ඒ හැම ලියුමකම ජේන් සඳහන් කරල තිබුණා. ඊළඟට ලස්සන පරිසරයක තිබුණු ඇගේ ලස්සන නිවස ගැන ඇය ආඩම්බර වෙන හැටි. ඇගේ සිතේ කණගාටුවක් ඇතිවී තිබුණේ, මට එංගලන්තයේ ඒ ගෙදරට ඒමට තිබූ අපහසුව ගැන. ඔබට පෙනෙනවා නේද. මං ආබාධිත කෙනෙක්. මං කොහොමද ඒ තරම් දුර යන්නෙ?"

ඇය කියූ තරම් දුර්වල බවක්, මට හැරියට් පාකර් මෙනෙවිය වෙතින් පෙනුණේ නෑ. මට හිතුණේ ඇයට එංගලන්තයට යන්න උවමනාවක් තියෙන්න නැහැ කියලයි.

"ජේන් සහ ඔබ අතර ඇඩි බැඳීමක් තිබුණු බවයි මට අහන්න ලැබුණේ......" මං ඇයට කිව්වා.

"මගේ හිතේ ජේන් ගැන තිබුණේ, වචනයෙන් විස්තර කරන්න බැරි ආදරයක්"

මෙහෙම කියූ පාකර් මෙනෙවියගේ දෙනෙත්වලින් කඳුළු කඩා හැළුණා. මිනිත්තුවකට දෙකකට ඇගේ කටහඬ වෙනස්වුණා.

"..... ඇගේ හිතෙත් මං ගැන තිබුණේ එවැනිම ආදරයක්. දෙයියො තමා දන්නෙ. මට වෙලාවකට හරියට කේන්ති යනවා. ඒකට හේතුව සන්ධි ප්‍රදාහය නිසා මගේ දණහිස්වලත් කොඳු නාරටියෙත් දැනෙන වේදනාව. මං කේන්ති අරගෙන කොච්චර කෑගැහුවත්, ජේන් නිශ්ශබ්දව හැමදෙයක්ම ඉවසුවා. මං ගැන කලකිරුණෙ නෑ. ඇය මොන තරම් හොඳ ගතිගුණ තිබුණු ගෑනු ළමයෙක්ද."

"ඇය විවාහ වෙලා ලන්ඩනයට යෑමෙන් ඔබට ලොකු පාළුවක් දැනෙන්න ඇති?"

"මට දැනුණු පාළුව මං කොහොම විස්තර කරන්නද. මට ඒක තවමත් දැනෙනවා. හැමදාමත් දැනේවි. නමුත් මං කොහොමද ඇය හැමදාමත් මා ළඟ තියාගන්නෙ? චාල්ස් ගැන ඇගේ හිතේ ලොකු පැහැදීමක් ඇතිවී තිබුණා. ජේන්ගෙ අනාගතය ගැන හිතන්න ඕනනේ. ඒ නිසා මං ඒ විවාහයට මගේ ආශීර්වාදය ලබාදුන්නා."

"චාල්ස් වැම්බරි මහත්මයා මට මෙහෙම දෙයක් කිව්වා. ජේන් නොමැතිවීමේ අඩුපාඩුව පුරවන්න, ඔබට අමතර සේවිකාවක් ගන්න ඔහු මුදල් වෙන්කළා කිව්වා...... ඇගේ වැටුප සහ ඔබේ වැඩිවුණු වියදම් වෙනුවෙන් මුදලක්....."

"ඇත්තෙන්ම ඔව්. ඔහු නිර්ලෝභීව මට පිහිටවුණා. එවැනි විශාල වියදමක් මාස්පතා දරාගන්න මට හැකියාවක් නෑ. ඔහු දිගටම ඒ මුදල එවාවි නේද?" මේ වෙලාවෙත් ඇයට හිතුණේ තමන් වෙත ලැබුණු ඒ අමතර මුදල ගැනයි. ඒක මගේ හිතේ සතිටුහන් වුණා.

"වැම්බරි මහත්මයා ඒ ගැන මට මොකුත් කිව්වෙ නෑ. ඔහු ඒ මුදල දිගටම ඔබට එවාවි. ඒකෙ සැකයක් නෑ." මං කිව්වා.

පාකර් මෙනෙවියගෙ මුහුණේ තිබුණේ අවිනිශ්චිත බවක්..... තමන්ට ප්‍රශ්නයකට මුහුණ දෙන්න වේදෝ කියන සැක සහිත බවක්. ඇය නොනවත්වාම රෝද පුටුවේ පැත්තට ඇඟිලි තුඩුවලින් තට්ටු කළ ආකාරය මං දුටුවා.

"පාකර් මෙනෙවිය." මං කිව්වා. "ඔබේ ලේලිය මෙහෙම දෙයක් කරගන්න ඇත්තෙ, ඇය මෙහේ ඉඳපු කාලේ වුණු මොකක් හරි සිදුවීමක් නිසා කියල ඔබට හිතෙන්නේ නැද්ද?"

"දෙවියනේ! මොනව ගැනද ඔබ මේ අහන්නෙ?"

"ඇගේ කැඩීගිය ප්‍රේම සම්බන්ධයක්? එහෙමත් නැත්නම් අත්හැරී ගිය විවාහයක්?"

"දෙවියනේ! එහෙම කිසිදෙයක් කවදාවත් තිබුණේ නෑ. සහතිකයි."

"එතකොට එයාගෙ පාසල් මිතුරු මිතුරියන්?"

"ජේන් හුඟක්ම පුංචි කාලෙ ඇයට ඉගැන්නුවෙ මම. තරුණ කාලෙ පාසල් ගුරුවරියකව හිටි නිසා මට ඒක අමාරු වුණේ නැහැ. ඊට පස්සෙ මං ඇයව ලොසාන්වල කාන්තා පාසලකට දැම්මා. ඇය පාසල් ගියේ ගෙදර ඉඳන්"

"ඇගේ පාසල් මිතුරියන් කවුද? ඔවුන් මෙහේ ආව ගියාද?"

"ජේන් ඒ තරම් තදින් කවුරු එක්කවත් මිත්‍ර සම්බන්ධතා පැවැත්තුවේ නෑ. ගැහැනු ළමයෙක් හෝ දෙන්නෙක් හවස තේවලට ගෙදරට ඇවිත් ගියා මට මතකයි. ඒත් ඔවුන්ගේ නම් ගම් කිසිදෙයක් මට මතක නෑ. ජේන්ට විශේෂ මිතුරියක් හිටියෙ නෑ."

"ඒ කාලෙ සහ ඊට කලින් ඇය පෙනී ඉඳපු ඡායාරූප ඔබ ළඟ තියෙනවද?"

"ඔව් හුඟක් තිබුණා. ඒවා පිළිවෙළකට ඇල්බම්වල අලවලයි තිබුණේ. ඒ ඇල්බම් කොහේ දමලද කියල මට මතක නෑ. ඔබට ඒ ඡායාරූප බලන්න උවමනාද?"

"ඔව් බැලුවොත් හොඳයි. ඇය විවාහවුණාට පසු ඡායාරූප නම් මට වැම්බරි මහත්මයා පෙන්නුවා. නමුත් මං කැමතියි ළමා කාලයේ ඒවා බලන්න."

ඇය මට ඇල්බම් ගණනාවක් පෙන්නුවා. ජේන් හා හැරියට් දෙදෙනා එකට සිට සහ වෙන් වෙන්ව ගත් ඡායාරූප රැසක් එහි තිබුණා. ඒ ඔක්කොම ජේන්ගේ වයස අවුරුදු පහළොව හෝ ඊට පසු කාලවල ගනිපුවා.

"ඇය හුඟක්ම ලාබාල කාලේ ගත්තු ඡායාරූප ඔබ ළඟ නැද්ද?" මං ඇසුවා.

"නෑ......" ඇය කිව්වා. "මං හිතන්නේ..... ඒ කාලෙ මා ළඟ කැමරාවක් තිබුණෙ නෑ" ඇය කිව්වේ මා දිහා හොරැහින් බලා ගොතගසමින්.

ඇය එය කියූ තාලයට මගේ හිතේ සැකයක් ඇතිවුණා. හැරියට් පාකර් මෙනෙවිය මේ දැන් කියූ දේ, මොකක් හරි අඩුපාඩුවක් මට පෙනුණා.

"එහෙම නම් ඔබ දෙදෙනා ස්ටුඩියෝවලට ගිහින් ගත්තු ඡායාරූප ඔබ ළඟ ඇති.....?"

"නැහැනේ" ඇය කිව්වා. "ඒවා ඒ කාලේ තිබුණා වුණත් දැන් නැතිවෙලා ගිහින්. ඉස්සරම අපි පදිංචි වෙලා හිටියේ සූරිච්වල. ඒ කුලී ගේක. එතැනින් අපි ආවා බර්න් නගරයේ තට්ටු නිවාසයකට. ඒකෙනුත් අයින් වෙලා අපි මේ ගෙදරට එද්දි, ජේන්ගෙ වයස අවුරුදු පහළොවයි."

"ජේන් ඔබගේ භාරයට පත්වුණේ, ඇයගේ වයස අවුරුදු පහේදි කියලයි මට දැනගන්න ලැබුණේ....."

"ඔව්"

"ජේන්ගේ දෙමව්පියන්ගේ ඡායාරූපයක් ඔබ ළඟ ඇති....?"

"නැහැ"

"නැහැ? වැම්බරි මහත්මයා මට කිව්වේ ඔබ ජේන්ගේ පියාගේ එකම සොයුරිය කියලයි. ඒක හරිද?"

"ඔව් ඔහු මගේ එකම සොහොයුරා"

"ජේන් ඔබේ දරුවෙකු හැටියට හදාගන්න ඔබ තීරණය කළේ ඇයි?"

"ඇගේ අම්මා කුමක් හෝ හෘද රෝගයකින් මියගියා. ජේන්ව හදාවඩා ගැනීම ගැන, මගේ අයියාට කිසිම තේරුමක් තිබුණේ නැහැ. ඇය බොහොම සියුමැලි, බොළඳ දරුවෙක්. මමත් අවිවාහක නිසා, මං ජේන් භාර අරගෙන හදාගත යුතු බවට අපි දෙන්නාම තීරණය කළා"

"නමුත් දරුවා හදා වඩා ගැනීමටත්, ඇගේ අධ්‍යාපනය වෙනුවෙනුත්, ඇගේ පියා ඔබට විශාල මුදලක් පරිත්‍යාග කළා?"

"ඇත්තෙන්ම ඔව්. නැතුව මං කොහොමද තනියෙන් ඒ කටයුතු කරන්නේ? හෝම්ස් මහත්මයා. ඇයි ඔබ මේ වගේ ප්‍රශ්න මගෙන් අහන්නේ? ඇගේ තාත්තා මට මුදල් පරිත්‍යාග කළ එක, කොහොමද ඇගේ මරණයට සම්බන්ධ වෙන්නේ? ඔබටත් චාල්ස්ටත් උවමනා කරන්නේ, ඇය දිවිනසා ගත්තේ ඇයි කියන කාරණය හොයන්න නේද? මේව කොහොමද ඒකට.......?"

"පාකර් මෙනෙවිය. ඔබ කියන දේ ඇත්තයි. මං චාල්ස් වැම්බරිගේ මිත්‍රයෙක් නෙමෙයි. මං රහස් පරීක්ෂකයෙක්. ජේන්ගේ අභිරහස් මරණයට හේතුව කුමක්ද කියා හොයාදීම ඔහු මට භාරකරලයි තියෙන්නේ."

පාකර් මෙනෙවියගේ මුහුණ සුදුමැලි වුණා. මං හිතන්නේ ඇයට යන්තමට ඩහදියත් දැම්මා. මෙපමණ වෙලාවක් ඇගේ මුහුණේ තිබුණු කාරුණික එහෙත් සාඩම්බර ගතිය, මුළුමනින්ම නැතිවෙලා ගියා. දැන් මට ඇයව පෙනුණේ භීතියට පත් මහලු ගැහැනියක් වගේ.

"ඔහේ ආවේ මොනවා හොයන්නද?" ඇය ඇසුවේ දුර්වල කට හඬකින්.

"පුළුවන් හැමදෙයක්ම හෙළිකරලා එළියට මතුකර ගන්න" මං නිර්භයව කිව්වා.

"මේ ලෝකේ මං එක්තරා කාරණයක් නිරීක්ෂණය කරල තියෙනවා වොට්සන්. ලෝකෙ ඉන්න හැම කෙනෙකුටම, අනිත් අයගෙන් හැංගිය යුතු මොනවා හරි තියෙනවා. ඒ රහස් දේ බොහෝවිට කාටවත් හෙළි කරන්නේ නැතුවම අපි මියයනවා. සමහරවිට ඒ රහස් කරුණ කාටවත් හිංසාවක්, හිරිහැරයක් නැති ඉතාම සුළු අහිංසක දෙයක් වෙන්න පුළුවනි. සමහරවිට යම් වැදගත්

කමක් ඇති රහසක් වෙන්නත් පුළුවනි. මෙහෙම දෙයක් නොදැනුවත්වම කටින් පිටවෙන්නෙ මොන වගේ වෙලාවලටද දන්නවද? උසාවියකදි සාක්ෂි කූඩුවට නැගලා ඉඳිද්දී - විරුද්ධ පැත්තේ නීතිඥයා හරස් ප්‍රශ්න එල්ල කරද්දී. හැරියට් පාකර් මෙනෙවියටත් තිබුණා මොකක් හරි හැංගිය යුතු කාරණාවක්. නමුත් ඒක ඇගේ කටෙන් පිටවුණේ නොහිතූ අයුරෙන්.

"වාල්ස් කළ වැඩේ බොහොම වැරැදියි" ඇය කිව්වා. "ජේන්ට හිමිවිය යුතු මුදල් මං වංචා කරනවා කියල පෙනුණා නම්, ඔහුට තිබුණේ ඒක මට කෙළින්ම කියන්න. ඒකට රහස් පරීක්ෂකයෙක් එවන්නේ මොකටද?"

"ඔබ කිසිම වංචාවක් කරන බවක්, වැම්බරි මහත්මයා කොහොමටවත් කිව්වෙ නෑ. ඔහු කිව්වේ ජේන්ගේ දෙමව්පියන් ඇය වෙනුවෙන් විශාල මුදලක් වෙන් කරන්න ඇති; ඒක හරි පුදුමාකාරයි කියලා"

"පුදුමාකාර තේන්නම්" ඇය කිව්වා. "මං හැමදෙයක්ම කළේ සාධාරණ පිළිවෙළට. ජේන් මට භාර දෙද්දී ඇගේ පියා සමග මං ඇතිකරගත් ගිවිසුම මේකයි. ජේන් විවාහ වෙනදාට සම්පූර්ණ මුදලෙන් හතරෙන් තුනක් ඇයට භාරදීමට මං පොරොන්දු වෙනවා. නමුත් ජේන් විවාහවුණේ කෝටිපතියෙකු සමග. ඉතින් ඒ සම්පූර්ණ මුදල මා ළඟ තබා ගැනීමේ වරද මොකක්ද? මේ වෙලාවෙ ඒක නොලැබුණා කියල ඇයට කිසිම අඩුපාඩුවක් තේරෙනවාද? අනික මං මැරුණු දවසක, මගේ සම්පූර්ණ බූදලයම හිමිවෙන්නෙත් ඇයට. ඇය මියගිය නිසා මං ඒ මුදල් ළඟ තබා ගැනීමේ වරදක් නෑ?"

"පාකර් මෙනෙවිය. මං කියන දේ අහන්න" මං කීවා. "ඔය මුදල් ගැන හිතලා ඔබේ මොළේ අවුල් කරගන්න කිසිම උවමනාවක් නෑ. වැම්බරි මහත්තයා මාව එව්වේ ඔය වගේ කටයුත්තකට නොවෙයි. මං ඒ බව ඔබට කලින් කිව්වා නේද? ඔහුට උවමනා කරන්නේ, තමන්ගේ බිරිඳ මෙහෙම දෙයක් කරගත්තෙ ඇයි කියන එක හොයාගැනීම පමණයි"

මං කියූ දෙයින් පාකර් මෙනෙවිය ලොකු සැහීමකට පත්වුණු බව පෙනුණා. ඇය තමන්ගේ සේවිකාව කැඳෙව්වා. මෙතෙක් වෙලා තමන් සිටි රෝද පුටුවෙන් ඔසවලා, තමන් හාන්සි පුටුවෙන් තබන්න කියලා සේවිකාවට අණ කළා. මේ අතරේ අනෙක් සේවිකාවක් තේ

පිළියෙල කරගෙන ආවා. පාකර් මෙනෙවිය කතන්දරය පටන්ගත්තේ තේ කෝප්පයක් බීලා දිගු සුසුමක් හෙළමින්.

"දැන් ඉතින් ජේන් මියගිහින් නේ. තවදුරටත් මේ කාරණා හංගාගෙන ඉඳීමෙන් ඇති වැඩක් නෑ" පාකර් මෙනෙවිය කිව්වේ දිගු කතාවකට සූදානම් වෙමින්.

"හෝම්ස් මහත්මයා. මං ඔබට ඇත්ත කියන්නම්. ඇය මගේ ලේලිය නොවෙයි. ඇයගේ භාරකාරත්වය සඳහා මං ඇගේ පියා එක්ක ගිවිසුමක් අත්සන් කළා. ඒ ඇය වැඩිහිටියෙකු වෙලා විවාහ වෙනතුරු ජේන්ව රැක බලාගන්න. දැන් ඔහු මියගිහින්. මං මේ විදියට ස්විට්සර්ලන්තයට වෙලා ජීවත්වෙද්දී, අප ගැන කවුරුවත් දන්නෙ නෑ. ඔය ගිවිසුම් ගැන හොයා බලන්න එන කෙනෙකුත් නෑ. ඉතින් අර මුදල....."

"පාකර් මෙනෙවිය. මං යළිත් කියන්නේ. ඔබ ඒ මුදල් කොයිතරමක් ඉතිරි කරගත්තද වියදම් කළාද කියන එක අපට වැදගත් නෑ. මට දැනගන්න උවමනා මෙච්චරයි. ජේන් ඔබේ ලේලිය නොවෙයි නම්, ඇත්තටම ඇය කවුද?"

"ඇය ආතර් හිගින්ස් නම් මහත්මයෙකුගේ එකම දියණිය. මට දැනගන්න ලැබුණේ එපමණයි. ඔහු ජීවත්වුණේ එංගලන්තයේ කොහේද, ඔහුගේ ලිපිනය කුමක්ද කියා ඔහු මට කිසි දවසක කිව්වෙ නෑ. මං දැනගෙන හිටී එකම දෙය, ඔහුගේ බැංකුකරුවන්ගේ ලන්ඩන් ශාඛාවේ ලිපිනය පමණයි. ඒ ලිපිනයේ ඉඳල චෙක්පත් හතරකින් මට මුදල් ගෙවීම් කළා. ජේන් මගේ භාරයට ගත්තට පස්සේ, හිගින්ස් මහත්මයා කැනඩාවට සංක්‍රමණය වුණා. අවුරුදු පහකට පසු ඔහු මියගියා. මේ කාරණා මට දැනුම් දුන්නේ බැංකුවෙන්. ඊට පස්සේ බැංකුවෙන්වත් මට කිසිම ලිපියක් ආවෙ නෑ"

මම ආතර් හිගින්ස් කියන නමත් බැංකුවේ ලිපිනයත් මගේ පොතේ සටහන් කරගත්තා.

"පාකර් මෙනෙවිය. මේ හිගින්ස් මහත්මයා ඔබේ පෞද්ගලික මිතුරෙකු නොවෙයිද?" මං ඇහුවා.

"කොහොමටවත් නෑ" ඇය කිව්වා. "මට ඔහු හම්බවෙලා තියෙන්නේ දෙවතාවක් පමණයි. ඒ කාලෙ මං බොහොම දුප්පත් කෙනෙක්. ධනවත් පවුල්වල දරුවන්ගේ පෞද්ගලික ගුරුවරිය හැටියටයි මං රැකියාව කළේ. එතකොට මං සේවය කරමින් සිටි

ඉංග්‍රීසි ජාතික පවුල, මේ රටේ පදිංචි වෙලා ඉඳලා ආපහු එංගලන්තයට යන්න තීරණය කළ අවස්ථාව. ඒ තීරණයෙන් මට යන එන මං නැතිවුණා. එතකොට තමයි මං පුවත්පතේ පළවුණු දැන්වීමක් දුටුවෙ. පුවත්පත බාරේ එයට පිළිතුරු ලියන්න කියලයි දැන්වීමෙ සඳහන් වුණේ.

"ස්වභාවයෙන්ම බොළඳ, සියුමැලි ගැහැනු ළමයෙකු ජීවිත කාලයටම බලාගන්න කෙනෙකු ඕනෑ."

රැකියාවක් නැතුව අනාථ වෙන්න ගිය මට, දෙවියන් ඇත්තෙන්ම පිහිටවුණා කියලයි හිතුණේ. මගේ ලිපියට පිළිතුරු ලැබුණා. මං ගියා ඒ තාත්තව හමුවෙන්න. ඒ හිගින්ස් මහත්මයා මට හමුවුණු පළමුවන අවස්ථාව. මං ගැන හෝ මගේ පවුල් පසුබිම ගැන ඔහු ඇහුවේ ප්‍රශ්න දෙක තුනක් විතරයි. ඔහුට එක් කාරණයක් අවධාරණය කිරීමට උවමනාව තිබුණා. ජේන් විවාහ වෙනතුරු හෝ මං ජීවත්ව සිටින තුරු, ඇය මා භාරයේ තබාගත යුතුයි. ළමයාට ලියුම් ලියන්නවත්, ඇය ආපසු භාර ගැනීමටවත් ඔහු කිසිසේත් බලාපොරොත්තු වෙන්නේ නැහැ කිව්වා. එංගලන්තයට තමන්ගේ තිබුණු සියලුම සම්බන්ධතාවයන් අත්හැරලා, තමන් කැනඩාවට යන බව ඔහු කිව්වා. දියණිය මට කැමැති ආකාරයකට හදා වඩාගන්න, නිදහස තියෙන බව ඔහු කිව්වා. ඒ කියන්නේ ඔහු ඇය මට භාරදීලා ඇත් සෝදාගත්තා. නමුත් ඒ වෙනුවෙන් ඔහු මට ගෙවූ මුදල ඉතා විශාලයි"

"දරුවාට කිසිම ආදරයක් නොතිබුණු, නොසැලකිලිමත් තාත්ත කෙනෙක්?"

"නොසැලකිලිමත්කම ම නෙමෙයි" පාකර් මෙනෙවිය කිව්වා. "ළමයාගේ මව මියගිහින්. ගැහැනු ළමයා හදාවඩාගන්න ඕන කොහොමද කියන එක ගැන, හිගින්ස් මහත්මයාට තේරුමක් තිබුණෙ නෑ. දියණිය බොළඳ සියුමැලි කෙනෙක් කියල සඳහන් කළේ ඇයි කියන එක ඔහු මට කිව්වා. කායික වශයෙන් ඇගේ කිසිම දුර්වලතාවයක් හෝ ආබාධයක් තිබුණෙ නෑ. නමුත් මාස කිහිපයකට කලින් ඇය, භයානක දුම්රිය අනතුරකට මුහුණ දුන්නලු. ඒකෙන් ඇය මස්තිෂ්කමය කම්පනයකට ලක්වෙලා තියෙනවා. ඒකෙන් ඇගේ මතකය සම්පූර්ණයෙන්ම මැකී ගිහින්. තමන්ගේ පියාවත් ඇයට අඳුනාගන්න බැහැලු. ඒ නිසාලු ඔහුට උවමනා වුණේ, දියණියට අලුත් රටක අලුත් ජීවිතයක් අරඹන්න ඉඩ සලසන්න.

අපි දෙවන වතාවට හමුවෙද්දී, හිගින්ස් මහත්මයා ඔහුගේ දියණියත් කැඳවාගෙන ආවා. ඇය දුටු වහාම මගේ හිත ඇය කෙරෙහි ඇදීගියා. ඇගේ අවිහිංසක බව දුටුවාම, ඕනම කෙනෙකුගේ හිතේ ඇය ගැන ආදරයක් ඇතිවීමේ පුදුමයක් නෑ. ඇවිත් මා එක්ක නවතින්න කැමතිද කියලා මං ඇයගෙන් ඇහුවා. මගේ අත මත ඇයගේ අත තබමින්, ඇය ඊට කැමැත්ත පළකළේ හරි සතුටෙන්, විශ්වාසයෙන්. හිගින්ස් මහත්මයා සමග ගිවිසුමට මං කැමති බව, මං ඔහුට එවෙලේම කිව්වා. ඔහු එදා යන්න ගියේ ඇයව මට භාරදීලා. ඊට පස්සේ කවදාවත් ජේන්ටවත් මටවත් ඔහු දකින්න ලැබුණේ නෑ. මං ඇයගේ නැන්දා ලෙස ජේන් මාව භාරගත්තා. ඇගේ අතීතයේ කිසිදෙයක් ඇයට මතක තිබුණේ නෑ. මං කියූ හැමදෙයක්ම ප්‍රශ්න කිරීමවලින් තොරව ඇය භාරගත්තා. සැබෑ ලෙස නැන්දා කෙනෙකු හා ලේලියක අතර බැඳීමකට වැඩි සෙනෙහයෙන් පිරුණු බැඳීමක්, අපි දෙන්නා අතර ඇතිවුණා."

"අමතක වුණු අතීතය කිසිම දවසක ඇයට යළි මතක්වුණේ නැද්ද?"

"කිසි දවසක නෑ."

"ඇය ආතර් හිගින්ස් මහතාගේ දියණිය යන කරුණ හැරෙන්න, ඇය ගැන වෙනත් කිසිම දෙයක් ඔබට දැනගන්න ලැබුණෙත් නෑ."

"අන්න හරි"

"ඔබ භාරගනිද්දී, ඇය තම අතීතය සම්පූර්ණයෙන්ම අමතක වුණු අවුරුදු පහක ගෑනු ළමයෙක්?"

"අවුරුදු දහහතක" පාකර් මෙනෙවිය කිව්වා.

"දහහතක? මොකක්ද ඒ කතාව?"

"ඒ කාරණය මට අමතක වුණානේ" ඇය කිව්වා. "ජේන්ටත් අනික් හැමදෙනාටමත් මං කිව්වේ, ඇය මට භාරවෙද්දී ඇගේ වයස පහයි කියල. අතීතය ඇයට අමතක වී තිබුණු නිසා ඒක ප්‍රශ්නයක් වුණේ නැහැ. කුඩා දරුවෙකු හැටියට ඇගේ ඡායාරූප මා ළඟ නොතිබුණේ ඇයි කියල දැන් ඔබට තේරෙනවා ඇති."

"ඔබට බොහොම ස්තුතියි පාකර් මෙනෙවිය" මං කිව්වේ ඇයගෙන් සමුගැනීමට සූදානම් වෙමින්. "ඔබ කියූ හැමදෙයක්ම මං රහසක් ලෙස ආරක්ෂා කරන්නම්. වැම්බරි මහත්මියට හිමි මුදල් ගැන අයිතිවාසිකම් කියන්න, ඇගේ සැමියා ඉදිරිපත්වෙව් කියල මම නම් හිතන්නෙ නෑ. දැන් මට සිදුවෙනවා ජේන් හිගින්ස් ඇගේ

ජීවිතයේ මුල් අවුරුදු දහහත ගතකළේ කොහේද, ඒ මොන වගේ ජීවිතයක්ද කියන එක හොයල බලන්න"

"මෙන්න මේ කාරණය මට ඒ කාලයේ ප්‍රහේලිකාවක් වුණා" පාකර් මෙනෙවිය කිව්වා. "දුම්රිය අනතුරක් ගැන හිගින්ස් මහත්මයා මට කියූ කථාව, මං හිතන්නේ බොරු. ඒ මොකද ජේන් කවදාවත් දුම්රියෙන් යන්න හෝ දුම්රිය එන්ජින්වලට කිසිම භයක් පෙන්නුවේ නෑ. අනික මං දුම්රිය අනතුරු ගැන විමසීමක් කර බැලුවා. ඔය කියන කාලයේ, ඔය කියන විධියේ භයානක දුම්රිය අනතුරක්, එංගලන්තයේ තබා අසල්වැසි රටකවත් සිදුවෙලා තිබුණෙ නෑ."

ඇයට ස්තුති කළ මම ආපහු ලන්ඩනයට ආවා. මං හොයාගත් දේවල් වැම්බරිට දැන්ම නොකියන්න මං තීරණය කළා. ඊළඟට මං ගියේ ආතර් හිගින්ස් ගනුදෙනු කළ බැංකුවට.

හිගින්ස් කැනඩාවට ගිය කතාව ඇත්ත. එහේ ගිහින් ඔහු යළිත් වරක් විවාහ වෙලා තියෙනවා. අවුරුදු පහකට පස්සේ ඔහු මියගිය බව, ඒ දෙවැනි බිරිඳ බැංකුවට දන්වා එව්වලු. ඔහුගේ ගිණුම වසා දමන මෙන් ඇය ඉල්ලා තිබුණලු. ඇයගේ ලිපිනයක් ඔවුන් ළඟ තිබුණේ නෑ. හිගින්ස්ගේ පළමු බිරිඳ මියගිය බවත්, දරුවා හදාවඩා ගැනීමට, ස්විට්සර්ලන්තයේ හැරියට් පාකර් නම් මෙනෙවියකට භාරදුන් බවත් බැංකුව දැන හිටියා.

ඇය මට කියූ තොරතුරු නිවැරදි බව දැන් මට තහවුරු වුණා. මීළඟට මට උවමනා වුණේ ආතර් හිගින්ස් හා ඔහුගේ එංගලන්තයේ පවුල ගැන තොරතුරු දැනගැනීමට. මගේ වාසනාවට එයින් ස්වල්පයක් බැංකුවේ ලිපි ලේඛනවල සඳහන්ව තිබුණා. ආතර් හිගින්ස් යනු වෘත්තියෙන් දේවගැතිතුමෙක්. ඔහු හැම්ෂයර් ප්‍රාන්තයේ රයිස්හැම් හි සියලු සාන්තුවරයන්ගේ දෙව්මැදුරේ දේවගැතිතුමා.

මං හැම්ෂයර් බලා පිටත්වී ගියේ හරිම සතුටෙන්. මේ ගැටලුව ටිකෙන් ටික හරි ලිහෙන්න පටන්ගත්තා. ඒක නිසා මගේ හිතේ ලොකු උද්‍යෝගයක් ඇතිවුණා. මේ හැම එකකටම මුල් වුණු දුෂ්ටයා හිගින්ස් දේවගැතිතුමා කියලයි මට හිතුණේ. අම්මත් නැති, මානසික ආබාධයකට ලක්වුණු තමන්ගේ එකම දුව, නාඳුනන කෙනෙකුට භාරදීලා කැනඩාවට යන එක, තාත්තා කෙනෙකුට ලේසියෙන් කරන්න පුළුවන් වැඩක්ද? මේක වෙලා දැන් අවුරුදු දහහතක් පමණ වෙනවා. නමුත් මේ පුද්ගලයින් ගැන මතක අය කිහිපදෙනෙක් හරි,

තවමත් ජීවතුන් අතර ඇති. මෙතැන මොකක් හෝ ලොකු පටළැවිල්ලක් වී ඇතිබව මට ඉවෙන් මෙන් දැනුණා.

එදා රාත්‍රි එහි තානායමේ නැවතුණු මම, රයිස්හැම්හි දේවස්ථාන හොයාගෙන ගියා. එහි තිබුණේ එංගලන්ත සභාවට අයත් එකම දෙව්මැඳුරක් පමණයි. එය භාරව සිටියේ තරුණ දේවගැතිතුමෙක්. අවුරුදු ගණනාවකට කලින් එහි සිටි හිගින්ස් දේවගැතිතුමා ගැන තරුණයා අසා තිබුණා.

"දෙව්මැඳුරේ සොහොන් බිමේ තියෙනවා හිගින්ස් මැතිණියගේ සොහොන" ඔහු කිව්වා. "දේවගැතිතුමා බොහොම කලබලයෙන් එංගලන්තය හැරදමා කැනඩාවට ගිය බව මටත් අහන්න ලැබුණා. ඒ ගැන විස්තර දැනගන්න හොඳම මිනිහා සිඩ්නි. ඔහු තමා දෙව්මැඳුරේ උද්‍යාන පාලකයා. පහුගිය අවුරුදු තිහක්ම ඒ රාජකාරිය කරල තියෙන්නේ ඔහු. යාර සීයක් වත්ත පහළට ගිහිං වමට හැරුණාම තිබෙන ගෙදර ඔහුගේ."

දේවගැතිතුමාට ස්තුති කරලා මං මුලින්ම ගියේ සොහොන් බිමට. හිගින්ස් මහත්මියගේ සොහොන හොයා ගැනීම මට එච්චර අමාරු වුණේ නෑ.

> "ආතර් හිගින්ස් දේවගැතිතුමාගේ සඳාදරණීය බිරිඳ
> මේරියන් ජේන් දෙව්මව් තුරුලේ සැතපුණු වගයි"

මං ඒ දිනයත් සටහන් කරගත්තා. එතකොට ජේන් මෙනෙවියගේ වයස අවුරුදු දොළහක් වෙන්න ඇති.

එදා හවස්වරුව ගමේ පොදු අවන්හලේ ගතකරන්න මං තීරණය කළා. කාලය ගෙවා ගන්න බැරි ගමේ වයස්ගත මිනිස්සු, බීර ටිකක් බොන්න අවන්හලකට - තැබෑරුමකට ඇදෙන්නේ බොහොම සතුටෙන්. නමුත් ඔවුන් මා දිහා බැලුවේ සැක සහිත මුහුණෙන්. ලෝභ නැතුව ඔවුනට මත්පැන්වලින් සංග්‍රහ කරලා සුහද සිනාවක් පෑවාම, අර දුරස්ථ බව නැතිවී ගියා.

"මේ මහත්තයව මීට කලින් අපට දකින්න ලැබිල නෑ. කොහේ ඉඳලද ආවෙ?"

"මං දෙව්මැඳුරුවල අලුත්වැඩියා කටයුතු කරන කෙනෙක්. මං ගිය සැරේ මේ ගමට එද්දී දෙව්මැඳුර භාරව හිටියේ ආතර් හිගින්ස් කියල දේවගැතිතුමෙක්. එයා නම් හරි නීතිකාරයා......"

මට කියන්න උවමනා වුණේ එපමණයි වොට්සන්. හිගින්ස් ගැන තමන්ගේ අදහස් නිදහසේ ප්‍රකාශ කරන්න, කවුරුවත් පසුබට වුණේ නැහැ. එතැනදි මට ඔහු ගැන දැනගන්න ලැබුණු තොරතුරු මං ඔබට කෙටියෙන් කියන්නම්.

දේවගැති කෙනෙකු හැටියට ඔහු ගැන ගමේ අයගෙ ගෞරවයක් තිබිල තියෙන බව ඇත්තයි. ඒ වුණත් ඔහුගේ අදහස් හා නීතිරීතිවල දැඩි බව නිසා, ඔහු ගමේ ජනප්‍රිය චරිතයක් වෙලා නැහැ. මනුස්සයෙකුට කරදරයක් වුණාම සැනසීමක් අපේක්ෂාවෙන් යන්න පුළුවන් කෙනෙක් නෙමෙයිලු, හිගින්ස් දේවගැතිතුමා. වැරැද්ද සිදුවුණු මිනිහාට අනුකම්පා කරල, ඔහු සැනසීමට කටයුතු කරනවා වෙනුවට, දේවගැතිතුමා කළේ බැණ වැදීම, තරවටු කිරීම ආදියලු. දුප්පත් සාමාන්‍ය මිනිසුන් සමග සුහදව ආශ්‍රය කිරීමට, ඔහු කැමැතිවෙලා නැහැ. ඔහුගේ පියා අසල්වැසි ප්‍රාන්තයක ඉඩම් හිමි ධනවතෙකුව ඉඳල තියෙනවා. එංගලන්ත සභාවෙන් දේවගැතිතුමා වෙත ලැබුණු දීමනාව ඔහුට ලොකු මුදලක් වෙලා නැහැ.

ඔහු සමීපව ආශ්‍රය කළේ ගමේ සිටි ධනවත් පවුල් තුන හතරක් විතරයිලු. ආගමික කටයුතුවලට ඔවුන්ගේ මන්දිරවලට යෑමට නම් හිගින්ස් දේවගැතිතුමාගේ අකමැත්තක් ප්‍රමාදයක් තිබිල නැහැ. අනික ඔහු බොහොම සැරපරුෂ කෙනෙකු ලෙස ප්‍රසිද්ධයිලු.

නමුත් ඔහුගේ බිරිඳ මේරියන් හිගින්ස් මැතිණිය, ඒකෙ අනිත් පැත්ත බවයි ගම්මු කිව්වෙ. ඇය දුගී දුප්පත් හැම කෙනෙකුටම කරුණාව දක්වපු ත්‍යාගශීලී තැනැත්තියක්ලු. තමන්ගේ සැමියාට නොදන්වා, ඇය දුගී දුප්පත් අයට මුදලින් උපකාර කළ වාර අනන්ත අප්‍රමාණලු. නමුත් අවාසනාවකට වගේ හිගින්ස් මහත්මියට, ඒ කාලයේ පිළිකා රෝගය වැලඳිලා තියෙනවා. ශල්‍යකර්මයකිනුත් පසු ඇය මියගිය වෙලාවෙ මුළු ගමම හඬා වැලපුණාලු. ඇයට හිටී එකම දියණියත් අම්මාගේම ගතිගුණ තිබූ කරුණාබර නිරහංකාර තැනැත්තියක්ලු.

අම්මාගේ හදිසි මරණය නිසා ඇය තදබල මානසික කම්පනයකට ලක්වුණාද කියල මං විමසුවා.

එවැනි දෙයක් ගැන කාටවත් මතකයක් තිබුණෙ නෑ. එහෙමත් නැත්නම් තමන් දැනහිටිදේ මට කියන්න ඔවුන් කැමති වුණේ නෑ. ඇය පාසලක නේවාසිකව ඉගෙන ගත් බවත්, ගෙදර ආවෙ පාසලේ නිවාඩු කාලයට පමණක් බවත්, ඇය බයිසිකලයක් පදිමින් ගමේ

සම වයසේ මිතුරියන් ආශ්‍රය කළ බවත්, සමහරුන්ට මතක තිබුණා. දේවගැතිතුමාගෙ ගෙදර කටයුතු ගැන හොයා බැලුවෙ උද්‍යාන පාලක සිඩ්නි සහ ඔහුගේ බිරිඳලු. ඒ තවමත් ඒ තනතුරේම වැඩ කරන වයස්ගත සිඩ්නි.

ඔහු මේ හැන්දෑවෙ අවන්හලට ඒවිද කියල මං ඇහුවා. මත්පැන් පානය නොකරන ඔහු, කොහොමටවත් එතැනට එන්නෙ නැතිලු. ඔහුගේ බිරිඳ මියගියාට පස්සෙ ඔහු ඉන්නෙ තමන්ගෙ විවාහක දියණිය සමගලු. මගේ බීර වීදුරුව අවසන් කරලා මං එතැනින් පිටවුණා.

තවමත් එච්චරම හවස්වෙලා තිබුණෙ නෑ. මං කෙළින්ම ගියේ සිඩ්නිගේ ගෙදරට. මට හැකිවුණා සිඩ්නි හමුවෙන්න. එතරම් ප්‍රමාද නොවී කතාබහ හිගින්ස් දේවගැතිතුමා යන මාතෘකාවට යොමුකරගන්න මට පුළුවන් වුණා. නමුත් මම බලාපොරොත්තු වුණු තරම් තොරතුරු සම්භාරයක් හෙළිකරගන්න මට හැකිවුණේ නෑ.

"හිගින්ස් දේවගැතිතුමා හරි ආඩම්බර කාරයෙක්. දෙව්මැඳුර වටේ උද්‍යානයේ මල්හිටුවා අලංකාර කරන්න, මං කොයිතරමක් මහන්සි වුණාද? නොයෙක් වර්ණවල රෝසමල් වර්ග හොයාගෙන ඇවිත් හිටවලා, මං උද්‍යානය හුඟක් ලස්සන කළා. දේවගැතිතුමා ඒක පැන්සයකට ගණන් ගත්තෙ නෑ. ඒ වුණත් අපි අතින් සුළු අඩුපාඩුවක් හරි වුණොත් එදාට ඉඳල ඉවරයි. රාක්ෂයෙක් වගේ කඩාගෙන පනිනවා. ඒකටත් එක්ක හිගින්ස් නෝනා. ඈය නම් සාත්තුවරියක්. ඈය අකාලයේ මැරුණෙ මේ පළාතෙ මිනිස්සුන්ගේ අවාසනාවට. ඒ වගේ කරුණාවන්ත නෝනා කෙනෙක් ගැන, මගේ ජීවිතේට අහන්න ලැබිල නෑ. ඈගේ දුවත් ඒ වගෙයි. කිසි ආඩම්බරයක් නැති දරුවා. මගේ මැරිච්ච බිරිඳ මාර්තා ඒ දරුවාට හරිම ආදරයෙන් හිටියේ."

"හිගින්ස් දේවගැතිතුමා හදිසියේම මෙහෙන් අස්වෙලා ගියේ ඇයි? බිරිඳගේ මරණයෙන් පස්සේ එයාට මෙහේ ලොකු පාළුවක් දැනෙන්න ඇති?"

"නෑ නෑ. ඒක නිසා නෙමෙයි. ඔහු මෙහෙන් ගියේ වෙනත් ප්‍රශ්නයක් නිසා. බෝඩිමක නැවතිලා ඉස්කෝලෙ ගිය ජේන් මෙනෙවියට මොකක්ද බරපතළ අසනීපයක් හැදුණා. මොකක්ද ඒකෙ නම..... රූමැටික උණද මොකද්ද. ඒ හින්දා ළමයාව ටික කාලයක් රෝහලක නවත්වලත් ඉඳල ඊළඟට කැනඩාවේ පදිංචියට ගියා."

සිඩ්නි මොනවා හරි කාරණයක් මට හැංගුවාදෝ කියල මගේ හිතේ සැකයක් ඇතිවුණා. ඔහු එහෙම කළේ ඇයි? සමහරවිට දේවගැතිතුමා වෙත තිබුණු ගෞරවය නිසා වෙන්න ඇති.

සිඩ්නි හමුවීමට එතැනට ආ ඔහුගේ මිත්‍ර අසල්වැසියෙකු නිසා, අපේ කතාබහට බාධා ඇතිවුණා. ඒ අමුත්තා ඒ තරම් ඉක්මනට එතැනින් යන පාටක් පෙනුණෙ නෑ. ඒ හින්දා මං තීරණය කළා ආපහු තානායමට ඇවිත් පහුවෙලා සිඩ්නි හමුවෙන්න යන්න.

පහුවදා උදේ මං යළිත් වරක් සිඩ්නි හම්බවෙන්න ඔහුගේ ගෙදරට ගියා. අවාසනාවකට වගේ ඔහු ගෙදර හිටියෙ නෑ. ඔහුගේ විවාහක දියණිය එළියට ආවෙ කුඩා දරුවෙකුත් අතේ තියාගෙන.

"තාත්තා බෙහෙත් අරගන්න නගරයේ රෝහලට ගියා" ඇය කිව්වා.

"මොකද ඔහු හදිසියේ අසනීප වුණාද?"

"නැහැ. තාත්තාට සතියකට වරක් ඇවිත් පෙන්වලා බෙහෙත් අලුත් කරගන්න කියලයි, වෛද්‍යවරු නියම කරලා තියෙන්නේ. දැන් අවුරුදු ගණනාවක ඉඳලා ඔහු කොන්දේ කැක්කුමට බෙහෙත් ගන්නවා. ඔහු ආපහු එන වෙලාවක් මට කියන්න අමාරුයි."

"මං ඊයේ ඔබේ තාත්තා එක්ක කතා කර කර හිටියේ හිගින්ස් දේවගැතිතුමා ගැන. දෙව්මැඳුරේ පිත්තාරු වැඩවලට ඒ කාලෙ මං මෙහේ ඇවිත් තියෙනවා. එතුමාට හිටියා ලස්සන සුරතල් දුවක්. ඇයට ඒ කාලේ අවුරුදු දාසයක් දාහතක් වෙන්න ඇති මගෙ හිතේ. ඇය ඔබේ යාළුවෙක්ද?"

"අපොයි ඔව්. ජේන් මෙනෙවිය මට වඩා අවුරුද්දක් විතර වැඩිමල්. ඇගේ තාත්තා වගේ නෙමෙයි. ඇය හරි කරුණාවන්තයි. ඇයට අයත් බයිසිකලය අපි දෙන්න පදින්නේ හවුලේ. සමහර වෙලාවට මාවත් වාඩිකරගෙන ඇය පදිනවා. අනික් වෙලාවට ඇය වාඩිකරගෙන බයිසිකලය පදින්නේ මම. අපි ගම පුරාම හැම තැනකම යනවා. හැන්දෑවට ගෙදර එන්නේ පාර පෙනෙන්නේ නැති තරමට ඇඳිරි වැටුණාම."

"එහෙමද? මට නම් අහන්න ලැබුණේ ඇය රූමටික උණ රෝගයට බරපතළ ලෙස ගොදුරු වුණා කියල. එහෙම කෙනෙකු කොහොමද ඒ තරමට බයිසිකල් පදින්නේ? ඔවුන් රට අත්හැර කැනඩාවට ගියෙත් ඒ රෝගී තත්ත්වය නිසාලු. ඒක මට කිව්වේ ඔබේ පියා."

මෙහෙම කියූ මම ඇගේ මුහුණ දිහා බලාගෙන හිටියා. උදෑසන හිරු එළිය කෙළින්ම ඇගේ මුහුණට වැටී තිබුණා. මං කියූ දෙයට චාලට්, එනම් සිඩ්නිගේ දියණියගේ මුහුණ රතුවුණා. ඊළඟට එය වෙනස්වුණු ආකාරය මට වචනයෙන් විස්තර කරන්න අමාරුයි. ඇගේ සිහියට නැඟුණු යම් දෙයක් නිසා, ඇය දෙනෙත් එක් තැනකට යොමු කරගෙන, යටි තොළ හපාගෙන කල්පනා කළේ අසිහියෙන් වගේ. මෙතැන මොකක් හරි රහසක් ඇතිබව මං තේරුම් ගත්තා. එය හෙළිකරගැනීමයි මට තිබූ අභියෝගය. මිනිත්තු පහක් පමණ ඒ ඉරියව්වෙන්ම ගල්ගැසී සිටි ඇය එක්වරම පිබිදුණා. ඒ හදිසියේ නින්දෙන් අවදිවුණු කෙනෙකු වගේ."

"මොකක්ද මහත්මයා ඔබ කිව්වේ?"

"ජේන් මෙනෙවියට සිදුවුණේ මොකක්ද කියලයි මං ඇහුවේ"

යළිත් වරක් ඇය නිශ්ශබ්ද වුණේ කිසිවක් කියාගැනීමට නොහැකිව.

"චාලට් මහත්මිය. මට ඇත්තම කියන්න" මං කිව්වා. "කවුරුත් හෙළි නොකරන රහසක් මෙතැන තිබෙන බව මං දන්නවා. ඒකෙ තැන් තැන් හෙළිවෙලයි තියෙන්නේ........"

"ඔබ මොකටද මේ තොරතුරු හොයන්නේ?" ඇය ඇහුවා. "ඔබ පත්තර වාර්තා කාරයෙක්ද?"

"එහෙම කියල හිතමු. නමුත් මං ඔබේ නම කාටවත් හෙළිකරන්නේ නෑ."

"අනේ ඔව්. මේක අපි කවුරුත් රහසක් හැටියට තබාගත් දෙයක්. මේකෙ කොටසක් ඔබ දැනටමත් දන්නවා නම්, ඉතිරි කොටස හංගාගෙන ඉඳීමෙන් පලක් නෑ. ඇය කැනඩාවේ පදිංචියට ගිහින් හුඟක් කල්. අපට ලියුමක්වත් එව්වේ නෑ. ඒක හින්දා මේක ඔබ දැනගත්තා කියල ඇති දෙයක් නැහැ. අනික මේක ගමේ වයසක අය කවුරුත් දන්නා දෙයක්"

"ඔබේ අවංක බව මං අගය කරනවා චාලට් මහත්මිය" මං කිව්වේ ඇය ධෛර්යමත් කරමින්. "කතන්දරය මුල ඉඳලම අහන්න මං කැමතියි."

"මහත්මයා ඔබ අහල ඇති. මේ හැම්ෂයර් පළාත හොප්ස්* වැවීම ගැන ප්‍රසිද්ධ පළාතක්. හොප් නෙළන්නෙ ගිම්හාන සෘතුවේදිනේ. ඒ කටයුත්ත ලාබෙටත් ඉක්මනටත් කරගන්න, ඉඩම් හිමියො සෙනග

* බීර නම් මත්පැන් වර්ගය සෑදීමට යොදා ගන්නා බීර මල්.

ගේන්නෙ පිට පළාත්වලින්. එහෙම එන සමහරු ලන්ඩනයෙන් එන රස්තියාදුකාරයින්. සමහරු මේ රටේම පදිංචි වෙලා ඉන්න දුප්පත් අයිරිෂ් – අයර්ලන්ත සංක්‍රමණිකයන්. හරිහැටි ඉංග්‍රීසි කතාකරන්නත් බැරි ඔවුන් ඇවිත් නවතින්නෙ, පාළු පිට්ටනිවල කූඩාරම් ගහගෙන. අයිරිෂ් අය නම් මහන්සිවෙලා වැඩ කරන ඒත් නුගත් මිනිස්සු. අවුරුද්ද පුරා නිදා වැටෙන මේ ගම්මාන, නින්දෙන් පිබිදෙන්නෙ ඔය කාලයට. දවල් වෙලාවට හොප් කඩමින් මහන්සි වෙන ඔය මිනිස්සු, හැන්දෑවට පටන්ගන්නවා මත්පැන් බොමින් සංගීත සාද පවත්වන්න."

"මං හිතන්නෙ නෑ වැදගත් පවුල්වල දෙමව්පියන්, ගෑනු ළමයින්ට ඒ පැත්තට යන්න ඉඩ දුන්නා කියල?"

"ඔව්. ඔබ හරි. ඒ මිනිස්සු ඉන්න පැත්තට දවල් කාලයෙදි යෑම පවා අපට තහනම් කර තිබුණා. නමුත් බයිසිකල්වල නැගිලා අපි හොරෙන්ම ඒ පැත්තට ගියා. ගමේ තරුණ තරුණියන් එක්ක හාදකම් පවත්වන්න, ඒ මිනිස්සුන්ටත් ලොකු උනන්දුවක් තිබුණා."

"එතකොට ඔබේ වයස කීයද?"

"ඒ කාලෙ මං හිතන්නෙ මට අවුරුදු පහළොවයි. ඒ කියන්නෙ ජේන් මෙනෙවියට දහසයයි. ඔය කාලෙ ගිම්හාන නිවාඩුවට ඇය ගෙදර ඇවිල්ලයි හිටියෙ. හිගින්ස් මහත්මියගේ මරණයෙන් පස්සේ ජේන් හිටියෙ හිතේ පාළුවෙන්. දේවගැතිතුමා තමන්ගේ දියණියට ආදරයක් කරුණාවක් පෙන්වපු කෙනෙක් නෙමෙයි. දෙව්මැඳුරේ වැඩවලට අමතරව ඔහුට හරියට ගමන්බිමන් තිබුණා. ඒ ඔහුගේ ව්‍යාපාරික කටයුතුවලට.

ඔය අතරෙදි තමා ජේන්ගේ ප්‍රේම සම්බන්ධයක් ඇතිවුණේ. හොප් කඩන්න ඇවිත් හිටි අයිරිෂ් තරුණයෙකුට හැකිවුණා ජේන්ගේ ආදරය දිනාගන්න. ඔහුගේ නම ෂෝන් ඕ කොනර්. නත්තල් කාලයට රඟදක්වන නාට්‍යවල රඟපාන නළුවෙක් වගේ, ඔහු බොහොම කඩවසම්. නිල්පාට ඇස් තිබුණු ඔහු අඩි හයක් පමණ උසයි. කොණ්ඩය රතුම රතු පාටයි. ඔහුට තිබුණේ මියුරු කටහඬක්. හැන්දෑවට ඔවුන්ගේ කඳවුරේ ගීත ගායනා පැවැත්වුණා. ෂෝන් ගැයූ ගීතවලට ජේන් වශීවුණා කිව්වොත් නිවැරදියි. ඇයත් එක්ක මේවට යන්න මගේ තිබුණේ අප්‍රමාණ හයක්. ඒ මොකද මං දන්නවා දේවගැතිතුමාගෙ ස්වභාවය. ඔහුට අයිරිෂ් ජාතිකයන්ව පෙන්වන්න බෑ. සමහරවිට ඒ ඔවුන්ගේ ආගම වෙනස් නිසා වෙන්න ඇති.

හොප් කැඩීම අවසන් කරලා, ඔවුන් අපේ ගමෙන් පිටවී යන දවසත් ළංවුණා. මේ වෙනකොට ෂෝන් වගේම ජේනුත් ආදරයෙන් පිස්සු වැටිලයි හිටියේ.

ජේන් මා එක්ක නිතරම කිව්වේ "චාලට්. මට ෂෝන් නොදැක එකම එක දවසක්වත් ඉන්න බැහැ" කියලයි. ඔය සම්බන්ධය අත්හරින්න කියා මං ඇයට ආයාචනා කළා. නමුත් ඒකෙන් වැඩක් වුණේ නැහැ. මං ඒ විධියට ආයාචනා කළේ, මේ සම්බන්ධය සාමදානයෙන් කෙළවර වන එකක් නොවෙන බව මට පෙනුණු නිසා. ජේන් කියන්නේ ගමේ ක්‍රිස්තියානි දෙව්මැදුරේ දේවගැතිතුමාගේ එකම දුව. ඇය තවම පාසල් යන අවුරුදු දාසයක දැරියක්. ඇගේ පෙම්වතා ෂෝන්........? ඔහු කිසිම ස්ථිර රැකියාවක් නැති අවුරුදු විස්සක පමණ දුප්පත් තරුණයෙක්. ඔවුන් රෝමානු කතෝලික ආගමේ අය නිසා, එතැනත් ප්‍රශ්නයක් ඇතිවේදෝ කියල මට හිතුණා. ඔවුනුත් මේ හැමදෙයක්ම තේරුම් අරගෙන ඉන්න ඇති. තමන්ට ඇතිවෙන ප්‍රශ්න ගැන කතාකරන්න ඇති. නමුත් හොප් කඩන්නන් ගමෙන් පිටවී යාමට නියමිත දවසට කලින් දා ඔවුන් ඒ ප්‍රශ්නය විසඳා ගත්තා!"

"ඒ කොහොමද?"

"කලින් දා රාත්‍රියේ කිසිකෙනෙකුට නොකියා ඔවුන් හොරෙන් පැන ගිහින්! ඇය මටවත් මේ ගැන කියල තිබුණෙ නෑ"

"දෙයියෝ සාක්කි! ඉතින්?"

"ඔබට අමුතුවෙන් කියන්න ඕනද? හිගින්ස් දේවගැතිතුමා යක්ෂාවේශ වුණා."

"ඔහු කොහොමද ඒ බව හරියටම දැනගත්තෙ?"

"ඇය තාත්තාට ලියුමක් ලියා තිබුණා යන්න කලින්. ඒකෙ ලියා තිබුණු විස්තර සියල්ල මට දැන් මතක නෑ. තමන් ෂෝන් සමග අයර්ලන්තය බලා යන බවත්, එහිදී ඔහු සමග විවාහ වෙන බවත්, ඒ නිසා තමන් සොයා කරදර නොවෙන ලෙසටත් ඇය ලියා තිබුණා. ඒ කරුණ තමා මට මතක."

"මේ සිදුවීමෙත් මුළු ගමම කැලඹී යන්න ඇති?"

"කැලඹුණාද කියන්නේ! මේ සිදුවීමට කලින් ඔහුගේ දේශනාවල එක් ප්‍රධාන මාතෘකාවක් වුණේ, තරුණ තරුණියන් අතර තිබිය යුතු විනය; ඊළඟට විවාහයකදී හැමවිටම එංගලන්ත සභාවේ ආගම

අදහන කෙනෙකු සමගම විවාහ විය යුතු බව. ඔහු එහෙම කියද්දී ඔහුගේ එකම දරුවා මේ නීතිරීති කඩා බිඳ දැම්මාම? ඔහු සිහිවිකල් නොවී බේරුණු එකම ඇති. ගම්මු කිව්වේ එහෙමයි."

"හිගින්ස් දේවගැතිතුමා මෙහෙන් අස්වෙලා ගියාද?"

"එකපාරටම අස්වෙලා ගියේ නෑ. දෙව්මැඳුරේ කටයුතු කරගෙන යාමට, ලන්ඩන් නුවරින් අලුත් දේවගැතිතුමෙකු ගෙන්වා ගත්තා. හිගින්ස් දේවගැතිතුමා ඊළඟට කළේ මොකක්ද දන්නවාද? ඔහු තමන් රැස්කර තිබූ ධනයත්, මුළු කාලයත් කැපකළේ, තමන්ගේ දුව සෙවීමට. ඔහු ඒ සඳහා මුදල් ගෙවා රහස් පරීක්ෂකයන් පවා යෙදෙව්වා කියලයි ආරංචිය ගියේ. ඒවල ඇත්ත-බොරු මං දන්නේ නෑ. කොහොම නමුත් ජේන් ගැන ආරංචියක් ලැබෙන කොට අවුරුද්දකට කිට්ටු කාලයක් ගතවෙලා. ඇය මවක් වෙන්නත් ළඟයි. ජේන් සහ ඇගේ සැමියා හැංගිලා ඉඳල තියෙන්නේ නොරිච්වල. ෂෝන්ට එහි ප්‍රධාන රෝහලක රැකියාවක් ලැබිල තියෙනවා, පිරිසිදු කරන්නෙකු ලෙස. ජේන් ඇගේ දරු ප්‍රසූතිය සඳහා එම රෝහලටම ඇතුළුවී තියෙන්නේ ඕ කෝනර් මහත්මිය ලෙස.

යක්ෂාවේශ වෙලා වගේ තමන්ගේ දුව හෙවූ හිගින්ස් දේවගැතිතුමා තවත් පමාවුණේ නෑ. ඔහු නීතිඥයින් මාර්ගයෙන් මොනවා හරි පියවර ගත්තා කියලයි ගමට ආරංචි වුණේ. සමහරු කිව්වා ඇය බාලවයස්කාරියක් නිසා, ඒ විවාහය කටුගාවන්න ඔහුට හැකිවුණා කියල. සමහරු කියනවා ඕ කොනර් මහත්මිය කියල පෙනී හිටියට, ඇය නීත්‍යානුකූලව විවාහ වෙලා නැහැ කියල."

"ඇය හමුවුණේ නොරිච්හි මොන රෝහලේදීද කියල ඔබට දැනගන්න ලැබුණද?"

"නැහැ මහත්මයා"

"ඊළඟට මොකද වුණේ?"

"ජේන් මෙනෙවිය ආපහු මේ ගමට නම් ආවේ නැහැ. හිගින්ස් දේවගැතිතුමා තමන්ගේ දේපළ, කඩිමුඩියේ විකුණාදැම්මෙ මේ දවස්වල තමයි. ඒ ඔහු කැනඩාවේ පදිංචියට යාමට සූදානමින් බවත් දැනගන්න ලැබුණා. එතැනින් එහාට සිදුවුණේ මොකක්ද කියන්න ගමේ කවුරුවත් දන්නේ නැහැ."

"වාලට් මහත්මිය. මං ගමේ වැඩිහිටියන් හත්අට දෙනෙකු සමග කථාකළා. නමුත් ඔවුන් මෙය යන්තමින් වත් කීවෙ නෑ."

"ඒකෙ පුදුමයක් නෑ. ඔවුනට උවමනා මෙය ගමේ තරුණ පරපුරට සඟවන්න."

ඉතින් වොට්සන්. වාලට් මහත්මියගෙන් මට හෙළිකරගන්න හැකිවුණු තොරතුරු එපමණයි. ඇයට ස්තුති කර මං ආපහු ලන්ඩනයට ආවා. ඊළඟ දවසේ මං ගියා නොරිච් වෙත.

දරුවෙකුගේ උපත සම්බන්ධ සියලුම ලිපිලේඛන, රෝහල්වල සුරක්ෂිතව ආරක්ෂා කෙරෙනවා. නමුත් ප්‍රශ්නය වුණේ ගතවී තිබුණු කාලය අවුරුදු පහළොවක් දහසයක් වීම. ඊළඟට ඒ කුමන රෝහලේද කියා හරිහැටි මං දැන නොසිටීම. කොහොම වුණත් දවස් හතරක් පහක් මහන්සිවෙලා මං ඒ රෝහලත් දරුවා ගැන තොරතුරුත් සොයා ගත්තා."

"ඇත්තට?"

"දරුවාගේ පියාගේ නම ෂෝන් ඕ කොනර්; මව ජේන් ඕ කොනර්. ළමයාට දී තිබුණු නම ජැක් ඩැනියෙල්. ඔවුන් පිළිබඳ තවත් විස්තර තිබුණා. නමුත් මගේ අවධානය යොමුවුණේ එයට අමුණා තිබූ තවත් කඩදාසියකට. දරුවාගේ මව සමග සිටි භාරකරුගේ ඉල්ලීම පිට, ඔවුන් දරුවා නොරිච්හි වේල්ස්කුමාර ළමා නිවාසයට යොමු කොට තිබුණා. ඒ දරුවා අනාථ දරුවෙකු ලෙස හදාවඩා ගන්න.

ඊළඟට මං ගියේ ඒ ළමා නිවාසයට. එය අනාථ දරුවන් හදාවඩා ගැනීමට වෙන්වුණු, එංගලන්ත සභාව මගින් පවත්වාගෙන ගිය ළමා නිවාසයක්. ආතර් හිගින්ස් දේවගැතිතුමාට අපහසුවෙන්න නැහැ, අර කුඩා දරුවාව ඒ ළමා නිවාසයට භාරදෙන්න. ජැක් ඩැනියෙල් දරුවා සම්බන්ධ ලිපිගොනුව ඔවුන් විවෘත කොට මට පෙන්නුවා. ඒ මම හදිසි මරණයක් ගැන කාරණා හොයන රහස් පරීක්ෂකයෙකු බව ඒත්තු ගැන්වූ පසු. ජැක් ඩැනියෙල් ගේ ඡායාරූප පවා මට දැකගන්න ලැබුණා. ඔහුගේ කුඩා කාලයේ තොරතුරු තිබුණේ, ඉගෙනීමට හෝ ක්‍රීඩාවලට දක්ෂකම නොපෙන්වූ දරුවෙකු ලෙස.

මෙම ආයතනයේ ළමයින් තබාගන්නේ වයස අවුරුදු නවය සම්පූර්ණ වනතුරු පමණයි. ඉන්පසු ඔවුන්, මේ ළමා නිවාසයට අනුබද්ධ පිරිමි හෝ ගැහැනු පාසල්වලට යවනවාලු. ජැක් ඩැනියෙල් යවනු ලැබූ පිරිමි පාසල තිබුණේත්, ළමා නිවාසයට තරමක් සමීපව. ඔහුගේ සම්පූර්ණ තොරතුරු අඩංගු පාසල් ලිපිගොනුවත් මට දකින්න ලැබුණා. ඔහු පාසල හැර ගිහින් තිබුණේ වයස අවුරුදු දහසයේදී. ඒ කියන්නේ ජේන් වැම්බරි මහත්මිය මේ අවාසනාවන්ත සිද්ධියට

මුහුණදීමට මාස පහකට හයකට කලින්. ක්‍රීඩාවලට යම් තරමක දක්ෂතා පෙන්වා තිබුණත් විභාගවලදී දිගින් දිගටම අසමත්වීම් නිසා ඔහුට පාසල හැරයන්න සිදුවී තිබුණා.

ඉතින් වොට්සන්, මං දැන් ළංවෙමින් සිටින්නේ, දිගු කතන්දරයක අවසානයටයි. ජේන් වැම්බරි මහත්මිය උද්‍යාන බංකු ඇණවුම් කළ සමාගමට මං ඊළඟට ගියා.

එම්පයර් ගෘහ භාණ්ඩ නිෂ්පාදන සමාගම වෙනුවෙන් තරුණයා නිකුත් කළ රිසිට් පත මා ළඟ තිබුණා. මං ඒ සමාගමේ නිලධරයන්ට මං පැමිණි කාරණය කිව්වා. ඒ ඔවුන්ගෙන් උද්‍යාන බංකු ඇණවුම් කළ වැම්බරි මහත්මිය, හදිසි මරණයකට ගොදුරු වී ඇති බව; ඒ නිසා ඒ ඇණවුම ලබාගත් තරුණයාගෙන් ප්‍රශ්න කිරීමට මට අවශ්‍ය බව. මගේ වාසනාවකට වගේ ඒ වෙලාවේ ඔහු රාජකාරි සඳහා එළියට ගිහින් හිටියේ නෑ.

අමුත්තන්ගේ කාමරයේ මං ඔහු එනතුරු මිනිත්තු පහක් බලාගෙන ඉන්න ඇති. මීළඟට ජැක් ඩැනියෙල් මා ඉදිරියට ආවා. ඔහු උසින් අඩි හයක් පමණ වූ කෙට්ටු තරුණයෙක්. සෘජු නාසයක් හා නිල්වන් දෙනෙත් තිබූ ඔහුට තිබුණේ, හොඳ කඩවසම් පෙනුමක්. නමුත් අනික් හැමදේකටම වඩා කැපී පෙනුණේ, ඔහුගේ කොණ්ඩය. එය රතුම රතු පාටයි. එය හිසේ සිට ඉහළට විහිදී තිබුණේ ඉත්තෑවෙකුගේ කුරු විහිදූ ආකාරයට.

"මොනවද මහත්මයා ඔබට මගෙන් දැනගන්න උවමනා?" ඔහු මගෙන් විමසුවේ මා ඉදිරිපිට තිබූ අසුනේ හිඳ ගනිමින්.

"ඩැනියෙල්. ඔබට දැනගන්න ලැබෙන්න ඇති, ඔබගෙන් උද්‍යාන බංකු දෙකක් ඇණවුම් කළ වැම්බරි මහත්මිය, හදිසි අනතුරකින් මියගිය බව?"

"ඔව් මහත්මයා. පුවත්පතක ඒ පුවත පළවී තිබෙනු මෙහේ මිත්‍රයෙකු මට පෙන්නුවා."

"හොඳයි. මට ඒ අවස්ථාව ගැන කරුණු කිහිපයක් ඔබෙන් අසා දැනගන්න උවමනායි. ඔබ මේ විදියට ගෙවල්වලට ගිහින්, මීට කලින් අලෙවි ප්‍රවර්ධන කටයුතු කරල ඇති. මේ කාන්තාවගේ හැසිරීමේ අමුත්තක්, වෙනස්කමක් ඔබට දකින්න ලැබුණද?"

"කාන්තාවගේ හැසිරීමෙද?" විමසූ ඩැනියෙල් තරුණයා කල්පනා කරන්න පටන්ගත්තා. මිනිත්තු තුනහතරක් නළල රැළි කරගෙන කල්පනා කළ ඔහු මෙහෙම කිව්වා.

"ඔබ එය විමසූ නිසා දැන් මට එය මතක්වුණා. මාව දකින්න ලැබුණු වහාම ඇය තිගැස්සුණා කියලයි මට ඒ වෙලාවෙ හිතුණේ. ඊළඟට ඇය මිනිත්තු කිහිපයක් නිශ්ශබ්දව, සිනාමුසු මුහුණෙන් මා දිහා බලාගෙන හිටියේ, අඳුනන කෙනෙකු දුටුවා වගේ. නමුත් මම නම් මීට කලින් කවදාවත් ඇය දැක නැහැ.

අප ආයතනය නිෂ්පාදනය කරන උද්‍යාන බංකු ගැන, මං ඇයට විස්තරයක් කළා. මං කියූ දේ ඇය මොළයට ගත්තද නැද්ද මං දන්නෙ නෑ. මට හිතුණේ ඇය සිටියේ වෙනත් දෙයක් ගැන කල්පනා කරමින් වෙනත් ලෝකයක කියලයි. අන්තිමට ඇය මුදල් ගෙවූ පසු රිසිට්පතක් ලියාදී මං පිටවී ආවා."

"ඇය මොනවා හරි දෙයක් ඔබෙන් විමසුවද?"

"ඔව්. ඇය මගේ නම සහ වයස ඇහුවා. මං මගේ නම සහ වයස කිව්වා. ඒ වෙලාවේ ඇගේ සිහිය තිබුණේ, වෙනත් අරමුණක කියලයි මට හිතුණේ."

ඔහුගෙන් ඇසීමට වෙනත් ප්‍රශ්න මට තිබුණේ නැහැ වොට්සන්. ඉතාමත් සංකීර්ණ ජිග්සෝ ප්‍රහේලිකාවක, අවසන් කැබැල්ලත් නිසි තැනට වැටී චිත්‍රය සම්පූර්ණ වුණා."

"හරිම අවාසනාවන්ත සිදුවීමක්" මම කීවෙමි.

"ඇයට තමන්ගේ අතීතය සම්පූර්ණයෙන්ම අමතකවී යෑම, ඔබ කොහොමද වොට්සන් පැහැදිලි කරන්නෙ? ඒක සැබැවින්ම වුණු සිදුවීමක්ද?" හෝම්ස් විමසීය.

"ඇත්තෙන්ම ඔව්. තම ආදරවන්තයාගෙන් සහ දරුවාගෙන් නොහිතූ ආකාරයට වෙන්වීමට ඇයට සිදුවුණා. ඒක ඇගේ මොළයට බලපෑවේ, දරුණු කම්පනයක් ලෙස. ඉතින් අතීතය අමතක වී ගිය එකේ පුදුමයක් නෑ. යළිත් දරුවෙකු ලැබීමට ළංවෙද්දී ඇගේ මනස අසාමාන්‍ය ලෙස සංවේදී තත්ත්වයට පත්වෙන්න ඇති."

"මට සැහෙන විශ්වාසයක් තියෙනවා, ජේන් හිගින්ස් විවාහ වුණු ෂෝන් ඕ කොනර් තරුණයාට තිබෙන්න ඇත්තෙත්, ඔහුගේ පුත්‍රයා – ජැක් ඩැනියෙල්ගේ පෙනුම. සිත ඉතා සංවේදීව තිබුණු මොහොතක මේ තරුණයා නිවසට පැමිණීමෙන් මොකක්ද වුණේ? අම්බිරි මතකයන් වසා දමා තිබුණු කඩතුරාව පුපුරා ගියේ, හෙණයක් පුපුරන විලසින්. පැරණි සිදුවීම ඇගේ මතකයට කඩා හැළෙන්න ඇත්තේ මහා දිය ඇල්ලක් විලසින්. ඒක ඇයට දරාගන්න බැරිවුණා."

"හෝම්ස් ඔබ කියූ දේ තමා සිදුවෙන්න ඇත්තෙ. ඒ ගැන සැකයක් නෑ. ඉතින් ඔබ අර චාල්ස් වැම්බරිට මොනවද අන්තිමට කිව්වෙ? ඔබ සොයාගත් කරුණු එකින් එක ඔහුට හෙළි කරලා, ඔහුගේ බිරිඳ සියදිවි නසාගත් හේතුව ඔහුට තේරුම් කරදෙන්න ඇති?"

"මගේ හිතවත් වොට්සන්. ඔබ හිතන්නෙ මං එහෙම කළා කියලද?"

"ඔව්. ඇයි ඔබ වෙන මොනවා කියන්නද?"

මං කලින් වෙලාවක් වෙන්කරගෙන, චාල්ස් වැම්බරි හමුවෙන්න ඔහුගේ නිවසට ගියා.

"හෝම්ස් මහත්මයා. මොකක්ද ඔබේ අවසන් නිගමනය? ඔබට හැකිවුණාද මේ සංකීර්ණ ගැටලුව විසඳන්න?"

"ඒක පෙර පරිදි ම යි වැම්බරි මහත්මයා"

"මොනවා? ඔබ කියන්නෙ අප ආයෙමත් ආවෙ, පටන්ගත්තු තැනටම කියලද? මගේ බිරිඳ මේ ආකාරයට වෙඩි තබාගෙන දිවිනසා ගැනීමට හේතුවක් හොයාගන්න, ඔබට හැකිවුණේ නැද්ද?"

"වෙනත් කිසිම හේතුවක් නෑ වැම්බරි මහත්මයා. වෛද්‍යවරයාගේ නිගමනය හරියට හරි. ඒක ඇගේ මොළයේ අභ්‍යන්තරයේ සිදුවූ ක්ෂණික විපර්යාසයක්. මට පුළුවනි ඒ ගැන සහතික වෙන්න.

දිවි තොර කරගන්න ඕන කියල සිතිවිල්ලක් ඇගේ මොළයට එන්න ඇත්තෙ එක් නිමේෂයකදී. ඒ මොහොතෙම ඇය ක්‍රියාත්මක වුණා. ඇය ජීවිතයේ කිසි දිනෙක, කිසිදු අසම්මත වැරැදි දේකට පටළැවුණෙ නැති, පාරිශුද්ධ ජීවිතයක් ගෙවූ තැනැත්තියක්. ඔබත් ඇගේ නෑන්දාත් සමීප අයත් දන්නා අයුරින්, ඇය හැමදාමත් සතුටෙන් හා තෘප්තියෙන් ජීවිතය ගතකළ කෙනෙක්. මෙහෙම දෙයක් කරගැනීමට ඇයට මොනම ආකාරයකවත් හේතුවක් නෑ. ඇය කිසිම වරදක් කවදාවත් නොකළ තැනැත්තියක්."

"දෙවියන්ට ස්තුතිවේවා! දෙවියන්ට ස්තුතිවේවා" චාල්ස් වැම්බරි මහත්මයා කිව්වේ දිග සැනසුම් සුසුමක් හෙළමින්."

# රුසියානු කුමරිය පිළිබඳ ගැටලුව

"මගේ ට්‍රන්ක පෙට්ටිය එළියට ඇද්ද නිසා දැන් ඉතින් මේ ගැටලුව ගැනත් ඔබට කියන්නම් වොට්සන්" හෝම්ස් කීවේ ට්‍රන්ක පෙට්ටිය තුළින්, කඩදාසිවලින් පිරී තිබූ ලොකු කවරයක් ඉවතට ගනිමිනි. "එහෙමත් නැත්නම් මං ඒ කතන්දරේ පස්සෙ දවසක ඔබට කියන්නද?"

"එපා! එපා!! මං කැමතියි ඒ කතන්දරයත් අදම කියනවා නම්. ඒ මොකද පරණ කතා දිගහරින්න තරම් විවේකයක් ඔබට ආයෙ කවදා ලැබේවිද කියන්න බැහැනෙ."

"හොඳයි කමක් නෑ." හෝම්ස් කීය. "වයින් වෙළෙන්දා වැම්බරිගෙ සිද්ධිය වගේ මේකත්, මට ඔබ හමුවෙන්න පෙර 1878-79 පමණ මා යෙදුණු පරීක්ෂණයක්. මුල් කාලයේ මට ලැබුණු පරීක්ෂණ බොහොමයක් වගේ මේකත් මට ලැබුණේ, විශ්ව විද්‍යාලයේදී මට හඳුනාගන්න ලැබුණු මිත්‍රයෙකු මගින්. ග්ලෝරියා ස්කොට් පරීක්ෂණය මට ලබාදුන්නු වික්ටර් ට්‍රෙවෝ වගේ, මේ මිත්‍රයාත් මං සමීපව ආශ්‍රය කළ කෙනෙකු නොවෙයි. ඔහු රුසියානු ජාතිකයෙක්. ඔහුගේ නම ඉවාන් චෙරිකොෆ්. ඔහු කඩු සරඹ හා බොක්සිංවලට දක්ෂයෙක්. ඒ වගේම ජිම්නාස්ටික් ක්‍රීඩාවටත් ඇඩි කැමැත්තක් දැක්වූ කෙනෙක්. රහස් පරීක්ෂණ ක්ෂේත්‍රයට මං දැක්වූ උනන්දුව ගැන ඔහුටත් අහන්න ලැබෙන්න ඇති. ක්‍රීඩාගාරයෙදි ක්‍රීඩාවල යෙදිලා විවේක ගන්න වෙලාවට, සුහද කතාබහක යෙදෙන්න අපි අමතක කළේ නෑ.

ඉවාන් චෙරිකොෆ් කියන්නේ, ඒ කාලයේ එංගලන්තයේ පදිංචියට ඇවිත් සිටි, කවුන්ට් ව්ලැදිමීර් චෙරිකොෆ් නම් රුසියානු ආදිපාදවරයාගේ එකම පුත්‍රයා. සැන් පීටර්ස්බර්ග් ප්‍රදේශයේ ධාන්‍ය වගා කළ ඉඩම් හිමියෙකු වුණු මේ ආදිපාදවරයා, එක්දහස් අටසිය හැත්තෑ ගණන්වල මුල, රුසියාව හැරදමා එංගලන්තයේ පදිංචියට ආවාලු. ධනපති රදළ පංතියේ අයෙකු වුණත් ඔහු තමන්ගේ ගොවීන්ට, කම්කරුවන්ට හොඳ වැටුප් ගෙවමින් ඔවුන්ගේ හොඳ

හිත ආදරය දිනාගත් අයෙක්ලු. මේක ඉඩම් හිමි අනෙක් රදළයන්ට විශාල ප්‍රශ්නයක් වෙලා තියෙනවා. ඔවුන් වෙරිකොෆ්ට විරුද්ධව රුසියානු අධිරාජ්‍යයාට පැමිණිලි කළාලු. සාර් පෙළපතේ II වැනි ඇලෙක්සැන්ඩර් රජු තමා ඒ කාලයේ රුසියාව පාලනය කළේ. මේ යුගයේදී ගොවියන්ට කම්කරුවන්ට එරෙහිව රජුගේ හමුදා ප්‍රහාර එල්ල කළේ අනුකම්පා විරහිතව. කැරලි කෝලාහල, උද්ඝෝෂණ ත්‍රස්තවාදී තර්ජන, ඔහු මැඩපැවැත්තුවේ, වෙඩි උණ්ඩයේ බලයෙන්. මහා විප්ලවයක්, සන්නද්ධ අරගලයක් ළඟ එන සලකුණු තිබුණා. ඒ නිසා සාර් රජතුමා සිටියේ අප්‍රමාණ භයෙන්. වහාම රුසියාවෙන් පිටවෙලා යන ලෙස ඔහු කවුන්ට් වෙරිකොෆ්ට නියෝග කළා. තමන්ගෙ ඉඩකඩම් හැකිතරමක් විකුණා දමලා, තමන්ගේ බිරිඳ හා දූදරුවන් සමග කවුන්ට් වෙරිකොෆ් එංගලන්තයට සංක්‍රමණය වුණා. කලබලවලට කලින් තමන්ගේ ජීවිතය බේරාගෙන එංගලන්තය වැනි සාමකාමී රටකට එන්න ලැබීම ගැන, ඔහු අප්‍රමාණ සන්තෝෂයකට පත්වෙන්න ඇති. ඔහු තමන්ගේ එකම පුතා වන ඉවාන් විශ්වවිද්‍යාලයට ඇතුළු කරලා හොඳ අධ්‍යාපනයක් ලබාදුන්නා.

විශ්වවිද්‍යාල කාලය අවසන් කළාට පසු එක් දිනක්, ඉවාන් වෙරිකොෆ් මා හමුවෙන්න මොන්ටේගු වීදියේ මගේ නවාතැනට ආවා. සුපුරුදු ආශිංසන, ආ ගිය කථාවලට පසු ඔහු කෙළින්ම කාරණයට පිවිසුණා. තමන් සහ තමන්ගේ පියාණන් වෙනුවෙන් එක්තරා අභිරහසක් විසඳීමේ කටයුත්තක යෙදෙන්න පුළුවන්ද කියා ඔහු මගෙන් විමසුවා.

"වෙරිකොෆ්" මං කියුවා "ඔබට කියුවාට කමක් නෑ. මං තවමත් මේ රහස් පරීක්ෂණ ක්ෂේත්‍රයට ආධුනිකයෙක්. මං විසඳා දී ඇති ගැටලු ගණන අත් දෙකේ ඇඟිලි ගණනටත් අඩුයි."

"ඒකට කමක් නැහැ හෝම්ස්" ඔහු කිව්වා. "මං මේ කටයුත්ත ඔබට භාරදෙන්නේ, ඔබ ගැන තියෙන විශ්වාසය නිසා. මේක විසඳා දීමට හැකි එකම පුද්ගලයා, ඔබ පමණක් කියා මට විශ්වාසයි. ඒක නිසා කරුණාකර මේක භාරගන්න." ඔහු ආයාචනා කළා.

"හොඳයි. මොකක්ද ඔබේ ගැටලුව?"

"ඔබ දන්නවා අපි රුසියාව අත්හැර දමා එංගලන්තයේ පදිංචියට ආවෙ ඇයි කියලා. සාර් රජතුමා සහ ඔහුගේ සමීප

ප්‍රභුවරුන් මගේ පියා සමග අමනාප වූ නිසා, මේ රටට ආ බව මං ඔබට කියා තිබෙනවා. අප පමණක් නොවෙයි. දුප්පත් හා මධ්‍යම පංතියේ රුසියානු ජාතිකයන් පවා, විශාල වශයෙන් දැන් රුසියාවෙන් පිටවී යන්න පටන් අරගෙන. ඔවුන්ගෙන් සමහරු ප්‍රංශයටත් ස්කැන්ඩිනේවියානු රටවලටත් යනවා.

සමහරු ගොඩබිමින් ප්‍රංශයට ඇවිත් ඊළඟට එංගලන්තයට එනවා. මේ නාඳුනන රුසියානු ජාතිකයන්ගෙන් බොහෝ දෙනෙක් මගේ පියා සොයාගෙන එනවා. ඔවුන් මගේ පියා සොයාගෙන එන්නේ අපේ ගෙදර නවාතැන් ගන්න බලාගෙන. මේක අපට විශාල ප්‍රශ්නයක් වුණා. මේ අය අතර සාර් රජුගේ ඔත්තුකාරයන් ඉන්න පුළුවනි. වෙස් වළාගෙන එන ත්‍රස්තවාදීන්, විප්ලවවාදීන් හා අපරාධකාරයන් ඉන්න පුළුවනි. සරණාගතයන් ලෙස එහෙම අය එංගලන්තයට ආ බවට සෑහෙන්න සාක්ෂි තියෙනවා. මේ ගැන බොහොම දුරට කල්පනා කරලා, මගේ පියාණන් මේකට විසඳුමකුත් හොයා ගත්තා.

ඔහු නැගෙනහිර ලන්ඩනයේ ඇල්ෆ්‍රඩ් වීදියෙන් පරණ තට්ටු නිවාසයක් මිලට ගත්තා. තරමක් අබලන් වුණත් තට්ටු පහක නිවාසයක් වූ මෙහි, කාමර විසිපහක් පමණ තිබෙනවා. මේකෙන් අපට විශාල පහසුවක් සැලසුණා. තමන්ට වෙනත් වාසස්ථානයක් සහ රැකියාවක් සොයා ගන්නා තුරු, මෙතැන, එංගලන්තයට පැමිණෙන සරණාගතයන්ට, තාවකාලික නවාතැනක් වෙනවා.

අපේ පවුලේ පදිංචිය සඳහා මගේ පියාණන් මන්දිරයක් මිලට ගත්තේ ලන්ඩන් නගරයට පිටත, වින්ඩසර් මාළිගයත් පිහිටි තේම්ස් නිම්නයෙන්. ඒක පාළුයි ගම්බද පළාතක් වගේ. නමුත් හැම කෙනෙක්ම ගමේ ජීවිතයට කැමති නෑ. රුසියාවෙන් ඇවිත් අපේ ගෙදර පදිංචිව සිටි, ඔල්ගා මිකයිලොව්නා කුමරියත් කැමැතිවුණා ඇගේ සේවිකාව සමග, ඇල්ෆ්‍රඩ් මාවතේ "යාල්ටා" නම් සරණාගතයන් සඳහා මිලට ගත් නිවසේ පදිංචියට යන්න.

ඇය කවුද කියන එකත් දැන් මා ඔබට කිවයුතුයි. ඇය වර්තමාන සාර් රජු වන දෙවැනි ඇලෙක්සැන්ඩර්ගේ දුරස්ථ ඥාති සොහොයුරියක්. විවාහයට පෙර ඇය පදිංචිව සිටියේ සාර් රජමාළිගයේම කොටසක. නමුත් ප්‍රේම සම්බන්ධයක් නිසා ඇය විවාහයට තෝරා ගත්තේ, රාජකීය පවුලක කෙනෙකු නොවෙයි.

සාමාන්‍ය පවුලක කෙනෙක්. ඔහු සැන් පීටර්ස්බර්ග් ප්‍රදේශයේ ඉඩම් හිමියෙකු වූ පෝල් මිඛායෙල් නම් ආදිපාදවරයෙක්. ඒ නිසා මේ විවාහයට සාර් රජතුමාගේ අනුමැතිය ලැබුණේ නෑ. ඔහු පෝල් මිඛායෙල්-ඔල්ගා යුවළ සමග අමනාප වුණා. සැන් පීටර්ස්බර්ගයට නුදුරු නගරයක තිබූ මාලිගාවක නව යුවළ පදිංචි වුණා.

බෝල්ෂෙවික් කාරයන් රට පුරා කැරලි කෝලාහල හා උද්ඝෝෂණ කරද්දී, මොවුන්ගේ මාලිගයටත් කඩා වැදුණා. ඔවුන් පෝල් ආදිපාදවරයා හිරබාරයට ගත්තා. පසුව ඔහු සැන්පීටර්ස්බර්ග් හිරගෙදරදී ඝාතනය කරණු ලැබුවා. තවදුරටත් රොමානෝෆ් රජපවුලේ කෙනෙකු නොවීම නිසා, ඔල්ගා කුමරියට හැකිවුණා කැරලිකාරයන්ගේ මරණීය දඬුවමෙන් බේරෙන්න. ඇය ගමන් බලපත්‍රයක්වත් නොමැතිව රටෙන් පිටවෙලා, එංගලන්තයට පලා ආවා. ඔල්ගා මිකයිලොව්නා කුමරිය ජීවිතය බේරාගත්තේ ඒ විධියට.

පෝල් මිඛායෙල් ආදිපාදවරයා මගේ පියාණන්ගේ දුර ඥාතියෙක්. ඒ අනුව මගේ පියා හා මව එංගලන්තයට ආ ඔල්ගා කුමරිය සාදරයෙන් භාරගත්තා.

ඇය මේ රටට ඇවිත් ගතවෙන්න ඇත්තේ අවුරුදු හතරක පමණ කාලයක්. දුර්ලභ චිත්‍ර අලෙවිකරන ප්‍රදර්ශනයක්, ලන්ඩන් නුවර පැවැත්වෙන බව පුවත්පත්වල පළවුණා. මගේ මව සහ පියා සමග ඔල්ගා මිකයිලොව්නාත් ප්‍රදර්ශනයට ආවලු. එහිදී ඇයට දකින්න ලැබුණාලු, රුසියාවේදී තමන්ට අයිතිව තිබුණු තමන්ගේ මාලිගයේ එල්ලා තිබුණු චිත්‍රයක්, මේ ප්‍රදර්ශනයට තබා ඇති බව. "පරෙවියන් සුරතල් කරන දැරිය"* නම් මේ තෙල්සායම් සිතුවම 1755 දී පමණ ෂෝන් බැප්ටිස්-ග්‍රූස් නම් ප්‍රංශ චිත්‍ර ශිල්පියා කළ සිතුවමක්. විප්ලවකාරී තරුණයෝ ඒ කාලයේ, ධනවතුන්ගේ මාලිගා කොල්ලකමින් වස්තුව එකතු කළා. ලෝකයේ සුප්‍රකට චිත්‍රශිල්පීන්ගේ වටිනා සිතුවම් මේ හැම මාලිගයකම වගේ තිබුණා. මංකොල්ලකාරයන් ඒවාට වැඩි අවධානයක් යොමු කළා. ඒ මොකද මෙවැනි චිත්‍රවලට යුරෝපය පුරා ලොකු ඉල්ලුමක් තිබුණු නිසා. විප්ලවකාරයින්ට ආයුධ ගන්න මුදල් උවමනා වෙද්දී ඔවුන් අර චිත්‍ර විකුණා දැම්මා.

මේ චිත්‍රය ඔල්ගා කුමරිය ඉතාම ආශාවෙන් රැකගත් චිත්‍රයක්. ප්‍රදර්ශනයේ එය අලෙවියට තබා තිබුණාලු රන් පවුම් භාරලක්ෂ

---

* කවරයේ පිටුපස බලන්න

පනස්දහසකට. රුසියාවේදී ඇය එය රාමුකර මාලිගයේ එල්ලා තිබුණු රාමුව පවා එහි තිබුණලු. ඇය එහි පිටිපස ඇගේ නම ලියා අස්සන් කර තිබුණා. ඒවා පවා එලෙසම තිබුණා. මේක දුටු ඇය කෝපාවිෂ්ඨ වුණා. තමන්ට අයත් චිත්‍රය ඉල්ලා ඇය මේ චිත්‍ර අලෙවි කරන්නන්ට එරෙහිව ලන්ඩන් අධිකරණයේ නඩුවක් පැවරුවා. මේකට මගේ පියා නම් කැමැති වුණේ නැහැ. ඒ මොකද රුසියාවෙන් පලා ඇවිත් ඇය එංගලන්තයේ සැඟවී සිටි බව ලෝකයටම හෙළිවන නිසා. නමුත් ඔල්ගා කුමරියගේ තර්කය වුණේ, තමන්ගේ චිත්‍රය තමන්ට ලැබුණොත් එය විකුණා, ජීවිතයේ ඉදිරි කාලය කාටවත් බරක් නොවී ගෙවන්නට පුළුවන් කියලයි. දැන් අවුරුදු දෙකක් ගතවුණා. තවමත් ඒ නඩුව පිළිබඳ කටයුතු අවසාන නැහැ.

ඊළඟට ඇය ඇල්ෆ්‍රඩ් පාරේ යාල්ටා මැඳුරේ පදිංචියට එන්න උවමනා බව කිව්වා. එය නැවැත්වීමටත් අපට හැකිවුණේ නැහැ. දීර්ඝ කාලයක් තිස්සේ අපේ පවුලේ සේවිකාවක වුණු අකුලිනා බොයරෝවා වයස අවුරුදු හැත්තෑවක පමණ කාන්තාවක්. සේවිකාවක වුණත් අප ඇයට සැලකුවේ පවුලේ කෙනෙකුට වගේ. තමන් යාල්ටා නිවසේ පදිංචියට යද්දී තමන්ගේ පරෙස්සමට, අකුලිනාව කැඳවාගෙන යන්නත් කුමරියට උවමනා වුණා.

යාල්ටාවත් එහි පදිංචි කරුවනුත් ගැන දැන් මං ඔබට කියන්නම්.

එහි කාමර විසිපහක් පමණ තිබුණත්, පදිංචිකරුවන් ඉන්නේ දහඅට දෙනයි. මෙම ස්ථානය පරිපාලනය කිරීමටත් කෙනෙකු අවශ්‍යයි. අපි එය අකුලිනාට භාරදුන්නා. ඔල්ගා කුමරියට පදිංචිය සඳහා බිම්මහලේ සුවපහසු කාමරයක් ලැබුණා. අකුලිනා බොයරෝවා ඊට යාබද කාමරයේ. නිවසේ කෑම කාමරය සහ කුස්සිය තිබෙන්නේත් බිම් මහලේ. දීර්ඝ කාලයක් තිස්සේ එංගලන්තයට ආ රුසියානු සරණාගතයින්, මේ යාල්ටාවේ තාවකාලිකව පදිංචි වී සිටියා. ඊළඟට ඔවුන් රැකියා සොයාගෙන, කුලීගෙවල් සොයාගෙන යාල්ටාවෙන් පිටවී ගියා.

නමුත් දින දෙකකට පෙර රාත්‍රියේ, එක් අවාසනාවන්ත සිදුවීමක් වුණා. යාල්ටා නිවසට කඩාවැදුණු සාහසිකයෙක් ඔල්ගා කුමරියගේ කාමරයට ඇතුළු වී, ඇය මරාදමලා. එය සිදුකර තිබුණේ ඇය ඇඳේ නිදා සිටියදී. පොලීසිය කියන්නේ මේක ඇය සතු රත්

රිදී දියමන්ති ආභරණ පැහැරගෙන යෑමට සොරුන් කළ වැඩක් කියලයි. පවුම් ලක්ෂ හතරහමාරක් වටිනා සිතුවමේ නියම අයිතිකාරිය ඇය බවයි පුවත්පත්වල පළවුණේ. ඇය සතුව විශාල ධනස්කන්ධයක් ඇති කියලා හොරු අනුමාන කරන්න ඇති. පොලීසිය කියන්නේ එහෙමයි."

මේ දක්වාත් මට කතන්දරය කිව්වේ ඉවාන් වෙරිකොෆ්. ඒ මගේ ගෙදරදී සහ, අප ඔහුගේ නිවස කරා අශ්වකරත්තයෙන් ගමන් ගන්නා අතරේ. පැය කිහිපයක ගමනින් අපි වෙරිකොෆ් පවුල පදිංචි මන්දිරයට ළඟාවුණා. එයට එක් පැත්තකින් වින්ඩ්සර් මාලිගයත් තවත් පැත්තකින් ඊටන් විදුහලේ ගොඩනැගිලිත් දකින්න ලැබුණා.

ඉවාන්ගේ පියා කවුන්ට් ව්ලැදිමීර් වෙරිකොෆ්, මා සාදරයෙන් පිළිගත්තා. ඒ ඔහුගේ ළඟ ඥාතියෙකු පිළිගන්නා තරම් සෙනෙහසකින්. ඔහුගේ උච්චාරණයේ රුසියානු බව හඳුනාගත හැකිවුණත්, කවුන්ට් වෙරිකොෆ්ගේ ඉංග්‍රීසි තේරුම් ගැනීම අපහසු වුණේ නැහැ.

"ෂර්ලොක් හෝම්ස් මහත්මයා. ඔබේ පැමිණීම මට විශාල ගෞරවයක්" කවුන්ට් කිව්වා. "මේ සංකීර්ණ ගැටලුව විසඳිය හැකි එකම පුද්ගලයා ඔබ බව, මගේ පුතා දිගින් දිගටම කියනවා. ඉතින් ඔබට කරදරයක් නැත්නම් ඒ කටයුත්ත භාරගන්න. ඒක මොන තරම් ලොකු උදව්වක්ද කියා, වචනයෙන් විස්තර කරන්න අමාරුයි.

මේ මිනීමැරුම ගැන විස්තර ඉවාන් ඔබට කියන්න ඇති. මේක දැන් මගේ හිතට ලොකු වධයක් වෙලා. එක් පැත්තකින් මේ මියගිය කුමරිය මගේ ඥාතිවරියක්. ඇය ඇවිත් අවුරුදු හතරකට කිට්ටු කාලයක් අප්‍රසිද්ධව මගේ ගෙදර කාලය ගත කළා. ඒකෙන් ඇයටවත් අපේ පවුලේ අයටවත් කිසි කරදරයක් තිබුණේ නැහැ. ඇයට අයත් තෙල් සායම් සිතුවම ලන්ඩනයට ඇවිත් තිබෙන බව දුටුවාම තමා, ඔල්ගා මිකයිලොව්නාගේ ඔළුව නරක් වුණේ. ඕක ඉල්ලා නඩුමගට බහින්න එපා කියා මං අනන්ත කිව්වා. නමුත් ඇය ඒකට කන්දුන්නේ නෑ. ඊළඟට ඇයට උවමනා වුණා පදිංචියට යාල්ටා නිවසට යන්න. ඒකෙන් මොකක්ද සිදුවුණේ? ඇය නිකරුණේ මැරුම් කෑවා.

දැන් මං මුහුණ දීලා තියෙන්නේ විශාල ප්‍රශ්නයකට. රුසියාවෙන් එංගලන්තයට එන සරණාගතයින් ගැන හිතලා මං

යාල්ටාව පවත්වාගෙන යායුතුමයි. මං කොහොමද ඒක කරන්නේ, මතන හැංගී ඉන්න අපරාධකාරයා අල්ලා ගන්නේ නැතුව?"

"උතුමාණනි. ඔබ කියන්නේ කුමරිය මරා දැම්මේ, යාල්ටා නිවසේම පදිංචිව ඉන්න රුසියානු ජාතිකයෙක් කියලද?" මං විමසුවා.

"ඇත්තෙන්ම ඔව්. ඒ ගැන කිසිම සැකයක් නෑ." කවුන්ට් වෙරිකොෆ් කිව්වා. "එය කළේ පිටින් ආව හොරුන් කියා ලන්ඩන් පොලීසිය කියනවා. නමුත් මම නම් ඒක කොහොමටවත් පිළිගන්නේ නෑ. ඔල්ගා කුමරිය ළඟ තිබුණු වස්තුවක් නෑ. ඇයගේ මුදල් පසුම්බියේ මා ඇයට දුන් සුළු මුදලක් තියෙන්න ඇති එච්චරයි. රුසියාවේදී ඇය සතුව දියමන්ති, මුදු මාල, රත්රන් ආභරණ, මුතු මැණික් තිබුණු බව ඇත්තයි. නමුත් කැරලි කෝලාහල පටන්ගත්තාම, වැඩි පරෙස්සමට ඇය ඒ ආභරණ එහේ බැංකුවක, සුරක්ෂිතාගාරයේ සේප්පුවක තැබුවලු. එංගලන්තයට ඇය පැන ආවේ බොහොම හදිසියෙන්. බැංකුවල තිබූ ඒවා ගන්නවත් ඇයට වෙලාවක් තිබිල නැහැ.

දැන් මතුවෙලා තිබෙන්නේ මෙවැනි ප්‍රශ්න. යාල්ටා නිවසේ ඉන්න කවුරු හරි, සාර් රජුගේ රහස් පොලීසිය වන "ඔච්රනා"වේ කෙනෙකු වෙන්න පුළුවනි. සාර් රජු ඇය ගැන තිබූ වෛරය නිසා ඇය මරා දැමීමට කෙනෙකු එව්වා වෙන්න බැරි කමක් නෑ. ඒ පුද්ගලයා කවුරු වුණත් ඔහු ඔය නිවසේ ඉන්න එක මගේ ජීවිතයටත් අවදානම්. ඒ මොකද සාර් රජු හිතන්නේ මං විප්ලවකාරයන්ට පක්ෂපාත අයෙක් කියලයි.

අනික් අතට ඔල්ගා කුමරිය ඝාතනය කළේ, විප්ලවකාරීන්ගේ කල්ලියේ කෙනෙකු විසින් වෙන්නත් පුළුවනි. එහෙම ත්‍රස්තවාදියෙකු එංගලන්තයේ සිටීම හරිම භයානකයි. ඔහු රුසියන් ජාතිකයන් වෙත ගෙන එන්නේ විශාල අපකීර්තියක්. එවැනි අපරාධකාරයෙක් මං ලබාදුන් නවාතැනක ඉඳලා, තවත් අපරාධ කළොත් මොකද වෙන්නේ? මේ රටේ පොලීසිය හිතාවි මං ත්‍රස්තවාදීන්ට අනුබල දෙන කෙනෙක් කියල. ඒ නිසා මේ අපරාධ කාරයා අල්ලා ගැනීම මට අත්‍යවශ්‍යම දෙයක්. එයට ඔබට කැමැති මුදලක් අයකරන්න. ඒ ගැන මගේ අමනාපයක් නෑ."

"උතුමාණනි" මං කිව්වා. "අපරාධකරු සිටින්නේ යාල්ටා නිවසේ කියා ඔබ කියනවා නම්, සෙවීම අරඹන්න ඕන එතැනින්.

ඒකයි නිවැරදි ක්‍රමය. නමුත් ඔතන නේවාසිකව ඉන්නේ රුසියන් ජාතිකයන් පමණක් නේද? ඉංග්‍රීසි ජාතිකයන් කවුරුවත් එතැන නැහැ නේද?"

"ඔව්. එතැන ඉන්නේ රුසියන් ජාතිකයන් පමණයි. ඇයි මොකක්ද ප්‍රශ්නේ?"

"යාල්ටාවේ නවතින්නෙ නැතුව ඔය පුද්ගලයන් ගැන හරි වැටහීමක් ලබා ගන්න බැහැ." මම කිව්වා. "පුද්ගලයන් ගැන තේරුම් ගැනීමටත්, ඔවුන්ගේ වැඩකටයුතු රහසින් නිරීක්ෂණය කිරීමටත්, ඔය ගෙදර කාමරයක නවාතැන් ගත යුතුමයි."

"ආ ඒක බොහොම පහසු දෙයක්" කවුන්ට් වරයා කිව්වේ සතුටෙන්. "යාබද නානකාමර සහිත ඉතාම සැපපහසු කාමරයක් අපි ඔබට දෙන්නම්."

"ප්‍රශ්නය ඒක නොවෙයි උතුමාණනි." මං කිව්වා. "ඉංග්‍රීසි කාරයෙක් මෙතැන නැවතුණු ගමන්, ඔවුන් තේරුම් ගන්නවා මේ රහස් පරීක්ෂකයෙක් කියලා. රුසියානු ජාතිකයෙකු රහස් පරීක්ෂකයෙකු ලෙස ආවා නම්, ඔවුනට නොතේරෙන විධියට ජීවත් වෙන්න පුළුවනි. ඉතින් මොකක්ද අපි මේකට කරන්නේ? හොඳයි. ඒ ගැන අපි තවදුරටත් පසුව කල්පනා කරල බලමු. අපරාධය ගැන පොලීසියට සාක්ෂි මොනවත් ලැබිල නැද්ද?"

"බොහොම ස්වල්පයයි." කවුන්ට් කිව්වා. "මිනීමැරුම සිදුවුණා කියල ඔවුන් විශ්වාස කරන්නේ පාන්දර තුනහමාරට පමණ. පිට පළාත්වලින් ලන්ඩනයට එළවළු ගෙනෙන කරත්තවලින්, එළවළු ගෝනිබාන්න යමින් සිටි සේවකයෙකු යමක් දැක තිබෙනවා. වොට්කින්ස් නම් ඔහු පාන්දර තුනහමාරට මේ නිවස අසලින් ගමන් කරල තියෙනවා. ඔහු දැකල තියෙනවා මේ වත්තේ ගැවසුණු සැක කටයුතු පුද්ගලයෙකුව. කළු දිග ලෝගුවක් හා පුළුල් වාටිය සහිත තොප්පියක් පැළඳි කෙනෙක්, වත්තේ ඉදිරිපස සිට පිටුපසට යාහැකි පාර දෙසට රහසේ ගමන් ගත්ත හැටි වොට්කින්ස් දුටුවාලු. එම පුද්ගලයාට දිගු යටි රැවුළක් තිබුණු බවත්, දෙනෙත් ආවරණය වන ලෙස තොප්පිය පහත් කර තිබූ බවත්, වොට්කින්ස් කියා සිටියා. මේ හැමදෙයක්ම ඔහුට දකින්න ලැබුණේ පාරේ ගෑස් ලාම්පුවෙන් නිකුත්වුණු එළියෙන්."

"ඔය විස්තරයට ගැළපෙන පෙනුමක් ඇති කෙනෙකු යාල්ටා ගෙදර ඉන්නවද?"

"ඊට ගැළපෙන කෙනෙකු ලෙස ඉන්නේ ලියොන් මූකොව්ස්කි පමණයි. ඔහුට දිග කළු රැවුලක් තිබෙනවා. ඔහු වැසි දිනවලට පුළුල් වාටියක් සහිත තොප්පියක් පළඳින කෙනෙක්. නමුත් හඳුනාගැනීමේ පෙරට්ටුවකදී, වොට්කින්ස්ට බැරිවුණා මූකොව්ස්කි හඳුනාගන්න. එදා රාත්‍රියේ තමන් දුටු පුද්ගලයා මීට වඩා උසින් අඩු මහතිනුත් අඩු කෙනෙකු බවයි වොට්කින්ස් කීවේ. ඒ අනුව සැකපිට අත්අඩංගුවට ගැනුණු මූකොව්ස්කි නිදහස් වුණා. පොලිසිය කොහොමටත් හිතන්නේ මේක ගෙදර කෙනෙකුගේ වැඩක් නොවෙයි; පිටින් ආව හොරෙකුගේ වැඩක් කියලයි"

"එහෙම දෙයක් කියන්න, මොනවද පොලීසියට ලැබුණු සාක්ෂි?"

"ඇයි අපරාධය සිදුවුණු තැනින් ඔවුන් සොයාගත් සාක්ෂි?"

"ඒ මොනවද?"

"ඔල්ගා කුමරිය හුස්ම හිරකර මරා දමලා තිබෙන්නේ, ඇය නිදාගත් ඇඳේමයි" කවුන්ට් වෙරිකොෆ් වැඩිදුරටත් කිව්වා. "ඇගේ කාමරය තිබුණේ බිම්මහලේ බව මං ඔබට කිව්වා. ඒකෙ ජනේලය විවෘත වෙන්නේ, ගේ පිටුපස ඇති ලොකු මිදුලට. එය සෑහෙන තරම් ලොකු ජනේලයක්. එය අවහිර කරන්න යකඩ කූරු කිසිවක් නෑ. ජනේල රාමුවේ හැම තැනකම පිහියකින් කළ කැපුම් සලකුණු තියෙනවා. පොලිස් නිලධරයන් කියන්නේ, මේක ලොකු පිහිතලයක් යොදා ජනෙල් පියන ඇරගැනීමේදී ඇතිවුණු සලකුණු කියලයි. ජනේලය ඇරගෙන කාමරයට ඇතුළුවුණු හොරා, පිටවෙන්න ඇත්තෙත් ඒ ජනේලයෙන්මයි. ඒ මොකද ඒ කාමරයේ දොර රාත්‍රියේ යතුරු දැමූ ආකාරයෙන් එලෙසම තිබුණා. ඇය ඝාතනය වෙන්න ඇත්තේ, හොරා කාමරයට ඇතුළුවුණු විට ඇතිවූ ශබ්දයෙන්, ඇය අවදිවුණු නිසා වෙන්න ඇති....."

"එතකොට හොරා අරගෙන ගිහින් තියෙන්නේ?"

"ඇයගේ මුදල් පසුම්බිය..... මං හිතන්නේ ඒකේ පවුම් අටක් දහයක් තියෙන්න ඇති. ඊට අමතරව ඇය පළඳින මුතුමාලය, එය දමා තිබූ පෙට්ටියෙන් අරගෙන තිබුණා. ඒක සැබෑ මුතු නොවෙයි. එය කොවෙන්ට් උද්‍යානයේ පදික වෙළෙන්දෙකුගෙන් සුළු මුදලකට ගත් ඉමිටේෂන් මුතුමාලයක්. ඒ ආකාරයේම රතු හා නිල්පාට වීදුරු කැබලිවලින් අලංකාර කළ ඉමිටේෂන් මුදු දෙකක් තිබුණා. ඒකත් ගෙනිහින්. එපමණයි."

"ඔවුන් කාමරය පුරා අවුස්සා, සැඟවූ මුදල් හෝ ආභරණ සොයා බලා තිබුණාද?"

"නැහැ"

"එතකොට පොලීසියේ මතයට ඔබ එකඟවන්නේ නැහැ"

"නැහැ. මේක දේශපාලන ඝාතනයක් බව මට විශ්වාසයි. මං ඔබට කලිනුත් කිව්වා වගේ, ඒ අපරාධකාරයා හැංගි ඉන්නේ යාල්ටා නිවසේ බවට සැක නෑ. ඒ මං ඔවුනට ලබාදුන් වහලක සෙවණ ලබමින්. අපරාධකාරයා කවුද කියලා මට හිතාගන්න බෑ. ඒ සාර් රජුගේ ආණ්ඩුව පෙරලා දැමීමට උත්සාහ කරන විප්ලවවාදී නැත්නම් ත්‍රස්තවාදී සංවිධානයක එකෙක්ද දන්නෙත් නෑ. ඔවුන් මේ දරුණු ක්‍රියාවල යෙදෙද්දී ගැහැනු-පිරිමි භේදයක් නෑ. ජෙනරාල් ට්‍රෙපොව් ඝාතනය කිරීමට තැත්කළේ වේරා සැසුලිෂ් නම් ගැහැනියක්. ඇය රුසියානු කොමියුනිස්ට් පක්ෂයේ ආරම්භක සාමාජිකාවක්.

ආයුධ සහ පුපුරණ ද්‍රව්‍ය මගින් බලය ලබා ගැනීමේ ක්‍රමයට මං විරුද්ධයි. මං ත්‍රස්තවාදය අනුමත කරන කෙනෙක් නෙමෙයි. ඒ නිසා යාල්ටා නිවසේ නවාතැන් ගැනීමට අපේක්ෂා කරන අය, මට ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කළ යුතුයි. ඔවුන් රුසියාවෙන් මේ රටට ඒමට හේතු පැහැදිලිව ඉදිරිපත් කළ යුතුයි. මමත්, පුතාත් වෙන් වෙන්ව ඒ ඉල්ලුම් පත්‍ර පරීක්ෂා කර බලනවා. නමුත් ඔවුන්ගේ ඉල්ලුම්පත් අතර සමහරවිට, වංචනික, ව්‍යාජ ඒවා තිබීමට ඉඩ තියෙනවා. එවැනි කෙනෙකු යාල්ටාවේ ඉන්නා බවට මට නිර්නාමික ලිපියකුත් ලැබුණා."

"සැක කටයුතු පුද්ගලයා පිරිමියෙක්ද ගැහැනියක්ද?"

"ඒක මම කොහොමටවත් දන්නෙ නෑ හෝම්ස් මහත්මයා." ඔහු කිව්වේ හිස් අත්ල දෙපසට හරවමින්. "මීට මාස කිහිපයකට කලින් ඔඩෙස්සාවේ පොලිස් ප්‍රධානියා වෙත ප්‍රහාරයක් එල්ල කෙරුණා. ඔහු රාත්‍රි ආහාරය සඳහා අවන්හලක් වෙත යමින් ඉඳල තියෙන්නේ. ඔහුගේ අශ්වකරත්තයට කවුරුන් හෝ වෙඩි ප්‍රහාරයක් එල්ල කළා. පොලිස් ප්‍රධානියා බේරුණා. නමුත් අශ්වකරත්තයේ රියැදුරා වෙඩි පහරින් මියගියා. දුටු අය කියන්නේ සාහසිකයා උස, හැඩිදැඩි සිරුරක් තිබූ, ලෝගුවක් හැඳ සිටි අයෙක්ලු. ඒ ගැහැනියක්ද පිරිමියෙක්ද කියන්න කවුරුත් හඳුනාගත්තෙ නෑ. ඔහු හෝ ඇය සෙනග අතරේ අතුරුදන්වුණා. ආරංචිය තියෙන්නේ මේ අපරාධකාරයා එංගලන්තයට පැන ආව කියලයි.

අකුලිනා බොයරෝවාගෙන් අපි විමසා බැලුවා. කිසිම කෙනෙකුගේ අභ්‍යන්තර ස්වභාවය ගැන කියන්න ඇයට දැනුමක් නෑ. ඇය බොහොම අහිංසක කෙනෙක්."

"යාල්ටා නිවසේ අකුලිනාගෙන් කෙරෙන රාජකාරිය මොකක්ද?"

"හෝම්ස් මහත්මයා. එතැන කටයුතු සියල්ල විධිමත්ව ක්‍රියාත්මක කරවන්නේ ඇයයි" කවුන්ට් කීවා. "එතැන ප්‍රධානියා ලෙස ඔල්ගා කුමරිය දැරුවේ, බොහෝදුරට නාමික තනතුරක් පමණයි. නේවාසිකයන් වෙනුවෙන් සේවිකාවන් ලවා ආහාර පිළියෙල කරවීම, ජලය ලබා ගැනීම, රෙදි සෝදන ගැහැනුන්ට කිළිටි රෙදි භාරදී පිරිසිදු කළ රෙදි භාරගැනීම ආදී සියලු දේ කරන්නේ ඇයයි. ඔල්ගා කුමරිය බුද්ධිමත් වගේම කපටි තැනැත්තියක්. මට හිතෙනවා මෙතැන ඉන්න අය මොන වගේ අයද කියන එක ඇය දැනහිටින්න ඇති කියලා. ඇයව නිශ්ශබ්ද කරන්න උවමනාවට, ඔල්ගා කුමරිය ඝාතනය කළා ද දන්නෙත් නෑ. ඒකයි මං ඔබට කිව්වේ මේක ඇතුළතින් දේශපාලනය තිබෙනවා වෙන්න පුළුවන් කියලා.

මේ පරීක්ෂණය මා වෙනුවෙන් සිදුකරන්න කියලා මං ඔබෙන් ඉල්ලා හිටින්නෙ ඒ නිසයි. නමුත් ඔබ කියනවා වගේ, ඒක ක්‍රියාත්මක කරන්නේ කොහොමද කියන එක නම් ප්‍රශ්නයක් තමයි. ඔබ ඉංග්‍රීසි කථාකරන ඉංග්‍රීසි ජාතිකයෙකු නිසා ඒක නිවැසියන්ට ප්‍රශ්නයක්. ඔවුන් ඔබව අවිශ්වාස කරන බවට සැක නෑ. ඔවුන් රුසියාවෙදිත් පීඩාවට පත්වී ඉඳලා, එහේ නීතියෙන් ගැලවෙන්න පැන ආ අය. ඔවුන්ගෙන් ඉඳහිට කෙනෙකුට තමයි යන්තමින් හෝ ඉංග්‍රීසි කථාකරන්න පුළුවන්. ලන්ඩන් පොලීසිය සමග සහයෝගයෙන් කටයුතු කරන්නත් ඔවුන්ගේ කැමැත්තක් නෑ. කොහොමද අපි මේ ප්‍රශ්නය විසඳිය යුත්තේ? හෝම්ස් මහත්මයා. ඔබට තියෙනවද ඒකට පිළිතුරක්?"

"උතුමාණනි. මං මේ ගැන කල්පනා කර බලන්නම්. මට පැය හතළිස් අටක කාලයක් දෙන්න. ගැඹුරින්ම කල්පනා කර බැලුවොත් මේකට විසඳුමක් ලැබේවි."

"හෝම්ස් මහත්මයා. කොහොමද මං ඒක දැනගන්නෙ?"

"තවත් දින දෙකකින්...... ඒ කියන්නේ අනිද්දා මේ වේලාවට මං සූදානම්. මං පදිංචිව සිටින මොන්ටේගු වීදියේ නිවසට ඔබේ

රියැදුරා සමග අශ්වකරත්තය එවන්න. එතකොට මට පුළුවනි මෙහේට ඇවිත් ඔබ සමග වැඩිදුර සාකච්ඡා කරන්න."

ඉතින් වොට්සන්. මේක මට හරි බැරෑරුම් ප්‍රශ්නයක් වුණා. මගේ නවාතැනට ඇවිත් මං දහඅතේ කල්පනා කළා. මොන තරම් සැර දුම්කොළ යොදා පයිප්ප කියක් බීවත්, මගේ හිතට පැහැදිලි විසඳීමක් ආවෙ නෑ. යාල්ටාවෙ නවතින්නේ නැතිව ඒ පුද්ගලයන් නිරීක්ෂණය කරන්නත් බෑ. ඉංග්‍රීසි ජාතිකයෙකු හැටියට ඉඳගෙන එහේ පදිංචි වෙන්නත් බෑ. දින එකහමාරක් කල්පනා කළ පසු, යම් තරමකට ප්‍රායෝගික විසඳීමක් මගේ සිතට ආවා. මේක ක්‍රියාත්මක කිරීමට දුෂ්කර, ඒ වගේම අවදානම් ක්‍රියාමාර්ගයක්. නමුත් මට වෙන විකල්පයක් තිබුණෙ නෑ.

වොට්සන්. ඔබ කියන්නේ අපරාධ කාරයන් ඇල්ලීමට, දැනටත් මං අවදානම් ක්‍රියා මාර්ග අනුගමනය කරනවා කියලයි. මගේ තරුණ අවදියෙ මං මොන තරම් දුෂ්කර, මොන තරම් අවදානම් කටයුතුවල යෙදුණාද කියල, ඔබට හිතන්න පුළුවන්ද? ඒ කාලේ මං දැනටත් වඩා දඩබ්බරයි. අවදානම් පරීක්ෂණයක යෙදෙන්න දෙපාරක් හිතන්නේ නෑ. ඉතින් මේකට මං සොයාගත්තු විසඳුම කුමක්ද කියා ඔබට හිතන්න පුළුවන්ද?"

"මට මොකුත්ම හිතාගන්න බැහැ"

"ඔව් මගේ හිතවත් වොට්සන්. ඒකෙ පුදුමයක් නෑ. මගේ තීරණය වුණේ මෙයයි. මං යාල්ටා නිවසේ පදිංචියට යනවා; ඒ කන්දෙක බිහිරි, කතා කරන්න බැරි ගොළුවෙකු ලෙස!"

"දෙයියෝ සාක්කි!"

"මං ගත්තු තීරණය කවුන්ට් ව්ලැදිමීර් වෙරිකොෆ්ට කිව්වා. එතකොට ඔහුටත් කියැවුණේ ඔබට කියවුණු දේමයි. ඔබ දන්නවා රඟපෑමේ කටයුත්තට මා උපතින්ම ලබා ඇති දක්ෂතාවය ගැන, ඒ හින්දා යාල්ටා නිවසෙදිත්, ගොළු බිහිරි රුසියානු ජාතිකයෙකු ලෙස රඟපෑමට හැකිවේවි කියල, මට ආත්ම විශ්වාසයක් ඇතිවුණා.

"හෝම්ස් මහත්මයා. ඔබට හොඳටම විශ්වාසද ගොළු බිහිරි කෙනෙකු ලෙස ඔවුන් අතර හැසිරෙන්න ඔබට පුළුවන් කියලා?" කවුන්ට් වෙරිකොෆ් විමසුවා. "පුතා ඉවාන්. ඔබ මොකද මේ ගැන කියන්නේ?"

"අපි ෂර්ලොක් හෝම්ස් මහත්මයාට අවස්ථාවක් දීල බලමු" ඉවාන් කිව්වේ සිනාමුසු මුහුණෙන්. "මේක විසඳන්න ඔහුට බැරි නම්, පුළුවන් කෙනෙක් එංගලන්තයේ ඇත්තෙත් නෑ."

"හෝම්ස් මහත්මයා" කවුන්ට් කීවා. "මා රුසියාවේ ඉඳිද්දී මගේ ඉඩකඩම් බලාගත්තු විශ්වාසවන්තම සේවකයා තමා අන්ද්‍රේ ඉවානිච්. ඔහු තමා එංගලන්තයේදි මගේ වැඩකටයුතු ගැන හොයා බලන්නෙ. ඇල්ෆ්‍රඩ් පාරෙ යාල්ටා නිවසෙ හැම දෙයක්ම සිද්ධවෙන්නෙ, ඔහුගේ අනු දැනුම ඇතිව. මේක ප්‍රායෝගිකව ක්‍රියාත්මක කරන්නෙ කොහොමද කියන එක අපි අන්ද්‍රේගෙන් විමසමු."

මෙහෙම කියූ කවුන්ට් සීනුවක් සඳහා ගැටගසා තිබූ ලණුවක් ඇද්දා. මිනිත්තු දෙකක් ගතවෙද්දී අන්ද්‍රේ ඉවානිච් අප ඉදිරියට ආවා.

"ආ.....! අන්ද්‍රේ. මේ තමයි අපේ ඉවාන්ගේ මිත්‍රයෙකු වන ෂර්ලොක් හෝම්ස් මහත්මයා. ඔහු අපරාධ පරීක්ෂකයෙක්. දැන් ඔහු ඇවිත් ඉන්නෙ ඇයි කියා ඔබට හිතාගන්න පුළුවන් නේද? ඔල්ගා කුමරිය ඝාතනය කළ අපරාධකාරයා හොයාගැනීමයි, ඔහුට මං භාර කළ රාජකාරිය."

ගොළු බිහිරෙකු ලෙස යාල්ටාවෙ නවතින්න මා කළ යෝජනාව ගැන කවුන්ට් අන්ද්‍රේට විස්තර කළා. මේක සියයට සීයක්ම සාර්ථක කරගන්න උවමනා මොනවද කියලයි, ඊළඟට කවුන්ට් වෙරිකොෆ් අන්ද්‍රේගෙන් විමසුවේ.

ප්‍රමාණයෙන් කුඩා මිනිසෙකු වුණු අන්ද්‍රේ ඉවානිච්ට තිබුණේ බුද්ධිමත් පෙනුමක්. ඔහු මා දිහා බලා මිත්‍රශීලී සිනාවක් පෑවා. නමුත් කවුන්ට් කීදේට එක්වරම පිළිතුරක් දුන්නේ නෑ. වම් අතේ ඇඟිලිවලින් තමන්ගේ නිකට තදින් අල්ලාගෙන ඔහු කල්පනා කළා. ඔහුගේ කටින් වචනයක් පිටවුණේ, මිනිත්තු තුනක් හතරක් ගතවුණාට පස්සෙ. මේ ඔහුගේ සාමාන්‍ය ස්වභාවය වෙන්න ඇති. ඒ මොකද අන්ද්‍රේ කථා කරන තුරුම, කවුන්ට් වෙරිකොෆ් සහ ඉවාන් සිටියේ සම්පූර්ණයෙන්ම නිශ්ශබ්දව.

"උතුමාණනි" අන්ද්‍රේ කිව්වා. "අනික් හැමදේකටම කලින් ඔහුට උවමනා වෙනවා, රුසියානු අනන්‍යතාවයක්. ඒකට අවශ්‍ය ලියවිලි අපි සකස් කරමු. මොහු ගොළු බිහිරෙක්; එංගලන්තයට කඩා වැටුණෙ කොහොමද, ඒ ඇයි කියන එක ගැන, විශ්වාස කළ හැකි කතන්දරයක් අවශ්‍ය වෙනවා. ඒක හදාගන්න එච්චර අමාරු වෙන්නෙ නෑ. ඊළඟට රුසියානු මෝස්තරයට මැසූ පරණ කබා, කමිස සහ කලිසම් කීපයක් අවශ්‍යයි. ඒ ටික මට ඉල්ලාගන්න වෙන්නෙ ඔබතුමාගෙන්"

"මගේ පරණ ඇඳුම් දැමූ අල්මාරියෙ ඕනෙ තරම් රුසියන් ඇඳුම් ඇති" කවුන්ට් කිව්වා. "ඔබට උවමනා දේ ඉවාන් මහත්තයට කියන්න. ඔහු ඒව දේවි. ලියකියවිලි හදාගන්න කොච්චර කාලයක් ගතවේවිද?"

"පැය විසිහතරයි උතුමාණනි" අන්ද්‍රේ කිව්වේ විශ්වාසයෙන්. "හෙට මේ වේලාව වෙන කොට මෙතුමා පදිංචි නිවසට මං හැමදෙයක්ම ගිහින් දෙන්නම්. ඔබතුමාට අපහසුවක් නැත්නම් ඊළඟට අපි යමු ඇල්ෆ්‍රඩ් වීදියෙ නිවාසයට."

අන්ද්‍රේ ඉවානිච් පොරොන්දු වුණු දේ අකුරටම ඉටු කළා. පහුවදා උදේ එකොළහ වෙද්දී ඔහු මොන්ටේගු වීදියේ මගේ නවාතැනට ආවා.

මුලින්ම ඔහු මට දුන්නෙ ඔබ අතේ ඔය තියෙන කඩදාසි. ඔහු මට දී තිබූ නම පාවෙල් සිමියෝනිච්. ඊළඟට ඔහු ගෙනැවිත් තිබුණා පාවෙල් ඉහළින්ම අගය කළ දේවල්. රුසියානු ගැමි ගැහැනියකගේ ඡායාරූපයක්. ඒ තමයි පාවෙල්ගේ අම්මා. අබලන්වූ බෑගයක් තුළ ඇඳුම්. තවත් පවුලේ සිහිවටන. ඊළඟට ඔහු මා වෙනුවෙන් කතන්දරයකුත් සූදානම් කර තිබුණා.

පාවෙල්ගේ ගම ලෙස ඔහු තෝරාගෙන තිබුණේ යූරල් කඳුකරයේ පිටිසර ගමක්. ඒ මොකද ඒ පළාත්වලින් ආ කිසිවෙකු මේ නවාතැනේ නොසිටි නිසා. පාවෙල් සිමියොනිච් ගොළු බිහිරි විතරක් නෙමෙයි; අකුරු ලියන්න හෝ කියවන්න නොදන්නා නූගතෙක්. ඒ යාල්ටාවෙ අය අකුරින් යමක් ලියා, මගෙන් යමක් විමසන්න උත්සාහ කිරීමෙන් වළක්වන්න. මගේ අම්මාගෙ නම ඉලියුෂා සිමියොනොව්නා. වැන්දඹුවක වුණු ඇය ධනවත් ඉඩම් හිමියෙකුගේ ධාන්‍ය වතුවල සේවය කළ ගෙවිළියක්.

මගේ ගොළු – බිහිරි – නූගත් කමින් කැරලිකරුවන් ප්‍රයෝජන අරගෙන. ඔවුන් ත්‍රස්තවාදී කටයුතුවලදී, මාව පණිවුඩකරුවෙකු හැටියට යොදාගෙන. සාර් රජුගේ රහස් පොලීසියෙන් මාව අල්ලාගන්න ඉඩ තියෙනවා. ඒ නිසා තමන්ගේ පුතාට රටින් පැනයාමට උදව් කරන්න යයි, සිමියනොව්නා ඉඩම් හිමියාට ආයාචනා කළාලු. කාරුණික ඉඩම් හිමියා මේ දෙදෙනාටම රටින් පිටවී යාමට ගාස්තු ගෙවලා. නමුත් මහලු කාන්තාව දුම්රිය ගමනේදී උණ සන්නිපාත රෝගය වැලඳිලා මියගිහින්. අදහස්

හුවමාරු කරගන්න බැරිව, අතේ මුදලකුත් නැතිව, පාවෙල් (මං) අතරමංවෙලා. එංගලන්තයට සංක්‍රමණය වුණු රුසියන් ජාතිකයන් පිරිසකට මාව හමුවෙලා, කවුන්ට් චෙරිකොෆ් ආදිපාද තුමා වෙත එව්වලු. එතුමා මාව අන්ද්‍රේට භාරදුන්නලු. යාල්ටා නිවසේ සේවකයෙකු ලෙස මා රඳවන්න, ආදිපාද තුමා තීරණය කළාලු.

අන්ද්‍රේ මේ කතන්දරය කියද්දී, මං බොහොම ඕනෑකමින් කන්දුන්නා. ඒ මොකද අම්මාගේ මරණය නිසා මගේ මුහුණ ඉතා ශෝකාකුල එකක් විය යුතුයි. ඊළඟට ඔහු ගෙනා ඇඳුම් පැළඳුම්වලින් මං සැරසුණා. යාල්ටා නිවසේ නවාතැන්ගෙන සිටින පුද්ගලයන්ගේ නාම ලේඛනයකුත්, ඔවුන් ගැන තොරතුරු සටහනකුත් අන්ද්‍රේ මා අතට දුන්නා. එහි පදිංචිකරුවන් ගණන අකුලිනා ඇරුණාම දහඅට දෙනෙක්.

මේ තියෙන්නේ ඒ ලේඛනය. මොවුන් හැමදෙනෙකු ගැනම මං ඔබට විස්තර කියන්න යන්නෙ නෑ වොට්සන්. මට ඒ පුද්ගලයන් හමුවුණු අවස්ථාවල හැටියට මං ඔබට තොරතුරු කියන්නම්.

මගේ අවධානයට මුලින්ම යොමුවුණේ, පොලීසියේ සැකයට භාජනය වුණු ලියොනිද් ෂුකොව්ස්කි. ඔහු ගැන අන්ද්‍රේගේ අදහස මොකක්ද කියලා මං ඔහුගෙන් විමසුවා. ඔහු උරහිස් හකුළමින් කිව්වේ ඇසින්දුටු සාක්ෂිකාරයාට වුණු වැරැදීමක් වෙන්න ඇති කියලා. ඔහු එයින් අදහස් කළේ වොට්කින්ස්ට මුලින් සිදුවුණු එක වැරදීමක්ද නැත්නම් හඳුනාගැනීමේ පෙරෙට්ටුවේදි වුණු දේ වැරැදීමක්ද කියන එක මට හිතාගන්න බැරිවුණා. ෂුකොව්ස්කිගේ ලියකියවිලිවල හැටියට, ඔහු මොස්කව් විශ්වවිද්‍යාලයේ සාහිත්‍යය හැදෑරූ ශිෂ්‍යයෙක්ලු. සාර් රජුගේ පොලීසිය සමග ඔහු ප්‍රශ්න ඇතිකරගෙන නැහැ.

පහුවදා උදේ අන්ද්‍රේ සමග කුලීරියකින් මම ඇල්ෆ්‍රඩ් පාරේ යාල්ටා නිවහනට ගියා. පාවෙල් සිමියොනිච් නම් ගොළු බිහිරි අසරණයා ලෙස මාව එහි නිවැසියන්ට අඳුන්වා දෙනු ලැබුවා.

* * *

"ඒ කාලෙ ඇල්ෆ්‍රඩ් වීදියෙ හැටි ඔබට මතකද වොට්සන්? අවුරුදු සිය ගණන් පරණ ගොඩනැගිලි තැනින් තැන. ඊට අමතරව පැල්පත්, හොරබඩු විකුණන කඩසාප්පු. කවුන්ට් චෙරිකොෆ් මේ

පළාතෙන් තට්ටු පහක නිවසක් මිලට ගත්තෙ ඉතා අඩු මුදලකට ලැබුණු නිසා වෙන්න ඇති.

යාල්ටා නිවසේ මූලස්ථානය වුණේ, කුස්සිය සහ කෑමකන කාමරය. මේ දෙක ලෙස තිබුණෙ ප්‍රමාණයෙන් තරමක් විශාල කාමරයක්. වැඩක් නොමැති නිවැසියන් කොයි වෙලෙත් කතාබහට එකතුවුණේ මෙතැනට. අත්දේ විසින් මුලින්ම මාව අනික් අයට අඳුන්වා දෙනු ලැබුවෙ මෙතැනදී.

මේ අය අතරින් මගේ අවධානය මුලින්ම යොමුවුණේ හතර පස් දෙනෙකුට. අන් හැමදෙනෙකුටම වඩා මගේ අවධානය දිනාගත්තු පුද්ගලයා වුණේ ලියොනිද් ෂුකොව්ස්කි. අපි කලිනුත් ඔහු ගැන කථා කළා. උසින් අඩි හයක් පමණ වුණු ඔහුට තිබුණේ හැඩිදැඩි සිරුරක්. එළියට ඇදුණු දත් කිහිපයක විකෘති පිහිටීමක් නිසා, ඔහුට තිබුණේ විරූපී මුහුණක්. දිගට ඇදුණු කළු රැවුලත්, අවුල්වුණු කළු කොණ්ඩයත් නිසා ඔහුට ලැබී තිබුණේ නියම විප්ලවකාරී මුහුණක්. කිසිවෙකුට ආචාරශීලී ලෙස කථා නොකළ ඔහුට තිබුණේ ගොරෝසු කටහඬක්.

මිනීමරුවා කියල සැක කරනවා නම් ඊට සුදුසු තවත් පුද්ගලයෙකු මේ ගෙදර හිටියා. කුඩා ශරීරයක් තිබුණු ඔහු, කුමන වෘත්තියක යෙදුණු කෙනෙකු ද මම දන්නේ නැහැ. ඔහු විටෙක කුස්සියේ වැඩ, දර පැළීම ආදිය කළ ඇෆනාසියෙෆ්. ඔහුට තිබුණේ උගුඩුවෙකුගේ වැනි කපටි බැල්මක්. ඔහු කුස්සියෙන් කෑම හොරකම් කරගෙන යන්නෙකු බව දවස් දෙකක් යද්දිම මට තේරුණා. ඔහුගේ මෙම හොර වැඩ ඔල්ගා කුමරිය දැනගෙන, තරවටු කරලා, ඊට පළිගැනීමක් ලෙස ඔහු ඇය මරා දැම්මද? බොරු රැවුලක් දමලා, කළු ලෝගුවක් හා පුළුල් වාටිය සහිත තොප්පියක් දැම්මා නම්, මොහු අපූරුවට වොට්කින්ස් දුටු පුද්ගලයා වෙන්න තිබුණා.

වෙරිකොෆ් පවුලේ සේවිකාව ලෙස ඉඳලා, මෙතැන පාලනය භාරදී තිබුණු අකුලිනා බොයරෝවා, සාන්තුවරියක් වගේ ගැහැනියක්. මඳක් තරබාරු ඇය කොයි වෙලෙත් හොයා බැලුවේ අනික් අය කෑවද බිව්වද කියලයි. වයස අවුරුදු හැත්තෑවක් වුණත් කඩිසරව එහා මෙහා ඇවිද්දේ, මේක කවුන්ට්වරයා විසින් නියම කළ රාජකාරියක් බව හිතේ දරාගෙන වගේ.

මෙතන ඉඳපු තවත් කාන්තාවක් වුණේ නතාෂා සොෂෙංකෝවා. ඇයගෙ පිළිවෙළ අන්දේ මට කිව්වේ අප අශ්වකරත්තයේ එන අතරේදී. ඇය දැනට රුසියාවේ වේගයෙන් පැතිරී යන "කාන්තා විමුක්තිය" ව්‍යාපාරයේ සාමාජිකාවක්ලු. ඇය දවසකට හත් අට වතාවක් රුසියානු කළු සිගරට් භාවිත කරමින් දුම්පානය කළා. ඇයට තිබුණේ දුඹුරු පැහැති පියකරු කොණ්ඩයක්. කවුරුත් සමගවත් වැඩි කතාබහක් නොතිබූ නතාෂා, විටෙක ෂුකොව්ස්කි සමග කතාබහ කළේ දේශපාලන අදහස්. කුස්සියේ ඉවුම් පිහුම්වලට උදව් කිරීමත් ඇය ප්‍රතික්ෂේප කළාලු.

මෙතැන සිටි තවත් සැක කටයුතු කෙනෙකු ලෙස මට පෙනුණේ, බොරිස් දිමිත්‍රිච් නම් තරුණයා. ඔහු බොහොම නිශ්ශබ්ද කෙනෙක්. ඔහු හරිහැටි අනෙක් අයගේ මුහුණ දිහාවත් බැලුවේ නැහැ. ශක්තිමත් සිරුරක් තිබුණු ඔහු, කෑම කාල අවසන්වුණු වහාම කුස්සියෙන් පිටවෙලා ගියා. රුසියාවෙදි විශ්ව විද්‍යාල ශිෂ්‍යයෙකු වුණු ඔහු, එංගලන්තයෙදි වරායෙ කම්කරුවෙකු ලෙස රැකියාවෙ යෙදුණු බව අහන්න ලැබුණා.

මා එහි ගිය මුල් දින දෙකේ යාල්ටාවෙ නිවැසියන්ගේ ප්‍රධාන මාතෘකාව වුණේ මාව. රුසියානු භාෂාවෙන් එකිනෙකා සමග කතාබහ කරමින් ඔවුන් මහ හඬින් සිනාසුණේ මාව පෙන්වමින්. ගොළු බිහිරි චරිතයක් රඟපාන එක සුළු දෙයක් කියල හිතාගෙන, ලොකු ආත්ම විශ්වාසයකින් මං එහි ගියේ. නමුත් ඒක මොන තරම් බැරෑරුම් කටයුත්තක්ද කියන එක, මට වැටහුණේ දවසක් දෙකක් ගතවෙද්දී.

දෙදෙනෙකු හැර, අනික් කවුරු කවුරුත් මා දිහා බැලුවේ, මව මියගිහින් අනාථවුණු ගොළු බිහිරි ආබාධිතයෙකු දිහා බලන සානුකම්පිත බැල්මෙන්. නමුත් ෂුකොව්ස්කි සහ නතාෂා සොෂෙංකෝවා දෙදෙනා, මා දිහා බැලුවේ වෙනත් ආකාරයකට. ෂුකොව්ස්කි නම් මා වෙත හෙළුවේ, නූගත් මෝඩයෙකු හෙළා දකින රළු බැල්මක්. ඒක මට ගෙන ආවේ සහනයක්. නමුත් නතාෂා සොෂෙංකෝවා මා වෙත හෙළුවේ මා කිසිසේත් විශ්වාස කරන්නේ නැහැ කියන, සැකයෙන් පිරුණු බැල්මක්. මට ඔබට කියන්න බැරිවුණා. අන්දේ එදා මගේ කාමරයේදී රහසින් මා. සමග කියූ දෙයක්. ඔහු නම් හිතන්නේ ඇය ත්‍රස්තවාදී කල්ලියක

සාමාජිකාවක් කියලලු. සාන්ත පීටර්ස්බර්ග් විශ්ව විද්‍යාලයේ ශිෂ්‍යාවක වුණු ඇය රුසියාවෙන් පැන ඇවිත් තියෙන්නේ කලබලයෙන්. තහනම් කරන ලද ශිෂ්‍ය ව්‍යාපාරයකට අදාළ පත්‍රිකාවක්, ඇය ශිෂ්‍ය ශිෂ්‍යාවන් අතර බෙදා හැරල තියෙනවා. ඒ ගැන ඇය අත්අඩංගුවට ගන්න පොලීසියෙන් හොයද්දී තමා, ඇය පැන ඇවිත් තියෙන්නේ. හුගක් සුදු පැහැති සමක්, දුඹුරු පාට අක් බමරු කෙටි කොණ්ඩයත් නිසා, ඇයගේ තිබුණා පියකරු රූමත් බවක්. නමුත් ඇවිදින කොට තිබුණු විකාර ස්වභාවයත්, කට හඬේ ගොරෝසු බවත් නිසා, ඇගේ ආකර්ෂණීය බව නැතිවී ගියා.

සම්පූර්ණයෙන් බිහිරි කෙනෙකුගේ ස්වභාවය ඔබ සමීපව නිරීක්ෂණය කරල තියෙනවද වොට්සන්? තනිව සිටින වෙලාවට ඔහුගේ මුහුණෙ තියෙන්නෙ හිස්බැල්මක්. නමුත් දෙදෙනෙකු කතාබහ කරමින් ඔහු සිටින පැත්තට එනවා කියල හිතමු. එතකොට ඔහුගේ මුහුණ වෙනස් වෙනවා. එවිට මුහුණේ මතුවෙන්නෙ කැලඹිලි සහගත නොඉවසිලිවන්ත බවක්. අනික් අය කතා කරන්නෙ මොනවද කියල තේරුම් ගන්න උත්සාහ කරනවා වගේ, ඔහු අනිත් අයගේ මුහුණු දිහා බලාගෙන ඉන්නේ, ඇඩි විමසිල්ලකින්.

ඒ වගේමයි බිහිරි අයෙකු හැටියට, ඔහුගේ හැසිරීමේ තවත් වෙනස්කම් තිබෙනවා. කුස්සියේ ලෝහ සාස්පානක් බිම වැටෙන හෝ පිඟානක් බිම වැටී බිඳෙන ශබ්දයක් ඔහුට ඇහෙන්නේ නෑ. ඔහුගේ පිටුපස සිට කවුරු හරි කෝපයෙන් බෙරිහන් දෙන ශබ්දයක් හෝ, දොරට තඩිබාන ශබ්දයක් ඔහුට ඇහෙන්නෙත් නෑ. ඒ නිසා මෙවැනි ශබ්දයකදී කිසිම තිගැස්සීමක් නොවෙන්න, ශබ්දයට ප්‍රතිචාර නොදක්වා ඉන්න පුරුදුවීමට මට සිදුවුණා. ඔබට පුළුවන්ද බිහිරෙකු ලෙස මා හැසුරුණු හැටි හිතෙන් මවාගන්න? ඒක මතක් වෙනකොටත් ඔබට නම් හිනා නේද? ගොළු බිහිරෙකු ලෙස ඒමට තීරණය කිරීමෙන් මං කළේ ලොකු මෝඩ වැඩක් කියලා, දෙතුන් වතාවක්ම මට හිතුණා.

මෙහි කුස්සිය සහ කෑමකන කාමරය වුණේ, දිගට පිහිටි එකම කාමරයක් බව මං ඔබට කිව්වා. ගෙදර සේවකයෙකු ලෙස මට ලැබුණේ ඊට යාබද කාමරයක්. එදා රාත්‍රි මං මුලින්ම කළේ, කෑමකන කාමරය මගේ කාමරයේ සිට රහසින් නිරීක්ෂණය කිරීමට

හැකිවෙන පරිදි, බිත්තියේ බඳාමයේ සිදුරක් සෑරීම. නමුත් මගේ කාමරයට ආව කෙනෙකුට එය නොපෙනෙන ලෙස මගේ අම්මා - ඉලියුෂා සිමියනොව්නාගේ ඡායාරූපය එතැන සවිකළා. මට උවමනා වෙලාවට එය ඉවත්කිරීමට හැකියාව තිබුණා.

මා එහි ගිහින් දෙවැනි දවසේ, පොලීසිය යාල්ටාවෙන් ඉවත් වී ගියා. ඔල්ගා කුමරියගේ කාමරය පිරිසිදු කරන්නද කියලා මං සංඥා මගින් අකුලිනාගෙන් විමසුවේ කොස්සක් පෙන්වමින්. ඇය ඊට අවසර දුන්නා. කොස්සක් අරගෙන ඒ කාමරයට ගිය මම, එය සියුම් පරීක්ෂාවකට ලක්කළේ එහි දොර වසා දැමීමෙන් පසු.

එහි ඇතුළුවුණු වහාම මං තේරුම් ගත් දෙය තමයි, ඔල්ගා කුමරිය ඝාතනය නිවස ඇතුළේම කෙනෙකුගේ වැඩක් බව. කාමරයේ තිබුණු එකම ජනේලය තිබුණේ පිටුපස මිදුලට මුහුණලා. එහි පහත පියන ඉහළට එසවිය හැකි ලණුව, දිරායාමෙන් කැඩීගොස් තිබුණා. ලණුව කැඩීගිය ජනේලයක පහත පියන ඉහළට ඔසවන්න, ඔබ කවදා හරි උත්සාහ කරල තියෙනවද වොට්සන්? ඒක ඉතාම දුෂ්කර වැඩක්. ශබ්දයක් නොනැගෙන ලෙස නම් එය කොහොමටවත් කරන්න බෑ. ලණුව කැඩී ගොස් තිබුණේ බොහෝ කලකට පෙර. ඒ බව මා තේරුම් ගත්තේ ඒ වටා එකතුවී තිබුණු දූවිලි තට්ටුවෙන් සහ මකුළු දැල්වලින්.

ඊළඟට මං මගේ අවධානය යොමු කළේ දොරේ යතුරු තහඩුවට. එහි තිබුණු සලකුණු දැකගන්න මගේ කාචය උවමනා වුණේ නැහැ. යතුරු තහඩුවට හොඳට තෙල් දමා තිබුණා. අවශ්‍යතාවය තිබුණු පුද්ගලයා, ඒක කල්තබා කර තිබුණා වෙන්නත් පුළුවනි. යතුරුකට තුළට, නැමූ යකඩ කම්බි සහ, හොරුන් භාවිත කරන අගුල් අරින නියන් දැමූ සලකුණු, ඉතාම පැහැදිලිව සටහන් වී තිබුණා.

එය කර තිබුණේ පුරුදුකාරයෙක්ද? ඒකයි මගේ සිතට නැගුණු ඊළඟ ප්‍රශ්නය. ඒක නිතර අගුල් අරින පුරුදුකාරයෙකුගේ වැඩක් නෙමෙයි. එහෙම නම් සැහෙන ශබ්දයක් ඇතිවුණා වෙන්නත් පුළුවනි. ඔල්ගා කුමරිය ගැඹුරු නින්දකට වැටෙන තැනැත්තියක්ද කියන කරුණ අපි දන්නේ නෑ. පාන්දර තුන-තුනහමාර කියන්නේ කොහොමටත් තදින් නින්ද යන වෙලාවක්. අගුල ඇරිය ශබ්දයට බාගවෙලාවට ඇයට ඇහැරෙන්නත් නෑ. ඇය නිදි ඇඳේම මිය

ගිහින් තිබීමෙන් පෙනෙන්නේ, අපරාධකාරයා ක්ෂණිකව ක්‍රියාත්මක වී ඇති බවයි.

මේක සොරෙකු විසින් කළ දෙයක් බව පෙන්වන්න, ඔල්ගා කුමරියගේ මේසය මත තිබුණු මුදල් පසුම්බිය, මුතු මාලය සහ මුදු අරගෙන තියෙනවා. ඊළඟට කාමරයේ දොර වසාගෙන පිටවී ගිහින් තියෙන්නේ, පිටුපස මිදුලට විවෘත වෙන දොර ඇරගැනීමෙන්. ඒක අමාරු වැඩක් නෙමෙයි. ඒ මොකද ඒ දොරේ යතුර කොයිවෙලෙත් තියෙන්නේ, දොර ඇතුළු පැත්තේ යතුරු කටේ. ඒ දොර විවෘත කරගෙන එළියට ගිය මිනීමරුවා, තමන්ගේ දිග කළුරැවුල සහ තොප්පිය පමණක් පාරට පෙනෙන විදියට, මිනිත්තු කිහිපයක් ගතකරන්න ඇති. ඒ එළවළු ගෝනි බාන්න වෙළඳපොළට යන මිනිස්සු, ඔය වෙලාවට පාරේ යන බව ඔහු දන්නා නිසා. ඊළඟට ඒ දොරෙන්ම යළිත් වරක් නිවසට ඇතුළු වෙලා නිශ්ශබ්දව තමන්ගේ කාමරයට යන්න ඇති. මිනීමරුවා කවුරු වුණත්, ඔහු මේක ඉතාම හොඳට හිතාමතා සැලසුම් කළ එකක් බව පැහැදිලියි. මං එහෙම කීමට තවත් කාරණයක් ඔබට කියන්නම් වොට්සන්.

ඔල්ගා කුමරියගේ කාමරයෙන් එළියට ඇවිත්, ඔහු පිටුපස මිදුලට පිවිසුණු දොර ගැන මං ඔබට කිව්වා. ඒ දොරත් ගෙදර අනික් දොරවලුත් මගේ පරීක්ෂාවට ලක්වුණා. මං මේ කියන දොරේ යතුරු තහඩුවට පමණක් නෙමෙයි, දොර උළුවස්සට සවිකර තිබූ සරනේරුවලටත් හොඳට තෙල් දමා තිබුණා. ඒ මොකද ඔහුට ශබ්ද නොනගා නිවසෙන් පිටවීමටත්, යළි නිවසට ඇතුළුවීමටත්, ඒ පියවර ගන්න ඇති. ඒ තෙල් දැමීම බොහොම කලබලයෙන් කළ එකක් බව පැහැදිලියි. සරනේරු කෙළින්ම බිම තෙල් විශාල ප්‍රමාණයක් වැගිරී තිබුණා. පාවහන්වලින් විසිරී තිබුණත් දොරේ යතුරු තහඩුව කෙළින්ම පොළොවේ තෙල් තිබුණා. අනික් වැදගත්ම කාරණය වුණේ, මේ ගෙදර වෙනත් කිසිම දොරකට මෑතකදී තෙල් දැමූ බවට කිසිම සලකුණක් තිබුණේ නෑ.

ඔල්ගා කුමරිය සතුව තිබූ දේවල් වැඩිදුර පරීක්ෂාව සඳහා පොලිස් භාරයට ගෙන තිබුණා. ඒ නිසා ඒ ගැන මගේ අවධානය යොමුකිරීමට මට හැකියාවක් තිබුණේ නෑ.

අපරාධකාරයාගේ හැසිරීමේ එක්තරා අවස්ථාවක්, මට ගැටලුවක් වුණු බව මා ඔබට කිවයුතුයි වොට්සන්. අපරාධ

කාරයෙකුගේ සාමාන්‍ය සිරිත නම් ඔහු කරන්නේ, අපරාධය සිදුකළ තැනින් වහාම ඉවත්වී ගොස්, තමන්ට ආරක්ෂාව සැලසෙන තැනක හැංගීම. මෙතැනදී ඒක තමන්ගේ කාමරය. නමුත් මේ වෙලාවෙ අපරාධකාරයා ඇයි දොරෙන් එළියට බැහැලා ගිහින්, පාරෙ ගිය කෙනෙකුට පෙනෙන අයුරින් දර්ශනය වෙලා, යළිත් ආපහු ඒමට වෙලාව ගතකළේ? මේක තරමක් අවදානම් කටයුත්තක්. ඒ පිටින් ආව කෙනෙක් මේ දේ කළා කියල පොලීසිය නොමග යැවීමට. ජනේලයේ පිටත රාමුවේ තිබූ සලකුණු හැම එකක්ම, සාක්කුවේ ගෙනයා හැකි ලොකු දුනු පිහියකින් කළ කැපුම් සලකුණු. ඒ මිස ඒවා ජනෙල් පියන ඇරීමට යෙදූ ලොකු පිහියක තලයකින් සිදුවුණු ඒවා නොවෙයි."

"කාමරය ඇතුළතින්, බිම අතුගෑමෙන් ඔබට කිසිවක් හමුවුණේ නැද්ද?" මම විමසුවෙමි. "සාමාන්‍යයෙන් ඔබට බොහොම ප්‍රයෝජනවත් වෙන සිගරට් කොට, දුම්කොළ අළු, ගිනිකූරු, පාවහන්වලින් නිවස තුළට ආ සුවිශේෂ පාස් වැනි දේවල්?"

"කාමරය තුළ තිබී සිගරට් කොට, අළු, ගිනිකූරු වගේ දේවල් සහ පිටතින් ආ පස් දකින්න ලැබුණා" හෝම්ස් කීය. "නමුත් ඒ එකකින්වත් මට පහසුවක් සැලසෙන්නේ නැහැනෙ වොට්සන්. මිනීමරුවා කාමරය තුළට ඇවිත් ගතකරන්න ඇත්තෙ ඉතාම කෙටි කාලයයි. ආවා. උවමනා කටයුත්ත කළා. පිටවී ගියා. ඔහු සිගරට්ටුවක් දල්වා ගන්න හෝ දුම්පානය කරමින් සිටින්න කාලයක් ගතකරන්න නැහැ. සිගරට් කොට, අළු සහ පස් තිබුණා. ඒ ඔල්ගා කුමරියගේ මිනිය බලන්න කාමරයට ආ මේ ගෙදර වැසියන්ගේ. ඒ සමගම පොලිස් භටයන්ගේ පාවහන්වලින් නිවස තුළට ආව පස්.

හඳුනාගැනීමේ පෙරෙට්ටුවේදී ෂුකොව්ස්කි හඳුනාගැනීමට, අර වොට්කින්ස් නම් පුද්ගලයා අසමත්වුණු බව ඇත්තයි. නමුත් ඇසින් දුටු සාක්ෂිකාරයන් අතින් සිදුවෙන වැරැදීම් අතපසුවීම් අප්‍රමාණයි. ඒ බව අපි අත්දැකීමෙන් දන්නවා. වත්ත ඇතුළේ සැකකටයුතු ලෙස ගැවසුණු පුද්ගලයා, වොට්කින්ස්ට දකින්න ලැබිලා තිබුණේ ඉතාම කෙටි කාලයක්. ඒ මිනිත්තුවක් හෝ දෙකක් පමණයි. ඊළඟට එය පවා ඔහු දුටුවේ, වීථියේ තිබූ ගෑස් ලාම්පුවකින්, වත්ත ඇතුළට වැටුණු එළියෙන්. ඒක ඒ තරම් දීප්තිමත් ආලෝකයක් නොවෙයි.

එහෙම නම් සැබැවින්ම එහි සිටියේ ෂුකොව්ස්කිද? ඇසින් දුටු සාක්ෂිකාරයාට පසුව ඔහු හඳුනාගැනීමට බැරිවුණා වත්ද?

අනික් අතට මෙහෙම දේකුත් තියෙනවා. අපරාධකාරයා ඔල්ගා කුමරියගේ කාමරයට ඇතුළුවුණේ, දොරේ අගුල ඇරගෙන නම්? එහෙම නම් ඔහු මොකටද එළියට ගිහින් තමන්ව ප්‍රදර්ශනය කරන්නේ? සමහර විට මේ අපරාධකාරයා මෙතෙක් මගේ බැල්මට හසුනොවුණු, අනික් දහහතර දෙනාගෙන් කෙනෙකු වෙන්නත් පුළුවනි. නමුත් මගේ හිතේ ඇතිවුණු සැකය යළිත් වරක් ෂුකොව්ස්කිටම එල්ල වුණු සිදුවීමක් දැන් මං ඔබට කියන්නම්.

මට භාරවී තිබූ කටයුතුවලින් එකක් වුණේ, කාමරවලින් කිළිටි ඇඳුම් එකතු කිරීම සහ, පිරිසිදු කළ ඇඳුම් කාමරවලට බෙදාදීම. මේ වෙනකොට මේ ගෙදර මං දින හතරක් ගත කර තිබුණා. අනික් අය ඉදිරියේ අපට කතාබහ කිරීමට නොහැකි නිසා, මේ කටයුත්ත කළ යුතු හැටි අන්ද්‍රේ මට පෙන්වා දුන්නේ සංඥා මගින්. එක් එක් අයගේ රෙදි ඔවුන්ගේ කාමරය වෙත ගෙනගොස්, පළමුව දොරට තට්ටු කළ යුතු බව ඔහු මට ඇඟෙව්වා. ඊළඟට අයිතිකාරයා කාමරය විවෘත කළ පසු, පිරිසිදු රෙදි කාමරය තුළට ගෙනයාමට හැකි බව මං තේරුම් ගත්තා.

අනෙක් හැම කෙනෙකුගේම කාමර ළඟට ගිහින් දොරට තට්ටු කළ වහාම, ඔවුන් දොර විවෘත කළා. නමුත් ලියොනිද් ෂුකොව්ස්කි එහෙම කළේ නෑ. බිහිරෙකු ලෙස හැසිරුණත් මට කාමරය ඇතුළෙන් ශබ්ද කිහිපයක්ම ඇසුණා. වේගයෙන් පුටුවක් ඉවතට තල්ලු කරන හඬ, ලාච්චුවක් ඇරුණු හඬ, විසිරුණු කඩදාසි එකට එකතුකරද්දී නැඟුණු හඬ සහ ලාච්චුව වසා දැමුණු හඬ. කාමරයේ දොර අරින්න ඔහුට මිනිත්තු දෙකකට වැඩි කාලයක් ගතවෙන්න ඇති. ඔහු ආවේ හතිදමමින්. දොරට තට්ටු කළේ මා බව දුටුවාම, ඔහු සැනසුම් සුසුමක් හෙළුවා. ඔහු යමක් ලියමින් සිට ඇතිබව මං තේරුම් ගත්තා. ඒ ඔහුගේ දකුණු අතේ ඇඟිලි තුඩුවල තැවරී තිබී, තවමත් නොවේළුණු තීන්තවලින්.

මා ගෙනගිය ඇඳුම්, තමන්ගේ ඇඳ උඩින් තබන්න යයි ඔහු සංඥා කළා. ඒ ඔහුගේ ලියන මේසයේ ලාච්චු අවසිර වනසේ, ඒ ඉදිරියෙන් සිටගෙන සිටිමින්. තමන් ලියමින් සිටි බව හැංගීමට ඔහු උත්සාහ කළේ කුමන ලියවිල්ලක්ද? සාර් රජුගේ "ඔච්රනා" රහස්

පොලීසිය වෙත යවන රහස් වාර්තාවක්ද? එහෙම දේවල් ගැන කවුන්ට් චෙරිකොෆ් මා සමග කිව්වා. මේ ෂුකොව්ස්කි "ඔව්රනා" වේ චරපුරුෂයෙක්ද? ඔහු මෙතැනට එවා තිබෙන්නේ සරණාගතයන් ලෙස, යාල්ටා නිවසේ ඉන්නා පුද්ගලයන් ගැන වාර්තා ලබාගැනීමටද? එහෙමත් නැත්නම් මොහු විප්ලවකාරී කල්ලියේ ත්‍රස්තවාදියෙක්ද? ඔඩෙස්සාවේ පොලිස් ප්‍රධානියා ඝාතනය කිරීමට තැත්කොට, රුසියාවෙන් පැන ආවේ මොහුද? දැන් මෙහි සිට කරන්නේ රුසියා රාජ්‍ය විරෝධී පත්‍රිකා රචනා කිරීමද?

මොන අතකට වුණත් වෙන්න පුළුවනි. ඔහුගේ කාමරය තිබුණේ ඊළඟ තට්ටුවේ, ඔල්ගා කුමරියගේ කාමරයට කෙළින්ම ඉහළ.... ඇය මරා දමා තමන්ගේ කාමරයට යන්න ඔහුට මිනිත්තු කිහිපයකට වඩා ගතවෙන්න නෑ.

ෂුකොව්ස්කි වඩාත් සමීපව නිරීක්ෂණය කරන්න පසුවදා මට අවස්ථාවක් සැලසුණා. ගල්අඟුරු ගොඩගහන මඩුව තිබුණේ ගෙවත්තේ කෙළවරක. ගෙනත් දමා තිබූ ලී කොට, දර සඳහා පැළීම සිදුකෙරුණෙත් මෙතැන. මං දර කොටයක් පැළීමට සූදානම් වුණා විතරයි. මං දුටුවා ෂුකොව්ස්කි පිටුපස දොරෙන් ගෙදරින් එළියට බැස්ස හැටි. ඔහු හොරැහින් පිටුපස බලමින්, ශබ්දයක් නොනඟින අයුරින් අඩිය තැබූ හැටියට, මගේ හිතේ සැකයක් ඇතිවුණා. එකට රෝල්කර තිබූ කඩදාසි රැසකින්, ඔහුගේ සාක්කුව පිරී එයින් කොටසක් එළියට ද දිස්වුණා.

ඔහු පිටුපස යන්න මං හිතුවා විතරයි; මං දුටුවා තවත් කෙනෙකු ඔහු පසුපස යන හැටි. අපේ ගෙදර සිට ඇල්ෆ්‍රඩ් වීථියට වැටී තිබුණු පටුමගේ, ඔහු පියවර විස්සක් යන්න ඇති. එතකොටම රහසිගත විදියට එළියට බැස්සේ නතාෂා සොෂෙංකෝවා. ඇය මොන අරමුණකින් ඔහු ලුහුබැඳ ගියාද මං දන්නෙ නෑ. නමුත් ඇය ලොකු රෙදි කැබැල්ලක් හිසට දමාගෙන හිටියේ හිස පමණක් නොව උරහිස් පවා වැහෙන අයුරින්. සමහර විට ඔල්ගා කුමරිය ඝාතනය ගැන, නතාෂා සැකකරනවා ඇත්තෙත්, ෂුකොව්ස්කි ගැන වෙන්න ඇති. මේ ඔහුගේ රහස්‍ය ගමන් බිමන් ගැන, ඇය සොයා බලන ආකාරය වෙන්න ඇති. මේ වගේ අවස්ථාවකදී ප්‍රයෝජනයට ගැනීමට මං ගෙනැත් තිබුණා, අඳුරු පාට පිටකබායක්, හා හතරට නැමිය හැකි ලොකු පිදුරු තොප්පියක්. කාමරයෙන් ඒ දෙකත්

අරගෙන මං පාරට බැස්සේ එක් ක්ෂණයකින්. මේ වෙනකොට අනික් දෙන්නා ඇල්ෆ්‍රඩ් වීදිය දිගේ ඉදිරියට යන්න පටන් අරගෙන. කබාය හැඳගෙන, තොප්පිය හිස දමාගෙන මාත් ඒ පිටිපස ගියා. වැඩි පරෙස්සම සඳහා මම, තොප්පියේ පුළුල් වාටිය මුහුණ ආවරණය වෙන විදිහට ඉදිරියට පහත් කළා. ඊළඟට මං නතාෂාට පියවර විස්සක් පමණ පිටුපසින් ගමන් කළේ, වෙනස් ආකාරයකට දිගු පියවර තබමින්.

තමන් පිටුපස කවුරුත් හෝ එනවාදැයි බැලීමට වෙන්න ඇති, ෂුකොව්ස්කි කිහිපවාරයක්ම ආපසු හැරී බැලුවා. මේ වෙනකොට පාරේ සෑහෙන සෙනගක් ගමන්ගත් නිසා, ඔහුට අප දකින්න ලැබෙන්න නැහැ. ඇල්ෆ්‍රඩ් වීදියේ ඉදිරියට ගිය ඔහු, මංසන්ධියේදී වයිට් චැපල් මාවතට පිවිසුණා. එහි යාර පනහක් පමණ ඉදිරියට ගිය ඔහු ගොඩවැදුණේ අවන්හලකට. ඒ සමගම පාරේ අනෙක් පැත්තට ගිය නතාෂා, ආභරණ වෙළඳ සලක ප්‍රදර්ශන කවුළුවේ තිබූ භාණ්ඩ නරඹන ආකාරයට කාලය ගතකිරීමට පටන්ගත්තා. මම කළේ ඒ අවන්හලේ දොරටුව පසුකරගෙන ඉක්මන් ගමනින් ඉදිරියට යෑම. ඒ අවන්හල රුසියානු මෙන්ම අනික් විදේශික කම්කරුවන් ගැවසෙන තැනක් බව මට පෙනුණා. කවුන්ටරයෙන් වීදුරුවක් පිරෙන්නට බ්‍රැන්ඩි මිලදී ගෙන, ෂුකොව්ස්කි එය එක හුස්මට බීගෙන බීගෙන යන ආකාරය මං බලාගෙන හිටියා. ඒ දොරටුව අසල බිම තබා තිබුණු ලොකු දැන්වීම් පුවරුවකට මුවා වෙලා. බීම වීදුරුව අවසන් කළ වහාම ඔහු ඉදිරියට එන බව සහතිකයි. මං පියවර කිහිපයක් ඉදිරියට ගිහිං පාර අයිනේ නවත්වා තිබූ අශ්වකරත්තයකට මුවා වෙලා බලාගෙන හිටියා.

මිනිත්තු පහක් ගතවෙන්න කලින් ෂුකොව්ස්කි අවන්හලෙන් පාරට බැහැලා ඉදිරියට ආවා. ඔහුට යන්න ඇරලා මං බලාගෙන හිටියේ, නතාෂා කරන්නේ මොකක්ද කියලයි. පාර හරහා යළිත් අප සිටි පැත්තට ආ ඇය, ඉක්මන් ගමනින් ෂුකොව්ස්කි පසුපස ගියා. තමන් පස්සෙන් කව්රුවත් ඒවි කියන සැකයක් ඇයගේ තියෙන්න නැහැ. ඒ මොකද ඇය එකම සැරයක් වත් ආපසු හැරී බැලුවේ නෑ. සෙනග අතරින් යාර සියයක් පමණ ඉදිරියට ගමන් කළ ෂුකොව්ස්කි ඊළඟට නැවතුණේ, පරණ ඇඳුම් අලෙවි කළ සාප්පුවක් ළඟ. එහි පුළුල් දොරටුව දෙපැත්තේම කොකුවල එල්ලූ

වෛවර්ණ ගැහැනු හා ළමා ඇඳුම් තිබුණා. සෑහෙන පිරිසක් මේ ඇඳුම් සාප්පුවට ආ ගිය බව මට දකින්න ලැබුණා. නමුත් ෂුකොව්ස්කි මෙහි ගියේ මොන උවමනාවකටද කියා මට හිතාගන්න බැරිවුණා.

ඒ අතරම මං බැලුවා නතාෂා සෙෂෙංකෝවා මොකද කරන්නේ කියලා. ඇය යළිත් වරක් පාර හරහා ගමන් කළේ, පාරේ ගමන් කළ අශ්වකරත්ත අතරින් රිංගමින් පැනදුවමින්. පාරේ අනෙක් පැත්තේත් මෙ වර්ගයේම පරණ ඇඳුම් සාප්පුවක් තිබුණා. ඇය ඒක ඇතුළට ගියාද? මට ඒක හරිහැටි දැක ගැනීමට හැකියාවක් තිබුණේ නෑ. තවදුරටත් ඇය ගැන ඔත්තු බැලීමටත් මට හැකියාවක් තිබුණේ නෑ. මගේ අවධානය යොමු කළ යුතු වුණේ ෂුකොව්ස්කිට. සාප්පුවේ දොරටුව අසල කාන්තා හා ළමා ඇඳුම් විශාල ප්‍රමාණයක් එල්ලා තිබුණු බව මං ඔබට කිව්වා. දොරටුව ළඟ නැවතී, ඒවා අතින් අල්ලා බලමින් මගේ දෙනෙත් මං යොමු කළේ සාප්පුව ඇතුළට.

සාප්පුවේ වෙළඳ සහායකයා ෂුකොව්ස්කි හඳුනන කෙනෙකු වගෙයි. සිනහවෙමින් ඔවුන් යෙදුණේ සුහද කතාබහක. නමුත් වැඩිවෙලාවක් යන්න කලින්, ආයතනයේ උඩුමහලේ සිට කෙනෙකු තරප්පුව බැස ආවා. කළුපාට වුණු ඒප්‍රනයක් හැඳසිටි ඔහු තරුණයෙක්. ඔහුගේ දෑත් කළු පැහැති තීන්තෙන් වැසී තිබූ ආකාරය මා දුටුවා. මේ මුද්‍රණ යන්ත්‍රයක් ක්‍රියාකරවන්නකු බව තේරුම් ගැනීමට මට අපහසු වුණේ නැහැ. තම සාක්කුවෙන් කඩදාසි මිටිය අතට ගත් ෂුකොව්ස්කි, එය තරුණයා අතට දුන්නා. ඔහු එය දිග හැර කඩදාසි කිහිපයක් පරීක්ෂා කර බලා හිස සෙලෙව්වා. එවිට තම සාක්කුවෙන් මුදලක් අතට ගත් ෂුකොව්ස්කි එය මුද්‍රණකරුගේ අතට දුන්නේ එතැනින් පිටවීමට සූදානමෙන්. මං වහාම ආපසු හැරී පුළුවන් වේගයෙන් අවුත් යාල්ටා නිවසට පැමිණියා. ඒ අතරමගදී තොප්පිය සහ කබාය ගළවා අතට ගැනීමටත් මං අමතක කළේ නෑ. ඒවා මගේ කාමරය තුළට දමා මං දර පැළීම ඇරඹුවා. මිනිත්තු දහයකට පමණ පසු ෂුකොව්ස්කිත් තවත් මඳ වේලාවකට පසු නතාෂාත් නිවහනට ආවා.

ෂුකොව්ස්කි මුද්‍රණකරුවන් ලවා යම් පත්‍රිකාවක් රහසිගතව මුද්‍රණය කරවන බව පැහැදිලියි. නමුත් ඔහු කටයුතු කරන්නේ "ඔඛ්රනා" චරපුරුෂයෙකු ලෙසද එසේත් නැත්නම් ත්‍රස්තවාදී

කල්ලියේ අයෙකු ලෙසද? මේ කරුණ පැහැදිලිව හිතාගන්න මට තවමත් හැකියාවක් තිබුණේ නෑ. එතකොට නතාෂා සොෂෙංකෝවා කියන්නේ කවුද? ඇය සැබැවින්ම විශ්වවිද්‍යාලයක ශිෂ්‍යාවක් විය නොහැකියි. එක්කෝ රුසියානු රජය වෙනුවෙන්, නැතිනම් විප්ලවකාරී කල්ලිය වෙනුවෙන් ඔත්තු බලන්නියක්. එහෙමත් නැත්නම් ඕල්ගා කුමරිය ඝාතනය කළේ කවුද කියා හොයාගෙන, එය කවුන්ට් වෙරිකොෆ්ට දැනුම්දීමේ අරමුණෙන්, සෝදිසියෙන් සිටින්නියක විය හැකියි. යාල්ටා නිවසේ අපරාධකාරයකු සිටින බව කවුරුන් හෝ නිර්නාමික ලියුමකින් දැනුම් දී තිබූ බවට, කවුන්ට් කියූදේ මට මතක්වුණා. කොහොම වුණත් නතාෂා ගැනත් මගේ අවධානය තදින්ම යොමු කළ යුතු බව මට හැඟුණා.

මගේ කාමරය තිබුණේ නිවසේ කෑම කාමරයේ එක් බිත්තියකට යාබදව බව මං ඔබට කිව්වා. ඒ බිත්තියේ සෑදූ සිදුරක් මගින් යාල්ටාවේ නිවැසියන් හැසුරුණු හැටි රහසේ නිරීක්ෂණය කළ බවත් මං කිව්වා.

කෑම කාමරයට කවුරුන් හෝ ඇවිද ආ අඩිශබ්දයක් මට ඇහුණා. එතකොට වේලාව සවස හයට පමණ ඇති. තමන්ට තේ කෝප්පයක් පිළියෙල කරන මෙන් වෙන්න ඇති; ආ තැනැත්තා රුසියානු භාෂාවෙන්, ශබ්ද නගා කිව්වේ කුස්සියේ සේවිකාවට. මට ඒ කටහඬ පැහැදිලිව හඳුනාගැනීමට හැකිවුණේ නෑ. මං වහාම අර බිත්තියේ සිදුර වසා තිබූ ඡායාරූපය ඉවත් කොට එතැනට දෙනෙත් ළං කොට බැලුවා.

කෑම කාමරයේ මේසයක් අසල පුටුවක හිඳගෙන සිටියේ නතාෂා සොෂෙංකෝවා. ඇය සිටියේ මා සිටි තැනට අඩි අටක් දහයක් ඈතින්. තමන්ගේ සාක්කුවෙන් සිගරට්ටුවක් ගත් ඇය, එය දල්වා ගැනීමට සූදානම් වුණා. ඒ සඳහා ඇය ගිනිපෙට්ටියක් අතට ගත්තා.

කාන්තාවක් සිගරට්ටුවක් දල්වා ගැනීමේදී අනුගමනය කරන ක්‍රියා පිළිවෙත ඔබ නිරීක්ෂණය කර තිබෙනවාද වොට්සන්? එය පිරිමියෙකු සිගරට් දල්වන ක්‍රමයට වඩා සම්පූර්ණයෙන්ම වෙනස්. මොනවා ඔබ ඒ වෙනස දැක නැද්ද?

පිරිමියෙකු හැමවිටම සිගරට්ටුව කටේ ගසාගෙන, ගිනිකූර දල්වන්නේ, එය සිගරට්ටුව දෙසට ළං කරලා. එපමණක් නොවෙයි.

ඔවුන් හැමවිටම ගිනිකූරෙ දැල්ල ඇතින්ම ආවරණය කරනවා. ඒ සුළු සුළං පහරකින් හරි ගිනිකූර නිවීයෑම වළක්වන්න. නමුත් ගැහැනුන් ගිනිකූර දල්වන්නේ කොහොමද? සිගරට්ටුව කටේ තිබුණත් ඔවුන් ගිනිකූර දල්වන්නේ ගිනිපෙට්ටිය හැකිතරම් ඈතින් තබාගෙන, අත් පුළුවන් තරම් ඈතට දිගුකරලා. එහෙම කරන්නේ, යම් විදියකින් ගිනි පුපුරක් ඉවතට විසිවී, මුහුණ පිළිස්සුණොත් කියන හැඟීම, යටිසිතේ තිබෙන නිසා වෙන්න ඇති. ගැහැනිය ඉංග්‍රීසිද, ප්‍රංශද, ඉතාලිද, රුසියානුද කියා විශේෂයක් නෑ. ජාතිය මොකක් වුණත්, ඔවුන්ගේ හැසිරීම ඒ විධියමයි. ඒක, වයසට ගියත් මෙලෝ සිහියක් නැතුව ලස්සන ඇඳුම් හොයන, ගැහැනු ගතිය වගේමයි.

නමුත් නතාෂා තමන්ගේ සිගරට්ටුව දල්වා ගත්තේ කොහොමද? පිරිමියෙකු දල්වන විධියට ගිනිකූර මුහුණට ළංවෙන්න දල්වලා. මේ, ඒ කරුණ මට දකින්න ලැබුණු පළමු වැනි වතාව නොවෙයි.

වොට්සන් ඔබ වෛද්‍යවරයෙකු හැටියට දන්නවා තවත් කරුණක්. අත්ල ඉහළට පෙනෙන සේ අත ඍජුව ඉදිරියට දිගු කළාම, පිරිමියෙකුගේ අතේ වැළමිටෙන් ඉහළ කොටසත් වැළමිටෙන් පහළ කොටසත් තිබෙන්නේ ඍජු රේඛාවක. නමුත් ගැහැනියකගේ අතේ පහළ කොටස වැළමිටේදී මඳක් ඉවතට හැරී තිබෙන්නේ කෝණයක් සාදමින්. නතාෂාට තිබෙන්නේ පිරිමියෙකුගේ වැනි ඍජු අතක් බව මං නිරීක්ෂණය කළ තවත් කරුණක්. ඊළඟට ඇගේ උගුරේ "ආදම්ගේ ඇපලය", ගොරෝසු කටහඬ දෙකත් පිරිමි ලක්ෂණ.

තවත් මිනිත්තු දෙක තුනක් යද්දී ෂුකොව්ස්කි සහ අර නිශ්ශබ්ද තරුණයා බොරිස් දිමිත්‍රිච් කෑමකන කාමරයට ඇවිත් නතාෂා සමග කතාබහක් පටන්ගත්තා.

මං වහාම තීරණයක් ගත්තා. ඊළඟට කෑම කාමරයට ගිහින් මං කළේ මොකක්ද? සිගරට්ටුව බොමින් සිටි නතාෂාගේ කොණ්ඩයෙන් තදින් අල්ලාගෙන ඉවතට ඇද්දා. ඇය මාරාවේශයෙන් කෑගසමින්, මගේ දෑත්වලින් ඇද්දේ මගෙන් නිදහස් වීමට. මවිතයට පත්වුණු ෂුකොව්ස්කි හා දිමිත්‍රිච් දෙන්නාත් රුසියානු භාෂාවෙන් බෙරිහන් දුන්නේ මට පිස්සු හැදිලා කියල හිතාගෙන. නමුත් එක් මොහොතකින් සියල්ල වෙනස් වුණා. නතාෂාගේ දුඹුරු පැහැති අක්බමරු අලංකාර කොණ්ඩය ගැළවී

මගේ අතට ආවා. දැන් අපට දකින්න ලැබුණේ, යුද භටයන්ගේ මෝස්තරයට කෙටියට කැපූ කළු කොණ්ඩයක්.

සියල්ල වැටහීමට අනෙක් දෙදෙනාට ගතවුණේ මොහොතයි. "ඔත්තුකාරයෙක්! ඔත්තුකාරයෙක්!" කියා මහ හඬින් කෑගැසූ ඔවුන් දෙදෙනා, නතාෂාට පහරදීමට පටන්ගත්තේ දැඩි කෝපයෙන්. යාල්ටාවේ නිවැසියන් තවත් හත් අටදෙනෙකු දුව ආවේ මේ ශබ්දය ඇහිලා. ඔවුන්ගෙන් එකෙක් දර සහ ගල් අඟුරු මඩුවේ තිබූ කඹයක් ගෙන ආවා. ඊළඟට නතාෂාගේ කකුල් හා අත් ගැටගැසුවා.

පිරිස කෝපාවිෂ්ඨව නතාෂාට පහර දෙද්දී "ඇය" බේරාගැනීමට ක්‍රමයක් මට තිබුණේ නෑ. වහාම පොලීසිය හා අන්ද්‍රේ කැඳවීමට අකුලිනා පණිවුඩකරුවන් යැව්වා. පණිවුඩය ලැබුණාම අන්ද්‍රේ පමණක් නොවෙයි කවුන්ට් චෙරිකොෆ් සහ මගේ මිත්‍ර ඉවාන්‍ත් එතැනට ආවා. ඔවුන්ගේ අවසරය ඇතිව මං වහාම චෙරිකොෆ් මැදුර වෙත ගියා. ඒ මේක පුවත්පත්වල මහා ප්‍රවෘත්තියක් ලෙස පළවෙද්දී, මගේ නම ඊට පටළැවෙන එකට මා අකමැති වුණු නිසා.

සිද්ධිය පිළිබඳ සම්පූර්ණ කතා පුවත එදා රාත්‍රි මට අසන්නට ලැබුණේ ඉවාන්ගෙන් සහ ඔහුගේ පියාගෙන්.

'නතාෂා' නම් ගැහැනු වෙස් අරගෙන සිටි පුද්ගලයා, ඇත්තෙන්ම, සාර් රජුගේ "ඔච්රනා" රහස් පොලීසියේ චරපුරුෂයෙක්. ඔහුගේ සැබෑ නම මකාර් ගාෂින්. ඝුකොව්ස්කි හා දිමිත්‍රිව් මේ චරපුරුෂයාට අනුකම්පා විරහිතව පහරදීල තියෙනවා. සම්පූර්ණ සත්‍යය හෙළිකරන බවට පොරොන්දු වෙලා, තමා මරා නොදමන මෙන් ගාෂින් ආයාචනය කළාලු. අන්තිමට කවුන්ට් චෙරිකොෆ්ගේ හා අන්ද්‍රේගෙත්, පොලීසියෙත් මැදිහත්වීමෙන් තමයි, ගාෂින් නම් චරපුරුෂයාගේ ජීවිතය බේරාගැනීමට හැකිවී තිබෙන්නේ.

සාර්ගේ රහස් පොලීසියෙත් චරපුරුෂයා ගාෂින්ව එංගලන්තයට එවා තිබෙන්නේ කටයුතු දෙකකට. එකක් කවුන්ට් චෙරිකොෆ් සහ ඔහුගේ පවුලේ අය මැදුරෙන් එළියට යද්දී, බෝම්බයක් පුපුරවා මරාදැමීමට. අනෙක ඔල්ගා මිකයිලොව්නා කුමරිය මරා දැමීමට. මේ සඳහා "ඔච්රනා" වෙන් චරපුරුෂයන් හතර දෙනෙක් එංගලන්තයට ඇවිත් තියෙනවා. ඔවුන් සැඟවී සිටින තැන් හා තොරතුරු සියල්ල මේ කල්ලියේ නායකයා වුණු ගාෂින් හෙළි කළාලු.

මොහු ගැහැනියක ලෙස වෙස්වළාගෙන, නතාෂා යයි නමක් අරගෙන යාල්ටාවේ අනික් අය රැවටූ බව ඇත්ත. නමුත් ඔල්ගා කුමරිය වැඩිහිටි කාන්තාවක්. නතාෂාගේ මේ රඟපෑමට ඔල්ගා කුමරිය රැවටී නැහැ. නතාෂා හෙවත් ගාෂින් ගෙදර නොහිටි වෙලාවක, ඔල්ගා කුමරිය ගාෂින්ගේ කාමරය සෝදිසි කර තිබෙනවා. හැම කාමරයකම අමතර යතුර තිබෙන්නේ ඇය භාරයේ නිසා, මේක ඇයට අපහසු වෙන්න නැහැ. කාමරයේ තිබූ රහස් ලියකියවිලි ඔල්ගා කුමරිය දකින්න ඇති. ඇය විසින් කළ යුතුව තිබුණේ මේ ගැන රහසිගතව කවුන්ට් චෙරිකොෆ්ට දැනුම්දීම. නමුත් කෝපාවිෂ්ඨ වුණු ඇය කර තිබුණේ ගාෂින්ට බැණ වැදී, යාල්ටාවෙන් පිටවෙන ලෙසට තර්ජනය කිරීමයි.

එදා රාත්‍රියට පමණක් තමාට නවාතැන් දෙන ලෙස ආයාචනය කළ ගාෂින්, ඔල්ගා කුමරිය ඝාතනය කර ඇගේ කට වසාදැම්මා. මේක කොහොමටත් ඔහුට පැවරී තිබුණු එක් කටයුත්තක්. ඔහු කාමරයට ඇතුළු වී තිබුණේ මං කියූ ආකාරයට, දොර අගුල විවෘත කර ගැනීමෙන්.

කවුන්ට්වරයාගේ බලකිරීම මත ෂුකොව්ස්කිගේ සැබෑ අනන්‍යතාවය හෙළිකිරීමට ඔහුටත් සිදුවුණාලු. ඔහුගේ සැබෑ නම වෙනත් එකක්. ඔහු සාර් රජය පෙරළා දැමීමට හවුල් වන මෙන් ගොවි කම්කරුවන්ගෙන් ඉල්ලා හිටි පුවත්පතක කර්තෘවරයෙක්. මේ වැරැද්දට සාර්ගේ රහස් පොලිසිය මඟින් අල්ලා ගනු ලැබූ ඔහු සැන්පීටර්ස්බර්ග් නුවර බන්ධනාගාරයට යැවුණාලු. උමඟක් හාරාගෙන ඔවුන් බන්ධනාගාරයෙන් පැනගත්තලු. ඉන්පසු එංගලන්තය බලා පලා ආවලු. ඔහු සහ බොරිස් දිමිත්‍රිච් දෙදෙනාම එකට හිරේ ඉඳලා එකට හිරෙන් පැනපු අය. එංගලන්තයට ආවාට පසු තමන්ගේ විප්ලවකාරී අදහස් වෙනස්කරගත් බවයි ඔහු කිව්වේ. එදා අර මුද්‍රණකරුවාට ඔහු දුන්නේ කොටස් වශයෙන් පුවත්පතක පළ කිරීමට ඔහු ලියූ ආදර කතාවක්ලු. ඒක රුසියාවෙන් එංගලන්තයට ඇවිත් ඉන්න, සරණාගතයන් අතර කියැවීමට ගැනුණු පුවත්පතක්. ඔවුන් දෙදෙනා තවදුරටත් යාල්ටා නිවසේ තබාගැනීමට කවුන්ට් තීරණය කරාද නැද්ද යන කරුණ මම දන්නේ නැහැ. ඊට සතියකට පමණ පස්සෙ එක දවසක් මගේ මිත්‍ර ඉවාන් සහ කවුන්ට් චෙරිකොෆ් මා හමුවෙන්න මොන්ටේගු වීදියේ මගේ නිවහනට ආවා.

"හෝම්ස් මහත්මයා" කවුන්ට්වරයා කිව්වේ මගේ අතට ලොකු මුදලක් සහ ත්‍යාගයක් පිරිනමමින්. "ඔබ මේක භාරගත යුතුමයි. ඒ මොකද ඔබ කළේ අභිරහස විසඳීම පමණක් නොවෙයි. චෙරිකොෆ් පවුලේ හැමදෙනාගෙම ජීවිතත් ඔබ බේරාගත්තා. ඔබ ගොළු බිහිරෙකු වගේ යාල්ටා නිවසට නොයන්න, අර අපරාධකාරයා හඳුනාගන්න කවදාවත් අපට ඉඩක් ලැබෙන්නෙ නෑ. එහෙනම් ඔහු මේ රටින් පිටවී යන්නෙ, අප හැමදෙනාම ඝාතනය කරලා. මේ කලබල, කැරලි කෝලාහල, විප්ලව ඉවරවෙලා රුසියාව සාමකාමී රටක් බවට පත්වුණොත්? එදාට අපි ආපසු රුසියාවෙ ස්ථිර පදිංචියට යනවා. එදාට රුසියාවෙ දීර්ඝ නිවාඩුවක් ගතකරන්න එන ලෙස මං ඔබට ආරාධනා කරනවා."

# පුරාවිද්‍යාඥයෙකුගේ අභිරහස් මරණය

ඒ 1883 මාර්තු මාසයේ දිනයක උදේ කාලයයි. උදේ තේ පානයෙන් පසු මම වෛද්‍ය පුස්තකාලය වෙත ගියෙමි. අහස කළු වලාකුළෙන් වැසී තිබුණත්, වැස්සක් ඉක්මනින් කඩාවැටේවි යයි මම නොසිතුවෙමි. එහෙත් හදිසියේ ඇද හැළුණේ ධාරානිපාත වර්ෂාවකි. මා එයට හසුවිය. කුලීරියක් ඉක්මනින් අල්ලා ගැනීමටද මට නොහැකි විය. ඒ නිසා මගේ ඇඳුම් පැළඳුම් පමණක් නොව, අතේ තිබූ පොත්පත් ද සම්පූර්ණයෙන්ම තෙමී ගියේය.

බේකර් වීදියේ අපේ නිවහනට මා ළඟාවන විට නිවස තිබුණේ අඩඅඳුරේයි. මට සුපුරුදු කටහඬ අපේ විසිත්ත කාමරය තුළින් විත් මගේ දෙසවණට වැටිණි.

"මගේ හිතවත් මිත්‍රයා. ඔබ සම්පූර්ණයෙන්ම තෙමුණා නේද වැස්සට අහුවෙලා? මං ජනේලයෙන් බලාගෙන හිටියේ. ඉක්මනට ඇඳුම් මාරු කරගෙන එන්න. අද කෝපි වෙනුවට හඩ්සන් මහත්මියට අපට එවන්නේ උණුසුම් චොකලට් පානය. ඔබ ආපසු ආවේ හොඳ වෙලාවට"

මම ඇඳුම් මාරු කරගෙන ඉක්මනින් විසිත්ත කාමරය වෙත පැමිණියෙමි. එහෙත් චොකලට් පානය ඇරඹීමටත් පෙර, අමුත්තෙක් හෝම්ස් හමුවීමට පැමිණියේය. ඒ ස්කොට්ලන්ඩ්යාඩ් පොලීසියේ අපරාධ පරීක්ෂක අපේ හිතවත් ලෙස්ට්‍රේඩ්ය.

"අද නම් මං ආවේ හොඳ වෙලාවට" ලෙස්ට්‍රේඩ් කීවේ දල්වා ගැනීමට සූදානම් වූ සුරුට්ටුව සාක්කුවට දමා, හෝම්ස් දුන් චොකලට් කෝප්පය අතට ගනිමිනි. "හෝම්ස් මහත්මයා. මං මේ වැස්සෙම ආවෙ රාජකාරි වැඩකට ඔබ කැඳවාගෙන යන්නයි. ඒ කිංස්ටන්වලට. ඊයේ රාත්‍රි එහේ දරුණු මිනීමැරුමක් සිද්දුවෙලා. ඒක ගැටලු සහගත එකක් බවයි එහේ පොලීසිය කියන්නේ. ඒ හින්දා ප්‍රමාද නොකර ඔබවත් කැඳවා ගෙන කිංස්ටන් ගියොත් හොඳයි කියලයි මට හිතුණේ. වැස්ස නොබලා යමු. ඒ පැත්තට යන ශීඝ්‍රගාමී දුම්රියක් පිටත්වෙනවා, චාරිංක්‍රොස්වලින් තවත් පැය භාගයකින්"

"ඕකනේ වොට්සන් මං හැමදාම කියන්නේ පොලීසියෙ අයට කිසි අනුකම්පාවක් නැහැ කියලා. බලන්න ඔබ වැස්සෙ තෙමිල තෙමිල ගෙට ඇවිත්, ඇඳුම් මාරුකළා විතරයි. ලෙස්ට්‍රේඩ් කතාකරන්නේ ආයෙමත් එළියට යන්න" මගේ මිත්‍රයා කීවේ සිනහවෙමිනි.

"හෝම්ස් මහත්මයා. ඔබම නේ අපට උපදෙස් දීල තියෙන්නේ; අපරාධයක් සිදුවුණු තැන පරීක්ෂා කිරීමට ප්‍රමාද වෙන්න හොඳ නෑ කියල" ලෙස්ට්‍රේඩ් කීය.

"හරි හරි. අපි ඉක්මනට පිටත්වෙමු"

මිනිමැරුම ගැන තමාට දුරකතනයෙන් අසන්නට ලැබුණු කරුණු අපට දැනුම්දීමට ලෙස්ට්‍රේඩ් උත්සාහ කළේය. එහෙත් එය තමාට නොපවසන මෙන් මගේ මිත්‍රයා ඉල්ලා සිටියේය. තමා මඳවේලාවකින් එතැනට යන නිසා, මේ ආකාරයට විස්තර දැනගැනීම අවාසියක් විය හැකි යයි හෝම්ස් කීය.

කිංස්ටන් දුම්රියපොළෙන් අප බසින විට, දහවල් කෑම වේලාවද පසුවී තිබිණ. එම ප්‍රදේශය භාර කිංස්ටන් පොලීසියේ ප්‍රධානියා අප පිළිගැනීමට දුම්රියපොළට පැමිණ සිටියේය. පර්සි රිපන් නම්වූ ඔහු බොහෝ කලකට ඉහතදී ලෙස්ට්‍රේඩ් යටතේ පොලිස් පුහුණුව ලැබූවෙකු බව අසන්නට ලැබිණ.

"හෝම්ස් සහ වොට්සන් මහත්වරු දෙදෙනා ගැන අහන්න ලැබිලා බොහොම කල්" රිපන් කීය. "ඒත් මුලින්ම දකින්න ලැබුණෙ අද. ඔබ හමුවීම විශාල සතුටක් මහත්වරුනි."

"රිපන්. අපි තවමත් දවල් කෑම කාල නෑ." ලෙස්ට්‍රේඩ් කීය. "කෑම වේල අවසන් කරලම වැඩ පටන්ගමු"

දුම්රියපොළ ආසන්නයේම වූ අවන්හලක විශේෂ කාමරයක් වෙත අප කැඳවාගෙන යන ලදි. සිද්ධිය පිළිබඳ විස්තරයක් පොලිස් නිලධරයා අප වෙත පැවසුවේ දිවා ආහාරය ගන්නා අතරතුරදී ය. "මියගිය පුද්ගලයා මාලන් හිල් නම් හැටදෙහැවිරිදි අවිවාහක කෙනෙක්"

"ඔබ ඔය කියන්නෙ ඊජිප්තු පුරාවිද්‍යාඥ මාලන් හිල්ද?" හෝම්ස් විමසීය.

"අන්න හරි" රිපන් කීය. "ඔහු දීර්ඝ කාලයක්, ඒ කියන්නේ අවුරුදු විස්සක පමණ කාලයක් ඊජිප්තුවට වෙලා කැණීම් කටයුතුවල යෙදුණාලු. එතැනින් විශ්‍රාම අරගෙන එංගලන්තයට ඇවිත් අවුරුදු දෙකක් යද්දී, නිව්යෝක් කෞතුකාගාරයේ ඊජිප්තු අංශය භාර ගැනීමට

ඔහුට ඇරයුමක් ලැබුණා. ඊට පස්සේ අවුරුදු තුනක් පමණ එහෙත් ගතකරල, ආපහු එංගලන්තයට ඇවිත් මාස කිහිපයලු ගතවුණේ.

නගරබද කලබලකාරී ජීවිතයෙන් මිදිල විවේක සුවයෙන් කල් ගෙවන්න, මුලින් ඔහුට උවමනා වුණාලු. ඉතින් කිංස්ටන් ඉඳල හැතැක්ම පහක් දුර බ්ලැක්හීත් කියන ඔහුගේම ගමේ තිබෙන, රැම්සේ නම් වත්තක මැද පිහිටි නිවසක තමයි ඔහු පදිංචි වෙලා හිටියේ. හිල් මහත්මයා ගැන බලාගන්න පවුලේ ඥාතියෙකු නොහිටි නිසා, ඒ කටයුතු කෙරුණේ හැරිසන් නම් වයසක ජෝඩුවක් අතින්. මියගිය මාලන් හිල් මහතා පදිංචිව සිටි "හිල් හවුස්" නිවසට හැතැක්මක් පමණ දුරින් පිහිටි නිවසක තමයි හැරිසන් ජෝඩුව පදිංචි වෙලා හිටියේ. උදේ හතට මේ ගෙදරට එන ඔවුන් ගෙදර පිරිසිදු කිරීම, රෙදි සේදීම, ඉවුම් පිහුම් කරලා හැන්දෑවෙ හතරහමාර වෙද්දි ගෙදරින් පිටවෙලා යනවලු. ගෙදරට අමුත්තෙක් එන දවසක් වුණොත් ඔවුන් ඒ අමුත්තාටත් එක්ක අමතර කෑම පිළියෙල කර තබා යනවාලු. ඊයෙත් ඒ වගේ දවසක්.

මාලන් හිල් මහත්මයා නෑදැයන් කාත් කවුරුත් නැති කෙනෙකු කියා මං මුලින්ම කිව්වා. නමුත් ඒක සියේට සීයක් නිවැරදි නැහැ. ඔහුට ඉන්නවා රසල් හිල් නම් ඥාති සොහොයුරෙක්. ඒ මහත්මයා පදිංචි වෙලා ඉන්නේ ලන්ඩන් නගරයේ. මාලන් මහත්මයාගේ ඇඩි ඉල්ලීම නිසා, රසල් මහත්මයා මේ ගෙදරට එනවලු සති අන්තයට දවසක් හෝ දෙකක් ගත කරල යන්න. ඒ මාසෙකට පමණ වාරයක්. ඊයේ හැන්දෑවත් රසල් හිල් මහත්මයා, රැම්සේ වත්තේ හිල් හවුස් නිවසට පැමිණි දවසක්.

තමන්ගේ රැකියාවේ රාජකාරි කටයුතු අවසන් කරලා හවස ලන්ඩනයෙන් පිටත් වෙන ඔහු, හිල් හවුස් වෙත එද්දී ඇඳිරි වැටී අවසන්ලු. අමුත්තාටත් එක්ක කෑම පිළියෙල කළ හැරිසන් යුවළ හිල් නිවසෙන් පිටවෙලා යද්දි, වෙලාව හවස 4.35 පමණ වෙලා තියෙනවා. මාලන් මහත්මයාගෙ හැසිරීමේ කිසිම වෙනසක් තිබිලා නැහැ.

රසල් හිල් මහත්මයා මේ ගෙදරට ළඟාවෙද්දී රෑ 7 පමණ වෙලා තියෙනවා. වෙනදා ඔහු මේ ගෙදරට එද්දී ඉස්තෝප්පුවේ වගේම ඉස්සරහ දොර අසල පහන් දල්වා තියෙනවාලු. නමුත් ඊයෙ රෑ ඒ ආකාරයට පහන් දල්වා තිබිල නැහැ. ආලෝකයක් දිස්වුණේ, මාලන් මහත්මයාගේ කන්තෝරු කාමරයෙන් පමණයි.

ගෙදර ළඟට ආව රසල් තමන්ගේ ඥාති සොයුරා අමතා කථා කළාලු "මාලන්! මාලන්!" කියමින්. නමුත් ඊට කිසිම ප්‍රතිචාරයක් ලැබිල නෑ. තුන් හතර වාරයක් කථා කරලත් පිළිතුරක් නැතිවුණාම, ඔහු තදින් දොරට තඩි බෑවලු. සීතුව කැඩිල නිසා තමන්ගේ සාක්කුවේ තිබුණු යතුරු කැරැල්ලකින් ජනෙල් විදුරුවට තට්ටු කළාලු. බලාපොරොත්තු කඩවුණු ඔහු යළිත් වරක් "මාලන්! මාලන්! මම රසල්. දොර අරින්න!" කියමින් කෑගැසුවා. ඒ අතරේ දී ඔහුට අහන්න ලැබුණා, නිවස ළඟින් වැටුණු පාරේ කවුදෝ ඉහළට ඇවිද ඇවිත් ගේට්ටුව ළඟ නැවතුණු ශබ්දය. ඔහු දුටුවා ලන්තෑරුමක් අතින් ගත් පුද්ගලයකු නිවසේ ගේට්ටුව ළඟටම ඇවිත් බව.

"මොකද? ඔබට ප්‍රශ්නයක්ද?" ඒ අමුත්තා ඇසුවා.

"ඔබ කවුද?"

"මම මුර සංචාරයේ යෙදෙන පොලිස් භටයෙක්. ඔබ කවුද?"

"මගේ නම රසල් හිල්. මේ මගේ ඥාති සොහොයුරු මාලන් හිල්ගේ නිවස"

"මේ මාලන් හිල් මහත්මයාගේ නිවස බව මං දන්නවා. දැන් මොකක්ද ප්‍රශ්නේ?"

"සිකුරාදා හැන්දෑවට මං මෙහේ එන බව ඔහු දන්නවා" හිල් කිව්වා. "ඔහු සාමාන්‍යයෙන් ගෙදරින් එළියට යන්නේ නෑ. රෑ වුණු වෙලාවට නම් කොහොමටවත් යන්නෙ නෑ. දැන් මං කොච්චර දොරට ගසමින් කෑගැහුවද? ඒත් ඔහු දොර අරින්නේ නෑ. ඔහුට මොකක් හරි කරදරයක් වත්ද කියා මට බයයි"

"ඔහුට කවුරුවත් සේවකයන් නැද්ද?"

"වයසක ජෝඩුවක් ඇවිත් දවල් දවසේ ගෙදර වැඩකරල දීල යනවා. මං හිතන්නේ හතරහමාර වෙද්දී ඔවුන් පිටවෙලා යනවා."

"මං කන්ද නැග එද්දීත් මට ඇහුණා ඔබ කෑගහන ශබ්දය" පොලිස් භටයා කිව්වා. "අපි බලමු මේ ප්‍රශ්නය විසඳා ගන්න....... අර බලන්න!" පොලිස් භටයා කිව්වෙ පියන විවෘත කර තිබූ ඉහළින් පිහිටි ජනේලයක් පෙන්වමින්. "දැන් අපි මොකද කරන්නේ?"

"මාලන්ට තදින්ම නින්ද ගිහින්ද දන්නෙ නෑ" රසල් හිල් කිව්වා. "කරන්න වෙන වැඩක් නැති නිසා, ඔහු හාන්සි පුටුවට වෙලා විස්කි ටිකක් වැඩිපුර බොනවා. ආයෙත් දොරට ගහලා බලමු"

ඔවුන් ජනෙල්වලට හා දොරවල්වලට ගසමින් කෑගැහුවත් දොර විවෘත කෙරුණේ නෑ.

"මොන ක්‍රමයකින් හරි ගේ ඇතුළට ගිහින් බලන්න ඕනැ" කියූ පොලිස් භටයා, ගේ පිටුපසට ගිහින් පරණ ඉණිමඟක් ඔසවා ගෙන ආවා. ඒක ජනේලය ළඟ බිත්තියට හේත්තු කළ ඔහු ඉහළට නැගුණා. ජනෙල් කවුළුවෙන් ඇතුළුවුණු ඔහු ගියාලු, එළියක් දිස්වුණු කන්තෝරු කාමරයට. පොලිස් භටයාට දකින්න ලැබුණේ කුමක්ද?

කාමරය අනික් පැත්ත පෙරලා තිබුණු හැටි කිව්වොත් හරි. අල්මාරිවල තිබුණු දේ එළියට ඇදල දාල. මේස ලාච්චු ඇදල. ඒ දේවල් බිමට දාල. පුටු පෙරළිලා. ඒ ඔක්කොටම වඩා ගෙහිමියා - මාලන් හිල් මහත්මයා! ඔහු මුනින් අතට බිම වැටිලා හිටියේ පුටුවත් එක්කම. එතැනින් ගලා ගිය ලේ පාරක් මාෂ් නම් මේ පොලිස් භටයා දුටුවා. මාලන් හිල් මහත්මයා සිටියේ මියගිහින් බව තේරුම් ගන්නට, දෙපාරක් බලන්න මාෂ්ට උවමනා වුණේ නෑ. ඔහු ජනේලය ළඟට ගිහින් රසල් හිල් අමතා කෑගැහුවා.

"රසල් මහත්මයා. කණගාටුයි කියන්න. ඔබේ ඥාතියාට ලොකු කරදරයක් වෙලා. ඔහොම ඉන්න මම ඔබව ඇතුළට ගන්න"

ඉස්සරහ දොරේ යතුරු දමා වසා තිබුණත් යතුර පෙනෙන්න තිබුණේ නෑ. රසල් හිල් ගේ ඇතුළට ආවේ පොලිස් භටයා විවෘත කළ ගෙදර පිටුපස දොරෙන්.

"දෙයි හාමුදුරුවනේ!" මළසිරුර දුටු රසල් හිල්ට කෑගැසුණා. "කවුද මේ අපරාධෙ කළේ? මේ අසරණ මනුස්සයා මරා දැමුණේ මොන අරමුණකින්ද? දෙවියනේ! මට ඉඳපු එකම නෑදෑයා."

"ඔහුව මරාදමන්න ඇත්තේ මොනවා හරි සොයන්න ආ කෙනෙක්" මාෂ් කිව්වා. "ඒක හුඟක් වටිනා වස්තුවක් වෙන්න ඇති. අල්මාරි ඇදල දාල තියෙන ආකාරයෙන් ඒක හිතාගන්න පුළුවනි"

මාෂ් මීළඟට නිවසෙන් එළියට ආවා. ඒ රසල් හිල් සමඟ.

"දැන් මේ අපරාධය ගැන මං වහාම පොලිස් ස්ථානයට දැනුම් දිය යුතුයි" මාෂ් කිව්වා. "මේ කිට්ටුවක වෙනත් ගෙයක් තියෙන බවක් මට නම් මතක නැහැ. ඔබ දන්නවද?"

"ගෙයක් ළඟම තියෙන්නේ හැතැක්ම එකහමාරක් විතර දුරින් බවයි මං අහල තියෙන්නේ" රසල් කිව්වා. "ඒ මං හිතන්නේ බ්ලැක් හීත්වලින් එන පාර බෙදෙන මංසන්ධිය?"

"ඔව්. ඔබ කියුවා හරි" මාෂ් ඊට එකඟවුණා. "මුර සංචාරය සඳහා එන අපි, එක එක පැතිවලට හැරී යන්නෙ ඔය හතරමං හන්දියේදි.

ඔබට පුළුවන්ද එතැනට ගිහිං, පොලිස් භටයෙකු හමුවෙලා මේ අපරාධය ගැන දැනුම් දෙන්න? මේ ලන්තෑරුම අරගෙන යන්න. කණගාටුයි. මට එන්න හැටියක් නෑ. මං මෙතැන මුරට සිටිය යුතුයි."

මාෂ් එවූ පණිවුඩය ලැබුණු වහාම මං මෙතැනට ආවා. මේක බොහොම සංකීර්ණ, විසඳීමට අපහසු අපරාධයක් බව දුටු වහාම මට තේරුණා. ඒ නිසා මං ඒ නිවස තුළ කිසිම දෙයක් එහා-මෙහා කළේ නෑ. හැකි ඉක්මනින් ස්කොට්ලන්ඩ්යාඩ් පොලීසියට විදුලි පුවතක් එව්වේ ඒ නිසයි."

"පර්සි රිපන් මහත්මයා. ඔබ කටයුතු කරල තියෙන ආකාරය ඉතාම නිවැරදියි" හෝම්ස් කීය. "මේ වගේ දේවල් ඔබට කියා දෙන්න ඇත්තේ මේ ලෙස්ට්‍රේඩ් මහත්මයා වැනි ජ්‍යෙෂ්ඨ නිලධරයන් වෙන්න ඇති. මියගිය පුද්ගලයාගේ ඥාති සොහොයුරා තවමත් මෙහේ රැඳී ඉන්නවද?"

"ඔව් මහත්මයා. අපරාධ පරීක්ෂණයට ස්කොට්ලන්ඩ්යාඩ් නිලධරයන් එනතුරු මඳක් රැඳී ඉන්න කියලා, මං ඔහුගෙන් ඉල්ලා හිටියා. ඔහු ඊට එකඟවුණා"

"මොකක්ද ඔබ කියූ වත්තේ නම? කොහොමද අපි එතැනට යන්නේ? කොයිතරම් දුරද?" ලෙස්ට්‍රේඩ් විමසීය.

"මෙහේ ඉඳල බ්ලැක්හීත්වලට හැතැක්ම පහක් දුරයි." රිපන් කීය. "ඒ පාර හරිහැටි සකස් කළ පාරක් නෙමෙයි. ගල් අතුරා සකස් කළ එකක් බව ඇත්ත. නමුත් එච්චර පළල එකක් නොවෙයි. අනික සමහර තැන්වල ගල් ගැලවී වළවල් සෑදිලා. බ්ලැක් හීත් මංසන්ධියේ ඉඳලා රැම්සේ වතුයායට තියෙන්නේ ගුරු පාරක්. ඒක තරමක් කඳුකරය නිසා වංගු සහිත පාරක්. මේ ඉඩම් බොහොම ඉස්සර කාලයේ තිරිඟු හා පලතුරු වගා කිරීමට යොදාගත්තාලු. ඒ කාලයේ වතු අධිකාරිවරයාට අයත්ව තිබූ බංගලාව තමයි පසු කාලයක "හිල් හවුස්" බවට පත්වුණේ"

"දුම්රියපොළේ ඉඳල එතැනට අශ්වකරත්තයකින් යන්න කොයිතරම් වෙලාවක් ගතවෙනවද?" හෝම්ස් විමසුවේය.

"කිංස්ටන් සිට බ්ලැක්හීත් දක්වා හැතැක්ම පහ නම් මිනිත්තු විස්සකින් හෝ විසිපහකින් යා හැකිවේවි." රිපන් කීය. "ඉතිරි හැතැක්ම එකහමාර......? මට ඒක කියන්න අමාරුයි ෂර්ලොක් හෝම්ස් මහත්මයා. අපි ඒක ගිහිල්ලම බලන්න වෙනවා.

"බොහොම හොඳයි"

දිවා ආහාරයෙන් පසු, හතරදෙනෙකුට යාහැකි තරමක ලොකු කුලීරියකින්, ගමන් ඇරඹීමට බලාපොරොත්තු වූයෙමු. එහෙත් ඒ මාර්ගය පටු නිසා සමහර තැන්වල කුලීරථ දෙකක් මාරුවීමට පවා අපහසු බැව් රියැදුරා කීය. ඔහු පැවසුවේ දෙදෙනෙකුට යා හැකි කුඩා කුලීරියක් යොදා ගැනීම වඩාත් යෝග්‍ය බවයි. ඒ අනුව දෙදෙනෙකුට පමණක් යාහැකි කුඩා රථ දෙකක් කැඳවාගැනීමට අපට සිදුවිය.

මිනිත්තු විස්සකින් පමණ බ්ලැක්හීත් වෙත ළඟාවීමට හැකි යයි රිපන් පැවසුවත් අපට ඒ සඳහා මිනිත්තු හතළිහක් පමණ ගතවී තිබිණ. රම්සේ වතුයායේ "හිල් හවුස්" මැදුර වෙත යාමට තවත් මිනිත්තු පහළොවක් ගතවිණි ඒ අනුව දුම්රිය පොළේ සිට ගමනාන්තය වෙත ඒමට අපට පැයකට කිට්ටු කාලයක් ගතවිය.

නිවස මුරකරමින් සිටි පොලිස් භටයෝ තම ප්‍රධානීන් දුටු විගස ආචාර කොට දොරටුවෙන් ඉවත්වූහ.

"මං කිසිම දෙයක් කළේ නෑ. මළසිරුර තිබුණේ ඔය විදියටමයි" පොලිස් නිලධරයා කීවේ අප කන්තෝරු කාමරය වෙත කැඳවාගෙන යමිනි. අඩි දහඅටක් පමණ දිග, අඩි දොළහක් පමණ පුළුල් වූ එය, සෑහෙන තරම් විශාල කාමරයක් විය. විසිත්ත කාමරයේ උදුන තරම් විශාල නොවූවත් මෙහිද ගිනිඋදුනක් තිබිණ. යකඩින් තැනූ ආරක්ෂක වැටක්ද ඒ වටා විය. මාලන් හිල් මහතා ඇද වැටී තිබුණේ මෙය ඉදිරිපිටයි. උදුනට අඩි තුනක් පමණ මෙපිටින් කුඩා හාන්සි පුටුවක්ද බිම පෙරළී තිබිණි.

මෘත ශරීරය හා පුටු තිබූ ආකාරය ගැන සටහනක්, හෝම්ස් තම පොතේ ඇඳ ගත්තේය. ඉන්පසු මෘත ශරීරය, විසිත්ත කාමරයේ හිස්ව තිබූ ලොකු මේසය මතට ගෙන යන මෙන්, පොලිස් භටයනට නියම කළේය. අප සැම දෙනෙකුගේම අවධානය එක්වරම යොමුවූයේ මියගිය හිල් මහතා වම් අතේ බැඳ තිබූ අත්ඔරලෝසුව වෙතයි.

"අත් ඔරලෝසුවටත් එක්ක පහර එල්ල වුණාද? එහෙමත් නැත්නම් වැටෙද්දී ඔහුගේ වම් අත ආරක්ෂක යකඩ වැට මත වැදෙද්දී, ඔරලෝසුව ඒකෙ වැදුණාද? මොකුත් හිතාගන්න අමාරුයි" ලෙස්ට්‍රේඩ් කීය. "වීදුරුව බිඳිලා. වෙලාව නැවතිලා. මේක අපට ලොකු පහසුවක්. එහෙම නේද හෝම්ස් මහත්මයා?"

"මේකෙ තිබෙන වෙලාව කීයද?"

"පහ පසුවී මිනිත්තු දෙකයි"

"මේක ස්විට්සර්ලන්තයේ නිෂ්පාදිත, ඉතාම හොඳ වර්ගයේ රොලෙක්ස් අත් ඔරලෝසුවක්" හෝම්ස් කීය. "කරුණාකරල මේක අතේ බැඳ තිබෙන ගාංචුවෙන් ගලවා මා අතට දෙන්න"

අතේ මැණික් කටුව මත ඔරලෝසුව බැඳ තිබූ තැනද, හෝම්ස්ගේ සියුම් පරීක්ෂාවට ලක්විය.

කාමරයේ එක් බිත්තියකට හේත්තු වන්නට ඉදිකර තිබූ පොත් රාක්කයේ, පොත් රැසක් බිම දමා විසුරුවා තිබිණ. බිත්ති අල්මාරි දෙකක, වීදුරු බිඳ දමා අගුල් කඩා තිබූ අයුරු අපි දුටුවෙමු. හෝම්ස් ඒ පිළිබඳව සටහන් තබාගත් ආකාරය අපි බලාසිටියෙමු. කාමරයේ එක් කෙළවරක වූ ලාච්චු අල්මාරියේ අගුල කඩා, එහි ලාච්චු එළියට ඇද තිබූ සියලු දේ බිම විසුරුවා දමා තිබිණ.

"ආපු පුද්ගලයා කවුරු වුණත්, ඔහු නොඉවසිල්ලෙන් මොකක් හරි හොයපු බවයි පෙනෙන්නේ" ලෙස්ට්‍රේඩ් කීය.

"දීර්ඝ කාලයක් ඊජිප්තුවෙත්, පසුව ඇමරිකාවෙත් කාලය ගත කළා නම්, ඔහු සෑහෙන ධනයක් උපයාගෙන ඇති" හෝම්ස් කීය. "අපරාධකාරයා කවුරු වුණත් ඒ ගැන හොඳින් දැන හිටි බවයි මට හිතෙන්නෙ"

තවත් කුඩා අශ්වකරත්තයක් නිවස වෙත ළඟාවෙන ශබ්දය අපට ඇසිණ. ඒ මෘත ශරීරය කිංස්ටන් වෙත ගෙනයාම සඳහා පැමිණි රථයයි. පශ්චාත් මරණ පරීක්ෂණය එදින හවස තුනට කිංස්ටන් හිදී පැවැත්වෙන බැව් පොලිස් නිලධර රිපන් පැවසීය. තම කාචය කබා සාක්කුවෙන් ගත් හෝම්ස්, යළිත් වරක් මෘත ශරීරයේ හිසේ තිබූ තුවාලය වෙත අවධානය යොමු කළේය. ශරීරයේ අනෙක් තැන්ද පරීක්ෂා කර බැලූ පසු, මෘත ශරීරය ඉවත් කරගෙන යාමට හෝම්ස් අවසර දුන්නේය.

ඉන්පසු ඔහු සෑහෙන වේලාවක් ගත කළේ නිවසේ සෑම තැනක්ම පරීක්ෂා කර බැලීම සඳහායි. අපරාධකාරයා නිවස තුළට පිවිස, පිටවී ගිය ජනේලය, ඒ අවට පොළොව ද හෝම්ස්ගේ අවධානයට ලක්විය. මේ සියලු කටයුතු නිමකළ පසු රිපන් හෝම්ස් ඇමතුවේය.

හිල් මහත්මයාගේ නිවසේ වැඩ කටයුතු කරමින්, ඔහු රැකබලාගත් හැරිසන් ජෝඩුව එහි පැමිණ සිටින බව රිපන් පැවසීය. හැරිසන්

අවුරුදු හැත්තෑවක් පමණ වයසක අයෙකු වූ අතර ඔහුගේ බිරිඳ ද ඊට කිට්ටු වයසක සිටි බැව් පෙනිණ.

"ඔබ කොයිතරම් කාලයක ඉඳලද මාලන් හිල් මහත්මයාගෙ ගෙදර වැඩ කරන්නෙ?"

"ඒ මහත්තයා ඊජිප්තුවේ ඉඳල මේ රටට ආවා. ඒ ඇවිත් මෙහේ හිටියේ අවුරුදු දෙකයි. ආයෙම ගියානේ ඇමරිකාවට. ආයෙ ආවා" මහලු හැරිසන් කීය. "ඒ කාලෙ ඉඳලම අපි තමයි හැමදාමත් මහත්තයාගෙ වැඩ කටයුතු කරල දුන්නෙ. කෑම ඉවීම කළේ මගේ බිරිඳ. ගෙවල් පිරිසිදු කිරීම, ඇඳුම් සේදීම, නගරයට ගිහින් ගෙදරට උවමනා බඩු මුට්ටු, කෑම බීම ගෙන ඒම, ලියුම් තැපැල් කිරීම ආදී හැම වැඩක්ම කළේ මම"

"ඇයි ඔබ දෙදෙනා මේ ගෙදර නැවතී ඉඳන් රාජකාරි නොකළෙ?" හෝම්ස් ඇසීය. "අවශ්‍ය නම් නැවතීමට ඕනෑ තරම් හිස් කාමර තියෙනවා නෙ?"

"ඉදිරියේදී අපි දෙන්නාව නවත්වා ගන්න අදහස් කරන බව මහත්තයා කිව්වා" එවර පිළිතුරු දුන්නේ හැරිසන් මහත්මියයි. "දණහිස් හා පිට කොන්දේ අමාරුව නිසා, මහත්මයා දුර්වලව හිටි බව ඇත්තයි. ඒ වුණාට ඔහුට ඇවිදගන්න බැරිකමක් තිබුණෙ නෑ. රෝද පුටුවක් තිබුණට ඒක නිතර පාවිච්චි කළේ නෑ. ඒකට වෙලා පොතක් දිගහැර ගෙන කියවමින් පුස්තකාල කාමරය තුළ එහා මෙහා ගියා"

"මේ ගෙදරට නිතර අමුත්තො එනවද?"

"අපේ මහත්තයාගේ නෑදැයකු වන රසල් හිල් මහත්තයා තමයි මෙහේ එන එකම තැනැත්තා. වෙන කිසිකෙනෙකු එන්නෙ නෑ. රසල් මහත්තයා නම් මාසයකට විතර සැරයක් මෙහේ එනවා. සිකුරාදා හැන්දෑවට එහෙම ආවම, එදා රෑත් සෙනසුරාදා රෑත් නැවතිලා, ඉරිදා හවසට ආපහු ලන්ඩන් යනවා. ඔහු එන්නෙත් මාසෙකට විතර සැරයක්. රසල් මහත්තයා එනදාට වැඩිපුර කෑම උයන්න කියා අපේ මහත්තයා මතක් කරනවා."

"ඔබ දෙදෙනා වැඩ අවසන් කරලා ගෙදරින් පිටවෙලා යන්නෙ කීයටද?"

"හැන්දෑවෙ හතරහමාරට" හැරිසන් කීය. "ඒ වෙලාවට තමයි මහත්තයා අත් ඔරලෝසුව වයින් කරන්නේ. හතරහමාර වෙද්දි අපි

නොගියොත් කෑගහනවා "යන්න! යන්න!" කියලා. ඒ වගේමයි උදේට හරියට හත වෙද්දි එන්න ඕන. එක මිනිත්තුවක් ප්‍රමාද වෙන්න බෑ"

"හොඳට මතක් කරලා බලන්න" හෝම්ස් කීවේ හැරිසන් යුවළටයි. "සමහර විට ඔබට දැන් අමතකද කියල මං දන්නෙ නෑ. රසල් මහත්තයා ඇර වෙනත් කිසිම කෙනෙක්, කවදාවත්ම මේ ගෙදරට ඇවිත් නැද්ද?"

"ඕන නම් හතර පස්දෙනෙකු ඇවිත් ඇති" හැරිසන් කීය. "ඊට වඩා නම් ඇවිත් නෑ. හැබැයි ඒ ආව කෙනෙක් කවදාවත් මෙහේ නැවතුණේ නම් නෑ"

"හොඳයි. කවුද ඔය කියන අනික් අමුත්තො?"

"පුරා විද්‍යාව ගැන පුවත්පත් සාකච්ඡා ලබාගන්න කියලා වාර දෙකකදී පත්තර දෙකකින් ආවා. ඒ දැනට මාස හයහතකට කලින්. ඊළඟට මහත්තයා ඇමරිකාවෙන් සහ තවත් පිටරටවලින් ඇණවුම් කළ පොත් අරගෙන කෙනෙක් ආවා. ඔහුගේ පැමිණීම ගැන නම් අපේ මහත්තයා හරියට සතුටුවුණා. ඔහුව ආපහු යැව්වේ ඔහුට දවාලට කන්නත් දීලා. ඔහු ආවේ මීට මාස තුනකට හතරකට කලින් විය යුතුයි. හරියටම මතක නෑ. ආයෙ මීට මාසෙකට විතර කලින් ඉලන්දාරියෙක් ආවා"

"ඒ කවුද?"

"ඔහු ආවේ රක්ෂණ සමාගමකින් බව කියනවා මගේ කන්වලට ඇහුණා."

"ඔහුගේ නම මොකක්ද? ආවේ මොන රක්ෂණ සමාගමෙන්ද?"

"අපි ඔය කතාබහට කන්දෙන්නෙ නැහැනෙ මහත්මයා" හැරිසන් කීය. "ඒ ආපු අය ගියාට පස්සේ, ඒ අයගෙ විස්තර මහත්තයා අපට කියන්නෙත් නෑ. කොහොම වුණත් ඒ කතාබහට හුඟක් වෙලා ගියා. මහත්තයා නිතර නිතර අසනීප වුණා. ඒ නිසා රක්ෂණයක් ගන්න කියලයි ඒ ආව ඉලන්දාරියා කිව්වේ. ශල්‍යකර්මයක් කරන්න වුණොත් ඒකටත් මුදල් ගෙවන කතාවක් කිව්වා"

"ඒ කොයිතරම් කාලයකට කලින්ද?"

"මං හිතන්නේ මාසයක්, නැත්නම් ඊටත් අඩු ඇති. ඒ ගැන විස්තර අපේ මහත්තයා රසල් මහත්තයා එක්කත් කිව්වා. ඔහු දන්නවා ඇති විස්තර"

"එතකොට මේ ගෙදරට ආව අය එච්චරද?"

"ඔව් මහත්මයා. මං කියූ අයට පිටින් ආවා නම් ඒ දොස්තර මහත්මයාත් නීතිඥ මහත්මයාත් විතරයි"

"ඔවුන් ආවේ නියමිත දිනයකටද? එහෙමත් නැත්නම් කැඳෙව්වොත් විතරද? ඔවුන්ගේ නම් මොනවාද?"

"දොස්තර මහත්තයාගෙ නම හයිස්මිත්. ඔහු පදිංචි බ්ලැක්හීත් ඉඳන් කිංස්ටන් යන පාරේ. හැම සඳුදාම උදේට එනවා. නීතිඥ මහත්තයාගෙ නම කෝතෝන්. ඔහු ආවේ කැඳවීමක් කළොත් විතරයි"

"හොඳට කල්පනා කරල මට කියන්න හැරිසන් මහත්මයා" හෝම්ස් කීය. "මෑතකදී ඇවිත් ගියේ නැද්ද, මහත්මයාගෙම ක්ෂේත්‍රයේ කෙනෙක්? ඒ කියන්නේ පුරාවිද්‍යාව ගැන උනන්දු කෙනෙක්? ඒ බඩු මිලට ගන්න කෙනෙක්?"

සෑහෙන වේලාවක් කල්පනා කළත් හෝම්ස් කියූ ආකාරයේ කෙනෙකු ගැන සිහිපත් කිරීමට හැරිසන්ට හැකි නොවිණි. ඔහු තම බිරිඳගෙන් ඒ ගැන විමසුවේය. ඔය කියන තාලේ කෙනෙකු මෑත කාලයක පැමිණ නැති බව, ඇය විශ්වාසයෙන් සඳහන් කළාය.

"ඔබ දෙදෙනාට ගෙවූ වැටුප් මහත්මයා නියමිත දවසකට ගෙව්වාද? ඔබ දෙදෙනාට රැකියාවක් කිරීමට බැරි කාලයක් සඳහා පාරිතෝෂික දීමනාවක් ගැන සඳහන් කළේ නැද්ද?"

"හැම මාසෙකම පළවැනිදාට තමයි අපට පඩි ගෙව්වේ." හැරිසන් මහත්මිය කිවාය. "ඒක අපේ වයසේ අනෙක් අයට, ප්‍රභූ නිවාසවල ගෙවන පඩියට වඩා වැඩියි. ඇමරිකාවට යන්න කලින් නීතිඥයා කැඳවා, මහත්මයා ඔහුගේ අන්තිම කැමැති පත්‍රය ලිව්වා. ඒකෙනුත් අප දෙදෙනාටම පවුම් පන්සීයක් බැගින් හිමිවෙනවාලු, මහත්මයාගෙ මරණයෙන් පස්සේ. දෙවියනේ! දැන් ඉතින් ඒකෙන් ඇති වැඩේ මොකක්ද? මේ රටක් වටින මනුස්සයාගෙ මරණයෙන් ලොකුම පාඩුව වුණේ අපට"

හැරිසන් යුවළ අපෙන් සමුගෙන පිටවී ගියහ. මාලන් හිල්ගේ ඥාති සොහොයුරු රසල් හිල් ද පැමිණ සිටින බව පොලිස් භටයෙක් පොලිස් පරීක්ෂක රිපන් වෙත දැනුම් දුන්නේය. ඒ අනුව ඔහුද අප හමුවට පමුණුවන ලදී.

උසින් අඩි පහමාරකට වැඩි නොවුණු, සිහින් සිරුරක් තිබූ රසල් හිල් මහතා, දැඩි කම්පනයකට පත්ව සිටි බව අපි දුටුවෙමු. කලින් දින රාත්‍රිය ඔහු ගත කළේ බ්ලැක්හීත් හි "ඩැෆඩිල්ස්" නම් තානායමේ බැව් ඔහු පැවසීය. මුළු රාත්‍රියම හරිහැටි නින්ද නොයාමෙන් දෙ නෙත් ඔහුගේ දෙනෙත් රතුවී තිබිණ.

"මාලන් තමයි මට ඉඳපු එකම ඥාතියා" ඔහු කීවේ කතාව අරඹමිනි. "ඔහුගේ අකල් මරණය නිසා මං වැටුණේ ලොකු අමාරුවක."

"මහත්මයා. අපි කැමතියි තොරතුරු සියල්ල මුල ඉඳලම දැනගන්න. ඒ මොකද මාලන් හිල් මහත්මයා අප්‍රසිද්ධව කල් ගෙවූ කෙනෙක්නෙ. මේ අභිරහස විසඳා ගන්න නම්, ඔහු ගැන තොරතුරු හැකි තරමක් අපි දැන සිටිය යුතුයි" හෝම්ස් කීය.

"මාලන්ගේ පියාත් මගේ පියාත් සොහොයුරන්. ඒකෙනුයි අපි නෑදැයො වුණේ. මේ රැම්සේ වතුයාය අයිතිව තිබුණේ අපේ සීයා වුණු ඩේවිඩ් හිල්ට. ඔහු ඒක අපේ පියවරුන්ට සම-සමව බෙදාදී තිබුණා.

මාලන්ගේ කැමැත්ත තිබුණේ ඉඩම් හිමි වැවිලිකරුවෙකු වෙන්න නෙමෙයි; පුරාවිද්‍යාඥයෙකු වෙන්න. '57 දී හෝ '58 දී ඔහු ඊජිප්තුව බලායන්න නැව් නැග්ගා. ඒ අර සුප්‍රසිද්ධ පුරාවිද්‍යාඥයා මහාචාර්ය රිචඩ් ලෙප්සියස්ගේ දෙවැනියා හැටියට කටයුතු කරන්න.

මේ කාලෙ වෙනකොට මාලන් විවාහ වෙලා ළමයි දෙන්නෙකුත් හිටියා. ඊජිප්තුව කියන්නේ කර්කශ දේශගුණයක් තිබෙන කාන්තාරයක් නෙ. ඉතින් ඔහු ළමයි දෙදෙනා සහ බිරිඳ මෙහේ නවත්වලයි ගියේ. සීයාගෙන් අපට උරුම වුණු වතුවල වැවිලි කර්මාන්තය ගැන සොයා බලන්න සිදුවුණේ මට. මාලන් ගිහින් අවුරුදු තුනක් පමණ යනතුරු අපට වරින් වර ලියුම් ලැබුණා. ඊළඟට එක්වරම ලියුම් එන එක නැවතුණා.

ඒකට හේතුව පුවත්පත්වල පළවුණා. පුරාවස්තු කැණීම් කරන්න කාන්තාරය මැදට ගිය ලෙප්සියස්, මාලන් ඇතුළු පිරිස වැලි කුණාටුවකට අහුවෙලා, පාර වැරදී අතුරුදන් වෙලා. කෑම සහ ජලය නොමැතිවීම නිසා, ඔවුන් මියයන්න ඇති කියලයි ඊජිප්තු රජය විශ්වාස කළේ. දෙසතියක් තිස්සේ ඔවුන් ගැන හොයලා අසාර්ථක වුණාම, ඒ කටයුත්ත අත්හැර දමා තිබුණා. ඒ බව ලන්ඩනයට දන්වා එව්වේ කයිරෝ නුවර බ්‍රිතාන්‍ය කොන්සල්වරයා.

මේ කාලය වෙන කොටත් මාලන්ගේ බිරිඳ ජීවත්වුණේ හරිම අසහනයෙන්. ඉඩකඩම් පාලනය හරිහැටි නොකෙරුණු නිසා මුදල් අග හිඟකමත් තිබුණා. මේ අතරේ ඇයට ඇමරිකාවේ නිව්යෝර්ක් සිට පැමිණි හේවඩ් නම් ඇඳුම් මෝස්තර නිර්මාණ කරුවෙකු හමුවී තිබුණා. තමන්ගේ සැමියා මියගිය නිසා, ඇය – එලිසබෙත්, හේවඩ් සමග විවාහ වෙලා දරු දෙදෙනා සමග ඇමරිකාවට සංක්‍රමණය

වුණා. මාලන් ඇතුළු පිරිස ජීවිත බේරාගත් බව අපට අහන්න ලැබුණේ තවත් මාසයකට පමණ පස්සේ. කෑම බීම නැතිව මරණාසන්නව සිටි ඔවුන් බේරාගෙන තිබුණේ, කාන්තාරයේ එඬේර ජීවිත ගතකරන බෙඩුයින් වරුන් විසින්.

පුරාවිද්‍යාඥයන් කණ්ඩායම ආපහු එංගලන්තයට ආවේ වීරයන් හැටියට බව ඔබට මතක ඇති. නමුත් තමන්ගේ බිරිඳ හා දරුවන් තමන් අත්හැර ගිහින් බව දුටුවාම, මාලන් දැඩි කම්පනයකට පත්වුණා. ඔහු මානසිකව කඩා වැටුණා. ඔහු එංගලන්තයේ ගතකළේ මාස හයයි. අනෙක් පුරාවිද්‍යාඥයන් කිව්වේ මාලන්ට සුදුසු යළිත් වරක් ඊජිප්තුවට ගොස් කැණීම් ඇරඹීම කියලයි. එංගලන්තයේ ජීවිතයෙන් කලකිරී හිටි ඔහු ආපසු ඊජිප්තුව බලා ගියේ හරි සතුටෙන්.

දෙවැනි වාරයේ ගියාම ඔහු තවත් අවුරුදු පහළොවක හෝ දහ හතක කාලයක් එහේම රැඳී සිටියා. එංගලන්තයට නිවාඩුවකට වත් ආවේ නෑ. අන්තිමට ඔහු එන්න තීරණය කළේ වෛද්‍යවරුන්ගේ උපදෙස් මත. ඊජිප්තුවේ කර්කශ දේශගුණයත්, අවිවේකී බවත් නිසා, මාලන් ශ්වසනාබාධවලට හා ඔස්ටියෝ ආතරයිටිස් රෝගවලට ලක්වී තිබුණා. ඔහු ආපසු එංගලන්තයට ආවේ මට මතක හැටියට '77 දී පමණ. මේ වෙනකොට ඔහු සෑහෙන මුදලක් උපයාගෙන තිබුණා. ජීවිතයේ අවසන් කාලය තමන්ගේ රටේ, තමන්ගේ ගමේ ජීවත්වීමට තීරණය කළ බවයි ඔහු කිව්වේ.

ඔහු මුලදී සෑහෙන සතුටෙන් මෙහේ ජීවත්වුණා. නමුත් කල් ගතවෙද්දී පාළුව හා තනිකම තමන්ට හුඟක් දැනෙන බව මාලන් කිව්වා. අඩුම වශයෙන් මාසයකට වරක්වත් මෙහේට ඇවිත්, ඔහු සමග කාලය ගතකරන මෙන් මගෙන් ඉල්ලා සිටියා. නමුත් ඒ විදියට දින ගණනක් මෙහේ ගත කරන්න මට හැකියාවක් තිබුණෙ නෑ. මං වෘත්තියෙන් කොටස් වෙළඳපොළේ තැරැව්කාරයෙක්. ලන්ඩනයේ ජීවත් නොවී ඒ රැකියාව කරන්න බෑ. අනික මං ගම්බද ජීවිතයට කැමතිත් නෑ. නමුත් මාලන්ගේ සිත රිදවීමට නොහැකි නිසා, සමහරවිට එක ළඟ සති අන්තවලත් මං "හිල් හවුස්" නිවසට ඇවිත් ගියා."

"නමුත් දශක දෙකක් කාලයක් මිත්‍රයන් ආශ්‍රය කරමින් විනෝදයෙන් කාලය ගත කළ ඔහුට, මෙහේ තිබුණු පාළුව පහුවෙද්දී දරාගන්න බැරිවුණා. ඔහු නිතරම කථා කළේ කයිරෝවේ ඔහු ගතකළ

විනෝදකාමී ජීවිතය ගැන. ඔහොම ඉන්න අතරෙ තමයි නිව්යෝක් නුවර කෞතුකාගාරයෙන් ඇරයුමක් ආවෙ. මාලන් බොහොම කැමැත්තෙන් ඒක භාරගත්තා. ඇමරිකන්කාරයන් ඔහුව ඉහළින්ම පිළිගත්තා කියලා මාලන් පහු කාලෙක මට කිව්වා. මං හිතන්නේ ඔහු නිව්යෝක්වල අවුරුදු තුනක් පමණ ගතකළා..... ඔව්. ඔහු ආයෙ ආවේ '82 – ගිය අවුරුද්දෙ නේ."

"ඔහු අන්තිම කැමැති පත්‍රය ලියා ඇති බව අපට අහන්න ලැබුණා" හෝම්ස් කීය. "ඒකෙ හැටියට ඔහුගේ දේපළ උරුමකරුවන් වෙන්නේ කවුද?"

"මා හැරෙන්න ඔහුට වෙනත් ඥාතීන් නොමැති බව මං ඔබට කිව්වා. ඒ නිසා දේපළවල උරුමකාරයා වන්නේ මම. හැරිසන් යුවළට ඔහු යම්කිසි මුදලක් ලිව්වා. ඔහුගේ බිරිඳ හා දරුවන් ගැන ආරංචියක් නොමැති නිසා, ඔහු සතු හැමදෙයක්ම මා නමට ලියන බව කිව්වා. ඔය දේපළ ගැන මගේ ඇති ආශාවක් නැහැ. ඊට වඩා මං කැමතියි ලන්ඩනයට වී නිදහසේ ජීවිතය ගෙවන්න."

"මේ අපරාධය කවුරුන් විසින් කරන ලද්දක් කියලද ඔබට හිතෙන්නෙ?" හෝම්ස් විමසීය.

"ඒක මට හිතාගන්න අමාරුයි මහත්මයා. ඔහු කිසි විටෙකත් මුදල් ළග තබාගත්තෙ නැහැ. වටිනා දියමන්ති හෝ ආභරණ තිබුණෙ නැහැ. නමුත්......"

"ඔව්. මොකක්ද ඔබ අදහස් කළේ?"

"ඊජිප්තුවේ කැණීම්වලදී ඔහු විසින් සොයා ගන්නා ලද ස්ෆින්ක්ස් පිළිම සහ රජවරුන්ගේ මුහුණුවල අනුරූ රාශියක් තිබුණා. ඒවා දඹ රත්තරනින් නිම කොට තිබුණු ඒවා"

"ඔබ අදහස් කරන්නේ මමීවලට දමා තිබූ රත්රන් වෙස්මුහුණු තරම් ලොකු ඒවා කියලද?"

"නැහැ නැහැ. දෙහි ගෙඩියක් තරම් ප්‍රමාණයේ කුඩා ඒවා"

"ඒවා ගැන විමසා බලන්න කවුරු හරි මෙහේ ඇවිත් ගියාද?" හෝම්ස් විමසීය. "සමහරවිට මාලන් හිල් මහත්මයා එවැනි අය ගැන ඔබට කියන්න ඇති?"

"දෙවරක්ම මට කියා තිබෙනවා" රසල් පැවසීය. "නමුත් ඒ ගැන වැඩිදුර හොයා බලන්න මං උත්සාහ කළේ නෑ. එහෙම දේක වැදගත්කමක් ඒ වෙලාවෙ මට තේරුණෙ නෑ"

මිළඟට මඳ නිහඬතාවයක් ඇතිවිය. මිනිත්තු කිහිපයකට පසු හෝම්ස් යළිත් වරක් තම ප්‍රශ්න ඉදිරිපත් කළේය.

"හොඳයි. ඊයෙ හවස ඔබ මෙම සිද්ධියට මුහුණ දුන් ආකාරය අපට කියන්න"

"මං හැමදාමත් එන්නේ එකම දුම්රියක" රසල් හිල් කීය. "ඒක කිංස්ටන්වලට ළඟාවෙන්නේ හවස 5.02ට. සති දෙකකට කලින් මෙහේ ඇවිත් ආපහු යද්දී, මගේ අතේ තිබූ පාර්සලයක්, මං අමතක වීමකින් කොහේ හෝ දමාගිහින්. මං හිතාගෙන හිටියේ ඒක කිංස්ටන් දුම්රියපොළේ මට අමතක වෙලා ගියා කියලයි. එහි ටිකට් එකතු කරන සේවකයාගෙන් මං ඒ ගැන විමසුවා. ඒක මගේ කබායක් සහිත පාර්සලයක්. සේවකයා මාව පාර්සල් අංශයට යොමුකළා. නමුත් එවැන්නක් ගැන ඔවුන් ළඟත් තොරතුරක් තිබුණේ නෑ. මිනිත්තු පහකට වැඩි කාලයක් මට අහිමි වී ගියා මිසක්, එම විමසීමෙන් මට ලැබුණු ප්‍රයෝජනයක් නෑ. දුම්රියපොළේ තිබූ ප්‍රධාන බිත්ති ඔරලෝසුව දිහා බැලූ මට කැගැහුණා.

"දෙවියනේ! 5.10 ත් වෙලා. මගේ ඥාති සොහොයුරා - මාලන් හිල් මා එනතුරු මඟ බලාගෙන ඇති. එයා කල්පනා කරාවි මට මොනවා වුණාද කියල"

"ඔබේ ඥාති සොහොයුරා පදිංචි කොහේද?" සේවකයා විමසුවා.

"ඔහු ඉන්නේ රැම්සේ වතුයායේ බංගලාවේ"

"එහේට හරි දුරයි නේ. මං හිතන්නේ හැතැක්ම හතක් අටක් දුර ඇති?"

"බ්ලැක්හීත් හන්දියටම හැතැක්ම පහක් විතර තියෙනවා" මං කිව්වා. "ඊළඟට එතැන ඉඳං රැම්සේ වත්තේ බංගලාවට හැතැක්ම එකහමාරක් විතර දුරයි"

"ඒ දුර ඇවිදගෙන යන්න ඔබට කොච්චර වෙලා ගතවෙනවද?"

"වේගයෙන් ඇවිද්දොත් පැන්දැවෙ හයහමාර වෙද්දි බ්ලැක්හීත්වලට යන්න පුළුවනි. ඉතිරි ටික කඳු පාර නේ. ඒකට මිනිත්තු විස්සක් හෝ විසිපහක් යනවා"

"කුලී රථ රියැදුරෝ ඔය පාරෙ යන්න කැමැති නැහැලු නේද?"

"ඒක ඇත්ත. පාර හොඳ නැති නිසා ඔවුන් ඒකෙ යන්න කැමති නෑ"

කථාව නොනවත්වන ඒ දුම්රිය සේවකයාගෙන්, මං බේරුණේ බොහොම අමාරුවෙන්. ඊළඟට මං ඉක්මන් ගමනින් ඇවිදගෙන

ඇවිත් බ්ලැක්හීත් පාරට වැටුණා. එතකොට වෙලාව පහමාරට ළඟයි. "ඩැෆඩිල්ස්" තානායමෙම එක පැත්තක තිබෙනවා ඔවුන්ගේ අවන්හල. මං එතැනට ගොඩවුණා. මං හිටියේ දැඩි පිපාසයකින්. ඒ නිසා බීර පයින්ටුවක් අරගෙන ඒක එක හුස්මට බිව්වා. මං එතැන කළමනාකරු අඳුනනවා. මගේ ඇඳුම් පාර්සලය අමතක වුණේ මෙතැනද? එහෙම සැකයකුත් මගේ හිතේ තිබුණා. මං ඔවුන්ගෙන් විමසීමක් කළා. නමුත් එවැනි පාර්සලයක් ගැන ඔවුනටත් මතක තිබුණේ නෑ.

"දැන් හයට විස්සයි. අපි තව මිනිත්තු විස්සකින් වහනව නේ" කළමනාකරු කිව්වා. "මේ වෙලාවෙ සෙනග වැඩියි. ඔබේ පාර්සලය ගැන හොයා බලන්න, මේ වෙලාවෙ මගේ සේවකයන්ට විවේකයක් නෑ. හෙට දවාලට එන්නකො"

ඔහුට තවත් කරදර නොකර මං ඉක්මනට පිටත්වුණා. ඒ ඇඳිරි වැටීගෙන එන්න පටන්ගෙන තිබුණු නිසා. 'Y' අකුර හැඩේට පාර දෙකට බෙදෙන තැනට එන්න, මට තවත් මිනිත්තු දහයක් ගතවෙන්න ඇති. මුර සංචාරයෙ යෙදීමේ රාජකාරි අවසන් කරමින් හිටි පොලිස් භටයා, එතැන බලා සිටි අයුරු මට දකින්න ලැබුණා. ඔහු බලාගෙන ඉන්න ඇත්තේ රෑ වැඩ මුරය කරන අනික් පොලිස් භටයා, හැන්දෑවෙ හයට එතැනට එනතුරු වෙන්න ඇති. මං ඔහුට ආචාර කරලා ආවා මිසක් එතැන රැඳුණේ නෑ. මං බ්ලැක්හීත් හන්දියට එද්දී සෑහෙන තරම් අඳුරු වැටිලා. වෙලාව හතට විස්සක් වගේ වෙන්න ඇති. සමහර ගෙවල්වල පහන් දල්වා තිබුණා. රැම්සේ වතුයායට පිවිසෙන පාර දිගේ ඉදිරියට එද්දි තමා අඳුරු වැටුණේ. මං "හිල් හවුස්" ගේ ළඟට එද්දි රෑ හත වෙන්න ඇති; නැත්තම් හතයි පහයි.

වෙනදාට මා එද්දී ගේ ඉස්සරහ දොර ළඟ පහන් දල්වා තියෙනවා. නමුත් ඊයෙ රෑ එහෙම තිබුණේ නෑ. වයසට යද්දි මාලන්ට කාරණා අමතක වෙනවා. පහන් දැල්වීමටත් ඔහුට ඒ විදියට අමතක වෙන්න ඇති කියලයි මට හිතුණේ. මං දොර ළඟට ගිහින්

"මාලන්! මාලන්!" කියා දෙතුන් වරක් කතා කළා. නමුත් කිසිම ප්‍රතිචාරයක් ලැබුණේ නෑ. ඊළඟට මං දොරට තදින් ගසමින් කථාකළා. ඒ ඔහුට නින්ද ගිහින්දෝ කියල හිතලා. ඒත් ශබ්දයක් නෑ. ඒ ගමන මගේ යතුරු කැරැල්ල අරගෙන දොරේ වීදුරුවටත් ගැහුවා. "මාලන්! මාලන්! දොර අරින්න. මං රසල්!" කියලා කෑගැහුවා. ඒත් වැඩක්

වුණේ නෑ. එතකොට තමයි මං දුටුවෙ, ලන්තෑරුමක් අතින් ගත්තු කෙනෙක් ගේ ළඟටම ඇවිත් හිටි බව. ඒ මුරසංචාරයේ යෙදෙන පොලිස් භටයෙකු බව මං දුටුවේ, මිනිත්තුවකට විතර පස්සේ. එතැන ඉඳන් සිදුවීම් සියල්ල ඔබට ඔහුගෙන් දැනගන්න ලැබෙන්න ඇති කියා මං විශ්වාස කරනවා"

"මාලන් හිල් මහත්මයා ජීවිත රක්ෂණයක් ලබාගත් බව, අපට ඔහුගේ සේවකයාගෙන් අහන්න ලැබුණා" ලෙස්ට්‍රේඩ් කීය. "ඔහු ඒ ගැන ඔබට දැනුම් දුන්නද?"

"ඔව්. තමන් නිතර නිතර අසනීප වෙන නිසා රක්ෂණයක් ගෙන තිබීම වාසි සහගත බව ඔහු මට කිව්වා. හදිසියේ ශල්‍යකර්මයක් කරන්න වුණොත් ඒකට මුදලක්, රෝහලේ නැවතීමේ ගාස්තු පවා මේකට ඇතුළත්ලු. හදිසියේ මරණය සිදුවුණොත් ජීවිත රක්ෂණයේ වන්දියක් හැටියට පවුම් විසිදහසක් ළඟම ඥාතියාට ලැබෙනවාලු. ඔහුගේ ඒ කතන්දරයට මං එච්චර සාන්දුන්නේ නෑ. ඒ මොකද තමන්ට නොයෙකුත් අසනීප ඇති බව කියමින් ඔහු කංකෙඳිරි ගෑ බව ඇත්තයි. නමුත් ඔහු ඒ තරම් ලේසියෙන් මියයාවි කියා මට හිතුණෙ නෑ. තවත් එකක්; මට ලන්ඩනයේ ආදායම් ලැබෙන මාර්ග තිබෙනවා, මා කර ඇති ආයෝජන මගින්. ඒක මට ජීවත්වීමට හොඳටම ප්‍රමාණවත්. ඉතින් අනුන්ගේ මරණයකින් මට හිමිවෙන මුදලක් ගැන, මං මොකටද කට ඇරගෙන බලාගෙන ඉන්නෙ?"

නිලධරයන්ට රසල් හිල්ගෙන් විමසීමට තවත් යමක් තිබූ බවක් නොපෙනිණ.

කාචය අතට ගත් හෝම්ස් තම සෝදිසිය කාමරයේ එක් කෙළවරකින් ඇරඹුවේය. එය පහසුවීම සඳහා අප සියලුදෙනාටම කාමරයෙන් ඉවතට යන මෙන් ඔහු ඉල්ලා සිටියේය. නිවසේ තිබූ දීප්තිමත්ම පහන දල්වා ගෙන, කාමරය තුළ පා සටහන් වෙත හෝම්ස් තම අවධානය යොමු කළ බැව් මම තේරුම් ගතිමි. තම සටහන් පොත අතට ගෙන ඔහු යම් යම් කරුණු ලියාගත් බවද මම දුටුවෙමි. බිම වැටී තිබූ පොත් එකින් එක පෙරලා බලමින්, ඒවා රාක්ක මත තබමින්, හෝම්ස් යෙදුණේ වෙහෙසකර කටයුත්තකයි. ඊට අමතරව සෑම ලාච්චුවක්ම විවෘත කර බලමින් ඔහු ඒවා සියුම් පරීක්ෂාවකට ලක් කළේය. මේ කටයුතු අවසන් වනවිට බොහෝ රෑ බෝවී තිබිණි. පරීක්ෂණ කටයුතුවල ඉතිරිකොටස, මීළඟ දවසට කල් දැමීමට සිදුවන ලකුණු පහළවිය.

"හෝම්ස් මහත්මයා. අදට අපි මෙතැනින් නවත්වමු" අතිශයින්ම විඩාවට පත් ලකුණු පෙන්වමින් ලෙස්ට්‍රේඩ් කීය. "මට නම් අද රෑම ලන්ඩන් යන්න වෙනවා. "ඩැෆඩිල්ස්" තානායමේ ඔබතුමාට සහ වොට්සන් මහත්මයාට නවාතැන් ගන්න හැකිවේවි."

"මමත් ඒ කාරණය කියන්න හැදුවා විතරයි" මගේ මිත්‍රයා කීවේ පරීක්ෂණ කටයුතු අත්හිටුවමිනි. "කෝ රසල් හිල් මහත්මයා?"

"සාක්ෂි දීම අවසන් කළ වහාම ඔහු පිටවෙලා ගියේ මගෙන් අවසර අරගෙන" පොලිස් පරීක්ෂක රිපන් කීය. "කලින් යොදාගෙන ඇති වැඩකටයුතු නිසා, ඔහු හෙට උදේ පාන්දරම ලන්ඩනයේ සිටිය යුතුයිලු. ඇයි ඔබතුමා ඔහුව හෙව්වේ?"

"දැන් ඉතින් මේ හැමදේකම උරුමක්කාරයා ඔහුනෙ" හෝම්ස් කිය. "මියගිය පුද්ගලයාට අයිති දිනපොත් දෙකක් සහ තවත් පොතක් වැඩිදුර පරීක්ෂාව සඳහා මට අවශ්‍ය වෙනවා. ඊට අමතරව මියගිය හිල් මහත්මයා අතේ බැඳ තිබූ ඔරලෝසුවත්, මා ලන්ඩනයට ගෙන යායුතුයි. මිනීමැරුම් නඩුව උසාවියට ඉදිරිපත් කිරීමේදී ඔබට මේවා අත්‍යවශ්‍ය වෙන භාණ්ඩ. මං ඒවා මගේ භාරයට ගැනීමට පෙර ඔබ අනිවාර්යයෙන්ම කළ යුතු කටයුත්තක් තියෙනවා රිපන් මහත්මයා.

මේ අත්ඔරලෝසුවේ ඉදිරිපස සහ පිටුපස ඡායාරූප කිහිපයක්ම ගත යුතුයි. ඊට අමතරව ඔරලෝසුව නොමැතිව මියගිය පුද්ගලයාගේ අතේ මැණික් කටුව දැකගත හැකි, සමීප ඡායාරූපයක් ඔබට ප්‍රයෝජනවත් වෙන්න ඉඩ තියෙනවා. පශ්චාත් මරණ පරීක්ෂණය සිදුකෙරෙන්නේ කොහේද? කිංස්ටන්වලද? එහෙනම් වහාම එතැනට පොලිස් ඡායාරූප ශිල්පියා යවන්න. රිපන් මහත්මයා. තවත් ඉල්ලීම් දෙකක් තියෙනවා. කිංස්ටන් සිට මේ දක්වා ප්‍රදේශය ඇතුළත් වෙන මිනින්දෝරු අධිකාරියේ සිතියමක් මට ඕනෑ. අනික රසල් හිල්ට මිනිය හමුවෙද්දි මුරසංචාරයේ යෙදී සිටි පොලිස් භටයා මා වෙත එවන්න"

ලෙස්ට්‍රේඩ් අපෙන් සමුගෙන ආපසු ලන්ඩනය බලා ගියේය. අපි "ඩැෆඩිල්ස්" තානායමේ නවාතැන් ගත්තෙමු.

පසුවදා උදයේ පොලිස් නිලධර රිපන් හෝම්ස් හමුවීමට තානායමට පැමිණියේය. හෝම්ස් ඉල්ලූ සිතියමද ඔහු රැගෙනැවිත් තිබිණ. ඔහු සමග පැමිණි ඡායාරූප ශිල්පියා මාලන් හිල්ට අයත්ව තිබූ පොත්වල සහ අත් ඔරලෝසුවේ ඡායාරූප ගත්තේය.

"හෝම්ස් මහත්මයා. පශ්චාත් මරණ පරීක්ෂණයේ වාර්තාව ලැබුණා" රිපන් කීවේ පිටත්වී යාමට සූදානම් වෙමිනි.

"ඔබම කියවන්න" හෝම්ස් කීය. "මං හිතන්නෙ නෑ අප දැනගත යුතු අලුත් යමක් ඕකෙ ඇති කියල......"

"එහෙනම් අහගන්නකො...... මරණය සිදුවී ඇත්තේ හවස පහත් හතත් අතර කාලයේ විය යුතුය. මරණයට හේතුව-හිස්කබල බිඳීයාමෙන්, මොළයට අධික වශයෙන් ලේ ගලායාමයි. ඊට ආසන්නම හේතුව හිසේ අස්ථිවලට බරපතල තුවාල සිදුවී තිබීමයි. මෙම තුවාල සිදුවී ඇත්තේ මොට, බරින් වැඩි ආයුධයකින් බැව් නිගමනය කළ හැක. ක්‍රිකට් පිත්තක් හෝ බරින් වැඩි මුගුරක් මේ සඳහා යොදා ගත්තා යයි සිතිය හැක......"

"ඒව තමයි හෝම්ස් මහත්මයා ප්‍රධානම කාරණා"

"මරණය සිදුවී ඇති වෙලාව හැන්දෑවෙ පහත් හතත් අතර කියලද කියන්නෙ?"

"ඔව්"

"ඒකෙන් නම් අපට ඒ හැටි ප්‍රයෝජනයක් නෑ. හැරිසන්ල ගෙදරින් පිටවෙලා යද්දි හවස හාමාරහමාරයි. රසල් හිල්ට සහ පොලිස් භටයාට මිනිය හමුවෙද්දි රෑ හතයි. කෝ ඔබ අර පොලිස් භටයා කැඳවාගෙන ආවද?"

"නැහැ මහත්මයා...... රෝයි මාෂ් තමා පෙරේදා හැන්දෑවෙ ඒ රාජකාරියෙ යෙදුණේ. නමුත් මං එනවිටත් ඔහු රාජකාරි සඳහා පැමිණ සිටියේ නැහැ. පොලිසියට වාර්තා කළ වහාම හිල් හවුස් වෙත පැමිණ, ෂර්ලොක් හෝම්ස් මහත්මයා හමුවෙන්න කියලා මං පණිවුඩයක් තැබුවා."

"මට තියෙනවා ඔබෙන් දැනගත යුතු තවත් කාරණා ස්වල්පයක් රිපන් මහත්මයා. මෙන්න මේ කාරණය මට ඊයෙ රසල් හිල්ගෙන් හරිහැටි දැනගන්න බැරිවුණා. හිල් පවුල ලන්ඩනයේ අය නොවෙයි. ඔවුන්ගේ ගම්පළාත් නම් මෙහේ බව කිව්වා. නමුත් ඔවුන් කුඩා කාලයේ ඉඳලම හැදිල වැඩිල තියෙන්නේ මෙහේද? කාගෙන්ද අපට ඒ ගැන දැනගන්න පුළුවන්?"

"මාලන් හිල්ගේ මරණය ගැන ආරංචිය ලැබුණේ රෑ අටට පමණ" රිපන් කීය. "ඒ වෙලාවෙත් මං හිටියේ පොලිස් ස්ථානයේ. අපේ පොලිසියේ සාජන්ට්වරයෙකු වන ඇලිස්ටෙයාගෙ ගම බිලැක්හීත්.




කිංස්ටන් සිට බ්ලැක්හීත් හරහා රැම්සේ වත්තේ හිල්හවුස් වෙත
ගමන්මග (පරිමාණයට නොවේ)

ඔහු මේ හිල් පවුල ගැන හොඳින් දන්නවා. ඔහු මට තොරතුරු හුගක් කිව්වා.

මාලන් හිල්ගේ සීයා වන ඩේවිඩ් හිල්, මේ පළාතටම හිටි ප්‍රමුඛතම වැවිලි කාරයෙක්ලු. පහත් මට්ටමේ තිබෙන ඉඩම්වල තිරිඟු, ඕට්ස් ආදිය වැවූ ඔහු අනෙක් ඉඩම්වල ඇපල්, දොඩම් ආදී පලතුරු වැව්වලු. ඔහුගේ මරණයෙන් පසු ඉඩම් උරුම වුණු පුතුන් දෙදෙනා අතින්, වැවිලි කර්මාන්තය හරිහැටි කෙරිල නෑ. අනික අවුරුදු ගණනාවකට කලින් ඇතිවුණු ගංවතුරෙන්, ධාන්‍ය වැවූ පහත් ඉඩම්වල භෝග විනාශ වී ගියාලු. ඊට පස්සේ ඒ ඉඩම්වල වගා කිරීම අත්හැර දමල තියෙනවා.

සාජන්ට් ඇලිස්ටෙයා සහ රසල් හිල් ඉගෙන ගෙන තියෙන්නේ එකම පාසලේ, එකම කාලවල. මාලන් හිල් ඉගෙනීමට දක්ෂ ශිෂ්‍යයෙක්ලු. ඒ නිසාම ඔහු ලන්ඩනයේ උසස් පාසලකට යවන්න ඔහුගේ පියා තීරණයක් ගත්තලු. එතැනින් ඔහු විශ්ව විද්‍යාලයකටත් ගිහින්, උපාධියකුත් ලබල, පසුව වැඩිදුර අධ්‍යාපනයට ජර්මනියට ගිහින් තියෙනවා.

රසල් හිල් කොහොමටවත් ඉගෙනීමට ප්‍රිය කළ කෙනෙකු නොවෙයිලු. කිංස්ටන් ඉඳන් පාසල අවසන් වී ගෙදර එද්දී, ඔහු අතරමගදී මිත්‍රයන් සමග අශ්වකරත්තයෙන් බහිනවාලු. ඔවුන්ගේ රැම්සේ වත්තට යාබදව තමයි ඩෝචෙස්ටර් ජලාශය නම් විශාල ජලාශය තිබෙන්නේ. ඊට අමතරව කවදාවත් වගාව සඳහා යොදා නොගත් රක්ෂිත වනාන්තරයකුත්, ජලාශයට යාබදව තිබෙනවා. ඊළඟට කලින් වගාකොට පසුව අත්හැර දමනු ලැබූ හිස් ඉඩම් තියෙනවා. රසල් හිල් හා ඔහුගේ පාසල් මිත්‍රයන් ආපසු ගෙදර එන්නෙ නැතුව කළේ මොකක්ද? මේ රක්ෂිත වනයට වැදිලා රොබින් හුඩ් ක්‍රීඩාවේ යෙදීම. සමහරදාට ඔවුන් ඩෝචෙස්ටර් ජලාශයට බැහැලා පිහිනුම් තරග පවත්වනවාලු. විශාල පාළු ඉඩම් පිට්ටනි හැටියට යොදාගෙන රග්බි හා ක්‍රිකට් ක්‍රීඩාවේ යෙදෙනවාලු. ඔහුගේ පියා මේ ගැන දැන හිටියත්, පුතාට අවවාද හෝ දඬුවම් කරල නැහැ. කුඩා කාලයේ රසල්ගේ රොබින් හුඩ් ක්‍රීඩාවටත් පිහිනීම්වලටත් සාජන්ට් ඇලිස්ටෙයා හතර පස්වතාවක් ගිහින් තියෙනවා. පසුව ඔහුගේ පියාට ආරංචි වී පියා තරවටු කළාම, ඔහු ඒවායින් ඉවත්වී තිබෙනවා. රසල් හිල්ලාගේ කැලේ පැනීම නැවතී තිබෙන්නේ

කොහොමද..... ඔවුන්ගේ කණ්ඩායමේ මිත්‍රයෙක් ඩෝචෙස්ටර් ජලාශයේ දියේ ගිලී මියගිහින්. ඒ සිදුවීමෙන් පසු රසල්ගේ පියා තම පුත්‍රයාව ලන්ඩනයේ නේවාසික පාසලකට යවා තිබෙනවා."

"බොහොම ස්තුතියි රිපන්" හෝම්ස් කිය. "මං හිතන්නේ ඔබේ සාජන්ට් ඇලිස්ටෙයාගේ උදව් මට අත්‍යවශ්‍ය වෙනවා. වෙලාව ආවාම මං ඔබට කියන්නම්. ඊළඟට ඔබ හඳුනනවාද මාලන් හිල්ගේ නීතිඥයා? ඔහුගේ නම තයිජල් කෝතෝන් බවයි මට අහන්න ලැබුණේ"

"ඔව්. ඔහු ඉන්නේ මේ ළඟ" රිපන් කිය. "ඔබතුමාට උවමනා නම් මට පුළුවනි, කෝතෝන් නීතිඥ මහතා ළඟට ඔබ කැඳවාගෙන යන්න"

"අපි හිතාගෙන හිටියේ අද උදේ වරුවේ යළිත් වරක් "හිල් හවුස්" වෙත යන්නයි. අපි ඒ සඳහා තවම සූදානම් වුණෙත් නැහැ. එහෙම නේද වොට්සන්? අපි මෙහෙම කරමු. මට හිතෙනවා නීතිඥ මහත්මයා හමුවෙන එක මේ වෙලාවෙම කළොත් හොඳයි කියලා. උදේ පාන්දර නිසා දැන් ඔහු ගෙදර ඉඳීවි නොවැරදීම.

වොට්සන්. මං ගිහින් නීතිඥයා හමුවෙලා එන්නම්. ඒ අතරේ ඔබ සූදානම් වෙන්න. මං ආපසු ආව වහාම පරීක්ෂණයේ කටයුතු සඳහා හිල්හවුස් වෙත යමු"

පොලිස් පරීක්ෂක පර්සි රිපන් සමඟ කුලීරියකට නැඟුණු හෝම්ස් පිටවී ගියේය. ඔහු ආපසු පැමිණෙන විට එකොළහමාරට ළංවී තිබිණ.

"දැන් මොකද කරන්නෙ?" මම ඇසීමි.

"දැන් ඉතින් අපි දවල් කෑමත් අවසන් කරල තමයි ඊමසේ වත්තට යන්න ඕන" හෝම්ස් කීය. "නැත්නං අපට වැඩ කරන්න වෙන්නෙ බඩගින්නෙ"

දහවල් ආහාරය ඉක්මනින් අවසන් කොට අපි කුලීරියක නැඟී "හිල් හවුස්" නිවස වෙත ගියෙමු. ඒ අතරේ දී රිය තැන් තැන්වලදී නවත්වන මෙන් හෝම්ස් රියැදුරාගෙන් ඉල්ලා සිටියේය. චණ්ඩ සූර්ය රශ්මිය නිසා ඒ වන විටත් අප සිටියේ අපහසුවෙනි. දැඩි උණුසුම නිසා සිරුරෙන් ඩහදිය ගලායමින් තිබිණ. මා සිටියේ ගමන අවසන් කිරීමට නොඉවසිල්ලෙනි.

"වොට්සන්. අපි මිනිත්තු පහකට බැහැල යමුද?" ඔහු විමසුවේ කුලී රථයෙන් බිමට බසිමිනි. "මුවර්හිල් රක්ෂිත වනාන්තරය මං

කවදාවත් දැකල නෑ. ඒ වගේමයි ඩෝචෙස්ටර් ජලාශය. මෙහෙම වෙලාවකවත් ඒව බලාගන්න එක හොඳයි. එහෙම නේද?"

එසේ කියා මගේ මුහුණ දෙස බැලූ හෝම්ස් කාරණා තේරුම් ගන්නට ඇත. කුස පිරෙන්නට ආහාර ගෙන සිටි මට අවශ්‍ය වූයේ එක තැනක රැඳී සිටීමටයි; වනාන්තර හෝ ජලාශ නැරඹීමේ රුචියක් මට කිසිසේත් නොතිබිණ.

"හොඳයි හොඳයි. ඔබ අශ්වකරත්තයට වෙලා ඉන්න" ඔහු කීය. "මං ඉක්මනට ඒ පැත්තට ගිහිං එන්නම්. මිනිත්තු දහයක් ගතවේවි. රියැදුරු උන්නැහේ. ජලාශය බලන්න යන්න කිට්ටුම පාර මේක නේද?"

අඩි හතරක් පමණ පළල, පටු පාරක් දිගේ හෝම්ස් ඇවිද ගියේ, දෙපසින් ඝනව කැලෑව වැවී තිබූ පෙදෙසකය. මිනිත්තු දෙකක් ගතවෙද්දී ඔහු අපට නොපෙනී ගියේය. අපි ඩහදිය වගුරුවමින් බලා සිටියෙමු. හෝම්ස්ට ආපසු පැමිණීමට පැය භාගයක්වත් ගතවන්නට ඇත.

"ඒ ගමන හරිම ප්‍රයෝජනවත් එකක් වුණා වොට්සන්" ඔහු සන්තෝෂයෙන් කීවේ කුලීරියට ගොඩවෙමිනි. "කොහොම වුණත් "හිල් හවුස්" නිවසේ අප කළ යුතු වැඩ ගොඩක් තිබෙනවා. රෝයි මාෂ් නේද අර පොලිස් භටයාගෙ නම? අප එනතුරු ඔහුත් බලාගෙන ඇති. රියැදුරු උන්නැහේ. කිංස්ටන්වලින් ලන්ඩන් බලායන දුම්රිය යන එන වෙලාවල් ගැන, ඔබට වැටහීමක් ඇති කියල මං හිතනවා. ලන්ඩන් පැත්තට ශීඝ්‍රගාමී දුම්රියක්, හැන්දෑවට තියෙන්නේ කීයට විතරද?"

"මහත්මයා. ලන්ඩන් යන දුම්රියක් හවස පහමාරට කිංස්ටන්වලින් පටන්ගන්නවා."

"ශීඝ්‍රගාමී එකක්?"

"ඔව් මහත්මයා"

"ඒක අනර්ඝයි. අපේ වැඩ රාජකාරි ටික ඉවර කරගත්තොත් අපට අදම ලන්ඩන් යන්න පුළුවනි වොට්සන්."

රෝයි මාෂ් නම් පොලිස් භටයා හිල් හවුස් නිවසේ අප එනතුරු බලා සිටියේය. අනෙක් රාජකාරි පසෙකට දමා පළමුව ඔහු සමග සාකච්ඡා කිරීමට හෝම්ස් තීරණය කළේය.

"ඔබ මෙතැන රස්තියාදු කරන්න සිදුවීම ගැන මට කණගාටුයි මාෂ්" හෝම්ස් කීය. "එදා රාත්‍රී ඔබේ අත්දැකීම ගැන මට කියන්න"

"මහත්මයා. මේ සති දෙකේම මට භාර වී තිබෙන්නෙ රාත්‍රි සේවය." මාෂ් කථාව ඇරඹුවේය. "රාත්‍රි මුර සංචාර පටන්ගන්නෙ හැන්දෑවෙ හයට. අපි හතර දෙනෙක් බ්ලැක්හීත් මංසන්ධියෙන් රාජකාරි අරඹනවා. මට පැවරී තිබෙන්නේ රැම්සේ වතුයායට වැටුණු පාර දිගේ මුරසංචාරයේ යෙදීම. ඒ පාර අවසන් වෙන්නේ මොන්රෝවියා වත්තේ මායිම ළඟින්. ඒ කියන්නේ මට ගමන්කරන්න තිබෙන මුළු දුර හැතැක්ම තුනකට කිට්ටුයි. මොන්රෝවියා වත්ත ළඟ මිනිත්තු කිහිපයක් ඉඳලා මං ඒ පාරෙම ආපහු එනවා. මං යන පාර හුඟක් කැඩිලා, පාර පුරා වළවල්. ඒ නිසා ගමන කෙරෙන්නේ හෙමින්.

පෙරේදා රෑ මං ඔය පාර දිගේ මොන්රෝවියා වත්ත දක්වා ගියා. මොකුත් ප්‍රශ්නයක් වුණේ නැහැ. එතැනට යද්දි වෙලාව 6.45යි. එතැන මිනිත්තු දෙකක් විවේක අරගෙන මං ආපහු ආවා. හිල් හවුස් මැඳුර කිට්ටුවට එද්දි වෙලාව හතයි.

මට ඇහුණා කවුදෝ උස් හඬින් "මාලන්! මාලන්!" කියන ශබ්දය. ඒ සමගම තොකඩවා දොරට ගහන ශබ්දයත් ඇසුණා. මේ ගෙදර පදිංචි මාලන් හිල් මහත්මයා බව මං දන්නවා. ඔහු විශ්‍රාමලත් වයස්ගත පුරාවිද්‍යාඥයෙකු බවත් මං දන්නවා. මේ පාරවලට රාත්‍රියේ මුර සංචාර යොදවන්න පොලීසිය තීරණය කළෙත්, ඔහුගේ ඉල්ලීම නිසා කියල මං අහල තිබුණා. ඒ මොකද මොන්රෝවියා වත්තේ බංගලාවකට කඩා වැදුණු හොරු රංචුවක්, ගෙහිමියා මරා දමා මුදල් මංකොල්ල කා තිබුණු නිසා. ඉතින් මං නිශ්ශබ්දව ගේට්ටුව ළඟ නැවතී කන්දුන්නා. ලන්තෑරුමේ එළිය අඩුකර හෙවණැල්ලක් යටට වී බලාහිටියා.

මේ ගෙදර ඉදිරි දොර ළඟ හැන්දෑවට පහනක් දල්වන බව මං දැකල තියෙනවා. නමුත් පෙරේදා පහන් දල්වා තිබුණේ නෑ. එළියක් පෙනුණේ ගේ ඇතුළේ පමණයි. දොරට ගසමින් කෑගැසූ පුද්ගලයා කළේ "මාලන්! මාලන්! මං රසල්!" කියමින් දොරට ගැසීම. මේ වෙලාව වෙනකොට හොඳටම කළුවර වැටිලා. මං ලන්තෑරුම එළිය කරගෙන ඔහු සිටි තැනට ගියා"

"මාෂ්. එතැන සිට ඉදිරියට සිදුවීම් වුණු පිළිවෙළ මං දන්නවා" හෝම්ස් කීය. "මට උවමනා කරන්නේ වෙනත් කාරණාවක් දැනගන්න. ඔබ හවස හයට බ්ලැක්හීත්වල ප්‍රධාන පාරෙන් රාජකාරි ඇරඹුවා. රැම්සේ වත්තට යන පාරේ ගමන් කළා. ඊළඟට මොන්රෝවියා වත්ත

මායිමේ සිට ආපහු ආවා. මේ කාලය ඇතුළත මේ පාරෙ ගිය කවුරු හරි ඔබට දකින්න ලැබුණාද? ඔබේ ඉස්සරහට හමුවුණාද?"

"නැහැ මහත්මයා"

"කාගෙවත් ශබ්දයක්, කෑගහන හඬක්, හරි වෙන අසාමාන්‍ය දෙයක්, ඔබට අහන්න හෝ දකින්න ලැබුණෙත් නැද්ද? හොඳට කල්පනා කරලා ඒක මට කියන්න"

"නැහැ මහත්මයා" මාෂ් කීවේ මිනිත්තු කිහිපයක් කල්පනා කළ පසුවය.

"හිල් හවුස් හි පහන් ඔබ යද්දි දල්වා තිබුණද?"

"නැහැ. සමහරදාට නම් පහන් දල්වා ඇති හැටි මට දකින්න ලැබෙනවා. මම එතැනින් යද්දී ඉර එළිය යන්තමට තිබූ නිසා ඒ ගැන මං මොකුත් හිතුවේ නැහැ"

"රසල් හිල් මහත්තයා මේ පාරේ ඇවිදගෙන එනවා මීට පෙර ඔබ දැක ඇති?"

"ඔව් මහත්මයා. මං හිතන්නේ තුන්හතර වතාවක් දැක තිබෙනවා. ඔහු කිංස්ටන් සිට එන්නේ පයින්මයි. ඒ මොකද කුලීරථ රියැදුරන් කළුවර වැටුණාම මේ පැත්තට එන්න අකමැති නිසා."

"එදා ඔය පැත්තේ රාත්‍රි මුර සංචාරයේ යෙදුණු ඔබේ මිත්‍රයන් සමග ඔබ කථා කරන්න ඇතිනේ. සැක කටයුතු කෙනෙක් හෝ අසාමාන්‍ය සිදුවීමක්, ඔවුන්ගෙන් කාට හරි දකින්න ලැබී තිබුණාද?"

"අපේ ප්‍රධානියා – රිපන් මහත්මයාත් මේ ගැන අපෙන් විමසුවා. නමුත් කිසිම කෙනෙකුට කිසිම දෙයක් දකින්න ලැබිල තිබුණෙ නෑ"

"හොඳයි මාෂ්. මට දැනට ඔබෙන් දැනගන්න උවමනා එපමණයි" හෝම්ස් කිය. "අපි මෙහේට ගෙනා කුලීරිය තවම ඇති. අප එනතුරු රැඳී ඉන්න කියල මං ඔහුගෙන් ඉල්ලා හිටියා. ඔබට පුළුවනි ඒකෙ නැගී කිංස්ටන් පොලීසිය වෙත ආපහු යන්න. මං ඔබට ලියුම් කැල්ලක් දෙන්නම්. ඒක දෙන්න පර්සි රිපන් මහත්මයාට. මං ඒකෙන් ඉල්ලා හිටින්නෙ මට උදව් කරන්න, සාජන්ට් ඇලිස්ටෙයා මෙහේට එවන්න කියලයි."

"ඔව් මහත්මයා. ඔබ කියන දේ මං කරන්නම්" පොලිස් භටයා කිය.

"සාජන්ට් ඇලිස්ටෙයා මේ පළාතෙ කෙනෙකු බව මට අහන්න ලැබුණා. මේ පැත්තෙ අතුරු පාරවල් ගැන ඔහු හොඳින් දන්නවා

ඇති. මේ මිනීමැරුම සිදුවෙලා තියෙන්නෙ හවස පහට පමණ. එල්ලවුණු ප්‍රහාරයේදී අත්ඔරලෝසුව නැවතුණු එකෙන් ඒ බව තහවුරු වෙනවා. කාමරයේ ලාච්චු, අල්මාරි අවුස්සා දමමින්, ඔහු යමක් හොයන්න ඇත්තේ මාලන් හිල් මරා දැමීමෙන් පසු. ඒ කියන්නේ හවස පහට පසු. මේ සූක්ෂම සොයා බැලීමට අපරාධකාරයාට පැයක් නැත්නම් මිනිත්තු හතළිස්පහක් අඩුම වශයෙන් ගතවෙන්න ඇති. නමුත් ඔහු ආපසු යද්දී ඔබ කාටවත් දකින්න නොලැබුණේ ඇයි? පොලිස් භටයන් මේ පාරේ මුරසංචාරයේ යෙදෙන බව සමහරවිට ඔහු දැන හිටින්න ඇති. ඒ නැතත් වෙනත් කෙනෙකු හෝ තමන්ව දැකීමේ අවදානමක් ඇති බව අපරාධකාරයා දැන හිටියා."

"එහෙනම් අපරාධකාරයා මොකක්ද කරන්න ඇත්තෙ?" මම ඇසීමි.

"ඔහු මේ පාරෙ නොගිහින්, හොර පාරක් යොදාගන්න ඇති" හෝම්ස් කීය. "ඒ කියන්නෙ කැලේ මැදින්, පහත් බිම් මැදින් වැටුණු අඩි පාරක් යොදාගන්න ඇති. මට ඇලිස්ටෙයාගෙ උදව් උවමනා වෙන්නෙ එතැනදී. අපට උපකාර කරන්න ඔහුට පුළුවන් බව මට විශ්වාසයි."

අපෙන් සමුගත් මාෂ් කුලීරියේ නැගී කිංස්ටන් බලා පිටත්විය. එහි රියැදුරාගේ ගාස්තුවද ගෙවා හෝම්ස් ඔහු අතට අමතර මුදලක් දුන්නේ සාජන්ට් ඇලිස්ටෙයාද කැඳවාගෙන එන මෙන් ඉල්ලමිනි.

"වොට්සන්. මං ඔබට කලිනුත් කිව්වා වගේ, මගේ බලාපොරොත්තුව අද හවසට ආපහු ලන්ඩන් යන්නයි" මගේ මිතුරා පැවසුවේ පොලිස් භටයා පිටවී ගිය පසුය.

"ඉතින් මොකක්ද ප්‍රශ්නේ?" මම ඇසීමි.

"මගේ පරීක්ෂණයේ තවමත් සම්පූර්ණ කරගන්න බැරිවුණු කොටසක් තියෙනවා. මෙහෙන් යන්න කලින් ඒකත් කරගත යුතුමයි."

"ඒ මොකක්ද?"

"ඔබට මතක නේ, අපි අද මෙහේ එන අතරේ කුලී රිය නවත්වලා මං බැහැල ගිය හරිය? මුවර්හිල් හරිය..... අර රක්ෂිත වනාන්තරයක් තිබුණේ......?"

"ඔව් මට මතකයි.... අර ජලාශයකුත් තියෙනවා කියල ඔබ කිව්වේ. ඒක නේද?"

"අන්න හරි. ඒ හරියේ පාරවල් මං හරියට දන්නෙ නැහැනෙ. ඒ හරිය සෝදිසි කරනවා නම්, ඒ හරිය හොඳින් දන්නා කෙනෙක්

කැඳවාගෙන යන්න ඕන. ඒ නිසයි මං සාජන්ට් ඇලිස්ටෙයා එවන්න කියලා පොලිස් නිලධර රිපන්ට පණිවුඩයක් යැව්වෙ."

"ඉතින්?"

"මෙහේ ඉඳන් එතැනට හැතැක්ම තුනක් තුනහමාරක් තියේවි." හෝම්ස් කිය. "ඔහුට එන්නත් පැයකට කිට්ටු කාලයක් ගතවේවි. ඊට වඩා හොඳයි මෙහෙම කරන්න පුළුවන් නම්. අපි එතැනට ගිහිං ඉඳිමු. ඔහු එද්දී අශ්වකරත්තය නවත්වාගමු"

"ඔව් ඒක හොඳයි."

"මට තවමත් සම්පූර්ණ කරන්න බැරිවුණු වැඩ මෙතැන ඉතිරිව තියෙන්නේ ඉතාම ස්වල්පයයි. මං ඒක ඉක්මනට අවසන් කරන්නම්"

මාලන් හිල්ට අයත් පොත් අල්මාරියක, පහතම ලාච්චුවක් ඇරීමට හෝම්ස් දැඩි උත්සාහයක යෙදුණේය. එය අසාර්ථක වූ තැන ඔහු කළේ යකඩ පටියක් දමා ලාච්චුවේ අගුල කඩා දැමීමයි. ඉන්පසු ලාච්චුව ඉතා පහසුවෙන් විවෘත විය. ගනකම් දූවිලි තට්ටුවලින් වැසී තිබූ ලිපිගොනු කිහිපයක්ම ඔහු එයින් ඉවතට ගත්තේය. ඒවා ඉක්මනින්ම පෙරළා බැලූ ඔහු, එයින් ලිපිගොනු දෙකක් පමණක් තෝරාගෙන, ඉතිරි ඒවා ආපසු ලාච්චුවට දමා වසා දැම්මේය. තෝරාගත් ලිපිගොනු දෙක ලොකු දුඹුරු පැහැති කවරයකට දමා නූලකින් ගැටගසා, එය මගේ අතේ තිබූ මල්ලට දමාගත්තේය.

"මේක තමයි මං හුඟක් මහන්සිවෙලා හෙව්වේ." හෝම්ස් කීය. "ඒව ගෙදර ගෙනිහින් විවේකව කියවලා බලමු. දැන් ඉතින් ආපහු ගමන අරඹමු"

අපි බ්ලැක්හීත් මංසන්ධිය වෙත පයින්ම ආවෙමු. බ්ලැක්හීත් පාපන්දු ක්‍රීඩා ගැන තොරතුරු ලබාගැනීමට පුවත්පත් වාර්තාකරුවෙකු ගෙන ආ කුලීරිය අල්ලා ගැනීමට අපට හැකිවිණි. එහි නැඟී මුවර්හිල් වෙත ගොස් සාජන්ට් ඇලිස්ටෙයා එනතුරු මඟ බලාසිටියෙමු. පැය භාගයක් පමණ ගතවෙද්දී ඔහු රැගත් කුලීරිය අප සිටි තැනට ළඟාවිය.

"මම සාජන්ට් ඇලිස්ටෙයා. මේ ෂර්ලොක් හෝම්ස් මහත්මයා සහ වොට්සන් දොස්තර මහත්මයා නේද?"

"ඔබ හමුවීම සතුටක්" හෝම්ස් කීය. "මං විශේෂයෙන් ඔබ කැඳෙව්වේ ඇයි කියල ඔබ දැනටමත් දන්නවා ඇති. ඔබ ගැන පර්සි රිපන් මහත්මයා මට කිව්වා. මට උවමනා කරන්නේ මේ පළාතේ පාරවල් කිහිපයක් හඳුනාගන්න.

අපි මෙහෙම හිතමු. මාලත් හිල් පදිංචිව සිටි නිවසේ ඈල කැලෑ පාරකින් පැනයන්න, අපරාධකාරයෙකුට උවමනා වුණා කියල හිතමු. ඒ සඳහා ගන්න පුළුවන් පහසුම හොඳම මාර්ගය මොකක්ද? මං අදහස් කරන්නේ, ගලින් ගලට පැනයාමට අවශ්‍ය නැති, දියකඩිතිවල බැහැල යාමට උවමනා නොවෙන පාරක්"

"මහත්මයා" ඇලිස්ටෙයා කීය. "මීට අවුරුදු දහයකට පහළොවකට කලින් නම්, ඔය කියන වගේ පාරවල් හතරක් පහක්වත් මට පෙන්වා දෙන්න තිබුණා. නමුත් දැන් ඒවායේ තත්ත්වය කොහොමද කියල මං දන්නෙ නෑ. ඒ මොකද මං මේ කැලෑවට පිවිසෙන්නෙ අවුරුදු පහළොවකට විතර පස්සෙ. මට සහතික වෙන්න බෑ......"

"...... කමක් නෑ අපි ගිහින් බලමු" හෝම්ස් කීය.

"පාසල් ගිහින් ගෙදර එන යාළුවො කට්ටිය රොබින් හුඩ් සෙල්ලම් කරන්න කැලේට පනින්නෙ මෙතැනින්" ඔහු කීවේ කලින් හෝම්ස් පා නැඟූ කැලෑ මාර්ගය පෙන්වමිනි. "ඒ කාලෙ මේක ගමේ මිනිස්සු සතුන් දඩයම් කළ, ගස් කැපූ මහ වනාන්තරයක්. දැන් නම් මේක රක්ෂිත වනාන්තරයක්. ඉස්සරහට තියෙන පහත් බිම් අයිතින් හිල් පවුලෙ අයට. මේ පළාතෙ ගවයන් හා බැටළුවන් ඇතිකරන අය, සතුන්ට තණකොළ කවන්න ගෙනෙන්නෙ මේ අඩවියට. තව ටිකක් ඉදිරියට ගියාම ඔබට ඩෝචෙස්ටර් ජලාශය දකින්න ලැබේවි. ඒ නිසා සතුන්ට වතුර බොන්න දෙන්නත් වෙන කොහේටවත් ගෙනියන්න උවමනා නැහැ"

"අපි හැරුණු තැනම තිබුණා ඉස්තාලයක් වගේ පරණ ගොඩනැගිල්ලක්." හෝම්ස් කීය. "මෙතැන තියෙනවා තවත් එකක්. මේව මොනවද?"

"මේ පහත් බිම් ඉස්සර තිරිඟු, ඕට්ස් වගේ ධාන්‍ය වගා කළ සශ්‍රීක ඉඩම්ලු. ඒ කාලෙ ඔය මඩු යොදාගෙන තියෙන්නෙ, ධාන්‍ය මලු, පෝර සහ, කෘෂි යන්ත්‍රෝපකරණ ගබඩා කරන්න. පස්සෙ මිනිස්සු කැලෑ කපද්දි ඇව ගබඩා කළා. දැන් නම් ජරාවාස වෙලා" ඔහු කීවේ බාගෙට ඇර දමා තිබූ එවැන්නක ඇතුළට එබී බලමිනි.

"ඔන්න ඇලිස්ටෙයා මෙතැන තියෙනවා මං හොය හොයා හිටි දෙයක්. මේ බලන්න" හෝම්ස් කීවේ පොළොවට ඇඟිල්ල දිගුකරමිනි.

"ඒ මොකක්ද මහත්මයා?"

"බයිසිකලයක ටයර් සලකුණක්. අපි බලමු මේකෙ වර්ගය මොකක්ද කියලා....... ටයර් දෙක වර්ග දෙකක. බයිසිකල් ටයර් වර්ග හතළිහකට කිට්ටු ගණනක, කට්ට රටා මං අධ්‍යයනය කර ඇති බව ඔබට කිව්වා නේද වොට්සන්. එක් ටයරයක් අලුත් ඩන්ලොප් ටයරයක්. අනික පෙරිග්‍රීන්. ඒක මඳක් ගෙවිලා. හො....... හෝ පිටුපස ටයරය තමා ඩන්ලොප්. ඔහු සෑහෙන තරම් වේගයෙන් බයිසිකලය පැදගෙන ගිහින් තියෙනවා. ඊළඟට බ්‍රේක් පාරක්. මොකද ඔහු බයිසිකලයෙන් බැස්සේ? ආ...... මඩවගුර හරහා පාර අවහිර කරමින් වැටී තිබුණු අත්තක්..... මේ තියෙන්නේ අත්ත ඉවතට ඇද දැමූ සලකුණු.

ඇලිස්ටෙයා මොහොතක් ඉන්න. මට උවමනායි මේ ටයර් සලකුණු මගේ සටහන් පොතේ ඇඳගන්න. බයිසිකලය පැද ආ තැනැත්තාගේ පාවහන්වල අඩිය, ඉතාම හොඳින් මේ මඩගොඩේ සලකුණු වෙලා..... ඒකත් ඇඳගමු. මේ පියවර දෙක අතර දුරත් මා මැනගත යුතුයි...... මොහොතක් ඉන්න..... දැන් ඒකත් හරි. මොකක් ගැනද අපි කතාකරමින් හිටියේ?"

දිගින් දිගටම මේ අඩවිය ගැන තොරතුරු කියමින් සිටි ඇලිස්ටෙයාට නිහඬවීමට සිදුවුණේ හෝම්ස් දුටු ටයර් සලකුණු නිසයි.

"මං කියන්න හැදුවේ මේ තරමට සශ්‍රීක ඉඩම් ධාන්‍ය වගා නොකර අත්හැර දැමීම ගැන....."

සාජන්ට් ඇලිස්ටෙයා කියූ දේ සත්‍යයක් බැව් මම තේරුම් ගතිමි. එම පහත්බිම් ප්‍රදේශයේ තණකොළ මෙන්ම අනෙක් වල් පැළෑටි හා පඳුරු වර්ග ද, ඉතා සරුව ඝනව වැවී තිබිණ. හරකුන් හා බැටළුවන් තණ කෑම සඳහා රංචු පිටින් පැමිණි සලකුණු දිගින් දිගටම දැකිය හැකි විය.

මගේ මිත්‍රයා කළේ, බිම තිබූ ටයර් සලකුණු ආදිය ගැන අවධානය යොමු කිරීම මිස, ඇලිස්ටෙයා කියූ දෙයට කන්දීම නොවේ. මේ අන්දමින් අප ඇවිද ආ දුර ප්‍රමාණය, සැතපුම් දෙකහමාරක් පමණ විය යුතුයයි මම අනුමාන කළෙමි.

"අර තියෙන්නේ ඩෝචෙස්ටර් ජලාශය" ඇලිස්ටෙයා කීවේ අප ගමන් කළ පාර සමීපයටම විහිදී තිබූ ජලාශයක් පෙන්වමිනි. "මේකෙ තමයි කොල්ලො කට්ටිය පිහිනුම් තරග පවත්වන්නෙ. එක්කෙනෙක් දියේ ගිලී මළාට පස්සේ ඒ ඔක්කොම නැවතුණා"

ඔහු කියූ දේට කන් යොමු නොකළ හෝම්ස් ඉදිරියට ඇවිද ගියේය. ඒ මාර්ගය දෙසට දෙනෙත් යොමු කරගෙනයි. අපේක්ෂා කළ දෙය දකින්නට නොලැබීමෙන්දෝ, ඔහු නළලේ අත තබාගෙන කල්පනා කළේය. ආපසු හැරුණු ඔහු යළිත් වරක් අප පසු කරගෙන, ආ මාර්ගයේම ආපසු ගමන් කළේය. යාර පනහක් පමණ ගිය හෝම්ස් නැවතුණේය. ඔහු යළිත් අප සිටි දෙසට පියවර නැගුවේය. අපි නිහඬව බලා සිටියෙමු. හිස කසමින් කල්පනා කළ ඔහු තීරණයකට ආ බැව් පෙනිණ.

"ඇලිස්ටෙයා. ඔබ කී දේට කන් නොදුන්නාට මට සමාවෙන්න" හෝම්ස් කීය. "මෙතැන ඉඳන් හිල් හවුස් නිවසට හුඟක් ළඟද?"

"ඔව් මහත්මයා. යාර සීයක් නෑ. මේ බෑවුමේ ඉහළට නැග්ග ගමන් හිල් හවුස් ගෙදර ගෙවත්තේ පිටුපස දොරටුව. ඒ කාලේ නම් එතැන තිබුණේ හරහට උණ බම්බු දමාපු කඩුල්ලක්. දැන් නම් එතැන ගේට්ටුවක් තියෙනවාද කියන කාරණය මා දන්නෙ නෑ"

"අපි ගිහින් බලමු"

ඉබියතුරු දැමීමට සැකසූ සවිමත් ගේට්ටුවක්, එතැන තිබූ බැව් එහි ළඟාවූ අපි දුටුවෙමු. එහෙත් ඉබ්බෙකු දක්නට නොවීය. අපි පිටුපස ගේට්ටුවෙන් හිල් හවුස් වෙත පැමිණියෙමු. වයස්ගත හැරිසන් යුවළ නිවස පිරිසිදු කරමින් සිටි ආකාරය දක්නට ලැබිණ. පොලිස් පරීක්ෂක පර්සි රිපන් විසිත්ත කාමරයේ අසුනකට වී පයිප්පයක් උරමින් සිටියේය.

"ආයුබෝවන් හෝම්ස් මහත්මයා ඔබේ වැඩකටයුතු සාර්ථකද?"

"ඉතාම සාර්ථකයි. පරීක්ෂණය සියයට අනූවක් සම්පූර්ණයි. කරන්න ඉතිරිවෙලා තියෙන්නෙ ඉතාම ස්වල්පයක් පමණයි. ඒ ටික සම්පූර්ණ කරන්න හැකිවෙන්නෙ, මං ආපසු ලන්ඩන් නගරයට ගියාට පස්සෙ. ඒ කටයුතුවලට පැය විසිහතරක්වත් අවශ්‍යයි. හෙට නෙමෙයි අනිද්දාට, අපි මෙහේ එනවා, ලෙස්ට්‍රේඩ් සමග."

අපට ආපසු යෑම සඳහා කුලීරියක් සූදානම්ව තිබිණ. 'ඩැෆඩිල්ස්' වෙත පැමිණ අපේ ඇඳුම් මලුද එකතු කරගෙන, අපි සවස පහමාරේ දුම්රියෙන් ලන්ඩන් බලා ආවෙමු.

ලෙස්ට්‍රේඩ් අපේ පැමිණීමේ අපේක්ෂාවෙන් බේකර් වීදියේ නිවහනට පැමිණ සිටියේය.

"අප මේ වෙලාවට ගෙදර එන බව ඔබ කොහොමද දැනගත්තෙ?" මගේ මිත්‍රයා විමසුවේය.

"රිපන් කිංස්ටන්වලින් මට විදුලිපුවතක් එවා තිබුණා. කොහොමද හෝම්ස් මහත්මයා ඔබේ ඉදිරි ගමන?"

"තවමත් ඒ කටයුතු සම්පූර්ණ නෑ ලෙස්ට්‍රේඩ්. පරීක්ෂණ සහ විමර්ෂණ කටයුතු තවත් ස්වල්පයක් ඉතිරි වී තියෙනවා. හෙට දවසේ ඒ ටික සම්පූර්ණ කිරීමට හැකිවේවි කියල මං විශ්වාස කරනවා. අනිද්දා උදේ දුම්රියෙන් කිංස්ටන් යන්න සූදානමින් ඉන්න"

"විශිෂ්ටයි හෝම්ස් මහත්මයා!" කී ලෙස්ට්‍රේඩ් අපට ශුභ රාත්‍රියක් පතා පිටවී ගියේය.

රාත්‍රී ආහාරයෙන් පසු මගේ මිත්‍රයා තම බෑගය විවෘත කොට හිල් නිවසින් ගෙන ආ පොත් කිහිපයක් එළියට ගත්තේය.

"වොට්සන්. මේක මාලන් හිල්ගේ අල්මාරියක තිබුණු සඟරාවක්. ඔබට පෙනෙනවා ඇති මේකෙ පිටපැත්තේ "වැදගත්" කියා ලියා ඇති බව. මේකෙ තියනවා ඔහු ගැන විස්තරයක්. ඒ නිසා තමයි මේක අරන් තියාගත්ත ඇත්තෙ. ඔබ කැමතිද මේක මටත් ඇහෙන්න කියවන්න? මේක බ්‍රිටිෂ් ඊජිප්ටොලොජිකල් ජර්නල් සඟරාවේ 1862 වසරේ කලාපයක්. මේ ඡායාරූපය සමග තියෙන්නෙ විස්තරය...."

## "ආචාර්ය හිල්, මාලන් හියුගෝ (1821 – )
## (බ්‍රිතාන්‍ය ජාතික ඊජිප්තු පුරාවිද්‍යාඥයා)

1845 දී කේම්බ්‍රිජ් සරසවියෙන් පුරාවිද්‍යාව පිළිබඳ ගෞරව උපාධියක් ලැබූ ඔහු පශ්චාත් උපාධිය සඳහා ජර්මනියේ බර්ලින් සරසවියට ඇතුළු විය. මහාචාර්ය කාල් රිචඩ් ලෙප්සියස් නම් ඊජිප්තු පුරාවිද්‍යාඥයා යටතේ එම ක්ෂේත්‍රයට පිවිසි හිල් 1857 දී මහාචාර්ය ලෙප්සියස් සමග කැණීම් සඳහා ඊජිප්තුවට ගියේය. වරක් ඔහු සහ තවත් විද්‍යාඥයන් පිරිසක් කාන්තාරය මැද අතුරුදන්ව මියගිය බවට ආරංචි විය. කෙසේ වෙතත් ඔවුන් දිවි ගලවාගෙන තිබිණි. තුතාන්කාමන්ගේ මහ සෙනෙවියන් වූ හොරෙම්හෙබ් හා මායාගේ සකාරා හි පිහිටි සොහොන් ගැබ් ගවේෂණය කර, තොරතුරු සම්භාරයක් හෙළි කරගත්තා ලද්දේ ආචාර්ය මාලන් හිල් විසිනි. මේ සොයාගැනීම වෙනුවෙන් ඔහුට ඊජිප්තු පුරාවිද්‍යාව පිළිබඳ යුරෝපා සංගමය පිරිනමන ෂෝන් ප්‍රංසුවා ෂැම්පලීන් රන් පදක්කම හිමිවිය.

1851 දී විවාහ වූ ඔහු දරු දෙදෙනෙකුගේ පියෙකි."

මම සඟරාව මගේ මිත්‍රයා අතට දුන්නෙමි.

"අපට තවත් කතාකරන්න පුළුවන් කාරණා හුඟක් තියෙනව වොට්සන්" ඔහු කීය. "නමුත් මේ ඒකට වෙලාව නෙමෙයි. මට පෙනෙනවා ඔබට හරි මහන්සියි. ඒ වගේම නිදිමතයි....."

"..... ඇයි ඔබට නිදිමත නැද්ද?"

"දැඩි කුතුහලයක් ඇති කරවන, ඉතාම සංකීර්ණ, එමෙන්ම සිත් ඇදගන්නා ගැටලුවක් මා ඉදිරියට තියෙන කොට, මට කොහොමටවත් නින්ද යන්නෙ නෑ. නින්දට යන්න කලින් මා එය විසඳිය යුතුමයි. ඔබට ශුභ රාත්‍රියක් වොට්සන්!"

පසුවදා උදෑසන තේ පානය සඳහා මා පැමිණෙන විට, හෝම්ස් තම කටයුතු අවසන් කරමින් සිටියේය. මෙවර ඔහුගේ පරීක්ෂාවට ලක්වී තිබුණේ, මියගිය හිල් මහතාගේ අතෙන් ගලවා ගත් ඔරලෝසුවයි.

වෙනදාට ඔහු රසායනික පර්යේෂණ සඳහා යොදාගන්නා මේසය මේ සඳහා ප්‍රයෝජනයට ගෙන තිබිණ. රසායනික ප්‍රතිකාරක අඩංගු බෝතල් සහ බන්සන් දාහකය වෙනුවට මේසය මත තිබුණේ, ඔරලෝසු කාර්මිකයන් ප්‍රයෝජනයට ගන්නා, ඉතා සියුම් ඉස්කුරුප්පු නියන්, පරණ ඔරලෝසු, ඇස ළඟම පළඳින කාච සහ අනෙකුත් උපකරණ කට්ටලයකි.

"මගේ හිතවත් වොට්සන්" හෝම්ස් කීවේ ඔහු යෙදී සිටි කටයුත්ත ගැන මා උනන්දුවක් දක්වන බව දුටු විටයි. "මාලන් හිල්ගේ මේ අත්ඔරලෝසුවේ වීදුරුව බිඳිලා. වෙලාව නැවතිලා හවස 5 යි මිනිත්තු 02 ට. මොකක්ද ඔබේ නිගමනය?"

"මාලන් හිල්ට ප්‍රහාරයක් එල්ලවුණා 5 යි 02 ට. ඒක ස්ථිරයි"

"ඒ කියන්නේ අපරාධකාරයා බොහොම දුරට ගෙට ඇතුළුවෙන්න ඇත්තේ හවස 5ට හෝ ඊට ටික වෙලාවකට කලින්? එහෙමද?" හෝම්ස් විමසීය.

"එහෙම විය යුතුයි. හැරිසන්ල ගෙදරින් පිටවෙලා යද්දි වෙලාව 4.35 යි. එතැන ඉඳන් ගතවුණු පැය භාගයක තරම් කාලයකදි තමා හැම දෙයක්ම සිදුවෙන්න ඇත්තෙ" මම කීවෙමි.

"වැරැදියි! වැරැදියි!! වැරැදියි!!!"

හෝම්ස් උස් හඬින් කීවේ ශබ්ද නගා සිනාසෙමිනි.

"ඒ කොහොමද වැරදුණේ?" මා ඇසුවේ ඔහු එය කියූ ආකාරය ගැන විමතියට පත්වය.

"ඔන්න අභාගත්ත මිත්‍රයා" හෝම්ස් කිය. "අපරාධකාරයාගේ ප්‍රහාරය එල්ල වුණේ මාලන් හිල්ගේ හිසට මිසක් අතේ මැණික් කටුව ප්‍රදේශයට නොමෙයි. නමුත් ඔරලෝසුවේ වීදුරුව බිඳී වෙලාව නැවතී තිබුණා. එහෙම වුණේ කොහොමද?

අපි ඒ වෙලාවෙ හිතුවේ, හිල් වැටෙද්දී, ඔහුගේ අත ගිනිඋදුන ආරක්ෂාවට තිබූ යකඩ වැටේ වදින්න ඇති කියලයි. මේ ඉතාම හොඳ වර්ගයේ රොලෙක්ස් ඔරලෝසුවක්. එහි වීදුරුව බිඳී ගොස්, කටු අමුණා තිබෙන කූර නැමෙන්න නම්, සැහෙන්න ප්‍රබල පහරක් එහි මුහුණතට එල්ල විය යුතුයි. පරණ රොලෙක්ස් ඔරලෝසු යොදාගෙන ඊයේ රාත්‍රි මං එය අත්හදා බැලුවා. ඒ නිසයි මං විශ්වාසයෙන් කියන්නෙ.

අතේ බැඳ තිබියදී ඒ ප්‍රබල ප්‍රහාරය එල්ල වුණා කියල මොහොතකට හිතමු. එහෙනම් ඔරලෝසුවට යටින් සමේ සැහෙන තැල්මක් තිබිය යුතුයි. සමට යටින් කේෂ නාළිකාවල ලේ ගැලීමක් සිදුවෙනවා. ඉතාම ප්‍රබල කාචයකින් මා මළසිරුරේ එතැන පරීක්ෂා කළත් සමේ වෙනසක් තිබුණේ නෑ. එතකොට මිනීමරුවාට උවමනා කළේ මොකක්ද? මිනීමැරුම සිදුවුණේ හවස 5.02 ට කියා අපට පොලීසියට දැනුම් දෙන්න."

"එතකොට ඔබ කියන්නේ මේ ඝාතනය සිදුවෙන්න ඇත්තෙ කීයට විතර කියාද?"

"මං කියන්නේ එය සිදුවෙන්න ඇත්තේ 6.30 ට පමණ" හෝම්ස් කීය. "මේකට මිනිත්තු 10ක් පමණ අඩු හෝ වැඩිවිය හැකියි."

"ඔබ කොහොමද හෝම්ස් ඒ වගේ නිගමනයකට ආවෙ? මොකක්ද මෙතැන සිදුවෙලා තියෙන්නෙ? මේක ටිකක් පැටළිලි සහගතයි."

"සිදුවුණු දේ මං ඔබට සරලව කියන්නම් වොට්සන්. අපරාධකාරයා හිල්ගේ හිසට පහර එල්ල කළේ හවස 6.30 ට කියල හිතමු. ඔහු හිල් මියගිය වහාම අත් ඔරලෝසුව ගලවාගෙන, ඒකෙ වෙලාව ආපහු කරකවනවා. පැය එකහමාරක් ආපහු කැරකුවාම වෙලාව පහයි. දැන් ඔහු ඔරලෝසුව ගිනි උදුන් පඩිය උඩ තියලා, එහි මුහුණතට පහරක් එල්ල කරනවා. මොකකින්ද? හිසට මාරාන්තික පහර එල්ල කළ බේස්බෝල් පිත්තෙන්ම. එය ගිනිඋදුන අසල වැටී තිබුණු හැටි අප දුටුවා"

"එතකොට අපරාධකාරයා එහෙම දෙයක් කළේ මොන අරමුණකින්ද?" මම ඇසීමි. "මිනීමැරුම සිදුවුණේ හවස 6.30 ට

නොව හවස 5 ට බව පෙන්වීමෙන් මොකක්ද ඔහුට ලැබෙන වාසිය?"

"ඒක බොහොම සරල දෙයක් නේ වොට්සන්. ඔබට තේරෙන්නෙ නැද්ද? අපරාධකාරයා හවස පහේ සිට 5.30 හෝ 5.45 දක්වා තමන් සමග සිටි බව කීමට සාක්ෂිකාරයන් – මිත්‍රයන් ඉන්නවා. ඒ වෙලාවෙ ඔවුන් අතර සිටි මිත්‍රයා, ඊට හැතැක්ම 6ක් 7ක් ඈත තැනක හවස 5 ට මිනිමැරුමක් සිදු කරන්නෙ කොහොමද? ඔහුට විරුද්ධව චෝදනා එල්ල කරන්නවත් පොලීසිය නිර්භය වෙන්නෙ නෑ"

"හොඳයි. ඔබ කියන දේ නිවැරදියි කියල මට විශ්වාසයි" මම කීවෙමි. "නමුත් ඔබ කොහොමද ඔය වගේ සංකීර්ණ දෙයක් හොයාගත්තෙ?"

"මං ඒකත් හැකි තරම් සරලව ඔබට තේරුම් කරන්න උත්සාහ ගන්නම් වොට්සන්.

මං මුලින්ම ඔරලෝසුවේ කටු සහ නැමී තිබුණු කූර අලුත්වැඩියා කරල, එය යථා තත්ත්වයට පත්කළා. මේක ඉතාම හොඳ, මිල අධික ඔරලෝසුවක්. මේක එක වාරයක් සම්පූර්ණයෙන්ම වයින් කළාම, පැය විසිහතරක් දුවනවා. මං ඒ බව වඩාත් තහවුරු කරගත්තේ, ඔරලෝසු තාක්ෂණ ශිල්පීන්ගේ කෝෂ ග්‍රන්ථය සෝදිසි කිරීමෙන්. මේ වර්ගයේ රොලෙක්ස් ඔරලෝසු ගැන සම්පූර්ණ විස්තරයක් එහි තිබෙනවා.

මේ ඔරලෝසුව හැමදාම හවස 4.30 ට වයින් තබන බව හැරිසන් යුවළ මා සමග කිව්වා. ඔවුනට වැඩ අවසන් කර නිවසෙන් පිටවී යන්න කියලා හිල් මහත්මයා කියන්නේ අත්ඔරලෝසුව වයින් කරන ගමන්ලු. දැන් මෙහෙම හිතන්න.

ඔරලෝසු දුන්නේ වයින් කාලය පැය 24යි.

නමුත් මං එය පරීක්ෂා කර බැලුවාම එහි වයින් ඉතිරිව තිබුණේ තවත් පැය 22 කට පමණයි. ඒකෙන් තේරෙනවා 4.30 ට වයින් කළ ඔරලෝසුව හවස 6.30 දක්වා ක්‍රියාකර ඇති බව.

එයට පොලු පාරක් දීලා, ඇත්තටම හවස 5ට ඔරලෝසුව නැවැත්තුවා කියලා හිතමු. එසේ නම් එහි දුන්නේ පැය 23½ක වයින් ඉතිරිව තිබිය යුතුයි. නමුත් එහෙම තිබුණෙ නැහැ. මෙතැනදී අප මතක තබා ගතයුතු කාරණය මේකයි. ඔරලෝසු කටු පැය 1½ ක් ආපසු කැරකැව්වාට, එහි දුන්න ඒ ප්‍රමාණයට ආපහු තදවෙන්නෙ

නෑ. මේක ඔබට තවමත් පැහැදිලි නැත්නම් මං පසුව ඔබට හොඳින් තේරුම් කර දෙන්නම්"

"හොඳයි. ඒක ගැන අපි පස්සෙ තවදුරටත් කථාකරමු. මොකක්ද හෝම්ස් ඔබ මට කියන්න ඕන කියූ අනික් කාරණය?"

"ඔව්. මං ඊයෙ උදේ ගියානෙ අර නීතිඥ මහත්මයා හමුවෙන්න. ඔහු තේ මාලන් හිල්ගේ නීතිඥයා – කෝතෝන් මහත්මයා? රසල් හිල් මොකක්ද අපට කිව්වේ? තමන්ගේ ඥාති සොහොයුරාට වෙනිං කාත් කවුරුවත් නැත; ඒ නිසා මාලන්ගේ අන්තිම කැමැති පත්‍රයේ හැටියට, මාලන්ගේ මරණයෙන් පසු, හැරිසන්ලාට ලියූ පවුම් දහස ඇර අනික් සියලුම දේපළ හිමිවෙන්නෙ තමන්ට බව."

"රසල් එහෙම කියුවා තමයි. නමුත් ඇත්ත තත්ත්වය ඒක නෙමෙයිද?"

"ඒ ගැන නීතිඥ මහත්මයාගෙන් මට වෙනත් කතාවක් අහන්න ලැබුණා" හෝම්ස් කිය. "අවුරුදු විස්සක් ඊජිප්තුවේ ඉඳලා, විශ්‍රාම අරගෙන මාලන් හිල් එංගලන්තයට ඇවිත් තියෙන්නේ 1877 දී. ඔහු රැම්සේ වත්තෙ පදිංචි වුණේ, තවත් කොහේවත් යන බලාපොරොත්තුවෙන් නෙමෙයි. ඔහු තමන්ගේ අන්තිම කැමති පත්‍රය ලියුවෙත් මේ කාලෙදී. තමන්ගේ ආදරණීය ඥාති සොහොයුරා රසල් ගැන, ඒ කාලයේ මාලන් හරි පැහැදීමකින් සිටියලු. නමුත් අවුරුදු දෙකක් ගතවෙද්දි ඔහුට මෙහේ ජීවිතේ එපාවුණා. මේ අතරෙදි තමයි ඔහුට නිව්යෝක් නුවර මෙට්‍රොපොලිටන් කෞතුකාගාරයෙන් ඇරයුම් ලැබුණෙ. තමන්ගෙ අසනීප ගැන දෙවරක් නොහිතූ ඔහු ඒ ඇරයුම කෙළින්ම භාරගත්තා. මෙහේ මිනිස්සු මාලන් හිල්ව ඉහළින් පිළිගත්තේ නෑ. නමුත් ඇමරිකාවෙදී ඔහු ඉතාම විශාල ලෙස පිළිගැනීමට ලක්වුණාලු. ඊජිප්තු පුරාවිද්‍යාත්මක දේශන පවත්වන්න, එක්සත් ජනපදය පුරාම යන්න සිදුවුණාලු. ඒවාට විශාල වශයෙන් මුදල් ලැබිල තියෙනවා. සෙනගත් ඇවිත් තියෙනවා. මේ ප්‍රසිද්ධිය නිසා ඔහුට කිසිසේත් නොසිතූ විරූ අත්දැකීමකට මුහුණ දෙන්න වුණාලු.

කෞතුකාගාරය මගින් ඔහුගේ පදිංචියට, සුඛෝපභෝගී මන්දිරයක් ලබාදීල තියෙනවා. එක දවසක් හැන්දෑවෙ ඔහු පොතක් කියවමින් ඉන්නා අතරෙ සේවකයා කිව්වලු, ඔහු හමුවීමට කාන්තාවන් දෙදෙනෙකු පැමිණ ඇති බව. ඔහු හැඳ පැළඳගෙන ගියාලු මේ අමුත්තන් දකින්න. කවුද ඇවිත් තිබුණේ? ඔබට අනුමාන කළ හැකිද වොට්සන්.

ඒ අවුරුදු විස්සකට පමණ පෙර මාලන් අත්හැර දමා ගිය ඔහුගේ බිරිඳ-එලිසබෙත් සහ ඔවුන්ගේ දියණියන් දෙදෙනා. ඔහුට අදහාගන්න බැරිවුණාලු, මේ එදා තමන්ට හිටි ආදරණීය බිරිඳ ද කියල. පුවත්පත්වල ඔහු ගැන පිටු ගණන් විස්තර පළවෙද්දී තමයි, එලිසබෙත්ට ඔහු ගැන දැනගන්න ලැබිලා තියෙන්නෙ. ඇය විවාහ වුණු හේවඩ් නම් ඇමරිකානු මෝස්තර නිර්මාණ ශිල්පියා, අවුරුදු හත අටකට පෙර මිය ගිහින්. ඇයට වෙනත් දරුවන් හිටියෙත් නෑ. හරිහැටි ආදායමක් නොලැබීම නිසා, ඔවුන් ජීවත්වෙලා තියෙන්නේ අන්ත අසරණ තත්ත්වයෙන්. අතීතය අමතක කර දැමූ මාලන් ඔවුනට විශාල වශයෙන් මුදල් පරිත්‍යාග කරල තියෙනවා. බිඳී ගිය ඒ පවුල යළිත් එකතුවුණේ කාටත් සතුට ළඟා කරමින්.

මාලන් අවුරුදු තුනක් ඇමරිකාවෙ ගතකළාලු. නමුත් රැකියාවෙ තිබුණු කලබලකාරී, අවිවේකී බව නිසා, ඒ තනතුරෙන් ඉල්ලා අස්වීමට ඔහු තිරණය කළාලු. මාලන්ගේ බලාපොරොත්තුව වෙලා තියෙන්නේ, ලන්ඩන් නුවරින් ගෙයක් මිලට ගෙන, තමන්ගේ පවුල ඉක්මනටම එංගලන්තයට ගෙන්වා ගන්න. නමුත් රසල් ඒකට කොහොමටවත් කැමැති වෙලා නැහැ. ලන්ඩනයෙන් නිවසක් මිලට ගැනීමට පවා ඔහු බාධා කරල තියෙනවා. මේ නිසා තමන්ගේ අන්තිම කැමති පත්‍රය වෙනස් කරන්න මාලන් තීරණය කළාලු. ඔහු මරණයට දින තුන හතරකට කලින් නීතිඥයා කැඳවා ඒ ගැන උපදෙස් දුන්නලු. දැන් මොකද්ද වොට්සන් ඔබට හිතෙන්නේ? මාලන් හිල් මරාදැමූ ඝාතකයා ගැන ඔබට අනුමාන කළ හැකිද?"

මම පුදුමයට පත්ව හෝම්ස් දෙසම බලා සිටියෙමි.

මීළඟ දිනයේ උදෑසන දුම්රියෙන් හෝම්ස්, ලෙස්ට්‍රේඩ් සහ මම කිංස්ටන් වෙත යමින් සිටියෙමු. පයිප්පය දල්වා ගත් මගේ මිත්‍රයා ගැඹුරු කල්පනාවකට වැටී සිටියේය. පොලිස් පරීක්ෂක රිපන්, සාජන්ට් ඇලිස්ටෙයා ඇතුළු කිහිපදෙනෙකු අප පිළිගැනීමට දුම්රිය පොළට පැමිණ සිටියහ. අප වෙනුවෙන් කුඩා කුලීරථ කිහිපයක්ම දුම්රිය පොළේ සූදානමින් තිබිණ. එබැවින් අප්‍රමාදව රැම්සේ වත්තේ හිල් හවුස් වෙත යාමට අපට හැකිවිය. මාලන් හිල්ගේ ඥාති සොහොයුරු රසල් හිල්, අපට පෙර එතැනට පැමිණ සිටියේය. ඒ හෝම්ස් විසින් යවන ලද විදුලි පුවතකට ප්‍රතිචාර ලෙස බැව් මම වටහා ගතිමි.

"මහත්වරුනි. මගේ ඉල්ලීම අනුව අප්‍රමාදව මෙහි පැමිණීම ගැන ඔබ හැමදෙනාටම මම ස්තුතිවන්ත වෙනවා" හෝම්ස් කීවේ රැස්ව සිටි අය අමතමිනි.

"පසුගිය දිනක මාලන් හිල් මහතා මරාදමනු ලැබුවේ, ගෙදර තිබූ වටිනා රිදී පිඟන් බඩු සහ රත්රන් පුරාවස්තු කිහිපයක් සොරාගැනීමට බව, සොයාගැනීමට අපට හැකිවුණා. මං කැමතියි එම දේවල් සඟවා ඇති ස්ථානය ඔබ හැමදෙනාටම පෙන්වා දෙන්න. රිපන් මහත්මයා, කරුණාකර එතැනට අප කැඳවාගෙන යන්න"

හෝම්ස් කළ ඉල්ලීම අනුව හැමදෙනෙක්ම රිපන් පසුපසින් නිවසේ පිටුපස ගේට්ටුවෙන් පිටවී, ඩෝචෙස්ටර් ජලාශය තිබූ කැලෑ මාර්ගයේ ගමන් ගත්තෙමු. ජලාශය අසලටම පැමිණි පසු ගමන නැවතිණි.

"හෝම්ස් මහත්මයා. ඔබ කර තිබූ දැන්වීම අනුව මං පොලිස් කිමිදුම්කරුවෙකු සොයා ගත්තා. මේ ඉන්නේ ඔහු" රිපන් පැවසුවේ ජලයේ කිමිදීමට සුදුසු ආකාරයෙන් ඇඳුම් මාරු කරගත් තරුණයෙකු පෙන්වමිනි. ඔහු මුහුදු පත්ලට කිමිදෙන්නන් පළඳින වීදුරු තහඩුවක් ඇති දෙනෙත් ආවරණයක් පැළඳ සිටියේය.

"ඔබ මේ ජලාශයේ මීට කලින් කිමිදිලා තියෙනවද?" මගේ මිත්‍රයා විමසුවේය.

"නැහැ මහත්මයා" තරුණයා කීය. "නමුත් මේ වගේ ජලාශවල කිමිදිලා තියෙනවා"

එසේ කියූ ඔහු ජලාශයේ ඉවුරක් අසලින් දියට බැස ඇතුළට කිමිදී නොපෙනී ගියේය. මිනිත්තුවක් ගතවීමට පෙර ඔහු පිහිනමින් උඩට මතුවිය. අත් ඉහළට දිගු කළ ඔහු සංඥා මගින් පොලිස් නිලධරයනට යමක් කීය. ඒ අනුව කෙළවරට යකඩ කොකු සවි කළ කඹ දෙකක් පහළට විසි කෙරිණ. එම කොකු දෙක අල්ලාගත් තරුණයා යළිත් වරක් ජලය තුළට කිමිදුණේය. මීළඟට ඔහු ඉක්මනින් මතුවුණේ "අදින්න අදින්න" කියමිනි. කඹ දෙකේ අනෙක් කෙළවරවල් අල්ලාගෙන සිටි පොලිස් භටයෝ, එම උපදෙස් වලට කීකරු වූහ. අප සියලු දෙනාම මවිතයට පත් කරමින් ජලාශය තුළින් ඉහළට ඇදී ආවේ බයිසිකලයකි. සෑහෙන තරම් මඩ තැවරී තිබුණද එය මෑතකදී දියට වැටුණු අලුත් බෙන්ට්ලි වර්ගයේ බයිසිකලයක් බැව් අපි දුටුවෙමු.

"රසල් හිල් මහත්මයා" ෂර්ලොක් හෝම්ස් කීය. "මාලන් හිල් - ඔබේ ඥාති සොහොයුරා මියගිය දවසේ හැන්දෑවේ, ඔබ මූවර්හිල්

වලින් පටන්ගත් මේ කැලෑ පාරේ, හවස 6 ත් 6.30 ත් අතර මේ බයිසිකලය පැද ආ බවට සාක්ෂි තියෙනවා"

"ඔබට පිස්සුද?" රසල් හිල් විමසුවේ සාවඥ හඬකිනි. "ඔය කියන වෙලාවෙදි මං බ්ලැක්හීත්වලට ළඟාවෙලත් නෑ. මං බ්ලැක්හීත් හන්දියට එනකොට 6.30 පහුවුණා. ඊළඟට රැම්සේ වතුයායෙ පාරදිගේ හිල්හවුස් වෙත එනකොට හතයි. අනික මාලන් මිය ගියේ හැන්දෑවෙ පහට කියල ඔහේලම තේ කියන්නෙ. ඒ වෙලාවෙ මං හිටියේ කිංස්ටන් දුම්රියපොළේ. මං ඩැෆඩිල් එකේ බීර බොනකොට හයට විස්සයි. ඉතින්....."

"ඒ වුණත් ඔබ කැලෑ පාරේ බයිසිකලයක් පැද ආ බවට....."

"ඔහේලට බයිසිකලයක් හම්බවුණු නිසා ඒකට මාව පටළවන්නද හදන්නෙ? අපරාධකාරයා බයිසිකලයක් පැදගෙන යන්න ඇති. ඒත් ඇයි ඒ පින්තූරෙට මාව රාමු කරන්න හදන්නේ?"

"ඔබ බයිසිකලයෙන් බැහැල සමහර තැන්වල එය තල්ලු කරගෙන ගියා නේද? ඒ තැන්වල තියෙනවා මේ බයිසිකලයේ ටයර් සලකුණු සමග ඔබේ පාවහන්වල අඩියේ සලකුණු"

රසල් හිල්ගේ මුහුණ සුදුමැලි විය. "අනෙක් තොරතුරු තිබුණේ කොහේද දන්නවද?" හෝම්ස් ඇසීය. "මාලන් හිල් තමන්ගේ පෞද්ගලික රහස්‍ය තොරතුරු ලියා තැබූ පරණ දින පොත් දෙකක් තිබුණා. ඒ වීදුරු අල්මාරියේ පහතින්ම වූ ලාච්චුවක.

කාමරය අනික් පැත්ත පෙරළමින් ඔබ හෙව්වේ ඒ දිනපොත් දෙක බව මම දන්නවා. ඔහු පසුව ලියූ අන්තිම කැමති පත්‍රය තිබුණේ ඒකෙ කියා ඔබ හිතන්න ඇති. නීතිඥ මහත්මයා ඒ දෙවැනි අන්තිම කැමති පත්‍රය සකස් කර තිබුණා. නමුත් ඒකට අත්සන් තබන්න මාලන් මහත්මයාට අවස්ථාවක් ලැබුණේ නැහැ. නීතිඥයාගෙන් විමසීමක් කළා නම්, ඔබට ඒ කරුණ දැනගන්න තිබුණා. දැන් ඉතින් අන්තිම කැමැති පත්‍රය ලියන්න වෙන්නෙ ඔබට."

රසල් හිල් එක් ක්ෂණයකින් කැලෑව දෙසට පැන දිව්වේය. එහෙත් ඔහු ලුහුබැඳ ගිය පොලිස් භටයෝ ඔහු අල්ලාගෙන ඔහුගේ දෑත්වලට විලංගු දැමූහ.

* * *

"මේ හැමදෙයක්ම සිද්ධවුණේ මාලන් ඇමරිකාවට ගිය නිසා" සිරකරු කීවේ පාපෝච්චාරණය අරඹමිනි. "ඔහු අත්හැර දමා

ඇමරිකාවට ගිය ගෑනි එලිසබෙත්ට දැකින්න ලැබුණා, දැන් මොහු විශාල ධනවතෙකු බව. ඒ ගෑනිගේ කොරාටිකකම්වලට ඔහු ආයෙත් රැවටුණා. ආපහු එංගලන්තයට ආව ගමන් මාලන් මට කිව්වා, ලන්ඩනයෙන් ගෙයක් අරගෙන බිරිඳ හා දරුවන් දෙදෙනා එංගලන්තයට කැඳවාගෙන එන බව.

එතකොට මං ඇහුවා මගේ නමට ලියා තිබෙන, ඔහුගේ අන්තිම කැමති පත්‍රයට සිදුවෙන්නෙ මොකද්ද කියල. එතකොට ඔහු කිව්වා ඒක සම්පූර්ණයෙන්ම අවලංගු කර දමල අලුත් එකක් ලියනවා කියල.

"මාලන් මේ අහපං" මං කිව්වා. "මට මගේ පියාගෙන් ලැබුණු හැමදෙයක්ම, දැන් මං විකුණලා අවසන්. මං දැනටමත් දහ අතේ ණය වෙලයි ඉන්නේ. උඹේ මුදලයෙන් කොටසක්වත් දැන්ම මට ලියපං. නැත්නම් මට වහ කාල මැරෙන්නයි වෙන්නේ"

"මගේ පියාට දුන්නු ඉඩම්වලට සමාන කොටසක්, අපේ සීයා උඹේ පියාටත් දුන්නා." මාලන් කිව්වා. "උඹ ඒවට මොකද කළේ? ඒව විකුණ විකුණා සුදු කෙළියා, අශ්ව රේස් ඔට්ටු ඇල්లුවා, බේබදු මිතුරන් එක්ක එකතුවෙලා බීලා විනාස කළා. ඉතින් ඒකට මං පළිද? මේ ධනයෙන් ලොකු කොටසක්, මං කාන්තාරයේ දිගුකලක් දහ දුක්විඳලා උපයාගත් ධනය. මං මගේ තරුණ ජීවිතයම ඒකට කැප කළා. උඹේ තර්ජනවලට බයේ ඒක උඹට නිකම්ම දෙන්න කියලද කියන්නෙ?"

"මාලන්. උඹ මාව අඳුනන්නෙ නෑ. ප්‍රවේසම් නූනොත් උඹට වෙන්නෙ......."

"අපොයි මං උඹව හොඳට අඳුනනවා" ඔහු කිව්වේ සාවඥ සිනහවක් පාමින්. "බොරු සාක්කි දීලා මං උඹව එල්ලුම් ගහෙන් බේරගත්තා අමතකද? එදා උඹ අර අසරණ ගෑනි හෙලන්ව...." කියන කොටම මං ඔහුගේ මුහුණට පහරක් එල්ල කළා. ඒකට ඔහුගේ දතක් කැඩී තොල පුපුරා ලේ ගලන්න පටන් ගත්තා. ඔහු යක්ෂයෙකු වගේ ශාපකරමින් දිව්රුවේ, මාව එල්ලුම් ගස් යවන බව කියමින්. මාලන් ගැන මං තීරණයක් ගත්තේ එදා.

මුචර්හිල් ළඟින් තිබෙන කැලෑ පාර මට හොඳට පුරුදුයි. ඒකෙ අබලන් වූ පරණ ගබඩා කාමරයක, මං බයිසිකලයක් සඟවා තැබුවේ මේ කටයුත්තට සූදානමෙන්.

සවස 5 ට කිංස්ටන් වෙත ළඟාවෙන දුම්රියෙන් ඇවිත්, මාව කාටත් මතක හිටින විදියට දෙතුන් දෙනෙකු සමඟ කතා කළා. 5.40

වෙන කොටත් මං ඩැෆඩිල් අවන්හලේ බීර වීදුරුවක් බිව්වා. හවස හය වෙද්දී මං බයිසිකලය හංගලා තිබුණු තැනට ආවා. වේගයෙන් එය පැදගෙන ඇවිත් මට හැකිවුණා 6.20 වෙද්දී ඩෝචෙස්ටර් ජලාශය ළඟට එන්න. බයිසිකලය වතුරෙ ගිල්වා දැමුවෙ කාටවත් දකින්න බැරිවෙන්න. ඊළඟට කන්ද නැගලා ගෙදර පිටුපස ගේට්ටුවෙන් ඇතුළුවෙන්න මිනිත්තු පහක් ගියේ නෑ. හැරිසන් ජෝඩුව ගෙදර ආවෙ ගියේ මේ ගේට්ටුවෙන්. ඒ නිසා මේක කවදාවත් ඉබියතුරු දමා වැහුවෙ නෑ.

හවස 6.25 වෙද්දී මා ළඟ තිබූ හොර යතුරකින් දොර ඇරගෙන මං ගෙට ඇතුළුවුණා. හැන්දෑවට විස්කි වීදුරුවක් පානය කරන මාලන්, හාන්සි පුටුවේ වැතිරී හිටියෙ අඩ නින්දේ. සැලසුම් කරගත් විධියට හැම දෙයක්ම අවසන් කරන්න මට ගතවුණේ මිනිත්තු පහයි. කලින් සැලසුම් කරගත් විදියට කරගන්න බැරිව මට වැරදුණේ එක තැනයි. ඒ මාලන්ගේ රහස් තොරතුරු ලියා තිබූ දිනපොත් හොයාගැනීමට නොහැකි වීම. ඒ වෙනුවෙන් මිනිත්තු විස්සකට වඩා ගතකරන්න මට හැකියාවක් තිබුණෙ නෑ. මාලන්ගේ ඔරලෝසුව ගලවාගෙන, පැය එකහමාරක් ආපහු කරකවලා එයට පහරක් මං එල්ල කළේ, ඔහුට පහරදුන් වෙලාවෙමයි.

මං ගෙයින් එළියට පැන්නේ විවෘත කරගත් ජනේලයෙන්. ඊළඟට හිල් හවුස් නිවස ළඟින් වැටී ඇති බ්ලැක්හීත් දක්වා යන පාරට පිවිසී බැලුවා. පාර පාළුයි. ඒ පාර දිගේ යාර සීයයක් පමණ ඉදිරියට ගියා. එතැන කැලෑ රොදක හැංගිලා මං බලාගෙන හිටියේ මුර සංචාරයේ යෙදෙන පොලිස් භටයා එනතුරු. ඔහු එනතුරු මට මිනිත්තු දහයක් විතර එතැන ඉන්න සිදුවුණා. ඊළඟට ඔහුගේ ලන්තෑරුමේ එළිය ඈත දකිද්දීම, මං හැකි ඉක්මනින් හිල්හවුස් වෙත ආවා. පොලිස් භටයාගේ පාවහන් බොරලු මත ගැටෙද්දී නැඟෙන හඬ පැහැදිලිව ඇසෙන තුරු ඉඳලා, මං මාලන් අමතමින් දොරට ගහන්න පටන් ගත්තා. මහත්වරුනි, එතැන් සිට ඉදිරියට කථාව ඔබ හොඳින් දන්නවා"

සිය ඥාති සොහොයුරා ඝාතනය ගැන රසල් හිල්ට එරෙහි නඩුව ඕල්ඩ් බේලි අධිකරණයේදී විභාගයට ගැනිණ. දින දොළහක් තිස්සේ පැවැති නඩු විභාගයෙන් පසු රසල් හිල්ට මරණ දඬුවම නියම විය.

# රක්ෂණ අභිරහස

1887 වර්ෂය මගේ හිතමිත්‍ර ෂර්ලොක් හෝම්ස් මහතාට අතිශයින්ම කාර්යබහුල වූ කාලයක් විය. ජනවාරි මාසයේදී අපි චාල්ස් ඔගස්ටස් මිල්වටන් පරීක්ෂණයේ යෙදුණු බැව් මගේ සටහන් පොතේ සඳහන්ව ඇත. මීට අමතරව ලෞඩර්හි මේරි ස්ටුවට් මහත්මියගේ අභිරහස් මරණය, රයිගේට් ප්‍රහේලිකාව සහ මිනිමරුවා නිදැල්ලේ පරීක්ෂණ ද මේ කාලයේ සිදුකළ ඒවාය. එම කාලයටම අයත් එහෙත් තරමක් වෙනස් ආකාරයක පරීක්ෂණයක් මෙවර ඔබ වෙත ගෙන ඒමට අදහස් කළෙමි.

රෝගීනට ප්‍රතිකාර කිරීමේ කටයුතු සඳහා, දිගින් දිගටම ලන්ඩන් නගරය පුරා ගමන් කිරීමට සිදුවීමෙන්, මම හෙම්බත්ව සිටියෙමි. වැසි සහිත එක් උදෑසනක මම විසිත්ත කාමරයට වී පොතක් කියවීමට උත්සාහ කළෙමි. ඒ විලියම් ක්ලාක් රසල් විසින් රචනා කරන ලද "සමුදුරේ බිහිසුණු අත්දැකීම්" නම් ග්‍රන්ථයයි. මගේ මිත්‍රයා ද විසිත්ත කාමරයට වී යම් කටයුත්තක නිරතව සිටියේය. පයිප්පය දල්වා එය මුවේ රඳවාගෙන, ඔහු වයලීනය හඬ නංවමින් සිටියේය. මගේ කියවීමට බාධා ඇතිවූයේ, වයලීනයෙන් නැගුණේ කන්කලු හඬක් නොවීම නිසයි.

"මොකක්ද හෝම්ස් ඔබ කරන්නෙ? ඕක හරිහැටි වාදනය කරන්නෙත් නෑ; නිශ්ශබ්දව ඉන්නෙත් නෑ" එය අසා සිටීමට බැරිම තැන මා විමසුවේ නොරිස්සුම් හඬෙනි.

"මට සමාවෙන්න වොට්සන්." හෝම්ස් කීය. "මගේ මේ වයලීනයේ තත් කිහිපයක් නරක් වෙලා. ඔබ දන්නවා නේද, මං මේ ස්ට්‍රැඩිවේරියස් වයලීනය ටොට්න්හැම් කෝට් පාරේ පරණ බඩු වෙළෙන්දෙකුගෙන් මිලට ගත්තේ, සිලිං 55 කට බව. මේ වගේ වයලීනයක් අද දවසේ ගිනි 500 කටවත් මිලට ගන්න බෑ. කාලයක් තිස්සේ මට උවමනා වෙලා තිබුණා මේ ගැන මගේ අවධානය යොමුකරන්න. නමුත් මට ඒකට වෙලාවක් තිබුණෙ නෑ. අද නම් මං කොහොම හරි....." මේ වේලාවේ කිසිවෙකු අප නිවසේ සීනුව

නාදකරන ශබ්දයෙන් හෝම්ස්ගේ කථාවට බාධා ඇතිවිය. මඳ වේලාවකින් හඩ්සන් මහත්මිය ඉදිරිදොර විවෘත කළ ශබ්දයද අපට ඇසිණ. ස්වල්ප වේලාවකට පසු ඇය උඩුමහලට පැමිණියේ අමුත්තෙකු ද සමගිනි.

"ෂර්ලොක් හෝම්ස් මහත්මයා" අමුත්තා කීවේ සුරත දිගුකරමිනි. "ඔබ හමුවෙන්න කියලා මට දැනුම් දුන්නේ, ස්කොට්ලන්ඩ්යාඩ් පොලීසියේ පරීක්ෂක බ්‍රැඩ්ස්ට්‍රීට් මහත්මයා. මෙවැනි පටළැවිලි ඔබ මීට පෙරත් ඉතා සාර්ථක ලෙස විසඳුවා කියල ඔහු කිව්වා. ඒ නිසයි මං ඔබ හොයාගෙන ආවේ."

"කරුණාකර මෙහෙන් ඉඳගන්න මහත්මයා" හෝම්ස් කීවේ වයලීනය ඉවතින් තබා, ගිනිඋදුන සමීපයේ අසුනක් පෙන්වමිනි. "අපට මුලින්ම කියන්න ඔබේ නම. ඊට පස්සේ ඔබේ ගැටලුව විස්තර සහිතව කියන්න. මේ මගේ උදව්කාරයා දොස්තර ජෝන් වොට්සන්. මා දැනගතයුතු හැමදෙයක්ම, ඔහුත් දැනගෙන සිටීම මට ලොකු පහසුවක්."

"මහත්මයා. මං හැමදෙයක්ම ඔබට කියන්නම්. මගේ නම ඩේවි හක්ස්ලි. මං රැකියාව කරන්නේ රක්ෂණ සමාගමක. හරියටම කියනවා නම් පෘඩෙන්ෂල් ඇෂුවරන්ස් රක්ෂණ සමාගමේ. එහි විවිධ ශාඛාවල අවුරුදු පහළොවක සේවයෙන් පසු, නැගෙනහිර ලන්ඩන් කාර්යාලයේ ශාඛා ප්‍රධානියා ලෙස මට පත්වීමක් ලැබුණා. දින කිහිපයකට පෙර මට විසඳාගැනීමට අපහසු ගැටලුවකට මුහුණදීමට සිදුවුණා.

අවුරුදු විසිහතක පමණ තරුණ කාන්තාවක්, එදා අපේ කාර්යාලයට පැමිණ මා හමුවුණා. සෑහෙන තරම් රූමත් තැනැත්තියක වූ ඇය, මාස පහක හෝ හයක ගැබිණි කාන්තාවක බව මා දුටුවා. ඇය හැඳසිටියේ සම්පූර්ණයෙන්ම කළු පැහැති ඇඳුම්.

"මහත්මයා. මගේ නම ලින්ඩා ජෙන්කින්ස්" ඇය කිව්වේ අසුනක හිඳගනිමින්. "මං පත්වුණේ හරිම අවාසනාවන්ත තත්ත්වයකට. මගේ ආදරණීය සැමියා මීට සතියකට පෙර මියගියා. ඒ මා අසරණ වැන්දඹුවක බවට පත්කරමින්. ඔහු ඔබේ රක්ෂණ සමාගමෙන් පවුම් 7000 ක ජීවිත රක්ෂණයක් අරගෙන තිබුණා. මං ආවේ ඒ මුදල ලබාගන්න" ඇය කීවේ ඇගේ අත්බෑගයෙන් කඩදාසි මිටියක් එළියට අදිමින්. "කරුණාකර මේවා පරීක්ෂා කර බලන්න"

එහි තිබුණා අපට අත්‍යවශ්‍ය වෙන ලියකියවිලි හැම එකක්ම. තෝමස් කාල් ජෙන්කින්ස් මහතාගේ මරණ සහතිකය. ඊළඟට ඔහු මීට මාස හයකට පෙර, එඩිංබ්‍රෝ නගරයේ අපේ රක්ෂණ කාර්යාලයෙන් ලබාගත් ජීවිත රක්ෂණ ඔප්පුව. ඔවුන් දෙදෙනා විවාහ වූ බවට විවාහ සහතිකය. රක්ෂණ ඔප්පුවේ මුලින් සඳහන් කර තිබුණේ, ජෙන්කින්ස් මහතා අවුරුදු 34ක් වයස අවිවාහකයෙකු ලෙස. විපතකදී මුදල් හිමිවිය යුත්තේ පවුලේ භාරකරුවන්ට ලෙස එහි සඳහන් වුණා. නමුත් පසුව එය වෙනස්කර තිබුණා. විපතකදී ලැබෙන මුදල් තම බිරිඳ වන ලින්ඩා ෆ්ලෙමිං ජෙන්කින්ස්ට හිමිවිය යුතු ලෙසටයි අලුතෙන් සටහන් කර තිබුණේ.

විවාහ සහතිකයේ හැටියට, ජෙන්කින්ස් සහ ලින්ඩා ෆ්ලෙමිං විවාහ වී තිබුණේ 1887 පෙබරවාරි 11 දා. නමුත් ඒ විවාහය වැඩි දවසක් තිබිලා නැහැ. ඒ මොකද ඔහු මේ අවුරුද්දේම මාර්තු 30 දා මියගිහින්.

විවාහය එඩිංබ්‍රෝ නගරයේදි සිදුකර තිබුණේ ජේම්ස් බැල්ෆර් දේවගැතිතුමා විසින්. ජෙන්කින්ස් මියගිහින් තිබුණේ, හෝල්බෝන්හි ඕලියන්ස් පටුමගේ, අංක 73 දරණ ස්ථානයේදී. මරණය සහතික කළ වෛද්‍යවරයාගේ නමත් මා ළඟ සටහන්ව ඇති" අමුත්තා කීවේ දිනපොත පෙරළමිනි.

"මේ තියෙන්නේ. ...... දොස්තර මයිකල් බැක්ස්ටර්, නො 7 හේග් උද්‍යානය. මරණයට හේතුව "ලේ අතීසාරය".

ඔහුගේ අකල් මරණය ගැන මං ඇයට කණගාටුව පළකළා. ලේ අතීසාරය රෝගය ගැන, මට එච්චර දැනුමක් නැති බව ඇත්තයි. නමුත් අවුරුදු තිස්හතරක මනුස්සයෙක්, මේ ලන්ඩන් නගරයේදි අතීසාරයෙන් මැරුණා කිව්වාම, මගේ හිතට සැකයක් ඇතිවුණා. ඒකත් විවාහ වෙලා මාස දෙකක් යන්න කලින්? මං කියන දේට ඔබ එකඟ වෙනවද ෂර්ලොක් හෝම්ස් මහත්මයා?"

"ඒ ගැන නම් මං ඔබ සමග එකඟ වෙන්නෙ නැහැ හක්ස්ලි මහත්මයා" හෝම්ස් කීය. "ඔබ අහල ඇති අවුරුදු දහස් ගණනකට කලින් ඉන්දියාවේ හිටියලු ගෞතම බුද්ධ කියලා මුනිවරයෙක්. මනුස්සයෙකුගේ ප්‍රාණයත් හරියට තණකොළ මත රැඳුණු පිණිබිඳුවක් වගේ කියලයි ඔහු කියල තියෙන්නේ. හිරු පායා එන මොහොතක පිණි බිඳුව අතුරුදන්වී යන්න ගතවෙන්නේ එක් නිමේෂයයිලු. ඒ

වගේ තමයි කෙනෙකුගේ ජීවිතයත්. හොඳයි ඔබේ කථාව දිගටම කියන්න."

"ඔව් ඒක හරි," හක්ස්ලි එකඟ විය. "කොහොම නමුත් මගේ හිතේ සැකයක් ඇතිවුණා. ඒකට හේතුව ඔහු රක්ෂණය වෙලා තියෙන්නේ මරණය පෙනි පෙනී. ඒකෙන් කාට හරි වාසියක් සැලසෙන්න ඔහු කසාදයකුත් බැඳගෙන.

"ඔබත් ඔබේ සැමියාත් ලන්ඩනයේ පදිංචියට ඇවිත් හුගක් කල්ද?" මං ඇයගෙන් විමසුවා.

"සති කිහිපයයි මහත්මයා" ඇය කිව්වා. "අපි එඩිංබ්‍රෝවලින් පිටවෙලා ලන්ඩනයට ආවෙ අපේ මධුසමය ගතකරන්න. අපේ මහත්මයාට පෙනුණා, ලන්ඩනය කියන්නේ ඔහුගේ ව්‍යාපාර සඳහා අපූරුම තැනක් බව. වැඩකටයුතු හොඳින් සිදුවෙද්දී තමයි මේ අවාසනාවන්ත සිද්ධිය වුණේ....."

ඇය ලේන්සුවක් අරගෙන දෙනෙත්වලට තදකරගත්තා. නමුත් ඒවායින් කඳුළු කඩාහැළුණු බවක් මට නම් පෙනුණෙ නෑ.

"ඒ ගැන මට කණගාටුයි ජෙන්කින්ස් මහත්මිය" මං කිව්වා. "කොහොම නමුත් මුදල් ගෙවන්න කලින් මට සිදුවෙනවා, මේ ගැන හොයාබලන්න. මං හිතන්නෙ නෑ ඒ ගැන ඔබේ අකමැත්තක් ඇති කියල.......?"

"කොහොමටවත් නෑ මහත්මයා" ඇය කිව්වා. "සැමියාගේ අවමඟුල වෙනුවෙනුත් මට විශාල මුදලක් වියදම් වුණා. වෙනත් ආදායම් මාර්ගයක් මට නෑ. මං ජීවත්වෙන්නේ හරි අමාරුවෙන්. ළඟදීම ළමයෙක් ලැබෙන්නත් ඉන්න නිසා....... මේ මුදලට චෙක්පතක් ඔබ මගේ නමට ඉක්මනින් ලබාදෙනවා නේද?" කියූ ඇය පිටවී ගියා.

"මේ මරණය ගැන මගේ හිතේ ලොකු සැකයක් ඇතිවුණා හෝම්ස් මහත්මයා" රක්ෂණ නිලධරයා කීය. "එරල් රොබින්සන් නම් පුද්ගලයෙකු සම්බන්ධයෙනුත් මේ වගේ අවුලක් ඇතිවුණාලු නේද. ඒ බව මට කිව්වේ ස්කොට්ලන්ඩ්යාඩ්හි බ්‍රැඩ්ස්ට්‍රීට් මහත්මයා.

පෘෂෙඩන්ෂල් ඇෂුවරන්ස් සමාගමේ අධ්‍යක්ෂක වරුන්ගෙනුත් මං විමසා බැලුවා. මෙය ඔබට භාරදීම ඔවුනුත් අනුමත කළා. ඔබ නියම කරන මුදලක් ගෙවීමට අපි සූදානම් මහත්මයා"

"හොඳයි. ඔබේ පරීක්ෂණය මං භාරගන්නම්. ඔබ කිව්වේ මේ කාන්තාවගේ නම ලින්ඩා ජෙන්කින්ස් කියලා. එහෙම නේද?" හෝම්ස් විමසුවේ තම සටහන් පොත අතට ගනිමිනි.

"ඔව් මහත්මයා. මට පුළුවනි මේ ලියවිලි හැම එකක්ම ඔබට දීලා යන්න. මේවා පිටපත්. මේවායේ මුල් ලියවිලි අප ළඟ තිබෙනවා" අමුත්තා කීය.

"ඒක බොහොම හොඳයි. ඇගේ ලිපිනයත් මෙහි තිබෙනවා නෙ. දැන් මට කියන්න ඇගේ පෙනුම."

"ඇය තරමක් උසයි. ඒ කියන්නේ උස අඩි පහයි අඟල් අටක් පමණ. කොණ්ඩය රන්වන් පැහැති උරහිසේ මට්ටමට කැපූ එකක්. ඇය රූමතියක් මං කලින්ම සඳහන් කළා වගේ ඇය ගැබිණි කාන්තාවක්."

ඒ දිනවල හෝම්ස් වෙත භාරවුණු වෙනත් වැදගත් පරීක්ෂණයක් නොතිබිණි. එබැවින් ඔහු මෙය භාරගත්තේ සතුටෙනි. අපේ අමුත්තා පිටවී ගිය වහාම හෝම්ස් විටේකර්ගේ කෝෂ ග්‍රන්ථය අතට ගත්තේය. ඉන්පසු එහි පිටු පෙරළා ලිපින කිහිපයක් ලියාගෙන විදුලිපුවත් පෝරම රැසක් පිරෙව්වේය. අන්තිමේදී අපේ සේවක ළමයා කැඳවූ හෝම්ස්, සේවකයා විදුලිපුවත් කාර්යාලය වෙත යැවීය.

පැය දෙකක් පමණ ගතවෙද්දී හෝම්ස් නමට විදුලි පුවත් රැසක්ම ලැබිණි.

"තෝමස් කාල් ජෙන්කින්ස් රක්ෂණය වී ඇත්තේ පවුම් පන්දහසකට. ගෙවීම් සියල්ල මේ සතිය තුළ නිම කරන්නෙමු.

– නැෂනල් මියුචුවල් රක්ෂණ සමාගම"

"ටී.සී. ජෙන්කින්ස් පවුම් දෙදහස් පන්සීයකට රක්ෂණය වී ඇත. එය ගෙවීමේ කටයුතු කඩිනමින් අරඹමු.

– ෆිඩෙලිටි රක්ෂණ සමාගම"

"තෝමස් ජෙන්කින්ස් වෙනුවෙන් ගෙවිය යුතු ජීවිත රක්ෂණය පවුම් තුන්දහසකි. සම්පූර්ණ මුදල මේ සතිය තුළ ගෙවා අවසන් කරන්නෙමු.

– විල්ස් කොන්ටිනෙන්ටල් රක්ෂණ සමාගම"

"තෝමස් කාල් ජෙන්කින්ස්ගේ රක්ෂණ ගෙවීම සූදානම්ව ඇත. බිරිඳ පැමිණ පවුම් දෙදහස භාරගත යුතුයි."

– බ්‍රිස්ටල් ඇෂුවරන්ස්"

"ජේනවා නේද වොට්සන් වැඩේ. මිනිහා හතර වටෙන්ම ජීවිත රක්ෂණ අරගෙන. මිනිහා හැංගිලාද? නැත්නම් මේක මොකක් හරි මගඩියක්ද? මධුසමය ගතකරන අතරෙදි ජීවිත රක්ෂණ මේ තරමක් අරගන්න, කාලය හොයාගන්නෙ මොන මිනිහද? තවත් රක්ෂණ සමාගම් කීයකින් විදුලිපුවත් ඒවිද දන්නෙ නෑ. අපි වහාම යමු මේ මරණය සහතික කළ වෛද්‍යවරයා හමුවෙන්න. ඔහුගේ නම සහ ලිපිනය මං සටහන් කරගත්තා"

කුලීරියක් කැඳවාගෙන අපි වහාම පිටත්වී ගියෙමු.

මයිකල් බැක්ස්ටර් විශේෂඥ කායික වෛද්‍යවරයෙකු විය. හේග් උද්‍යානයේ තිබුණු නවීනම විශාලම නිවස ඔහු සතුවිය. පිළිගත් වෛද්‍ය විශේෂඥයකු වූ ඔහු, වංචනික කටයුත්තකට හවුල් වන්නෙකු නොවන බව බැලූ බැල්මටම පෙනිණ.

"....... මොකක්ද ඔබ කියූ නම?" වෛද්‍යවරයා විමසුවේ රාක්කයකින් ලොකු පොතක් එළියට ගනිමිනි. "ආ මේ තියෙන්නේ...... දිනය මාර්තු 30 කියල නේද කිව්වේ..... තෝමස් කාල් ජෙන්කින්ස්..... දැන් මට මතකයි.

මාර්තු පළමුවැනිදා ඉඳල ඔහුගේ මරණය තෙක්, මං දහ දොළොස් වතාවක් ඔය ජෙන්කින්ස්ව පරීක්ෂා කරල තියෙනවා. මුල ඉඳලම ඔහුට තිබුණේ පාචනය. විටෙක අඩුවුණා. විටෙක වැඩිවුණා. ඒකයි ලේ අතීසාරය කියල මං මරණ සහතිකයේ සඳහන් කළේ. ඒකට කිසිම හේතුවක් හොයාගන්න මට බැරිවුණා. මියගිය පුද්ගලයා තෝමස් ජෙන්කින්ස් බව මට සහතිකයි. ඒ ගැන ඔබේ හිතේ කිසිම සැකයක් ඇතිකර ගන්න එපා. ඔහු මියයන්න මිනිත්තු කිහිපයකට කලිනුත් මං එතැන. ඔහුගේ නාඩි බොහොම දුර්වල වී තිබුණා. අවමංගල අධ්‍යක්ෂක වරුන් පැමිණ මිනිය ගෙනයද්දීත් මං එතැන."

"එතකොට ජෙන්කින්ස් මහත්මිය?" හෝම්ස් විමසීය. "ඔහු මරණයට පත්වුණු බව ඔබ කිව්වාම ඇය තදින්ම හඬා වැලපෙන්න ඇති?"

වෛද්‍යවරයා මඳ වේලාවක් කල්පනා කළේය.

"හරි. දැන් මට මතකයි. ඇගේ ස්වාමියා මියගිය බව කිව්වාම, ඇය එක්වරටම හඬා වැටුණෙ නෑ; දුකට පත්වුණු බවක් පෙනුණෙත් නෑ. මේ මරණය ගැන කලින් ඉඳලම දැනගෙන හිටියා වගේ, ඔහේ බලාගෙන හිටියා. එම්බාම් කිරීම සඳහා මිනිය ගෙනයද්දිවත්, කම්පනයට පත් ලකුණු ඇයගෙන් දකින්න ලැබුණෙ නෑ."

"බැක්ස්ටර් දොස්තර මහත්මයා" හෝම්ස් කීය. "මේ පුද්ගලයාට ප්‍රතිකාර කරන්න, ඔබ කීප වාරයක්ම ඔහුගේ නිවසට යන්න ඇති. මේ ජෙන්කින්ස් නිවසේ තවත් හිටියෙ කවුද? එහි තිබුණෙ මොන වගේ පරිසරයක්ද?"

"ඔබ ඇහුවේ හොඳ ප්‍රශ්නයක්" වෛද්‍යවරයා කීය. "ජෙන්කින්ස්ලගෙ ගෙදරත් හරි පුදුමාකාර තැනක්. ඒ ගෙදර තවත් පිරිමි දෙන්නෙක් හිටියා. එක්කෙනෙක් කෙට්ටු උස, රතු හිසකෙස් තිබූ පුද්ගලයෙක්. අවුරුදු තිස්පහක-හතළිහක වයසේ සිටි ඔහුගේ මට හොඳටම මතක ලක්ෂණයක් තිබුණා. ඒ තමයි ඔහුගේ නාසික අස්ථිය බිඳීයාම නිසා පැතලිවුණු නාසය. ඔහුගේ ඉදිරි දත් කැඩී කළු පැහැවී තිබූ බවත් කථාකරන විට මං දුටුවා. මට හිතෙනවා. ඔහු කලකට පෙර බොක්සිං ක්‍රීඩකයෙකු වෙන්න ඇති කියලා.

අනික් තැනැත්තා මිටියි තරබාරුයි. හිස සම්පූර්ණයෙන්ම තට්ටය පැදිලා. දුඹුරු ඇස් තිබුණු ඔහුට, මේ ගෙදර ලොකු බලයක් තිබුණු බව මට පෙනුණා.

මේ දෙදෙනා ජෙන්කින්ස් පවුලට සම්බන්ධ වුණේ කොහොමද කියන එක, හරිහැටි තේරුම් ගන්න මට බැරිවුණා. සමහරවිට ඥාතීන් වෙන්න ඇති. එහෙමත් නැත්නම් ඒ ගෙදර නේවාසිකව සිටි අය වෙන්නත් පුළුවනි."

"ඔබට මතකද ඔවුන්ගේ නම්?"

"ඔහොම ඉන්න මං කල්පනා කරල බලන්න......" කී වෛද්‍යවරයා මඳවේලාවක් ගතකළේ දකුණු අතේ ඇඟිලිවලින් නළලට තට්ටුකරමිනි. බිඳුණු නාසයක් ඇති කෙට්ටු උස මිනිහාගෙ නම බ්‍රවුන්...... මං හිතන්නේ එරික් බ්‍රවුන්. තරබාරු මිනිහා මාෂල්. ඔහුගේ මුල නම ඇහුණු බවක් මට මතක නෑ.

"දොස්තර මහත්මයා. මියගිය ජෙන්කින්ස්ගේ පෙනුම කොයිවගේද?"

"අඩි හයක් පමණ උස ඔහුගේ සිරුර හැඩිදැඩියි. කළුපාට ගොරෝසු කොණ්ඩයක් තිබුණා. මුහුණ වටේ වැවී තිබුණා කළුපාට රැවුලක්. ඔහුට තිබුණේ සොල්දාදුවෙකුගේ පෙනුම. ආ..... ඔහුගේ කන්පෙති ලොකුයි. ඒවා එළියට නැමී තිබුණා.

ආ ඔබ කිව්වාමයි මට තවත් කාරණයක් මතක් වුණේ. මේ මාෂල් කියන නම තිබුණු තරබාරු මිනිහාට, වෛද්‍ය විද්‍යාව පිළිබඳව යම් ආකාරයක දැනුමක් තිබුණා. ජෙන්කින්ස් මිය යන්න ඇත්තේ,

අක්‍රමවත් බහුවිධ අතිසාරයෙන් කියල මට කිව්වෙත් මාෂල්. රෝගියා පෙන්වූ රෝග ලක්ෂණ ගැන කථාකරද්දිත්, ඔහු භාවිත කළේ වෛද්‍ය ක්ෂේත්‍රයේ අය යොදන වචන"

"බොහොම ස්තුතියි බැක්ස්ටර් දොස්තර මහත්මයා" හෝම්ස් කීවේ අසුනෙන් නැගිටිමිනි. "තවත් කාරණා මොනවා හරි සිහිවුණොත් ඒවාත් අපට දැනුම් දෙන්න."

මීළඟට අපි හෝල්බෝන්හි ඔලියන්ස් පටුමගේ අංක 73 හි, ජෙන්කින්ස් පවුල පදිංචිව සිටි නිවස බලා පිටත්වී ගියෙමු. එය තට්ටු දෙකේ පැරණි නිවසක් විය. එතරම් පිරිසිදු අලංකාර බවත් නොපෙනුණත්, එහි ඉඩම වටා කටුකම්බි සවිකළ ආරක්ෂක වැටක් විය. ඉබ්බෙකු දමා ගේට්ටුව ද වසා තිබූ අතර, ජනේල සියල්ල වසා දමා තිබුණේ, තවදුරටත් එහි කිසිවෙකු පදිංචිව නොමැති බව පෙන්වමිනි. නිවස හිමිකරු පදිංචිව සිටියේ යාබද වත්තේ බැවින්, සියලු තොරතුරු ඔහුගෙන් දැනගැනීමට හැකිවිණි.

"කවුද? ජෙන්කින්ස් නෝනයි එයාගෙ නෑදෑයොයිද? ඇත් දවස් පහකට කලින් එයාලා යන්න ගියා" නිවස හිමිකරු වූ චෝනර් පැවසීය.

"මහත්මයා. අපි මේ ආවෙ පරීක්ෂණයකට. අපට පුළුවන්ද මේ නිවස ඇතුළත පරීක්ෂා කරල බලන්න" හෝම්ස් කීය.

"ඇත්තෙන්ම පුළුවනි. මං ඔබට දෙන්නම් ගෙදර යතුරු කැරැල්ල. හැබැයි ගේ පිරිසිදු කරල නම් නෑ. එයාලා ගියේ හරිම කලබලේකින් නොවැ" චෝනර් පිළිතුරු දුන්නේය.

"හැබැට? ඔබ කොහොමද කියන්නෙ, එයාල ගියේ කලබලේකින් කියල?" හෝම්ස් විමසීය.

"ජෙන්කින්ස් නෝනා එදා ආපහු ගෙදර එද්දී මං හිටියේ මේ ගේ දොරකඩ. ඇය හති දමාගෙන දුවගෙන ඇවිත් කිව්වේ "අපි පුළුවන් ඉක්මනින් මෙහෙන් පිටවෙලා යන්න ඕනෙ" කියලයි."

"කාටද ඇය එහෙම කිව්වේ?"

"අර රතුපාට කොණ්ඩයක් තිබුණු උස මිනිහා – බ්‍රවුන් මහත්තයාට. මාෂල් මහත්තයා ඇහුවා "ඇයි මොකද මොකද?" කියලා. ඊළඟට තුන්දෙනාම ගේ ඇතුළට ගිහින් තමා ඒ ගැන කතාවුණේ. පස්සෙ මට කිව්වා සතියක් ඇතුළත ගෙදරින් පිටවෙලා යනබව."

"ඊළඟට මොකද ඔවුන් කළේ?"

"මාෂල් මහත්තයා ගිහිං, පරණ ලී බඩු විකුණන ඩොන් මාටින්ව කැඳවාගෙන ආවා. එයා ලී බඩු ටික ගත්තෙ බොහොම අඩු ගණනට. සමහර ඒවා දුන්නෙ නොමිලේ වගේ. කොහොම වුණත් ලී බඩු ටික ගෙනියන්න එයාට දවස් දෙකක් ගතවුණා."

අපි නිවස විවෘත කොට බැලුවෙමු. නිවස තුළ ලී බඩු කිසිවක් නොතිබුණු බව සැබෑය. එහෙත් නිවස පුරා එකතුවී තිබූ කුණු කසළ හා සුන්බුන්වල අඩුවක් නොවීය. නිවස පිරිසිදු කොට යැමටවත්, පිටවී ගිය අය උත්සාහයක් දරා නොතිබිණි. එය දුටු මගේ මිත්‍රයා නම් අප්‍රමාණ සන්තෝෂයකට පත්විය. ඔහු ගෙහිමියාගේ සේවකයකු යවා, වෙළඳසලකින් කඩදාසි මලු කිහිපයක් ගෙන්වා ගත්තේය. ඉන්පසු කුණුගොඩ පිරික්සමින් එක් එක් භාණ්ඩ තෝරාගෙන, ඒවා වෙන් වෙන්ව කඩදාසිමලු තුළට දමා, ඒ මත සටහන් තැබීමට පටන්ගත්තේය.

"වෝනර් මහත්මයා. මට මෙන්න මේ කාරණය පැහැදිලිව කියන්න." හෝම්ස් කීය. "ජෙන්කින්ස් යුවළ හා අනිත් දෙන්නා අතර තිබුණු සම්බන්ධය මොකක්ද? මාෂල් හා බ්‍රවුන් යන මහත්වරු ජෙන්කින්ස් නෝනගෙ ඥාතීන්ද?"

"මම නම් ඒක දන්නෙ නැහැ මහත්මයා. ගෙදර මූලිකයා වුණේ මාෂල් මහත්මයා. අනික් හැමදෙනෙකුම වැඩ කළේ ඔහු කියපු හැටියට."

නිවස තුළ එකතුව තිබූ කසළ ගොඩෙන් හෝම්ස් තෝරාගත් භාණ්ඩ කිහිපයක් ගැන පමණක් මම මෙහිදී සඳහන් කරමි.

ඇතුළත තෙල් වර්ගයක් අඩංගුව තිබී හිස්වූ, කුඩා වීදුරු බෝතල් දහයක් පමණ. සුදු, කහ සහ රෝස පැහැති කුඩු වර්ග ඇතුළට දමා අසුරා තිබූ කඩදාසි පැකට්. අවර්ණ හා දුඹුරු පැහැති ස්ඵටිකමය රසායන ද්‍රව්‍ය අඩංගු ලියුම්කවර මේ අතර විය.

"වෝනර් මහත්මයා. ඔබ අපට තොරතුරු ලබාදීම ගැන අප ස්තුතිවන්ත වෙනවා" හෝම්ස් කීවේ ඔහුගෙන් සමුගැනීමට සූදානම් වෙමිනි. "මේ පුද්ගලයන්ගෙන් කවුරුන් හෝ යළිත් මෙහේට ආවොත් ඔවුන් සමග හොඳින් කතාබහ කරන්න. ඔවුන් දැනට පදිංචි කොහේද කියන කාරණයත් විමසා අපට දැනුම්දෙන්න. ඒ සඳහා මගේ ලිපිනය මං ඔබට දී යන්නම්. අපි මේ විධියට ඇවිත් විමසීමක් කළ බව රහසක් හැටියට තියාගන්න."

අප එදා ආපසු බේකර් වීදියට පැමිණෙන විට සැන්දෑවී තිබිණ. රසායන ද්‍රව්‍ය සහ තෙල් සහිත බෝතල් පිළිබඳව කළ පරීක්ෂාව හෝම්ස් ඇරඹුවේ රාත්‍රී ආහාරයට පසුවය. අධික ලෙස විඩාපත්වී සිටි බැවින් මම වහාම නින්දට ගියෙමි. පසුවදා උදෑසනින්ම අවදිවී සිටි මගේ මිත්‍රයා තේ පානය අවසන් කොට පුවත්පත් කියවමින් සිටියේය.

"වොට්සන් ශුභ උදෑසනක්. අපිට අද අපේ පරීක්ෂණ කටයුතු උදෑසනින්ම අරඹන්න වෙනවා. මං බලාපොරොත්තු වෙනවා මහාචාර්ය මැකින්ටයර් හමුවෙන්න යන්න"

"ඒ මොකටද? ඊයේ රෑ ඔබ කළ රසායනික විශ්ලේෂණ සාර්ථක වුණේ නැද්ද?"

"සෑහෙන තරම් සාර්ථක ප්‍රතිඵල ලැබුවා වොට්සන්. ඒ වුණත් මං කැමතියි, මේ රසායනික ද්‍රව්‍ය ගැන දෙවැන්නෙකුගේ අදහසක් ගන්න. අපි කටයුතු කරන්නේ ඉතාම භයානක, ඒ වගේම කෛරාටික පුද්ගලයන් රැසක් සමග. ඔබට මතකද අර වෛද්‍ය බැක්ස්ටර් කියූ කරුණ? මාෂල් කියන පුද්ගලයා, වෛද්‍ය විද්‍යාව ගැන දැනුමක් ඇති කෙනෙකු කියා බැක්ස්ටර්ට සිතුණු බව? ඒ හින්දයි මං මහාචාර්ය ස්කොට් මැකින්ටයර් හමුවෙන්න තීරණය කළේ. ඔහු විශ්ව විද්‍යාලයට ගිහිං ඔහුගේ දේශන අරඹන්න කලින්, මහාචාර්යතුමා හමුවෙලා අපේ රසායන ද්‍රව්‍ය ඔහුට දීලා එමු. එතකොට දවල් එක දෙක වෙද්දි අපට පුළුවනි නියම තත්ත්වය දැනගන්න."

ව්‍යෝහාරික වෛද්‍ය විද්‍යාව පිළිබඳ මහාචාර්යවරයෙකු වූ ස්කොට් මැකින්ටයර්, විෂ සහිත රසායන ද්‍රව්‍ය පිළිබඳව, මුළු යුරෝපයටම ප්‍රමුඛ විද්වතෙකු විය. රසායන ද්‍රව්‍ය ගැන විස්තර සහිතව දැන ගැනීමට අපට හැකිවූයේ සවස දෙකට පමණයි.

"හෝම්ස් මහත්මයා. කුඩා බෝතල් හැම එකකම ඉතිරිවී තිබුණු තෙල් වර්ගය ක්‍රෝටොන් තෙල්. එය අතිශයින්ම ප්‍රබල විරේකයක් බව ඔබට අමුතුවෙන් කියන්න උවමනා නැහැනෙ."

"මහාචාර්යතුමා. ක්‍රෝටොන් තෙල් මේ බෝතල්වල අඩංගු ප්‍රමාණය, මාස දෙකක කාලයක් තුළ එක් පුද්ගලයෙකුට බීමට දුන්නොත්, ඇතිවෙන ප්‍රතිඵල මොන වගේ වේවිද?" හෝම්ස් විමසීය.

"කිසිම සැකයක් නැහැ. ඔහුට පාචනය නොකඩවා ඇතිවේවි. ප්‍රතිකාර නිසි ලෙස ලබා නොදුන්නොත් විජලනය ඇතිවෙලා එයින් ලැබෙන ප්‍රතිඵල ඉතාම අහිතකර වෙන්න ඉඩ තියෙනවා."

"මෙය යම්කිසි අතිසාර රෝග තත්ත්වයක් කියලා, වෛද්‍යවරයෙකුගේ හිතේ සැකයක් ඇතිවෙන්නත් පුළුවනි?"

"ඔව්. බැරිකමක් නෑ"

"එතකොට මං ඔබතුමාට ලබාදුන් රසායන ද්‍රව්‍ය ගැන මොනවද කියන්න පුළුවන්?"

"එකක් ආසනික්. තව එකක් ටාටා එමටික්. අනික් හැම එකක්ම විෂක් නොමැති රසායන ද්‍රව්‍ය" මහාචාර්යවරයා පිළිතුරු දුන්නේය. අපි ඔහුට ස්තුතිකොට එතැනින් පිටවී ආවෙමු.

"මේක කාගෙ වැඩක්ද, එය කොහොම සිදුවුණාද කියන එක මට තවමත් හිතාගන්න අමාරුයි" හෝම්ස් කීවේ අප විශ්වවිද්‍යාලයේ දොරටුවෙන් පිටවී යද්දීය. "නමුත් තෝමස් කාල් ජෙන්කින්ස් ඝාතනයට ලක්වී ඇති බව නම් මට විශ්වාසයි. දැන් අපි යමු නාගරික හදිසි මරණ පරීක්ෂකවරයා හමුවෙන්න. ඒ යන අතරමගදී ස්කොට්ලන්ඩ්යාඩ් එකටත් විදුලිපුවතක් යවමු. ඒ කටයුත්ත සඳහා බ්‍රැඩ්ස්ට්‍රීට්ම ආවොත්, ඒක අපට ලොකු පහසුවක් වෙනවා."

"මෙතැනදී ඉතාම සූක්ෂම විධියට වෛද්‍ය බැක්ස්ටර් නොමඟ යවා ඇති බව පැහැදිලියි" හෝම්ස් කීවේ මරණ පරීක්ෂකවරයාටයි. "මුලින් තෝමස් ජෙන්කින්ස්ට ඉතා විශාල මුදලක ජීවිත රක්ෂණයක් ලබාගන්නවා. එක තැනකින් නෙමෙයි. රක්ෂණ සමාගම් පහකට නොඅඩු ගණනකින්. ඊට පසු ඔහු ඉතා ඉක්මනින්ම විවාහ වෙනවා. රක්ෂණ මුදලේ ප්‍රතිලාභියා හැටියට නම් කෙරෙන්නේ ඔහුගේ බිරිඳ. ඊළඟට කවුරු හරි ඔහුට බොන්න දෙනවා ක්‍රෝටොන් තෙල්. ඔහු පරීක්ෂාකර බලන වෛද්‍යවරයා හිතන්නේ, ජෙන්කින්ස්ට බරපතළ ලේ අතිසාරයක් වැලඳී ඇති බව. අන්තිමේදී ඔහු මියගියාම, ඒ බව සඳහන් කරලා වෛද්‍ය සහතිකයක් නිකුත් කරන්නත් වෛද්‍ය බැක්ස්ටර් පසුබට වෙන්නේ නෑ. නමුත් ජෙන්කින්ස් ඇත්තටම මියගියේ අතිසාරය නැත්නම් පාචනය නිසාද? මේක හරිහැටි දැනගන්න නම් මෘතශරීරය ගොඩ අරගෙන, එය පශ්චාත් මරණ පරීක්ෂණයකට භාජනය කළ යුතුයි."

හෝම්ස්ගේ ඉල්ලීම අනුව එය සිදුකරන ලදි. එහිදී පස්දෙනෙකු මරාදැමීමට ප්‍රමාණවත් තරම් ආසනික් ප්‍රමාණයක් තෝමස් කාල් ජෙන්කින්ස්ගේ මෘත ශරීරයේ තිබී හමුවිය.

"සැලසුම් සහගතව මනුෂ්‍ය ඝාතනයක් සිදුකර ඇතිබව දැන් පැහැදිලියි" හෝම්ස් කීය. "දැන් අපි සම්පූර්ණ අවධානය වහාම

යොමුකරන්න ඕන මේ තක්කඩින් අල්ලාගන්න. විවාහ සහතිකයේ හැටියට එඩිංබ්‍රෝ නුවරදී මේ දෙදෙනාගේ – ඒ කියන්නේ ලින්ඩා ෆ්ලෙමිං සහ තෝමස් කාල් ජෙන්කින්ස් අතර විවාහය සිදු කරලා තියෙන්නේ ජේම්ස් බැල්ෆර් දේවගැතිතුමා විසින්. අපි යමු ඔහු හමුවෙන්න.

තම කටයුතු සාර්ථක වෙද්දී හෝම්ස් කටයුතු කරන්නේ ඇඩි උද්‍යෝගයකිනි. ඔහුගේ කෑම රුචිය ඉතා යහපත් මට්ටමකට ළඟාවී තිබිණි. අපි එඩිංබ්‍රෝ නගරය බලා දුම්රියෙන් ගමන්ගත්තෙමු. ගමනට ගතවූ කාලයෙන් අඩක්ම හෝම්ස් ගත කළේ නිදාගැනීම සඳහාය. අවදිව සිටියදී ඔහු දිගින් දිගටම කථා කළේ, මට කථා කිරීමට ඉඩක් නොදෙමිනි. තමා බරිත්සු නම් ජපන් සටන් කලාව ප්‍රගුණ කළ ආකාරය ගැන ඔහු පැවසුවේ අපමණ සතුටකිනි. ඔහු මීළඟට කථාකිරීමට පටන්ගත්තේ, ජර්මන් හා ඇමරිකානු ඉංජිනේරුවන් විසින් සාර්ථක ප්‍රතිඵල ලබමින් අත්හදා බැලූ, අභ්‍යන්තර ජ්වලන එන්ජිම ගැනයි. ගල් අඟුරු ආසවනය කිරීමෙන් ලබාගන්නා ප්‍රොපේන් හා බියුටේන් ස්ප්‍රීතු ඉන්ධන ලෙස යොදාගැනීමට හැකිවුවොත්, කාර්මික ලෝකයේ ඇතිවෙන විප්ලවය දැවැන්ත එකක් වෙනු නිසැකයයි හෝම්ස් කීය.

හෝටලයක නවාතැන් ගෙන, පසුවදා උදෑසන අපි ජේම්ස් බැල්ෆර් දේවගැතිතුමා සොයා ගියෙමු. අප ගෙනගිය විවාහ සහතිකය ඔහුට පෙන්වීමු.

"ඔය විවාහය සිදුකළේ මම බව ඇත්තයි" ඔහු කීවේ දේවස්ථානයේ තිබූ විවාහ ලේඛන පොත පෙරළා බලමිනි. "නමුත් මේ ලින්ඩා ෆ්ලෙමිං වත් තෝමස් ජෙන්කින්ස් වත්, මං කොහොමටවත් අඳුනන අය නෙමෙයි. ඔවුන් අපේ දේවස්ථානයට කිසිම සම්බන්ධකමක් නෑ. ඔවුන් දෙන්නා කසාද බන්දවන්න ඉස්සරවෙලා මං ඔවුන් දැකල තිබුණෙත් නෑ. බැන්දට පස්සෙ දුටුවෙත් නෑ.

මේ බලන්න. මනමාලයාගේ ලිපිනය අංක 122 සාන්ත ක්ලෙමන්ස් පටුමග. මනාලියගේ ලිපිනය හැටියට දක්වා තියෙන්නෙත් ඒකමයි. ඊළඟට මේ විවාහයට සාක්ෂියට අත්සන් කළ සාක්ෂිකරුවන් දෙන්නාගේ නම් මෙතැන තියෙනවා. ඒ එරික් බ්‍රවුන් සහ ජෝන් මාෂල්. ඒ දෙන්නාගේම ලිපිනත් අංක 122 සාන්ත ක්ලෙමන්ස් පටුමග ම යි. මේක හරිම අසාමාන්‍ය දෙයක් තමා. නමුත් මට කරන්න දෙයක් නැහැ මහත්මයා. ඔවුන් දෙන නම් සහ ලිපින මං

මේ පොත්වල ලියනවා. ඊළඟට ආගමානුකූලව විවාහය ලියාපදිංචි කරනවා."

ඔහුට ස්තුති කොට අපි එතැනින් පිටවූයෙමු. හෝම්ස්ට මීළඟට වුවමනා වූයේ සාන්ත ක්ලෙමන්ස් පටුමගේ මෙම නිවසට ගොස් පරීක්ෂා කිරීමටයි. අංක 122 වූයේ දුර්වර්ණ වූ බිත්ති සහිත අබලන් තට්ටු නිවාසයක එක් කොටසකි.

"පෙබරවාරි මාසේ මැද විතර, මේ ගෙදර පදිංචි වෙලා හිටියද අලුත බැඳපු ජෝඩුවක්? ඔවුන්ගේ නම ජෙන්කින්ස්"

අප විමසුවේ නිවස භාරකරුගෙනි.

"එහෙම නමක් ඇති කෙනෙක් කවදාවත් මේ ගෙදර හිටියෙ නෑ මහත්මයා" නිවස භාරකරු කීය. "ඔය කියන කාලේ ජෝඩුවක් මේ ගෙදර පදිංචි වෙලා හිටි බව නම් ඇත්තයි. ඒ මහත්තයාගෙ නම ජෝන් මාෂල්. එයා උසින් අඩි පහමාරක් විතර. බොහොම තරබාරුයි. ඔළුවෙ එක කෙස්ගහක් නෑ. සම්පූර්ණ තට්ටෙ. මහ ගොරෝසු කටහඬක් තියෙන සැරපරුෂ මනුස්සයෙක්. කොයි වෙලෙත් එයාගෙ නෝනට කඩාපනිනවා."

"නෝනගෙ නම මොකක්ද?"

"..........නමද....... ඒක මට එච්චර මතක නෑ මහත්මයා"

"ඒ නෝනගෙ හැඩහුරුකම් කොහොමද?"

"මාෂල් මහත්තයාට වඩා ටිකක් උසයි. ලස්සනයි. රන්වන් පාට කොට කොණ්ඩයක් තිබුණේ. එච්චර මහත නෑ. මං හිතන්නේ මෙහෙන් යන කාලෙ බබෙක් හම්බවෙන්නත් හිටියා"

"එයාගෙ නම ලින්ඩාද?"

"අන්න හරියට හරි මහත්තයා. එයා ලින්ඩා තමයි. ඔය නම කියලා මාෂල් මහත්තයා ඇයට බැණවදින හැටි මට කීපසැරයක්ම අහන්න ලැබිල තියෙනවා."

"එතකොට ඒ කාලෙම තවත් මහත්තුරු දෙන්නෙක් මේ ගෙදර හිටියද?" හෝම්ස් විමසීය.

"තවත් මහත්තුරු දෙන්නෙක්?"

"ඔව්. එක් කෙනෙක් රතුපාට හිසකෙස් තිබෙන කෙට්ටු උස කෙනෙක්. එයාගෙ නහය බිඳිලා. අනික් එක්කෙනා ටොම් ජෙන්කින්ස්. කළු කොණ්ඩයක් තිබෙන කළු රැවුළක් වැවූ හැඩිදැඩි ඇඟක් තියෙන කෙනෙක්. ලොකු කන්පෙති දෙක එළියට නැමිලා තියෙන්නේ. අඩි හයක් විතර උසයි."

"නෑ මහත්තයා. එහෙම අය ඉඳහිට මෙහේ ආව ගියාද කියන එක මං දන්නෙ නෑ. නමුත් ඔවුන් මේ ගෙදර පදිංචිවෙලා හිටියෙ නම් නෑ. තව කාටවත් ඉන්න ඉඩක් මේ ගෙදර ඇත්තෙත් නෑ. මාෂල් ජෝඩුව මෙහෙන් අස්වෙලා ගියාට පස්සෙ, තවමත් මේක කුලියට දෙන්න කෙනෙක් හොයාගන්න බැරිවුණා."

"ඔන්න වොට්සන් අපේ ප්‍රශ්නය වඩාත් සංකීර්ණ වෙනවා." හෝම්ස් කීවේ ආපසු ලන්ඩනය බලා ඒමට අප දුම්රියට ලැඟුණු පසුවය. "තට්ට හිසක් තිබෙන තරබාරු ජෝන් මාෂල්ගේ බිරිඳ රූමත් ලින්ඩා බවට දැන් සැකයක් නෑ. නමුත් පෙබරවාරි එකොළොස්වැනිදා ඇය මොකද කරන්නේ? තෝමස් ජෙන්කින්ස් සමග විවාහ වෙනවා. සාක්කියට අත්සන් කරන්නේ ඇගේ සැමියා මාෂල් සහ තවත් යාළුවෙක් වන බ්‍රවුන්. ඇයට මාෂල්ගෙන් දික්කසාද වෙන්න වෙලාවක් තිබුණෙත් නෑ. ඔබට මොකක්ද වොට්සන් හිතෙන්නේ?"

"ඇයට දික්කසාද වෙන්න කිසිම උවමනාවක් තිබුණෙ නෑ" මම කීවෙමි. "ඔවුනට උවමනා වුණේ විවාහ සහතිකයක්. ඒකට ඇය අවිවාහක තරුණියක විදියට දේවගැතිතුමා ඉදිරියේ රඟපෑවා. ඒ රක්ෂණ සමාගම් රවටලා රක්ෂණ මුදල් ලබාගන්න. මේක ඔවුන් හැමදෙනාම එකතුවී කළ කුමන්ත්‍රණයක්"

"විශිෂ්ටයි වොට්සන්. මටත් හිතෙන්නේ ඔබ කියූ දේමයි. මාෂල් යුවළට හමුවුණා පහසුවෙන් රවටා ගන්න පුළුවන් මිනිහෙක්. ඒ තමයි තෝමස් ජෙන්කින්ස්. නිරෝගී තරුණ වයසේ කෙනෙකු නිසා ඔහුට ජීවිතරක්ෂණ ලබාගන්න අමාරුවක් නෑ. ජෙන්කින්ස් ක්‍රෝටොන් තෙල් බොන්න ඇත්තේ කැමැත්තෙන්ම. ඒ, වෛද්‍යවරයා රැවටීමේ අරමුණෙන්. මාෂල් ජෝඩුව ජෙන්කින්ස්ට කියන්න ඇත්තේ මේකයි. වෙන කාගෙ හරි මිනියක් පෙන්වලා රක්ෂණ සමාගම්වලට වංචා කරමු; ඊට පස්සේ අපි ඒ මුදල් බෙදාගමු කියල. ජෙන්කින්ස් ඒ ගැටේට අහුවුණා. මොවුන් තමාව මරා දමාවි කියා ඔහු හිතන්න නෑ.

පෘඩෙන්ෂල් රක්ෂණ සමාගමේ හක්ස්ලි පළපුරුදු කෙනෙක්නෙ. මුදල් ගෙවන්න කලින් පරීක්ෂණයක් පවත්වනවා කියල ඔහු කිව්වානේ. එතකොට වැඩේ ගැස්සුණා කියල අපරාධකාරයින්ට තේරුණා. දැන් එල්ල වෙන චෝදනාව මනුෂ්‍ය ඝාතනය. ඒ දෙන්නා විතරක් නෙමෙයි එරික් බ්‍රවුනුත් මේ වෙනකොට හැංගිලා ඇති."

"දැන් මොකක්ද ඔබ කරන්න බලාපොරොත්තු වෙන්නෙ?"

"මෙයාල හොයාගැනීම නම් එච්චර ලේසි වෙන්නෙ නෑ වොට්සන්. මෙයාලගේ විස්තර අපි යවන්න ඕන එංගලන්තය පුරා තිබෙන සෑම පොලිසියකටම සහ රක්ෂණ සමාගමකටම. ඊට අමතරව ප්‍රංශයට සහ එක්සත් ජනපදයටත් ඔවුන් ගැන දැන්විය යුතුයි. අපට ඉවසිල්ලෙන් බලා ඉන්න වෙනවා, කොහෙත් හරි හෝඩුවාවක් මතුවෙනතුරු."

හෝම්ස් දුම්රියේදී පැවසූ අයුරින්ම කටයුතු කළේය. කොයිතරම් විපරම් කළත් මාස පහක කාලයක් අපරාධකාරයන් ගැන කිසිදු ආරංචියක් නොලැබිණි. අන්තිමේදී ආරංචිය ලැබුණේ කෝන්වෝල් ප්‍රාන්තයේ පිහිටි ලෝන්සෙස්ටන් නගරයේ පොලිස් ස්ථානයෙනි. අපි වහා එහි පිටත්ව ගියෙමු.

"හෝම්ස් මහත්මයා. මේකට සම්බන්ධ මිනිහාගේ පෙනුම, ඔබ ටික කලකට පෙර එවා තිබූ විස්තරවලට හොඳටම ගැළපෙනවා" අප සමග කීවේ රොස් නම් පොලිස් ප්‍රධානියාය.

"අඩි පහමාරක් පමණ උස, තරබාරු ලොකු තට්ටයක් තිබෙන පුද්ගලයෙකු තමා මීට සම්බන්ධ. ඔහු මේ පළාතේ පහළ මට්ටමේ හෝටලයක නවාතැන් ගෙන තියෙන්නේ, ඉයන් මැක්ඩූගල් යන නමින්. ඔහු සවුත් වෙස්ටන් රක්ෂණ සමාගමේ නියෝජිතයකු හමුවෙලා සාකච්ඡා කළාලු. ඒ තරුණ කාන්තාවක සඳහා ජීවිත රක්ෂණයක් ගන්න. ඔහුත් සමග මේ හෝටලයේම නවාතැන් ගෙන ඉන්න ජූඩිත් ෆිලිප්ස් නම් තරුණිය, තමන්ගේ පෙම්වතිය බවත් ළඟදීම ඇය විවාහ කරගන්නා බවත් මැක්ඩූගල් කියල තියෙනවා.

මේ අනුව රක්ෂණ සමාගමට ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කෙරුණා. එවිට ඇය වෛද්‍ය පරීක්ෂණයක් සඳහා කැඳවනු ලැබුවා. ඇය නිරෝගී බවට ඒකෙන් පෙනී ගියා. ඒ නිසා පරීක්ෂණයෙන් සමත්වුණු ඇය වෙනුවෙන් ජීවිත රක්ෂණ ඔප්පුවක් නිසි පරිදි නිකුත් කළා. ඇය සඳහන් කර තිබුණේ, සමසෙට් ප්‍රාන්තයේ නිව් ෆොරස්ට්හි උපත ලැබූ බවත්, දැන් ඇගේ වයස විසි අටක් බවත්. නමුත් සති කිහිපයක් ගතවෙද්දී, තමන්ගේ පදිංචිය වෙනස් කළ බව ඇය රක්ෂණ සමාගමට දැන්නුවා. ඇගේ අලුත් ලිපිනය අංක 200, වෝල්ටන් උද්‍යාන පාර බවත්, තමන් හදිසි අනතුරකට මුහුණ පෑවොත්, රක්ෂණ ප්‍රතිලාභය හිමිවෙන ඉයන් මැක්ඩූගල් නම් තම සැමියා ඉන්නෙත් මේ ලිපිනයේම බව ඇය දැනුම් දී තිබුණා.

තවත් මාස දෙකක් ගතවෙද්දී මැක්ඩූගල් ඇවිත් තියෙනවා සවුත් වෙස්ටන් රක්ෂණ සමාගමේ ට්‍රූරෝ නගරයේ කාර්යාලයට. ඔහු කිව්වාලු මේ සමාගමේ ලෝන්සෙස්ටන් කාර්යාලයෙන් රක්ෂණයක් ගත් ජූඩිත් ෆිල්ප්ස් නම් තම බිරිඳ මීට සති දෙකකට පෙර මියගිය බව. ඇයගේ භූමදාන කටයුතු අවසන් බවත් ඔහු කිව්වාලු. තමන් ආවෙ ජූඩිත් ෆිලිප්ස් වෙනුවෙන් තමන්ට හිමි පවුම් දෙදහසක රක්ෂණ මුදල ලබාගන්න කියල ඔහු දැනුම් දී තියෙනවා. මේ මුදල වහාම ගෙවීම රක්ෂණ කාර්යාලයේ ප්‍රධානියා ප්‍රතික්ෂේප කළාලු.

"ඔය මියගිහින් තියෙන්නේ ජීවිත රක්ෂණයක් ලබාගත්තු තරුණියමද කියලා අපි කොහොමද දන්නෙ? මං කැමතියි ඇයට රක්ෂණය විකුණු ලෝන්සෙස්ටන්හි නියෝජිතයා කැඳවා විමසා බලන්න. අපි හදිසි මරණ පරීක්ෂකට පෙත්සමක් ඉදිරිපත් කරනවා මළසිරුර ගොඩගන්න කියල. රක්ෂණ නියෝජිතයාට එතකොට හැකිවේවි සහතිකේටම මේ ඇයද කියා හඳුනාගන්න."

මැක්ඩූගල් මුලින් මෙයට කැමැති වෙලා නැහැ. මුදල් ලබාගන්න වෙන ක්‍රමයක් නැහැ කියල තේරුණාම ඔහු ඊට එකඟවුණාලු.

මෘත ශරීරය ගොඩගැනීමේ කටයුතු කරල තියෙන්නේ අර රක්ෂණ නියෝජිතයා එතැන බලා ඉඳිද්දී. මිනීපෙට්ටිය විවෘත කළාම ඔහු මෘතශරීරය දෙස හෙළල තියෙන්නේ එක බැල්මයි. ඔහු කිව්වලු

"මැක්ඩූගල් මහත්තයා. මොකක්ද ඔබ අපට පෙන්වන්න හදන විජ්ජාව? මේ ඔබේ පෙම්වතිය නොවෙයි. මේ අපි වෛද්‍ය පරීක්ෂණයකට ලක්කරලා ජීවිත රක්ෂණයක් ලබාදුන්නු තැනැත්තිය නොවෙයි. ඇය බොහොම ලක්ෂණ කෙට්ටු තැනැත්තියක්. ඒ මේ කාන්තාව නම් නොවෙයි."

එතකොට මැක්ඩූගල් පෙන්නුවේ තමන් ලොකු ගැටලුවකට මැදිවුණු ආකාරයක්. ඔහු කිව්වලු.

"ඔබ කී දේ හරි මහත්මයා. මේ මගේ ජූඩිත් නෙමෙයි. සුසාන භූමියේ අයට ලොකු පටලැවීමක් වෙලා. ඔවුන් අපට පෙන්වාදීල තියෙන්නේ වැරදි මිනීවළක්. හෙට උදේ අපි නොවැරදීම මෙතැනදී හමුවෙමු. හරි මිනීවළ මොකක්ද කියන එක මෙහේ අයට එතකොට මං පෙන්වා දෙන්නම්"

නමුත් ඔහු එනවා කියූ දිනයේවත්, ඊට පසුව දිනයකවත්, මැක්ඩූගල් ඇවිත් නැහැ. සුසාන භූමිය භාර නිලධරයා ඔවුන්ගේ ලේඛන පෙන්වමින් සහතික වුණාලු, ජූඩිත් ෆිලිප්ස් නමින් භූමදාන

කළේ එදා ගොඩගත් මළසිරුර බව. එතකොට පොලීසියෙන් පශ්චාත් මරණ පරීක්ෂණයක් ඉල්ලා හිටියා. ඒකෙදි වෛද්‍යවරු වැදගත් කාරණයක් හොයාගත්තා. ඒ තමයි මියගිය තැනැත්තිය කවුරුවුණත් ඇය මියගිහින් තියෙන්නේ ආසනික් විෂ, අධික ප්‍රමාණයක් ශරීර ගතවීමෙන් බව."

පොලිස් නිලධරයාට ස්තුති කළ හෝම්ස් එදින විරුරෝහි "කාසල්" හෝටලයේ නවාතැන් ගැනීමට තීරණය කළේය.

"අපට රාත්‍රි දුම්රියේ අදම ලන්ඩනය බලා යන්න පුළුවන්කම තිබුණානෙ. මොකද හෝම්ස් ඔබ මෙහේ නවතින්න තීරණය කළේ?" මම විමසුවෙමි.

"මේ ගැටලුව ඉතා සංකීර්ණ ලෙස අතු විහිදුණු එකක් බව මං ඔබට මුලදීම කිව්වනේ වොට්සන්. ඒ සංකීර්ණ බව දැන් තව තවත් වැඩිවෙනවා. මේ කෝන්වෝල් ප්‍රාන්තයට විහිදුණු අලුත්ම අත්තෙත් පැටළුණු තැන් හුඟක් තියෙනවා. ඒවායින් හැකි තරමක් ලිහාගෙන අපි ආපහු ලන්ඩනයට යමු.

මගේ හිතේ මුලින්ම ඇතිවුණු සැකය මේකයි. ජූඩිත් ෆිලිප්ස් නමින් ඇත් මරණයට පත්වී ඉන්නේ අපි ලින්ඩා යන නමින් හඳුනන මාෂල්ගේ නැතහොත් ජෙන්කින්ස්ගේ බිරිඳද? ඒ ගැන නිශ්චිත තොරතුරක් අපි තවමත් දන්නේ නෑ. මුලින්ම අපි පශ්චාත් මරණ පරීක්ෂණය පැවැත්වූ වෛද්‍යවරයා හමුවෙලා ඒ කාරණය දැනගෙන ඉඳිමු"

එම කටයුත්ත සිදුකර තිබුණේ එම පළාතේ පොලිස් ශල්‍ය වෛද්‍යවරයා විසිනි. ඔහු අපගේ ප්‍රශ්නවලට පිළිතුරු දීම ඇරඹුවේ තම සවිස්තර සටහන් පොත දිග හැරගෙනයි.

"...... ජූඩිත් ෆිලිප්ස් නමින් භූමදාන කරන ලද කාන්තාවගේ මළ සිරුරෙන් තබාගත් සටහන් මේ. ඇයගේ උස අඩි පහයි අඟල් එකක් පමණ. කෙස් වැටිය දුඹුරු පැහැති දිග එකකි. ජීවත්ව සිටියදී සිරුර තරමක් තරබාරු එකක් වීමට බොහෝ දුරට ඉඩ ඇත. ඇය ගර්භණී නොවන අතර මෑතකදී දරුවන් ප්‍රසූත කර නොමැත."

"මට දැනගන්න උවමනා වුණේ ඇය ලින්ඩාද නැද්ද කියන එකයි වොට්සන්" හෝම්ස් කීවේ නවාතැන්ගත් හෝටලය වෙත අප ආපසු එන අතරය.

"ඒකෙන් අපට නිශ්චිතවම හිතාගන්න පුළුවන් එක කාරණයක්. ජෝන් මාෂල් රක්ෂණ මුදල ලබාගැනීමේ අරමුණෙන් ඝාතනය කර තිබෙන්නේ වෙනිං කාන්තාවක්. ලින්ඩා ජෙන්කින්ස් නෙමෙයි."

"ජූඩිත් ෆිලිප්ස් රක්ෂණ සමාගමට දීල තිබුණෙත් කුලීනිවසක ලිපිනයක් වෙන්න ඇති" මම හෝම්ස්ට කීවෙමි. "මේ වෙනකොටත් ඔවුන් එතැනින් පැනගිහින් ඇති. ඒ වුණත් අපි ගිහින් විමසලා බැලුවොත් අලුත් තොරතුරු මොනවා හරි සොයාගන්න අපට බැරිවෙන්නේ නෑ"

"ඔබේ අදහස විශිෂ්ටයි වොට්සන්" මගේ මිත්‍රයා කීය. "ඒකට අපි මේ මොහොතෙම යමු."

වාල්ටන් උද්‍යානයේ අංක 200 මෑතකදී ඉදිකළ කුඩා නිවසක් විය. කෙසේ වෙතත් මෑතකදී එහි පදිංචිව සිටි මැක්ඩූගල් හා ඔහුගේ නැගණිය එතැනින් ඉවත්වී ගිය බව අසල්වැසියෝ අපට පැවසූහ.

"ඔවුන් මේ ගෙදර පදිංචියට ඇවිත් දැන් මාස කිහිපයක් වෙනවා. මැක්ඩූගල් මහත්මයා තට්ටය පෑදුණු තරබාරු කෙනෙක්. ඔහුගේ නැගණිය රත්වන් පාට කෙටි කොණ්ඩයක් තිබූ රූමත් කාන්තාවක්. ඇයට බබා හම්බවුණේ මේ ගෙදර පදිංචිව උන්නු කාලෙ. ඇගේ සැමියා මෑතකදී මියගිය නිසා, නංගි ගැන සොයා බලන්නෙ තමන් බව මැක්ඩූගල් මහත්මයා අපට කිව්වා. ඒ නෝනාට ගෙදර වැඩකටයුතු තමන්ටම කරගන්න අමාරු නිසා, ඇයගේ උදව්වට සේවිකාවො හිටියා. මුලින් මේ ගෙදරට ආව කෙල්ල වැඩිකල් මෙහේ හිටියෙ නෑ. ඉක්මනටම අස්වෙලා ගියා. ඇය අපට කිව්වේ කසාද බඳින්න හොඳ මහත්මයෙකු හමුවුණු නිසා අස්වෙලා යනවා කියලයි. ඊළඟට වෙනත් කෙල්ලක් මේ ගෙදර රැකියාවට ආවා. ඇය තමා හදිසියේ මියගියේ"

අපට දැනගන්නට ලැබුණේ එපමණකි.

"මෙතැන සිදුවෙලා තියෙන්නෙ මොකක්ද කියලා ඔබට තේරුම් කරන්න පුළුවන්ද වොට්සන්?"

"මේක මහ අවුල් ගොඩක්. මට නම් ඒ තරම් පැහැදිලි නෑ" මම කීවෙමි.

"මට පෙනෙන විදියට සිදුවෙන්න ඇත්තේ මෙහෙම දෙයක්" හෝම්ස් කීය. "ඔහු ජූඩිත් ෆිලිප්ස් රැකියාවට බඳවාගෙන රක්ෂණය කළේ ඇය මරාදමා මුදල් ලබාගන්න. නමුත් ඒ කෙල්ල ගෙදරින් පැනගියාම මාෂල්ගේ සියලුම සැලසුම් බිඳවැටුණා. මොන හේතුවක් නිසාද ඇය පැන ගියේ? තමන්ට අවසානයේ අත්වෙන ඉරණම කුමක්ද කියන එක, ඇයට ඉවෙන් වගේ වැටහුණා වත්ද?

කොහොම වුණත් තමන්ගේ වැඩකටයුතු එතැනින් අත්හැර දමන්න මාෂල්ගේ සූදානමක් නෑ. ඒ නිසයි ඔහු තවත් තරුණියක රැකියාවට බඳවාගෙන ඇයට වහ දුන්නේ. අන්තිමේදී රක්ෂණ ප්‍රතිලාභය ඔහුට අහිමිවුණේ, මාෂල්ගේ අත්වැරැද්දකින් නෙමෙයි; මියගිය තරුණිය හරිහැටි හඳුනාගැනීම අත්‍යවශ්‍ය බව, විරුරෝහී රක්ෂණ නියෝජිතයා තදින්ම කියා සිටි නිසා."

"ඔබ මොනවද හෝම්ස් මෙතැනින් ඉදිරියට කරන්න බලාපොරොත්තු වෙන්නෙ?"

"ජෝන් මාෂල්, එරික් බ්‍රවුන් සහ ලින්ඩා ජෙන්කින්ස් සෙවීම මං තවදුරටත් කරනවා. දැන් මං කැමතියි ජූඩිත් ෆිලිප්ස්වත් මේ ලැයිස්තුවට ඇතුළත් කරන්න. ඇය හෝයා ගැනීමේ කටයුත්තට මට තවත් එක හෝඩුවාවක් ඉතිරිවෙලා තියෙනවා. ඒ තමයි සවුත්වෙස්ටන් රක්ෂණ සමාගමේ ඉල්ලුම් පත්‍රයට ඇය දී තිබුණු එක් තොරතුරක්. තමන්ගේ උපන්ගම, සමර්සෙට් ප්‍රාන්තයේ රොම්සී අසල නිව් ෆොරස්ට් බව ඇය සඳහන් කර තිබුණා. ඇය පැනගියේ තමන්ගේ දෙමව්පියන් ළඟට – තමන්ගේ ගමට වෙන්නත් පුළුවනි. සමහරවිට එතරම් තොරතුරක් නොලැබෙන්නත් පුළුවනි. ඒ වුණත් ඒ හෝඩුවාව ඔස්සේ තවදුරටත් හොයා බැලිය යුතුයි."

මීළඟ දිනයේ අපි සමර්සෙට් ප්‍රාන්තයේ රොම්සී වෙත ගියෙමු. නිව් ෆොරස්ට් යනු රොම්සී සිට වැටී තිබුණු අබලන් පාරකින් යාබුතු කඳුකරයේ වූ කුඩා ගම්මානයකි. රක්ෂිත වනයකටද යාබදව පිහිටි මෙම ගම්මානය, පහසුකම් අඩු පෙදෙසක් විය. තරුණ පරපුර රැකියා සොයා ගමෙන් පිටවී යාම නිසා, ගමේ ඉතිරි වී සිටියේ වයස්ගත වැඩිහිටියන් පමණි.

"ඔව්. ජූඩිත් අපේ දුව තමා" වයස්ගත ෆිලිප්ස් මහත්මිය අපේ විමසීමට පිළිතුරු ලෙස කීවාය. "මගේ මහත්තයත් අංශබාගෙ හැදිලා එක්තැන්වෙලා හුඟක් කල්. ඉතින් සෑහෙන කාලෙක ඉඳල දුව රක්ෂාවක් හොයමින් සිටියේ.

ඇයට ගෘහ සේවිකාවක ලෙස රැකියාවක් ලැබුණේ රැකීරක්ෂා ඒජන්සියක් මගින්. ඇය කෝන්වෝල් වැනි ඈත පළාතකට යවන්න අපි කැමති වුණෙත් නෑ. ඩූගල් කියන මහත්තයෙකුගේ ගෙදර ඇයට රැකියාව ලැබුණු බව අපට දන්වා එවා තිබුණා. ඩූගල් මහත්තයාගෙ නංගිගේ සැමියා ළඟදී මියගිහින්ලු. ඇයට කුඩා දරුවෙකු ඉන්නවාලු.

ඒ ගෙදර ඉවුම් පිහුම්, රෙදි සේදීම හා පිරිසිදු කිරීම් තමා ජූඩිත්ට භාරවෙලා තියෙන්නේ.

අපට එවූ තුන්වැනි ලියුමෙ ඇය කියා තිබුණා, ගෙදර ප්‍රධානියා වුණු ඩූගල් මහත්මයා ජූඩිත් ගැන පැහැදිලා, ඇයට විවාහ යෝජනාවක් කර ඇති බව. ඔහු ඇයව නගරයට කැඳවාගෙන ගිහින් තියෙනවා සාප්පු සවාරියක. ඒ ගමනෙදි රක්ෂණ සමාගමකට ගොඩවෙලා, ජීවිත රක්ෂණයකුත් අරගෙන දුන්නලු. බලන්න මහත්මයා. ඇයට එච්චර ආදරයෙන් උන්නු ඩූගල් මහත්මයා අත්ඇරලා, ජූඩිත් වෙන මහත්මයෙක් එක්ක පැන ගිහින් නෙ."

"හැබෑට? ඒ කා එක්කද? කොහොමද ඇයට මේ අලුත් මහත්තයා හමුවෙලා තියෙන්නේ?"

"ඔහු පීටර් ක්ලයිව් කියල එඩිංබ්‍රෝ නගරයේ මහත්මයෙක්." ෆිලිප්ස් මහත්මිය තවදුරටත් කීවාය. "එයා ඉයන් ඩූගල් මහත්තයගෙයි, ඔහුගේ නංගිගෙයි හිතවතෙක්. ඒ හිතවත්කමට ඔවුන් බලන්න ක්ලයිව් මහත්තයා කෝන්වෝල්වලට ගියාලු. ඒ වෙලාවේදි තමයි ඒ මහත්තයාට, අපේ ජූඩිත් ගැන හිත ගිහින් තියෙන්නේ. ක්ලයිව් මහත්තයා එඩිංබ්‍රෝ නගරයේ ලොකු ව්‍යාපාරිකයෙක්ලු. ආපසු එඩිංබ්‍රෝ වෙත යන ගමන් ඔවුන් මේ ගෙදරටත් ගොඩ වැදුණා."

"හැබෑට? කොහොමද ඔය ක්ලයිව් මහත්තයාගෙ පෙනුම?"

"එයා හරි උසයි කෙට්ටුයි. වයස අවුරුදු තිස්පහකට වැඩි නැතුව ඇති. කොණ්ඩය රතුම රතු පාටයි. පෙනුම හොඳ කඩවසම්. නැහැයෙ තමයි පොඩි ප්‍රශ්නයක් තියෙන්නේ. බොක්සිං තරගයකදී නැහැයේ ඇටය බිඳිලා, නැහැය පැතළියි. ඉස්සරහ දත් ටිකත් කැඩිලා කළුපාට වෙලා. ඒක නම් ඔය දත් දොස්තර කෙනෙක් ළඟට ගියාම හදාගන්න බැරිය"

ෆිලිප්ස් මහත්මිය පවසන මේ තොරතුරු අනුව, ජූඩිත්ගේ අලුත් මනමාලයා එරික් බ්‍රවුන් නම් අනෙක් තක්කඩියා බැව් පැහැදිලිය. කිසිවක් නොකියූ හෝම්ස් සහ මම මුහුණට මුහුණ බලාගත්තෙමු.

"එතකොට ඔය කියන ක්ලයිව් මහත්තයා, මෙහෙදි ඔබේ ජූඩිත් දුවව කසාද බැන්දද?" හෝම්ස් විමසීය.

"නැහැ මහත්මයා" ෆිලිප්ස් මහත්මිය කීවාය. "එයාලා කසාද බඳිනවා කිව්වේ එඩිංබ්‍රෝ නගරයට ගිහින්. ඒ කරලා මට ලියුමක් එවනවා කියල දුව කිව්වා. එහෙම කියල ගිහින් දැන් මාස දෙකකටත්

වැඩියි. මම මේ මඟබලාගෙන ඉන්නේ. මට ඇගෙන් ලියුමක්වත් ලැබුණෙ නෑ. මොනවා හරි කරදරයක් වෙලාද දන්නෙත් නෑ....... දැන් මේක මගේ හිතට හරි බරක්"

"ඕකට හිත අමාරු කරගන්න උවමනා නැහැ ෆිලිප්ස් නෝනා" හෝම්ස් කීවේ කතාබහ අවසන් කිරීමට සූදානම් වෙමිනි. "මංගල උත්සවයේ වැඩ නිසා, එයාලට විවේකයක් තියෙන්න නෑ. ඔවුන් ඔබට ලියුමක් එව්වොත්, නැත්තම් මෙහේ ආවොත්, ඒ බව මට වහාම දන්වලා එවන්න ඕනෑ. ඒ ලියුමක් මගින් නෙමෙයි විදුලිපුවතක් මගින්. ඒකට උවමනාවටත් වැඩිය මුදල් මං ඔබට දීල යනවා. ජූඩිත් ඉන්න තැනක් දැනගත්තු වහාම මට දන්වන්න. ඒකෙන් ජූඩිත්ට විශාල වාසියක් සැලසෙනවා. විශාලම වාසියක්. ඒ හින්දා මට ඔවුන්ගේ ලිපිනය දැන්වීමට අමතක කරන්න එපා."

ඇගෙන් සමුගෙන අපි නිව් ෆොරස්ට් ගම්මානයෙන් පිටවී ආවෙමු. හෝම්ස් යළිත් මේ ගැන කථාව ඇරඹුවේ අප ලන්ඩනයට ආපසු ඒමට දුම්රියට නැඟුණු පසුවය.

"ෆිලිප්ස් නෝනාට ඇයගේ දුව ආපහු දකින්න ලැබේවි කියලද වොට්සන් හිතන්නෙ?" හෝම්ස් ඇසීය. "මට නම් ඒ ගැන එච්චර විශ්වාසයක් නැහැ. බ්‍රවුන් කියන්නෙත් මාෂල් වගේම අපරාධකාරයෙක්. රක්ෂණ මුදල් ලබාගැනීමට මනුෂ්‍ය ඝාතන කරන්නෙක්. මේ වෙනකොටත් ඔහු තමන්ගේ ව්‍යාපාර කටයුතු අවසන් කරලද දන්නෙත් නැහැ. කොහොමවුණත් මං බලාපොරොත්තු වෙනවා මේ තක්කඩියා ගැන ස්කොට්ලන්තයේ පොලිස් ස්ථානවලට දන්වා යවන්නත්"

එහෙත් ෂර්ලොක් හෝම්ස්ගේ එම නිගමන වැරදි බව සනාථ කරමින් ඔහු වෙත විදුලි පුවතක් ලැබුණේ තවත් සති තුනක් ගතවීමටත් පෙරය. ඒ මේරි ෆිලිප්ස් මහත්මියගෙනි.

**"ජූඩිත්ගෙන් ලිපියක් ලැබුණා. ක්ලයිව් සමග විවාහයෙන් පසු ඔවුන් පදිංචි අංක 117 කැන්ඩ්ල් මේකර් පාර, ග්‍රේ ෆ්‍රයර්ස් චතුරශ්‍රය, එඩිංබ්‍රෝ.**

**මේරි ෆිලිප්ස්"**

"ඇය තවමත් ජීවතුන් අතර ඉන්නවා නම් ඒක මොනතරම් සතුටක්ද?" හෝම්ස් කීවේ අප්‍රමාණ සන්තෝෂයෙනි. "අර එරික්

බ්‍රවුන් කියන අපරාධකාරයාට ක්ලයිව් කියන නම ගත්තට පස්සෙ අපරාධ ලෝකයෙන් ඈත්වෙන්න හිතුණා වෙන්නත් ඇති....."

"....... මොකක්ද හෝම්ස් දැන් ඔබ කරන්න බලාපොරොත්තු වෙන්නෙ?"

"වෙහෙස මහන්සිය නොබලා අපට ආපහු යන්න වෙනවා එඩිංබ්‍රෝ වෙත. මීට අවුරුදු තුනකට පමණ කලින්, මේරියන් ඩැල්රිම්පල් මෙනෙවිය හමුවෙන්න අපි ගියෙත්, ඔය ග්‍රේ ෆ්‍රයර්ස් චතුරශ්‍රයටමනේද?"

ග්‍රේ ෆ්‍රයර්ස් චතුරශ්‍රය පිහිටියේ ග්‍රේ ෆ්‍රයර්ස් දෙව්මැඳුරට ඉතා සමීපවය. කැන්ඩ්ල්මේකර් පාර යනු, දෙව්මැඳුරේ සිට එඩිංබ්‍රෝ විශ්වවිද්‍යාලය දක්වා වැටී තිබූ ප්‍රධාන පාරට සම්බන්ධව තිබූ අතුරුපාරකි.

"මේ එරික් බ්‍රවුන් හෙවත් පීටර් ක්ලයිව් කියන පුද්ගලයා මනුෂ්‍ය ඝාතනවලට සම්බන්ධ අපරාධකාරයෙක්" හෝම්ස් කීවේ ස්කොට්ලන්තයේ එඩිංබ්‍රෝ පොලිසියේ ප්‍රධාන පරීක්ෂක වරයාටයි. "ඔහු ආසනික් යොදා මිනීමරන කල්ලියක කෙනෙකු බව ඇත්ත. නමුත් ගිනිඅවි පාවිච්චියටත් අදක්ෂයෙකු වෙන්න බෑ. ඒ හින්දා ඔහු හිරභාරයට ගැනීමට ආයුධ සන්නද්ධ භටයන් හයදෙනෙකුගේ කණ්ඩායමක් මට ඕනෑ"

"ඔබේ කටයුතුවලට සහය වෙන්න ලැබීමත් අපට ලොකු ගෞරවයක් ෂර්ලොක් හෝම්ස් මහත්මයා" හැරල්ඩ් මැක්ආතර් නම් පොලිස් නිලධරයා කීය. "දවසේ ඕනෑම වෙලාවක, ඕනෑම තැනකදී ඔබට සහයෝගය දෙන්න අප සූදානම්"

"හරි. බොහොම ස්තුතියි." හෝම්ස් කීය. "අප කියන පුද්ගලයා සහ ඔහුගේ බිරිඳ මේ දිනවල, මා කියූ නිවසේ පදිංචි බව අප හොයා ගත්තා. හෙට උදේ හතර වෙද්දී ඔය ස්ථානය වටලා ඔවුන් අත්අඩංගුවට ගනිමු."

"මෙතැනට යාමට අපි සාමාන්‍ය කුලීරථ යොදාගමු" මැක් ආතර් යෝජනා කළේය. "ඔබ දෙදෙනා නැවතී ඉන්නේ ග්‍රෑන්ඩ් චාන්සලර් හෝටලයේ නේද? ඔබ කැඳවාගෙන යාමට කුලීරියක් උදේ 3.45ට හෝටලයට එනවා. එහි රියදුරා ලෙස එන්නේ පොලිස් භටයෙක්."

කැන්ඩ්ල් මේකර් පාරේ අංක 117 පොලිසිය මගින් වටලා, එහි නිවැසියන් අත්අඩංගුවට ගැනිණ. අපට අවශ්‍යව සිටි අපරාධකාරයකු

වූ එරික් බ්‍රවුන් හෙවත් පීටර් ක්ලයිව් තම බිරිඳ සමග යටත් වූයේ කිසිදු සටනකින් තොරවය. පොලිස් ස්ථානයට ගෙනගිය පසු ඔහු පාපෝච්චාරණයේ යෙදුණේ සිය කැමැත්තෙනි.

"මගේ සැබෑ නම විලියම් ෆර්ගසන්. නමුත් එරික් බ්‍රවුන් සහ පීටර් ක්ලයිව් කියන බොරු නම් මා වරින් වර පාවිච්චි කළා. අපේ කල්ලියේ නායකයා වුණේ බර්ට් ස්ටීවන්ස්. ඔහු මිනී ගණනාවක් මැරූ පාතාල ලෝකයේ පුරුදුකාරයෙක්."

"මොනවා බර්ට් ස්ටීවන්ස්?" ෂර්ලොක් හෝම්ස් විමසුවේ මවිතයට පත්වය. "එතකොට ජෝන් මාෂල්, ඉයන් ඩූගල් යන නම්වලින් පෙනී හිටියෙත් ස්ටීවන්ස්මද?"

"ඔව් මහත්මයා"

"බොහොම හොඳයි" හෝම්ස් කීය. "මං හරි කැමැතියි ඔහුව මුහුණට මුහුණ හමුවෙන්න. මාව මරාදමන බවට තර්ජනය කර තිබුණු බර්ට් ස්ටීවන්ස්. මේ කල්ලියේ නායකයා බව මං හීනෙකින්වත් හිතුවෙ නෑ. හොඳයි ෆර්ගසන් ඔබේ කථාව දිගටම කියන්න."

"ඔව් මහත්මයා." සිරකරුවා කීය. "සමහරවිට ඔබ දන්නවත් ඇති, බර්ට් ස්ටීවන්ස් කියන්නේ ඉස්සර වෛද්‍යවරයෙකු බව. ඔහු පෞද්ගලික වෙදකමේ යෙදුණේ ඩන්ඩි නගරයේ. නමුත් ඔහු යෙදුණු නොයෙකුත් විෂමාචාර හා අපරාධ නිසා වෛද්‍ය මණ්ඩලය බර්ට් ස්ටීවන්ස්ගේ බලපත්‍රය තහනම් කළා. එදා ඉඳන් ඔහු කටයුතු කළේ පාතාල ලෝකය එක්ක. ලින්ඩා ෆ්ලෙමිං කියන්නේ ඔහු මෑත කාලයේ විවාහ කරගත් බිරිඳ.

මහත්මයා. ඔනෙම දේවස්ථානයක මං දිවුරන්නම්. මිනීමැරුමකට හවුල්වෙන්න මගේ කිසිම අරමුණක් තිබුණේ නෑ. මට බර්ට් හමුවුණේ ඩන්ඩිහි තැබෑරුමක. ඔහු සමග මුහුණපුරා රැවුල වැවූ තවත් කෙනෙකු හිටියා. තමන්ගේ සැලැස්ම බර්ට් මට කිව්වේ මෙහෙමයි.

"මේ අහනවා එරික්. දැන් ජීවන වියදමත් එන්න එන්නම වැඩිවෙනවා. අපි බොහොම අමාරුවෙන් හම්බකරගන්නා මුදල් ඔක්කොම සූරගන්නෙ කවුද? තැබෑරුම් කාරයොයි, අශ්වරේස් කාරයොයි. මගේ හිතේ හොඳ ප්ලෑනක් තියෙනවා. අපි බැංකුවක් මංකොල්ල කන්නෙ නැතුව රක්ෂණ සමාගම් මංකොල්ල කමු."

"ඒ කොහොමද?"

"මේ ඉලන්දාරියා ඉන්නවානේ" ඔහු කිව්වේ එතැන සිටි අමුත්තා දෙසට අත දිගු කරමින්." මෙයාගෙ ඇත්ත නම ඇලෙක්සැන්ඩර්

ග්‍රිෆිත්, මෙයා කාලයක් යුද්ධ හමුදාවේ සේවය කළ කෙනෙක්. අපි මෙයාට බන්දලා දෙනවා මගේ බිරිඳව!" මෙහෙම කියූ බර්ටී මහ හඬින් හිනාවුණා.

"මොනවා ඒ කොහොමද?" මං ඇහුවා.

"ඒවා මෙහෙම කතාකරන්න බෑ. එනවා මගේ ගෙදරට" කියූ ඔහු අපව තමන්ගේ ගෙදරට කැඳවාගෙන ගියා. තමන්ගේ සැලැස්මේ ඉතිරි හරිය ඔහු කිව්වේ ගෙදරදී.

"අද ඉඳන් ග්‍රිෆිත්ගේ නම තෝමස් කාල් ජෙන්කින්ස්. හරිද. ඒ බව ඔප්පු කරන සහතිකයක් ගන්න මට පුළුවනි. ඊළඟට අපි යනවා මගේ බිරිඳත් එක්ක බැල්෴ර් දේවගැතිතුමාගේ දෙව්මැඳුරට. එයා අපි කව්රුවත් අඳුනන්නෙ නෑ. ගිහින් විවාහය ලියාපදිංචි කරගන්නවා තෝමස් කාල් ජෙන්කින්ස් සහ ලින්ඩා ෆ්ලෙමිං අතර. ඒ විවාහයට සාක්ෂිකරුවන් ලෙස අත්සන් කරන්නේ තමුසෙයි මමයි" බර්ටී යළිත් වරක් මහහඬින් සිනාවුණා. එතකොට මගේ නම ජෝන් මාෂල්. තමුසෙ එරික් බ්‍රවුන්.

අපට වැදගත් වෙන්නේ ඒ විවාහ සහතිකය විතරයි. ඒ සහතිකයත් අරගෙන ග්‍රිෆිත්ව යවනවා එඩිංබ්‍රෝ නගරයේ තිබෙන ප්‍රධාන රක්ෂණ සමාගම් හත අටකටම. ගිහින් ඔහු ගන්නවා ජීවිත රක්ෂණ, ලොකු ලොකු මුදල් ප්‍රමාණවලට. එයාලගේ වෛද්‍ය පරීක්ෂණවලට පෙනී ඉන්න ග්‍රිෆිත්ට සිදුවේවි. මෙයා නිරෝගී තරුණයෙකු නිසා, රක්ෂණ සමාගම්වල අය වැඩිය ප්‍රශ්න අහන්නෙ නෑ. ඊට පස්සෙ අපි හතරදෙනාම යනවා ලන්ඩන් නගරයට.

එහේදී අපි ගෙයක් කුලියට අරගෙන පදිංචිවෙලා, අපේ කටයුත්තේ දෙවැනි අදියර පටන්ගන්නවා. ග්‍රිෆිත් තමුසෙ බීල තියෙනවද බඩ විරේක කරන බෙහෙත්? නෑ? හොඳයි මං දෙනවා තමුසෙට බොන්න ක්‍රෝටන් තෙල්. මේකට දවසට තුන් හතර සැරයක් බඩ බුරුල්වෙලා යනවා. එච්චරයි. හොඳ වෛද්‍යවරයෙකුත් අල්ලාගෙන අපි කියනවා අපේ මිත්‍රයාට පාචනය හැදිලා කියල. වෛද්‍යවරයා නොයෙකුත් කුඩු වර්ග දේවි. ඒ කිසි එකක් තමුසෙ බොන්න උවමනා නෑ. දවස් පහක් හයක් අපි මේ විදියට පාචනයට බෙහෙත් ගන්නවා.

ඔය අතරේ මං ඉන්නේ සෙවිල්ලෙන්. ඒ ග්‍රිෆිත්ගෙ ශරීර ප්‍රමාණයේ තරුණයෙකුගේ මළසිරුරක් හොයාගන්න. මං වෛද්‍යවරයෙකු හැටියට පළපුරුද්දක් තියෙන කෙනෙක් නේ. ඉතින් සේවකයෙකුට

ගණනක් ගෙවලා, මිනීකාමරයකින් මළසිරුරක් හොරෙන් පාස්කර ගැනීම මට එච්චර අමාරු වැඩක් නෙමෙයි. ඒ මොකද කාත් කවුරුවත් නැති හිඟන්නො, ඉස්පිරිතාලෙදි ඕන තරම් මැරෙනවා. මිනියක් හම්බවුණු ගමන් අපි ඒක ගෙදර අරගෙන එනවා. ඊළඟට ඒකට ග්‍රිෆිත්ගෙ ඇඳුම් අන්දවලා, අර දොස්තරටම කියනවා අපේ ලෙඩා මියගියා කියලා. මං ඔහුට කියන්නේ මරණයට හේතුව ලේ අතීසාරය කියලා සහතිකයක් දෙන්න කියලා. ඒක ගත්ත ඉක්මනින් අපි මළසිරුර භූමදාන කරලා සති දෙක තුනක් නිශ්ශබ්දව ඉන්න ඕන. ඊළඟට තමයි මේකේ තුන්වැනි හෙවත් අවසාන අදියර පටන්ගන්නේ.

කළුපාට ඇඳුම්වලින් සැරසිලා, ලින්ඩා රක්ෂණ සමාගම්වලට යන්නේ ඇස්වල කඳුළු පුරවාගෙන. ඒ විතරක් නෙමෙයි. ඔවුනට උවමනා කරන රක්ෂණ ඔප්පුව, මරණ සහතිකය සහ විවාහ සහතිකයත්, ඇය අරගෙන යනවා. රක්ෂණ සමාගම්වලින් අපට පවුම් ලැබෙන්නෙ දහස් ගණනින්. මුදල් අපි හතරට බෙදනවා. ග්‍රිෆිත්ගෙ මුදල ලැබුණු ගමන් තමුසෙ වහාම ආපහු එන්න ඕන මේ ඩන්ඩිවලට. ඇවිත් වැඩිය එළියට පහළියට බහින්නෙ නැතුව ඉන්නවා. ඊටත් පස්සෙ තමයි අපි ආපහු එන්නේ. දැන් තේරුණාද?"

ග්‍රිෆිත් තරුණයා මේකට කැමැති වුණේ ප්‍රශ්න නොඅසාම. මට තිබුණේ විවාහයට සාක්ෂියට අත්සන් කිරීම සහ බර්ට්ට උදව්වීම ආදී සුළු වැඩ පමණයි. ඒ නිසා මාත් කැමැතිවුණා.

"බර්ට් මේ වගේ අපරාධයක් කරන බව දන්නවා නම්, මං කොහොමටවත් මේකට සම්බන්ධ වෙන්නේ නෑ. අප කවුරුවත් නොහිතූ විධියට ඔහු අන්තිම දවසේ, ග්‍රිෆිත්ට විරේක බෙහෙත සමග විෂක් දීලා. ග්‍රිෆිත් මියගියා. බර්ට්ට කියූ විදියට මළසිරුරක් හොයාගන්න උවමනා වුණේ නෑ. සමහර විට මේ විදියට කරන්න ඔහුගේ හිතේ මුල ඉඳලම සැලැස්මක් තිබුණද දන්නෙ නෑ.

මගේ හිතේ ලින්ඩා ගැනත් ඇතිවුණේ කණගාටුවක්. බර්ට් සමග විවාහයෙන් දරුවෙකු ලැබෙන්න හිටි ඇයත්, අන්තිමට මේකට පටලැවුණා. ඔහු සමග දිගටම කටයුතු කරනවා ඇරෙන්න අපි කාටවත් මේකෙන් ගැලවීමක් තිබුණෙ නෑ.

අවශ්‍ය ලියකියවිලි අරගෙන ලින්ඩා රක්ෂණ සමාගම් ගණනාවකටම ගියා. නමුත් කාගෙන්වත් වැඩිදුර ප්‍රශ්න කිරීමක් කෙරුණෙ නෑ. ඇය අන්තිමට ගිය පෲඩෙන්ෂල් රක්ෂණ සමාගම තමයි කියලා තිබුණේ, වැඩිදුර පරීක්ෂණයක් අවශ්‍ය බව. එතකොට

තමයි තරු පෙනුණේ. අපි කවුරුත් භීතියට පත්වෙලා ලන්ඩන් නගරයෙන් පැන ගියා.

මැක්ඩූගල් කියන නම අරගෙන බර්ට් සහ ලින්ඩා ගියේ කෝන්වෝල් ප්‍රාන්තයට. එහිදී ඔවුන් අයියා සහ නංගි ලෙස නැවතීමට ගෙයක් කුලියට ගත්තා බව මට කිව්වා. මං ආපහු එඩිංබ්‍රෝ වෙත ආවා. මේ රක්ෂණ වංචාවෙන් බර්ට් එකතු කරගත් මුදල කොපමණද කියල මං දන්නේ නෑ. නමුත් ඔහු මට ගෙවන්න පොරොන්දු වුණු මුදලෙන් එක පැන්සයක්වත් මට ගෙව්වේ නෑ. මුදල් අගහිඟකම් මට බොහොම සැරේට දැනෙන්න පටන්ගත්තා. එතකොට තමයි මං බර්ට් හොයාගෙන කෝන්වෝල් වෙත ගියේ.

ජූඩිත් මට හමුවුණේ ඔවුන්ගේ ගෙදරදී. ඇය සමග කතාබහ කරද්දී මගේ හිතේ ඇය ගැන ආදරයක් පැහැදීමක් ඇතිවුණා. ඇයගේ හිතෙත් ඒ වගේ හැඟීම් ඇතිවුණු බව මං තේරුම් ගත්තා. ජූඩිත් ගම්බදව හැදුණු වැඩුණු යහපත් තරුණියක බව මට පෙනුණා. ලන්ඩනයේ හෝ එඩිංබ්‍රෝවල නගරබද ගැහැනුන් ළඟ නොතිබුණු ගුණධර්ම ජූඩිත්ගේ තිබුණා.

නමුත් එදා රාත්‍රි බර්ට්ගෙන් මට අහන්න ලැබුණු පුවතකින්, මං දැඩි කම්පනයකට පත්වුණා. ඒ බර්ට් ඇයට ජීවිත රක්ෂණයක් අරගෙන ඇති බව. ඒකෙ තේරුම මොකක්ද? මුදල් ලබා ගැනීමේ අරමුණෙන් ඔහු ළඟදීම ඇයව මරාදමන බව. තරුණ කාලයේ සිටම මම නොයෙක් වංචා හා තක්කඩි වැඩට හවුල්වුණු කෙනෙකු බව ඇත්තයි. නමුත් කෙනෙකු අමු අමුවේ මරාදැමීමකට මට එකඟවෙන්න බෑ. බර්ට්ට හොරෙන් මට හැකිවුණා හැමදෙයක්ම ජූඩිත්ට දැනුම් දෙන්න. ඊළඟ දා රාත්‍රියේ මං ජූඩිත් සමග කෝන්වෝල්වලින් පැන ආවා. මුලින් නිව් ෆොරස්ට්හි ඇගේ දෙමව්පියන් හමුවෙන්න ගිහිං, ඊට පසු එඩිංබ්‍රෝ වෙත ආවා. දැන් අපි දෙන්නා විවාහ වෙලා ආදරයෙන් සතුටෙන් ජීවත්වෙනවා."

මේ පාපෝච්චාරණය අනුව තමාට නිදහස ලැබෙතැයි, එරික් බ්‍රවුන් හෙවත් ෆර්ගසන් හෙවත් ක්ලයිව්, අපේක්ෂා කරන්නට ඇත. එහෙත් මිනීමැරුමකට අනුබල දුන්, භයානක අපරාධකාරයෙකුගේ හවුල්කරුවෙකු නිදහස් කිරීමට, පොලීසියේ සූදානමක් නොතිබිණ. කෙසේ වෙතත් මොහු අත්අඩංගුවට ගත් බවත්, බර්ට් ස්ටීවන්ස්ගේ අලුත්ම අපරාධ ගැන සියලු තොරතුරුත්, පුවත්පත් වෙත හෙළි

නොකොට රහසිගතව තබාගන්නා ලදී; එසේ කෙරුණේ ෂර්ලොක් හෝම්ස්ගේ උපදෙස් අනුවය.

"හෝම්ස් මහත්මයා." ස්කොට්ලන්ත පොලීසියේ ප්‍රධානියා වූ මැක් ආතර් කීය. "එඩිංබ්‍රෝ, ඇබඩීන්, ග්ලාස්ගෝ හා ඩන්ඩි යන නගර හතර හා බැඳුණු, නොවිසඳුණු අපරාධ ගණනාවක් තියෙනවා. මේ අය එයින් සෑහෙන ගණනකට හවුල් බවට සැක නෑ. එයින් කිහිපයක් හරි විසඳගන්න දැන් අපට හැකිවේවි. ඔබ අපට කළේ විශාල උදව්වක්. ඒ ගැන අපි හැමදාමත් ණය ගැතියි. මීළඟට මොකක්ද අප කළ යුත්තේ?"

"බර්ට් ස්ටීවන්ස් බ්‍රිතාන්‍යය පුරා සැරිසරමින්, නොයෙකුත් අපරාධ වංචාවල යෙදී ඇති බවට සැක නෑ" හෝම්ස් කීය. "මට හිතෙනවා ඔහු තවමත් කෝන්වෝල්වල ඇති කියල. කොහොම වුණත්, කොහේ ගියත්, ඒ පළාත් ඔහුට ඉන්න බැරි තරම් රත්වෙන කොට ඔහු ආපහු ගමට එනවා. ඒක සහතිකයි. ඒ හින්දා ස්කොට්ලන්තය පුරාම ඔබේ අවධානය තිව්‍ර කරන්න. මගෙන් උපදෙස් අවශ්‍ය නම් ඕනෑම මොහොතක මාව සම්බන්ධ කරගන්න. අද හැන්දෑවේ දුම්රියෙන් දොස්තර වොට්සන් සහ මම ආපහු ලන්ඩනය බලා යනවා."

"බර්ට් ස්ටීවන්ස්ට නිදැල්ලේ ඉන්න ඉඩ හැරීම හරිම භයානකයි." මගේ මිත්‍රයා කීවේ අප ආපසු එන අතරය. "මගේ සියලු වැඩකටයුතු නවත්වලා මේ පුද්ගලයා ගැන අවධානය යොමුකරන්න ඕන. ඔහු පටලවා ගත හැකි ආකාරයේ සියුම් දැලක් වියන්න ඕන අප්‍රමාදව."

ලන්ඩනයට පැමිණි වහාම හෝම්ස් ස්කොට්ලන්ඩ්යාඩ් පොලීසිය වෙත ගියේය. මෙම අපරාධකරුවන් කල්ලිය ගැන විමර්ෂණය කිරීම හෝම්ස් භාරදී ගියේ පරීක්ෂක බ්රැඩ්ස්ට්‍රීට් වෙතයි. එහෙත් ඔහු වෙත අලුත් තොරතුරු කිසිවක් ලැබී නොතිබිණි.

මීළඟ දින කිහිපයම හෝම්ස් තම හාන්සිපුටුවට වී කල්පනා කරමින් කාලය ගත කළේය. විටෙක දුම්පයිප්පය උරමින් විටෙක වයලීනය වාදනය කරමින් සිටි ඔහු, මා සමග කතාබහකට කැමැත්තක් දැක්වූයේ නැත. අන්තිමේදී එක් දිනක් ඔහු දොඩමළු වූයේ පොලිස් පරීක්ෂක බ්රැඩ්ස්ට්‍රීට් හෝම්ස් හමුවීමට පැමිණි විටය.

"මට සෑහෙන විශ්වාසයක් තියෙනවා" හෝම්ස් කීය. "ස්ටීවන්ස් තවමත් ඇත්තෙ කෝන්වෝල්වල කියල. ඔහුගේ උපාය ලෝන්සෙස්ටන්වලදි සාර්ථක නොවුණු නිසා, සමහර විට ඔහු තවත්

ඈතට ගිහින් ඇති. ප්ලිමත්, ෆැල්මත්, පෙන්සාන්ස්, රෙඩ්රූත් පැත්තට වැඩි අවධානයක් යොමුකරන්න කියලා ඔබේ ඔත්තුකාරයන්ට කියන්න"

"ඔවුන් ඒ කටයුත්ත ඉතා හොඳින් කරනවා හෝම්ස් මහත්මයා" බ්‍රැඩ්ස්ට්‍රීට් කිය. "සමහරක් අය ගෙවල් ගානෙ යන්නෙ රක්ෂණ නියෝජිතයන් විදියට. ඡායාරූපයක් නොතිබුණත් බර්ට් ස්ටීවන්ස්ගෙ පෙනුම ගැන හොඳ දැනුමක් අපේ අයට ලබා දීල තියෙනවා"

සතුටුදායක ආරංචියක් මීළඟට අප වෙත ලැබුණේ තවත් සති තුනකට පසුවය. එනම් ස්ටීවන්ස්ගේ පෙනුම ඇති අයෙකු රෙඩ්රූත්හි දකින්නට ලැබී ඇති බවයි. වෙස්වළාගත් පොලිස් භටයන් විසිපස් දෙනෙකුවත් රෙඩ්රූත් වෙත යවන මෙන්, හෝම්ස් බ්‍රැඩ්ස්ට්‍රීට් වෙත උපදෙස් දුන්නේය. මීළඟ දිනයේ අපි දුම්රියෙන් කෝන්වෝල් ප්‍රාන්තය බලා පිටත්වී ගියෙමු.

තවත් දින දෙකක් ගතවෙද්දී රෙඩ්රූත් නගරයේ තැන් තැන්වල අලංකාර ලෙස සැරසූ අශ්වකරත්ත සංචාරය කරනු දක්නට ලැබිණ. "ඇංග්ලෝ - ඇමරිකන් රක්ෂණ සමාගම" යනුවෙන් පින්තාරු කළ ධජ එම රථ මුදුනේ ලෙල දුන් අතර මහජනයා වෙත විශේෂ පණිවුඩයක්ද ඒවායේ ප්‍රදර්ශනය කෙරිණි.

"ජීවිත රක්ෂණය ඔබේ දෙපා ළඟටම
කාටත් දැරිය හැකි මුදලකට"

යන්නයි එම පණිවුඩය. මෙම අලුත් රක්ෂණ සමාගම මහජනයා වෙත ලබාදුන් වාසි රැසක් විය. වෛද්‍ය පරීක්ෂණයකට පෙනී නොසිට ජීවිතරක්ෂණයක් ලබාගැනීමට තිබූ පහසුව; ඔබ විවාහ වීමට බලාපොරොත්තු වන තරුණයාට හෝ තරුණියට, ජීවිත රක්ෂණයක් ගැනීමේදී සලස්වන පහසු ගෙවීමේ ක්‍රමය, ඒ අතර විය.

මෙම ආකර්ෂණීය සැලැස්මට අනුව ජීවිත රක්ෂණ ලබාගැනීමට තරුණ පරපුරේ බොහෝ දෙනෙක් ඉදිරිපත් වූහ. ඒ අතර වයස අවුරුදු හතළිහ ඉක්මවූ පුද්ගලයකු සිටියේ එක් අයකු පමණි. ඒ උසින් අඩි පහමාරක් වූ තරබාරු, සම්පූර්ණ තට්ට හිසක් තිබූ ක්ලැරන්ස් හිල් නම් මහතෙකු පමණි. ඔහු පැමිණ සිටියේ තමා විවාහවීමට අපේක්ෂා කළ ඇලිස් වීලර් නම් තරුණියට ජීවිත රක්ෂණයක් ලබාගැනීමටයි. ඔහු සිය කැමැත්තෙන් පවුම් 20ක් ගෙවුවේ තම පෙම්වතිය කැඳවාගෙන ඒමට දිනයක්ද වෙන්කර ගනිමිනි.

අශ්වකරත්තය තුළදී ලියවිලි අත්සන් කළ ඔහු බිමට බහිද්දී පිළිගැනීමට කිහිපදෙනෙක් බලාසිටියහ.

"මං විශ්වාස කරනවා මේ බර්ට් ස්ටීවන්ස් හෙවත්, ජෝන් මාෂල්, හෙවත් ඉයන් මැක්ඩූගල් කියලා?" මගේ මිත්‍රයා කීවේය. ඒ නිල ඇඳුමින් සැරසුණු හැඩිදැඩි පොලිස් නිලධරයන් හත්අට දෙනෙකුට මැදිවී, මුව අයාගෙන පුදුමයෙන් බලාසිටි අපරාධකාරයාටයි. "ඔබ කාලයක් තිස්සේ මාව හෙව්වා වුණත්, මේ අප හමුවුණු පළමුවෙනි වතාව නේද ස්ටීවන්ස් දොස්තර මහත්තයා. මං බේකර් වීදියේ ෂර්ලොක් හෝම්ස්!"

ඕල්ඩ් බේලි අධිකරණයේ දී විභාගයට ගැනුණු, ස්ටීවන්ස්ට එරෙහි නඩු විභාගය දින අටක් තිස්සේ පැවැත්විණි. මිනීමැරීමට ආධාර හා අනුබල දීමේ චෝදනාවට වරදකරුවූ ලින්ඩා ෆ්ලෙමිං ස්ටීවන්ස්ට අවුරුදු දෙකක සිරදඬුවමක් ලැබිණ. එරික් බ්‍රවුන් හෙවත් පීටර් හෙවත් විලියම් ෆර්ගසන්ට බරපතළ වැඩ ඇතිව අවුරුදු පහක සිරදඬුවමක් නියම විය. මහ මොළකරු වූ බර්ට් ස්ටීවන්ස්ට මරණීය දණ්ඩනය නියම විණි.

# මර උගුල

කාබනික රසායන විද්‍යාව යනු මගේ මිත්‍ර ෂර්ලොක් හෝම්ස් මහතා අතිශයින්ම ප්‍රිය කළ ක්ෂේත්‍රයක් බැව් මම මීට පෙරද සඳහන් කර ඇත්තෙමි. පසුගිය මාසයේ එක දිගට දින කිහිපයක්, ඔහු එම පරීක්ෂණවල නිරත විය. හදිසියේ ගිනි ඇවිළිය හැකි රසායන ද්‍රව්‍ය ඊට අදාළ වූ නිසා, එම පරීක්ෂණ බේකර් වීදියේ නිවහනේ නොකිරීමට හෝම්ස් තීරණය කළේය. ඔහු ඒ සඳහා යොදාගත්තේ මහාචාර්ය අර්නස්ට් ඇලිංහැම්ගේ අපර් රිච්මන්ඩ් පාරේ තිබූ පර්යේෂණාගාරයයි.

"හෝම්ස්. ඊයෙ ඔබ ගෙදර නොහිටි වෙලාවෙ අනුග්‍රාහකයෙක් ආවා ඔබ හමුවෙන්න" මම කීවෙමි.

"හැබෑට? කවුද ඒ?"

"තරුණ වෛද්‍යවරයෙක්. ඔහු ලොකු ගැටලුවකට මුහුණදීලා. ඒක මොකක්ද කියා මට කියන්න ඔහු කැමැතිවුණේ නෑ. අද උදේ නැත්නම් හැන්දෑවෙ, ඔබ හමුවෙන්න යළිත් එන බව ඔබට කියන්න කිව්වා."

"ඔහු එන වෙලාවක් කිව්වද?"

"නැහැ"

"ඔහු එනවා කියන වෙලාවට මට ආපහු එන්න ලැබේද කියන එක අවිශ්වාසයි වොට්සන්. මාත් මගේ මිත්‍රයාත්, ගල් අඟුරු ආසවනය කිරීමේ කටයුත්තක යෙදිලයි ඉන්නෙ."

"ඒක ඔබ මීට පෙරත් කළ පරීක්ෂණයක් නෙ"

"ඔව්. නමුත් මෙවර අපි ඒක කරන්නේ වෙනත් ක්‍රමයකට. ගල් අඟුරු ඉතාම කුඩා කැබලිවලට කුඩු කරලා, අයන් ඔක්සයිඩ් සමග උත්ප්‍රේරකයක් අපි එයට මිශ්‍ර කරනවා. ඊළඟට අපි ඒක සෙන්ටිග්‍රේඩ් අංශක 500 ට රත්කරන්නේ, අධික පීඩනයක් යටතේ."

"ඒ මොන අරමුණකින්ද?"

"එයින් ලබාගන්න පුළුවන්, තවමත් හොයාගෙන නැති, රසායන ද්‍රව්‍ය මොනවද කියල හොයන්න. ඊයේ අපට ලැබුණා අතිශයින්ම ගිනිගන්නා සුලු, මද්‍යසාරය වැනි ස්ප්‍රීතු වර්ගයක්. ඒක තවදුරටත් පිරිසිදු කර ගත්තොත්......"

හෝම්ස් තම කථාව නැවැත්වූයේ, වේගයෙන් පැමිණි අශ්වකරත්තයක්, අප නිවස ඉදිරිපිට නවත්වන ශබ්දය ඇසීමෙනි. එයින් බිමට බට පුද්ගලයා කවුරු වුවත්, ඔහු පියගැට පෙළ දිගේ ඉහළට වේගයෙන් දිව එන ශබ්දය අපට අසන්නට ලැබිණි. ඔහු දොරට තට්ටු කරද්දී මම විසිත්ත කාමරයේ දොර විවෘත කළෙමි.

මට දකින්න ලැබුණේ කලින් දිනයේද පැමිණ, හෝම්ස් හමුවීමට නොලැබුණු වෛද්‍යවරයාය.

"මට සමාවෙන්න මහත්වරුනි" ඔහු කීය. "මට හිතුණා අද උදේම ආවොත්, ෂර්ලොක් හෝම්ස් මහත්මයා හමුවෙන්න හැකිවේවි කියල. ඔබේ උදේ තේ පානයට බාධා කිරීම ගැන මට සමාවෙන්න. එය අවසන් වෙනතුරු ටිකක් වෙලා ඉන්න මට පුළුවනි."

මගේ මිත්‍රයා බලාපොරොත්තුව සිටියේ තේ පානය අවසන් කළ වහාම, පර්යේෂණ සඳහා රසායනාගාරය වෙත පිටත්ව යෑමටය.

"ඔබ ඊයේත් ආ බව මට අසන්නට ලැබුණා" හෝම්ස් කීය. "මට වැදගත් කටයුත්තක් සඳහා යාමට තිබුණත්, මම එය පැයකින් කල් දමන්නම්. වොට්සන්. විදුලිපුවතක් යවන්න මහාචාර්ය ඇලිංහැම්ට, මං උදේ එකොළහටයි එන්නෙ කියලා. වහාම ඒ කටයුත්ත ගැන බිලීව යවන්න."

අප තේ පානය අවසන් කළ පසු, හෝම්ස් පයිප්පයද දල්වාගෙන තම හාන්සිපුටුවේ වැතිරුණේය. ඒ තමා ඉදිරියට පැමිණෙන මෙන් අමුත්තාට සංඥා කරමිනි. මමත් ඒ අසලින්ම වූ අසුනක හිඳගතිමි.

"දොස්තර මහත්මයා" හෝම්ස් කීවේ අමුත්තා අමතමිනි. "මේ මගේ හිතවත්ම මිත්‍රයා මෙන්ම උදව්කරුවා දොස්තර ජෝන් වොට්සන්. අප දෙදෙනා පරීක්ෂණවල යෙදෙන්නේ එකටයි. ඒ නිසා මා වෙත පැවසිය යුතු ඕනෑම රහස්‍ය දෙයක්, ඔහුටද පවසන්න ඔබට සිදුවෙනවා. ඔබට කැමැති නම් පයිප්පය දල්වාගන්න."

"මහත්මයා. මේ ගැන මම මුලින්ම ගියේ ස්කොට්ලන්ඩ්යාඩ් පොලීසියට" අමුත්තා කීය. "ඔවුන් මගේ පැමිණිල්ල ලියාගත්තා. සතියක් ගතකරලා ඔවුන් කියනවා, ඔවුනට කරන්න දෙයක් නැහැලු. මේ වගේ අවුලක් විසඳන්න කාලය තිබෙන්නේ, පෞද්ගලික රහස් පරීක්ෂකයන්ට පමණලු. ඒ නිසා ඔබ හමුවෙලා බලන්න කිව්වා. මෙවර මට එහෙම කිව්වේ ස්කොට්ලන්ඩ්යාඩ්හි ස්ටැන්ලි හොප්කින්ස් නම් මහත්මයා."

"උදව්කර ගත හැකි හෝඩුවාවන් එපමණ නැති වෙලාවට, ඒවා කාලය ගතකරන්න හොප්කින්ස්ල හරි කම්මැලියි. ඉතින් ඔය සිද්ධිය, සම්පූර්ණ විස්තරයක් සමග ඔබේ ගැටලුව මට කියන්න මහත්මයා."

"හෝම්ස් මහත්මයා. මගේ නම රැල්ෆ් ඇඩම්ස්. මගේ වයස අවුරුදු විසිහතයි. මං තවමත් අවිවාහකයි. සීමාවාසික පුහුණුව අවසන් කිරීමෙන් පසු, මම සාන්ත මයිකල් රෝහලට බැඳුණා. එහි රිචඩ් මාෂ් නම් කායික වෛද්‍ය විශේෂඥයා යටතේයි මං සේවය කරන්නේ.

මගේ පියා ඉංග්‍රීසි ජාතිකයෙකු වුණත්, මගේ මව දකුණු අප්‍රිකානු ජාතික කාන්තාවක්. මගේ පියා තරුණ කාලයේම දකුණු අප්‍රිකාවට ගිහිං ඩිවිලියර්ස් දියමන්ති සමාගමෙයි සේවය කළේ. ඒ නිසා මගේ ළමා කාලය ගෙවුණේත් එහිදී. මගේ පියා සෑහෙන තරම් ධනයක් උපයාගෙන එංගලන්තයට ආවා. ජීවත්වීම සඳහා මට රැකියාවක් කිරීමේ අවශ්‍යතාවයක් නැහැ. නමුත් මම වෛද්‍ය වෘත්තියට කැමතියි. මගේ එකම අරමුණ දුප්පතුන් සඳහා නොමිලයේ ප්‍රතිකාර ලබාදෙන රෝහලක් පිහිටුවීම. රෝහලේ රාත්‍රී සේවය නොතිබුණොත්, එදාට මගේ රාජකාරි අවසන් වෙන්නේ හවස හයට. මගේ විවේක කාලයේදී මා කරන්නේ නාට්‍ය නැරඹීම.

මේක සිදුවුණේ මීට සතියකට කලින්. එදා වැඩ අවසන්කර ගෙදර පැමිණි පසු මට හිතුණා නාට්‍යයක් නරඹන්න යන්න. ඒ සඳහා හැඳ පැළඳගෙන මං ගෙදරින් පිටත්වුණා. කුලීරියක් කැඳවා මං රියැදුරාට කිව්වා "ක්වීන්ස්" නෘත්‍යශාලාව වෙත මා ගෙනයන ලෙස. මං කුඩා කාලයේ සිටම ලස්සනට අඳින්න පළඳින්න කැමැති කෙනෙක්. උත්සව අවස්ථාවලට මගේ එක අතක මං මුදු දෙකක් පළඳිනවා. ඒ දෙකම දකුණු අප්‍රිකාවේ පතල්වලින් ලැබුණු වටිනා දියමන්ති. ඒවා කුඩා කාලයේ සිටම මා ළඟ තිබුණා. ඒ නිසා මට නම් ඒවා වටිනා වස්තූන් කියා කවදාවත් හිතුණේ නැහැ. මීට අමතරව, මගේ පියාට ස්විට්සර්ලන්ත ආදිපාදවරයෙකුගෙන් තෑගි ලැබුණු රත්රන් ඔරලෝසුවක්, මපියා මට තෑගි කළා. ඒකත් මං නිතර පාවිච්චි කළා. නාට්‍යය නැරඹීම සඳහා මම "ඩ්‍රෙස් සර්කල්" කොටසේ සැපපහසු අසුනක් තෝරාගෙන හිඳගත්තා.

නාට්‍යය නම් කිසිසේත් සිත් ඇදගන්නාසුලු එකක් වුණේ නැහැ. එය නැරඹීමට ඒ තරම් සෙනගක් පැමිණ සිටියේත් නැහැ. තිරය ඉක්මනින් විවෘතවී නාට්‍යය ඇරඹුණා. නමුත් නළුනිළියන්ගේ රඟපෑම් පවා තිබුණේ ඉතා පහළ මට්ටමක.

මේ නාට්‍යය නැරඹීමට ඒමෙන් මං කළේ මොන මෝඩකමක්ද කියා, මං පසුතැවෙමින් සිටියේ. මට හිතුණේ අසුනෙන් නැගිට පිටවී යන්නයි. ඔන්න එතකොටම මගේ අවධානය වෙනත් පැත්තකට ඇදගන්නා යමක් සිදුවුණා. ඒ, නාට්‍යයට ප්‍රමාදවී ආ දෙදෙනෙක් මගේ ළඟින්ම අසුන් ගැනීම. එක් අයෙක් සුවිශේෂ පෙනුමක් තිබූ පිරිමියෙක්. අනෙකා ඉතාම රූමත් තරුණියක්. පිරිමියා ටිකක් වයස්ගතයි. ඔහුට තිබුණේ කොටට කැපූ පැසුණු කොණ්ඩයක්. ඔහුගේ මුහුණේ උඩු හෝ යටි රැවුල් කිසිවක් තිබුණේ නැහැ; සම්පූර්ණයෙන්ම රැවුල් මුඩුකර තිබුණා. අඩි හයක් පමණ උස්වුණු ඔහු, පුළුල් උරහිස් තිබූ හැඩිදැඩි පුරුෂයෙක්. ඔහු අසුන වෙත ඇවිද ආ හැටි මට මතකයි. කඳ කෙළින් තබාගෙන බරට අඩි තබමින් ඔහු ඇවිද ආවේ, අවුරුදු හැටක කෙනෙකුට වඩා, අවුරුදු විසිපහක ඉලන්දාරියෙකුගේ ගමනින්.

ඔහු සමග පැමිණි කාන්තාවත් උසයි, කෙට්ටුයි. ඇයට තිබුණේ රන්වන් පැහැති කෙස් වැටියක් සහ පැහැපත් සමක්. ඇගේ දෙනෙත් දම් පැහැති බව මට පසුව දකින්න ලැබුණා. කාන්තාවන්ගේ ඇඳුම් පැළඳුම් ගැන මට එච්චර දැනුමක් නැහැ. ඒ නිසා ඒවා විස්තර කරන්න අමාරුයි. නමුත් ඇය හැඳ සිටියේ කළුපාට ලේස් ගවොමක් කියා මම විශ්වාස කරනවා. ගවොමට උඩින් ඇය, ඔපෙරා-කබායක් හැඳගෙන සිටියා. එය වටිනා ලෝමවලින් නිමවූ එකක් බව මං දුටුවා. ඊට අමතරව ඇගේ අතේ තිබුණා ප්‍රමාණයෙන් විශාල පිහාටු අවානක්.

මේ තරුණිය ඇවිත් හිඳගත්තේ, මා ළඟින්ම තිබූ හිස් අසුනේ. ඇය අතේ තිබූ නෘත්‍ය- දෙනෙතියෙන්, ඇය නාට්‍යය නරඹන්නට පටන්ගත්තා. ඇය එමගින් කළ නිරීක්ෂණ යොදාගත්තේ, නළු නිළියන්ගේ රඟපෑම්වල අඩුපාඩු විවේචනය කිරීමට. මඳවේලාවක් ගතවෙද්දී මට හිතුණේ රඟපෑම ගැන, ඇයටත් යම් දැනුමක් තිබුණු බවයි.

නාට්‍යයේ රඟපෑම් මෙන්ම වේදිකා කළමනාකරණය තිබුණේ ඉතාම අයහපත් තත්ත්වයේ. මේ කරුණු නිසාම තරුණියගේ සිතේ නාට්‍යය ගැන උදෙ‍්‍යාගයක් ඇතිවී තිබුණා. නළු නිළියන්ගේ රඟපෑමේ තිබූ අඩුපාඩු ඇය නොනවත්වාම කිව්වේ ඇය ළඟ සිටි මහත්මයාටයි. ඊට පිළිතුරු ලෙස ඔහුත් යම් යම් දේ කිව්වා. මඳ වේලාවක් ගතවෙද්දී මට හිතුණේ, මේ නම් නිසැකවම පියෙකු හා දියණියක කියලයි.

එපමණක් නොවෙයි. ඔවුන් එකිනෙකාට දැඩිව ආදරය කළ අය බැව් පෙනුණා.

මං කියන මේ කරුණ ඇසුවාම ඔබට සිනහත් පහළ වේවි. මේ වෙනකොට මගේ හිතේ දැඩි උද්‍යෝගයක් ඇතිවී තිබුණේ, මා නරඹන්න පැමිණි නාට්‍යය වෙත නොවෙයි. මගේ සම්පූර්ණ අවධානය යොමුවුණේ, නාට්‍යය නැරඹීමට පැමිණ සිටි මේ ජෝඩුව වෙතයි. තරුණිය නම් ඕනෑම තරුණයෙකුගේ සිත තදින්ම ආකර්ෂණය වෙන ආකාරයේ සුරූපිනියක්. මගේ සිත ඇය වෙත ඇදී ගියේ, ඒ සුරූපී බව නිසා පමණක්ම නොවෙයි. ඇය එතැනට පැමිණ, මා දුටු මොහොතේ පටන්ම, මා ඇගේ වසඟයට ගන්න ඇය සමර්ථ වුණා. දැන් මට හිතෙන්නේ එහෙමයි. ඇය සතුව තිබුණා යම් අදෘශ්‍යමාන බලවේගයක්. එමගින් මා පාලනය කිරීමට ඇයට හැකිවුණා කියලයි මං හිතන්නේ. කාරණා නිරීක්ෂණයටත්, ඒ මගින් යම් නිශ්චිත නිගමනයන්ට ඒමටත්, මට තිබූ හැකියාවට ඒ වෙලාවෙ මොනවා වුණාද මං දන්නේ නෑ.

තමන්ගේ අතේ තිබූ පිහාටු–අවාන, ඊළඟ මොහොතේ ඇය බිම දැම්මා කියලයි මට හිතුණේ. ඉතින් මං එය අහුලා ඇය අතට දුන්නා. ඒ මොහොතේ ඇගේ දම් පැහැයට හුරු නිල් පැහැති දෙනෙත් සම්පූර්ණයෙන්ම මා වෙත යොමු කරගෙන තිබියේ, මගේ මොළය අවුල්කරමින්.

එක් ජවනිකාවක් අවසන් වී විවේක කාලයක් ලැබුණා. එවිට අයිස්ක්‍රීම් අලෙවිකරන වෙළෙන්දෙකු අප අසලට ආවා.

"ඔබ අයිස් ක්‍රීම් එකක් කනවද?" තරුණිය විමසුවේ ඇය අසල සිටි මහත්මයාගෙන්. එසේ නොකන බවට ඔහු හිස සොලවා සංඥා කළා. ඊළඟට ඔහු වෙළෙන්දාගෙන් අයිස්ක්‍රීම් එකක් මිලට ගෙන ඇයට දුන්නා.

"මේක කන්න රෙජිනා" ඔහු කිව්වා. "එතකොට ඔබේ පිපාසය අඩුවේවි."

එයට සිනාවක් පෑ ඇය පුටුවේ පිටුපසට හේත්තුවී අයිස්ක්‍රීම් රසවින්දා.

මං වරින්වර ඇය දෙසට නෙත් යොමුකළ බව ඇත්තයි. නමුත් එහෙම කරද්දී, ඇයට අසුනොවීමට මං පරෙස්සම් වුණා. මේ අතරේ එක්වරක් මං ප්‍රේක්ෂකාගාරයේ ඈත කෙළවර දෙසට නෙත් යොමුකළා. එවිටයි මං දුටුවේ, තරුණිය සමග සිටි අර පුද්ගලයා මා



"නාට්‍යයට ප්‍රමාද වී ආ දෙදෙනෙක් මගේ ළඟම
අසුන් ගත්තා......."

දිහා බලාගෙන හිටියේ ඇසිපිය නොහෙළා. ඔහුගේ ළංව පිහිටි කළු දෙනෙත් මා වෙත යොමුවී තිබුණා. ඒ මාව තියුණු පරීක්ෂණයකට ලක් කරන ආකාරයෙන්. ඔහුගේ මුහුණේ තිබුණේ කුරිරු බැල්මක් කියලයි මට හිතුණේ. ඔහුගේ ක්‍රියාව මා දුටු බැව් දුටු වහාම, ඔහු අහක බලාගත්තා. මගේ සිතේ ඔහු ගැන ඇතිවුණේ, පිළිකුල් සහගත භය මුසු හැඟීමක්. විෂඝෝර සර්පයෙකු දෙස බැලීමෙන් කෙනෙකුට ඇතිවෙන හැඟීම් තමයි, ඔහු දෙස බැලීමෙන් මගේ හිතෙත් ඇතිවුණේ.

තිරය විවෘතවී නාට්‍යය යළිත් ඇරඹුණා. මේ වෙනකොට මගේ අවධානය සම්පූර්ණයෙන්ම ඔවුන් වෙත යොමුවෙලා. මඳ වේලාවක් යද්දී ඇයගේ වැඩිහිටි මිත්‍රයා, ඇය දෙසට නැඹුරුවී යමක් කොඳුරන ආකාරය මං දුටුවා. ඇයගේ දෑත් වෙවුළා ගියා. ඇගේ අතේ තිබූ දෙනෙතිය අතින් ගිලිහී උකුල උඩට වැටුණා. ඔහු දෙසට හැරුණු ඇය යමක් කීවේ කැලඹුණු අයුරෙන්. ඒ කුමක්ද කියා මට ඇහුණේ නෑ.

"මං එළියට ගියොත් මීට වඩා පහසුවක් දැනේවි" ඔහු කීවේ ඇයට පිළිතුරු වශයෙන්. "හිත නරක් කරගන්න එපා. ඇඟට සනීපයක් දැනුණු හැටියෙම මං ආපහු මෙතනට එන්නම්"

අසුනෙන් නැගී සිටි ඔහු, ළඟම තිබූ පිටවීමේ දොරටුවක් වෙත ගියා. ඔහු එහෙම යද්දී මං හැරී ඔහු දෙස බැලුවා.

"ඔහු අසනීපවෙලා වත්ද?" මගේ හිතට නැඟුණු සිතිවිල්ල එයයි. ඒ බවක් ඔහු වෙතින් පෙනුණෙ නම් නෑ. කැලඹීමට පත් තරුණියගේ දෑත් වෙවුළන අයුරු නම් මට දකින්න ලැබුණා.

පිටවෙන දොරටුව වෙත ළඟාවුණු ඔහු ආපසු හැරී තරුණිය දෙස බැලුවා. ඔහුගේ දෙනෙත්වල තිබුණේ හොර බළලෙකුගේ පෙනුමක්. ඔහු ගැන ඇතිවූ පිළිකුල් සහගත හැඟීම යළිත් වරක් මගේ සිතේ ඇතිවුණා.

නාට්‍යය රඟදැක්වීම දිගටම සිදුකෙරුණා. නමුත් තරුණිය තවදුරටත් එය නැරඹුවේ නැහැ. ඇය පුටුවේ පිටුපසට හේත්තුවී බලාගත් අතේ බලාගෙන හිටියා. ඔහු පිටවී ගිය දොරටුව දෙස ඇය වරින්වර බැලුවේ නොඉවසිල්ලෙන්. ඉන්පසු සුසුමක් හෙළූ ඇය දෙනෙත් පහතට යොමුකරගත්තා.

කාලය ගතවී ගියා. එහෙත් වයසක මහත්මයා ආපසු අසුනට ආවේ නෑ. නොඉවසිලිමත් බවක් පළකරමින් වරක් ඇය අසුනෙන් නැගිට්ටා. යළිත් වරක් ඇය අසුනේ හිඳගත්තේ, ආයාසයක් දරා හිත පාලනය කරගනිමින් බව මං දුටුවා.

මං උත්සාහ කළේ ඇයගේ හැසිරීම ගැන, මං උනන්දුවක් නොදක්වන බව පෙන්වන්නයි. නමුත් හදිසියේ එක්වරක් අපේ දෙනෙත් එකින් එක හමුවුණා. ඇගේ දෙනෙත්වල මා දුටුවේ දුක්ඛදායක කැලඹිලි බවක්. ඒ දැකීමෙන් මා ඇය වෙතට නැඹුරු වුණේ නිරායාසයෙන්.

"ඔබ සමග ආ තැනැත්තා ගැන ප්‍රශ්නයක් ඇතිවෙලාද ඔබ ඉන්නේ?" මං ඇහුවා. "මට කළ හැකි දෙයක් තිබෙනවාද?"

"ඔබට ස්තුතියි මහත්මයා" ඇය කිව්වා. "ඒ වයසක මහත්මයා මගේ තාත්තා. මං හිතන්නේ ඔහු අසනීපෙන්. මගේ මොළය අවුල්වෙලා තියෙන්නේ ඒ නිසා."

"ඔහු ආපහු ආවෙ නැත්තෙ ඇයි කියා හොයා බලන්න උවමනාද?" මං ඇහුවා. "ඔබට උවමනා නම් මං ගිහින් ඒ ගැන විමසා බලන්නම්."

"ඔබට එවැනි දෙයක් කළ හැකි නම් ඒක ලොකු උදව්වක්"

මං වහාම අසුනෙන් නැගිට්ටා. ප්‍රේක්ෂකාගාරයෙන් පිටවී මං රංගශාලාවේ ආලින්දයට ගියා. කබා එල්ලාතැබීම සඳහා තිබූ කාමරයේ සේවකයාගෙන් මං විමසුවා.

"සුදුපාට හිසකෙස් ඇති තරමක වයසක මහත්මයෙක් මෙහි ආවද? නාට්‍යය නරඹමින් ඉඳලා ඔහු පිටවෙලා ආවෙ, මීට පැය බාගයකට කලින්. ඔහුගේ දුව ඉන්නවා ප්‍රේක්ෂකාගාරය ඇතුළේ. තාත්තට අසනීපයක්ද දන්නෙ නැහැ කියල ඇය හොඳටම භයවෙලයි ඉන්නෙ."

ඒ කාමරය භාරව හිටී සේවකයා වයසක මහත්මයා ගැන කිසිදෙයක් දැනහිටියෙ නෑ. නමුත් ඒ අසල හිටි සේවිකාවකට මා කියූ දේ අහන්න ලැබිලා මෙහෙම කිව්වා.

"ඔබ ඔය කියන්නේ කවුරු ගැනද කියලා මං හිතන්නේ මං දන්නවා. ඔහුට අසනීපයක් නෑ"

"ඔබ කොහොමද ඒක දන්නෙ?" මං ඇහුවා

"ඔබ ඔය කියන විදියෙ වයසක මහත්මයෙක් ප්‍රේක්ෂකාගාරයෙන් එළියට ආව නේන්නම්. ඒ මීට පැය භාගයකට විතර කලින්. ඔහු ආවේ "ඩ්‍රෙස් සර්කල්" පැත්තේ දොරටුවකින්. ඔහු එළියට ආ ගමන් ඉල්ලුවේ සුරුට්ටුවක්. ඔහු ඒක දල්වාගත්තා. ඊට පස්සෙ ඔහු මොකද කළේ කියල මං දුටුවේ නෑ. මම හිතන්නේ ඔහු යන්න ගියා කියලයි."

මං වහාම ආපහු ගිහින්, සිතේ කැලඹීමෙන් සිටි තරුණියට ඒ තොරතුරු ඇනුම් දුන්නා. ඒ පුවතින් ඇය කොහොමටවත් සෑහීමට පත්වුණේ නැහැ.



"සුදු පාට හිසකෙස් ඇති තරමක වයසක මහත්මයෙක්
මෙහේට ආවද?"

"තාත්තට හොඳටම අසනීප ඇති" ඇය කිව්වා. "එහෙම නොවුණා නම් මාව තනියෙන් මෙහේ දාල ඔහු යන්නේ නෑ. ඔහුට ඒ ආබාධය වැලඳීගෙන එන බව මට තේරුණා. මේ අසනීපයේ බරපතළ තත්ත්වයන්ට ඔහු වරින්වර මුහුණදෙනවා. එවිට වලිප්පුව සෑදුණා වගේ, ඔහුගේ මුළු ශරීරයම ගැහෙන්න පටන්ගන්නවා. ඒ කියන්නේ තත්ත්වය හරිම භයානකයි."

"ඔහුට අසනීප වුණා නම් ඔහු කරන්නේ, ඔබට පණිවුඩයක් එවා ඔබ එතැනට කැඳවන එකයි. පිරිසිදු වාතය ආශ්වාස කරන්න ඔහු ටිකක් එළියට යන්න ඇති?"

"මං දන්නෙ නෑ. සමහරවිට එහෙම වෙන්නත් ඇති" ඇය කීවා.

"ඔබත් මෙහි දමල යම් විධියකින් ඔහු ගෙදර ගියා කියල හිතමු. එහෙම නම් ඔහු කරන්නේ වෛද්‍යවරයෙකු ගෙදරට කැඳවා ගැනීම. එහෙම නේද?" මං ඇහුවා.

ඇය හිස සෙලෙව්වේ එසේ නොවන බව හඟවමින්.

"මගේ තාත්තද?" ඇය ඇහුවා. "වෛද්‍යවරයෙකු කැඳවන එක නම් ඔහු කොහොමටවත් කරන්නෙ නෑ. වෛද්‍ය වෘත්තියේ අය ඔහුට පෙන්වන්න බෑ. ඔවුන් ගැන කිසිම විශ්වාසයක් නෑ. කොයි වෙලෙත් කියන්නේ; වෛද්‍යවරයෙකුගෙන් උපදෙස් ගන්නවාට වඩා මැරෙන එක හොඳයි කියලයි."

"ඒක හරි කණගාටුවට කරුණක්" මං කිව්වා. "ඔහුට තිබෙන අසනීපය වැනි රෝග තත්ත්වවලදී, වෛද්‍යවරුන්ට ලබාදිය හැකි සහනය අප්‍රමාණයි. නමුත් ඒක කරන්න පුළුවන් වෛද්‍ය විද්‍යාව හරි හැටි ඉගෙන ගෙන ඒ ගැන, අවබෝධයක් ලැබූ කෙනෙකුට පමණයි."

මං මෙහෙම කිව්වාම ඇය ඇසිපිය නොහෙළා මා දිහා බලාගෙන හිටියා. මට පෙනුණා ඇය තරුණ තැනැත්තියක බව. මුහුණේ පිළිබිඹු වුණේ ඇඩි කම්පාවට පත් තත්ත්වයක්."

"දැන් මං මොනවා කරන්නද කියලා මට හිතාගන්නවත් බෑ" ඇය කිව්වා. "ඒ මොකද මේ ලෝකෙ මට ඉන්න එකම නෑදෑයා මගේ තාත්තා විතරයි. ඔහුගේ එකම දරුවා මම. මං දන්නවා ඔහු බරපතළ ලෙස අසනීපෙන්. මං දැන් මොකද කරන්නේ?"

අපේ මේ කතාබහ කෙරුණේ බොහොම පහත් ස්වරයකින්. ඒ නිසා රඟහලේ සිටි කාටවත් ඒකෙන් හිරිහැරයක් වුණේ නෑ. මුහුණු එකට ළං කරගෙනයි අපි කථාකළේ. ඇගේ රන්වන් පැහැ කෙහෙරැළි මගේ මුහුණෙත් වදින්න ඇති.

"මේක තවත් ඉවසා දරාගන්න මට පුළුවන් කමක් නෑ" ඇය එක්වරම කිව්වා. "මං යන්න ඕනෑ එළියට. නාට්‍යය ඉවරවෙනතුරු මට බලාගෙන ඉන්න බෑ."

අසුනෙන් නැගී සිටි ඇය ප්‍රේක්ෂකාගාරයෙන් පිටවෙද්දී, මං ඇය පසුපස ගියා. අපට දකින්නට ලැබුණේ, නාට්‍යය නැරඹීමට පැමිණි කිසිවෙකු ආලින්දයේ නොමැති බවයි. ඇයට කාරණා පහදා දීමට හැකිදැයි මං උත්සාහ කර බැලුවා.

"ඔබ හරිම සංවේදී කෙනෙක්. ඒ නිසා අනවශ්‍ය ලෙස කලබල වෙලා" මං කිව්වා. "ඔබේ පියා අකමැති වෛද්‍ය වෘත්තියේ යෙදෙන කෙනෙක් මම. ඔබ හිතන්නේ ඔහු බරපතළ ලෙස ආබාධයකට ගොදුරු වෙලා කියලයි. එහෙම කෙනෙක්, යන ගමන නවත්වා සුරුට්ටුවක් දල්වා ගැනීම කොහොමටවත් කරන්නේ නෑ. ප්‍රේක්ෂකාගාරයෙන් පිටවී යද්දී ඔහුගේ හැටි, මට ඉතාම හොඳට දකින්න ලැබුණා. ආබාධයකට ලක්වූ බවක් ඔහු වෙතින් දිස්වුණේ නෑ. රෝගී බවක සලකුණු තියෙනවා නම්, ඒක අනෙක් කාටත් වඩා කලින්ම දකින්න ලැබෙන්නේ වෛද්‍යවරයෙකුට. එහෙම දෙයක් මං දුටුවේ නෑ."

"ඔබට හිතෙන්නේ එහෙමද?" ඇය ඇසුවා. "තාත්තාට අසනීපයක් නොතිබුණා නම්, ඔහු මේ විදියට මාව මෙහි තනිකර දමා යාවි කියා ඔබ හිතනවාද?"

එයට දියහැකි පිළිතුරක් මගේ හිතට ආවේ නැහැ. ඇය කියූ කාරණයත් ඇත්තයි. මේ තරම් රූමත් තරුණ දියණියක්, රාත්‍රි කාලයේ රඟහලක තනිකර යාවිද තාත්තා කෙනෙක්.

"අනික ඔබ කොහොම දන්නෙ?" ඇය ඇසුවා. "සුරුට්ටුව දල්වාගත් පුද්ගලයා මගේ තාත්තා නොව, සුදු හිස කෙස් තිබූ වෙනත් කෙනෙකු විය හැකියි.

මං වහාම ගෙදර යන්න ඕන. මේ තත්ත්වය විඳ දරාගන්න මට කොහොමටවත් බෑ. මං ගෙදර යන්න ප්‍රමාදවෙලා මගේ තාත්තා මියගිහින් තිබුණොත්? ඔහු ආපහු ගෙදර නොගියා වෙන්නත් පුළුවනි. දැන් මං මොකක්ද කරන්නෙ? තාත්තා තමයි මගේ මුළු ලෝකයම. ඔහු මියගියොත් මට පිස්සු හැදේවි. නැත්නම් හෘදයාබාධයක් හැදිලා මාත් මියයාවි."

"ඔබ භීතියට පත්වෙලා ඉන්නේ හරිම අනවශ්‍ය විදියට" මං කිව්වා. "නමුත් මේ වෙලාවේ ඔබට කරන්න තියෙන හොඳම දේ

ආපහු ගෙදර යන එකයි. ඔබගේම අශ්වකරත්තයක් තියෙනවාද? මං බලන්නද කුලීරියක් කැඳවාගන්න පුළුවන්ද කියලා?"

"මටත් තාත්තාටත් අයත් පෞද්ගලික රථයක් තිබෙනවා. සමහරවිට ඒක තවමත් ඇවිත් නැතුව ඇති. ඒක හඳුනාගන්න ඔබට බැරිවේවි. ඒ හින්දා මාත් එන්නම්. අපි දෙන්නාම ගිහින් බලමු."

"එහෙනම් මගේ අතින් අල්ලාගන්න" මං ඇයට කිව්වා. මගේ අවංක උවමනාව වුණේ ඇයට උදව්කරන්නයි. මං ඇය පහළට කැඳවාගෙන ගියා. පෞද්ගලික රිය මඳක් ඈතින් නවත්වා තිබුණා. එය ආපසු ඇවිත් තිබුණේ, හොඳ වෙලාවට. ඒ මොකද නාට්‍යය අවසන්වීමට නියමිතව තිබුණේ තවත් පැයකින් පමණ. කරත්තයට නැගීමට මං ඇයට උදව් කළා. ඇගේ මුහුණ සුදුමැලි වී ඇති හැටි මං ගෑස් එළියෙන් දුටුවා.

"ඔබට උවමනා නම් මට පුළුවනි ඔබ ගෙදරට ඇරලවන්න?" මං ඇහුවා. "මං ඒක සතුටින් කරන්නම්."

"ඔබ එහෙම කරනවා නම් ඒක මොනතරම් කරුණාවන්ත කටයුත්තක්ද" ඇය කිව්වා. "අනික ඔබ කිව්වා නේද ඔබ වෛද්‍යවරයෙක් කියලා? මගේ තාත්තා අසනීපයෙන් නම්, ඔබට හැකිවේවි ඔහුට මොනවා හරි ඖෂධයක් නියමකරන්න"

"මට බය තියෙන්නේ ඔහු ඒකට ඉඩ දෙන එකක් නැහැ කියලයි. වෛද්‍යවරුන් ගැන ඔහුගේ හිතේ විශ්වාසයක් නැහැ කියල ඔබම නේ කිව්වෙ"

"ඒක ඇත්තයි" ඇය කිව්වා. "නමුත් ඔහු මෙම ආබාධයට ලක්වුණාම දිගු කාලයක් ඔහු ඉන්නේ සිහිසන් නැතුව. අනේ මාව ගෙදර එක්ක යන්න මහත්මයා. ඔබ දොස්තර......"

"රැල්ෆ් ඇඩම්ස්" මං පිළිතුරු දුන්නා.

"මගේ නම රෙජිනා - රෙජිනා. බේකර්. ඇඩම්ස් දොස්තර මහත්මයා. කරුණාකර මා සමග එන්න. ඔබට පුළුවන් නම් මගේ තාත්තට කළයුතු ප්‍රතිකාරයක් නියම කරන්න."

"ඔබ සමග ඒම මට සතුටක්" කී මම අශ්වකරත්තයට නැඟුණා. ඇය පැත්තකට වී ඇය අසලින්ම මට ඉඩදුන්නා. මීළඟට රියදුරා කුඩා කවුළුව විවෘත කළා. ඒ අශ්වකරත්තය පැදවිය යුතු තැන ගැන විමසීමට.

"කොහේට යන්න කියලද මං ඔහුට කියන්නේ?" මං ඇයගෙන් විමසුවා.

"ආපහු යන්න කියන්න" ඇය වහා පිළිතුරු දුන්නා.

"ආපහු යන්නලු!" මං කෑගසා රියැදුරාට කිව්වා.

කවුළුව වසා දැමූ ඔහු රිය ඉදිරියට ගත්තේ වේගයෙන්. මං ගිය ගමන ගැන මගේ මොළයට ආවේ, සෑහෙන වේලාවකට පසුවයි. මං මේ අශ්වකරත්තයක රාත්‍රියේ යමින් සිටියේ, මං කිසිසේත් නොහඳුනන තරුණියක සමග. ඒ මං කිසිසේත් නොදන්නා තැනකට. අඩුම වශයෙන් එතැන ලිපිනයක්වත් මං දැනගෙන හිටියේ නෑ.

එය තරුවලින් එළිය වූ රාත්‍රියක්. රෑ හමා ආ සුළඟේ තිබුණේ සුවදායක බවක්. මුලින්ම අප ගමන්කළේ පිකැඩලිය හරහා. ඊළඟට අපි හයිඩ්පාක් කෝනරය පහුකළා. ඊටපසු සාන්ත ජෝජ් රෝහලට බටහිරින් පිහිටි මාවතක ගමන් කළා. ඉන්පසු අපි කෙළවරක් නැති චතුරශ්‍ර, මංසන්ධි පසු කරමින් ඉදිරියට ගමන් කළා. මේ වෙනකොට ඇය යළිත් වරක් සැනසුණු සතුටු සිතකින් කථා කළා.

"මං දන්නෙ නෑ ඔබට කොහොම ස්තූති කරන්නද කියල. ඔබට මං කොයිතරම් ණය ගැතිද කියන එක වචනයෙන් විස්තර කරන්න බෑ"

"ඕක සුළු දෙයක්" මං කිව්වා.

"එහෙම කියන්නෙ කොහොමද?" ඇය කීවා. "ගැහැනු ළමයෙකුගේ හිතේ ඇතිවෙන අවුල් සහගත තත්ත්වයක්, වෙන කෙනෙක් නම් තේරුම් ගන්න එකක් නෑ. අනුකම්පා කරන එකකුත් නෑ. ඇඩම්ස් දොස්තර මහත්මයා. ඔබ මෙහෙම ආවට නාඳුනන කෙනෙකු ගැන විශ්වාසය තියලා, මේ විදියට යන්න වෙනත් කෙනෙකු නම් එන එකක්වත් නැහැ."

"වෙනත් ඕනෑම වෛද්‍යවරයෙකු කරන දේ තමයි මං කළෙත්" මං කිව්වා. "ඔබ සමහරවිට දන්නෙ නැතුවත් ඇති. තමන්ගේ උතුම් වෘත්තියට ගරු කරන ආදරය කරන වෛද්‍යවරයෙක්, ලෙඩෙකුට පිහිට වෙන්න පසුබට වෙන්නෙ නෑ. තමන්ට යන්න වෙන්නෙ කොහේටද, ඒ දවසෙ කොයි වෙලාවටද කියන දේට, ඔහු තැකීමක් කරන්නෙත් නෑ. තමන්ගේ පෞද්ගලික දේවල් ඉවතට දමලා රෝගියෙකුගේ පිහිටට යන්න, අප බැඳී සිටිනවා. ඉතින් මං කොහොමද ඔබේ ඉල්ලීම ප්‍රතික්ෂේප කරන්නෙ?"

"ඔබ තමයි අපේ ගෙදරට එන පළමුවැනි වෛද්‍යවරයා" ඇය කීවා. "මට වෙලාවකට හිතෙනවා, අපේ ගෙදරට එන්න කියල ඔබට නොකිව්වා නම් හොඳයි කියල"



"ආපහු යන්නලු!" මං කෑ ගසා රියැදුරාට කිව්වා.

"ඒ ඇයි? මං දුටුවාම ඔබේ තාත්තට තරහ යාවිද?"

"නැහැ ඒක නෙමෙයි" ඇය කීවා. "ඔබ එනවනේ. එතකොට ඒකෙත් ඉවරයක් වේවි. කොහොම වුණත් ඔබේ කරුණාවන්තකම ගැන මං හැමදාමත් ණයගැතියි"

"මං හිතනවා මට පුළුවන් වේවි කියල ඔබේ තාත්තට පිහිටවෙන්න"

මං එහෙම කිව්වාම ඇගේ මුහුණ එළිය වැටුණා. "ඒකෙ සැකයක් නෑ. ඔබ හරි දක්ෂයෙක් බව පෙනෙනවා. ඔබගේ මුහුණ දුටු හැටියෙම මං දැනගත්තා ඔබ දක්ෂයෙකු බව. ඔබට තියෙනවා දක්ෂ ශල්‍ය වෛද්‍යවරයෙකුට උරුම දෑත්. ඒක මට බැලූ බැල්මටම කියන්න පුළුවනි"

"ඔබ කොහොමද එහෙම දෙයක් කියන්නෙ?" මං ඇසුවේ හඬනඟා සිනාසෙමින්. "ඒක නෙමෙයි මං ප්‍රශ්නයක් අහන්නද? අපි කොහේටද මේ යන්නෙ? ලන්ඩන් නගරයේ මේ ප්‍රදේශය කොහේද කියල, මට කොහොමටවත් අඳුනාගන්න බෑ. ඒ වුණත් ජීවිතයේ වැඩිකාලයක් මං ගතකරල තියෙන්නේ ලන්ඩන් නුවරමයි. අපි යන්නෙ උතුරටද දකුණටද නැගෙනහිරටද බටහිරටද? ඔබේ ගෙදර ලිපිනය මොකක්ද?"

"අපි යන්නේ බටහිර දෙසට" ඇය කිව්වේ බොහොම සන්සුන් හඬකින්. මීළඟට මං තවත් යමක් කියන්න කලින් ඇය යමක් කළා. ඇගේ අතේ තිබුණු පිහාටු-අවානෙන් ඇය රියැදුරා ඇමතීමට තිබෙන කුඩා කවුළුවේ පියන විවෘත කළා. ඊළඟට රියැදුරා අමතලා මෙහෙම කිව්වා.

"අපි කෙටි පාරෙන් ගෙදර යමු ඇන්ඩ්‍රූස්. දිග රවුමක් යන්න තියෙන පාරෙ යන්න එපා. අපි ඉන්නෙ ලොකු හදිසියකින්. කෙටි පාරෙන් යමු"

"ඔව් නෝනා" රියැදුරා කියනු මට ඇසුණා.

අපි ගමන් කරමින් හිටියේ පුළුල් මාවතක. රථය එක්වරම මුඩුක්කු නිවාස පිහිටි පටු පාරකට හරවනු ලැබුවා. හොඳටම රෑ වෙලා තිබුණත්, පාරෙ හරියට සෙනග හිටියා. කෑගහන ළමයින්ගෙන්, බීමත් වූ මිනිසුන්ගෙන් සහ ගැහැනුන්ගෙන්, වීදිය පිරී තිබුණා. ඒ හරියෙදි රාත්‍රියේ හමා ආ සුළගේ තිබුණේ දැඩි දුර්ගන්ධයක්.

වංශවත් පෙනුමක් තිබූ මේ තරුණ කාන්තාව පදිංචි, මේ වගේ පළාතක කියල හිතන්න පුළුවන්ද. නෑ. මේ ඇය රියැදුරාට යාමට

කිව් කෙට්පාර නේ. මඳ වේලාවකදී අප ළඟාවුණේ ජනශූන්‍ය චතුරශ්‍රයකට. රිය නවත්වනු ලැබුවේ ලොකු ගෙයක් ළඟ. එහි එකම එක පහනක්වත් දල්වා තිබුණෙ නම් නෑ. මම මුලින් රියෙන් බැහැලා බේකර් මෙනෙවියටත් රියෙන් බහින්න උදව් කළා.

"බේකර් මෙනෙවිය. ඔබේ තාත්තා ආපසු ගෙදර ආවාද කියා කරුණාකරල විමසා බලන්න." මං කීවා. "ඒ මොකද ඔහු ඇවිත් නැත්නම් මං ඔබේ නිවසට පැමිණෙන එකේ තේරුමක් නෑ."

"ඕ! ඒකට කමක් නෑ. මොහොතකට ගේ ඇතුළට එන්න" ඇය කීවේ සතුටට පත් හඬකින්. "සේවක සේවිකාවන් හැම දෙනෙකුම නින්දට ගිහින් වගෙයි මට පෙනෙන්නෙ. දැන් මට සිද්ධවෙනවා අමතර යතුරෙන් දොර ඇරගෙන ගේ ඇතුළට යන්න. මං ඉක්මනට හොයල බලන්නම්, තාත්තා ආපහු ගෙදර ආවද කියන එක. මිනිත්තුවෙන් දැනගන්න පුළුවනි. ඇතුළට එන්න. මං ඒ කාරණය හොයාගෙන එනතුරු විසිත්ත කාමරයෙන් ඉන්න"

එහෙම කියද්දී ඇය මගේ මුහුණ දිහා සෘජු බැල්මක් හෙළුවා. ඇගේ පිටකබාය උරහිස්වලින් ඉවත්වෙද්දී මට දකින්න ලැබුණේ කෙට්වු අත්දෙකක්.

"ඒක නෙමෙයි. කුලී රථ නවත්වන තැනක් මේ කිට්ටුව තියෙනවද?" මං ඇයගෙන් ඇසුවේ එක්වරම. "ඒ මොකද ඔබේ පියාට ප්‍රතිකාර කරන වැඩක් අවසන් කළ වහාම මං ගෙදර යන්න ඕන. මං ඉන්නෙ ලෝකෙ මොන පැත්තකද කියන එක මට හිතාගන්නවත් බෑ."

"බටහිර පැත්තේ" ඇය කිව්වා. "ඔබට කරන්න තියෙන්නේ මේකයි. මේ පාර දිගේ ඉදිරියට ඇවිදගෙන ගිහින්, හමුවෙන පළමුවැනි හන්දියෙන් දකුණට හැරෙන්න. එවිට ඔබට දකින්න ලැබේවි කුලීරථ ගාලක්. රාත්‍රියට මගීන් ගෙනයන කුලීරථ, හැමවිටකම එතැන නවත්වලා තියෙනවා. මෙහේ වැඩ කටයුතු ඉවර කළාම ආපසු ගෙදර යන එක ඔබට බොහොම පහසුයි."

අපි දොර ඇරගෙන ඇතුළුවුණේ සාලයකට. වීදියේ හමා ආ සුළඟින් ගෙදර ඉදිරි දොර සම්පූර්ණයෙන්ම වැසුණා. ඒ එක්කම වීදියේ ගෑස් ලාම්පුවලින් ගේ තුළට වැටුණු එළිය අවහිර වුණා. අප හිටි සාලය මුළුමනින්ම අන්ධකාර වුණා.

"අපේ සේවකයින් වැඩකරන හැටි නම් අන්තිම තරකයි" බේකර් මෙනෙවියගේ කටහඬ මට ඇසුණා. "මං ඔවුන්ට උපදෙස් දීල

තියෙන්නේ, සාලෙ මේසය උඩ ඉටිපන්දම් හා ගිනිකූරු තියන්න කියලයි. ඒගොල්ල ඒ උපදෙස් අමතක කරලා. දොස්තර මහත්මයා. ඔබට එක් මොහොතකට ඉන්න වෙන්නෙ අන්ධකාරයේ. ඒකට කමක් නැහැ නේද?"

"කමක් නැහැ"

ඇය ඉක්මනින් එතැනින් පිටවී ගියා. ඇය තරප්පු පෙළේ උඩට නගින ශබ්දය මට ඇහුණා. ඇය ක්‍රමයෙන් ඉහළට නගිද්දී එම ශබ්දය ක්‍රමක්‍රමයෙන් අඩුවී ගියා. ඇය ගිනිකූරු හොයාගෙන තට්ටු ගණනාවක් ඉහළට නගිනවා වගෙයි. කිසිම දෙයක් නොදන්නා නිවසක් ඇතුළේ මං තනියම. අන්ධකාර සාලය ඇතුළේ තිබුණේ සොහොන් පිටියක වැනි නිශ්ශබ්දතාවයක්. පාරේ ගෑස් ලාම්පුවක එළියක් වත්, දොරේ ෆෑන්ලයිට් එක හරහා වැටෙනවාද කියා මං සුපරීක්ෂාකාරීව බැලුවා. එළිය කිසිවක් ඇතුළට ආවෙ නෑ. ඒ මොකද මේ ගෙදර ෆෑන්ලයිට් එකක් තිබුණෙ නෑ. ඉතින් කොහොමද ගේ ඇතුළට එළියක් එන්නෙ. කෙටියෙන් කියනවා නම්, මේක ඊජිප්තුවේ සොහොන් ගැබක් වගෙයි. එළිය තියා හුළං පොදක්වත් ගේ ඇතුළට එන්නෙ නෑ.

දිගු වෙලාවක් ගතවුණා. බේකර් මෙනෙවියට ආපහු එන්න හුගක් වෙලා ගතවෙනවා වගේ. මං ඇය එනතුරු බලාගෙන හිටියේ සිටගෙන.

එක්වරම මා පිටුපසින් කුඩා ශබ්දයක් ඇසුණා. කොහෙන්ද ඒක ආවෙ? මේ ගෙදර කල්තබා නින්දට යන සේවකයන් නිදාගන්නෙ බිම්මහලේද? වීදියට පිවිසෙන දොර ඇතැයි මට හිතුණු පැත්තට මං පැන්නා. මට ඒ දොර අහුවුණෙ නෑ. දොරේ අගුල මට අහුවුණා නම් මං ඒ දොර විවෘත කරනවා. වෙන මොකකටවත් නොවෙයි. ගේ ඇතුළට එළිය ටිකක් වැටෙන්න. කොයිතරම් අත-පත ගාලා බැලුවත් දොර අගුලක් නම් මට අහුවුණේ නෑ.

ඊළඟ මොහොතේ තරප්පුව මුදුනෙන් කනමැඳිරි ආලෝකයක් පහතට වැටුණා. එය වඩාත් තීව්‍ර වෙද්දී බේකර් මෙනෙවියගේ සායේ රැළි එකට ගැටී නැඟුණු ශබ්දයත් මට අහන්න ලැබුණා.

"මං ඔබෙන් දහස්වාරයක් සමාව අයදිනවා දොස්තර මහත්මයා" බේකර් මෙනෙවිය කිව්වේ, එක් අතකින් දැල්වූ ඉටිපන්දමක් රැගෙන පහළට ඇවිත්. "මේ අන්ධකාර සාලයේ මේ තරම් වේලාවක් ඔබ



"මං ඔබෙන් දහස්වාරයක් සමාව අයදිනවා දෙස්තර මහත්තයා"

රැඳවීම ගැන, ඔබට මොනවා හිතෙන්න ඇද්ද. පමාවට හේතුව මේකයි. මගේ තාත්තා ආපහු ගෙදර ඇවිත්ද කියන කාරණාව දැනගන්න මං හිටියේ නොඉවසිල්ලෙන්. දෙවියන්ට ස්තුතිවේවා! ඔහු ආපසු ඇවිත්. තවමත් ඉන්නේ නිදන කාමරයේ. ඔබට පුළුවන්ද මාත් එක්ක උඩුමහලට එන්න?"

ඇය ඉදිරියෙන් දිවගියා. මං ඒ පිටිපසින් ගියේ ඇගේ ඉල්ලීමට කීකරුව. හමුවුණු මුල් තට්ටුවේදීම අපි පිවිසුණේ තවත් විසිත්ත කාමරයකට. පහන් කිපයකින් එය ආලෝකමත් කර තිබුණා. මැද තිබූ මේසය මත කෑම සූදානම්ව ඇති හැටි මට දකින්න ලැබුණා.

"මොහොතකට හිඳගන්න" බේකර් මෙනෙවිය කීවා. "ඔබට කීමට යමක් දෙන්න ඕන. මොනවද මං දෙන්නෙ? ෂැම්පේන් බෝතල් අරින වැඩේ මට කවදාවත් හරිහැටි කරගන්න බෑ. සමහර විට ඔබට හැකිවේවි එය කරගන්න. මේ ජුල්ස් මම් ෂැම්පේන්. මගේ තාත්තා මෙතැන හිටියා නම් ඔහුත් කියාවි, මෙයින් ටිකක් බීල ඉන්න කියල"

"කෑම බීම මට අවශ්‍ය නෑ" මං කිව්වා. "මං කැමතියි ඔබේ තාත්තාව පරීක්ෂා කර බලන්න. ඔහුගේ අසනීප තත්ත්වය දැන් කොහොමද? මං මෙහේ ඇවිත් ඉන්න බව ඔබ ඔහුට කිව්වද?"

"නැහැ. මං කොහොමද භය නැතුව එහෙම දෙයක් කියන්නෙ? ඔහුට වෛද්‍යවරුන් පිළිකුල් බව මං ඔබට කිව්ව නේද?"

"එහෙම නම් සමහරවිට ඔහුට වෛද්‍ය වරයෙකුගෙන් ප්‍රතිකාර අවශ්‍ය නැතුවත් ඇති" මං කිව්වේ අපුනෙන් නැගිටිමින්. "මං ඔබට සුභ සන්ධ්‍යාවක් පතලා සමුගන්නම්"

"ඔන්න! ඔන්න! ඔබ ඊතට මා එක්ක කේන්ති අරගෙන." ඇය කිව්වා. "ඒකෙ පුදුම වෙන්න දේකුත් නෑ. මං ඔබව මෙතන රස්තියාදු කරනව නෙ. ටිකක් ඉවසන්න මහත්මයා! මගේ තාත්තා ඔබ ලවා පරීක්ෂා කරගන්න මට අවශ්‍යයි. නමුත් අපි ඔහු වෙත ළංවෙන්න ඕන බොහොම සැලසුම් සහගතව පරෙස්සමෙන්"

ඇය සෝපාවක සැපපහසුවට හිඳගත්තා. එක් අතක් තබාගත්තා නළලේ. ඇය ඉතාම සුන්දර යුවතියක බව මං දුටුවා. ඒ තරම් රූමත්තියක මං කවදාවත් දැකල නෑ. ඒ බව මට අවංකව කියන්න පුළුවනි. ඇය වෙත මගේ සිත ආකර්ෂණය වෙන හැඟීමක් සමගම, විකර්ෂණය වෙන හැඟීමකුත් ඇතිවුණා.

"මේ අහන්න" මං ඇයට කිව්වා. "මං මේ ගෙදරට ආවෙ අසනීපයෙන් ඉන්නවා කියූ ඔබේ පියාට ප්‍රතිකාර කිරීමටයි. මාව වහාම ඔහු ළඟට කැඳවාගෙන යන්න. නැත්නම් මට වෙන්නේ ඔබට ශුභ රාත්‍රියක් ප්‍රාර්ථනා කරන්නයි"

මං එහෙම කියුවාම ඇයට හිනා ගියා.

"සුභ රාත්‍රියක් ප්‍රාර්ථනා කිරීම බොහොම පහසුයි." ඇය පිළිතුරු දුන්නා. මීළඟට ඇගේ ස්වභාවය වෙනස් වුණා.

"ඇයි මං මේ විධියට ඔබට කරදර කරන්නේ? දොස්තර මහත්මයා. අර පුදුමාකාර දැඩි වේදනාත්මක ශරීර ආබාධයට ඔහු මේ දැන් ගොදුරු වුණා විතරයිලු. ඔහුගේ රෝග ලක්ෂණ මං හොඳින් හඳුනනවා. ඔහු මෙයට ගොදුරු වෙන බව මං දැනගත්තේ, ඔහු ප්‍රේක්ෂකාගාරයෙන් එළියට යද්දීමයි. මං හිතුවේ අප මෙහේට එද්දි ඔහු සිහි විසඥව ඉඳීවි කියලයි. නමුත් දැන් ඔහුට සිහිය ඇවිත්. ඔබ ඔහුගේ කාමරයට කැඳවාගෙන යාම දැන් මට ප්‍රශ්නයක්. ඒ මොනවා වුණත් ඔබ ලවා ඔහු පරීක්ෂා කරගැනීමත් මට අවශ්‍යයි. ඉතින් මොකක්ද ඔබ මට දෙන අවවාදය?"

ඇගේ මුහුණෙන් දිස්වුණේ දැඩි ශෝකාකුල බවක්. යළිත් වරක් මට මතක්වුණේ මා වෛද්‍යවරයෙකු බව. මා අතින් ඉටුවිය යුතු යුතුකම් හා රාජකාරි ගැන මගේ සිහියට ආවා.

"කරන්න තිබෙන හොඳම දේ මේකයි." මං කිව්වා. "ඔබේ පියාගේ කාමරයට මාව කැඳවාගෙන යන්න. වැඩි කලබලයක් නොකර මාව හඳුන්වාදෙන්න, දොස්තර ඇඩම්ස් ලෙස. මෙන්න මේ විදියේ දෙයක් වෙන්න සියයට එකක ඉඩ කඩක් තියෙනවා. සැබෑ වෛද්‍යවරයා දුටුවාම, ඔහුට තමන් හිතේ මවාගෙන ඉන්න වෛද්‍යවරු අතුරුදන් වේවි. මට පුළුවනි එක දෙයක් ගැන ඔබට සහතික වෙන්න. ඔහු ඔබට දොස් පවරන එකක් නම් නෑ"

මගේ අවවාදය ගැන බේකර් මෙනෙවිය මොහොතක් සිතාබලන බවයි මට පෙනුණේ.

"හොඳයි" ඇය එක්වරම කිව්වා. "ඔබ කියන දේ හරි අවදානම් ක්‍රමයක්. නමුත් සමහරවිට ඒක වෙන්න ඇති කරන්න තිබෙන හොඳම දේ. අපි වහාම උඩුමහලට යමු. එන්න මගේ පිටුපසින්"

ඒ නිවස ගෘහභාණ්ඩවලින් හොඳින් සම්පූර්ණ වී තිබුණා. නමුත් එය ඇතුළත හරි අන්ධකාරයි. මෙවැනි ගෙයක් හැම විටම ගෑස්ලාම්පු

රැසකින් හොඳින් ආලෝකමත් වෙනවා. මෙහි ගෑස් ලාම්පු නොමැතිවීම, අසාමාන්‍ය මෙන්ම පුදුමාකාර දෙයක් බව මට ඒ වෙලාවෙ හිතුණා. බේකර් මෙනෙවිය උඩුමහලට නැඟුණේ දැල්වූ ඉටිපන්දමත් අරගෙන.

ඊළඟ තට්ටුවට පිවිසෙන තැනදී අපි මඳකට නැවතුණා. ඇය දකුණට හැරුණාම අපි කාමරයකට ඇතුළුවුණා. ඒක තියෙන්න ඇත්තේ පහළ කෑම සූදානම් කර මේසයක් තිබූ එකට කෙළින්ම ඉහළ. මේ කාමරය ඉතාම විශාල උස් වහළක් තිබූ එකක්. ගෘහභාණ්ඩ එහි තිබුණේ පරණ මෝස්තරයේ ඒවා. මහෝගනී ලීයෙන් තැනූ වියන් ඇඳක් කාමරයේ එක් කෙළවරක තිබුණා. ඇඳුම් අල්මාරිය සහ පුටුත් ඒ විධියමයි. අපි ඇතුළුවෙද්දී කාමරය තිබුණේ අඳුරේ. එය දුරුකිරීමට අතේ ගෙනගිය කුඩා ඉටිපන්දම සමත්වුණේ නැහැ.

එය මේසයක් මත තැබූ බේකර් මෙනෙවිය කෙළින්ම ඇඳ ළඟට ගියා. දෑත් දෙපසට තබාගත් කෙනෙකු එහි වැතිරී සිටියා. ඔහු හැඳගෙන සිටියේ හැන්දෑවට අඳින ඇඳුම්. මේ තරුණිය සමග රඟහලට පැමිණි පුද්ගලයා ඔහු බව හඳුනාගන්න මට මොහොතක් ගතවුණේ නෑ. ඔහු කඩවසම් පුද්ගලයෙකු බවයි මට පෙනුණේ. මේ වෙලාවේ නම් ඔහු සිටියේ දෙනෙත් පියාගෙන. ඔහුගේ මුහුණ සුදුමැලි වී තිබුණේ, කිරිගරුඬින් නෙළූ පිළිමයක් වගේ. ඔහු වෙත ළඟාවී, ඔහුගේ සිරුරට උඩින් නැමී මං ඔහු දිහා බැලුවා. ඔහු ඇසිපියක් ගැහුවේ වත් ඇඟිල්ලක් සෙලෙව්වේවත් නැහැ.

"තාත්තේ" ඇය කිව්වා.

ඔහු ඊට පිළිතුරු දුන්නේ නැහැ.

"ඔහුට සිහි නැතිවෙලා ආයෙමත්. තත්ත්වය දැන් වඩාත් නරක අතට හැරිලා" ඇය කීවේ භීතියට පත් මුහුණෙන් මා දෙස බලමින්.

"නෑ නෑ. භයවෙන්න කිසිම හේතුවක් නෑ" මං කිව්වා.

මං මෙහෙම කිව්වේ හොඳ විශ්වාසයෙන්. ඒ මොකද මම ඒ මොහොතෙම රෝගියාගෙ අතින් අල්ලා නාඩි බැලුවා. නාඩි වැටීම සම්පූර්ණව මෙන්ම ක්‍රමානුකූලව සිදුවුණා. ඔහු වෙතට තවත් ළංවී මං පරීක්ෂා කළා. එක් සිතිවිල්ලක් මගේ හිතට ආවේ විදුලියක් කොටනවා වැනි ආකාරයට, මාව පුදුමයට පත්කරමින්. සිහි නැතිවෙනවා කියා ඔහු මේ කරන්නේ බොරු රඟපෑමක් විය යුතුයි!



"..... මම ඇඟිලි තුඩු ඇස්බෝලය මත තබා තද කළා"

ඔහු ප්‍රේක්ෂකාගාරයෙන් පිටවෙද්දී ඔහුගේ දෙනෙත්වල තිබූ දුෂ්ට බැල්ම මට යළිත් සිහිවුණා.

"ඔහු අසනීපයෙන් සිටින බවක් මට නම් පෙනෙන්නෙ නැහැ" මං කිව්වේ නාඩි පරීක්ෂා කිරීමට එසවූ අත යළිත් ඇඳ මත තබමින්. ඉටිපන්දම ඔහුගේ මුහුණ දෙසට ළං කරන මෙන් මම බේකර් මෙනෙවියගෙන් ඉල්ලා හිටියා. මෙය ඔහු සිහිවිසඥ බවට කළ රඟපෑමක් නම්, ඔහු ඒ කටයුත්ත දක්ෂ ලෙස කළා. මම ඇසිපිය ඔසවා බැලුවා. දෙනෙත් එකම විදියට නිශ්චලව තිබුණා. නමුත් ඉටිපන්දම විවෘත ඇස ඉදිරියෙන් එහා මෙහා කළාම, කණිනිකා ප්‍රතික්‍රියා කළේ සිහි විසඥ නොවූ කෙනෙකුගේ ආකාරයට. මම ඇඟිලිතුඩක් ඇස් බෝලයක් මත තබා තදකළා. ඒ වේදනාවට ඔහු ප්‍රතික්‍රියා දැක්වූවා. එය රඟපෑමක් බව තේරුම් ගන්න, ඒ ටික ප්‍රමාණවත් වුණා.

"මේ වෙලාවෙ හිත කලබල කරගන්න කිසිම හේතුවක් නැහැ." මං ශබ්ද නඟා කිව්වා. "ඔබේ තාත්තා වෙනුවෙන් මං බෙහෙත් ටිකක් සූදානම් කරන්නම්. හොඳ නින්දක් ගියාම ඔහු සාමාන්‍ය තත්ත්වයට පත්වේවි. ඔසුසලකට යැවිය හැකි කෙනෙක් ඔබ ළඟ ඉන්නවද?"

"අවශ්‍යතාවයක් තියෙනවා නම් මට පුළුවනි යන්න" ඇය කිව්වා. "සේවකයන් සියලු දෙනාම නිදා ගන්න ගිහින්"

"මේ වගේ වෙලාවක ඔවුන්ගෙන් කෙනෙක් අවදි කරගන්න ඕන නේ" මං කිව්වා. "මං බේකර් මහත්මයා ළඟ ඉන්නම්. ඔබ ගිහින් ඉක්මනට ඔබේ සේවකයෙකු අවදි කරගෙන එන්න."

"බොහොම හොඳයි" ඇය කීවේ මඳ නිහඬතාවයකට පසු. "මං ඒ විදියට කරන්නම්"

"ඔබ ඉටිපන්දම අරගෙන යන්නෙ නැද්ද?" මං විමසුවා.

"නැහැ. මට පුළුවනි කළුවරේ පාර හොයාගන්න"

ඇය කාමරයෙන් පිටවෙලා ගියේ දොර වහගෙන. ඇය පිටවී ගිය වහාම ඇස් ඇර බැලූ රෝගියා ඇඳේ හිඳගත්තා. ඔහු කළේ මා දිහා බලාගෙන ඉඳීම.

"මොකක්ද ඔබේ නම?" ඔහු ඇසුවා.

"දොස්තර ඇඩම්ස්. ඔබේ රෝගය හඳුනාගෙන ඔබට බෙහෙත් නියම කරන්න කියල, ඔබේ දුව මගෙන් ඉල්ලා හිටියා"

"රඟහලේදී අප කිට්ටුව වාඩිවෙලා හිටියෙ ඔබ නේද?"

"ඔව්"

"ඇයත් එක්ක මේ ගෙදරට එන්න කියලා, මගේ දුව ඔබෙන් ඉල්ලා හිටියද?"

"එහෙමමත් නෙමෙයි. ඇය හිටියේ ඔබ ගැන කම්පා වෙවී. එතකොට ඇය සමග මේ ගෙදරට එන්න මං කැමැත්ත පළකළා."

"අසරණ රෙජිනා" කියූ ඔහු දොර දෙස බලාගෙන ඉඳල මෙහෙම කිව්වා. "ඔබ වැනි වෛද්‍යවරයන් ගැන මගේ විශ්වාසයක් නැහැ කියල ඇය කිව්වෙ නැද්ද?"

"ඇය එහෙම කිව්වා තමයි. නමුත් දැන් ඉතින් ඔබට සනීපයි නේ. ඒ නිසා මම පිටවෙලා යන්නම්"

"නෑ. එහෙම කරන්න එපා. ඔබ මෙහේ ආවෙ ආරාධනයක් ඇතුවනේ. මං කැමතියි ඔබේ දැනුම පරීක්ෂා කරල බලන්න. මගේ අසනීප තත්ත්වයට බෙහෙත් නියම කරන්න"

"මං ඒක බොහොම කැමැත්තෙන්ම කරන්නම්" මං කිව්වා. "ඒක නොවෙයි. ඔබ සිහි විසඥවී නැති බව, ඔබ දුටු වහාම මං තේරුම් ගත්තා."

"ඒක හරි. මං හිටියේ හොඳ සිහියෙන්"

"එහෙනම් මොකද සිහි නැතිවෙලා වගේ රඟපෑමක් කළේ?"

"රෙජිනා වෙනුවෙන්. දෙවියනේ! මේක තවත් ඉවසාගන්න මට පුළුවන්කමක් නෑ.

දොරේ අගුළ දමන්න" ඔහු මට නියම කළා. "ඇයට මේ කාමරේ ඇතුළට එන්න දෙන්න එපා. මං හෘදයාබාධයකින් පෙළෙන කෙනෙක්. දෙවියනේ! මට මේ වේදනාව තවත් ඉවසන්න බෑ.

රෙජිනා මේ කිසිදෙයක් දන්නෙ නෑ. මං මේක ඇයට හංගලයි තියෙන්නෙ. මේක මීමැස්මොරය නිසා සෑදෙන වලිප්පුව හැටියටයි, මං ඇයට පෙන්වාගෙන ඉන්නෙ. මේ ඒක නෙමෙයි. අපායෙ ගින්දර වගේ වේදනාවකින් මාව පිළිස්සෙනවා. ඉක්මන් කරලා මට බෙහෙතක් නියම කරන්න. ඉක්මනට!"

"මගේ ළඟ ඒ බෙහෙත තිබුණා නම්, මං එය ඔබට දෙනවා. ඔබ ඉඩදෙනවා නම් ඔබේ සේවකයා අතේ යැවීමට මං බෙහෙත් තුණ්ඩුවක් ලියන්නම්. ඔබේ අකමැත්තක් නැත්නම් මම ම ඔසුසලට ගිහිං ඒ බෙහෙත රැගෙන එන්නම්"

"එපා එපා. කොහේවත් යන්න එපා. මේ කාමරේම නොවෙයි. පහළ තට්ටුවෙත් ඉන්න. රෙජිනා යාවි ඔබේ තුණ්ඩුවත් අරගෙන



"ඇඳේ රෙදි අල්ලාගෙන වේදනාවෙන් දඟලන්න පටන්ගත්තා"

බෙහෙත් අරගෙන එන්න. ඇය දොර ළඟට ඇවිත් ඉන්න බව මට කියන්න පුළුවනි. ඒ මට ඇහුණු ශබ්දවලින්. දොර ඇරලා ඇයව ඇතුළට ගන්න. කතා කළ යුත්තේ හොඳට හිතල බලලා. මාව පාවා දෙන්න එපා"

"මට පුළුවනි තව මොහොතකින් ඇයව ඇතුළට ගන්න" මං කිව්වා. "ඒ වුණත් ඔබ කරන්නේ වැරැදි වැඩක්. මෙවැනි දේකට ධෛර්ය සම්පන්නව මුහුණදීමට, ඇයට ශක්තියක් ඇති බව මට විශ්වාසයි. දැන් බැරි නම් පහුවෙලා හරි, ඒ කාරණය ඇයට දැනගන්න ලැබේවි. ඔබෙන් අවසර ලැබෙනවා නම්, මේ කාරණය මං ඇයට කියන්නම්. ඒක මං කියන එක වැඩිය හොඳයි"

"මේ වේදනාව ගෙන එන දේ නිසා අන්තිමේදී මං මැරෙනවා. එහෙම නේද?" බේකර් විමසුවා.

"මං ඔබට කියන්න අවශ්‍ය නැහැනේ. ඔබේ ආබාධය, බරපතළ රෝගී තත්ත්වයක්. ට්‍රයිනයිට්‍රින් ස්වල්පයකින් ඔබට ඉක්මන් සහනයක් ලැබේවි."

"මට ඇතුළට එන්න ඉඩදෙන්න" රෙජිනා කෑගසනු ඇසුණා.

"බේකර් මහත්මයා. ඔබේ රෝගය ගැන මං ඔබේ දියණියට කියන්නද? අපි කතාබස් කළ හඬ ඇයට ඇහෙන්න ඇති. ඔබට සිහිය ලැබී ඇතිබව ඇය දැනටමත් තේරුම් අරගෙන ඇති."

"මං වේදනාවෙන් සිටින බව ඇයට කියන්න" බේකර් කිව්වා. "මට යළිත් සිහිය ලැබී ඇති බවත්, ඔබ මට ට්‍රයිනයිට්‍රින් දීමට බලාපොරොත්තු වෙන බවත්.ඇයට කියන්න. දැන් යන්න. අද රෑට වෙන මොනවත් කියන්නෙ නෑ කියල මට පොරොන්දු වෙන්න"

ඒ බවට පොරොන්දු වෙලා මං දොර විවෘත කළා. ඒ සමගම බේකර් ඇඳේ රෙදි තදින් අල්ලාගෙන වේදනාවෙන් කෙඳිරිගාන්න දඟලන්න පටන් ගත්තා. දොර විවෘත කළ වහාම ඇය ඇතුළට ආවෙ සතුටෙන්.

"මගේ තාත්තට දැන් සනීපයි නේද? ඔය සිහිය ඇවිල්ලත් තියෙන්නෙ" ඇය කිව්වා.

"මොකුත් ශබ්දයක් ඇහෙන්නෙ නැතුව, කාමරේට වෙලා තනියම ඉන්න ඔහුට උවමනාලු." මං කිව්වා. "ඔහුට අඳුරේ ඉන්න ඉඩ සලස්වන එක වඩාත් හොඳයි. අපි මේ ඉටිපන්දමත් අරගෙන පහළ තට්ටුවට යමු."

ඉටිපන්දමක් අරගෙන අපි පහළ තට්ටුවට බැහැලා විසිත්ත කාමරයට ගියේ එකටම.

"බෙහෙත් ගෙන එන්න ඔසුසලට යාමට ඔබේ සේවකයා එනවද?"

"ඔව්. ඔහු මිනිත්තුවෙන් ඒවි"

"එහෙම නම් මට දෙන්න කඩදාසියක්, තීන්ත සහ පෑනක්. මං ලියන්නම්කො උවමනා කරන බෙහෙත්"

ඇය මට ඒවා ලබා දුන්නා. මං උවමනා කරන බෙහෙත ලියුවා. ඒ තමයි ට්‍රයිනයිට්‍රින් සහ එය ශරීරයට නික්ෂේපනය කිරීමට සිරින්ජයක්. ඊළඟට මං ඒ බෙහෙත් තුණ්ඩුව ඇය අතට දුන්නා. ඇය ඒකත් රැගෙන කාමරයෙන් පිටවී ගියා.

"සේවකයා පහළට එන්න හුඟක් වෙලා ගත්තා." ඇය කීවේ යළිත් කාමරයට පිවිසෙමින්. "මේ සේවකයො කිසිම අනුකම්පාවක් නැති, බොහොම හෙමින් වැඩකරන අය. නමුත් අපි එයාලට කොයිතරම් හොඳට සලකනවද"

"ඔබේ කතාව සම්පූර්ණ ඇත්ත" මං කිව්වා. "ගෙදර මහත්තයා සහ නෝනා ගෙයින් එළියට ගියාම, ඉක්මනට නින්දට යන සේවකයන් ඉන්න ගෙවල් ඉඳහිට තියෙනවා. ඒ වගේම තමයි, ගෙදර මහත්මයා බොහොම තදින් අසනීපවෙලා අසාධ්‍ය වුණත්, සමහර ගෙවල්වල සේවකයින් ඒක සලකන්නෙ නෑ. ඔවුනට උවමනා සැපට නිදියන්න"

"අසාධ්‍ය කියන වචනය කියන්න එපා" ඇය කිව්වා. "තත්ත්වය ඒ තරමටම නරක නැහැනෙ"

"අසාධ්‍ය කියන වචනය මේ වෙලාවෙ යෙදීම මං අතින්වුණු වැරැද්දක් වෙන්නත් පුළුවනි. කොහොම වුණත් ඔබේ පියාගේ රෝගී තත්ත්වයට අපි ඉක්මනින් සහනයක් සැලැස්විය යුතුයි. මං ගිහින් ඔසුසලෙන් බෙහෙත් අරගෙන එන්නම්"

"නෑ නෑ සේවකයා එනවා" ඇය කිව්වා.

කිසිවෙකු බරට අඩි තබා පියගැට පෙළ බහින ශබ්දය මට ඇහුණා. බාගෙට ඇරුණු දොර අතරින් මට පිරිමියෙකු දකින්න ලැබුණා. මගේ බෙහෙත් තුණ්ඩුව රෙජිනා ඔහු අතට දුන්නා. ඒ ඉක්මන් කරන ලෙස උපදෙස් සමග.

"දැන් ඉතින් ඒක හරි" ඇය කිව්වා. "අපි මෙහෙම බලා ඉන්න අතරේ ඔබ කැමැති තේද මොනවා හරි කන්න?"

"නැහැ එපා"

මේසයක් මත සූදානම් කර තිබුණේ කටට කෙළ උණන, වහාම ගිලදමන්න හිතෙන කෑම. අලුතෙන්ම සෑදූ සැන්ඩ්විච් තට්ටු ගණනාවක්, පොකිරිස්සන් සලාදයක් සහ තවත් රසවත් යයි සිතිය හැකි කෑම වර්ග රැසක් එතැන තිබුණා. නමුත් මෙයින් කිසිවක් ආහාරයට ගැනීම මං කෙළින්ම ප්‍රතික්ෂේප කළා. ඒ ඇයි? ඇඩි අන්ධකාරයක තිබුණු මේ ගෙදර, තරමක එළියක් තිබුණේ මේ කෑම තිබූ කාමරයේ පමණයි. මේ තරුණ කාන්තාව මා දිහා බලාගෙන හිටියේ ත්‍රාසයෙන් දෙනෙත් ඇරගෙන; ඇගේ දෙතොල් වටා තිබුණේ කැලඹීමක ලකුණු. කෑමට තිබූ ප්‍රියතාවය එයින්ම මට නැතිවෙලා ගියා.

"ඔබට පුළුවන්ද මේ ෂැම්පේන් බෝතලයක් අරින්න?" ඇය ඉල්ලා සිටියා. "පිපාසය වැඩිකමට මට ක්ලාන්තය හැදීගෙන එනවා වගෙයි. ෂැම්පේන් වීදුරුවක් වත් බිව්වොත් හොඳයි"

මං ඇගේ ඉල්ලීම ඉටුකළා. ඇය ෂැම්පේන් වීදුරුව බීගෙන බීගෙන ගියා. එයින් ඇගේ සුදුමැලි ගතිය අඩුවුණු බව මට පෙනුණා.

"ඔබ හොඳ මනුස්සයෙක්" ඇය කිව්වා. "ඔබට කරදර කරන්න සිදුවීම ගැන මට කණගාටුයි"

"ඒක සුළු දෙයක්" මං කිව්වා.

"ඔබ හිඳගන්නේ නැද්ද? නැගිටල ඉඳල ඔබට මහන්සි ඇති" ඇය කිව්වා.

පුටුවක හිඳගෙන මං කාමරය වෙත මගේ දෙනෙත් යොමු කළා.

"මේක පරණ මෝස්තරයට තැනූ පුදුමාකාර නිවසක්" මං කිව්වා. "ඔබ මේ ගෙදර පදිංචියට ඇවිත් දැන් කොච්චර කාලයක් වෙනවද?"

"මං උපන්දා ඉඳලම හිටියෙ මෙහේ. මගේ වයස දැන් අවුරුදු දහහතයි...... දොස්තර මහත්මයා....."

"ඔව්. ඇයි මොකක්ද ප්‍රශ්නේ?"

"ඔබව මෙතැන තනියෙන් දාල මං ගියාට කමක් නැද්ද?" ඇය ඇසුවා. සේවකයා බෙහෙත් අරගෙන එනතුරු මං තාත්තා ළඟට යන්නද?"

"ආ ඒකට කමක් නෑ." මං කිව්වා. ඔබේ සේවකයා ඉක්මනට ඒවි කියල මං විශ්වාස කරනවා. ට්‍රයිනයිට්‍රින් තික්ෂේපණයක් දුන්නු ගමන් ඔය අමාරු ගතිය නැතිවෙනවා."

"ඔහු ඉක්මනට ඒවි. මං උඩුමහලට යන්නම්"

"හොඳයි. උවමනා වුණොත් මට කතාකරන්න"

සිනාමුසු මුහුණින් මඳ වේලාවක් මා දිහා බලාගෙන හිටි ඇය දොර වසාගෙන පිටවුණා. දොර වටා රෙදිවලින් "පෑඩ්" කර තිබූ නිසා එයින් ශබ්දයක් නැඟුණේ නැහැ.

මා සිටි තැනම හොඳ සැපපහසු ආකාරයේ හාන්සි පුටුවක් තිබුණා. මං ඒකේ සැපපහසුවට වැතිරිලා ඇස්දෙක පියාගත්තා. මේ වෙනකොට මට මහන්සියත් නිදිමතත් දැනෙන්න පටන් අරගෙන. දැන් වෙලාව මධ්‍යම රාත්‍රියත් පහුවෙලා. මං බලාගෙන හිටියේ සේවකයා ඖෂධය අරගෙන එනතුරු. මගේ මේ පුදුමාකාර රෝගියාට, ඔහුගේ වේදනාවෙන් සහනයක් ලබාදීමයි මගේ එකම අරමුණ වුණේ.

රෙජිනා බේකර් තමන්ගේ පියාට දැඩිව ආදරය කළ කෙනෙකු බවයි මට පෙනුණේ. නමුත් ඔහු ඇයට සැලකූ පිළිවෙළ හරි නෑ. ඔහුට මොන තරම් ලොකු වේදනාවක් දැනුණා වුණත්, ඇය රඟහලේ තනියම දමල යාම වැරදියි. මේ තරම් රූමත් තරුණ ගැහැනු ළමයෙකු, රාත්‍රියේ රඟහලක දමා යාම, තාත්තා කෙනෙකුට කරන්න පුළුවන් වැඩක්ද? මෙහෙම දෙයක් කළ ඔහු ඇයි ඊළඟට සිහිවිසංඥ වුණු බවක් මවා පෑවේ? ඔහු ඇත්තෙන්ම ගොදුරු වී හිටියේ හෘදයාබාධය නිසා ඇතිවුණු වේදනාවකට. නමුත් තම දුවට පෙන්නුවේ මීමැස්මොර රෝගය නිසා වලිප්පුව සෑදුණු බව. මෙතැන මට තේරුම් කළ නොහැකි අවුල් ගොඩක් තිබුණා.

"දෙවියනේ" මං කියා ගත්තේ මටම. "මෙක වෙන්න පුළුවන්ද? මේ බේකර්ට තිබුණු රෝග ලක්ෂණ හෘදයාබාධයකට ඇතිවෙන ඒවා නොවෙයි. ඒකත් ඔහු කළ රඟපෑමක්ද?"

මගේ තිබුණු නොඉවසිලිමත් බව නිසා මං කාමරයේ ඉහළ පහළ ඇවිදින්න පටන්ගත්තා. එය ප්‍රමාණයෙන් විශාල, එමෙන්ම උස් සීලිමක් තිබූ කාමරයක්. හැම බිත්තියකම වගේ, සීලිමේ ඉඳන් පොළොව දක්වාම තිබුණේ පොත් රාක්ක. ඒවා පිරී තිබුණේ බොහොම පිරිසිදුවට දීප්තිමත් පිටකවර තිබූ පොත්වලින්. පොත් කියන්නේ සාමාන්‍යයෙන්, සිතේ සතුටක් සැනසීමක් ඇති කරන ඒවා. නමුත් කුමන හෝ හේතුවක් නිසා මේ පොත්වලින් මට එවැනි හැඟීමක් ඇතිවුණේ නෑ.

කාලය ගෙවාගන්න උවමනා නිසා මට හිතුණා, මෙයින් පොතක් අරගෙන කියවන්න. මං එහි තිබූ චාල්ස් ඩිකන්ස්ගේ මාටින් චසල්විට් පොත අතට ගත්තා. එය විවෘත කරන්න උත්සාහ කළත් එසේ කළ හැකි වුණේ නෑ. ඊළඟට මම අනෙක් පොත් පරීක්ෂා කර බැලුවා.

ඒ එකක්වත් සැබෑ පොත් නොවෙයි. අලංකාර පොත් කවර අලවා තිබූ, පොත්වල ප්‍රමාණයේ ලී කැබලි. මං හරි පුදුමයකට පත්වුණා.

මිළඟට මං අර පුටුවේ හිඳගත්තා. මේසෙ උඩ තිබූ කෑම බීමත් මගේ හිතේ කෑම රුචියක් ඇතිකළේ නෑ. ෂැම්පේන් ටිකක් බොන්නවත් මට හිතුණේ නෑ. සුරුට්ටු සහිත පෙට්ටියක් මේසය උඩ තිබුණා. නමුත් එයින් එකක් දල්වා ගන්නවත් මට හිතුණේ නෑ.

මේ වෙනකොට මේ ගෙදර කාලය ගතකිරීම ගැන මගේ හිතේ භයක් චකිතයක් ඇතිවී තිබුණා. වහාම මේ නිවසෙන් පිටවී යායුතුයි කියන හැඟීම, මගේ හිතේ හොල්මන් කළා. සේවකයා තවත් ප්‍රමාද නම් මගේ රෝගියාට අවශ්‍ය ඖෂධය ගෙන එන්න, මම ම ඔසුසලකට යනවා කියන තීරණයට මම ඇවිත් ඉවරයි.

මෙතෙක් වෙලා මම හිටියෙ, අර සුවපහසු පුටුවෙ වැතිරිලා බව මං ඔබට කිව්වා. මා සිටි කාමරය ඇතුළට, ඉතා අසාමාන්‍ය වගේම විෂ වායුවක් වැනි ගන්ධයක් හමා එන බව, මට එක්වරම තේරුණා. මං පුටුවෙන් ඉහළට එසවුණේ ඉබේම. මං වහාම දිව්වෙ ජනේලයක් ළඟට. ඒ ජනේලය විවෘත කිරීමේ අරමුණෙන්. මං ඊට උත්සාහ දරද්දී දකින්න ලැබුණේ මොකක්ද? මේ ජනේලය මෙන්ම අනික් ජනේලත් කොහොමටවත් විවෘත කිරීමට බැරි බව. ඒවා හදල තිබුණේ ඒ විධියටයි. මේ වෙනකොට කාමරය ඇතුළේ තිබූ දුර්ගන්ධය හුස්ම හිරකරන ගතිය වැඩිවෙලා බව මට දැනුණා. මගේ හිසේ කරකැවිල්ලක් සහ ක්ලාන්ත ගතියක් ඇතිවී තිබුණා.

මොකක්ද මේ සිදුවෙලා තියෙන්නේ? මාව මර උගුලක හිරකරලද? මේ කෙළින්ම පහළින් තිබෙන කාමරයක ගින්නක් ඇතිවෙලාද? ඒ දුම තමා පොළොවේ ලෑලි අතරින් ඉහළට එනවා ඇත්තේ. රෙජිනා බේකර් සහ ඇගේ පියා මේ ගැන කිසිදෙයක් දන්නෙ නැතුව ඇති. හුස්මගැනීමේ අපහසුවක් ඇති කළ මේ ගඳේ තිබුණේ, කාබනික ද්‍රව්‍ය ඇවිළෙන ගින්නක දුමට සමාන බවක්. නමුත් ඊට වඩා මොකක් හෝ වෙනසකුත් තිබුණා. හුස්ම අල්ලන්න අමාරුව නිසා කහිමින් මම දොර වෙතට දිව්වා. දිව්වා නොවෙයි, බීම වැටී වැටී බඩගෑවා කිව්වොත් වඩාත් නිවැරදියි.

දොර වෙතට ළංවුණු මම එය අරින හැඬලයේ එල්ලුණා. ඒ ඉතාම අමාරුවෙන් හුස්ම ගනිමින්. ප්‍රමාදවීමට මට තවත් එක් මොහොතක් තිබුණේ නෑ. පිරිසිදු වාතය ආශ්වාස නොකොළොත් මා ක්ෂණිකව මිය යන බව සහතිකයි. ඒ බව මගේ මොළයට ආවේ එක් ක්ෂණයකින්.



"හුස්ම අල්ලන්න අමාරුවෙන් මම දොර වෙතට දිව්වා"

දොර විවෘත කිරීමට මං එහි හැඬලය කැරකුවා. නමුත් දොර විවෘත වුණේ නැහැ. හැඬලය රවුමට රවුමට කරකැවුණා. නමුත් දොර හෙලවුණේවත් නැහැ. කෙටියෙන් කියනවා නම් මාව කාමරයේ සිටියදී දොර යතුරු දමලා. ක්‍රම ක්‍රමයෙන් මගේ හුස්ම හිරවෙගන යන බව මට තේරුණා. මගේ හෘදය ඉතා වේගයෙන් ස්පන්දනය වෙන්න පටන් ගත්තා. හරියට කුළු ගෙඩියකින් පපුවට පහරදෙනවා වගෙයි මට දැනුණේ.

මගේ හිතට යම් අස්වැසිල්ලක සේයාවක් ගෙන එන දසුනක් මේ මොහොතේ මට දකින්න ලැබුණා. ඒ මා කිසිසේත් බලාපොරොත්තු නොවූ දෙයක්. ඒ තමයි මේ කාමරයට තවත් දොරක් තිබුණු බව. අර ව්‍යාජ පොත්වලින් පිරුණු රාක්කයක් තබා ඒ දොර ආවරණය කරලයි තිබුණේ. මම එක පොතක් අතට ගෙන ඒක සැබෑ පොතක් නොවන බව දැක, තවත් පොත් කීපයක් අතට ගෙන බැලූ බව මං ඔබට කිව්වා. ඒවා ඉවතට දැමුවා මිස, මං ඒවා තිබුණු හැටියටම ඇසුරුවේ නැහැ. ඒ හිඩැස තුළින් තමයි මට අර දොර දකින්න ලැබුණේ.

මං වහාම එතැනට පැන පොත් රාක්කය ඉවතට තල්ලු කළා. එවිට මට දක්නට ලැබුණේ, යන්තමින් විවෘතව තිබුණු අර දොර. මං එය තල්ලු කළ වහාම ඒ දොර සම්පූර්ණයෙන් විවෘත වුණේ තවත් කාමරයකට. එහි වටිනා සැඳෑ ඇඳුමකින් සැරසුණු අයෙක් බිම වැතිර සිටියා. එක්කෝ සිහි නැතිව; නැත්නම් බොහොම දුරට මියගිහින්. මං ඔහු දෙසට ළංවුණේ විසිවෙමින්. එතැනින් එහාට කිසිදෙයක් මට මතක නෑ.

මට සිහිය ආවේ කොයි වෙලාවකද කියල මං දන්නෙ නෑ. සිහිය ආවේ කොහොමද කියල දන්නෙත් නෑ. කොහොම වුණත් සිහිය එද්දි මං හිටියේ අශ්වකරත්තයක් තුළ. ඒ කරත්තය වීදි අතරින් වේගයෙන් ගමන් කරමින් තිබුණා. මේ වෙනකොට වීදිවල සෙනග කවුරුවත් දකින්න ලැබුණේ නැහැ. ඒ කොයි හරියද කියල මං දන්නෙත් නැහැ. සිදුවුණේ මොකක්ද කියන එකත් මට මුලින් මතක් වුණේ නැහැ. එහෙත් මඳ වේලාවක් ගතවෙද්දී ඒ හැමදෙයක්ම මගේ සිහියට ආවා. බිම වැටී සිටි මිනිසාගේ මුහුණ. මේසය උඩ තිබූ කෑම, රාක්කවල තිබූ බොරු පොත්, ඒ හැමදේකටම වඩා මගේ මොළයට දැනුණේ, මගේ හුස්ම හිරකරමින් කාමරය තුළට ආ දුමාරය.

"ගල් අඟුරු දුම" මං මටම කියාගත්තා. ගල් අඟුරු පිළිස්සූ උදුනක් කාමරයේ කොහේ හරි සඟවා තියෙන්න ඇති. මාව වංචනික ලෙස ඒ ගුහාව තුළට යැව්වේ මරාදමන්නයි. සුරූපී රෙජිනා බේකර් ඇගේ පියා සමග එකතුවී මර උගුලක මා හිර කළා. ඒ මාව මරාදමා මා සතු වටිනා දේ පැහැර ගැනීමට. මං කොහොමද ඒකෙන් බේරුණේ? කොහේටද මාව මේ ගෙනියන්නේ? මේ වෙලාවෙ මං ඉන්නේ කොයි හරියෙද? මං මේ අශ්ව රථය තුළට ආවෙ කොහොමද?

අශ්වකරත්තය හරහා හමා ගියේ වේගවත් සිසිල් සුළඟක්. මං ආඝ්‍රාණය කර තිබූ විෂ වායුව සිරුරෙන් ඉවත් වෙද්දී, මගේ මොළය මොහොතින් මොහොත පිරිසිදු වෙන්න පටන්ගත්තා. මොළය යළි ක්‍රියාකාරී වෙද්දී මතකය අවදිකර ගැනීමට මට හැකිවුණා. රියැදුරාට කථා කළ හැකි කවුළුව විවෘතකොට, මං ඔහු අමතා කෑගැහුවා.

"නවත්වනවා මේ වාහනේ! තමුසෙ මාව අරගෙන යන්නෙ කොහේටද?"

ඔහු රථය වහාම පාර අයිනට කර නැවැත්තුවා. පාර පාළුවට ගිහින් තිබුණේ. එතකොට වෙලාව පාන්දර දෙකට විතර ඇති කියලයි මට හිතුණේ.

"තමුසෙ කොහෙද මාව අරගෙන යන්නේ?" මං ඇහුවා.

"ඔබේ ගෙදරටයි මං ඔබව අරගෙන යන්නේ" රියැදුරා කිව්වා. "ඔබේ ලිපිනය මං දන්නවා. ඔබව භාරදුන් මහත්මයා මට කිව්වේ. ඔබේ නම ඇලෙක්ස් වැග්නර් අංක 7 රොටුන්ඩා උද්‍යානය පටිනි බව. ඒක හරි නේද? ඔබේ ආගන්තුක පත්‍රය කියලා මට දුන්නු කාඩ්පතේ තිබුණෙ එහෙමයි."

"ඒක සම්පූර්ණයෙන්ම වැරදියි. මගේ නම වැග්නර් නෙමෙයි. මට පෙන්වන්න ඒ කාඩ්පත"

තමන්ගේ කබා සාක්කුව අත ගෑ රියැදුරා ඉතා අපිරිසිදු ආගන්තුක පත්‍රයක් මා අතට දුන්නා. මං ඒක මගේ සාක්කුවට දමාගත්තා.

"දැන් මට කියන්න. මං කොහොමද ඔබේ කුලීරියට නැගුණේ?" මං ඇහුවා.

"මං රියගාලක මගේ කුලීරිය නවත්වාගෙන අඩ නින්දකට වැටිල හිටියේ" රියැදුරා කිව්වා. "කව්දෝ මගේ ඇඟට තට්ටු කරනවා දැනිල මං ඇහැරුණා. හිසේ පටන් සිරුර ආවරණය කරගෙන හිටි නාඳුනන මිනිහෙක් මට කථා කළා. ඔහුගේ අශ්වකරත්තය ඒ අසලම නවත්වා තිබුණා.

"රියැදුරු උන්නැහේ. ඔහේ කැමතිද කුලී ගමනක් යන්න?" ඔහු ඇසුවා.

"ඇයි කොහේටද?"

"මේ මහත්තයා මගේ ගෙදර උත්සවයකට ආව කෙනෙක්. ඔහු හොඳටම බීලා වෙරිවෙලා ඉන්නේ. ඔබට පුළුවන්ද ඔහුව ගෙදරට ගිහින් දාන්න? මං ගෙවන්නම් ඔබේ ගාස්තුව"

"කොහේටද මහත්මයා යන්න තියෙන්නේ?"

"පටනිවලට. මේ තියෙන්නේ ඔහුගේ ලිපිනය සහිත ආගන්තුක පත්‍රය. ගෙදර තියෙන්නේ පට්නිවල පාලම ළඟ. කියද ඔබේ ගාස්තුව?"

"සිලිං අටක් වත් ගන්න වෙනවා"

"මෙන්න පවුම් බාගයක්ම තියෙනවා. මට උදව් කරන්න ඔහු ඔබේ රියට දමාගන්න." ඔහු කිව්වා. "ඔබ මගේ රියට නැඟුණේ එහෙමයි."

"රියැදුරු උන්නැහේ. උන් හරි තක්කඩි. උන් මාව රවටලා මා ළඟ තිබුණු දේවල් අරගෙන. මාව ගෙදරට ගෙනියන්න. මං පදිංචිව ඉන්නේ බ්‍රික්ස්ටන්වල ප්‍රයරි පටුමගේ. හෙට උදේම මං යන්න ඕන ස්කොට්ලන්ඩ්යාඩ් පොලිසියට."

ඒකයි මහත්මයා මගේ කතන්දරය"

අපේ අමුත්තා වූ වෛද්‍ය රැල්ෆ් ඇඩම්ස් තම කථාව නිම කළේය.

මෙතෙක් වේලා දෙනෙත් පියාගෙන සිටි හෝම්ස් අමුත්තා දෙස තියුණු බැල්මක් හෙළා තම ප්‍රශ්න ඉදිරිපත් කළේය.

"ඇඩම්ස් මහත්මයා. මට තිබෙනවා ප්‍රශ්න කිහිපයක්ම" හෝම්ස් කීය.

"මුලින්ම මට කියන්න. මොනවද ඔවුන්ගෙන් ඔබට සිදුවුණු අලාභය? මොනවද ඔවුන් ඔබෙන් වංචාකරගෙන තියෙන්නේ?"

"මා ළඟ තිබුණු දියමන්ති ඇල්लූ මුදු දෙකම. මගේ කරේ තිබුණා රත්රන් හා ප්ලැටිනම් මිශ්‍රකර තැනූ දම්වැලක්. මගේ සාක්කුවේ තිබුණා රත්රන් දම්වැලකට සම්බන්ධ කර තිබූ සාක්කු ඔරලෝසුවක්. මං කලින් කිව්වා වගේ ඒක රතුකැට මත ක්‍රියාත්මක වුණු දියමන්ති එබ්බවූ එකක්. මගේ කබායේ තිබුණා රත්රන් බොත්තම් 7ක්. ඒ සියල්ලම ඔවුන් ගලවාගෙන. ඒ හැරෙන්න මගේ මුදල් පසුම්බිය. එහි තිබුණා පවුම් දෙසීයක පමණ මුදලක්"

"ඇයි ඔබ මේ ගැන වහාම ක්‍රියාත්මක නොවුණේ? ඔබ ගියේ නැද්ද පොලීසියට?"

"මං ස්කොට්ලන්ඩ්යාඩ් පොලිසියට ගියා"

"ඔබට හමුවුණු නිලධරයා කවුද?"

"ඩව්බිගින් නම් පොලිස් පරීක්ෂකයෙක්"

"දෙයියෝ සාක්කි! ඩව්බිගින්ද?" හෝම්ස් විමසුවේ තම දකුණු අත නළලේ තබාගනිමිනි.

"ඔව් මහත්මයා. ඔහු තමා කිව්වේ – ඔය වගේ පැමිණිලි අපට මීට කලින් ලැබිල තියෙනවා. කොච්චර හෙව්වත් අපරාධකාරයන් ගැන මොකුත් හොයාගන්න බැරිවුණා – කිව්වා. ඊළඟට ඔහු මගේ නමයි ලිපිනයයි ලියාගත්තේ හොරුන් අහුවුණොත් පොලිසියට දැනුම් දෙන්න කියමින්"

"මෝඩ යක්ෂයා!" හෝම්ස් කීවේ අත මිට මොළොවා මේසයට පහරක් එල්ල කරමිනි. "වොට්සන් ඔබට මතකද ඩව්බිගින්? ඔය යකා කරන තරමක් කරන්නේ මෝඩ වැඩ. මීට කලිනුත් අපේ මොකක් හරි පරීක්ෂණයකදී ඔහු ගැටී ගියා. ඔහු පොලිස් සේවයෙන් ඉවත් කරන්න කියලා මං මයික්‍රොෆ්ට කියන්නේ කොච්චර කාලයක ඉඳලද? ඩව්බිගින් ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයෙකුගේ මස්සිනා. මං කිව්වා අස්කරන්න බැරි නම් එංගලන්තයෙන් පිට කොහේ හරි රටකට මාරු කර යවන්න කියලා. යටත් විජිතයකට ගියොත් එහේ මිනිස්සුන්ගෙන් ගුටිකාලා හරි හැදිලා ඒවි.

හොඳයි. ඔබට අද මෙහේ එන්න හිතුණෙ ඇයි?"

"සතියක කාලයක් බලාගෙන හිටියත් කිසිවක් කෙරුණෙ නෑ. අද උදේ ගිහින් මං යළිත් විමසුවා. අද මට හමුවුණේ වෙනත් නිලධරයෙක්. ඔහුගේ නම මං හිතන්නේ ස්ටැන්ලි හොප්කින්ස්. ඔහු තමයි කිව්වේ මේ වගේ ගැටලු ලිහන්න පුළුවන් ඔබට පමණක් බව"

හෝම්ස් මඳ සිනාවක් පෑවේ එය අනුමත කරන ආකාරයෙනි.

"හරියටම ඔය සිද්ධිය වුණු දිනය කවදද මහත්මයා?" හෝම්ස් විමසීය.

"මාර්තු මාසේ 22 වැනිදා" අමුත්තා කීවේ තම සාක්කු දිනපොත එළියට ගෙන පරීක්ෂා කරමිනි.

"වොට්සන් මගේ ස්ක්‍රැප් පොත අරගන්න. ඒකෙ මාර්තු 23, 24 දිනවලට ඇති පිටු පෙරළා දෙන්න"

නියමිත දිනය පෙරළා මම ස්ක්‍රැප් පොත ඔහු අතට දුනිමි.

"හ්ම්...... මේ තියෙන්නෙ "ඊව්නිං නිවුස්" පුවත්පතෙන් කපාගත් කොටසක්..... තවත් එකක් තියෙනවා 24 වැනිදා ඩේලිමේල් පුවත්පතේ.....

"ඊයේ උදෑසන බ්‍රොම්ලි දුම්රියපොළ අසල තිබී හමුවූ මළසිරුර ෆුලම් පාරේ අංක 86 හි පදිංචිව සිටි ඇලන් ඩෙක්ස්ටර් මහතාගේ බවට හඳුනාගෙන ඇත. පූර්ණ සන්ධ්‍යා ඇඳුම් කට්ටලයෙන් සැරසී සිටි ඔහු 22 වැනිදා සැන්දෑවේ නිවසින් පිටව ගොස් ඇත්තේ රොක්සි නෘත්‍ය ශාලාවේ නාට්‍යයක් නැරඹීම සඳහාය. ව්‍යාපාරිකයෙකු වන ඒ මහතාගේ මුදල් පසුම්බිය, ඔරලෝසුව හා ආභරණ මෙතෙක් හමුවී නැත. මරණයට හේතුව විෂ වායුවක් ආඝ්‍රාණය කිරීම බැව් පශ්චාත් මරණ පරීක්ෂණයේදී හෙළිවිය....."

තවත් විස්තර තියෙනවා. දැනට නම් ඒවා එච්චර වැදගත් නෑ. මේ අනුව ඔබට දකින්න ලැබුණු අනික් පුද්ගලයා තමා ඇලන් ඩෙක්ස්ටර්. ඔහු ඔබ තරම් වාසනාවන්ත වෙලා නැහැ. මං හිතනවා ඔහු ඔවුන්ගේ ගොදුර වෙන්න ඇත්තේ ඔබට කලින්. ඔබේ තීක්ෂණ නුවණත්, ක්ෂණිකව ක්‍රියාත්මක වීමත් නිසා ඔබ ජීවිතය ගලවාගත්තා. ඔබ සාක්කුවේ දමාගත්තා කියූ අර ආගන්තුක පත්‍රය මට දෙන්න."

අමුත්තා එය හෝම්ස් අතට දුන්නේය.

"මේක ඕනෑම කෙනෙකුගේ ආගන්තුක පත්‍රයක් වෙන්න පුළුවනි. කමක් නෑ. මේකත් මං ළඟ තබාගන්නම්. මේකෙ නම තියන ඇලෙක්ස් වැග්නර් කවුද කියලත් අපි හොයල බලමු.

ඇඩම්ස් මහත්මයා. ඔබ මේ අපරාධකාරයන් දෙදෙනාගේ පෙනුම ගැන හොඳ විස්තරයක් කළා. ඒක අපට ප්‍රයෝජනවත් වේවි. අංක සිහි තබා ගැනීමට ඔබට තිබෙන මතක ශක්තිය කොහොමද?"

"ඒ තරම් විශේෂ දක්ෂකමක් තිබෙනවා කියන්න බැහැ"

"ඔබ අර නිවසට ඇතුළු වෙන වෙලාවෙ, ඒ ගෙදර හෝ අසල්වැසි නිවසක අංක ඔබට දකින්න ලැබුණෙ නැද්ද?"

අමුත්තා මඳවේලාවක් කල්පනා කළේය.

"ඒ වෙලාවේ රාත්‍රියේ තිබුණේ තද අඳුරක්. නමුත් වීථියේ ගෑස් ලාම්පුවලින් තරමක ආලෝකයක් නිවස ළඟට වැටුණා. නමුත් අංකයක් දුටු බවක් මට මතක නෑ"

"කමක් නෑ." හෝම්ස් කීය. "ඔබ සහ බේකර් මෙනෙවිය නිවස වෙත ගිය පෞද්ගලික රියේ අංකය, ඔබ නිවස වෙත ගෙන ආ කුලීරියේ අංකය ඔබ දුටුවාද?"

"දකින්න ඇති තමුන් මගේ මතකයේ රැඳුණ හා කියලයි මට හිතෙන්නෙ"

"ගමන් කළ ප්‍රදේශයේ දකින්න ලැබුණු මහසලකුණු කිසිවක් මතකත් නැ?"

"පිකැඩිලිය, හැම්ප්ටන් කෝනරය සහ සාන්ත ජෝර්ජ් රෝහල පමණයි මට හඳුනාගත හැකිවුණේ"

"සම්පූර්ණ කාලයක් ගතවීම විශාල පාඩුවක්" හෝම්ස් කීය. "ස්කොට්ලන්ඩ්යාඩ් එකට ලියුමක් යවා වහාම මා වෙත එවන්න. එයාගේ නම් තමයි මතකය මට වඩා ඇත්. තොරතුරු සොයාගන්න තිබුණු සොඳුරුවන් දැන් කැඩියන්න පටන් අරගෙන. අර "ස්ට්‍රින්ජ්" නාමය යොදාගෙන එදාම විසඳුවා නම්, මේ අපරාධකාරයන් ගැන තවත් මොනවා හරි දැනගන්න තිබුණා. මීට කලිනුත් මේ අපරාධකාරයින් පුද්ගලයන් රවටාගෙන ගිහින්, ඔවුන් සතු වටිනා ආභරණ සහ මුදල් පැහැරගෙන. ඒ අසරණයන් මරා දමන්න ඇති. පොලිසියෙන් කිසිදෙයක් කෙරෙන්න නැහැ. පසුගිය කාලේ මේ එංගලන්ද රජ පවුලට සම්බන්ධ සිද්ධියක - අර වටිනා සිතුවමක් හොරු ගැනීම පිළිබඳ පරීක්ෂණයේ යෙදී හිටියේ. ඒ නිසා පුද්ගලයින් අතුරුදන්වීම් සහ අභිරහස් ලෙස මෘතශරීර හමුවීම් ගැන තොරතුරු මට මගහැරෙන්න ඇති.

හොඳයි ඇඩම්ස් දොස්තර මහත්මයා. ඔබේ ලිපිනයත් අපට කියන්න. මේ ගැන ක්‍රියාත්මක වීම මං වහාම පටන්ගන්නවා. ඔබට තවත් මොනවා හරි කාරණා සිහිවුණොත් වහාම ඇවිත් මට කියන්න.

මේ අපරාධකාරයන්ට අහුවෙලා ජීවිතය ගලවාගැනීමට හැකිවුණේ ඔබට පමණයි. වඩාත් නිවැරදිව කියනවා නම් අප දන්නේ ඔබ පමණයි. මේ උගුලට අහුවෙලා ජීවිතය ගලවාගත් තවත් අය ඉන්න පුළුවනි. නමුත් ලැජ්ජාව නිසා මේ ගැන කිසිම පැමිණිල්ලක් නොකළා වෙන්නත් පුළුවනි. මේ දේ ඉදිරියට ගෙන ඒමෙන් ඔබ කරන්නේ සමාජයට විශාල සේවයක්. ඒ බව මා කිවයුතුයි."

"පොලිසියට ගිහින් වැඩක් නොවුණු නිසා අනික් අය කාරණය අත්හැර දැමුවා වෙන්නත් පුළුවනි" මම කීවෙමි.

"ඔව් වෙන්නත් පුළුවනි. ඒකත් සිදුවිය හැකි දෙයක්. ඇඩම්ස් මහත්මයා. අපි දැන් යමු ස්කොට්ලන්ඩ්යාඩ් පොලිසියට. එහි තිබෙනවා අපරාධකාරයන්ගේ ඡායාරූප එකතුවක්. අපි බලමු ඒකෙ ඉන්න

කවුරු හරි ඔබට හඳුනාගන්න පුළුවන්ද කියල. වොට්සන්. ඔබත් අප සමග එනවා නම් වහාම සූදානම් වෙන්න."

"මට එන්න හැටියක් නෑ හෝම්ස්. මට ක්‍රොයිඩන් වෙත යන්න වෙනවා. මගේ දිගු කාලීන රෝගියෙකු බැලීමට මා යායුතු දවස අද. ඔහු ආබාධිත කෙනෙක්. මා එනතුරු අද මඟ බලාගෙන ඇති"

ඉක්මනින් හැඳ පැළඳ ගත් හෝම්ස් අපේ අමුත්තා සමග වහාම නිවසින් පිටවී ගියේය.

මගේ මිත්‍රයා මට යළිත් හමුවූයේ එදින සැන්දෑයාමයේදීය.

"කොහොමද හෝම්ස් අද උදේ ස්කොට්ලන්ඩ්යාඩ් ගමන සාර්ථක වුණාද?" මම ඔහුගෙන් විමසුවෙමි.

"අපරාධකරුවන්ගේ ඡායාරූප ප්‍රදර්ශනයේ අපි සෑහෙන වෙලාවක් ගතකළා" හෝම්ස් කිය. "එහෙත් කවුරුන් හෝ නිශ්චිතව හඳුනාගන්න ඇඩම්ස්ට හැකිවුණේ නෑ"

"ඒ කියන්නේ මේ ජෝඩුව අපරාධ ලෝකයට අලුතෙන් පිවිසි අය කියලද?" මම ඇසීමි.

"අලුතෙන්ම පිවිසි අය නොවෙන්නත් පුළුවනි." හෝම්ස් කීය. "මෙච්චර කාලෙකට පොලීසියට අහුනොවුණු අය. ඒ නිසා අප ළඟ ඔවුන්ගේ ඡායාරූප නොමැති, කවදාවත් දඬුවමක් නියම නොවුණු අය.

කොහොම වුණත් මේ ඔවුන්ගේ පළමුවැනි උත්සාහය කියලා මං හිතන්නේ නෑ. බලන්න ඔවුන් කටයුතු කර ඇති සූක්ෂම පිළිවෙළ. වෛද්‍යවරයෙකු කියන්නේ සාමාන්‍යයෙන් ඉතා බුද්ධිමත් කෙනෙක්. එවැනි කෙනෙකු පවා රවටා ගැනීමෙන් පෙනෙන්නේ මොකක්ද? මේ අපරාධකාර යුවළ උපක්‍රමශීලී වීමට පෙන්වා ඇති දක්ෂතාවය. බිලී පිත්තකින් මාළු බාන මිනිහා මොකක්ද කරන්නේ? බිලී කොක්කට ඇම අමුණලා වතුරට විසිකරනවා. මේ සිත් ඇදගන්නාසුලු ඇමට මාළුවා ආකර්ෂණය වෙනවා. වෛද්‍ය ඇඩම්ස් අර තරුණියට ආකර්ෂණය වුණෙත් ඒ ආකාරයට. ඔහු ඇය සමග අර අද්භූත ගෙදරටත් ආවා. මර උගුලක ඔහු හිර කරනු ලැබුවා. තව ටිකෙන් ඔහු මියයන්නේ විෂවායු ආඝ්‍රාණයෙන් නේ. ඔහු බේරුණේ......"

"මං හිතන්නේ ඔහු ඒ මර උගුලෙන් බේරුණේ පොත් කියවීමට ඔහුගේ තිබූ කැමැත්ත නිසා" මම කීවෙමි. "චාල්ස් ඩිකන්ස්ගේ මාටින් චසල්විට් අතට ගත් නිසා ඒවා ව්‍යාජ පොත් බව ඔහු

තේරුම් ගත්තා. ඊළඟට "පොත්" ගණනාවක් ඉවත් කළ හිඩැසින් තමා, ඔහුට අර රහස් දොර දකින්න ලැබුණේ."

"ඔබ කියන දේත් ඇත්තයි වොටසන්. කොහොම නමුත් මේ අපරාධකාරයන් විෂ වායුවලින් මනුෂ්‍ය ඝාතන කරන්නේ තිරිසන් සතුන් මරන ගණනට. මං අද සවස සහ හෙට උදේ පුවත්පත් ගණනකට දැන්වීමක් භාරදුන්නා. බලමු මෙකටවත් හෝඩුවාවක් ලැබේවිද කියලා."

හෝම්ස් මා දෙසට කඩදාසියක් දිගු කළේය.

"පවුම් 10 ක ත්‍යාගයක්!

මෙය විශේෂයෙන් කුලිරථ රියැදුරෙකු සඳහාය. අධික ලෙස මත්පැන් පානය කිරීම නිසා සිහි විසඥව සිටි තරුණ මහත්මයෙකු බ්‍රොම්ලි දුම්රියපොළ අසලට හෝ බ්‍රික්ස්ටන් හි ප්‍රයරි මාවතට හෝ පටනි මංසන්ධිය අසලට ප්‍රවාහණය කළේ ඔබද? දිනය පසුගිය මාර්තු 22 වැනිදා රාත්‍රියේ. එසේ නම් මේ ත්‍යාගය හිමි ඔබටයි. බේකර් වීදියේ අංක 221 බී නිවසේ උඩුමහලට එන්න."

"ඊළඟට මං ගියා අර ඇලෙක් වැග්නර් – රියැදුරාට දීල තිබුණු ආගන්තුක පත්‍රයේ හිමිකරුවා හොයාගෙන. ඒ මනුස්සයා මියගිහින් අවුරුද්දකට කිට්ටුලු. ඔහු නිවාසවලට ගෑස් පයිප්ප සවිකිරීම කොන්ත්‍රාත් ගත්තා වැද්දුම්කරුවෙක්. ගෙදර අය කියන හැටියට වැඩිපුර ඇණවුම් ලබාගැනීමට තමන්ගේ ආගන්තුක පත්‍ර බෙදාදීම ඔහුගේ සිරිතක්ලු" හෝම්ස් කීය. "ආපසු එන ගමනේ මං ගියා අනෙක් පුද්ගලයා – අර මියගිය ඇලන් ඩෙක්ස්ටර් ගැන තොරතුරු විමසන්න, ෆුලම් පාරේ අංක 86 නිවසට. ඔහු ක්‍රීඩා භාණ්ඩ අපනයන කරන සමාගමක සහකාර අධ්‍යක්ෂකවරයෙක්. ඔහුට සිටින්නේ මහලු මව පමණයි. වයස අවුරුදු තිස්පහක් වුණත් අවිවාහකයෙක්. සැන්දෑ කාලයට ඔහු නාට්‍ය නැරඹීමට සහ සමාජ ශාලාවලට යන්න පුරුදුව සිටියලු. නාට්‍ය සඳහා ඔහු හැමවිටම ගොස් තිබෙන්නේ "රොක්සි" නෘත්‍යශාලාවට.

ඊළඟට මම "ක්වීන්ස්" සහ "රොක්සි" නෘත්‍යශාලා දෙකටම ගියා. ඒ තැන්වල "ඩ්‍රෙස් සර්කල්" අංශයේ සේවකයන් හමුවුණා. රෙජිනා බේකර් සහ බේකර් මහතාගේ හැඩහුරුකම් කියලා, එවැනි පෙනුමක් ඇති අය ගැන මතකද කියලයි මං විමසුවේ. තැන් දෙකේම සේවකයන්ට මේ ජෝඩුව මතකයි. ඒ මොකද වයස් පරතරය නිසා.

සමහරු කිව්වා ඒ තාත්තා සහ දුව විය යුතුයිලු. කිසිම දවසක ඔවුන් නාට්‍යයක් ඉවර වෙනතුරු නරඹන්නේ නැහැලු; කලින් පිටවී යනවාලු. ඒ හැරෙන්න වෙනත් කිසි තොරතුරක් ඔවුන් දන්නේ නෑ"

හෝම්ස් පළකළ පුවත්පත් දැන්වීමට පිළිතුරු ලෙස කුලීරථ රියැදුරෝ සිව්දෙනෙක් පැමිණියහ. ඒ දැන්වීම පළවී දින තුනක් පමණ ගතවූ පසුවය. ඒ සිව්දෙනාගෙන් දෙදෙනෙකු සැබැවින්ම ප්‍රවාහණය කර තිබුණේ අධික ලෙස බීමත්ව සිටි මහත්වරුන් වූ අතර, ඔවුන් අපේ පරීක්ෂණයට අදාළ නොවන බැව් පෙනී ගියේය. ඒ නිසා ඒ රියැදුරන් දෙදෙනා සමග කළ කතාබහ මෙහි සඳහන් නොකරමි. මේ අපේ කාරණයට අදාළ පළමු රියැදුරා සමග කළ කතාබහය.

"රියැදුරු උන්නැහේ. ඔබ කියන්නේ මත්පැන් බීල සිහි විසඥව සිටි මහත්මයෙකු ඔබ බ්‍රොම්ලි දුම්රියපොළ ළඟට ගෙනැත් දැම්මා කියල. ඒක හරිද?"

"ඔව් මහත්මයා." අමුත්තා කීය. "දිනය හරියටම මට මතක නෑ. මාර්තු මාසේ 20, 22 කාලේ දවසක්. මං මොකුත් නීතිවිරෝධී දෙයක් කර නැහැ නේද? සිහිසන් නැතිවෙනතුරු මත්පැන් බොන මහත්වරු ගෙවල්වලට ගෙනියන එක, අපේ රස්සාවෙ අයට අලුත් දෙයක් නෙමෙයි"

"ඔබ නීති විරෝධී දෙයක් කළා කියල මං හිතන්නේ නෑ" හෝම්ස් කීය. "පසුව උවමනා වුණොත් ඔබව කැඳවන්න, කරුණාකරල ඔබේ නමයි ලිපිනයයි මට කියන්න. ඊළඟට ඔය කතන්දරය මුල ඉඳල කියන්න. මං කියූ පවුම් දහයේ තෑග්ග ඉක්මනටම ඔබට ලැබෙනවා"

"මහත්මයා. මගේ නම රොබට් පවල්. ලිපිනය අංක 404 ඉඩාහෝ පටුමග. මං එළවන්නේ සමසෙට් කුලී රථ සමාගමට අයත් කුලීරියක්. මහත්මයෙකු සහ නෝනා කෙනෙකු වයිට්චැපල්වලට බස්සලා මං ආපහු එමින් හිටියේ. පාර අයිනේ අශ්වකරත්තයක් නවත්වලා තිබුණා. ඒකෙ ඉඳපු කෙනෙක් පාරට බැහැලා අත ඉස්සුවා"

"එතකොට වෙලාව කීයට විතරද?"

"පාන්දර තුනට විතර ඇති"

"හොඳයි ඔබේ කතාව කියන්න"

"ඔහු හුගක් උස ඒ වගේම මහත කෙනෙක්. ඔහු මෙහෙම කිව්වා.

"මගේ ගෙදර පාටියකටආව යාළුවෙක් හොඳටම බීල සිහිනැතුව ඉන්නේ. මගේ කරත්තෙන් එයාව ගෙදර ගෙනියන්නයි හැදුවේ.

නමුත් මගේ අශ්වයින් දෙන්නා ඉන්නෙ හරි මහන්සියෙන්. ඔබට පුළුවන්ද මෙයාව බ්‍රොම්ලි දුම්රියපොළ ළඟට ගිහින් දාන්න? හෙට උදේ වෙරි හිඳුණාම එයා කෝච්චියේ නැගල ගෙදර යාවි."

"එතකොට මගේ ගාස්තුව?" මං ඇහුවා.

"ඒක මං මේ දැන් ඔබට ගෙවනවා. මෙයාව ඔසවලා ඔබේ කරත්තයට පටවන එකත් මං තනියෙන් කරන්නම්. කීයද ඔබේ ගණන?"

"සිලිං හයයි"

"මෙන්න සිලිං අටක් මෙතැන තියෙනවා. ඔබේ කරත්තයේ දොර හොඳට ඇරල මට ඉඩ අරගෙන දෙන්න" ඔහු කිව්වා.

"අර බීල හිටි කෙනා ඒ තරම් තරබාරු කෙනෙක් නෙමෙයි. තරුණයෙක්. ඒ නිසා තනියම ඔහු ඔසවා මගේ කරත්තයෙන් තැබීම, අර හැඩිදැඩි මහත්තයාට අමාරු වුණේ නැහැ. හොඳටම බීල හිටියත් සමහර මිනිස්සු වාහනේට පටවන කොට බානකොට කෙඳිරිගානවා, සාපකරනවා, දඟලනවා. ඒත් මේ මිනිහා කිසි ශබ්දයක් කළේ නෑ. බ්‍රොම්ලි දුම්රිය පොළ ළඟට එනකොට මනුස්සයෙක් ළඟපාතක පෙනෙන්න හිටියෙ නෑ. මං අර මහත්තයව ඔසවලා අයිනේ සිමෙන්ති පඩියක් උඩින් තියලා යන්න ගියා. එච්චරයි"

"මෙන්න පවල් මං ඔබට ගෙවන්න පොරොන්දු වුණු පවුම් දහය" හෝම්ස් කිවේ රියැදුරාට මුදල් ගෙවමිනි. "තමන්ගේ බීපු මිත්‍රයාව ඔබට භාරදුන් මහත්තයාව ආයෙත් දැක්කොත් හඳුනාගන්න ඔබට පුළුවන්ද? කොහොමද ඔහුගේ පෙනුම?"

"ඔහු අඩි හයක් පමණ උසයි. හැඩිදැඩි ශක්තිමත් සිරුරක් තිබුණේ. අර මිනිහාව උස්සලා මගේ කරත්තෙට දැම්මෙ ඇඟට දැනෙන්නේ නැතිව. එතැන තිබුණ අඳුර නිසා එයාගෙ මුහුණ නම් මට හරිහැටි පෙනුණෙ නෑ. කන්දෙකත් වැහෙන විදිහේ කැප් තොප්පියක් දමාගෙන, වැහිකබායක් ඇඳගෙනයි හිටියේ. කටහඬ රළුයි."

"ඔහුගේ වයස කීයක් ඇතිද?"

"ඔහු තරුණයෙක් නම් නෙමෙයි. පනහට වැඩියි. සමහරවිට හැටටත් වැඩිද මං දන්නෙ නෑ."

"හොඳයි පවල්. අවශ්‍ය වුණොත් අපි ඔබට කතාකරන්නම්. දැන් ඔබට යන්න පුළුවනි" කී හෝම්ස් දොර විවෘත කළේය.

"ඔහු ගෙනැත් තියෙන්නේ මළමිනියක් බව, ඇයි ඔබ ඔහුට කිව්වෙ නැත්තෙ?" මා විමසුවේ අමුත්තා පිටව ගිය පසුවය."

"ඒ මිනිහගේ ඔළුව අවුල් කළා කියල, මේ වෙලාවෙ අපට වෙන වාසියක් නෑ වොට්සන්. එතකොට මේ මිනිය කුලීරියට භාරදීල තියෙන්නෙත් බේකර්. ඔහු තමන්ගෙ ගොදුරුවලින් නිදහස් වෙන්නෙ එකම ක්‍රමයට. හැබැයි ඊට කලින් දියමන්ති මුදු, ඔරලෝසු, මුදල් පසුම්බි ඉවත් කරගන්න අමතක කරන්නෙ නෑ"

"මේක මංකොල්ල කෑමට යොදාගෙන තිබෙන අලුත්ම ක්‍රමයක්" මම කීවෙමි. "මෙච්චර කාලෙකට ලන්ඩනයේ මෙහෙම දෙයක් අපට අහන්න ලැබිල නැහැ නේද හෝම්ස්?"

"මෑත කාලෙදි නම් අපට ඒ වගේ දේවල් අහන්න ලැබුණෙ නෑ. තරමක් දුරට මීට සමාන විධියට මිනිසුන්ගෙන් කළ කොල්ලකෑම්, ඉස්සර කාලේ ලන්ඩනයේ සිදුවෙලා තියෙනවා. තමන්ට අත්වුණු ඉරණම ගැන කියන්න, ඊට ගොදුරු වුණු මිනිහා, බොහෝ විට පණ පිටින් ඉතුරු වෙන්නෙ නෑ. වාසනාවකට වගේ දොස්තර ඇඩම්ස්ගෙ ජීවිතය බේරුණා. එහෙම නොවෙන්න මේකෙ අගක් මුලක් අපි කොහොමද හිතාගන්නෙ?"

අප වෙත පැමිණි අනික් රියැදුරා, වෛද්‍ය ඇඩම්ස් ප්‍රවාහණය කර තිබූ තැනැත්තාය. ඔහු අපට කීවේ ඇඩම්ස්ගෙන් අප ඇසූ තොරතුරුමය. ඊට අමතරව අප අසාගත් රියැදුරාගේ නම සහ ලිපිනය හෝම්ස් ලියා ගත්තේය.

"ඔහු ඔබට කතාකරන කොට ඔබේ කුලීරිය ගාල්කරගෙන හිටියෙ කොහේද?"

"ක්‍රොම්වෙල් පාරේ කෞතුකාගාරය ළඟ රථ ගාලේ"

"අර මහත්මයාව ඔසවලා ඔබේ රියට දැම්මෙ තනියමද?"

"නැහැ මහත්මයා. මට එක් පැත්තකින් අල්ලන්න කිව්වා."

"ඔබට තමන්ගේ මිත්‍රයා භාරදුන්නු තැනැත්තා, ආයෙමත් දුටුවොත් ඔහු හඳුනාගන්න ඔබට හැකිවේවිද?"

"ඒ ගැන නම් මට සහතික වෙන්න බැහැ." රියැදුරා කීය. "ඒ මොකද ඔහු හැඳගෙන සිටියේ මුළු ඇඟම ආවරණය වෙන විධියේ ඇඳුම්. දාගෙන හිටී කැප්තොප්පියට මුහුණ පවා බාගෙට වැහුණා. අනික ඔහු මට කතාකළේ කළුවර තැනකදී. ගෑස්ලාම්පුවේ එළිය ඔහු මඟ හැරියා කියලයි මට එවේලේ හිතුණේ"

"හොඳයි ජෝන් ලුවී ඔබට යන්න පුළුවනි. උවමනා වුණොත් ඔබ කැඳවන්නම්. මෙන්න මං පොරොන්දු වුණු මුදල"

අපට ස්තුති කළ රියැදුරා පිටව ගියේය.

"බලන්න වොට්සන්. මේ අපරාධකාරයා තමන්ගේ සොඳුරු කුලිරථවලට හාරදිල තියෙන්නෙ. එකිනෙකට ඈත තැන්වලදී, තමන්ගෙ ගෙදර ළඟදි නෙමෙයි."

එසේ කතාව අවසන් කළ මගේ මිත්‍රයා තම පියන් මැටි පයිප්පය තෝරාගෙන, එහි කෝච්ච සැර දුම්කොළ පිරවූ ආකාරය මම දුටුවෙමි.

"හෝම්ස්, ඔබ බලාපොරොත්තු වෙනවාද පැය දෙක තුනක් තනියම නිදහසේ මේ ගැන කල්පනා කරන්න. එහෙම නේද?"

"මොනවා?" ඔහු විම්සුවේ සැබෑවින්ම මවිතයට පත්වෙමිනි. "දෙවියනේ! ඔබ කොහොමද ඒක තේරුම්ගත්තෙ? ඒක මගේ හිතේ ගැඹුරේම පහළවුණු අදහසක්. ඔබ කොහොමද...."

"මගේ හිතවත් මිත්‍රයා" මම කීවෙමි. "නිරීක්ෂණ මගින් නිගමනයන්ට එළඹී රහස් හෙළිකරගන්න පුළුවන් අය, මේ ලෝකෙ ඉන්නේ, උපදේශක රහස් පරීක්ෂක ෂර්ලොක් හෝම්ස් මහත්මයා පමණක්ම නොවෙයි."

"හහ් හහ් හා!" මගේ මිත්‍රයා මිනිත්තුවක් දෙකක් යනතුරු නොකඩවාම සිනාසුණේය. ඒ හදපත්ලෙන්ම නැඟුණු හාස්‍යයෙන් බැව් මම තේරුම් ගතිමි.

"මම ඇත්තෙන්ම දන්නෙ නෑ වොට්සන්. ඔබ ඒ කාරණාව තේරුම් ගත්තෙ කොහොමද කියල....."

"ඔබ හැමදාමත් කියනවා වගේ ඒක තේරුම් කරල දුන්නම ඒකෙ අගය නැති වෙනවා"

"නැහැ නැහැ. කොහොමටවත් නැහැ"

"පයිප්ප දෙකක් අත ළඟ තිබියදීත් ඒවා අතට නොගෙන, ඔබ පිගන් මැටි පයිප්පය දුම්බීම සඳහා තෝරාගත්තා" මම කීවෙමි. "ඊළඟට ඊයෙ පෙරේදා පාවිච්චි කළ දුම්කොළ වෙනුවට, ලාච්චුව ඇරලා ඔබ තෝරාගත්තේ, නිතර භාවිතයට නොගන්නා සැරෙන් වැඩි, රොටර්ඩෑම් දුම්කොළ. ඔබ මේ විදියට පයිප්පය බොන්නේ ඉතාම සංකීර්ණ ගැටලුවක් විසඳන්න සිදුවුණාම පමණයි. මට මතකයි බැස්කවිල් අවුල අපට ඉදිරිපත් වුණු වෙලාවෙත්, ඔබ මේ ආකාරයෙන් තනිවෙලා කල්පනා කළා"

"විශිෂ්ටයි වොට්සන්. ඔබ මගේ ක්‍රම අනුගමනය කරලා සාර්ථක ප්‍රතිඵල ලැබීම ගැන මං අප්‍රමාණ සන්තෝෂයට පත්වෙනවා. ඔබ දිනෙන් දින දියුණුවෙන හැටි දකින්න ලැබීම මොන තරම් සතුටක්ද?"

"මං බලාපොරොත්තුවෙනවා දැන් වෛද්‍ය පුස්තකාලයට යන්න. ඔබට ගෙන ආයුතු යමක් තිබෙනවාද?"

"එහෙම දෙයක් මට මේ වෙලාවෙ හිතාගන්න අමාරුයි"

තවත් පමා නොවී මම නිවසෙන් පිටවී ගියෙමි. කුලීරියක් අල්ලාගත් මට මිනිත්තු කිහිපයකින් පුස්තකාලය වෙත ළඟාවීමට හැකිවිණි. එදා සැන්දෑවේ මා ආපසු එනවිටත්, ඔහු හාන්සි පුටුවට වී කල්පනා කරමින් සිටියේය. පයිප්පයෙන් හැළුණු දුම්කොළ අළු සහ පයිප්පයෙන් ඉවත් කළ දුම්කොළ රොඩු, අසල වූ වීදුරු බඳුනක ගොඩගසා තිබිණි. පසුගිය කාලයේ පුවත්පත්වලින් කපා එකතු කළ පුවත් ඇතුළත් "ස්ක්‍රැප්" පොතද හෝම්ස්ගේ දෙපා අසල විය.

"කොහොමද ඔබ අර ගැටලුව ගැන කල්පනා කරල සාර්ථක ප්‍රතිඵල ලැබුවද?" මා විමසුවේ, ඇඳුම් මාරු කරගෙන විසිත්ත කාමරයට පැමිණි පසුවයි.

"උත්ප්‍රේරකය ලෙස වැනේඩියම් පෙන්ටොක්සයිඩ් යොදාගෙන නේ අපි ඔක්සීකරණය කළේ" හෝම්ස් කීය. "එතකොට ලැබුණු රසායනික ද්‍රව්‍යය ඇන්ත්‍රක්විනෝන් විය යුතුයි. එහෙම නම් අපට මහ ගැටලුවක් වුණු රසායනය නැෆ්තලීන් විය යුතුයි. මං ඒ බව මුලදීම මහාචාර්ය ඇලිංහැම්ට කිව්වා. ඔහු ඒ වෙලාවෙ ඒක පිළිගන්න මැළිවුණා. ඒක නැෆ්තලීන් බවට....."

"මගේ හිතවත් හෝම්ස්" තවත් ඉවසිය නොහැකි වූ තැන මම ඔහුගේ කථාවට බාධා කළෙමි. "මං ඇහුවේ ඔබේ රසායනික පරීක්ෂණ ගැන නෙමෙයි. මං ඇහුවේ අපරාධ පරීක්ෂණය ගැන. අර වෛද්‍ය ඇඩම්ස්......"

"හරි හරි මට සමාවෙන්න මිත්‍රයා. ඒක ගැන කල්පනා කිරීම මං අත්හැර දැමුවා"

"ඒ කියන්නේ ඔබ ඒක පහසුවෙන්ම විසඳුවාද?"

"කොහොමටවත් නෑ." හෝම්ස් කීය. "ගැටලුව විසඳීමට ලැබිල තිබෙන හෝඩුවාවන් ප්‍රමාණවත් නැතිනම්, තවදුරටත් මොළයට වධදීමෙන් පලක් නෑ. මං හිතාගෙන ඉන්නේ පාතාල ලෝකයේ හිටි මගේ මිත්‍රයකු හමුවෙලා බලන්න. මේ ආකාරයේ පුද්ගලයින් ගැන ඔහුවත් දන්නවාද බලන්න"

කලක් පාතාල ලෝකයේ සිටි අපරාධකරුවන් පුනරුත්ථාපනය වූ පසු, ඔවුන්ගෙන් කිහිපදෙනෙකු යහ මගට ගැනීමට හෝම්ස්

සමන්විය. අපරාධකරුවන්ගේ ලෝකයේ රහසිගත තොරතුරු හෝම්ස් වෙත ලබාදීමට මොවුහු සමත්වූහ. පරණ ඇඳුම් වෙළඳාමක් කළ හියු ග්‍රීන් මෙයින් එක් අයෙකි. ෂින්වෙල් ජොන්සන් තවත් අයෙකු විය.

"මට හිතෙන්නේ මෙහෙමයි වොට්සන්" හෝම්ස් කීය. "වයස් පරතරය කුමක් වුණත්, ඒ දෙන්නා බොහෝවිට සැමියා සහ බිරිඳ. ඔවුන්ගේ නිවාසයත් ඔවුන් විශේෂයෙන් සකස් කරගෙන ඉන්නේ ඒ අපරාධය කිරීමට සුදුසු පිළිවෙළට. නිවස තුළ ගෑස් ලාම්පු නොමැතිකම. අනික් අයට අරින්න බැරි දොරවල්. ව්‍යාජ පොත් සහිත රාක්ක. විෂ වායුව ගලා ආ කාමරයේ අරින්න බැරි ජනේල. මේ හැම කරුණකින්ම ඒ බව තහවුරු වෙනවා. දවල් දවසටම මෙයාලා එළියට බහින්නේ නෑ. වැම්පයර් වවුල්ලු වගේ රෑට තමයි ගොදුරු සොයා යන්නේ. ඔවුනට අඩුම වශයෙන් එක් උදව්කාරයෙක්වත් ඉන්නවා. ඔහු තමයි අශ්වකරත්තයේ රියැදුරා. ඔහුගේ පෙනුම ඇඩම්ස් හරිහැටි දුටුවේ නැහැ. ඊළඟට බෙහෙත් ගෙන ඒමට ඔසුසලට ගියා කියන පුද්ගලයාත් මට හිතෙනවා, මේ අශ්වකරත්ත රියැදුරාමයි කියල. හෙට දවසම මං ගතකරන්නේ මේ පුද්ගලයන් සහ ඔවුන් පදිංචි නිවස ගැන තොරතුරු හොයාගන්න."

පසුවදා සැන්දෑවේ හෝම්ස් අප නිවහනට ළඟාවෙද්දී දැඩි වෙහෙසකට පත්ව සිටියේය. තමා දවස ගෙවූ ආකාරය ගැන එක් වචනයක් හෝ මා සමග කථා කිරීමට ඔහු කැමැත්තක් දැක්වූයේ නැත. ඔහුගේ වැඩ කටයුතු සාර්ථක වී නැති බැව් මම එයින් තේරුම් ගත්තෙමි. රාත්‍රී ආහාරය නිම කළ වහාම ඔහු නින්දට ගියේය. තොරතුරු යම් පමණකට හෝ දැනගැනීමට මට හැකිවූයේ පසුවදා උදැසනයි.

"මේ අපරාධකාරයින් ගැන මං කළ සොයා බැලීම් හැම එකක්ම අසාර්ථකයි වොට්සන්" හෝම්ස් කීවේ තම කෝප්පයට කෝපි වත්කරගනිමිනි. "මං බේකර් වීදියේ කොලු රැළ – විගින්ස්ගේ කොලු රංචුව යැව්වා පුරුදු විදියට. ඔවුනට බැරිවුණා කිසිම දෙයක් හොයාගන්න. ඊළඟට මං ඊයෙ දවස ගතකළේ හියු ග්‍රීන් සහ ෂින්වෙල් ජොන්සන් මෙහෙයවමින්. වැදගත් කිසි දෙයක් හොයා දෙන්න ඔවුනටත් හැකිවුණේ නෑ. මේ වගේ වංචනික කටයුතුවලට උදව්කරන අශ්වකරත්ත රියැදුරන් ගැන ජොන්සන් දැනගෙන හිටියා. ඔවුන්ගෙන් තොරතුරක් ලබාගන්න උත්සාහ කළා. හරිගියේ නැහැ. දැන් අපි ඉන්නේ කිසිම හෝඩුවාවක් නොමැතිව, මහා ප්‍රාකාරයක් අබියස. අපට මෙතැනින් එහාට යන්න කිසිම ක්‍රමයක් නැහැ"

"බේකර් යැයි කියාගන්නා මේ ජෝඩුව, හැංගිලා ඉන්න මේ තරම් දක්ෂයින් වුණේ කොහොමද? ඔවුන් පිටරටක හෝ එංගලන්තයේම ඈත පළාතක ජීවත්වෙන ගමන්, වරින්වර ලන්ඩනයට ඇවිත් ක්‍රියාත්මක වෙන අය වෙන්න බැරිද?" මම ඇසීමි.

"ඔවුන් ක්‍රියාත්මක වෙන්නෙ මොන ආකාරයටද? ඒක හිතාගන්න මටත් අමාරුයි. අපි තවමත් ඉන්නේ පටන්ගත්තු තැනමයි. මේ පිළිබඳව මට කළ හැකි අවසන් දේ ම කරල බලන්න මං තීරණය කළා"

"මොකක්ද ඒ අවසන් දේ?"

"වොට්සන්. ඒකට මට ඔබේ උදව් අවශ්‍ය වෙනවා. සමහරවිට අපට යෙදෙන්න වෙන්නේ, ජීවිතයත් මරණයත් අතර සටනක වෙන්න පුළුවනි. ඔබ මොකද කියන්නේ?"

"මං ඔබ සමග එනවා. ඒක සහතිකයි. ඇෆ්ගන් යුද පෙරමුණේ සටන් කළ මම, මරණයට භයයි කියා ඔබ හිතනවද?" මම කීවෙමි.

"මගේ හිතවත් වොට්සන්." හෝම්ස් කීවේ, අසුනෙන් නැගිට මගේ දකුණු අත අල්ලා ගනිමිනි. "මොන තරම් භයානක පුද්ගලයෙකු ඉදිරියට යන්නත් ඔබ කවදාවත් පසුබට වුණේ නෑ. හැමදාමත් මා සමග ආවා. ඒක මට කවදාවත් අමතක වෙන්නේ නෑ. මං හැමදාමත් ඔබට ණය ගැතියි.

මං බලාපොරොත්තු වෙන්නේ මේ ප්‍රශ්නයට කෙළින්ම මුහුණ දෙන්න. ඒ කියන්නේ මේ බේකර් කියන ජෝඩුව මුහුණට මුහුණ හමුවෙන්න"

"ඔබ කොහොමද එහෙම දෙයක් කරන්නෙ?"

"මගේ සැලැස්ම මේකයි වොට්සන්" හෝම්ස් කීය. "මෙයාලා තවත් ජීවිතයක් විනාශ කරන්න කලින් අපි ක්‍රියාත්මක විය යුතුයි. මං ධනවත් තරුණයෙකු ලෙස වෙස්වළා ගන්නවා. ඒකට ප්‍රමාණවත් තරම් දියමන්ති සහ මැණික් ඇල්ලූ මුදු මා ළඟ තිබෙනවා නෙ. බොහිමියාවෙ රජතුමා මට පරිත්‍යාග කළ රත්රන් ඔරලෝසුවත් මා ළඟ තියෙනවා. මට උවමනා කරන්නේ ආත්මාරක්ෂාවට සාක්කුවේ දාගෙන යාහැකි නවීන රිවෝල්වරයක් පමණයි"

"දෙයියෝ සාක්කි හෝම්ස්!"

"ඔව් මිත්‍රයා. මට විතරක් නෙමෙයි. ඔබටත් එවැනි රිවෝල්වරයක් අවශ්‍යයි. ඒ මොකද අපට ගනුදෙනු කරන්න සිදුවෙලා තියෙන්නෙ බොහොම භයානක මිනිහෙකු හා ගැහැනියක සමග. ඔවුන් පපුවේ

කිසිම තෙතමනයක් නැති මිනිස්සු. මංකොල්ලකෑමේ අරමුණෙන් මිනිසුන් මරාදමන්න කිසිම අනුකම්පාවක් නෑ. ඒ හින්දා මට උපකල්පනය කරන්න පුළුවනි; අවශ්‍යතාවයක් ආවොත් ගිනිඅවි පාවිච්චි කරන්නත් ඔවුන් මොහොතක්වත් ප්‍රමාද වෙන එකක් නෑ"

"ඔබ බලාපොරොත්තු වෙන්නෙ ගිනිඅවි මිලට ගන්නද?"

"නැහැ වොට්සන්. ස්කොට්ලන්ඩ්යාඩ් පොලිසියෙන් මට ඒ ආයුධ ලබා දෙන්නේ විශේෂ අවසරයකින්. ඊළඟට ඒ නවීන ආයුධවලින් වෙඩි තැබීම පුහුණු වෙන්න අපි යන්න ඕනෑ එපිං වනාන්තරය අසල යුදහමුදා වෙඩිපිටියට"

"දැන් සෙල්ලම පටන් අරගෙන? එහෙම නේද හෝම්ස්?"

"හරියට හරි මිත්‍රයා" ඔහු පිළිතුරු දුන්නේ සිනාමුසු මුහුණෙනි.

පැය තුනක පමණ කාලයක් අපි හමුදා වෙඩිපිටියේදී ඉලක්කයට වෙඩි තැබීම පුහුණු වීමු. නවීන රිවෝල්වරවල ශබ්දය ඉතා අඩුවූ අතර, බරෙන් අඩුවූ ඒවා පරිහරණය ඉතා පහසු බැව් මම තේරුම් ගතිමි. ගිනි අවියේ ආරක්ෂක අගුල දමා ගැනීම මෙන්ම ඉවත් කිරීම තත්පර කිහිපයකින් කළ හැකි පහසු කටයුත්තක් විය. ඒ සියල්ල පිළිබඳව අපට පුහුණුවක් ලබාදෙන ලද්දේ, තරුණ යුද හමුදා නිලධරයෙකු විසිනි.

පරීක්ෂණ කටයුතු සඳහා හෝම්ස් හැමදාමත් වෙස්වළාගත්තේ තනිවමය. එහෙත් මෙවර යෙදීමට තිබූ කටයුත්තේ බැරෑරුම් බව නිසාදෝ, ඔහු තවෙකෙකුගේ ආධාර ලබාගත්තේය. අවශ්‍ය සියලුම බඩු බාහිරාදිය රැගත් වේෂ නිරූපණ ශිල්පියෙක් බේකර් වීදියේ අප නිවහනටම පැමිණියේය. එම කටයුතු කෙරුණේ මගේ මිත්‍රයාගේ සොහොයුරු මයික්‍රොෆ්ට් හෝම්ස්ගේ අණින් බැව් පසුව මට දැනගන්නට ලැබිණි.

අප කරන්න යන්නේ කුමක්ද කියා හෝම්ස් මට කල් තබා පැවසුවේ නැත. අපි එදා රාත්‍රි ආහාරය ඉක්මනින් ගත්තෙමු. තම රාජකාරිය නිම කොට වේෂ නිරූපණ ශිල්පියා පිටවී ගියේය. මගේ මිත්‍රයාගේ කැඳවීමෙන් මම ඔහුගේ කාමරයට ගියෙමි.

මට දකින්න ලැබුණේ අවුරුදු පහළොවකින් පමණ තරුණ වී සිටි හෝම්ස්ය. ඔහුගේ මුහුණේ, ඇස්වටා, නළලේ තිබූ රැළි සියල්ල අතුරුදන් කිරීමට වේෂ නිරූපණ ශිල්පියා සමත්වී තිබිණ. මයික්‍රොෆ්ට් එවා තිබූ වටිනා ලෝම රෙදි ඇඳුම් කට්ටලයෙන් සැරසී, දියමන්ති මුදු ආදී ආභරණ හෝම්ස් පැළඳ ගත්තේය. එවිට දකින්නට ලැබුණේ

මහන්සි වී වැඩකළ දුප්පත් රහස් පරීක්ෂකයෙකු නොවේ. සුඛෝපභෝගී දිවියක් ගතකළ සිටුවරයෙකි.

"වොට්සන් මගේ හය තියෙන්නේ ඔළුවට දමල තියෙන බොරු කොණ්ඩය ගැලවිලා හදිසියේ බිමට වැටේද කියලයි" මගේ මිත්‍රයා කිවේ සැහැල්ලුවෙන් සිනාසෙමිනි.

"කොහොම වුණත් ඔහු වැඩේ නම් අපූරුවට කරල තියෙනවා" මම කීවෙමි. "ඔබට තියෙන්නේ රාජ කුමාරයෙකුගේ පෙනුමක්"

"ස්තුතියි මගේ හිතවත් වොට්සන්. මෙතැන ඉඳන් මගේ නම චාල්ස් කොවෙන්ට්‍රි – කොවෙන්ට්‍රි ආදිපාදවරයාගේ බාලම පුත්‍රයා. වයස 35 යි. මගේ විනෝදාංශ අශ්වරේස්, කාඩ්සෙල්ලම්, දඩයමේ යෑම, ඉලක්කයට වෙඩිතැබීම, දේශ සංචාරය."

"කෝ ඒවා ඔප්පුකරන්න ලියකියවිලි?"

"මේ බලන්න"

හෝම්ස් මගේ අතට දුන්නේ අලංකාරව මුද්‍රණය කර තිබූ ආගන්තුක පත්‍රයකි.

"දැන් මොකක්ද හෝම්ස් ඔබේ සැලැස්ම?"

"මං බලාපොරොත්තු වෙනවා මේ විදියට වෙස්මාරු කරගෙන, "ක්වීන්ස්" සහ "රොක්සි" නාත්‍යශාලාවල, රාත්‍රියේ දර්ශනයට ගිහින් උත්සාහ කර බලන්න. ඒ මොකද ඔවුන් දැනටමත් ක්‍රියාත්මක වෙලා තිබෙන්නේ ඒ තැන් දෙකේ බව අප දන්නා නිසා"

"මේ රාත්‍රියේම ඔවුන් ඒවිද කියල අපි කොහොමද දන්නෙ?"

"ඒක නම් කියන්න බැහැ. මේ විධියට සමහර විට අපට දින ගණනාවක් රස්තියාදු වෙන්න සිදුවේවි කියලයි මට හිතෙන්නෙ"

"ඔව් ඒක හරි"

"වොට්සන් මෙන්න මේ කාරණය ඔබ මතක තබාගත යුතුයි." හෝම්ස් කීය. "අපි දෙන්නා මේ ස්ථානයට යන්නෙ වෙන වෙනම. මං එක කුලීරියකින් කලින් යනවා. ඔබ වෙනත් එකකින් යන්න. ඊට මිනිත්තු දහයකට පමණ පස්සේ. අපි යන්නේ "ඩ්‍රෙස් සර්කල්" අංශයට. මට ඔබත්, ඔබට මාත් පෙනෙන හරියක අසුන් ගන්න උත්සාහ කරල බලන්න. මට ළඟම අසුන් දෙකක් මං හිස්ව තබාගන්නවා, කාටවත් වාඩිවෙන්න ඉඩ නොදී. ඒ බේකර් යුවළ ආවොත් ඉඳගන්න ඉඩදෙන්න"

"එහෙම කරන්න රඟහලේ අය ඉඩදේවිද?"

"ටිකට් නිකුත්කරන අංශයට අමතර මුදලක් ගෙවල, ඒක කරන්න පුළුවනි. මං ඒ ගැන විමසා බැලුවා. නමුත් බේකර් ජෝඩුව වෙනුවෙන් මං ටිකට් මිලදී ගන්නෙ නෑ"

"හරි මට තේරෙනවා" මම කිවෙමි. "ඔවුන් ආවා කියල හිතමු. කාන්තාව ඔබ ළඟත්, පිරිමියා ඊට අල්ලපු අසුනේත් හිඳගත්තා කියල හිතමු. මං මොකක්ද කළ යුත්තේ?"

"ඔබ කිසිම දෙයක් කරන්න එපා. හොඳ කල්පනාවෙන් හොරෙන් බලාගෙන ඉන්න" හෝම්ස් කිය. "මං ආදිපාදවරයාගේ පුත්‍රයා වුණත් වෛද්‍යවරයෙකු වෙන්න උගත් බව ඇයට කියනවා. මට උගුල අටවන එක, එතකොට ඇයට පහසු වෙනවා. දොස්තර ඇඩම්ස්ගේ කතන්දරය ඔබට මතකයි නේ. හැමදෙයක්ම ඒ පිළිවෙළටම සිදුවේවි. ඒ ගැන සැකයක් නෑ. ඒ මොකද ඔවුන්ගේ පැත්තෙන් ඒක ඉතා සාර්ථක වුණු වැඩ පිළිවෙළක් නේ."

"ඊළඟට මොකක්ද?"

"මුලින්ම බේකර් පිටවෙලා යාවි" හෝම්ස් කිය. "ඊළඟට මට යන්න සිදුවෙනවා ඇයත් එක්ක. මං එක පාරටම එළියට යන්නෙ නෑ. අසුනෙන් නැගිටිමින් මිනිත්තු කිහිපයක් ප්‍රමාද වෙනවා. ඒ ඔබට සංඥාවක් හැටියට. එතකොට වොට්සන් වහාම අසුනෙන් නැගිටලා එළියට යන්න. ගිහින් ඔබේ කුලිරියට නැගලා අන්ධකාරයේ රැඳී ඉන්න. මං ඇවිත් ඇය කියන කුලිරිය කැඳවාගෙන පිටත්වෙලා යද්දි, යාර පනහක පමණ පරතරයක් තියලා, ඔබත් පසුපසින් ආ යුතුයි. ඊළඟට අශ්වකරත්තය නවත්වලා අප කොහේදි හරි එයින් බසින බව දුටුවොත්, ඔබත් වහාම කුලිරියෙන් බැහැගන්න. එතැන සිට ඉදිරියට ඔබට එන්න වෙන්නේ පා ගමනින්"

"ඊට පස්සෙ මොකක්ද මට කරන්න තියෙන්නෙ?"

"ඔබට එවේලේම ඒ ගෙට ඇතුළුවෙන්න ඉඩක් ලැබේවි කියල මං හිතන්නෙ නෑ වොට්සන්. රිවෝල්වරයත් අතට අරගෙන ඔබ අඳුරේම හැංගිලා සූදානමෙන් ඉන්න. මට අවස්ථාවක් ලැබුණොත් මං ඔබව නිවස තුළට ගන්නවා."

"හෝම්ස් ඔබ කරන්න යන්නේ බොහොම භයානක වැඩක්" මම කිවෙමි. "ඔය බේකර් කියන යක්ෂයා ඔබට කිසිම අනුකම්පාවක් දක්වන එකක් නැහැ. ඔහු මහාචාර්ය මොරියාටිට හා ඇඩල්බට් ග්‍රැහාර්ට වඩා භයානක පුද්ගලයෙක් කියලයි මට හිතෙන්නෙ."

"කරන්න දෙයක් නෑ මගේ හිතවත් වොට්සන්. මං මේ අන්තරායදායක ක්‍රියාමාර්ගයට එළඹුණේ ඇයි? මේක විසඳන්න වෙනත් සාර්ථක ක්‍රමයක් නැති නිසා. එහෙම නම් අපි පිටත්වෙමු"

එදා රාත්‍රියේත් තවත් රාත්‍රි දෙකකත් අපි "ක්වීන්ස්" රඟහලට ගියෙමු. එහෙත් අපරාධකරුවෝ එහි නොපැමිණියහ. මීළඟට දින දෙකකට පසු "රොක්සි" රඟහලට යෑමට හෝම්ස් තීරණය කළේය.

මෙම රඟහල අප කලින් ගිය "ක්වීන්ස්" රඟහලට වඩා ප්‍රමාණයෙන් විශාල තැනක් බව ප්‍රසිද්ධ කරුණකි. අනික එය පිහිටා තිබුණේ ඔක්ස්ෆර්ඩ් වීථියට සමීපව නිසා, නාට්‍ය බැලීමට පැමිණෙන අනුග්‍රාහකයන් සංඛ්‍යාවද ප්‍රමාණයෙන් වැඩි බවට මතයක් තිබිණ.

අප කලින් යොදාගත් ක්‍රමය මෙහිදීද අනුගමනය කළෙමු. හෝම්ස් කලින් ගොස් "ඩ්‍රෙස් සර්කල්" අංශයේ වම් කෙළවරේ හිඳගත්තේ, තමා අසලම වූ අසුන් දෙක හිස්ව තබාගනිමිනි. ඔහුගේ ආසන පේළියට කෙළින්ම දකුණු කෙළවරේ වූ අසුනක් මම තෝරාගතිමි. පිටවීමේ දොරටුවක් ඒ සමීපයේම තිබීම මට අමතර වාසියක් විය.

ඉතා බාල ගණයේ නාට්‍යයක් වූ එය නැරඹීමට පැමිණ සිටියේ සුළු පිරිසකි. නාට්‍යය ඇරඹී මිනිත්තු විස්සක් පමණ ගතවෙද්දී යුවළක් පැමිණ, මගේ මිත්‍රයා හිඳගෙන සිටි දෙසට ගමන් කළ ආකාරය මම බලාසිටියෙමි. මා හරිහැටි දුටුවේ පිටුපසින් ගමන් කළ පිරිමියා පමණි. ඔහු උසින් අඩි හයක් පමණ වූ හැඩිදැඩි සිරුරක් තිබූ පුද්ගලයෙකු බැව් තේරුම් ගතිමි. තවත් මිනිත්තු දහයක් ගතවෙද්දී පළමු විවේක කාලය සඳහා තිරය වැසිණි.

ඒ ඉක්මනින්ම ප්‍රේක්ෂකාගාරය තුළ පහන් දල්වන ලදී. ඒ සමගම සමහරු තම අසුන්වලින් නැගිට, ඔබමොබ ඇවිද යාමට පටන්ගත්හ. අයිස්ක්‍රීම් සහ රසකැවිලි අලෙවි කළ වෙළෙඳුන් ශාලාව තුළට පැමිණියේ මේ අවස්ථාවේදීය. අයිස්ක්‍රීම් වෙළෙන්දා හෝම්ස් සිටි දෙසට ගමන් කරද්දී, ඒ අවස්ථාවෙන් ප්‍රයෝජන ගැනීමට මම තීරණය කළෙමි. මාද ඒ දෙසට ගමන් කළේ, අයිස්ක්‍රීම් වෙළෙන්දාගෙන් මාර්ගය අවහිර වී ඇතිබැව් වටහාගෙනය.

වෛද්‍ය ඇඩම්ස් අපට කියූ දෑ අකුරටම නිවැරදි බවත්, මේ පැමිණ සිටින්නේ එම යුවළම බවත් තේරුම් ගැනීමට, මට ගතවූයේ එක් නිමේෂයකි. ඉතාම රූමත් නව යෞවන වියේ තරුණියක් අයිස්ක්‍රීම් රසවිඳිමින් සිටියාය. පැසුණු කෙටි හිසකෙස් තිබූ ඇගේ

හැඩිදැඩි පියා, අයිස්ක්‍රීම් සඳහා මුදල් ගෙවා අවසන් කළේය. ඒ සමගම යාබද අසුනේ සිටි "චාල්ස් කොවෙන්ට්‍රි" හෙවත් මගේ මිත්‍රයා, තම මුදල් පසුම්බිය විවෘත කොට මුදල් නෝට්ටු මිටියක් එළියට ගත් සැටි මම දුටුවෙමි. එයින් නෝට්ටුවක් වෙළෙන්දාට දී අයිස්ක්‍රීම් මිලදී ගත් ඔහු, ඉතිරි මුදල තමා ළඟ තබාගන්නැයි වෙළෙන්දාට කිය.

හෝම්ස් වෙත බැල්මක් නොහෙළාම මම ඉදිරියට ගොස් ප්‍රේක්ෂකාගාරයෙන් පිටතට ආවෙමි. නාට්‍යය යළි ඇරඹීමට පෙර, වෙනත් දොරටුවකින් ප්‍රේක්ෂකාගාරයට ඇතුළුවීමි. එතැන් සිට මගේ දෙනෙත් යොමුවී තිබුණේ නාට්‍යය වෙත නොව, හෝම්ස් සහ ඔහු අසල සිටි බේකර් යුවළ වෙතයි. ශාලාව තුළ එතරම් දීප්තිමත් ආලෝකයක් නොතිබුණත්, ඔවුන් දෙසම බලාසිටියෙමි.

තවත් පැය කාලක් ගතවීමට පෙර, බේකර් තම අසුනෙන් නැගිට එළියට ගියේය. හැමදෙයක්ම සිදුවන්නේ වෛද්‍ය ඇඩම්ස් අපට කියූ කරාවේ ආකාරයටම බැව් පෙනිණ. මේ ඔවුන් දෙස ඇසිපිය නොහෙළා බලා සිටිය යුතු වේලාවයි. දැන් හෝම්ස් කොයි මොහොතක හෝ තම අසුනෙන් නැගිටිනු ඇත. ඒ මට ශාලාවෙන් පිටවීම සඳහා සංඥාවයි. මගේ හදවත වේගයෙන් ස්පන්දනය වීමට පටන්ගෙන තිබිණ. මා අතින් යම් වරදක් සිදුවුවොත්, සියල්ල වැරදී අවුල් වී යනු නිසැකය. එබැවින් මම සංඥාව දුටු සැණෙින් අසුනෙන් නැගිට එළියට යාමට, දැඩි අවධානයකින් සිටියෙමි.

කෙසේ වෙතත් ඒ සඳහා මා සිතා සිටියාට වඩා වැඩි කාලයක් ගතවිණි. අන්තිමේදී හෝම්ස් තම අසුනෙන් නැගිට්ටේය. මම වහාම ශාලාවෙන් පිටවී, කුලීරථ නවත්වන රථගාල දෙසට ගමන් කළෙමි.

"මහත්මයා. මං මෙහේ" මගේ කුලීරථයේ රියැදුරා ඉදිරියට පැමිණියේය. "අපට පිටත් වෙන්න වෙලාව හරිද?"

"ඔව්"

"එහෙනම් නගින්න. ඔබට යන්න උවමනා කොහේටද?"

"ටිකක් ඉස්සරහට ගිහිං අපි නවත්වාගෙන ඉඳිමු" මම කීවෙමි. "යන්න උවමනා තැන මං හරිහැටි දන්නෙ නෑ. තව ටිකක් වේලාවකින් මගේ යාළුවෙක් නෘත්‍ය ශාලාවෙන් එළියට එනවා එයාගෙ නෝනත් එක්ක. අපි යන්න ඕනෙ එයාලගෙ පිටි පස්සෙන්. ටිකක් වෙලා බලමු"

"ඔබේ කැමැත්තක්" කී රියැදුරා රථයට නැග නිහඬව බලාසිටියේය.

මිනිත්තු පහකට පමණ පසු බේකර් මෙනෙවියගේ අතින් අල්ලාගත් හෝම්ස් නෘත්‍ය ශාලාවේ ආලින්දය වෙත පිවිසෙන අයුරු මම බලාසිටියෙමි. ඇය එහි සිටියදී ඔහු මාර්ගය වෙත ආවේ, බේකර් යුවළට අයත් අශ්වකරත්තය කැඳවාගෙන ඒමට විය යුතුය. ඔහු අශ්වකරත්ත වෙත විමසමින්, ගියත් ඔහුගේ උත්සාහය සාර්ථක නොවූ බැව් පෙනිණ. ආපසු ගිය හෝම්ස් තරුණ කාන්තාව සමග යම් වැදගත් දෙයක් කතාබහ කළ බවක් මම දුටුවෙමි. ඒ ඇයගේ කරත්තය සොයාගැනීමට ඔහුට නොහැකිවීම ගැන වියයුතුය. මීළඟට අශ්වකරත්තය සෙවීමට ඇයද පැමිණියාය. ඔවුහු මා නැගසිටි කරත්තය අසලටම පැමිණියහ. ඔවුන් කතාබහ කළ හඬ මගේ දෙසවණට වැටිණි.

"මට විශ්වාස කරන්නත් බැහැ" ඇය කීවාය. "අපේ අශ්වකරත්තය මෙහි තිබිය යුතුමයි. තාත්තා කොහොමටවත් කරත්තය මෙතැනට නොඑව ඉන්නේ නැහැ"

"ඔහුව කැඳවාගෙන යද්දී කරත්තය මොනවා හරි අනතුරකට භාජනය වුණාද දන්නේ නැහැ" හෝම්ස් කීය. "මගේ පෞද්ගලික රථය නම් තියෙනවා....."

"එපා එපා!" ඇය කිවාය. "ඒක දුටුවොත් අපේ අසල්වාසීන් විමසිලිමත් වෙන්න ඉඩ තියෙනවා. මං ඒකට කැමති නෑ"

"එහෙම නම් මං සාමාන්‍ය කුලී රියක් කැඳවන්නද?" හෝම්ස් විමසුවේය.

"වෙන මොනවා කරන්නද" ඇය කීවේ බලාපොරොත්තු කඩවූ හඬෙනි. "මෙතැනට වෙලා අපි කොයිතරම් වෙලාවක් බලාගෙන ඉන්නද?"

මුව තුළට ඇඟිල්ලක් ඇමූ හෝම්ස් විසිල් හඬක් නැංවූයේ කුලීරියක් කැඳවමිනි. තරුණිය රියට නැංවූ ඔහු, ඉන්පසු එයට පිවිසියේය. මීළඟට රිය සෙමෙන් සෙමෙන් ඉදිරියට යන ආකාරය මම දුටුවෙමි.

"ඔය කරත්තය පස්සෙන් යන්න" මම මගේ රියැදුරාට උපදෙස් දුන්නෙමි. "යායුතු තැන කොතැනද කියලා මං දන්නේ නෑ. නමුත් ඔබ යායුත්තේ ඔවුන් පසුපස"

කිසිවක් නොකී රියැදුරා මගේ උපදෙස් අනුගමනය කරමින් සෙමින් රිය පැදෙව්වේය. පිකැඩලිය සහ හයිඩ්පාක් පෙදෙසේ

සෙමින් ගමන් කළ රිය, සාන්ත ජෝජ් රෝහල අසලදී වෙනත් පාරකට හරවන ලදී. මෙය සම්බන්ධ වූයේ නැගෙනහිර ලන්ඩනය දෙසට වැටෙන, තරමක් පුළුල් මාවතකටයි.

හෝම්ස් සහ තරුණිය ගමන්ගත් රිය, නොයෙකුත් මංසන්ධිවලින් හැරෙමින්, තවමත් ගමන් කළේ නැගෙනහිර ලන්ඩනයේමය. විටෙක තේම්ස් ගඟ සමීපයේ වරායේ කම්කරුවන්ගේ නිවාස සහිත පටු මාර්ගවලද, තවත් විටෙක බඩු ගබඩා තිබූ මාවත්වලද, එය ගමන් කළේය. මේ මාවත් මොනවායි මම දැන නොසිටියෙමි. එහෙත් මගේ මිත්‍රයා මේවා හඳුනාගන්නට ඇතුවා නොඅනුමානය. මවුත් අපෙන් මඟ හැරියාමට ඉඩ තිබුණද, ඒ කරත්තයට කිට්ටු නොවී ගමන් කිරීමට මගේ රියැදුරාට උපදෙස් දුන්නෙමි. අන්තිමේදී ඒ රථය අන්ධකාරයේ තිබූ උස් නිවසක් අසල නවත්වන ලදී. වීථියේ තිබූ ගෑස් පහනේ ආලෝකය යම් තරමකින් ලැබුණද එය තට්ටු තුනේ නිවසක්ද හතරේ එකක්ද කිම අපහසු විය. එයට යාර පනහක් පමණ පිටුපසින් අපේ රිය අන්ධකාරයේ නවත්වා, මම පා ගමනෙන් ඉක්මනින් ඉදිරියට ගියෙමි.

පළමුව හෝම්ස් අශ්වකරත්තයෙන් බිමට බැස්සේය. අනතුරුව ඔහුගේ ආධාරයෙන් තරුණිය ද බිමට බැස්සාය. හෝම්ස්ගේ අතින් අල්ලාගත් තරුණිය, නිවස වෙත පිවිසෙන පියගැට පෙළේ ඉහළට නැගීමට හෝම්ස්ට උදව් කළාය. ඒ අවසරයෙන් මා එතැනට ළංවූයේ හෝම්ස් අවස්ථාවක් ලබා දුන්නොත්, වහා නිවස තුළට පිවිසීමේ බලාපොරොත්තුවද ඇතිවය. එහෙත් ඔවුන් නිවස තුළට පිවිසි වහාම ඒ ඉදිරි දොර වසා දමනු ලැබිණ.

මගේ මිත්‍රයා මර උගුලක් තුළ සිරවූවා නොවේදැයි මගේ සිත භීතියෙන් වෙළී ගියේය. මගේ සිතට තිබූ එකම සැනසීම වූයේ, ඔහු ළඟ කාණු හයේම උණ්ඩ පිරවූ නවීන රිවෝල්වරයක් ඇති බව දැනසිටීම පමණකි. නිවසේ ඉදිරි දොර වෙත තිබූ පියගැට පෙළ දිගේ, ශබ්දයක් නොනැගෙන සේ මම ද ඉහළට නැගුණෙමි. වීථියේ වූ ගෑස් පහනේ එළිය ඒ සඳහා ප්‍රමාණවත් විය. ඉදිරි දොර අසලම වූ ජනේලය වෙතට කන ළංකර මම සවන්දුන්නෙමි.

තවත් මිනිත්තු දෙකක් පමණ ගතවෙද්දී මට අසන්නට ලැබුණේ කිසිවෙකු, නිවස තුළ පිටගැට පෙළක් දිගේ ඉහළ නගින ආකාරයයි. ඒ තරුණිය විය යුතුය. අන්ධකාරයේ තිබූ විසිත්ත කාමරයේ හෝම්ස්

තනිකර දමා, ඇය තම පියා සොයා ඉහළ මාලයට නගිනවා විය යුතුය. මම ඉවසිල්ලෙන් සවන් දීගෙන සිටියෙමි. ඊළඟට මට ශබ්දයක් අසන්නට ලැබුණේ, මා අසලම තිබූ ඉදිරි දොරේ යතුරු තහඩුවෙනි. මිනිත්තුවක් ගතවීමට පෙර දොර විවෘත විය.

"ඇතුළට එන්න වොට්සන්!" කොඳුරන හඬින් හෝම්ස් කියනු ඇසිණ. "සූදානමින් ආව නිසා මට හැකිවුණා, කම්බි නියනකින් දොර ඇරගන්න. ගේ ඇතුළෙ කට්ට කළුවරයි" ඔහු කීය. "ඒ වුණත් අපට දොර වහන්න වෙනවා. හැමදෙයක්ම සිද්ධවෙන්නේ දොස්තර ඇඩම්ස් කියූ පිළිවෙළටමයි. ඇගේ තාත්තට අදත් පපුවෙ අමාරුව හැදුණා. අදත් සේවකයන් කලින්ම නින්දට ගිහින්. තව මිනිත්තු දෙකක් ගතවෙද්දී ඇය ඉටිපන්දමක් දල්වාගෙන පහළට බසීවි. ඊට කලින් ඔබ අර ලොකු අල්මාරිය එහා පැත්තේ හැංගෙන්න ඕන වොට්සන්. ඇය සමග "ලෙඩා" බලන්න යෑමට මට සිදුවෙනවා. මා එහි ඇතුළුවුණු විගස ඔවුන් දොර වසා දමන බවට සැක නෑ. ඊට පස්සේ ඔබ ඉක්මනින් ඉහළට නැගලා, දොරට අඩි තුනහතරක් දුරින් ඉන්න"

"මං කොහොමද කළුවරේ උඩට නගින්නෙ?" මම ඇසීමි.

"මං ආවෙ ඒකට සූදානම් වෙලා" කී හෝම්ස් ඉටිපන්දමක් හා ගිනිපෙට්ටියක් සාක්කුවෙන් ගෙන මා අතේ තැබීය. "දැනට පෙනෙන හැටියට නම් හැමදෙයක්ම සිද්ධවෙන්නෙ, දොස්තර ඇඩම්ස් වෙනුවෙන් සකස් කර තිබූ වැඩසටහනේ පිළිවෙළටමයි.

මුලින් මාව ගෙන යාවි කෑම මේසය තිබෙන කාමරයට. ඊළඟට ලෙඩා බලන්න ඔහුගේ කාමරයට. මාව ඒ කාමරය තුළ දමලා ඇය පිටවී යනවා නෙ....."

හෝම්ස්ගේ සිතේ තිබූ සැලැස්ම මට පැවසීමට පෙර ඇය පහළට ඒම සඳහා තරප්පු පෙළ බසින ශබ්දය ඇසිණ.

"......දැන් කරන්න දෙයක් නෑ! අපි එන හැටියක් බලමු වොට්සන්!" ඉක්මනින් කියූ ඔහු, මා විශාල අල්මාරිය පිටුපසට තල්ලු කළේය.

"මට සමාවෙන්න කොවෙන්ට්‍රි මහත්මයා" ඇය කියූ හඬ මට මොහොතකින් ඇසිණ. "ඉටිපන්දම් ගිනිපෙට්ටි හොයාගන්න මට ටිකක් වෙලා ගතවුණා. වැඩිවෙලාවක් ගතවුණේ තාත්තට කොහොමද කියල බලන්න. අපි යමු ඉහළ තට්ටුවට......"

මීළඟට එම කාමරයට ඉටිපන්දමින් ලැබුණු ආලෝකය ක්‍රමයෙන් අඩුවී යන්නට විය. ඒ ඇය හෝම්ස් ද කැඳවාගෙන උඩුමහලට යාමට පිටත්වූ බැවිනි.

මීළඟ තට්ටුවේදී ඔවුන් අනෙක් පසට හැරී ගිය බැවින් තරප්පු පෙළ අන්ධකාර විය. කෙසේ වෙතත් හෝම්ස් කෑම මෙසය වෙත කැඳවාගෙන යමින්, ඇය කථා කළ හඬ මට ඇසිණි. පුටුවක් ඉවතට ඇද්ද ශබ්දය ඇසුණු පසු, මම මගේ ඉටිපන්දම දල්වා ගෙන සූදානම් වූණෙමි. හෝම්ස් කුමක් හෝ අනතුරකට ලක්වේදෝයි දැඩි බියක් මේ මොහොතේ මගේ සිතේ ඇතිවිය. ඔහු තනි පුද්ගලයෙකු පමණි. ඔවුන්ගේ රියැදුරා ද ගණන් ගතහොත්, එතැන අඩුම වශයෙන් තිදෙනෙකි. මේ අන්ධකාර නිවසේ ඔවුන් සඟවා ගෙන සිටින සහායකයන් ගණන කොපමණදැයි අපි නොදනිමු. සතුරන් සංඛ්‍යාව වැඩිවෙද්දී, ගිනිඅවියකින් වුවද ලබාගත හැකි ආරක්ෂාව සීමාසහිතය.

දෙවැනි තට්ටුවේ කාමරයේ මේසය මත සූදානම්ව තිබූ ආහාර සහ ෂැම්පේන් රස විඳින මෙන්, ඇය ඔහුට ඇරයුම් කරන හඬ මට අසන්නට ලැබිණ. එය ඇසීමට මට හැකිවූයේ මා ඒ වනවිටත් පියගැට පෙළේ භාගයක් දුර ඉහළට නැගී සිටි නිසයි. හෝම්ස් එය ප්‍රතික්ෂේප කළේ තමාට ඉක්මනින් රෝගියා පරීක්ෂා කිරීමට අවශ්‍ය බැව් පවසමිනි.

ඔවුනට රෝගියා සිටි කාමරය තිබූ තුන්වැනි තට්ටුවට නගින්නට ඉඩහැරියෙමි. මීළඟට මම දෙවැනි තට්ටුවට නැගුණෙමි. කටයුතු සිදුවන ආකාරය මට දැනුම්දිය යුතු නිසා, හෝම්ස් වඩාත් උස් හඬින් කථාකළ බැව් මම තේරුම් ගතිමි.

"මේ කාමරයේද ඔබේ තාත්තා ඉන්නෙ?" ඔහු විමසීය.

"ඔව්. ඇයි ඔබ එහෙම අහන්නෙ?" ඇය විමසුවාය. ඇගේ කටහඬේ තිබුණේ සැකයක සේයාවක්ද? කෙසේ වෙතත් මා ඉවසීමෙන් බලා සිටිය යුතුය.

රෝගියාගේ කාමරය තුළට පිවිසුණු ඔවුහු දොර වසා දැමූහ. මා මීළඟට කළ යුත්තේ කුමක්ද? ඒ ගැන කල්තබා මට උපදෙස් දීමට මගේ මිත්‍රයාට අවස්ථාවක් නොලැබිණි. දැන් ඒ කාමරය තුළ සිදුවෙමින් පවතින්නේ කුමක්ද? රෝගියාට ලබාදීම සඳහා ට්‍රයිනයිට්‍රින් ගෙන්වාගත යුතු බව හෝම්ස් පවසනවා නොඅනුමානය. එය ගෙන ඒමට සේවකයා සූදානම් කිරීම සඳහා ඇය පහළ තට්ටුවට බසිනු ඇත. පියගැට පෙළේදී ඇය මුහුණට මුහුණ හමුවීම වැළැක්වීමට මා කළ යුත්තේ කුමක්ද? මා වහාම ඉහළට නැගිය යුතුය. ඉන්පසු රෝගියා සිටින කාමරයේ දොර සමීපයේ අන්ධකාරයට වී සැඟවී

සූදානමින් සිටිය යුතුය. වැඩි පරෙස්සම සඳහා මා ඉදිරියට ගමන් කළ යුත්තේ රිවෝල්වරය දකුණු අතේ සූදානමින් තබාගෙනයි. රිවෝල්වරයේ ආරක්ෂක අගුළද ලිහිල් කළෙමි. මේ අවස්ථාව සඳහා මවිසින් පැළැඳිය යුතුව තිබුණේ, ක්‍රේප් රබර් අඩිය සහිත මගේ පාවහන් යුගලයි. එහෙත් අමතක වීමෙන් මා පැළඳගෙන ඇත්තේ සම් අඩිය සහිත පාවහන්ය. ඇවයෙන් තනා තිබූ තරප්පු මත පා තබද්දී, සම් අඩිය නිසා තියුණු ශබ්දයක් නැගිණ. එබැවින් ඉහළ නැගීම ඉතාමත් සෙමින් කිරීමට මම තීරණය කළෙමි.

තුන්වැනි තට්ටුවට ළඟාවීම සඳහා මවිසින් නැගිය යුතුව තිබුණේ තවත් තරප්පු තුනක් හෝ හතරක් පමණි. එක්වරම සිදුවූයේ මා කිසිසේත් අපේක්ෂා නොකළ දෙයකි. රෝගියාගේ කාමරයේ දොර විවෘත කරගත් තරුණිය, වේගයෙන් පියගැට පෙළේ මුදුන වෙත පිවිසියාය. ඇය එසේ එද්දී කාමරයේ දොර ශබ්ද නගා වසා ඇමූ බැව් එක් සැණෙකින් මගේ මතකයේ සටහන් විය.

තරප්පු පෙළේ ඇයට දක්නට ලැබුණේ අනපේක්ෂිත දසුනකි. වම් අතින් ඇල්වූ ඉටිපන්දමත්, දකුණු අතින් රිවෝල්වරයක් රැගෙන එන අමුත්තකු දුටු විගස, ඇය භීතියෙන් තැතිගත් බවට කිසිදු සැකයක් නොමැත. ඇගේ කටින් නිරායාසයෙන්ම පිටවූයේ අනතුරු ඇඟවීමේ විලාපයකි.

"දෙවියනේ! හොරු ඇවිත්! හොරු ඇවිත්!" ඇය දෙවරක්ම කෑගැසුවාය. "මාව බේරාගන්න කවුරුවත් නැද්දෝ?"

වහාම ආපසු හැරුණු ඇය උඩුමහලට දිව ගියාය.

"ඒයි නැවතියන්!" මම කෑගැසුවෙමි. "දිව්වොත් උඹට වෙඩිතියනවා. ඔහොමම නැවතියන්"

එහෙත් මගේ තර්ජනය ගණන් නොගෙන ඇය ආපසු දිව ගියාය. මම ඇය පසුපස එළවා ගියෙමි. රෝගියා සහ හෝම්ස් සිටි කාමරයේ දොර පහසුවෙන් විවෘත කළ ඇය එයට ඇතුළුවූයේ, "හොරෙක්! හොරෙක්! ඔහුගේ අතේ රිවෝල්වරයක්" යයි කියමිනි. ඒ සමගම ඇය කාමරයේ දොර පියන වේගයෙන් තල්ලු කළේ එය වැසියන අයුරෙනි. එහෙත් කාමරයේ දොර අසලට පිනූ හෝම්ස් උළුවස්ස හා දොර පියන අතරට තම කකුල තබා, දොර වැසියාම සපත්තුවෙන් වැළැක්විය. තම රිවෝල්වරය එක් ක්ෂණයකින් අතට ගත් හෝම්ස් එය බේකර් හා ඔහුගේ දියණිය යයි කියූ කාන්තාව දෙසට එල්ල කොට කෑගසා අනතුරු ඇඟවිය.

"ගිනිඅවි අතට ගන්න හදන්න එපා! හෙල්ලුනොත් වෙඩිතියනවා! උස්සනවා අත් ඉහළට! දෙන්නම. දෙන්නම. වොට්සන් වහාම කාමරය ඇතුළට ඇවිත් මේ එක්කෙනෙකුව භාරගන්න!"

"දෙවියනේ! මොකක්ද මේ වැඩේ තේරුම? තොපි ආවෙ මංකොල්ල කන්නද?" මෙතෙක් වේලා ඇඳේ සිටි බේකර් විමසුවේ, වහා එයින් නැගිට දෑත් ඉහළට ඔසවමිනි. "මේ මිනිහා ගෙට ඇතුළුවුණේ කොහොමද රෙජිනා? උඹ ඉස්සරහ දොර හරියට වැහැව්වේ නැද්ද?" බේකර් ඇයට කෑගැසුවේ කෝපාවිෂ්ඨවය.

"ස්මිත් නෝනා. මෝටිමර් මහත්මයා. ඒ ප්‍රශ්න ගැන කථාකරල විසඳගන්න ඔහේලට හුඟක් කාලය තියෙනවා" හෝම්ස් කීවේ උපහාසාත්මක හඬෙනි. "දැන් ඉතින් බහිමු පහළට. වොට්සන්. ඔබ ගෙන ආ ඉටිපන්දම ඔබේ වම් අතට ගෙන එළිය කරන්න"

තමන්ට ගැලවීමට ක්‍රමයක් නොමැති බව දත් අපරාධකරුවන් දෙදෙනා පහළට බැසීමට පටන්ගත්තේ, කෝපයෙන් යම් යම්දේ කියමින් අපට ශාපකරමිනි.

"ස්මිත් නෝනා. කරුණාකරල ඔබ ළඟ තියෙන යතුරෙන් ඉස්සරහ දොරේ අගුල අරින්න." හෝම්ස් කීය. "නැත්නම් අපට සිදුවෙනවා ඔබේ ගවොමේ සාක්කුවට අත අල යතුර අරගන්න"

තම සාක්කුවෙන් යතුර ගත් ඇය එය මෝටිමර් නම් ඇගේ සහකරු අතට දුන්නාය. දොර විවෘත කිරීම පහසුවනසේ මම ඉටිපන්දම ඒ දෙසට ළං කළෙමි. ඉදිරි දොර විවෘත නොකළ මෝටිමර් පසෙකට වී එක් මොහොතක් බලා සිටියේය. මීළඟට ඔහු එක් ක්ෂණයකින් ක්‍රියාත්මක විය. මා අතේ තිබූ ඉටිපන්දමට ඔහු වේගවත් පා පහරක් දුන්නේය. මීළඟට එයින් ඇතිවූ ඝන අන්ධකාරයේ ආරක්ෂාව ලබමින් ඔහු හෝම්ස් වෙතට කඩා පැන්නේ යක්ෂාවේශ වූවෙකු මෙනි. එහෙත් එවැන්නක් බලාපොරොත්තුවෙන් සිටි මගේ මිත්‍රයා, රිවෝල්වරය දකුණු අතේ තබාගෙනම වේගවත් බොක්සිං පහරක් වමතින් එල්ල කළේය. මගේ අවධානය ඒ දෙසට යොමුවෙද්දී. ගැහැනිය ලී බන්දේසියක් වැනි බර යමක් මා වෙත දමාගැසුවාය. මගේ දකුණු අතේ තිබූ රිවෝල්වරය ගිළිහී බිම වැටී ඉවතට විසිවී ගියේ උස් හඬක් නංවමිනි. ඒ මොහොතේම හෝම්ස් තම රිවෝල්වරය දොර දෙසට එල්ලකොට වෙඩි පිට වෙඩි කිහිපයක්ම තැබුවේ කන්බිහිරි කරවන හඬක් නංවමිනි.

හෝම්ස්ගේ වමත් පහර කා බිමවැටී සිටි අමරිකයා මෙන්ම තරුණිය ද, එසේ වෙඩි පුපුරන හඬෙන් භීතියට පත්වන්නට ඇත.

"වොට්සන් මෙන්න ගිනිපෙට්ටිය" මගේ මිත්‍රයා කියනු ඇසිණ. "දැන් ඉතින් ඔබේ ඉටිපන්දම හොයාගෙන දල්වාගන්න" ගිනිපෙට්ටිය රැගත් හෝම්ස්ගේ අත මගේ උරහිසට තෙරපෙනු මට දැනිණි.

ගිනිකූරක් දල්වා ඉටිපන්දම සොයාගෙන, එයද දැල්වීමි. තවදුරටත් සටන් කිරීම අත් හළ මෝටිමර් බිම වැතිර සිටියේය. තරුණිය අප වෙත යොමු කළේ පරාජයට පත් බැල්මකි. ඉදිරි දොරේ යතුර බිම වැටී තිබිණි. එය අතට ගත් මම දොර විවෘත කළෙමි.

නිල ඇඳුමෙන් සැරසී සිටි පොලිස්භටයෝ කිහිපදෙනෙක් නිවසට පිවිසෙන තරප්පු පෙළ මතට වී බලා සිටියහ. ඔවුන් ගිනිඅවිවලින්ද සන්නද්ධ වී සිටි බැව් මා දුටුවේ, ඔවුන්ගේම අත්වල තිබූ ලන්තෑරුම්වලිනි.

"ඔබට වෙඩිතබන්නත් සිදුවුණා නේද හෝම්ස් මහත්තයා?" යයි විමසුවේ ඉදිරියෙන් සිටි ස්කොට්ලන්ඩ්යාඩ් නිලධර ස්ටැන්ලි හොප්කින්ස්ය. "ඒ වුණත් තුවාලකාරයො කවුරුවත් නැහැ නේද? ඔබ දුන් උපදෙස් අනුව, පොලිස් ඒකක හයක් ගෙනැවිත් මේ සිට්ටුව තැන් තැන්වල රඳවා තැබුවා. ඔවුන් මෙතැනට කැඳවාගන්න එච්චර වෙලාවක් ගතවුණේ නෑ"

අපරාධකරුවන් දෙදෙනා සිරභාරයට ගත් පසු පොලීසියේ බලකිරීම මත, තම නිවස ඇතුළත පෙන්වා දීමට අපරාධකරුවනට සිදුවිණ. කෙසේ වෙතත් එම නිවස අප විසින් හරිහැටි පරීක්ෂා කරන ලද්දේ පසුදින දහවල් කාලයේදීය.

එම නිවස පිහිටා තිබුණේ නැගෙනහිර ලන්ඩනයේ සොහෝ ප්‍රදේශයේ පටුමාවතකයි. නගර සංවර්ධනය සඳහා කඩාදැමීමට නියමිතව තිබූ මෙම නිවස, මේ හොරදෙටුවා විසින් සුළු මුදලකට මිලට ගෙන තිබිණි. එහි ජනේල විවෘත කිරීමට නොහැකි වනසේ ඉස්කුරුප්පු ඇණ යොදා සකසා තිබිණි. මේ අතර දොරවල් විවෘත කිරීමට තිබූ හැඬල, බොත්තමක් තදකිරීමෙන් ක්‍රියාවිරහිත වන පරිදි වෙනස් කොට තිබිණි.

"මේ දෙන්නා කොහොමටවත් තාත්තයි දුවයි නොවෙන බව නම් මම මුලදිම දැනගත්තා" හෝම්ස් කීවේ අපරාධකාරයන් රක්ෂිත බන්ධනාගාර ගත කළ දිනට පසුවදා සැන්දෑවේ අපේ නිවහනේදීය.

එදා රාත්‍රි භෝජනය සඳහා ස්ටැන්ලි හොප්කින්ස්ද බේකර් වීදියට පැමිණ සිටියේ මගේ මිත්‍රයාගේ ආරාධනයෙනි.

"රෙජිනා කියන බොරු නමින් පෙනී හිටියාට, ඇගේ සැබෑ නම මොරීන් ස්මිත්. වයස දහහතයි කිව්වට දැන් වයස තිහක්වත් ඇති. ඇය මුලින් අක්ෂ ටෙනිස් ක්‍රීඩිකාවක්. ඊට පස්සේ නිළියක ලෙස නාට්‍ය කණ්ඩායමකට බැඳිලා, යුරෝපයේත් ඇමරිකාවේත් සංචාරය කළා. හොර තක්කඩියා එඩී මෝටිමර් ඇත්තෙන්ම අවුරුදු හැටක කෙනෙක්. ඔහුත් එම නාට්‍ය කණ්ඩායමේම සාමාජිකයෙක්. මේ මොරීන් ස්මිත් මුලින් නාට්‍ය කණ්ඩායමේ නිෂ්පාදකයා වුණු රොබට් ස්මිත්ගේ බිරිඳ. ඔවුන් ඇමරිකාවේ සංචාරයකට ගිය වෙලාවේ බොස්ටන් නගරයේදී, එක් රාත්‍රියක රොබට් ස්මිත් ඝාතනය වුණා. මේ පිළිබඳ සැකය එල්ලවුණේ එඩී මෝටිමර්ට. නමුත් සාක්ෂිවල තිබූ පරස්පර විරෝධී බව නිසා මෝටිමර් නිදහස් වුණා. නාට්‍ය කණ්ඩායම බංකොළොත් වුණා. ඔවුන් විසිරී ගියා. මොරීන් ස්මිත් හා එඩී මෝටිමර් යුරෝපයට පැනගියා කියලයි ආරංචිය ගියේ. කොහොම හරි භයානක උගුලක් අටවලා ඉතාම ඉහළ මට්ටමෙන් මංකොල්ලකෑම්වල යෙදෙන්න, ස්මිත්-මෝටිමර් යුවළ සමත්වුණා. එඩී මෝටිමර්ගේ තීක්ෂණ නුවණෙන් තමා, මේ හැමදෙයක්ම සැලසුම් කරන්න ඇත්තේ. නමුත් මේ ක්‍රමයට ඔවුන් අපරාධ විශාල ගණනක් කරන්න කලින් අල්ලා ගැනීමට අපට හැකිවුණා කියල මං විශ්වාස කරනවා."

"හෝම්ස් මහත්තයා. මං දැනගෙන හිටියේ නෑ ඔබ අර තරුණ කාන්තාවට විවාහ යෝජනාවක් කරලා, ඇය සමග ඇගේ ගෙදරට යන්න සැලසුම් කළ බව" හොප්කින්ස් මහ හඬින් සිනාසෙමින් කීවේ හෝම්ස් දිගු කළ සුරුට්ටුවක් දල්වා ගනිමිනි.

"දීර්ඝ කාලයක් අවිවාහකව සිටි නිසා මාත් තීරණය කළා විවාහවෙන්න" හෝම්ස් කිවේද හඬනගා සිනාසෙමිනි. "මගේ අතේ තිබූ දියමන්ති මුදු, රත්රන් ඔරලෝසුව දුටුවාම, ඇය උත්සාහ ගත්තා මාවත් ගොදුරු කරගන්න. අර අයිස්ක්‍රීම් වෙළෙන්දා ආ වෙලේ මම මුදල් පසුම්බිය අතට ගත්තා. ඒ වෙලාවෙ මට හැකිවුණා කොවෙන්ට්‍රි ආදිපාදවරයාගේ ලාංඡනය සහිත ආගන්තුක පත්‍රයක් බිම දමන්න. ඇය ඒක අහුලාගත්තේ තම පිහාටු අවාන බිම දමලා අහුලන ගමන්. ඊට පස්සෙ තමයි මා එක්ක බලෙන් කතාවට ආවේ. සිද්ධියේ ඉතිරි හරිය වෛද්‍ය ඇඩම්ස් මුහුණදුන් පිළිවෙළමයි.

රියැදුරා අත්අඩංගුවට ගත් එකෙන් ඔබේ කටයුත්ත පහසු වුණා නේද හෝම්ස් මහත්මයා?"

"ඇත්තෙන්ම ඔව්. ඔවුන්ගේ රියැදුරා සමග අශ්වකරත්තය නැගෙනු කිව්වාම ඇය මුලින් විශ්වාස කළේ නෑ" හෝම්ස් කීය. "මාත් එක්තරා සාමාන්‍ය කුලීකරත්තයක යන්න ආවේ එච්චර කැමැත්තකින් නෙමෙයි. ඇයි අප යායුතු තැන රියැදුරාට කියන්න සිදුවෙනවා නෙ

ඔබට කියන්න මට බැරිවුණා වොට්සන්. නාට්‍යය අවසානවෙන්න කලින් නාට්‍ය ශාලාවෙන් පිටවී යන තැනැත්තා ගමන් කරන අශ්වකරත්තය ගැන, ඔවුන්ගේ අවධානය යොමු කරන්න කියලා මං හොප්කින්ස්ට කිව්වා. ඒ අනුව බේකර් නිවසට බස්සලා ආපසු ආ කරත්තය හා රියැදුරා පොලිස් අත්අඩංගුවට ගැනුණා.

අනික අප ගමන් කළ අශ්වකරත්තවල රියැදුරන් ලෙස කටයුතු කළේ වෙස්වලාගත් පොලිස් නිලධරයන්. අප අප නිවසට ඇතුළුවුණු වහාම එතැනින් පිටවී ගිහින්, සැඟවී සිටි පොලිස් කණ්ඩායම් නිවස ළඟට කැඳවාගෙන ඒම ඒ දෙදෙනාට භාරවී තිබුණා. අප එළියට බහිද්දී නිවස ළඟම හිටින්න පොලීසියට හැකිවුණේ ඒ නිසයි."

"හෝම්ස් ඔබට හිතෙන්නේ ඔවුන් කළ එකම අපරාධය ඇලන් ඩෙක්ස්ටර් ඝාතනය පමණක් කියලද?" මම ඇසීමි.

"පසුගිය අවුරුදු දෙක තුළ අභිරහස් ලෙස අතුරුදන්වූ කිහිප දෙනෙකුගේම ලේඛනයක් මා ළඟ තියෙනවා. ඒ සමහර දෙනෙකුගේ මෘතශරීරවත් හමුවුණේ නෑ. ඒවට ස්මිත්-මෝටිමර් යුවළගේ දායකත්වය කොහොමද කියල මීළඟට විමසල බලන්න ඕන"

ප්‍රමාණවත් තරම් සාක්ෂි නොතිබීම නිසා ඩෙක්ස්ටර් ඝාතනය ගැන චෝදනාව, පොලිසිය මගින් ස්මිත්-මෝටිමර් යුවළ වෙත එල්ල නොකරන ලදී. එහෙත් වෛද්‍ය රල්ෆ් ඇඩම්ස් ඝාතනයට තැත්කිරීමේ චෝදනාවට නඩු විභාගය, ඕල්ඩ් බේලි අධිකරණයේදී විභාගයට ගැනිණි. මොරීන් ස්මිත් හා එඩී මෝටිමර් වරදකරුවන් බව ඒකමතිකව තීරණය විය. ඒ අනුව ඔවුන් දෙදෙනාට ජීවිතාන්තය දක්වා සිරදඬුවම් නියම විණි.

# දුම්රිය අනතුර

මීට පෙර අවස්ථාවකදී ද මගේ හිතමිත්‍ර ෂර්ලොක් හෝම්ස් මහතා වෛද්‍ය ප්‍රතිකාර සඳහා, විශේෂඥ වෛද්‍ය ක්වින්සි මොන්රෝ වෙත ගෙන ගිය බැව්, මගේ පාඨකයන්ට මතක ඇතුවා නිසැකය. කායික රෝග පිළිබඳ විශේෂඥයකු වූ වෛද්‍ය මොන්රෝ, අවුරුදු තිහකට වැඩි කාලයක දීර්ඝ පළපුරුද්දක් තිබූ වෛද්‍යවරයෙකි. මා ඉගෙනීම ලැබූ කාලයේ මගේ ද ගුරුවරයෙකු වූ ක්වින්සි මොන්රෝ සේවය කළේ ක්වීන් මේරි රෝහලේය. තදබල හිස කැක්කුමකින් සහ වරින්වර සැදුණු ක්ලාන්තයකින් මගේ මිත්‍රයා පීඩා විඳිමින් සිටියේ සති ගණනක සිටයි. ඔහු නැවත වරක් වෛද්‍ය මොන්රෝ වෙත කැඳවාගෙන යාමට අන්තිමේදී මම තීරණය කළෙමි. ඒ මා කළ ප්‍රතිකාරවලින් හෝම්ස්ට සතුටුදායක ප්‍රතිඵල නොලැබුණු විටයි.

"හෝම්ස් මහත්මයාගේ රුධිර පීඩනය තිබෙන්නේ ඉහළ මට්ටමක" වෛද්‍ය මොන්රෝ පැවසුවේ සෑහෙන වේලාවක් රෝගියා පරීක්ෂා කිරීමෙන් පසුවය." මං දන්නවා ඔබට රෑ දවල් නොබලා හුඟක් මහන්සි වෙන්න සිදුවී ඇති බව. මීට කලින් ඔබ පරීක්ෂා කළ වෙලේ මං දුන්නු අවවාද ඔබ හරිහැටි පිළිපැද්දා ද මම දන්නේ නෑ. නමුත් මං ඔබට තදින්ම අවවාද කරනවා. දුම්බීම සම්පූර්ණයෙන්ම අත්හැර දමන්න. අවිවේකීව දිගින් දිගටම වැඩකරන්න සිදුවීම, ඔබේ හෘදයට ඉතාම අහිතකරයි. අධික වශයෙන් ලුණු සහිත ආහාර ගැනීම නවත්වන්න. අතික අඩුම තරමෙන් සති දෙකක විවේකයක් දැන් ඔබ ගතයුතුමයි. මා නියම කරන ඖෂධ පාවිච්චියට ගත යුත්තේ ඔබ ලන්ඩන් නගරයෙන් පිටවී ගිහින්. ඒ කියන්නේ නිවාඩුව ඔබට අනිවාර්යයි"

වෛද්‍යවරයා කොපමණ අවවාද කළත්, ලන්ඩනයෙන් පිටවී ගොස් විවේකයක් ගැනීමට හෝම්ස්ගේ කැමැත්තක් නොතිබිණි. එහෙත් මෙම රෝගය නොසලකා හැරියහොත්, ඔහුට අංශභාග රෝගය වැලැඳීමට ඉඩ ඇති බැව්, මම මගේ මිත්‍රයාට මතක් කළෙමි. නිවාඩුවක් ගතකිරීම සඳහා ඔහුගේ එකඟතාවය අන්තිමේ දී ලැබුණේ එවිටය. වෝමිංටන් නම් ඈත පිටිසර ගම්මානයේ නිවාඩු නිකේතනයක

කාමර දෙකක්, මම ලැන්ඩනයේ සිටම වෙන්කර ගත්තෙමි. අප ලන්ඩන් නගරයෙන් පිටත් වී ගියේ එක් ඔක්තෝබර් මාසයක අපර භාගයේය.

සැන්දෑවේ ඇඳිරි වැටෙමින් පැවැති වෙලාවේ, පළමුවන පංතියේ දුම්රිය මැදිරිය තුළ සිටියේ, හෝම්ස් සහ මා පමණි. අප ළංවෙමින් සිටියේ ඇපල්හැම් නම් කුඩා දුම්රියපොළටයි. දුම්රියේ වේගය ක්‍රමයෙන් අඩුවෙද්දී, කවුළු තුළින් හිස් දමමින් අපි වේදිකාව දෙසට නෙත් යොමු කළෙමු. දුම්රියට නැග ගැනීමට නොඉවසිල්ලෙන් සිටි ගම්බද ජනයා දෙස අපි බලාසිටියෙමු. තම මවිතය පළකරන හඬක් එක්වරම මුවෙන් පිට කළ හෝම්ස් මා ඇමතීය.

"වොට්සන්. අර ඔබේ මිත්‍රයා කර්නල් හේටර් නේද? ඔහු තවම අපව දැක්කෙ නෑ. ඔහුව අඬගහගමු මේ මැදිරියට."

"දෙවියනේ හේටර් නේන්නං" මම කීවෙමි. "සරේවල ස්ථිර පදිංචි කාරයා මේ කොහේ යනවද?"

දුම්රිය කවුළුවෙන් ඉහළට මගේ අත දිගුකොට මම ඔහුට සංඥා කළෙමි.* මගේ සංඥාව දුටු හේටර් වහා අප සිටි මැදිරිය වෙත දිව ආවේය.

"ඔබ දෙදෙනා අතරට මේ විදියට කඩාවැදීමෙන්, ඔබේ සාකච්ඡා වලට බාධාවක් නොවේවි කියල මං හිතනවා" කර්නල් හේටර් කීවේ අප දෙදෙනාට උණුසුම් ලෙස අතට අත දෙමිනි. "බොහොම කාලයකට පස්සෙ හරි, ඔබ දකින්න ලැබුණු එක මොනතරම් සන්තෝෂයට කරුණක්ද"

"ඔබ දකින්න ලැබීම ගැන අපටත් ඒ වගේම සන්තෝෂයි" මම කීවෙමි. "සරේ ප්‍රාන්තයේ පදිංචි ඔබ මොනවද මේ ගමේ..... මොකද්ද මේකෙ නම? ඇපල්හැම්. මෙහේ මොනවද කරන්නෙ?"

"මෙතැනින් හැතැක්ම හතරක් පමණ රට ඇතුළට වෙන්න, මගේ සහෝදරයාට අයිති ගොවිපොළක් තියෙනවා. එහේ නිවාඩුවක් ගත කරන්න එන්න කියලා, ඔහු මට ආරාධනා කරන්නේ බොහොම කාලයක ඉඳල. මං ඒක හැමදාමත් කල් දමමින් හිටියා. ඊළඟට ඔහුගේ දුව විවාහ ගිවිස ගැනීමේ උත්සවයත් ගිය සතියේ පැවැත්වුණා. ඒ ඔක්කොම අල්ලලා මං එහේ ආවා. නමුත් අද රෑම මං පිටත්වී යායුතු තවත් ගමනක් තියෙනවා. මං දැන් මේ යන්නෙ ඒ සඳහා"

---

*රයිගේට් ප්‍රහේලිකාව මගේ මිත්‍ර හෝම්ස් විසින් විසඳන ලද්දේ අප කර්නල් හේටර්ගේ නිවසේ නිවාඩුවක් ගත කරද්දී බව ඔබට මතක ඇතුවා නිසැකය.

"ඔබේ ඒ ගමන මොකක්ද කියලා අපි විමසන එක හොඳ නැහැ. එහෙම නේද හේටර්" මා කීවේ සිනාමුසු මුහුණෙනි.

"අපොයි ඔව්" හෝම්ස් එය අනුමත කළේය.

ඒ ගමන මොකක්ද කියලා ඔබට කියන්න බැරිකමක් නැහැ" කර්නල් හේටර් කිය. "මා මේ දුම්රියෙන් යන්නේ බැඩ්ස්හැම් මංසන්ධිය දුම්රියපොළට විතරයි. එතැනින් මා අල්ලා ගන්නවා බෝට්ටු දුම්රිය - ඇම්ස්ටඩෑම් වෙත යාමේ අරමුණෙන්"

"ඇම්ස්ටඩෑම්? ඕලන්දයට?"

"ඔව්. ඒ කාරණය ඔබට කියුවාට කමක් නෑ." හේටර් කිය. "දියමන්ති කපා ඔපදැමීම ඉහළම තත්ත්වයෙන් කෙරෙන්නේ, ඇම්ස්ටඩෑම් වලදි බව ඔබ දන්නව නේ. දකුණු අප්‍රිකාවෙන් එංගලන්තයට එන රළු දියමන්ති මිලදී ගන්නා අයට, ඒවා අරගෙන ඇම්ස්ටඩෑම් යන එක අනිවාර්යයි. මමත් දැන් කාලයක සිට ඒ ව්‍යාපාරයට සම්බන්ධ වෙලයි ඉන්නේ. අද රෑ යන බෝට්ටු දුම්රියෙන්, අපේ මිත්‍රයන් කිහිපදෙනෙකුම ඇම්ස්ටඩෑම් යනවා. ඔවුනට එකතු වෙන්නයි මගේ බලාපොරොත්තුව"

"කොයිතරම් හොඳද" හෝම්ස් කිය. "අපි නම් මේ යන්නේ වෝමිංටන්වලට. මගේ මිත්‍ර දොස්තර වොට්සන්, මට බරපතළ වැඩ ඇතිව සති දෙකක සිරදඬුවමක් නියම කළා."

"හැබෑට?"

"හේටර්. ඔබ දන්නවානේ විශේෂඥ වෛද්‍ය ක්වින්සි මොන්රෝ" මම කිවෙමි. "ඔහුයි හෝම්ස්ට හිරදඬුවම නියම කළේ. මා නොවෙයි. ශරීර සෞඛ්‍යය ගැන හිතල සති දෙකක නිවාඩුවක් හෝම්ස්ට අනිවාර්යයෙන්ම අවශ්‍යයි කිව්වේ මොන්රෝ"

"මගේ ගෙදර නිවාඩුවක් ගතකරන්න ඇවිල්ලත්, හෝම්ස් මහත්මයාට සිදුවුණේ විවේක ගන්න නොවෙයි; ගැටලු විසඳන්න." කර්නල් හේටර් කිය. "මේ සැරෙත් එහෙම වේවිද දන්නෙ නැහැ නේද?"

"මේ සැරේ නම් එහෙම දේකට මං කොහොමටවත් ඉඩ දෙන්නෙ නෑ" මම කිවෙමි. "මෙවර නිවාඩු ගැනීම අනිවාර්යයි"

"වොට්සන් මගේ මිත්‍රයා. ඔබ දුටුවාද මේක?" හෝම්ස් කීවේ දුම්රිය මැදිරියේ රාක්කයෙන් තම ඇඳුම් බෑගය පහළට ගෙන ඒ තුළින් කුඩා පෙට්ටියක් එළියට ගනිමිනි"

"දෙයියෝ සාක්කි!" මට කෑගැසිණ.

"ඔබ කොයි වෙලාවෙද මේක ඇඳුම් බෑගයට දමාගත්තෙ? මං දුටුවෙ නෑ?"

"මගේ හිතවත් මිත්‍රයා" හෝම්ස් කීය. "අපි පිටවී එන්න කලින් ඔබ හඩසන් මහත්මිය සමඟ මිනිත්තු දහයක් පමණ කථා කරමින් සිටියා මතකද?"

"ඔව්. ඇයගේ ආමාශයේ ඇවිල්ලක් ඇතිවෙන්න පටන් අරගෙන." මම කීවෙමි. "ඒකට හේතුව ඇයගේ සන්දිවල වේදනාවට ඇය අලුතෙන් පාවිච්චි කරන වේදනා නාශක ඖෂධ. මේ අලුත් වෛද්‍යවරු ප්‍රබල වේදනා නාශක රෝගීන්ට නියම කරන්නේ කිසිම වග විභාගයක් නැතුව......"

"එකෙන් වාසියක් වුණේ මටයි" හෝම්ස් කීය.

"ඒ කොහොමද?"

"ඔබ හඩසන් මහත්මිය සමඟ කථාකරද්දී, මං මේ පෙට්ටිය ඇඳුම් බෑගයට දමා ගත්තා" හෝම්ස් කීවේ දඟකාර අයුරෙන් සිනාවෙමිනි. "කර්නල් හේටර්, මේ පෙට්ටියෙ තමා අපරාධ පරීක්ෂණ සඳහා මට ප්‍රයෝජනවත් වෙන මූලික උපකරණ මං දමාගෙන යන්නෙ. සියුම් දේ පරීක්ෂාවට ප්‍රබල කාච, කුඩා දේ අල්ලන අඬු, මං සොයාගන්නා සියුම් දේවල් ආරක්ෂිතව නිවසට ගෙන යෑම සඳහා අවශ්‍ය වෙන කඩදාසි කවර, මේක පැරිස් බදාමය, පස් මත ඇති පා සටහන්, ලාංඡන උපුටා ගෙන යාම සඳහා, ගෙන යා යුතු දේ ද්‍රවයක් නම් ඒ සඳහා කුඩා බෝතල්, හදිසි පරීක්ෂණ සඳහා අත්‍යවශ්‍ය රසායනික ද්‍රව්‍ය, යතුරු දමා තිබෙන දොරවල් ඇරීමට හොර යතුරු, ඉස්කුරුප්පු නියන්, වෙස් මුහුණු......"

කතාවෙන් කතාවෙන් අපි බැඩ්ස්හැම් දුම්රිය පොළටත් ඇවිත්" කර්නල් හේටර් කීවේ තම ඇඳුම් බෑගය රාක්කයෙන් ඉවතට ගනිමිනි." ඔබ දෙදෙනාත් මෙතැනදී බැහැලා වෙනත් දුම්රියකට නගිනවා නේද?"

"ඔව්. වෝම්ංටන් දුම්රිය ගමන්කරන්නේ ශාඛා දුම්රිය මඟක නේ. ඒක පටන්ගන්නේ බැඩ්ස්හැම් වලින්"

මැදිරියේ විවෘත කරන ලද දොරකින් අපි වේදිකාවට පා තැබුවෙමු. දුම්රිය ස්ථානයේ යම්කිසි අසාමාන්‍ය කැලඹිලි සහිත දෙයක්, මේ දැන් සිදුවී ඇති බව හෝ සිදුවෙමින් පවතින බව, මේ වෙලාවේ අපට පෙනී ගියේය. දුම්රිය පොළේ සුළු සේවකයන් සැමදෙනාම

පාහේ ද දුම්රිය මගීන් විශාල සංඛ්‍යාවක් ද වේදිකාවේ එක් කෙළවරකට එකතුවී සිටි බැව් අපි දුටුවෙමු. ඔවුන් සැමදෙනෙකුම පාහේ තම අවධානය යොමු කරගෙන සිටියේ, වේදිකාවෙන් එක් කෙළවරකින් එපිට, ඈත ඝනාන්ධකාරය වෙතයි.

"ඇයි මොකක් හරි ප්‍රශ්නයක්ද?" කර්නල් හේටර් විමසුවේ එතැන සිටි දුම්රිය සේවයට අදාළ නිලධරයෙකුගෙනි.

"ඔව් මහත්මයා" ඒ නිලධරයා කීය. "මෙහේට හැතැක්මක් විතර ඈත තැනක දී, මිනිහෙක් බඩු කෝච්චියකට යට වෙලා. මැස්සක් රැගත් පෝටර්වරුන් දෙදෙනෙකු එක්ක, දුම්රිය ස්ථානාධිපතිතුමා එතැනට ගියා. මය ලන්තෑරුමක එළියක් පෙනෙනවා නේද? මං හිතන්නේ ඒ ඔවුන් ආපහු එනවා"

දෙනෙත් ඒ දිශාවට යොමු කරගෙන අපි බලා සිටියෙමු. දෙපසට පැද්දෙමින් තිබූ ආලෝකය ඉක්මනින්ම අප වෙත ළඟාවිය. ඉදිරියෙන්ම පැමිණියේ ලන්තෑරුමක් අතින් ගත්, නිල ඇඳුමෙන් සැරසී සිටි දුම්රිය ස්ථානාධිපති වරයා ය. දිගු මැස්සක් ඔසවා ගත් සේවකයන් දෙදෙනා පැමිණියේ ඒ පිටිපසිනි. ජල-රෝධක ටාපෝලින් රෙද්දකින් මැස්ස ආවරණය කොට තිබිණ. යටින් වූ මිනිස් සිරුරක හැඩරුව එහි දැකිය හැකි විය. හැකිළු කුඩයක් හා අත්බෑගයක් දුම්රිය ස්ථානාධිපතිවරයා අතේ තිබිණි. ඔවුහු අප පසුකොට "ලාම්පු-කාමරය" නමින් හැඳින්වුණු කාමරය වෙත ගමන්ගත්හ.

"ඒ දුම්රියට යටවුණු මිනිහගෙ කුඩයද මේ?"

අපේ මිත්‍ර කර්නල් හේටර් විමසුවේ මැස්සේ පිටිපස කෙළවර ඔසවාගෙන ගමන්ගත් සේවකයාගෙනි.

"ඔව් මහත්මයා"

"කෝ බලන්න" කී හේටර් "ලාම්පු කාමරය" වෙත ගොස් කුඩය පරීක්ෂා කළේය. අපි ද ඔහු වෙත ළංවූයෙමු.

"දෙයියන්ට ඔප්පු වෙච්චාවෙ!" හේටර්ට කෑගැසිණ. "මේක ලොම්බාඩිගේ කුඩේ. මට පුළුවනි ඒ ගැන දිවුරන්න වුණත්. ඔබ අඳුනනවා නේද එස්රා ලොම්බාඩි?" හේටර් අන්තිම ප්‍රශ්නය ඉදිරිපත් කළේ ෂර්ලොක් හෝම්ස්ටයි. එහෙත් මගේ මිත්‍රයා එසේ නොවන බව හැඟවූයේ හිස දෙපසට සොලවමිනි.

මීළඟට කර්නල් හේටර් දුම්රිය සේවකයා ඇමතුවේ අවධාරණාත්මක හඬකිනි.

"මේ කුඩය අඳුනාගන්න හැකිවුණා කියල ඔබේ මහත්තයට කියන්න. මොකද අයිතිකාරයා එස්රා ලොම්බාඩි කියල මං අඳුනන මහත්මයෙක්. ඔබට පුළුවන් වුණාද ඔහුගේ තොප්පිය හොයාගන්න? ඒකෙ ඇතුළු පැත්තෙත් ඒ නම ඔබට දකින්න පුළුවනි. ඔහු හැමවිටම තමන්ගේ නම තොප්පියේ ඇතුළු පැත්තේ ලියනවා"

"ඔහුගේ තොප්පිය නම් අපට තවමත් හම්බවුණේ නෑ" සේවකයා පිළිතුරු දුන්නේය. "ආ මේ එන්නේ ස්ථානාධිපතිතුමා......මහත්මයා. මේ මහත්තයට පුළුවන්ලු කුඩය අඳුනාගන්න"

"ආ.....ඔබට හැකිවුණාද ඔහුගේ කුඩය අඳුනාගන්න? එහෙනම් කරුණාකරලා ලාම්පු කාමරයට ඇවිත් මිනිය හඳුනාගන්න පුළුවන්ද බලන්න?"

කර්නල් හේපර් ගේ තැලුණු මුහුණ තවත් සුදුමැලි විය. ඔහු ඉදිරියට යාමට පසුබට වූ ආකාරය මම දුටුවෙමි. "එයාට හුඟක් තුවාල සිදුවෙලාද?" ඔහු අත්තිමේදී විමසුවේය.

"තුවාල තේන්නම්. එත්ජමයි, කෝච්චි පෙට්ටි හයකුයි සිරුර උඩින් ගියාට පස්සෙ තමයි, කෝච්චිය නවත්වා ගන්න හැකිවුණේ. වැඩිපුර තුවාල තැනුවම හිස කඳෙන් වෙන්වෙලා"

"දෙවියනේ! මොන අපරාධයක්ද!" හේපර්ට කියැවිණි. "මට ඔය වගේ දර්ශන බලන්න අමාරුයි. මා නොබැලුවට කමක් නැහැ නේද?"

"එහෙම කියන්න එපා" හෝම්ස් කීය. "මළසිරුරක් අඳුනාගනිද්දී ඒක හැකි ඉක්මනින්ම කරන එක තමයි වඩාත් හොඳ"

"හොඳයි. එහෙම නම් මං ඔබේ කීමට එකඟ වෙන්නම්. වෙන මොනවා කරන්නද" කී හේපර් දුම්රිය ස්ථානාධිපතිවරයා පසුපස ලාම්පු කාමරය වෙත ගියේය. ඒ බලවත් නොකැමැත්තෙන් බැව් අපි දුටුවෙමු.

දුම්රිය ස්ථානයේ සීනු උස් හඬින් නාදවීමට පටන් ගත්තේය. ඒ බෝට්ටු දුම්රිය ළඟ එන බවට සංඥාවකි. මෘතශරීරය පරීක්ෂා කිරීමට හේපර් ගතකරන්නට ඇත්තේ සුළු කාලයක් විය යුතුය. කම්පාවට පත් මුහුණෙන් එළියට කඩා වැදුණු ඔහු ළංවූයේ හෝම්ස් වෙතටයි.

"ඔහු තමයි! ඔහු තමයි! දෙවියනේ ඒ එස්රා ලොම්බාඩි තමයි. මොකක්ද මේ සිදුවෙලා තියෙන අපරාදෙ. අපි දෙන්නා මේ දුම්රිය පොළේදී අද හවස හමුවෙමු කිව්වේ ඔහු. ඒ අපි දෙන්නා එකට ඇම්ස්ටඩෑම් යන්න. අපි නවතින්න හිටියෙත් එකම හෝටලේ.

දෙවියනේ! මොකද්ද මේ සිද්ධවුණේ? දැන් මං කළයුත්තේ මොකද්ද කියල මට හිතාගන්නවත් බෑ" කර්නල් හේටර් නොනවත්වාම දෙඩෙව්වේ දරාගත නොහැකි ශෝකයකිනි.

"කපා ඔප දැමීමට ගෙන යන දියමන්ති මොනවා හරිත් ඔහු ළඟ තිබුණද?" හෝම්ස් විමසීය.

"කිසිම සැකයක් නෑ. ඔහු ළඟ තියෙන්න ඇති" හේටර් කීය. "ඒව හරියටම මොනවද, කොයිතරම් ප්‍රමාණයක්ද කියන එක නම් මම දන්නෙ නෑ. ඒක හරියටම දන්නවා ඇත්තෙ, ඔහුගේ කාර්යාලයේ ලිපිකරුවො. ඒක නෙමෙයි හෝම්ස් මහත්මයා. ඔබට පුළුවන්ද මට උදව්වක් කරන්න? මා වෙනුවෙන් මේ මරණය ගැන වැඩිදුර හොයාබැලීමක් කරන්න ඔබට පුළුවන්ද? මේක හදිසි අනතුරක්ද කියන කාරණය සැක හැර දැනගන්නයි මට උවමනා. කියන්න බැහැනෙ දැන් කාලෙ. ඔහු වෙත මගේ කෘතඥතාවය දැක්වීමට එහෙම දෙයක්වත් මා කළ යුතුයි."

"ඒක කරන්න බැරි කමක් නෑ" හෝම්ස් කීය. "එතකොට ඔබ ඇම්ස්ටඩෑම් වෙත යන ගමන වෙනස් කරන්නේ නැද්ද?"

"එහෙම කරන්න හැටියක් නැහැ හෝම්ස් මහත්මයා. දියමන්ති ඔපදමන තැන්වලට අපි විශාල මුදල් ප්‍රමාණ ගෙවා, දින සහ වේලාවත් කල්තබා වෙන්කර ගෙනයි ඉන්නෙ. ඒ කටයුතු කලට වේලාවට කර නොගත්තොත් මහා ප්‍රශ්නයක් වෙනවා. ළඟදීම බ්‍රසල්ස් නුවර දී, වෙළඳ සල්පිලක් හා වෙන්දේසියක් පැවැත්වීමට නියමිතයි. ඒකට මං සූදානම් වෙන්නේ අවුරුදු දෙකක ඉඳලා....."

"හරි හරි මට තේරෙනවා. ඔබ ගියාට කමක් නෑ" හෝම්ස් කීය. "ඔහු ඔබේ සමීප මිත්‍රයෙක්ද?"

"ඔව් මහත්මයා. අපි දෙන්නා දීර්ඝ කාලයක ඉඳන් මිත්‍රයෝ. ඔබ දන්නවානේ වොට්සන්, හමුදාවෙන් ලැබෙන විශ්‍රාම වැටුපෙන්, ජීවිතය ගැටගහගන්න මොනතරම් අමාරුද කියලා. ඉතින් එහෙම ඉන්න කොට මේ ක්ෂේත්‍රය ගැන මට කියා දීලා, මට උගන්නලා, අත හිත දුන්නේ, මේ එස්රා ලොම්බාඩි නම් මිත්‍රයා. ඒ ගැන අදටත් මං ඔහුට ණය ගැතියි."

"හොඳයි" හෝම්ස් කීය. "මේක ඔබ වෙනුවෙන් මං ගැඹුරින්ම විමසා බලනවා. අප කළේ මොනවද, අපට සොයාගැනීමට හැකිවුණේ මොනවද කියල, මං වොට්සන් ලවා සම්පූර්ණ වාර්තාවක් ලියවන්නම්. අපි එහෙම කළොත් හරිද?"

"ඇත්තෙන්ම ඔව් මහත්වරුනි." හේටර් කිවේ ළඟ එන දුම්රියට නැඟීමට සූදානම් වෙමිනි. "ෂර්ලොක් හෝම්ස් මහත්මයා. මගේ හිතවත් වොට්සන්. ඔබ දෙදෙනාටම අනේක වාරයක් ස්තුතියි. මෙය භාරගන්න කැමතිවීම ගැන. ඔන්න දුම්රිය එනවා"

එසේ කියා අප දෙදෙනාටම හිස නමා ආචාර කළ කර්නල් හේටර්, තවත් මොහොතක්වත් පමා නොවී වේදිකාවේ ඉදිරියට දිව ගියේය.

කර්නල් හේටර් රැගත් දුම්රිය පිටත් වී ගිය පසු. අපි දුම්රිය ස්ථානාධිපතිවරයා හමුවීමට ගියෙමු. හේටර් අපට භාරදුන් වගකීම පිළිබඳව ඔහුට දැනුම් දුන්නෙමු. කෙසේ වෙතත් පොලීසිය පැමිණෙන තෙක් තමා කිසිවක් නොකරන බව හෝම්ස් ඔහුට පැවසුවේය.

"ඒක ඇත්ත මහත්වරුනි. පොලීසිය එනතෙක් අපට කිසිවක් කරන්න අවසර නැහැනෙ. මං පොලීසියට පණිවුඩයක් යවලයි තියෙන්නේ. ඔවුන්ගේ නිලධරයෙක් කොයි මොහොතේ හරි මෙහාට ඒවි"

පොලිස් භටයෙකු මෙහි පැමිණීමට සෑහෙන වේලාවක් ගතවෙනු ඇතැයි හෝම්ස් අනුමාන කළේය. එතෙක් කාලය ගත කිරීම සඳහා පිරිමි විවේකාගාරයේ, සෙනඟ නොමැති ඈත කෙළවරක් වෙත අපි ගියෙමු.

"මේ වගේ මරණයක් තුන් ආකාරයකට සිදුවෙන්න පුළුවන් වොට්සන්" හෝම්ස් කිවේ සැපපහසු පුටුවක හිඳගනිමිනි. "හදිසි අනතුරක්, දිවි නසා ගැනීමක් සහ මිනීමැරුමක්. අපට ලැබෙන හෝඩුවාවන්, සාක්ෂි මගින්, මරණය සිදුවුණේ මෙයින් කොයි එක නිසා ද කියන එක, අපට තීරණය කරන්න සිදුවෙනවා. මෙහිදී අපට ලැබෙන හෝඩුවාවන් තුන් ආකාරයකින් අප සලකා බැලිය යුතුයි. පළමුවෙන්ම සිද්ධිය ගැන අපට ලැබෙන සාමාන්‍ය දත්ත. දෙවැන්න මළ සිරුර පරීක්ෂා කිරීමෙන් අපට ලබා ගැනීමට හැකි විශේෂ දත්ත. ඊළඟට තුන්වනුව මරණය සිදුවුණු ස්ථානය පරීක්ෂා කිරීමෙන් ලබාගත හැකි දත්ත.

මුලින් අපි හිතාබලමු අපට ලැබී තිබෙන සාමාන්‍ය දත්ත ගැන. මියගිය පුද්ගලයා ධනවත් දියමන්ති වෙළෙන්දෙකු බව අපට අහන්න ලැබුණා. ඔහු යමින් සිටියේ ඕලන්දයේ ඇම්ස්ටඩෑම් නුවරට. ඒ, තමා ළඟ තිබූ දියමන්ති කපා ඔපදමා ගැනීමේ කටයුත්තකට විය යුතුයි. ඔහුගේ බෑගයේ, එහෙමත් නැත්නම් ඇඳුමේ සාක්කුවල, සඟවාගෙන,

වටිනාකමෙන් අධික දියමන්ති යම් ප්‍රමාණයක් ඔහු ගෙනගියා කියල අපට හිතන්න පුළුවනි. අපි එහෙම නිගමනයකට ආවාම, මුලින් අප කළ උපකල්පන වලට ඒකෙන් යම් බලපෑමක් වෙනවා. ඒ මොකද්ද? මේක සියදිවිනසා ගැනීමක් විය හැකියි කියා අප කළ උපකල්පනය, ඉතාම දුර්වල එකක් වී නොවැදගත් වෙනවා. අනික් අතට මේක මිනීමැරුමක් වියහැකියි කියා අප කළ උපකල්පනය, හුඟක් ප්‍රබල වී ඒකට වැදගත් තැනක් ලැබෙනවා.

මේක හදිසි අනතුරක් වීමට ඉඩ ඇතැයි කියා හිතන්න පුළුවන් හේතු කාරණා මොනවාද? මෙතැන ගේට්ටුවක් සහිත ආරක්ෂිත ප්‍රවේශයක් තිබීම; මෙතැන ගේට්ටුවක් නොමැති අනාරක්ෂිත ප්‍රවේශයක් හෝ මංසන්ධියක් තිබීම. තමන්ගේ නිවස, මන්පැන් හලක් හෝ අවන්හලක් එතැන තිබීම. ඒ හේතු නිසා මේ පුද්ගලයා එතැනින් දුම්රිය මගට පිවිසීම. මියගිය පුද්ගලයාගේ නිවස ඔය හරියේ නැති බව අපි දන්නවා. නමුත් අනික් කාරණා කිසිවක් තවමත් දන්නේ නැහැ. ඒ නිසා ඒ ගැන කාරණා තවදුරටත් හොයාගන්න තුරු, ඒක තව ටික වේලාවකට කල් දමන්න අපට සිදුවෙනවා"

"ඇයි හෝම්ස්." මම කිවෙමි. "අර කුඩය, බෑගය සමඟ මළසිරුර ඔසවාගෙන ආ දුම්රිය සේවකයා මෙහි ඇතිනෙ. අපි ඔහුගෙන් විමසා බලමු. තමන් දන්නා දේවල් කියන්න ඔහු ඇත්තේ නොඉවසිල්ලෙන්"

"ඒක හරි. මේක ගැන ඔබට මතක් වුණු එක අපට වාසියක්. බලමු අපට කීමට ඔහු දන්නේ මොනවද කියලා."

ඔහුගේ රාජකාරි කාලය ඒ වනවිටත් අවසන් වී නොතිබුණු නිසා, ඩග්ලස් නම් එම දුම්රිය පෝටර්වරයා හමුවීමට අපට හැකිවිය. පැයකට දෙකකට පෙර තමා අත්දුටු ඛේදජනක සිදුවීම ගැන, තමා දැන සිටි දේ කීමට ඔහු සිටියේ නොඉවසිල්ලෙනි.

"ඒක සිද්ධවුණේ මේ විදියට තේ මහත්මයා" ඩග්ලස් කීය. "හරියටම මේක සිදුවුණු තැන රේල්පාරේ ලොකු වංගුවක් තියෙනවා. බඩු කෝච්චිය ඒ වංගුව අරගත්ත කොටම තමයි රියැදුරාට ඒක දකින්න ලැබිල තියෙන්නෙ"

"ඒක කිව්වේ මොකද්ද?"

"රේල් පාර හරහා යමක් හෝ කෙනෙක් වැටිල උන්නු හැටි. වංගුව අරගත්ත ගමන්, එන්ජිමේ මහ ලාම්පුවෙ එළිය වැටුණේ කෙළින්ම රේල් පාරට. ඔහු ඒ මොහොතෙම දුටුවා මේ මිනිහෙක්

බව. රියැදුරා වහාම පිස්ටනයට යන වාෂ්ප නළය වහලා නලාව හැඬෙව්වා. ඒ ගමන්ම තිරිංග වහාම තද කළා. නමුත් ඔබ දන්නවනෙ. ඔබට හිතාගන්න පුළුවන් නේ පෙට්ටි දහයක් දොළහක් තියෙන බඩු කෝච්චියක බර. මේ අසරණයා උඩින් එන්ජිමයි බඩු පෙට්ටි හයකුයි ගියාට පස්සෙ තමයි කෝච්චිය නවත්වාගන්න පුළුවන් වුණේ"

"කෝච්චියේ රියදුරා මේ ගැන ඔබත් එක්ක කථා කළාද?"

"ඔව් මහත්මයා. මාත් එක්ක විතරක් නෙමෙයි, අපි හැමෝටම කිව්වා. අපේ ස්ථානාධිපතිතුමා ඉස්සරහ නේ මෙව කිව්වේ"

"මේ මිනිහ රේල්පාරෙ වැටිල හිටි පිළිවෙළ රියැදුරා හරියටම දැකල තිබුණද?"

"ඔව්. මහලාම්පුවෙ එළිය කෙළින්ම වැදුණේ රේල්පිලිවලටලු. ඔහු වැතිරී ඉඳල තියෙන්නේ, හරියටම බෙල්ල රේල් පීල්ල උඩ තිබෙන විදියට, මුනිං අතට. ඔහුගේ ඔළුව කොටස රේල් පීලි දෙක අතරට තිබ්බ්න. ඇඟ හරිය සිල්පර කොටන් උඩයි, රේල් පාරෙන් එළියටයි තියෙන විදියට. ඒකෙත් තේරෙන්නේ ඔහු හිතාමතාම මේ විදියට රේල්පාරේ වැතිර හිටි බව"

"ඔතන රේල් ගේට්ටුවක් නොමැති අනාරක්ෂිත තැනක්ද?"

"නෑ මහත්මයා. එතන පාරක් කිසිම එකක් නෑ. ඒ හින්දා රේල් ගේට්ටුවක් නෑ. අනාරක්ෂිත පිවිසුමක් නෑ. වෙන එකක් තියා කඩයක්වත් නෑ. තැබෑරුමක් නෑ. කිසිම දෙයක් නෑ. අනික ඔය හරියේ පාර දෙපැත්තේම අඩි පහක් උසට රේල් පීලිවලින් ගහපු වැටවල් තියෙනවා. ඒ නිසා රේල් පාරට යෑම ලේසි නෑ. ගියා නම් ඔහු ඒ වැටක් උඩට නැගලා රේල්පාර පැත්තට පනින්න ඇති. ඔහු ජීවිතය නැතිකරගන්න හිතාමතාම කටයුතු කරලා"

"මෙතරම් තොරතුරු ඔබ දැනගත්තේ කොහොමද?" හෝම්ස් විමසීය.

"ඇයි මහත්මයා. රියැදුරයි එයාගෙ දෙවැනියයි, රේල්පාරට බැහැල මිනිය එතැනින් ඉවත් කරානේ. ඊළඟට එයාලා ළඟම තිබුණු සංඥා පෙට්ටියට ගිහින්, දුම්රියපොළට සංඥාවක් එව්ව නේ. අපි රේල්පාර දිගේ ඇවිදගෙන යද්දී ස්ථානාධිපතිතුමා මේ ඔක්කොම අපට කිව්වා"

අපි ඔහුට ස්තුති කොට ලාම්පු කාමරය දෙසට ගමන් කළෙමු.

"එක් කාරණයක් ගැන නම් මේ මිත්‍රයා සියයට සීයක් නිවැරදියි" හෝම්ස් කීය. "මේක හදිසි අනතුරක් වෙන්න බැරි බව ඔහු කියූ

කරුණු වලින් සනාථ වෙනවා. මේ අනතුරට පත් පුද්ගලයා එක්කො ළඟ පමණක් පෙනෙන, දුර නොපෙනෙන දෘෂ්‍යාබාධිතයෙක් වෙන්න ඕන. නැත්නම් බිහිරි හෝ මන්ද බුද්ධික කෙනෙකු වෙන්න ඕන. එහෙම වුණා නම් ඔහු අර වැටට නැගලා, දුම්රිය පාරට පිවිසිලා, දුම්රියේ හැපුණා වෙන්න පිළිවන්. එහෙමත් නැතුව මේ පුද්ගලයා රේල්පීලි හරහා වැතිර හිටි බව, අපි කොහොමද තේරුම් කරන්නෙ? අර දුම්රිය සේවකයා කියන්න වගේ එක්කො මේක දිවිනසාගැනීමක්.

එහෙමත් නැත්නම්, ලොම්බාඩ් මහත්මයා රේල්පීලි උඩ වැතිර උන්නු වෙලාවෙ, ඔහු ඉඳලා තියෙන්නේ මියගිහින්. නැතිනම් ඉඳලා තියෙන්නේ සිහිසන් නැතුව. මෘතශරීරය දකින තුරු තවත් උපකල්පනවලට එළඹීම අපි තාවකාලිකව නවත්වමු. දුම්රිය ස්ථානාධිපතිතුමා සහ පොලිස් නිලධරයෙක් මේ එන්නේ. මොනවද ඔවුනට කියන්න තියෙන්නේ කියල අපි අහල බලමු"

මෙම මරණ පරීක්ෂණයට හවුල්වීමට බාහිර පුද්ගලයෙකුට ඉඩ නොදීමට පොලිස් නිලධරයා මේ වනවිටත් තීරණය කොට අවසන්ය.

"ප්‍රදේශයේ අධිකරණ වෛද්‍යවරයා, මියගිය තැනැත්තාගේ පශ්චාත් මරණ පරීක්ෂණය සිදු කරණු ඇති බවත්, තොරතුරු අවශ්‍ය කෙනෙකු සිටී නම්, ඒවා ඔහුගෙන් ලබාගත හැකි බවත් අප වෙත දන්වා සිටින ලදී.

මේ අවස්ථාවේ හෝම්ස්, තමා පෞද්ගලික රහස් පරීක්ෂකවරයකු බව සඳහන් හැඳින්වීමේ පත්‍රය ඉදිරිපත් කළේය.

"මං කලිනුත් දුම්රිය ස්ථානාධිපති තුමාට කිව්වා වගේ, මං පෙනී ඉන්නේ මියගිය පුද්ගලයා වෙනුවෙන්. ඔහු හැටන් උද්‍යානයේ සුප්‍රසිද්ධ දියමන්ති වෙළෙන්දෙකු වන එස්රා ලොම්බාඩ් බවට, ඔහුගේ මිත්‍රයෙකු විසින් හඳුනාගෙන තිබෙනවා."

මීට එරෙහිව තමාට කළ හැකි දේ අල්ප බව පොලිස් නිලධරයා වටහා ගත්තේය. සමහරවිට ෂර්ලොක් හෝම්ස් යන නම ඔහු මීට පෙර අසා තිබෙන්නට ඇත. කෙසේ වෙතත් ඒ බවක් නොපෙන්වූ ඔහු, හෝම්ස්ගේ කටයුතුවලට බාධා කිරීමට උත්සාහ නොකළ බැව් කිවයුතුය.

මළසිරුර ගෙන ආ මැස්ස තබා තිබුණේ, එක් බිත්තියකට සමීප වන්නටයි. කෙසේ වෙතත් එම ඛේදජනක දසුන තවමත් ටාපෝලින් රෙද්දෙන් ආවරණය වී තිබිණ. මියගිය තැනැත්තාගේ අත් බෑගය

සහ කුඩය ලොකු පෙට්ටියක දමා තිබූ අතර ඔහුගේ වීදුරු බිඳී ගිය උපැස් යුගල කුඩා පෙට්ටියක දමා තිබිණ.

"මේ කණ්ණාඩි කුට්ටම හමුවුණෙත් මිනිය ළඟ තිබිලද?" හෝම්ස් විමසීය.

"ඔව්" දුම්රිය ස්ථානාධිපති තුමා කීය. "කණ්ණාඩි කුට්ටම තිබුණේ ඔහුගේ හිසට කිට්ටුවෙන්. සිල්පර කොටන් අතර ගල් මත කණ්ණාඩියේ වීදුරු කැබැලි විසිරී තිබුණා."

තම කුඩා සටහන් පොතේ හෝම්ස් එම කරුණ ලියා ගත්තේය. මීළඟට පොලිස් නිලධරයා, සිරුර වසා තිබූ රෙද්ද ඉවත් කළේය. තමා අතේ තිබූ ලන්තෑරුමේ ආලෝකය ඔහු හොඳින් ලබා දුන්නේ එය මෘත ශරීරය වෙත ළංකරමිනි. කවුරුත් නිශ්ශබ්දව බලා සිටියේ අවතැන්ව තිබූ හිස සහ විකෘතව තිබූ ගාත්‍රා දෙසයි. මගේ කනට තම මුව ළං කළ හෝම්ස් මෙසේ කීය.

"මං හිතන්නේ අපේ උපකල්පන තුනෙන්, දෙකක්ම අපට බයනැතුව ඉවත් කරන්න පුළුවනි"

පොලිස් නිලධරයා මේ මොහොතේ හෝම්ස් දෙස බලා සිටියේ, ඔහු පැවසූ දේ හරිහැටි තේරුම් ගැනීමට නොහැකිවය. මීළඟට තම බෑගයේ තිබූ කුඩා පෙට්ටිය අතට ගත් හෝම්ස්, කුඩා දේ අල්ලන ට්වීසරයක් එළියට ගත්තේය.

"මහත්මයා. ඔබ දන්නවානේ" පොලිස් නිලධරයා කීවේ හෝම්ස්ගේ කටයුතු වලට තමා බාධාකරන බව හඟවමිනි. "පශ්චාත් මරණ පරීක්ෂණයක් කරන්න අපට තවමත් අවසර ලැබිල නෑ"

"ඔව්. මා ඒ කාරණාව දන්නවා" හෝම්ස් කීය. "මට උවමනා ඔහුගේ කට ඇතුළ පරීක්ෂා කර බලන්න පමණයි. වොට්සන් ඔබට පුළුවන්ද මගේ පෙට්ටියෙන්, කුඩා දේ ලොකුවට පෙනෙන අවතල දර්පණය සහිත දන්ත කැටපත එළියට ගන්න?"

දන්ත වෛද්‍ය කැටපත රෝගියාගේ මුවතුළට ඇමූ හෝම්ස්, තම හිසේ සවිකර තිබූ දීප්තිමත් පහනේ ආලෝකය ඒ දෙසට යොමු කළේය. මීළඟට ඔහු අතේ තිබූ උපකරණයෙන් මළසිරුරේ යටි ඇන්දේ හා උඩු ඇන්දේ ඉදිරිපස කෘන්තක දත් මත හා දත් අතර තැන්පත්ව තිබූ යම් යම් දේ එළියට ගත්තේය ඒවා වෙන් වෙන්ව පිරිසිදු කඩදාසි කවරවලට දමන මෙන් ඔහු මගෙන් ඉල්ලා සිටියේය.

"මහත්මයා. ඔබ හොයන්නේ ඔහු කාල තියෙන්නේ මොනවද කියලද?" පොලිස් නිලධරයා විමසුවේ උපහාසාත්මක හඬකිනි.

"ඔහු මැරිලා තියෙන්නේ මන්ද පෝෂණයෙන් නොවෙන බව නම් මට විශ්වාසයි"

"ඒක නම් මාත් දන්නවා. නමුත් ඔබ දන්නවද? මේ වගේ පරීක්ෂණයකදී සෑම් කාරණයක්ම වැදගත් වෙනවා"

"මේ මිනිහා මියගිහින් තියෙන්නේ හිස කඳෙන් වෙන්වෙලා. එතකොට ඔහු කාල තියෙන දේ වැදගත් වෙන්නේ කොහොමද කියන එක නම් මට තේරුම් ගන්න අමාරුයි" පොලිස් නිලධරයා කීය.

"ඔබට ඒකෙ වැදගත් කමක් පෙනෙන්නෙ නැද්ද?" හෝම්ස් විමසුවේය. "මේ බලන්න ඔහුගේ ඇතුළු කබායෙ තැන් තැන්වල රැඳී තිබෙන්නෙ මොනවද කියල. ඒ ඕට්ස් ධාන්‍යය වැඩිවශයෙන් යොදා සකස් කළ විස්කෝතුවක කෑබලි. ඔහුගේ යටි ඇන්දෙ ඉදිරි දත් මත තිබී මට හමුවුණෙත්, එම විස්කෝතු කෑබලිමයි."

"ඒක කිසිම වැදගත්කමක් නැති දෙයක්" පොලිස් නිලධරයා කීය. "මෙතැනදි වැදගත් වෙන්නෙ, ඔහුගේ මරණයට හේතුව කුමක්ද කියන එකයි. ඒක සියදිවි නසා ගැනීමක්ද, හදිසි අනතුරක්ද නැත්නම් මිනීමැරුමක්ද කියන කාරණයයි"

"මොනවද ඔබ මේ කියන කතා?" මගේ මිත්‍රයා පිළිතුරු දෙද්දී ඔහුගේ කටහඬේ උපහාසාත්මක ස්වරයක් ගැබ්ව ඇති බව මම තේරුම් ගතිමි." ඔබ කියන ඔය ප්‍රශ්න දැන් විසඳිලයි තියෙන්නෙ. දැන් අපට විසඳන්න ඉතිරි වී තිබෙන ප්‍රශ්නය: මේ මිනීමැරුම කළේ කවුද, ඒ මොන අරමුණකින්ද කියන එක"

පොලිස් නිලධරයාගේ මුව බාගෙට විවර විය. ඔහු දෙනෙත් හෝම්ස් වෙත යොමුකරගෙනම ඇසිපිය නොහෙළා බලාසිටියේ, අතිශයින්ම පුදුමයට පත් වීලසිනි.

"මහත්මයා. ඔබ කොහොමද ඔය තරම් පහසුවෙන්ම නිගමනයකට ආවෙ?"

"මෙතැන සිදුවී තිබෙන්නේ මිනීමැරුමක් බව ඉතාම පැහැදිලියිනෙ" හෝම්ස් කීය. "මියගිය පුද්ගලයා දියමන්ති වෙළෙන්දෙක්. ඔහු විශාල වටිනාකමක් ඇති දියමන්ති තොගයක්, තමන්ගේ ඇඳුම්වල සඟවාගෙන සිටි බවයි මා සැක කරන්නේ. ඔබ විසින් වහාම කළ යුතු දේ, මේ මළසිරුර සෝදිසිකර බැලීම. මා යෝජනා කරන්නේ එයයි"

"ඔබ කොහොමද එහෙම දෙයක් කියන්නෙ? මියගිය තැනැත්තා දියමන්ති වෙළෙන්දෙක් බව ඇත්තක් කියමු. ඔහු ළඟ වටිනා දේවල්

තියෙන්න ඇති. ඒ නිසා කවුරු හරි ඔහුව මරාදමලා. ඔහොම අනුමාන කරන්න ඕනකෙනෙකුට පුළුවන්." කී පොලිස් නිලධරයා තවත් යමක් එකතු කළේය. "ඒ වුණත් මහත්මයා. ඔබ මේ කාරණයත් මතක තබාගත යුතුයි. අධිකරණ වෛද්‍යවරයා ඒවි. මහේස්ත්‍රාත් තුමෙක් ඒවි. ඊළඟට ඉන්ක්වෙස්ට් විභාග තියාවි. අපි අධිකරණයට වග කියන්න ඕන.

අර ළමයින්ගේ පත්තරවලින් පවත්වන්නේ කතන්දරයක් දීලා අපරාධකාරයා අනුමාන කිරීමේ තරග. මේක ඒ වගේ එකක් නෙමෙයි. මළසිරුර පරීක්ෂා කිරීම ගැන කියනවා නම්, මං මේ කරන්න හදන්නේ ඒ කටයුත්ත තමා"

පොලිස් නිලධරයා මියගිය පුද්ගලයා හැඳ සිටි ඇඳුම්වල සාක්කු පරීක්ෂා කළේය. මීළඟට ඔහුට හමුවූ සියලුම දේවල් මළසිරුර අසල තිබූ පෙට්ටියකට දැම්මේය.

එලරි කිං නම් මේ තරුණ පොලිස් පරීක්ෂකවරයා, තමාගේ දැනුම හා බුද්ධිය ගැන අධි තක්සේරුවකින් කටයුතු කළ පුද්ගලයෙකු බැව් අපි දුටුවෙමු. ලන්ඩනයේ උසස් පාසලකින් ඉගෙන ගෙන, තමා ස්කොට්ලන්ඩ්යාඩ්හි පුහුණුවක්ද ලැබූ බැව්, ඔහු පැවසුවේ සාඩම්බරයෙනි. ෂර්ලොක් හෝම්ස් ක්‍රියාකළ ආකාරය ගැන හැකි සෑම විටකදීම උපහාසාත්මක දේ කීමට ද එලරි කිං පසුබට නොවීය.

මියගිය පුද්ගලයා පැළඳ සිටි පාවහන් වල අඩිය ගැන, හෝම්ස් දැඩි අවධානයක් යොමු කළේය. පාවහන්වල කට්ට රටාව තම සටහන් පොතේ ඇඳගත් හෝම්ස්, තමාට ලැබුණු දත්ත එහි ලියාගත්තේ තමාටම මුමුණමිනි. අන්තිමේදී කාචය අතට ගත් ඔහු පාවහන් වල අඩිය තියුණු පරීක්ෂණයක ට ලක් කළේය.

"ප්‍රංශයේ හදන ඉයුජින් රේමන්ඩ් වර්ගයේ පාවහන් - එංගලන්තයේ මිල අධිකම පාවහන්." හෝම්ස් කීය.

"විශාල කර බැලීමට කාචයක් නැතුවත්, ඔහුගේ සපත්තුවල අඩිය පෙනෙනවා නෙ මහත්මයා" කිං කීය. "ආ කමක් නෑ. සමහරවිට ඔබේ ඇස්වල පෙනීම අඩු ඇති"

ඔහු කී දේ හෝම්ස්ට ඇසුණු බවක් වත් නොපෙනිණ.

"......... පාවහන් සෑහෙන්න අලුත්. යන්තමින් වත් ගෙවී ගිහින් නැහැ. සමහරවිට අද තමයි මේක මුලින්ම පළඳින්න ඇත්තෙ. පස් සහ වැලි වර්ග කිහිපයකම කැට මෙහි ඇලී තිබෙනවා. ඊට අමතරව අඳුරේ ඇවිදගෙන එද්දී ඔහු අඩිය තියල තියෙනවා, ගවයෙකුගේ ගොම ගොඩක් උඩට. ඉන්පසු වෙනත් යම් යම් දේ ඒ මත ඇලී තිබෙනවා.

වොට්සන්. මම සාම්පල එකතු කරන කඩදාසි පැකට් පහක් හෝ හයක් මා අතට දෙන්න. හරි. ස්තුතියි"

පැකැට්ටුවල පිටත යම් යම් දේ සටහන් කළ හෝම්ස්, පාවහන්වල අඩියේ තිබූ දැ දූනු පිහියෙන් සූරා, පැකැට්ටු තුළට දමා ගත්තේය.

පොලිස් නිලධර එලරි කිං විසින් මියගිය පුද්ගලයාගේ සාක්කුවලින් ඉවත් කළ දෑ වෙත, හෝම්ස් මීළඟට අවධානය යොමු කළේය. ඔහු මුලින්ම අතට ගත්තේ ලොම්බාඩිගේ දුම්කොළ පසුම්බිය යි.

"ඔහුගේ දුම්කොළ පසුම්බියේ ඔබ දකින්න බලාපොරොත්තු වුණේ මොනවද?" එලරි කිං විමසුවේ හෝම්ස් එය පරීක්ෂා කොට ඉවතින් තබතු දුටු විටයි.

"මං දකින්න බලාපොරොත්තු වුණේ සාමාන්‍ය දුම්කොළ. සිහින්ව කැපූ ලටකියා* එහි දකින්න ලැබේවි කියල මං හිතුවෙ නෑ. තමන්ගේ සිගරට්ටුවට තනිකරම ලටකියා දමල දුම්බොන අය ඉතාමත් දුර්ලභයි."

දුම්කොළ පසුම්බියට අමතරව එතැන, තමාගේම සිගරට්ටුව ඔතාගැනීම පිණිස කඩදාසි රැසක් සහිත "සිගරට් පොතක්" සහ, රිදීයෙන් තනා තිබූ ගිනිපෙට්ටියක් ද විය. සිගරට් පොතෙන් පිටුවක් ඉරාගත් හෝම්ස් එය ආලෝකයට හරවා, එහි දිය සලකුණු පරීක්ෂා කළේය.

"මේ වගේ දේවල් ගැන ඔබේ අවධානය නදින්ම යොමුකරන බවයි මට පෙනෙන්නෙ" එලරි කිං කීවේ, කිසිදු උනන්දුවක් නොමැතිව බලාසිටි දුම්රිය ස්ථානාධිපතිවරයා දෙස බලමිනි.

"ඇත්තෙන්ම ඔව්" හෝම්ස් කීය. "මේ බඩු බාහිරාදිය අතර දියමන්ති නම් කිසිවක් පෙනෙන්න නෑ"

"නැහැ. නමුත් ඔහු ළඟ කලින් දියමන්ති තිබුණද කියල අපි දන්නෙ නෑ." පොලිස් නිලධර කිං පැවසීය.

"කොහොම වුණත් රත්රන් දම්වැලක් සහිත වටිනා රත්රන් ඔරලෝසුවක් තියෙනවා. දියමන්තියක් සවිකළ ටයි කටුවක් තියෙනවා. මුදල් පසුම්බිය තියනවා.... අපි බලමු..... ඒකෙ තියනවා රත්රන් පවුම් විසි පහක්. මංකොල්ලකෑමක සලකුණු මෙතැන නැහැ. එහෙම නේද? මේක මිනීමැරුමක් කියල ඔබ කළ උපකල්පනය තාවමත් එලෙසමද?"

---

*ලටකියා යනු සිරියාවෙන් එංගලන්තයට ආනයනය කරනු ලැබූ මිල අධික දුම්කොළ විශේෂයකි. ලටකියා සාදන්නේ යන්තමින් වියළූ දුම්කොළ, සඳුන් දර සහ කුරුඳු තෙල් වාෂ්පය සහිත දුමෙන් සුගන්ධවත් කිරීමෙනි. විවිධ සිගරට් දුම්කොළ වර්ග වලට ලටකියා 50% දක්වා මිශ්‍ර කෙරුණු අතර සමහරු 100% ක්ම ලටකියා දුම්පානය සඳහා යොදාගන්න

"මගේ ඒ නිගමනයේ කිසිම වෙනසක් නෑ" හෝම්ස් කීය. "මං කැමතියි මළසිරුර හමුවුණු තැන පරීක්ෂා කරල බලන්න. දුම්රිය එන්ජිම පරීක්ෂා කරන්න පියවර ගත්තද?" හෝම්ස් ඒ ප්‍රශ්නය යොමු කළේ ස්ථානාධිපතිවරයාටයි.

"ඒක පරීක්ෂා කරන්න කියලා මං ඒ වෙලාවෙම බ්‍රැඩ්ෆීල්ඩ් වෙත විදුලි පුවතක් යැව්වා. මං හිතන්නේ මේ වෙනකොට ඒක ලැබිලත් ඇති. අනතුර සිදුවුණු තැනට යන්න කලින් මං ඒක බලන්නම"

අපි ලාම්පු කාමරයෙන් එළියට පැමිණියෙමු. දුම්රිය ස්ථානයේ පරීක්ෂකවරයා, අප වෙත විදුලි පුවතක් ගෙන ආවේය. ස්ථානාධිපතිවරයාට එය භාරදුන් විට ඔහු එය ශබ්ද නඟා කියෙව්වේය.

"විශේෂ සැලකිල්ලකින් මම දුම්රිය එන්ජිම පරීක්ෂා කළෙමි. ඉදිරියෙන්ම තිබූ රෝදයේ තරමක ලේ පැල්ලමක් විය. ඊට පිටුපස රෝදයේ තිබුණේ ලේ ඉතා ස්වල්පයක් පමණයි. වෙනත් කිසිම තැනක ලේ සලකුණු නොමැත."

ස්ථානාධිපතිතුමා හෝම්ස් වෙත හෙළුවේ මෙය තමාට ප්‍රශ්නයක් බව හඟවන බැල්මකි.

"අපි අනතුර සිදුවුණු තැනට ගිහිල්ලම බලමු , රේල් පාරෙන් කියවෙන්නෙත් එම කථාවමද කියල" හෝම්ස් කීය.

දුම්රිය ස්ථානාධිපතිවරයාගේ මුහුණෙන් දිස්වූයේ ඔහු යම් ප්‍රහේලිකාවකට මැදිවී ඇති අයුරකි. ඔහු හෝම්ස්ගෙන් යමක් විමසන්නට සූදානම් වූ බැව් අපට වැටහිණ. එහෙත් පොලිස් නිලධරයා මේ කටයුතු අවසන් කිරීම සඳහා නොඉවසිල්ලෙන් සිටි අයුරක් දිස්විය.

මිය ගිය තැනැත්තාගේ සාක්කුවල තිබී හමුවූ දේවල් තම කබා සාක්කුවල දමාගෙන ඔහු පියවර කිහිපයක් ඉදිරියට තබා අප එනතුරු බලා සිටියේ තම සාක්කු ඔරලෝසුවෙන් වෙලාවද පරීක්ෂා කරමිනි. එක් ලන්තෑරුමක් අතට ගත් ස්ථානාධිපතිතුමා පෙරමුණ ගත්තේය. ලාම්පු කාමරයේ තිබූ හොඳින් එළිය විහිදූ දීප්තිමත් පහනක් මගේ මිත්‍රයාට උවමනා විය. ඔහු එය දුම්රියපොළේ පරීක්ෂකවරයාගෙන් ඉල්ලා ගත්තේ, පරෙස්සමෙන් ආපසු ගෙනැත් දෙන බවට පොරොන්දු වෙමිනි.

දුම්රිය ස්ථානාධිපති සහ එලරි කිං දුම්රිය මඟ අසලින් ඉදිරියෙන් ගමන් ගත්හ. ඔවුනට පියවර විස්සක් පමණ පිටුපසින් අපි ගමන් කළෙමු.

"මට නම් මෙ කිසිදෙයක් පැහැදිලි නෑ" මා කීවෙ හෝම්ස්ටයි. "ඔබ බොහොම ඉක්මනට නිගමනයකට ආවා, මේක දිවිනසාගැනීමක් නොව මිනීමැරුමක් කියල. ඔබ ඔය තරම් ස්ථිරව ඒ කාරණය කියන්නෙ කොහොමද?"

"මං මුලින්ම අවධානය යොමු කළ කාරණාව මේකයි. ඒ, මේ අනතුර සිද්ධවුණේ මෙම දුම්රියපොළ පිහිටි පැත්තේ රේල් පීලිලෙද? නැත්නම් ඇතින් පිහිටි අනික් රේල් පීල්ලෙද? ඊළඟට මෙතැන සමහර පුංචි පුංචි කාරණා මං නිරීක්ෂණය කළා වොට්සන්. ඒවායින් නිශ්චිත නිගමනවලට ඒම අපහසු නෑ." හෝම්ස් කීය. "හිසේ දකුණු පැත්තේ පාර්ශ්වික කපාල අස්ථිය මුදුනේ තුවාලයක් තිබුණා. දකුණු ඇහැ බෙරිලා, හිසේ කෙස් තිබෙන ප්‍රදේශයෙන් කොටසකුත් දකුණු කන ඉදිරිපස දක්වා තමයි මේ තුවාලෙ. මේක තියුණු ලෝහ දාරයක් මුහුණ මතින් පැත්තට ගමන් කිරීමෙන් ඇතිවුණු එකක්.

එවැනි දෙයක් දුම්රිය එන්ජිමේ ඉදිරි කොටසකින් පහසුවෙන්ම ඇතිවෙන්න පුළුවනි. නමුත් ඒ තුවාලයෙන් හුගක් ලේ ගලල තියෙනවා, සෑහෙන වෙලාවක් තිස්සේ. ඒ විධියට ලේ ගලාගිය ලේ දහරා දෙකක් තියෙනවා. දෙකේම ලේ කැටි ගැහිලා පමණක් නෙමෙයි, තරමක් දුරට වියළිලා. නමුත් මේ මිනිහාගේ බෙල්ල දුම්රියේ රෝදයට කැපී ගිහින්, හිස වෙන්වෙලා නේ. මා කියූ මුහුණේ තුවාලය ඇතිවුණේ එන්ජිම නිසා නම්, ඒක ඇතිවෙන්න පුළුවන් හිස වෙන්වුණාට පස්සේ. ඒ මොකද ඒ තුවාලය තිබුණේ ළංවෙන එන්ජිමට ඈත පැත්තේ. නමුත් කඳෙන් වෙන්වුණු හිසකින් ලේ ගලායාමක් සිදුවෙනවා නම් ඒ බෙල්ලේ තුවාලයෙන් පමණයි. මුහුණේ තුවාලයකින් නොවෙයි.

නමුත් මෙතැනදී මොකක්ද සිදුවෙලා තියෙන්නේ? මුහුණේ තුවාලයෙන් ලේ ගලා ගිහින් තියෙනවා. ඒකත් එකිනෙකට සෘජුකෝණිකව පිහිටි ලේ ධාරා දෙකක්. කිසි බාධාවක් නොතිබුණ පළමුවැනි ලේ ධාරාව ගමන් කරල තියෙන්නේ දකුණු කනට ඉදිරියෙන් කම්මුල දිගේ පහළට. එහෙම ගිහින් ඒ ලෙයින් කමිසයේ

කොලරය ලෙයින් පෙඟිලා. දෙවැනි ලේ ධාරාව ගමන් කරල තියෙන්නේ කනට ඉහළින් කොණ්ඩය තෙමමින් හිසේ පිටුපසට. වොට්සන් ඔබ දන්නවා, ගුරුත්ව ආකර්ෂණය කියන්නේ, එකම දිශාවකට පවතින දෙයක් බව. එහි දිශා වරින් වර වෙනස් වෙන්නේ නැහැ. හිස මුදුනේ තුවාලයෙන් කම්මුල දිගේ නිකට දෙසට ලේ ගැලුවා නම් ඒ වෙලාවේ ඔළුව තියෙන්නෙ ඇත්තේ කෙළින්. ඔහු ඉන්න ඇත්තේ නැගිටලා නැත්නම් වාඩිවෙලා.

ඊළඟට මං කියූ දෙවැනි ලේ ධාරාව ගැන හිතන්න. එතකොට ඔළුව තියෙන්න ඇත්තේ මුහුණ උඩ අතට; හිසේ අක්ෂය පොළොවට සමාන්තරව. මං කියන කාරණය ඔබට පැහැදිලියිද? ඔහු බිම හාන්සිවෙලා උඩ බලාගෙන ඉද්දී, කනට උඩින් තිබෙන තුවාලයෙන් ගලායන ලේ එකතුවෙන්නේ, ඔළුවේ පිටුපසට. ඒ ටික පැහැදිලිද? නමුත් දුම්රියේ රියැදුරා එන්ජිමේ පහනෙන් දකිද්දී මියගිය පුද්ගලයාගේ මුහුණ තිබුණේ කොහොමද? එය තිබුණේ මුහුණ පහතට - මූනිං අතට බව රියදුරා කිව්වා.

එතකොට අපට පැහැදිලිවම ගතහැකි නිගමනය මොකද්ද? ඔළුවට පහරක් එල්ල වෙද්දී එස්රා ලොම්බාඩි හිටියේ, නැගිටලා නැත්නම් වාඩිවෙලා. ඔහු ඒ ඉරියව්වෙම ස්වල්පවෙලාවක් සිටියා. ඒ වෙලාවෙ තමා ලේ වේගයෙන් ගලා ගිහින් නිකට සහ කොලරය තෙමුවේ. ඊළඟට ඔහු ජීවත්ව ඉඳිද්දීම ඉක්මනින් ඔහු බිම වැටී, හාන්සි වී සිටින ඉරියව්වෙන් සිටියේ මුහුණ උඩට. ඒ ආකාරයට සෑහෙන වෙලාවක් ඉන්න ඇති. ඒ මොකද ඔහුගේ හිසේ පිටුපසට සෑහෙන තරම් ලේ ප්‍රමාණයක් ගලාගොස් එය කැටි ගැසී තිබුණා."

"ලේ ගලාගොස් තිබුණු හැටි නම් මම දුටුවා. නමුත් ඒ මගින් ඔය තරම් නිගමනවලට ඒමට හැකියාවක් මට තිබුණේ නෑ"

"නිරීක්ෂණය මගින් නිගමනවලට එළඹීම කළ හැකිවෙන්නේ, ඒක හොඳින් පුරුදු පුහුණු වුණොත් විතරයි. ඒක තෙමෙයි වොට්සන්. ඔහුගේ මුහුණ ගැන ඔබ මොනවද නිරීක්ෂණය කළේ? මං අදහස් කරන්නේ ඔහුගේ මියයෑමට ආසන්නතම හේතුව ගැන"

"ඔබ එහෙම කියූවාම මට පහසුයි" මම කීවෙමි. "මුහුණේ වර්ණය වෙනස්වීම සහ අනික් සලකුණු අනුව, මරණයට එකම හේතුව ලේ ගලායාම නොවෙයි කියලයි මට හිතෙන්නෙ"

"ඒ කිව්වෙ?"

"ලොම්බාඩිගෙ මුහුණෙන් පෙනුණේ, මියයෑමට පෙර හුස්ම හිරවීමකට ගොදුරු වූ කෙනෙකුගේ ලක්ෂණ"

"විශිෂ්ටයි වොට්සන්. අති විශිෂ්ටයි. මට හිතෙනවා ඔබ කළ යුතුව තිබුණේ ශල්‍ය වෛද්‍ය විද්‍යාව නොවෙයි. අධිකරණ වෛද්‍ය විද්‍යාව. එහෙම කළා නම් ඔබ ඒ ක්ෂේත්‍රයේ ඉහළටම යන්න තිබුණා."

"මුහුණේ එම දුර්වර්ණවීම ඇරෙන්න, ඉතාම කුඩා කේෂනාළිකා පුපුරා යෑමෙන් හැදුණු සියුම් ලේ ගැලීම් පවා, බැලූ බැල්මටම පෙනුණා කියලයි මට හිතෙන්නෙ" මම කීවෙමි.

"ඒ ගැන නම් කිසිම සැකයක් නෑ වොට්සන්" හෝම්ස් කීය. "ඒක හුස්ම හිරවීමෙන්, නැත්නම් පෙණහැල්ලට ඔක්සිජන් නොලැබීයාමෙන් මියගිය පුද්ගලයෙකුගේ මුහුණ. ඔබ දකින්න ඇති ඔහුගේ දිව ඉදිමී දුර්වර්ණ වී තිබුණු හැටි. ඔබ දුටුවාද ඔහුගේ උඩුතොලේ ඇතුළුපැත්ත? එහි තිබුණා දත්වලට හැපුණු සලකුණු. මුඛය මත ඇතිවුණු තෙරපීමක් නිසා තොලේ ඇතිවුණු තුවාල දෙක තුනකුත් මං දුටුවා. අප කරන මේ නිරීක්ෂණ හා නිගමන, තවත් යම්කිසි දේකට අනුකූල බව ඔබට පෙනෙනවාද? ඇයි වොට්සන් ඔහුගේ හිස මත ඇතිවී තිබෙන තුවාල වලට"

"ඔබ ඔය කියන කාරණාව මට එච්චර පැහැදිලි නෑ"

"අපි මෙහෙම හිතමු. කවුරු හරි මේ වගේ දෙයක් කිව්වා කියල හිතමු" හෝම්ස් කීය. මියගිය පුද්ගලයා සතුරෙකු සමඟ සණ්ඩුවකට පටලැවුණා; සතුරා මේ මනුස්සයාගේ ඔළුවට දරුණු පහරක් හෝ දෙකක් එල්ල කළා; ඊළඟට ඔවුන් දෙදෙනා අතර පොරබැදීමක් ඇතිවුණා. වඩාත් ශක්තිමත් සතුරා විසින්, මියගිය පුද්ගලයා යටත් කරගෙන, ඔහුගේ හුස්ම හිරකරනු ලැබුවා. එහෙම දෙයක් වුණා නම් අපට බලාපොරොත්තු විය හැකි හෝඩුවාවන් මොනවාද? මේ අපට දකින්න ලැබුණේ, ඒ හෝඩුවාවන් තමා."

"දැන් මට පැහැදිලියි. ඒක තමෙයි. මියගිය පුද්ගලයාගේ දත් අතර සිරවී තිබී ඔබට යමක් හමුවුණා නේද? ඒ මොකක්ද?"

"දත් අතර තිබී වැදගත් වස්තූන් දෙක තුනක්ම හම්බවුණා. සමහරක් කෑම කැබලි. මං හිතන්නේ ඔබ මේ අදහස් කරන්නේ මට හමු වූ නූල් කැබැල්ල ගැන විය යුතුයි"

"අන්න හරි. මටත් ඒක පෙනුණේ නූල් කැබැල්ලක් වගේ"

"වොට්සන්. මට ඒ ගැන නම් විස්තර කියන්න වෙන්නේ, මගේ අණ්වීක්ෂයෙන් පරීක්ෂා කර බලල"

"එතකොට ඔහුගේ පාවහන්වල පතුල් ඔබ හොඳ සෝදියකට ලක් කළානේ. එයින් මොනවද ඔබට තේරුම්ගන්න හැකිවුණේ?"

"පාවහන්වල අඩිය සූරලා මං අර කවර කිහිපයකට දමාගත්ත නේ. අවසන් නිගමනයකට එන්න හැකිවෙන්නේ, ඒවාත් සියුම් පරීක්ෂණයකට ලක්කළාට පස්සේ තමයි.

ඒ වුණත් කාරණා කිහිපයක් ඔබට කියන්න, දැන් වුණත් මට පුළුවනි. මං ඔබට කලිනුත් කිව්වා මේ තැනැත්තාගේ පාවහන් අලුත් බව. මරණය සිදුවුණා කියන තැන කිට්ටුව පාරක්, අවන්හලක් හෝ තැබෑරුමක් වත් නැති බවයි, අර ඩග්ලස් නම් මනුස්සයා කිව්වේ. එතකොට මේ ලොම්බාඩ් ප්‍රධාන පාරක ඉඳන් සෑහෙන දුරක් පයින් ඇවිත් තිබෙන්න ඕන. එතකොට ඔහුගේ පාවහන්වල අඩියේ පස්, වැලි, මඩ කොයි තරමක් තියෙන්න ඕනද? මේ ඔක්තෝබර් මාසේ දිගින් දිගටම වැස්ස තියෙන කාලෙ. අපි දැන් ආ මග දිගට, රේල් පාර දෙපස, දිය කඩිති තිබුණු බව ඔබ දකින්න ඇති. එස්රා ලොම්බාඩ් දුම්රිය මාර්ගය වෙත ආවේ පයින් නම්, පාවහන්වල මඩ තැවරුණේ නැත්තේ ඇයි?"

"මට හිතෙනවා ඔහු එන්න ඇත්තේ කාගෙ හරි කර පිටින්; නැත්නම් අශ්වකරත්තයක් තුළ" මම කීවෙමි.

"ඔබේ නිගමනය විශිෂ්ටයි වොට්සන්" මගේ මිත්‍රයා කීය. "පාවහන් අඩියේ මට දකින්න ලැබුණේ මොනවද දන්නවද? දුම්කොළ දැවීගිය පසු දකින්නට ලැබෙන අළු. සුරුට්ටුවක් හෝ සිගරට්ටුවක් දැල්වෙද්දී එය මත පය තැබීමෙන්, සපත්තු අඩියේ ඔපදැමූ සම, ගින්දරට යන්තමින් පිළිස්සී ගිය තැනක්. මං ඔබට කලිනුත් කියූ ඕට්ස් මිශ්‍රිත විස්කෝතුවල කුඩු. ඊට අමතරව වර්ණවත් කෙඳි. මං විශ්වාස කරනවා මේවා බුමුතුරුණකින් ගැලවී ගිය කෙඳි කියල.

මේ හැමදෙයක්ම වගේ තිබුණේ, පාවහන් අඩියේ කට්ට අතර ඇති හිඩැස්වල. එස්රා ලොම්බාඩ් මරාදමල තියෙන්නේ පොහොසතෙකුගේ නිවාසයක. එහි දොරකඩ තිබෙන්නෙ රබර් පාපිස්සක්. ඒ නිසයි පාවහන් අඩියේ තිබූ පස් විශාල ප්‍රමාණයක් ඉවත්වුණේ. රළු පොල්කෙඳි පාපිස්සක් තිබුණා නම්, පාවහන් අඩිය මීටත් වඩා පිරිසිදු වෙන්න ඉඩ තිබුණා. එහෙම නොවුණු එක අපට වාසියක්. මීට අමතරව එහි ඇලී තිබුණු කෙඳි තමා, බුමුතුරුණක කෙඳි කියා මා විශ්වාස කරන්නේ. අණ්වීක්ෂයකින් පරීක්ෂා නොකොට ඒ ගැන නම් වැඩි යමක් කියන්න බැහැ."

මිනිත්තු කිහිපයක් යනතුරු මට කිමට කිසිවක් නොතිබිණි. මේ විශිෂ්ට අපරාධ පරීක්ෂකයා, සුළු හෝඩුවාවකින් පවා කරුණු සොයා ගැනීමට දක්වන දක්ෂතාවය කෙතෙකු පුදුමයට පත් කරවන සුලු විය. මේ වනවිට අපි අනතුර සිදු වූ තැනට ළඟා වී සිටියෙමු. දුම්රිය ස්ථානාධිපතිතුමා සහ පොලිස් නිලධරයා, ඔවුන් ළඟ තිබූ ලන්තෑරුමේ ආධාරයෙන්, එතැන පරීක්ෂාකර බැලීමට පටන්ගෙන තිබිණ.

"මෙතැන, ලේ තියෙන්නෙ නම් බොහොම ස්වල්පයයි" දුම්රිය ස්ථානාධිපති කිය. "මේ විධියේ දුම්රිය අනතුරු මං අප්‍රමාණව දැකල තියෙනවා. ඒ හැම වෙලාවකදීම මට, මීට වඩා ගලා ගිය ලේ දකින්න ලැබුණා. ඒ වගේමයි එත්ජිමේ තැවරී තිබුණු ලේ ප්‍රමාණයත්. නමුත් මෙතැන මේ සිදුවුණු දේ පුදුමාකාරයි"

මෙය අපේ දෙසවන්වලට ද වැටිණි. එහෙත් එම ප්‍රකාශය ගැන හෝම්ස් අවධානය යොමු නොකළේය. ඊට හේතුව මේ වන විට ලේ ගලායාම පිළිබඳ ගැටලුව, ඔහුට තවදුරටත් ගැටලුවක් නොවීමයි.

තම අතේ තිබූ පහනේ දීප්තිමත් ආලෝකය හෝම්ස් යොමුකළේ රේල්පීලි දෙපස විහිද තිබූ බොරලු තට්ටුව දෙසටයි. එය අඟල් භාගයේ පමණ තිරිවානා ගල් කැබලි, අඟලේ පමණ කළු ගල් කැබලි හා ඉතා කුඩා හුණුගල් කැබලි වලින් සැදුණු මිශ්‍රණයක් විය. පොලිස් නිලධරයා සිල්පර කොටයක් මත දෙදණ තබාගෙන, රේල් පීල්ල මතට ලේ ගලාගිය තැනක් පරීක්ෂා කරමින් සිටියේය. ඔහුගේ පොලිස් පාවහන්වල අඩිය දෙසට හෝම්ස් මගේ අවධානය යොමුකළේය.

"ඔබ දුටුවාද වොට්සන්?" හෝම්ස් කීවේ මෘදු හඬෙනි. පොලිස් නිලධරයාගේ පාවහන් අඩියේ, හුණුගල් කැබලි මිශ්‍රිත තිරිවානා කැබලි ඇලී. කට්ට අතර හිරවී තිබූ අයුරු මම දුටුවෙමි.

"ඔහුගේ තොප්පිය ඔබට හමුවුණේ නැද්ද?" හෝම්ස් විමසුවේ බිම තිබූ කුඩා නූල් කැබැල්ලක් අහුලා ගැනීමට රේල් පාර වෙත පහත් වෙමිනි.

"නැහැ" එලරි කිං පැවසීය. "ඒක එච්චර ඈතක වෙන්න බෑ: ළඟම ඇති. මහත්මයා ඔබට තවත් හෝඩුවාවක් ලැබුණා වගෙයි?" ඔහු විමසුවේ මඳ සිනාවක්ද සමගිනි.

"ප්‍රංචි ට්වයින් නූල් කෑල්ලක්" හෝම්ස් කිය. "කවුද දන්නෙ. පහුවෙලා මේකෙනුත් මොකක් හරි ප්‍රයෝජනයක් ලැබෙන්න ඉඩ තියෙනවා. මේක අර කවරයකට දමාගන්න වොට්සන්."

"මේ අසරණයාගේ ඇස් පෙනීමේ ලොකු දුර්වලකමක් තියෙන්න ඇති. බලන්න ඔහුගේ උපැස් යුගල බිඳී ගොස්, සැදී ඇති වීදුරු කැබලි ගොඩ" පොලිස් නිලධර එලරි කිං පැවසුවේ ඒ දෙසට අත දිගු කරමිනි.

"මේ වීදුරු කැබලි පොලිසිය භාරයට ගන්න ඔබට අවශ්‍ය වෙනවද?" හෝම්ස් විමසුවේය.

"ඔය වීදුරු කැබලි වලින් අපට කිසි වැඩක් නෑ. මොනව කරන්නද?" කිං පැවසුවේ සාවඥ සිනාවක් මුවගට නගා ගනිමිනි.

"පොලීසියට උවමනා නැත්නම් අපි ඒ ටික එකතු කරගමු වොට්සන්" හෝම්ස් කිවේ ඔහු ළඟ තිබූ පෙට්ටියෙන් කුඩා දේ අල්ලන ටිව්සරයක් අතට ගනිමිනි. ඒ සමඟම තවත් එවැනි උපකරණයක් මා අතට දුන්නේ, තම කටයුත්තට උදව් කරන මෙන් මට සංඥාකරමිනි. මේ අතර එලරි කිං මදක් ඈතට තම ලන්තෑරුම එළිය කරමින් පරීක්ෂා කළේය. ඒ මියගිය පුද්ගලයාගේ තොප්පිය ගැන විය යුතුය.

"වොට්සන් වීදුරු කැබලි හැකි තරමක් කවරයට දමාගන්න." හෝම්ස් කිය. "ඉතාම වැදගත් හෝඩුවාව මේක වෙන්නත් පුළුවන්."

"කොහොමද එහෙම වෙන්නෙ?" මම ඇසීමි.

"ඒක ඔබට තේරුම් ගන්න අමාරුද?" හෝම්ස් ඇසීය. "බලන්න ඔය විසිරී තිබෙන වීදුරු කැබලි දිහා. සමහරක් තරමක් ලොකු කැබලි. තවත් සමහරක් ඉතාම කුඩායි, වැලි කැට වගේ. ඔහුගේ උපැස් යුගලේ වීදුරු, තරමක් ඝනකම් අවතල ඒවා බවට සැක නෑ. නමුත් ලොකු කුඩා වීදුරු කැබලි ඉතා විශාල ප්‍රමාණයක් තිබෙනවා. ඒ වගේමයි සිහින්ව කුඩුවුණු වීදුරු කැබලිත්. නමුත් කොහොමද උපැස් යුගල ඒ විදියට බිඳුණෙ? බිම වැටීමෙන් ම කියල හිතන්න අමාරුයි නේද?

ඔය විදියෙ කණ්නාඩිවල කාචය බිම වැටුණම බිඳෙන්නේ ප්‍රමාණයෙන් තරමක් ලොකු කැබලි අඩු ගණනකට . මේ තරම් මහා ගොඩකට නෙමෙයි. උපැස්යුගල දුම්රියේ රෝදයට අහුවෙලත් නෑ. එහෙම වුණා නම් වීදුරු ඉතාම සිහින් කුඩු බවට පත්වෙනවා. රාමුව සමතලා වෙන්න තැලෙනවා. උපැස් යුගලේ කැරට් 22 රත්‍රන් වලින් තැනූ ශක්තිමත් රාමුව, තැලී ගොස් තිබුණා තමයි. නමුත් ඒ දුම්රියේ රෝදයකට අහුවුණු ආකාරයට නෙමෙයි. කාගෙ හරි

කකුලකට - පාවහන්වලට පැඟුණු ආකාරයට. වොට්සන් ඔබට හිතෙන්නේ උපැස් යුගල කාටහරි පැගෙන්න ඇත්තේ කොයි වෙලාවෙ කියලද?"

"මට හිතෙනවා එස්රා ලොම්බාඩිගෙ සිරුර මේ දුම්රිය මාර්ගයට ගෙනැත් දැමූ වෙලාවෙ ඒක සිදුවෙන්න ඇති කියල"

"නැහැ වොට්සන්. මට හිතෙන්නෙ ඒකෙ අනික් පැත්ත" හෝම්ස් කීය. "ලොම්බාඩි මිනීමරුවා සමඟ පොරබදන්න ඇති. ඒ වෙලාවෙ ගැලැවී වැටුණු උපැස් යුගල, එක්කෙනෙකුට හෝ දෙදෙනාටම පැගුණා."

"එහෙම නම් වීදුරු කැබලිවලට බිඳී යන්නෙ එතැනදිම නේ. ඒවා මෙහේට ආවෙ කොහොමද?"

"අපරාධකාරයා ඒ කටයුත්ත ඉතාම හොඳින් කරල තියෙනවා." හෝම්ස් කීය. "ඔහු වීදුරු කැබලි ඔක්කොම වගේ එකතුකරලා රාමුවත් එක්කම මෙහේ ගෙනැත් දමලා."

මේ අතර අනෙක් දෙදෙනා අප වෙත පැමිණියහ.

"ඔබට ඔහුගේ තොප්පිය හමුවුණාද මහත්මයා?" හෝම්ස් විමසුවේ දුම්රිය ස්ථානාධිපතිවරයාගෙනි.

"නැහැ"

"එහෙනම් ඒ කටයුත්ත සඳහා අපි ඔබට හවුල්වෙන්නම්" හෝම්ස් කීය. "මහත්මයා. මේ කිට්ටුව තිබෙනවද ගම්මානයක්?"

"එකම ගමයි තිබෙන්නේ. ඒ විචෙස්ටර් නම් ගම. ඒක තියෙන්නේ මෙතැනට හැතැක්ම පහක් පමණ දුරින්" දුම්රිය ස්ථානාධිපතිවරයා පිළිතුරු දුන්නේය.

"එතකොට මෙතැනට ළඟම පාරක් තියෙන්නෙ කොයි හරියෙද?"

"කෝන්ෆීල්ඩ් උද්‍යානය හරහා එන පාර නම් මේ ළඟටම එනවා. ඒක බාගෙට සකස් කළ පාරක්. උද්‍යානය කිච්චට ඒ හරිය පාළුයි. ඒකෙ තිබෙන්නෙ එක ගෙයක් පමණයි. ඒ මෙතැනට යාර තුන්සීයක් පමණ දුරින්. නිවාස යෝජනා ක්‍රමයක් සඳහා ඉඩම් කට්ටි වෙන් කළ විශාල ඉඩමක, ඉදිවුණු එකම ගේ ඒක. අනික් බිම් කට්ටිවල කවදාවත් නිවාස ඉදිවුණේ නෑ. එතැන ඉඳලා දුම්රියපොළට යා හැකි අඩිපාරක් තියෙනවා."

"ඒ කිට්ටුව වෙනත් ගෙවල් නැද්ද?"

"කිසිවක් නෑ. හැතැක්ම බාගයක් ඇතුළත තිබෙන එකම නිවස එය පමණයි. මේ කිට්ටුවක වෙන පාරක් ඇත්තෙත් නෑ"

"ඒ පැත්තත් පරීක්ෂා කර බලන්න තිබුණා" හෝම්ස් කීවේ අහස දෙස බලමිනි. "නමුත් අන්ධකාරයේ අපට කිසිවක් හරිහැටි දැකගන්න ලැබෙන්නේ නැහැ. අද රාත්‍රියට නම් ලොකු වැස්සක් කඩාවැටේවි කියල හිතන්න අමාරුයි. අපට රාත්‍රිය ගතකිරීමට සුදුසු තානායමක් මේ කිට්ටුවක නැද්ද?"

"කුඩා තානායමක් තියෙනවා "රෝයල් ලයන්ස්" නමින්. ඒක තියෙන්නේ දුම්රිය පොළට යාර දෙසීයක් පමණ දුරින්. ඔවුන්ගේ අයකිරීම් නම් ඉතා අසාධාරණ බවයි මං අහල තියෙන්නේ."

"නමුත් මේ වෙලාවෙ අපට වෙනත් විකල්පයකුත් නෑ" හෝම්ස් කීවේය. ඒ දුම්රිය ස්ථානාධිපතිවරයා අපට ලබාදුන් තොරතුරු වලට පිළිතුරු වශයෙනි.

දුම්රියපොළ වෙත පැමිණි අපට අසන්නට ලැබුණේ, පශ්චාත් මරණ පරීක්ෂණය භාරව සිටි අධිකරණ වෛද්‍යවරයා එවා තිබූ පණිවුඩයකි. තමන් තවත් ප්‍රමාදවීමට ඉඩ ඇතැයි ඔහු දන්වා තිබිණි. එබැවින් තවදුරටත් එතැන නොරැඳී අපි තානායම වෙත ගමන්ගත්තෙමු.

"මං මොන තරමක් උත්සාහ කළාද, ඔබට සැබෑ විවේකයක් ලබාදෙන්න" මා හෝම්ස්ට කීවේ අප රාත්‍රි ආහාරය ගනිමින් සිටියදීය.

"කෝ ඒ සැලැසුම සාර්ථක වුණේ නැහැනෙ"

"වොට්සන්. මං බේකර් වීදියට වෙලා හිටියා නම්, මට විසඳීමට මේතරම් හොඳ අබිරහසක් ලැබෙන්නෙ නෑ." හෝම්ස් කීය. "ඒ හින්දා මට මේ අවස්ථාව ලබාදීම ගැන, මං ඔබටත් වෛද්‍ය මොන්රෝටත් හද පත්ලෙන්ම ස්තූතිවන්ත වෙනවා"

"ඔබට නම් විහිළු. නමුත් අවිවේකී බව නිසා රෝගය වැඩිවුණොත් ඔන්න මට නම් කරන්න කිසිම දෙයක් නෑ" මම කීවෙමි.

"මගේ හිතවත් වොට්සන්. රෝගය උත්සන්න වෙලා මං මිය ගියොත්? එහෙම වුණත් මං ඔබට නම් දොස්පවරන්නෙ නෑ."

අතිශයින්ම විඩාපත්වී සිටීම නිසා මට උවමනා වී තිබුණේ, රාත්‍රි ආහාරය අවසන් කළ වහාම නින්දට යාමටයි. එහෙත් මගේ මිත්‍රයාට විඩාවක සේයාවක්වත් නොතිබිණි. දීප්තිමත් පහනක් කාමරයට ගෙන්වා ගත් ඔහු, එය ලියන මේසය මත තබාගෙන වැඩ ඇරඹුවේය. ලොම්බාඩිගේ උපැස් යුගලේ කාච පිහිටා තිබූ ආකාරය, ඔහු මුලින්ම හිස් කඩදාසියක ඇඳ ගත්තේය. අනතුරුව අප එකතු කරගෙන ආ

වීදුරු කැබලි එකින් එක ඒ මත තබමින්, යළි වෙනස් කරමින්, සංකීර්ණ ප්‍රහේලිකාවක් විසඳීමට උත්සාහ කළේය. මට ඇඩි නිදිමතක් දැනුණෙන් මම නින්දට ගියෙමි.

"උපැස් යුගලේ ප්‍රහේලිකාව, මං ඊයෙ රෑ සෑහෙන තරම් සාර්ථක ලෙස විසඳුවා වොට්සන්" මගේ මිත්‍රයා පැවසුවේ අප පසුවදා උදෑසන තේ පානය කරද්දීය. "මං ඒ වීදුරු කැබලි එකිනෙක පිළිවෙළින් තැබුවේ, ජිග්සෝ ප්‍රහේලිකාවක් සකස් කරන ආකාරයට. එක් කාචයක තරමක් ලොකු කෑල්ලක් අඩුයි. ඒක කුඩුවී ගියාද දන්නෙත් නෑ. ඔබ දන්නවාද මට සොයාගන්න හැකිවුණු අතික් දේ? එතැන තිබුණා වීදුරු කැබලි උවමනාවටත් වඩා. මේ බලන්න"

ඔහු මට පෙන්වූ සමහර වීදුරු කැබලි, උපැස් යුගලේ කාචවල ඒවා නොවන බව, දැන් මට ද තේරුම් ගත හැකිවිය.

"එතකොට මේවා මොනවද?"

"මේවා බීම පානය කිරීමට යොදාගන්නා වීදුරුවක කැබලි. ඒකෙ තියෙනවා තරු සහිත මෝස්තරයක්. ඒකෙන් මගේ නිගමනයට අමතර ශක්තියක් ලැබෙනවා."

"ඒ කොහොමද?"

"දෙදෙනා අතර පොරබැදීම සිදුවෙද්දී වෙන්න ඇති, බීම වීදුරුව බිඳෙන්න ඇත්තෙ. අපරාධකාරයාගෙ ගෙදර කසළ ගොඩ පරීක්ෂා කළොත්, අපට හැකිවේවි වීදුරුවෙ ඉතිරි කොටස හොයාගන්න. ඒ ඉතින් දැනටමත් ඔහු ඒක විනාශකර නොමැති නම්"

"අද දවසේ මොන කටයුතුවල යෙදෙන්නද ඔබ අදහස් කරන්නෙ?"

"පරීක්ෂණ කටයුතුවලින් හතරෙන් එකක් මං දැනටමත් කර අවසන්"

"මොනවා? ඒ කොහොමද හෝම්ස්?"

"මං අද උදෙන්ම නැගිටලා ගියා, මේබල්තෝප් පාරේ පොලිස් මුරපොළට. ඔවුනට තමා මේ අවට පොලිස් මුර සංචාරයේ යෙදීම භාරවෙලා තියෙන්නේ. ඔවුන් ළඟ තිබූ මේ පළාතේ අඟලේ සිතියම වෙත මා අවධානය යොමු කළා. මෙන්න මං ඒකෙ ආධාරයෙන් ඇඳගත් දළ සිතියම. අපට අද පරීක්ෂා කිරීමට තිබෙන කෝන්ෆීල්ඩ් ප්‍රදේශය මේකෙ තියෙනවා. පොලිස් මුරපොළේ ප්‍රධානියා විශ්‍රාම යාමට කිට්ටු, පොලිස් සාජන්ට්වරයෙක්. ඔහු බොහොම කාරුණික

පුද්ගලයෙක්. මා ඔහු සමඟ හුඟක් වෙලා කථාකළා. ඒකෙන් මට හැකිවුණා මේ පළාත ගැන තරමක අවබෝධයක් ලබාගන්න.

ලොම්බාඩ් දුම්රියට යටවුණු තැනම, මීට කලිනුත් කෙනෙකු දුම්රියට යටවී මියගියාලු. ඔහුත් මේ පළාතේ කෙනෙකු නොවෙයිලු. ඔහු මෙහේට ආ පිළිවෙළ ගැන සාක්ෂි තිබුණා. නමුත් රෑ වෙච්ච වෙලාවෙ ඔහු රේල් පාරෙ මෙතැනින් ගියේ ඇයිද කියන්න කවුරුවත් දැනගෙන හිටියෙ නැලු. තමන්ගේ සටහන් පොතක් දිගහැරි පොලිස් නිලධරයාට හැකිවුණා තවත් තොරතුරු ටිකක් මට දෙන්න.

ඒ සිද්ධිය වෙලා තියෙන්නෙ මීට අවුරුදු දෙකකට පමණ කලින්. මියගිය පුද්ගලයාගෙ නම කත්බර්ට් එමැනුවෙල්. ලන්ඩන් සිට රෑ අශ්වකෝච්චියේ ඔහු ඇවිත් තියෙන්නේ, බැඩ්ස්හැම් දුම්රිය පොළෙන් දුම්රියට නගින්න"

"ඇම්ස්ටඩෑම් බලා යන්න?"

"හරියටම දන්නෙ නෑ. නමුත් එහෙම වෙන්න පුළුවනි. නින්ද ගිහින් හිටි එමැනුවෙල් මහත්මයාට අවදිවෙද්දී අශ්වකරත්තය ඔහු බැසිය යුතු තැන පසුකර තවත් හැතැක්ම බාගයක් පමණ ඉදිරියට ගිහින්. තමන් ඒ ගැන කලින් දැනුම් දී තිබිලත්, තමාව නියම තැනින් බැස්සුවේ නැති එක ගැන, ඔහු අශ්වකෝච්චියේ සේවකයාට බැණ වැදී තිබෙනවා. සේවකයා කිව්වාලු, කෝන්ෆීල්ඩ් වතුයායට වැටෙන පාරේ ටික දුරක් ගියාම, බැඩ්ස්හැම් දුම්රියපොළට යාහැකි අඩිපාරක් තියෙන බව. එහෙම යන්න ගිය එමැනුවෙල් පාර වැරදිලා වෙනත් පැත්තකට ගිහින් අනතුරකට මුහුණ දුන්නා.

මට හිතෙනවා එස්රා ලොම්බාඩ්ට වෙන්න ඇත්තෙත් මේ දේමයි කියලා. නමුත් ඔහු අතරමගදී ඝාතනයට ලක්වුණා. ලොම්බාඩ් ළඟ තිබූ දියමන්ති පමණක් අරගෙන මිනීමරුවා පැන ගියා. අපරාධය සිදු කළ තැන හරියටම සොයාගත්තොත් ඒක විශාල ජයග්‍රහණයක්. මිනීමරුවා ගැන හෝඩුවාවක් රැසක් එතැන තියෙන්න බැරි නෑ"

"ඒ දේ සිදුවෙන්න ඇත්තේ ඔය කෝන්ෆීල්ඩ් වතුයායෙ කියලද ඔබට හිතෙන්නෙ?"

"මේ සිතියම බලන්න වොට්සන්. ලොම්බාඩ්ට වෙන්න ඇත්තෙත් එමැනුවෙල්ට වුණු දේමයි." හෝම්ස් කිය. "දුම්රියපොළට යෑමට බැසිය යුතු තැන මඟ හැරුණා. ඔහු අශ්වකරත්තය නවත්වන ඊළඟ නැවතුම්පොළෙන් බැස්සා. ඔහුට තිබුණා කුලීරියක් කැඳවාගෙන

නියම පාරෙන් දුම්රිය පොළට යන්න. ඇයි ඔහු එහෙම එහෙම නොකළෙ? එක්කො මේතරම් රෑ වෙලා කුලීරියක් අල්ලා ගැනීම අමාරු වෙන්න ඇති. එහෙමත් නැත්නම් ඔහුට හිතෙන්න ඇති ඒකට හුගක් වෙලා ගතවේවි; ඒ අතරෙ තමා යායුතු බෝට්ටු දුම්රිය පිටත් වී යාවි කියල"

"සමහරවිට ඔහු කාගෙන් හරි විමසුවා නම්, ඒ පුද්ගලයා කියන්න ඇති, අඩිපාරෙන් ගියාම දුම්රිය පොළට හරි ළඟයි කියල" මම කීවෙමි.

"ඔව්, එහෙම වෙන්නත් පුළුවනි. කොහොම නමුත් ඔහු නියම පාරෙන් ගමන් කළේ නෑ. ගියේ වැරදි පාරෙන් කියලයි මට හිතෙන්නෙ"

"එතකොට ඔබ සෝදිසිය පටන්ගන්න බලාපොරොත්තු වෙන්නෙ කොතනින්ද ?"

"ලොම්බාඩි අශ්ව කෝච්චියෙන් බැස්සා කියල මං උපකල්පනය කරන නැවතුම් පොළ ළඟින්. ඒ කියන්නේ ලන්ඩන් - මේබල්තෝප් ප්‍රධාන පාරෙන්. ඔය මාර්ග පිහිටා තිබෙන කෝන්ෆීල්ඩ් වතුයාය ගැනත් මා විමසා බැලුවා වොට්සන්. ඒක අවුරුදු එකසිය පනහකට පමණ පෙර ඉරිඟු වගා කරන්න උත්සාහ කළ ඉඩමක්ලු. නමුත් ඒක සාර්ථක වෙලා නැහැ. මොකද ඒක පහත්බිමක් නිසා, එහි වැහි වතුර එකතුවෙන, දියසීරාව වැඩි බවක් තියෙනවාලු. පාළුවට අත්ඇරල තිබුණු මේ ඉඩම එක් ව්‍යාපාරිකයෙකු විසින් මිලට ගෙන තිබෙනවා. ඔහු කැලෑව එළිකරලා, පහත්බිම පුරවලා, ඉඩම කට්ටි කර විකිණීමට උත්සාහ කරාලු. ඉඩමට දැමූ පාර අඩවශයෙන් සකස් කර ඔහු ඒකෙ නිවසක් ඉදිකරගෙන පදිංචි වුණේ, ඉතිරි බිම්කොටස් විකිණීමේ බලාපොරොත්තුවෙන්. නමුත් ඉඩමේ ඔප්පුවල එහි නියම අයිතිකරුවන් පිළිබඳව තිබුණේ නොපැහැදිලි බවක්. ඒ නිසා ඉඩම් කැබලි මිලදී ගන්නන්ට ණය දීම, බැංකු ප්‍රතික්ෂේප කරාලු. නිවාස යෝජනා ක්‍රමය එතැනින්ම නැවතුණාලු. ඊට වඩා යමක් කියන්න ඒ පොලිස් නිලධරයා දැනහිටියෙ නෑ."

උදේ නවයහමාරට පෙර අපි කුලීරියකින් පිටත්වී ගියෙමු. ප්‍රථමයෙන්ම අප ළඟා වුයේ අශ්ව කෝච්චි ගමනාගමනය සිදුවූ ප්‍රධාන පාරටයි. ලොම්බාඩි රියෙන් බැස්සේ යයි අප අනුමාන කළ තැනදී කුලීරියෙන් බැස අපි අඩිපාර සොයා පිටත්වීමු.




බැඩ්ස්හැම් දුම්රිය පොළ අවට පෙදෙසේ දළ සිතියමක්
(පරිමාණයට නොවේ)

අඩක් සකස් කළ පාර ඇරඹුණු තැනම, "කෝන්ෆීල්ඩ් උද්‍යානය" යනුවෙන් සඳහන් වූ සිමෙන්තියෙන් තැනූ ඇවැන්ත පුවරුවක් විය. එය කාලය සමග දුර්වර්ණ වී තිබිණ. පටන්ගැනීමේදී පාර අඩි විසිපහක් පමණ පුළුල් එකක් විය. එහි ගල් අතුරා තාර දමා සකස්කර තිබුණේ, මුල් යාර පනහක පමණ දුරක් පමණි. එයද කාලය සමග කැඩීබිඳී ගොස්, වළවල් හැරී තිබිණි. පාරේ පුළුල් බව මීළඟට අඩුවිය. එතැනින් ඉදිරියට තිබුණේ, කිසිදිනෙක තාර නොදැමූ ගුරු පාරක් බැව් අපි දුටුවෙමු. නිතර වාහන ගමන් නොකළ නිසා, කරත්ත රෝදවලින් පාර සෑරී නොතිබිණ. එහෙත් මෙය පහත් බිමක් නිසා, වැසි කාලයට ජලය සහ මඩ එකතු වෙන තැනක් බව දිස්විය. ගුරු පාර ඇරඹී යාර පහළොවක දුරක් ඉදිරියට යද්දී, දකුණු පැත්තට තිබූ අඩිපාරක් අපි දුටුවෙමු.

"මෙන්න මේක තමයි වොට්සන් දුම්රිය පොළට යන අඩිපාර. එස්රා ලොම්බාඩ්ට මේ අඩිපාර මඟ ඇරුණා නම් ඒකෙත් පුදුමයක් නෑ. ඒ මොකද මේ රූස්ස ගස් හා පඳුරු නිසා මෙතැන අඩිපාරක් තියෙන බව, අඳුරු වැටුණාම නොදන්නා කෙනෙකුට පෙනෙන්නෙත් නෑ. හිතාගන්නත් බෑ. අපි පහුවෙලා ඒකෙ ගිහින් බලමු. මට දැනට උවමනා කරන්නේ මේ තාර නොදැමූ පාරෙ යන්න"

මේ පාර කිසිවෙකු විසින් එතරම් භාවිතයට ගත් එකක් බැව් නොපෙනිණ. පාර දෙපස තණකොළ කෑම සඳහා නිදැල්ලේ ගැවසුණු ගවයන් හතරපස් දෙනෙකුගේ රංචුවක් අපි මුලින්ම දුටුවෙමු. වාහන හෝ පදිකයන් නිතර ගමන් නොකළ නිසාදෝ, පාරේ තැන් තැන්වල තණකොළ හා උසට නොවැවුණු පැළෑටි දක්නට ලැබිණ. කෙසේ වෙතත් මගේ මිත්‍රයා අප්‍රමාණ ප්‍රීතියකට පත්වුණේ, පාවහන්වල අඩි සලකුණු මැටි පොළොව මත සටහන් වී තිබෙනු දුටු විටයි.

"මේක නම් අපරාධ පරීක්ෂකයෙකුට ඉතාමත් කලාතුරකින් ලැබෙන වාසනාවක්" හෝම්ස් කීය. "දෙතුන් දෙනෙකු මේ පාරේ ඉහළ පහළ ඇවිද ගිය බවට, පාවහන්වල සලකුණු ඉතාමත් පැහැදිලිව සටහන් වී තියෙනවා. සමහර තැන්වලදී ඒවාට බාධාවෙලා තියෙන්නේ, ගවයන්ගේ කුර සලකුණුවලින් සහ ඉඳහිට කුලීරියක රෝදයකින් පමණයි.

ඔබට පුළුවන්ද වොට්සන් මෙන්න මේ පාවහන් සලකුණු හඳුනාගන්න? පුළුවන්? ඔව්. ඔබ කියන්න වගේ ඒවා පැහැදිලිවම

කාන්තාවකගේ පාවහන් සලකුණු. ඊළඟට පිරිමියෙකුගේ තරමක් ගෙවුණු "ජෝන් වයිට්" පාවහන් ලකුණුත් තියෙනවා. එක් සලකුණු ජෙළියක් සෑහෙන තරම් අලුත්. එතකොට මේක......? හො හෝ!

තව ටිකෙන් ඒක මට වරදිනවා! ඒ එස්රා ලොම්බාඩි මහත්මයා මේ පාරේ ගමන්කර ඇති බව තහවුරු කරන ලකුණු. මේවා අප කලින් දුටු ඉයුජින් රේමන්ඩ් පාවහන්වල ලකුණු බව ඉතාම පැහැදිලියි."

අපි අඩි දහයක් පමණ ඉදිරියට ඇවිද ආවෙමු.

"ඔබට මතකද වොට්සන් කර්නල් හේටර් අපට කියූ කරුණ? ලොම්බාඩි බලාපොරොත්තු වුණාලු මෙම දුම්රිය පොළේදී හේටර් හමුවෙන්න. තමන් යන්නෙ දුම්රියපොළට කියල හිතාගෙන ලොම්බාඩි මේ පාර දිගේ කොයිතරම් දුරක් ගියාද? ඒකයි දැන් අපට විසඳන්න තිබෙන ප්‍රශ්නය.

ඔහු ගමන් කරල තියෙන්නේ පාර මැදින්මයි. පාවහන් අඩියේ සලකුණු ඉතාම පැහැදිලිව මැටි පසේ වැදිල තියෙනවා. අර තියෙන්නේ සිතියමේ සඳහන් නිවස විය යුතුයි - කෝන්ෆීල්ඩ් උද්‍යානයේ බිම් කොටස් අලෙවිකරන්න, එහි අයිතිකරුවා ඉදිකළ නිවස. ඔහු ඒක ඉදිකරන්න ඇත්තේ, ඉඩම අලෙවිකරන සමාගමේ කාර්යාලය හැටියට. ඒ සැලැසුම අවුල් වී ගියාම නිවාසය සම්පූර්ණ කරලා කුලියට දෙන්න ඇති."

"ඒ ගෙදර කවුරුවත් ඉන්න පාටක් නම් නැහැ. ගේට්ටුව වහල. ජනේල ඔක්කොමත් වහල දමල" මම කීවෙමි.

"පා සටහන් අනුව ලොම්බාඩි පාර දිගේ කෙළින්ම ඉදිරියට ගිහිං" හෝම්ස් කීය. "යාර විසිපහක් විතර ගිහිං ඔහු පාර මැදම නැවතිලා. ඒ ඇයි? ඔහුට වැටහුණා තමන් ගමන්ගත්තු පාර වැරදි බව.

මේ බලන්න ඔහු ආපහු හැරුණු හැටි. ඊළඟට ඔහු වේගයෙන් ආපහු යනවා. පියවර දෙකක් අතර දුර කෙටි වීමෙන් පෙනෙන්නේ, ඔහු ගමන ඉක්මන් කළ බව. ඔහු යන්නේ අර වසා තිබෙන ගෙදර ගේට්ටුව ළඟට. ගෙදර නම සඳහන් පුවරුව තියෙන්නෙ ඉස්සරහ බිත්තියක - "කෝන් පැලස්" අපූරු නමක්."

"හෝම්ස් ඔබ මේක දුටුවාද?" මා පැවසුවේ ගේට්ටුව අසලම බිමට අත දිගු කරමිනි. පාරේ තිබූ ගොම ගොඩක් මතම මියගිය ලොම්බාඩිගේ පාවහන් අඩියේ සලකුණ තිබිණි.

"ඔබේ නිරීක්ෂණය විශිෂ්ටයි වොට්සන්. ලොම්බාඩිගේ එක් පාවහනක යටි පැත්තේ ගොම තැවරෙන්න ඇත්තේ මෙතැනදී. ඔහු

මේ ගෙදරට ඇතුළු වී තිබෙන බව මට විශ්වාසයි. අපි බලමු ගේට්ටුවෙන් ඇතුළු නොවී, හොයාගන්න පුළුවන් හෝඩුවාවක් මොනවද කියල."

ගේට්ටුව අසල බිම තිබී ලී පතුරු ගිනිකූරක් අපට හමුවිය. හෝම්ස් එයද කවරයක් තුළ තැන්පත් කරගත්තේය.

"අපේ ඉදිරිගමන මෙතැනින් අවසන් වෙනවා වොට්සන්. මට උවමනා කරන හැමදෙයක්ම මං සොයාගත්තා"

"ඒ කියන්නේ ඔබ මේ ගෙදරට මේ මොහොතේ ඇතුළුවෙන්නේ නැද්ද?"

"තට්ටු කරලා බලමු" හෝම්ස් කීය. "කවුරු හරි දොර ඇරියොත් අපේ වැඩ කටයුතු හුඟක් පහසු වෙනවා........"

"දොර ඇරියෙ නැත්නම්?"

"මේ ගෙදරට මේ මොහොතේ දොර කඩාගෙන ඇතුළුවෙන්න මගේ බලාපොරොත්තුවක් නෑ වොට්සන්. මිනීමැරුම සිදුවී තිබෙන්නේ මෙතැන බව මට හොඳටම විශ්වාසයි. ඒ නිසා අපි මෙතැනට ඇතුළුවෙන්න ඕන, ස්කොට්ලන්ඩ්යාඩ් පොලීසියේ නිලධරයකු සමඟ. එහෙම නොකළොත් පසුව උසාවියෙදි ප්‍රශ්න ඇතිවෙන්න ඉඩ තියෙනවා. ඒ මොකද මේ අපරාධය පරීක්ෂා කිරීම, පොලීසිය අපට නිලවශයෙන් භාරදුන්නු එකක් නෙමෙයිනෙ."

කිහිපවාරයක් ගේට්ටුවට තට්ටු කළත් නිවස තුළින් ප්‍රතිචාරයක් නොවීය. "හරි. මං හිතුව වගේමයි." හෝම්ස් කීය. "හැමදේකටම කලින් මෙතැන මුර කරන්න අපි පොලිස් භටයන් දෙදෙනෙක් රඳවමු. මං ගිහිං අද උදේ මට උදව් කළ පොලිස් සාජන්ට් කැඳවාගෙන එන්නම්. ඊට පස්සෙ අපේ ඇඳුම් බෑග් එකතු කරගෙන වහාම යමු ලන්ඩනයට."

"ගිහිං?"

"ගෙට ඇතුළුවීමට සහ සෝදිසි කිරීමට නිල අවසර පත්‍රයක් වහාම ගත යුතුයි. ග්‍රෙග්සන්, ලෙස්ට්‍රේඩ් හෝ හොප්කින්ස් වැනි නිලධරයෙකු සමඟ තමයි අපි ආපහු එන්නේ"

ඇඳුම් මලු ද රැගෙන අපි ආපසු ලන්ඩනය වෙත පැමිණියෙමු. බේකර් වීදියේ අපේ නිවහනට යාම පසුවට කල්දමා, අපි කෙළින්ම ස්කොට්ලන්ඩ්යාඩ් පොලීසිය වෙත ගියෙමු.

"නිවාස සෝදිසිකිරීම සඳහා ඇතුළුවීමේ අවසර පත්‍රය, අදම ගන්න ලැබෙන එකක් නෑ හෝම්ස් මහත්මයා" ස්ටැන්ලි හොප්කින්ස් කීය. "මේ වෙනකොට හැමතැනක්ම වහල ඇල. මේව ගන්න වෙන්නෙ හෙට උදේ තමයි"

"හොඳයි. එහෙම නම් කරන්න දෙයක් නෑ" හෝම්ස් කීය. "අවසර පත්‍රත් අරගෙන ඔබ බේකර් වීදියට එන්න. ඊට පස්සෙ හැකි ඉක්මනින් අපි බැඩ්ස්හැම් යමු"

"කොයිතරම් මහන්සි වුණත් කළයුතු වැඩ රාශියක් තියෙනවා" මගේ මිත්‍රයා කිවේ අප බේකර් වීදියේ නිවහනට ළඟා වූ විටයි. "අපට සොයාගැනිමට හැකිවුණු සියුම් දේවල්, අණ්වීක්ෂයෙන් පරීක්ෂා කර බැලීම තමයි මුලින්ම තියෙන්නෙ"

තමන් සොයාගත්තා දේ ඔහු එකින් එක මා වෙත දැනුම් දෙන නිසා, මම විවේක ගැනිමට තීරණය කළෙමි. ඒ සියලු දේ රාත්‍රියේ නින්දට යාමට පෙර මට දැනගැනිමට හැකිවිය.

"එස්රා ලොම්බාඩි ගේ යටි ඇන්දේ ඉදිරි දත් මත තිබී හමුවුණා තේ කැම ද්‍රව්‍යයක්. ඒ ගැන මා කියූ දේ නිවැරදි බව තහවුරු වුණා වොට්සන්. ඒ ඕට්ස් ධාන්‍යය මිශ්‍රිත විස්කෝතුවක සුන්බුන්. ඇතුළු කබායේ බොත්තම් අතර සහ පාවහන් අඩියේත් ඒ දේම තිබුණා. අපරාධය සිදුවෙන්න ඇත්තේ නිවස තුළ. එම විස්කෝතුවල සියුම් කැබලි තවමත් එතැන ඇති.

ඊළඟට දත් අතර හිරවී තිබී මා සොයාගත් නූල් කැබලි; ඒක පැහැදිලිවම යම්කිසි රෙද්දකින් ගැලවී ගිය නූල්. අණ්වීක්ෂයෙන් මට දැනගැනිමට හැකිවුණා, නූල සෑදී තිබුණු අයුරු සවිස්තරව. විවිධ වර්ණවල ඩයි යොදා පාට ගැන්වූ, විවිධ වර්ගවල කෙඳි. එයින් වැඩිහරිය තද රතු පැහැය යෙදූ වූල් කෙඳි. නිල් පාට යෙදූ කපු කෙඳිත් තිබුණා. කහ වර්ණය යෙදූ කෙඳි වර්ගයක් තිබුණා. ඒක හණ කෙඳි කියලයි මට හිතෙන්නේ. මිශ්‍ර වර්ණ කිපයක රෙද්දක් නිසා, කාන්තාවකගේ ඇඳුමකින් වෙන්නත් පුළුවනි. නමුත් හණ කෙඳි තිබීමෙන් පෙනෙන්නේ, දොර ජනේලවලට දමන තිර රෙද්දක්; එහෙමත් නැත්නම් මේස රෙද්දක් කියලයි මං හිතන්නෙ. පාවහන්වල අඩියේ ඇලී තිබුණු රතුපාට කෙඳි නම් නිසැකවම, රතුපාට බුමුතුරුණකින් ගැලවී ගිය ලෝම කෙඳි."

නිතිමය අවශ්‍යතා සම්පූර්ණ කරගෙන අප බැඩ්ස්හැම් දුම්රියපොළට ළඟාවෙද්දී, පසුවඳ දහවල් එක පමණ වී තිබිණ. "රෝයල් ලයන්ස්" තානායමෙන් දිවා ආහාරය ගෙන, කෝන්ෆීල්ඩ් උද්‍යානය වෙත පිටත් වූයෙමු. ඒ දුම්රිය පොළේ සිට වැටී තිබූ අඩිපාරෙනි. අප සමග පැමිණි ස්කොට්ලන්ඩ්යාඩ් පොලිස් නිලධරයා වූයේ ටෝබියස් ග්‍රෙග්සන්ය.

"අප එනතුරු මෙතැන ආරක්ෂා කිරීම ගැන ඔබට ස්තුතියි සාජන්ට් මහත්මයා" හෝම්ස් කීවේ ගේට්ටුව අසල සිටි පොලිස් නිලධරයා වෙත නෙත් යොමු කරමිනි. "ගේට්ටුව හා දොරවල් කඩාගෙන ඇතුල්වෙන්න වුණත් දැන් ඉතින් අපට අවසර තියෙනවනෙ"

හෝම්ස් ළඟ තිබූ යතුරු කැරැල්ලෙන් ගේට්ටුවේ ඉබ්බා විවෘත කිරීමට ගතවූයේ මිනිත්තුවක් පමණි. ගෙවත්තට ඇතුළු වූ විගස හෝම්ස් තම උකුසු ඇස් යොමුකළේ, ගේට්ටුව හා දොර අතර මල් වවා තිබූ තැන් වෙතටයි.

"මෙන්න මේකෙන් අපට ලැබෙනවා තොරතුරු රාශියක්" ඔහු කීවේ, අඟල් භාගයකටත් අඩු ප්‍රමාණයක් දැවීගොස් තිබූ සිගරට්ටුවක් අහුලා ගනිමිනි.

"මොනවද ඒකෙන් ලැබෙන තොරතුරු?"

"සිගරට්ටුව දල්වලා ඉවතට විසිකරල තියෙන්නෙ උරන්නෙ නැතුවම. ඒකෙන් පෙන්වන්නෙ, කරන්න අරමුණු කරගත් දේ හදිසියේ වෙනස්වුණු හැටි. ගෙට ඇතුළුවෙද්දී සිගරට්ටුව ඉවතට විසි කිරීමෙන් පෙනෙනවා, ඔහු ගෙදරට අමුත්තෙකු බව. ගෙදර කෙනෙකු වුණා නම් ඔහු සිගරට්ටුව ගේ තුළට ගෙන යනවා නෙ.

මේ සිගරට්ටුව ඔතා තිබෙන්නෙත් "සිග්-සැග්" නමින් හඳුන්වන දිය සලකුණ සහිත කඩදාසියකින්. එස්රා ලොම්බාඩ් ළඟ තිබූ "සිගරට් පොතේ" කඩදාසිත් "සිග්-සැග්" දිය සලකුණ සහිත ඒවා. දැන් අපි බලමු මෙහි අඩංගු දුම්කොළ මොනවාද කියල"

සිගරට්ටුවේ නොදැල්වුණු කෙළවර ඉරූ මගේ මිත්‍රයා, ඇතුළත වූ දුඹුරු පැහැති දුම්කොළ ඇඟිලි තුඩින් ගෙන තම අත්ලට දමා මා වෙතට ළං කළේය. මම එහි සුවඳ ආඝ්‍රාණය කළෙමි.

"මේක සම්පූර්ණයෙන්ම ලටකියා බවට කිසිම සැකයක්`නෑ" මම කීවෙමි.

"හරියට හරි වොට්සන්. සිහින්ව කැපූ ලටකියා දුම්කොළ. මේක ලොම්බාඩ් එතූ සිගරට්ටුවක් බවට කිසිම සැකයක් නෑ. එම දුම්කොළමයි. එම කඩදාසියමයි. කමක් නෑ. අපි බලමු ඒ නිගමනය තවදුරටත් සනාථ කරන සාක්ෂි තියෙනවද කියල.

ෆ්‍රෙග්සන් ඔබ මොකද කියන්නෙ? අපි දොරේ අගුල කඩමුද? නැත්නම් මා ළඟ තිබෙන යතුරක් දාල උත්සාහ කරල බලමුද?"

"හෝම්ස් මහත්මයා. ඔබේ කැමැත්තක්"

පැය භාගයකට කිට්ටු කාලයක් නොයෙක් යතුරු හා නැමූ කම්බිකූරු යොදමින්, හෝම්ස් දොර විවෘත කරගැනීමේ උත්සාහයක යෙදුණේය. එහෙත් එය සාර්ථක නොවිණි. අන්තිමේදී පිටිපස දොරේ අගුල කඩාගෙන අපි නිවස තුළට පිවිසියෙමු.

විසිත්ත කාමරය වෙත මුලින්ම ගියේ හෝම්ස්ය. ඔහු එයට ඇතුළු නොවුණු අතර, අපට එහි ඇතුළුවීමට ද ඉඩ නොදුන්නේය. පළමුව ඔහු එම කාමරයේ ගෑස් පහන් සියල්ල දැල්වීය. මීළඟට ඔහු බිම දණගසාගෙන බිත්ති අයින් සෝදිසි කළේ, දැඩි උනන්දුවකිනි. මිනිත්තු පහක් ගතවෙද්දී, ජයග්‍රාහී හඬක් ඔහුගේ මුවෙන් නිකුත්විණි. මීළඟට ඔහු අප වෙත ආවේ තමන් සොයාගත් දේ අපට පෙන්වමිනි.

"එස්රා ලොම්බාඩිගේ උපැස් යුගල බිමවැටෙද්දී, කාචයක් බිඳිල එක කෑල්ලක් ඉවතට විසිවී ගිහින්" හෝම්ස් කිය. "මෙන්න ඒක. ඔබ කළ සොයාගැනීමක් හැටියට එය ඉදිරිපත් කළාට මගේ අමනාපයක් නෑ ග්‍රෙග්සන්. ඔහුගේ උපැස් යුගලේ වීදුරු කැබලි එක්කරමින් මා විසඳූ ජිග්සෝ ප්‍රහේලිකාව, සම්පූර්ණ වෙන්නෙ මේකෙන්. මේ ගේ ඇතුළෙන් අපට තවත් හොයාගන්න පුළුවන් මොනවද කියල බලමු"

බිත්තියක් අයිනේ වූ බීම ට්‍රොලියක් මත විස්කි බෝතලයක් සහ සෝඩා සයිෆනයක් විය. ඒ අසලම තිබුණේ හිස් වූ විස්කෝතු පෙට්ටියකි. රෝලරයකින් ඇඹරූ ඕට්ස් ධාන්‍යය යෙදීමෙන්, මෙම විස්කෝතු සම්පූර්ණ ආහාරයක් බවට පත්කොට ඇතැයි, එහි පිටත ලේබලයේ සඳහන් විය.

ගිනිඋදුන සමීපයේ බිම තවත් සිගරට්ටුවක් තිබිණි. එය අඩක් පානය කිරීමෙන් පසු, පයින් පාගා දැමීම නිසා සමතලා වී තිබිණ. ඒ සමීපයේම තිබී ලී පතුරු ගිනිකූරක් ද අපට හමුවිය. මේ සිගරට්ටුවද ලටකියා දුම්කොළ අඩංගු එකක් බැව් හෝම්ස් අපට පෙන්වා දුන්නේය.

"වොට්සන්. ඔබට මේ මේසරෙද්ද ගැන කියන්න පුළුවන් මොනවද?" හෝම්ස් විමසුවේ සාලය කෙළවර තිබූ පුටුවක් වෙත අතදිගු කරමිනි.

"ඇයි ඔබ එහෙම අහන්නෙ?"

"ඇයි වොට්සන්. මීට කලින් නොදුටුවත්, මේ මේසරෙද්ද ඊයේ රෑ හඳුනාගන්න අපට හැකිවුණානෙ"

"ඔබ මේ කියන්නෙ මොකක් ගැනද කියා මට තේරුම් ගන්න අමාරුයි හෝම්ස් මහත්මයා" ග්‍රෙග්සන් කීය.

"මට සමාවෙන්න ග්‍රෙග්සන්. අප සොයාගත් හැමදෙයක් ගැනම ඔබට කියන්න, මට වෙලාවක් ලැබුණෙ නැහැනෙ. මියගිය පුද්ගලයාගේ දත් අතර තිබී නූල් කැබැල්ලක් අපට ලැබුණා. ඒ නූල සෑදී තිබුණේ, රතු වූල් කෙඳි, නිල් කපු කෙඳි සහ කහ හණ කෙඳි එකට ඇඹරීමෙන් බව මං අණ්වීක්ෂයෙන් දුටුවා. මේ රෙද්දෙන් නූලක් ගලවාගෙන, මගේ උත්තල කාචයෙන් පරීක්ෂා කර බලන්න. රතු, නිල් සහ කහ කෙඳි එහි අඩංගු බව දැකගැනීමට ඔබට හැකිවේවි."

"මේක මිනීමැරුමට සම්බන්ධ නම්, ඒකත් මම පොලිස් භාරයට ගත යුතුයි. එහෙම නේද?" ග්‍රෙග්සන් විමසීය.

"ඇත්තෙන්ම ඔව්. ඒ සමගම බලන්න අර ගිනි උදුන් පඩිය මත තිබී සොයාගත්, මේ සුදුපාට ට්වයින් නූල් කැරැල්ල දිහා"

"ඒක කොහොමද වැදගත් වෙන්නෙ?"

"දුම්රිය අනතුර සිදුවුණු තැන රේල් පාරේ තිබී මං ට්වයින් නූල් කැබැල්ලක් අහුලා ගත් බව ඔබට මතකද වොට්සන්? ඒක ඇහිඳ ගත්තාම, පොලිස් පරීක්ෂක කිංගේ උපහාසයටත් මං ලක්වුණා. ට්වයින් නූල සුදුපාට වුණාට, ඒක අඹරද්දී කොළ පැහැති කෙන්දකුත් එයට මිශ්‍ර කර තිබුණා. මෙකෙත් ඒ කොළපාට, ඒ විදියටම ඇති"

"අපරාධකාරයා ට්වයින් නූලකින් ගැටගහන්න ඇත්තේ මොකක්ද?" ග්‍රෙග්සන් විමසීය.

"මට හරියටම කියන්න අමාරුයි" හෝම්ස් පිළිතුරු දුන්නේය. "මට හිතෙනවා ඔහු ඉන්න ඇත්තේ ලොකු හදිසියකින් කියල. මිනීමරුවන් කවුරුත් අපරාධයක් කළාට පස්සේ ඉන්නේ ලොකු හදිස්සියකින්. ලොම්බාඩිගේ මළසිරුර අපරාධකරු දුම්රිය මාර්ගය වෙත ගෙනයන්න ඇත්තේ, තමන්ගේ කරමත පටවාගෙන. ලොම්බාඩිට අයත් අත්බෑගය සහ කුඩය, ඒ සමඟම ගෙනයාම අමතර කරදරයක්. ඒ නිසා ඒ දෙක ඔහු ට්වයින් නූල් දෙපොටකට ගැටගසා එල්ල ගත්තා වෙන්න බොහොම දුරට ඉඩ තියෙනවා. මළසිරුර දුම්රිය මාර්ගය මත දමද්දී ඒ නූල කපා ඉවත් කරගන්න ඔහු අමතක කළේ නෑ. අපරාධකාරයා ශල්‍ය වෛද්‍යවරයෙකු නොවන බව නම් මට සහතිකයි"

"ඔබ කොහොමද එහෙම කියන්නේ?" මා විමසුවේ විමතියට පත්වය.

"ඔබ සිල්ක් නූල් යොදා රෝගීන්ගේ මතුපිට තුවාල මහල ඇති?"

"ඔව්. අනන්ත අප්‍රමාණව"

"තුවාලය හොඳවුණාම මැහුම් ඉවත් කරද්දී, ඔබ ඒ නූල තැන් දෙකකින් කපන්නේ නෑ; එක් තැනකින් කපලා, නූල ඇද ඉවත් කරනවා?"

"සත්තකින්ම ඔව්" මම කීවෙමි. "තැන් දෙකකින් කැපුවොත් නූල් කැබැල්ලක් ඇතුළෙ ඉතිරි වෙනවානෙ"

"හරියට හරි. මේ අපරාධකාරයා කරල තියෙන්නේ ඒ වැරදි විදියට. තැන් දෙකකින් කැපුවාම එක් කැබැල්ලක්.......!"

මේ අවස්ථාවේ හෝම්ස් තම කථාව වහාම අත්හිටෙව්වේය. ඒ ගේට්ටුවෙන් ඇතුළු වූ කිසිවෙකු, නිවස වෙත එන අඩි ශබ්දයක් අපට අසන්නට ලැබීමෙනි. නිවස තුළ සොහොන් පිටියක මෙන් දැඩි නිශ්ශබ්දතාවයක් ඇතිවිය. නිවසේ ඉදිරි දොර වෙත පැමිණියේ කාන්තාවක විය යුතු බැව් තේරුම් ගැනීම අපහසු නොවිණි. ඒ පාවහන් සිමෙන්ති පොළොව මත ගැටුණු හඬෙනි. තම කබා සාක්කුවට අත දැමූ පොලිස් පරීක්ෂක ග්‍රෙග්සන් රිවෝල්වරය අතට ගෙන එය ඉදිරි දොර දෙසට එල්ල කරගෙන සූදානම් විය.

යතුරකින් දොර අගුල ඇරී දොර විවෘත විය. නිවසට ඇතුළුවූයේ මැදිවියේ කාන්තාවකි. එක්වරම අප තිදෙනා දුටු කල, ඇය භීතියෙන් සුදුමැලි වූවාය. දෙනෙත් විශාල කරගෙන බලාසිටි ඇය, ක්ලාන්තයෙන් බිම ඇද වැටේවි යයි මම සිතුවෙමි.

"ඔ......ඔහෙල කවුද? දෙයියන්ගෙ නාමෙන් කියනවා! ඔහේලා මොනවද මේ ගෙදර ක.....කරන්නෙ?" ඇයට කෑගැසිණ.

"නෝනා" ග්‍රෙග්සන් කීය. "මං පොලිස් නිලධරයෙක්. අනෙක් තොරතුරු ඔබට දැන්ම කියන්න හැටියක් නෑ. ඊට කලින් මට කියන්න, ඔබ කව්ද? ඔබ මොකටද මේ ගෙදරට ආවෙ?"

"මහත්මයා. මං තමයි මේ ගෙදර පිරිසිදු කර දීමට සහ කෑම ඉව්මට එන ගෘහ සේවිකාව."

"එතකොට කවුද මේ ගෙදර අයිතිකරු...... ඔබේ ස්වාමියා?

"ඇන්ඩ්රූ ෆ්ලෙචර් මහත්මයා"

"ඒ මහත්මයා තව ටික වෙලාවකින් ගෙදර ඒමට නියමිතද?"

"ඒක කියන්න බෑ. ඔහේල මොකටද ඒව හොයන්නෙ?" කාන්තාව කීවේ ගරුසරු බවක් නොමැතිව ය.

"මං ඔබට කලිනුත් කීවා." ග්‍රෙග්සන් කීය. "අපි පොලීසියෙන්. රාජකාරි වැඩකට"

"මහත්මයා ඊයෙ හැන්දෑවෙ කෝච්චියෙන් ලන්ඩන් යන බව කිව්වා. එහෙම ගියාම පහුවදාට දවල් කෑමට එනවා"

"ඒ කියන්නෙ අදත් දවල් කෑමට ඒවි නේද? ඔබ ආවෙ කෑම පිළියෙල කරන්නද?" ග්‍රෙග්සන් ඇසීය.

"මට ඒව මොකුත් කියන්න බෑ."

"ඔබේ නම මොකක්ද නෝනා?" ඒ විමසීම හෝම්ස්ගෙනි.

"සිල්වියා මිලර්"

"මිලර් මහත්මිය" හෝම්ස් ඇය ඇමතීය. "අපි ආවෙ වැදගත් රාජකාරි වැඩකට. අපට නියම වෙලා තියෙනවා මේ ගෙදර සෝදිසි කරන්න. ඒකට තව පැයක්වත් ගතවෙන්නෙ නෑ. කරුණාකරල එතෙක් විසිත්ත කාමරයේ අසුනක හිඳගන ඉන්න. ඊට පස්සේ ඔබට පුළුවනි ඉවුම් පිහුම් පටන්ගන්න"

"එහෙම නම් මං ගිහින් පැයකින් ආපහු එන්නද?" ඇය විමසුවේ හොරැහින් බලමිනි.

"ඔබට ඒ දේ කරන්න ඉඩදෙන්න නම්, අපට කොහොමටවත් බැහැ නෝනා" හෝම්ස් කීය. "ඔබ කැමති නම් අපි පොලිස් මෙට්‍රන්වරියක් කැඳවන්නම්. ඔබට පුළුවනි ඇය සමග පොලිස් ස්ථානයට යන්න"

"නැහැ උවමනා නැහැ. මං මෙහෙත් ඉන්නම්" ඇය කීවාය. "ඔබේ රාජකාරි ඉවරයක් කරල ඉක්මනට මෙහෙන් යන්න"

"හොඳමයි මිලර් මහත්මිය" හෝම්ස් කීවේ ආචාරශීලි ස්වරයෙනි.

මිලර් මහත්මිය හොඳින් කන් යොමුකරගෙන සිටි බැවින්, එතැනින් ඉදිරියට අප අතර කතාබහක් නොකෙරුණු තරම්ය. මුර සංචාරයේ යෙදුණු පොලිස් භටයෙකු අත මේබල්තෝප් පොලීසිය වෙත පණිවුඩයක් යැවීමට ග්‍රෙග්සන්ට හැකිවිණි. එමගින් පොලිස් මෙට්‍රන්වරියක ඉක්මනින් කැඳවාගැනීමට අවස්ථාව සැලසිණ.

මුළුතැන්ගෙයි කසළ බඳුන පරීක්ෂා කළ මගේ මිත්‍රයා, බිඳී ගිය වීදුරු තඹලේරුවක් සොයාගත්තේය. තරු මෝස්තරයක් තිබූ එහි එක් කැබැල්ලක් අඩු බැව් ඔහු පෙන්වා දුන්නේය. මීළඟට හෝම්ස් කාමරයෙන් කාමරයට ගියේ තවත් යමක් සොයමිනි. ඒ කුමක්දැයි අපට පැවසුවේ නැත. එහෙත් මඳවේලාවකට පසු දොරවසා තිබී

විවෘත කරගත් අමුත්තන්ගේ කාමරයෙන්, ඔහු එළියට පැමිණියේ ජයග්‍රාහී ලීලාවෙනි. තමාට සොයාගැනීමට හැකිවූ, ෆෙල්ට් වලින් නිර්මාණය කෙරුණු අඟනා තොප්පියක් ඔහු අපට පෙන්විය. මීළඟට ඔහු අපට පෙන්වූයේ එහි ඇතුළතයි. "එස්රා ලොම්බාඩ්" යනුවෙන් එහි ලියා තිබිණ.

එය පරීක්ෂාකර බැලීමටවත් අපට අවකාශයක් නොලැබිණ. ඊට හේතුවූයේ නිවස ළඟට කුලීරියක් පැමිණි ශබ්දය අසන්නට ලැබීමයි.

"ඔහු සීනුව නාද කළාම, ඔබ දොර විවෘත කරන්න වොට්සන්" හෝම්ස් කීවේ තම කබා සාක්කුවේ තිබූ රිවෝල්වරය අතට ගෙන එහි ආරක්ෂක අගුල ලිහිල් කරමිනි. "ග්‍රෙග්සන් සූදානමින් ඉන්න. ඔබේ දෙනෙත් එක මොහොතකටවත් ඉවතට ගන්න එපා."

සීනුව නාද කරන ශබ්දය ඇසෙද්දී, මම දොර විවෘත කිරීම සඳහා ඉදිරියට යාමට තැත් කළෙමි. එහෙත් හෝම්ස් තම වම් අතෙන් මා අල්ලා එක් මොහොතකට රඳවා ගත්තේය. අනතුරුව මට යාමට ඉඩ දුන්නේය.

විවෘත කළ දොරෙන් ඇතුළු වූයේ අඩි හයක් පමණ උස හැඩිදැඩි පුද්ගලයෙකි. "ඇන්ඩ්‍රූ ෆ්ලෙචර් මහත්මයා" ග්‍රෙග්සන් කීය. "එස්රා ලොම්බාඩ් මහතා මරාදැමීම ගැන මහරජිනගේ නාමයෙන් මම ඔබ හිරභාරයට ගන්නවා"

තිගැස්සුණු අමුත්තා එක්පියවරක් පිටිපසට ගත්තේය. එහෙත් තමා දෙසට එල්ලවී තිබූ රිවෝල්වර දෙක දුටු ඔහු දෑත් ඉහළට එසෙව්වේ යටත්වන බව හඟවමිනි.

## II

"මගේ සැබෑ නම හැරී පෝට්මන් බව මං පිළිගන්නවා. කලකට පෙර මං එය ඇන්ඩ්‍රූ ෆ්ලෙචර් ලෙස වෙනස් කරගත්තේ මගේ අපකීර්තිමත් අතීතයෙන් සැඟවී සිටීමේ අරමුණෙන්" අමුත්තා කීවේ පාපෝච්චාරණය අරඹමිනි.

"හැටින් උද්‍යානයේ දියමන්ති වෙළෙන්දෙකු ගේ ලිපිකරුවෙකු ලෙස මා සේවයට බැඳුණේ තරුණ කාලයේ මයි. අවුරුදු හතක කාලයක් මං ඔහු ළඟ සේවය කළා. දකුණු අප්‍රිකාවෙන් සහ අනෙක් රටවලින් එංගලන්තයට එන දියමන්ති ගැන මට ඉගෙන ගන්න ලැබුණේ ඔය කාලයේදියි. නොකැපූ රළු දියමන්ති කැට කපා ඔපදැමීම ගැනත්, ඒවා අලෙවි කිරීමේ ශාස්ත්‍රයත් ඉගෙන ගන්න මට හැකිවුණා.

දියමන්ති වෙළඳුන් කෝටි ගණනින් මුදල් උපයාගත්තත් සේවකයන් වූ අපට ගෙව්වේ ඉතා අඩු වැටුප්. ඒ නිසා මේ රැකියාවෙන් ඉවත් වී මගේම ව්‍යාපාරයක් අරඹන්න, අන්තිමේදී මං තීරණය කළා. නමුත් අවාසනාවකට වගේ ඒක සාර්ථක වුණේ නෑ. ඒකට හේතුවුණේ මා ළඟ උපයාගත් මුදලක් නොතිබීම.. ඉක්මනින් අරමුදලක් සපයාගැනීමට නීත්‍යානුකූල ක්‍රමයක් ගැන මං කල්පනා කළා. ලොකු ඉඩම් මිලදීගෙන කට්ටිකර විකිණීමෙන්, ලොකු පොහොසතුන් බවට පත්වූ පුද්ගලයන් ගැන මං අසා තිබුණා.

දිගු කලක් අත්හැර දමා තිබූ මඩවගුරක් වුණු කෝන්ෆීල්ඩ් වතුයාය, මං අඩු මුදලකට මිලට ගත්තේ ඒ අරමුණෙන්. එයට පස් පුරවා සංවර්ධනය කර ගෙයකුත් ඉදිකළේ, බිම් කොටස් වෙන්දේසි කිරීමේ බලාපොරොත්තුව ඇතිව. නමුත් එය සම්පූර්ණයෙන්ම අසාර්ථක වී මා බංකොළොත් වුණා. පහුගිය අවුරුදු දෙක තිස්සේම මං නොයෙක් ව්‍යාපාරවල යෙදුණා. සවුත්හැම්ටන් වෙත ගොස් නාවිකයන් පිටරටවලින් ගෙනෙන කුඩා දියමන්ති මිලට ගැනීම ඉන් එකක්. ඒ අතරේ ඉඳහිට තවත් පුද්ගලයිනුත් අඩුමිලට දියමන්ති අරගෙන මා වෙතට ආවා. ඒවා ඔවුනට ලැබුණේ කොහොමද කියා මට කිව්වේ නෑ. මං ඇහුවෙත් නෑ. ඒවා සෑහෙන ප්‍රමාණයක් එකතුවුණාම, මං ඇම්ස්ටඩෑම් නුවරට ගෙනගියා. එහි දියමන්ති මිලට ගත් මගේ ගනුදෙනුකාරයන් මගෙන් ප්‍රශ්න ඇහුවෙත් නෑ.

මගේ නිවස පිරිසිදු කිරීම හා ඉවුම් පිහුම් කරදෙන මිලර් මහත්මිය ඇයට සුපුරුදු විදියට ඇගේ රාජකාරි අවසාන කොට, හැන්දෑවේ හයට පිටවී ගියා. ඊළඟට මං රාත්‍රී දුම්රියෙන් ලන්ඩනය බලා යාමට සූදානම් වෙන්න පටන්ගත්තා. මගේ ගනුදෙනු කටයුතු හුගක් ලන්ඩනයේදී සිදුවෙන්නෙ මහ රෑට: මං යාමට නියමිතව තිබුණේ බැඩ්ස්හැම් දුම්රිය පොළෙන් රෑ 8.02 ට පිටත්වන දුම්රියෙන්. ඇම්ස්ටඩෑම් යන මගීන් ගමන්ගන්නා බෝට්ටු දුම්රිය පිටත්වෙන්නේ 7.55 ටයි. හැන්දෑවෙ හයයි කාල වෙනකොට මං හැඳ පැළඳගෙන ඉවරයි. මගේ ඇඳුම් බෑගය හා මුදල් කල්තබා සූදානම් කරගත්තේ එදා හවස් වරුවේමයි. මං ගෙදරින් පිටවී යායුත්තේ තවත් පැය එකහමාරකින් පමණ. නිවසෙන් එළියට බැහැලා මං ගෙවත්තේ ඇවිද්දේ, ඉදිරිකාලයේදී මවිසින් කළ යුතුව තිබූ වැඩ රාජකාරි ගැන කල්පනා කරමින්.

මං ආපහු ගෙට එන්න ගියාවා විතරයි. මට ඇහුණා කාගෙගෙද් අඩි ශබ්දයක්. ඒ මගේ නිවස අසලින් වැටුණු, සකස් නොකළ පාරේ ඇවිද එන කෙනෙකුගේ අඩි ශබ්දය. මං නැවතී සාන්දුන්නා. මේ සිටවුවක ගෙවල් කිසිවක් නෑ. පාර දිගේ යා හැකි තැනකුත් නෑ. අවේලාවේ අපේ ගෙදරට එන අමුත්තෙක්ද මේ? ගේට්ටුව ළඟටම ගිහින් ඒකට උඩින් මං අන්ධකාරය දිහා බැලුවෙ කුතුහලයෙන්.

ආ පුද්ගලයා කවුරු වුණත් ඔහු මගේ ගේට්ටුව ඉදිරිපිට නැවතිලා ගිනිකූරක් දැල්වූවා. ඔහු එහෙම කළේ දුම්වැටියක් දල්වා ගැනීමට. එයින් ඔහුගේ මුහුණට එළිය වැටුණා. ඒළඟට ඔහුට මාව දකින්න ලැබුණා. කටින් දුම වලාවක් පිට කළ ඔහු, දුම්වැටිය අතට අරගෙන මගෙන් විමසීමක් කළා.

"මහත්මයා. මේ පාර දිගේ ගිහින් මට පුළුවන්ද, බැඩ්ස්හැම් දුම්රියපොළට යන්න?"

"බැහැ. දුම්රියපොළට යා හැකි අඩිපාරක් තියෙනවා, මේ හරියට එන්න කලින්. ඔබ දැන් ඒක පහුකරගෙනයි ඇවිත් ඉන්නේ. ආපහු හැරිල යන්න. යාර හතළිහක් විතර යද්දී, ඔබේ වම් අත පැත්තටයි අඩිපාර. ලොකු ඕක්ගස් දෙකක් අතරින් තමයි ඒක පටන්ගන්නේ"

"අඩි පාරක්!" අමුත්තා කිව්වේ තරමෙහත්. "අශ්වකෝච්චියේ සේවකයා මාව මහපාරෙන් බැස්සුවේ අඩිපාරක් තියෙනවා කියල. පහුගිය පැය බාගයක කාලයක්, මා අන්ධකාරයේ ඇවිදිමින් කළේ ඔය අඩිපාර හෙවීම. මගේ ඇස් පෙනීමත් දුර්වලයි. දැන් ඉතින් මං යායුතු දුම්රියත් මට අල්ලාගන්න බැරිවෙවි"

"ඔබට යන්න තියෙන්නේ කීයෙ දුම්රියේද?"

"හතයි පනස්පහට ඒක පිටත්වෙන්නේ"

"මටත් යන්න තියෙනවා දුම්රියක" මම කිව්වා. "ඒක පිටත්වීමට නියමිත අටයි දෙකට. ඒ කියන්නේ ඔබේ එකට වඩා මිනිත්තු හතකට පස්සේ. ඒකෙ නගින්න මං ගෙදරින් පිටත්වෙලා යන්නේ තවත් පැයකින් විතර. ඒ මොකද මෙතැන ඉඳන් දුම්රිය පොළට හැතැක්ම භාගයකට වැඩිය නෑ. ඔබට කැමති නම් එන්න මගේ ගෙදරට. ඇවිත් ටිකක් විවේක ගන්න. මාත් එක්කම පුළුවනි දුම්රියපොළට යන්න. එතකොට කළුවරේ ගිහින් පාර වැරදීමේ අවදානමක් නෑ"

"ඔබ හරි කරුණාවන්තයි" කී අමුත්තා අන්ධකාරයේ තිබුණු ගේ දිහා බැලුවා. "නෑ ඒකට කමක් නෑ......මං හිතන්නේ මට පුළුවන් වේවි අඩිපාර හොයාගන්න....." ඔහුට කියවුණේ හිතේ සැකයෙන්.

"දුම්රියපොළට ගියත් ඔබට තවත් හුගක් වෙලා රස්තියාදු වෙන්න සිදුවේවි" මං කිව්වේ ගේට්ටුව හොඳින් අරිමින්.

අමුත්තා අවිනිශ්චිතව මඳ වේලාවක් කල්පනා කළා. ඊළඟට තීරණයකට ඇවිත්, මං දිහා හොඳින් බලලා, දුම්වැටිය උරමින්ම ගෙවත්තට පානැගුවා.

මං ගේ ඇතුළට ඇවිත් ගිනිකූරක් ගසා ගෑස් පහන් දල්වා එළිය වැඩිකළා. එතකොට අමුත්තා තමන්ගේ සිගරට්ටුව එළියට විසිකරලා ගෙට ඇතුළුවුණා. ගෑස් පහනේ දීප්තිමත් ආලෝකයෙන් අපි එකිනෙකාගෙ මුහුණු දිහා බැලුවේ කුතුහලයෙන්.

"දෙයියන්ට ඔප්පු වෙච්චාවෙ! මේ එස්රා ලොම්බාඩ් නේ!" මගේ හිතට ආවත් මං එහෙම කිව්වෙ නෑ. මාව අඳුනාගන්න ඔහුට කොහොමටවත් හැකිවුණේ නෑ. ඔහු හැටන් උද්‍යානයේ ඉහළම පෙළේ දියමන්ති වෙළෙන්දෙක්. මං එහි සිටි වෙනත් වෙළෙන්දෙකුගේ ලිපිකරුවෙකු පමණයි.

"මහත්මයා වාඩිවෙන්න" මං කිව්වේ සැපපහසු අසුනක් පෙන්වමින්. "ඔබ කැමතිද මොනවා හරි බොන්න? ඇවිදලා ඔබට මහන්සිත් ඇති?"

"බීම නැතිවුණත් ප්‍රශ්නයක් නෑ" අමුත්තා කිව්වේ ඔහුගේ තොප්පිය සාලයේ කෙළවරක අසුනක් මත තබමින්. ඊළඟට ඔහුගේ අත් බෑගය ඒ හරියේම බිමින් තියලා කුඩය එයට හේත්තු කළා. ඉන්පසු අසුනක හිඳගත්තා.

"විස්කෝතුවක් කමුද?" මං ඇහුවේ ඩ්‍රැම්බුයි විස්කි බෝතලය සහ සෝඩා සයිෆනය, බීම ට්‍රොලිය මත තබා ඔහු වෙත ළංකරන ගමන්. ඒ සමගම වීදුරු දෙකකුත් තැබුවා.

"හොඳයි හොඳයි. ඔබට ස්තුතියි" ලොම්බාඩ් කිව්වේ සතුටු සිතින්. "මට එහේ මෙහේ සැහෙන්න ඇවිදින්න සිදුවුණානෙ. ඊට වඩා දුම්රියෙන් ගමන් කරන්නත් තියෙනවා"

"ඒක හරි" මං කිව්වා. "අතික යන්තමින් හරි බඩගින්නක් පිපාසයක් තියාගෙන, කවදාවත් දුම්රියකට නගින්න හොඳ නෑ. මා ළඟ තියෙන්නෙ නම් ඕට්ස් මිශ්‍රිත අධිපෝෂිත විස්කෝතු විතරයි"

"ඒක වඩා හොඳයි"

ඔහු කෑම බීමට ගිජු කෙනෙකු බව මට පෙනුණා. ඔහු නොනවත්වාම විස්කෝතු කමින් විස්කි බිව්වා. කථාකිරීමේ කොටස

දිගටම කරන්න වුණේ මට. මෙවැනි වෙලාවකදි සාමාන්‍ය සිරිත වුණේ, දුම්රියෙන් යන්නෙ කොහේටද, ඒ මොන කටයුත්තකටද කියන එක කතාබහ කිරීම. මං ඒ දෙකම හොඳින් දැන සිටියා. ඒ නිසා ඒ බවක් අඟවන්නෙ නැතුව, නිශ්ශබ්දව සිටීම වඩා හොඳයි කියලයි මට හිතුණේ.

ලොම්බාඩ් දියමන්ති වෙළඳාම ගැන සෑහෙන කීර්තිනාමයක් ලබා සිටි කෙනෙක්. ඔහුගේ පියාත් යෙදී තිබුණේ එම ව්‍යාපාරයේමයි. ඒ නිසා පළුදු නොමැති සහ වටිනාකමින් ඉහළ දියමන්ති, නොකැපූ දියමන්ති හඳුනාගැනීමට, ඔහුට සුවිශේෂ හැකියාවක් තිබුණා. ඒවා සෑහෙන ප්‍රමාණයක් එකතු කරගෙන වරින්වර ඇම්ස්ටඩෑම් යෑමට ඔහු පුරුදුව සිටියා. ඒ කාරණාව මට දැනගන්න ලැබුණේ ඔහු ළඟ සේවය කළ මගේ මිත්‍ර ලිපිකරුවෙකුගෙන්.

මෙවැනි ගමනක් යද්දි ඔහු හැඳගෙන ගියේ බාල රෙදිවලින් මැසූ පරණ ඇඳුම් කට්ටලයක්. රන් පවුම් තිස් හතළිස් දහසක් වටිනා දියමන්ති, මේ ඇඳුමේ රහස් සාක්කුවල සඟවා ගෙනයන බවත්, මං දැන හිටියා. මේ ටික මා සතු කරගත්තොත් තවත් මහන්සිවීමට, මේ ආත්මයේ අවශ්‍ය වන්නේ නෑ. ඉඩම් විකිණීමේ ව්‍යාපාරයට බැහැලා මං එරුණු එරිල්ලෙන් ගොඩඒමට හැකි ක්‍රමයක්, මේ දක්වා පෙනෙන තෙක් මානයක තිබුණේ නෑ. මොකක්ද මං කළයුත්තේ?

මගේ හිතට ආවේ ඉතාම පාපතර කෲර සිතිවිල්ලක්. මීට කලිනුත් දෙවරක් මේ පාපකාරී කටයුත්තේ යෙදිලා සෑහෙන කාලයක් හිරේ දුක් වින්දා. ඒ වෙලාවේ මට මරණ දඬුවම නියම නොවුණේ, පොලිසියේ අදක්ෂ කමින් වැදගත්ම සාක්ෂි ඔවුනට මඟහැරුණු නිසා. ඊළඟට තවත් මිනීමැරීමකට වරදකරු වෙලා බ්‍රෝඩ් මුවර් හිරගෙදර රඳවා සිටියා. ඒ පෝරකයට යෑමට සූදානමෙන්. සිරගෙදරින් පැනගන්න තවත් හිරකරුවෙකු සෑරූ උමගකින් මටත් වාසි සැලසුණා. මගේ බාහිර පෙනුම වෙනස් කරගෙන, හැරී පෝට්මන් යන නමත් ඇන්ඩ්රූ ෆ්ලෙචර් ලෙස වෙනස් කරගෙන මං සමාජයට ආවා. මුහුණ වටා තිබූ කළු රැවුළ කපා දමා හිසකෙස්වල පාටත් දුඹුරු පාට කරගෙන කණ්ණාඩි පැළඳීම නිසා, මාව හඳුනාගන්න කාටවත් හැකිවුණේ නෑ. එදා මට විරුද්ධව තිබූ මිනීමැරීමේ චෝදනාව ඔප්පු වෙද්දී මං හරියට පසුතැවුණා. දේව ප්‍රාතිහාර්යයකින් හරි මට ජීවිතදානය ලැබුණොත්, මිනීමැරීමේ අපරාධය තවත් නම් කරන්නේ

නෑ කියලා මං දැඩිව අධිෂ්ඨාන කරගත්තා. නමුත් වස්තුවට ගිජුකමෙන්, ඒ අධිෂ්ඨාන සිත පිරිහෙන්න පටන් අරගෙන.

"දැන් හැන්දෑවෙනකොට හරිම ශීතලයි නේද?" මං ඇහුවේ ලොම්බාඩිගෙන්.

"ඒක ඇත්ත. ශීත සෘතුවත් ටික ටික ළංවෙනවානෙ" ලොම්බාඩි කිව්වේ තවත් විස්කි උගුරක් ගිල දමමින්. ඒ සමගම ඔහු තවත් විස්කෝතුවක් සැපීමට පටන්ගත්තා.

"මේ මිනිහා ළඟ තිබෙන දියමන්තිවල වටිනාකම, පවුම් පනස්දහසටත් වැඩිවෙන්න පුළුවනි" මගේ හිත මට කිව්වේ පාපතර සිතිවිලි උත්සන්න කරමින්. "ඒ මුදල මා අතට ලැබුණොත්, ජීවිතයේ ඉතිරි කාලය මට දුක්විඳින්න සිදුවන්නේ නෑ. එය බැංකුවක තැන්පත් කළාම ලැබෙන පොලිය, තවත් අවුරුදු සියයකට ඇති"

හිතේ එක් පැත්තක් එහෙම කියද්දී අනික් පැත්තෙන් මට මෙහි බරපතළ බව මතක් කර දුන්නා. "දෙපාරක් මිනීමැරූ මගේ ජීවිතය බේරාදෙමින්, දෙවියන් වහන්සේ මට කරුණාවන්ත වුණා. මේ සැරේ නම් මට කිසිම ගැලවීමක් නැති බව සහතිකයි."

බලාගෙන ගියාම කලින් මා අතින් සිදුවණු ඝාතන, හිතාමතා සැලසුම් සහගතව කළ ඒවා නොවෙයි. මුල් මිනීමැරුමෙදි මං ආභරණ වෙළඳසලක් බිඳලා, ඒ බඩු මගේ මල්ලට දමාගත්තා. ඒවන තුරුත් එතැන ආරක්ෂක භටයා සිටියේ තද නින්දේ. ඊළඟට මං එතැනින් පිටවී යන්න හදද්දී ඔහුට ඇහැරිලා, ඔහු මරළතෝනි දෙන්න පටන්ගත්තා. එතැනදි මට වෙනත් විකල්පයක් තිබුණෙ නෑ.

අනික් අවස්ථාවෙ මා අතින් මරණයට පත්වුණේ පොලිස්භටයෙක්. මාත් මගේ මිත්‍රයෙකුත් බැංකුවකින් මුදල් මංකොල්ලකාල එළියට පැන්නේ, කාටවත් කිසිම හිරිහැරයක් නොකර. අපි දෙන්නා පාරට බැහැලා අපේ අශ්වකරත්තයට නගින්න සූදානම් වුණා විතරයි. කොහේදෝ උන්නු පොලිස් භටයෙක් ඇවිත්, කකුල් මාට්ටුවක් දාල මාව බිම දැම්මා. ඒ වෙලාවෙ මං යක්ෂාවේශ වුණා. මගේ අතින් එක් ක්ෂණයකින් රිවෝල්වරය පත්තුවුණා. ඒවා කිසි එකක් කලින් සැලසුම් කොට හිතමතා කළ ඒවා නොවෙයි. නමුත් මෙක! මනුෂ්‍යයකු ඝාතනය කර වස්තුව මංකොල්ල කනවා කියන්නේ, සම්පූර්ණයෙන්ම සිහිවිකල් වූ පිස්සන් කරන වැඩක්.

මට අනුන්ගේ වස්තුව උවමනා නෑ. මට පුළුවනි මහන්සිවෙලා මුදලක් උපයාගන්න. ඒකට තවත් සෑහෙන කලක් ගතවේවි. ඒත් කමක් නෑ. මං මගේ හිත සනසවා ගත්තා.

සීතලේ පාරේ ඇවිද ආ ලොම්බාඩිට, මගේ ගිනිඋදුනේ උණුසුමෙන් ලොකු සහනයක් ලැබෙන්න ඇති. බඩ පිරෙන්න විස්කෝතු කමින් ඔහු හාන්සි පුටුවේ වැතිර හිටියේ, දුම්රියෙන් දුර ගමනක් යන්න තිබෙන බව, මොනම අයුරකින් වත් හිතට නොගෙන. සැහැල්ලුවෙන් ඔහු විස්කි වීදුරුව තොල ගෑ ආකාරයෙන් මට හිතුණේ එහෙමයි.

මාත් එක්ක එකට බැංකුව මංකොල්ල කාපු නීරෝ ගැන මේ වෙලාවෙ මගේ හිතට ආවා. ඒ ඇයි කියන්න මං දන්නෙ නෑ. යමක් කරන්න හදද්දී මගේ හිතේ ඇතිවෙන දෙගිඩියාව ගැන, ඔහු මට හිනාවුණු වාර අනන්තයි. මෙහෙම වෙලාවක නීරෝ මේ ගෙදර හිටියා නම් මොකක්ද කරන්නෙ? මං පසුබට වුණු වෙලාවට ඔහු නැගූ ඔච්චම් හිනාහඬ, මගේ කන්වල රැව් පිළිරැව් දුන්නා වගෙයි මට දැනුණේ. ඔහු මේ වෙලාවේ ළඟක හිටියා නම් මොනවා කියාවිද? ඔහුට තිබුණේ රළු සාහසික මුහුණක්. නමුත් කටහඬ ලාබාල තරුණයෙකුගේ වැනි මෘදු කටහඬක්.

"උඹ මහ මෝඩයෙක් හැරී. ධනස්කන්ධයක් උඹේ ගෙදරටම ආවා. ඒත් ඒක බාරගන්න එක්කෝ උඹට මොළයක් නෑ; නැත්නම් උඹට වාසනාවක් නෑ. මේ ගෙදර මේ වෙලාවෙ වෙනත් කිසිකෙනෙක් නෑ. මේ කිට්ටුවක ගෙයක් නෑ. පාර මනුස්සයො ගමන් කරන පාරක් නෙමෙයි. ඒ මිනිහා මේ ගෙදරට ආව බව කවුරුවත් දැක්කෙත් නෑ. දන්නෙත් නෑ. මේ ඝනාන්ධකාරයේ කිසිකෙනෙකුට කිසිදෙයක් පෙනෙන්නෙත් නෑ. මේක උඹට ජීවිතයට එකම එක් වාරයක් ලැබෙන අවස්ථාවක්. උඹ නම් අංක එකේ මෝඩයෙක් හැරී"

නීරෝ ඒ වගේ දෙයක් කියන හැටි, මගේ කන්වල රැව්පිළිරැව් දුන්නා. නීරෝ නම් එහෙම කියාවි. ඒත් මළසිරුරට මොකද මං කරන්නෙ?

මේ මොහොතේ මට අහන්න ලැබුණේ බැඩ්ස්හැම් දෙසට ආ දුම්රියකට සංඥා නොමැතිවීම නිසා, එයින් නැගුණු තළා හඬ. ඒ ශබ්දය නිසා මගේ සිතේ ඇතිවුණු සිතිවිලි, එකින් එකට මාරු වෙවී ගිය සිතිවිලි දාමයක් වුණා. මට මේ දුම්රියෙන් ප්‍රයෝජන ගන්න බැරිද? මගේ හිතේ සිටි යක්ෂයා – නීරෝ කියනු මට ඇහුණා.

උදුනේ ගිනිගොඩ නිවී යමින් තිබුණු නිසා වෙන්න ඇති. මගේ මුළු සිරුරම වෙව්ලා ගියා. මේක වුණේ ගේ ඇතුළට ආව සීතල හුළං පාරකින්ද? නැතිනම් මගේ සිතේ ඇතිවූ චකිතය නිසා වුණු තිගැස්සීමක්ද? මං වහාම ගෙදර වහල ඇල, ලොම්බාඩි සමග දුම්රියපොළට යායුතුයි. එතකොට මට පුළුවනි මේ පාපකාරී සිතිවිලිවලින් බේරෙන්න. මං එහෙම හිතුවා විතරයි, කොහේදෝ ඈතක සිට නිරෝ ඔහුගේ සමච්චල් සිනාව නගනවා වගේ මට ඇහුණා. විස්කි බෝතලයෙන් තවත් ටිකක් වීදුරුවට දමා ගත් ලොම්බාඩි, එය තොලගෑමට පටන්ගත්තේ සෝඩා එකතු නොකරම.

"දුම්රියපොළට යන්න පිටත්වෙන්න, තවමත් කල් වැඩියි කියලයි මට හිතෙන්නෙ" මං කිව්වා.

මෙතෙක් වෙලා ඇස්දෙක බාගෙට පියාගෙන හාන්සි පුටුවේ හිටි ලොම්බාඩි කඳ කෙළින් කර හිඳ ගත්තා.

"ඔබේ ඔය ඔරලෝසුවේ වෙලාව හරිද?" ඔහු විමසුවේ බිත්තියේ සවිකර තිබූ ලොකු ඔරලෝසුවට අත දිගුකරමින්. එය නිවැරදි බව මං කිව්වා.

"දුම්රිය පොළට ඇවිදගෙන යන්න, අපට කොයිතරම් වෙලාවක් ගතවේවිද?" ලොම්බාඩි විමසුවා.

"මිනිත්තු විස්සක් නැත්නම් ඊට ටිකක් වැඩිවේවි...... වැඩිම වුණොත් පැය භාගයයි."

"එහෙමද?" ලොම්බාඩි විමසුවේ සන්සුන් හඬෙන්. "ඒ කියන්නේ අපට තවත් පැයකට වැඩි කාලයක් තියෙනවා. දුම්රිය පොළේ ඉන්නවාට වඩා, මෙහෙම ඉඳීම සුවපහසුයි කියලයි මටත් හිතෙන්නෙ. එළියෙ හමන හුළංපාරත් හරි සීතලයි මට හිතෙන්නෙ"

"ඉදිරි දොර හරිහැටි වහන්න මට අමතක වෙලා. ගේ ඇතුළට සීතල සුළං ආවද?" මං ඇහුවා.

"මං හිතන්නෙ ගිනිඋදුන නිවී යන නිසා වෙන්න ඇති සීතල"

ලොම්බාඩි එහෙම කිව්වත් මං නැගිටලා ඉදිරි දොර වෙත ගිහින් බැලුවා. දොර නිකම් වසා තිබුණත් යතුරු දමා තිබුණේ නෑ. මං එය යතුරු දැම්මා. මං ආපහු ඇවිත් ඔහු ඉදිරියේ පුටුවේ වාඩිවුණා.

මගේ ඇස්දෙක තවදුරටත් නදින්ම යොමුවුණේ ලොම්බාඩි දෙසටයි. මට පියවර දෙක තුනක් ඉදිරියෙන් ඉන්න මේ මිනිහා ඉන්නේ බාගෙට මත්වෙලා, නිදිකිරා වැටෙමින්. ඔහුගේ දිරාගිය

ඇඳුමේ සාක්කුවල පවුම් පනස්දහසක් හෝ ඊට වැඩිය වටිනා දියමන්ති. තවදුරටත් එතැනට වෙලා ඒ මිනිහා දිහා බලාගෙන ඉන්න, මට පුළුවන් කමක් තිබුණේ නෑ. එතැනින් ඉවතට යාමට මං තීරණය කළා.

"සමාවෙන්න මහත්මයා" මං කිව්වා. "මං යනවා ගේ ඇතුළට. මේ පාවහන් ඉවත්කරලා ගනකම් බූට්ස් සපත්තු දෙකක් දාගන්න මට හිතයි. පහුගිය දවස්වල මෙහේට වැස්සා. ඒ නිසා අපි යන පාරේ මඩ තියෙන්නත් පුළුවනි. තෙත පාවහන් දමාගෙන දුරගමනක් යැමත් අපහසුයිනේ"

"ඔව් ඒක හරි" ලොම්බාඩි කිව්වා.

මං එතැනින් නැගිටලා ගබඩා කාමරයේ මගේ පාවහන් තබන තැනට ආවා. බූට්ස් සපත්තු තබන තැන, මොනවාදෝ සුන්බුන් වගයකින් අවහිර වී තිබුණා. කවුද මේක කරන්න ඇත්තේ? මිලර් මහත්මිය වෙන්න ඇති. උද්‍යානයේ අලුත් හරිතාගාරයක් හදන්න ආව බාස්ලා කපලා ඉතිරිවුණු යකඩ පටි කැබලි, පයිප්ප කැබලි ඇණ ආදී සුන්බුන්. මගේ බූට්ස් සපත්තු උඩින් තිබූ මේ දේවල් මං ඉවතින් තැබුවා. මුලින්ම මගේ අතට අහුවුණේ, අඩියක් පමණ දිග යකඩ බට කෑල්ලක්. මේක රවුම් පයිප්ප කෑල්ලක් නෙමෙයි. හතරැස් හරස් කඩක් තිබූ එකක්. මං ඒක එහා මෙහා පද්දලා බැලුවා. අපූරු ආයුධයක්! ආත්මාරක්ෂාව සඳහා මගේ නිදන කාමරයේ වුණත් තබා ගැනිමට සුදුසු. සැහැල්ලු හුරුබුහුටි ආයුධයක්. බූට්ස් දැමීමට සූදානමෙන් මං පාවහන් ඉවත් කළා. ඊළඟට මං විසිත්ත කාමරය දෙසට ඇවිදගෙන ගියේ, ලොම්බාඩි මොනවා කරනවාද බලන්න.

ඔහු තවමත් පුටුවේ හිඳගෙන සිටියා. ඒ මුළුතැන්ගෙය දෙසට පිටුපස හරවාගෙන. මගේ පාවහන් ඉවත් කළ දෙපාවල තිබූ ගනකම් මේස් නිසා, මගේ පියවර හඬ ඔහුට ඇහුණේ නෑ. මත්පැන් බීම සහ විස්කෝතු කෑම ඔහු මේ වෙනකොට අවසන් කරලයි හිටියෙ. ඔහු සාක්කුවෙන් දුම්කොළ පසුම්බිය අරගෙන, සිගරට්ටුවක් ඔතාගනිමින් හිටියෙ. සිගරට් කඩදාසියේ දාරයට කෙළ ගා එය ඇලවූ ඔහු සාක්කුවට අත දමා ගිනිපෙට්ටිය ගත්තා. සිගරට්ටුව දෙතොල් අතර රඳවාගෙන එය දල්වාගත් ලොම්බාඩි ගිනිපෙට්ටිය සාක්කුවට දමා ගත්තා.

මං ආපහු ගබඩාකාමරයට ගියේ බූට්ස් සපත්තු දමාගැනීමට. නමුත් මගේ ඔළුවට වැහී තිබුණු පාපතර යක්ෂයා මට වඩා ඉක්මන්

වුණා. මගේ අත ගියේ බූට්ස්වලට නෙමෙයි; හතරැස් යකඩ බට කෑල්ලට. ඒකත් අරන් මං ගියේ ලොම්බාඩි වෙතට.

යකඩ බට කෑල්ල උඩ සිට පහළට හුළං කපාගෙන එද්දී ශබ්දයක් නැගුණා. ලොම්බාඩි ක්ෂණිකව හිස හැරෙව්වේ, සිද්ධවෙන දේ ඉවකින් වැටහුණා වගේ. ඒකෙන් මගේ ඉලක්කය වැරදුණා. ආයුධය ඔහුගේ හිසේ පැත්තකින් පහළට ලිස්සා ගියා. ඒ කනට ඉහළින් බොරු ඇහැ ප්‍රදේශයේ තුවාලයක් ඇතිකරමින්. ඒ සමගම ඔහුගේ මුවෙන් නැගුණේ මරළතෝනියක්. එක් ක්ෂණයකින් ඔහු තම ඇත්වලින් මගේ ඇත් අල්ලාගත්තා.

ආයුධය මගේ අතින් බිම වට්ටවන්න ඔහු සමත්වුණා. ඊළඟට අප දෙදෙනා අතර ඇතිවුණේ දරුණු පොරබැදීමක්. ඔහු වාඩිවූ පුටුව පෙරළී ගියා. ඔහු විස්කි පානය කළ වීදුරුව ටීපෝව මතින් බිමට වැටී බිඳුණා. ඔහුගේ උපැස්යුගළ ගැළවී බිමට වැටුණේ අප පොරබදන අතරේ. ඊළඟට එය අපේ කකුල්වලට පෑගී, වීදුරු කාච කුඩා කැබලිවලට කැඩීගියා. ශරීර ශක්තිය අතින් ඔහු මට වඩා දුර්වල බව මට පෙනී ගියා. ඒ බව ඔහුත් තේරුම් ගන්න ඇති. ඒ නිසා අප පොරබදන අතරෙත්, ඔහු උස් හඬින් මරළතෝනි නැගුවා. මේකෙන් මං පත්වුණේ ඇඩි භයකට. ඒ මොකද මගේ නිවස තිබුණේ පාළු අඩවියක වුණත්, හදිසියේ කෙනෙකු ගේ ළඟ පාරේ ගමන් කළොත්? එහෙම වුණොත් ඔහු ප්‍රධාන පාරට දුව ගිහින්, මුර සංචාරයේ යෙදෙන පොලිස් භටයෙකුට දැනුම් දෙන බවට සැක නෑ. මේ විලාප නැඟීම ඉක්මනින් නතර කළ යුතුයි.

ලොම්බාඩි සිටියේ ක්‍රම ක්‍රමයෙන් දුර්වල වෙමින්. මට හැකිවුණා ඔහුගේ උඩුකය, හිස්ව තිබූ මේසය මත උඩුබැලි අතට හාන්සි කරවන්න. ඒ සමගම ඔහු කට ඇරියේ යළිත් වරක් විලාප නඟන්න. මට කළ හැකිව තිබුණේ, අමාරුවෙන් ඇදගත් මේස රෙද්දේ කෙළවර ඔහුගේ මුහුණට සහ කටතුළට එබීම පමණයි. මේ විදියට මිනිත්තු දෙකක් පමණ ගතවෙද්දී, ඔහුගේ දැඟලීම් ක්‍රමයෙන් අඩුවුණා. මං මගේ ග්‍රහණය ලිහිල් කළාම අප්‍රාණික සිරුර බිම ඇද වැටුණා.

සියල්ල අවසන්. හොඳට හෝ නරකට ඔක්කොම ඉවරයි. මගේ මුහුණෙන් ඩහදිය වැගිරෙන්න පටන්ගත්තා. මට දැනුණේ ක්ලාන්ත ගතියක්. මුළු කාමරයම කරකැවෙනවා වගේ මට පෙනුණා. මගේ වීදුරුවෙන් බාගයක් පිරෙන්න විස්කි දමාගෙන, මං එය ගිලදැම්මා.

මං වෙලාව බැලුවා. රෑ හතට තවත් මිනිත්තුවක් තිබුණා. මා ලන්ඩනය බලා යායුතු දුම්රියට තවත් පැයක් තිබුණා. ඒ කාලය තුළ සියලු රාජකාරි මා අවසන් කළ යුතුයි. මගේ හිතේ ඇතිවූ සැලැස්මට විසඳීමක් ලෙස මට මතක්වුණේ බඩුදුම්රියක්. ඒක ඒමට නියමිත හතයි විස්සට. මගේ ගෙදර ඉඳන් දුම්රිය පොළට තරමක් දුර බව ඇත්තයි. නමුත් දුම්රිය මාර්ගයේ ලොකු වංගුව තිබෙන තැනට, යාර තුන්සීයකට වැඩි දුරක් නෑ. ඒ වුණත් එක තත්පරයක්වත් නාස්තිකරන්න මට හැකියාවක් තිබුණේ නෑ. මගේ හිතේ ලොකු භයක් ඇතිවුණේ, ලොම්බාඩ්ගේ විලාප හඬ කාටහරි අහන්න ලැබුණාදෝ කියලයි. එහෙම නොවුණා නම් ප්‍රශ්නයක් නෑ.

ඔහු බිම වැටී සිටියේ උඩුබැලි අතට. ඔහුගේ දත් අතර හිරවී තිබූ මේස රෙද්ද මම හෙමින් හෙමින් ඉවත් කළා. මා සිතූ අයුරින්ම ඉතාම වටිනා නොකැපූ දියමන්ති රැසක් මට හමුවුණා.

ඔහුගේ හිසෙන් ගලාගිය ලේ කලාළය මතත්, මේස රෙද්ද මතත් තිබුණා. මුළුතැන් ගෙයින් වතුර බාල්දියක් ගෙනැවිත් ඒවා ඉක්මනින් පිරිසිදු කරදැමීමට මට හැකිවුණා. තවදුරටත් ලේ ගලායාම වැළැක්වීමට ලොම්බාඩ්ගේ හිසට යටින් කඩදාසි කිහිපයක් තැබුවා. බිම පෙරළී තිබූ පුටුව කෙළින් කළාම මට දකින්න ලැබුණේ, ඔහුගේ උපැස්යුගල සහ බිඳී ගිය කාචවල කැබලි. ඒ සියල්ල බුරුසුවකින් එකතු කොට කඩදාසි කවරයක් තුළට දමා සාක්කුවට දමා ගත්තා. ඔහුට පහරදුන් ආයුධය වුණු යකඩ බට කැබැල්ලට කළයුත්තේ කුමක්ද? මට ඉතිරිවී තිබූ කාලය අනුව කළහැකිව තිබූ හොඳම දේ, ළඟම තිබූ කටු පඳුරින් පිරුණු කැලෑරොදට විසිකිරීමයි. බිඳී ගිය වීදුරුව නිවස පිටිපස කසළ ගොඩට ඇම්මා.

මළසිරුර සමගම තවත් ඉවත් කළයුතු දේවල් දෙකක් ඇතිබව මට මතක්වුණා. ඒ තමයි ඔහුගේ අත්බෑගය සහ කුඩය. රාක්කයෙන් ටිවයින් නූල් බෝලය අරගෙන දිග කෑල්ලක් කපාගත්තා. කුඩා පිහියකුත් මං සාක්කුවට දමා ගත්තා. මීළඟට බෑගය සහ කුඩය ටිවයින් නූලෙන් ගැටගැසුවේ, මට ඒ දෙක කරේ දමාගෙන එකවර ගෙනයාමට හැකිවන පරිදි. මේ කටයුතුවලට සෑහෙන කාලයක් ගතවී තිබුණා. මට තවත් පමාවීමට හැකියාවක් තිබුණේ නෑ. ලොම්බාඩ්ගේ මෘත ශරීරයත්, කුඩය හා අත්බෑගයත් කරමත පටවාගෙන මං ගෙයින් එළියට බැස්සා.

රාත්‍රියේ තිබුණේ මහ ඝන අන්ධකාරයක්. මගේ ගෙදර ඉඳන් රේල්පාර දක්වා පාළු හිස් ඉඩම විහිදුණා. කවුරුන් හෝ යන එන ශබ්දයක් තිබේද කියලා මං මිනිත්තුවක් දෙකක් කන්දීගෙන හිටියා. කිසි ශබ්දයක් නෑ. බර කරටගෙන මං පිටත්වුණා. මගේ ගමන නිශ්ශබ්ද එකක් වුණේ නැහැ. ඊට හේතුවුණේ දෙපැත්තට පැද්දුණු කුඩය සහ අත්බෑගය නැගූ ශබ්දය. මගේ ගෙදර ඉඳන් රේල්පාර ළඟට ඇවිදයාමට සාමාන්‍යයෙන් නම් මට ගතවෙන්නේ මිනිත්තු පහක් පමණයි. නමුත් බරකුත් කරින් ගෙන, වරින් වර නැවතෙමින්, කන් දෙමින් ගමන් කළ නිසා, මට මිනිත්තු හත අටක් ගතවෙන්න ඇති. දැන් මා ඉදිරියේ තිබුණේ හරහට යකඩ රේල්පීලි තුනක් සවිකර ඉදිකර තිබූ මාර්ග බාධකය. කෙනෙකු වැරදීමකින් හෝ දුම්රිය මාර්ගයට පිවිසීම එයින් අවහිරවුණා.

මීළඟට මං ගමන් කළේ, රේල් පාරේ තියුණු ආකාරයෙන් වංගුවක් තිබුණු තැනට. තවත් වරක් කන්දීලා ශබ්දයක් නැතිනිසා, මාර්ග බාධකයට නැග රේල්පාර දෙසට පැන්නා. ඈතින් ඇසුණු දුම්රියක නළාහඬ මට මතක් කළේ, මා ඉක්මන් කළයුතු බව. ඔහුගේ ගෙල, රේල් පීල්ල මත සිටින අයුරින් සකස් කිරීමට, එතරම් වෙලාවක් ගතවුණේ නෑ. සාක්කුවේ තිබුණු ලොම්බාඩිගේ උපැස්යුගල අරගෙන ඔහුගේ හිස අසලින් බිම ආල, ඒ කාචවල වීදුරු කුඩු ගෙන ආ පැකට්ටුව මගේ සාක්කුවෙන් එළියට ගත්තා. එහි තිබුණු වීදුරු කුඩු උපැස්යුගල ළඟින් විසුරුවා දැම්මා. මා දෙසට එන බඩු දුම්රියේ ශබ්දය ඇසුණේ එතරම් ඈතින් නෙමෙයි. තවත් ඉතිරිව තිබුණේ කුඩය හා බෑගය ගැටගසා තිබූ ටවයින් නූල කපා ඉවත්කර ගැනීම පමණයි. අන්ධකාරය නිසා එය පැහැදිලිව පෙනුණේ නැහැ. නූල කපා ඉවත්කර ගැනීමට මිනිත්තුවක් දෙකක් ගතවුණා.

මට එක්වරම හිතුණේ එතැන නැවතී දුම්රිය ගමන් කරන ආකාරය බලාගෙන ඉන්නටයි. නමුත් ඒක අවදානම් කටයුත්තක් බව මට එක් ක්ෂණයකින් වැටහුණා. කෙනෙකු එතැන බලා සිටි බව එන්ජිමේ එළියෙන් රියැදුරා දුටුවොත්, හැම දෙයක්ම අවුල් වී යනවා. මා අපේක්ෂා කළ ප්‍රතිඵලය කනපිට පෙරළී යනවා සහතිකයි. දුම්රිය මාර්ග බාධකයෙන් එහා පැත්තට පැනලා මං පුළුවන් වේගයෙන් නිවස වෙත දුව ආවා.

මගේ වත්තේ පිටුපස ගේට්ටුව වෙත මං ළඟාවුණා පමණයි. එක් ශබ්දයක් ඇසී මං තිගැස්සී නැවතුණා. ඒ දුම්රිය එන්ජිමෙන්

නැඟුණු දීර්ඝ නළා ශබ්දය සහ එක්වරම තිරිංග යෙදීමෙන් නැඟුණු හඬ. ඉන්පසු බඩු පෙට්ටි එකිනෙක ගැටීමෙන් නැඟුණු ශබ්දය හා වාෂ්ප මුදාහැරීමෙන් එන්ජිමෙන් නැඟුණු හඬ. දුම්රියේ රියැදුරා තිරිංග යොදා දුම්රිය නවත්වාගෙන!

එක් මොහොතකට මට දැනුණේ, මගේ හදවත නැවතුණා වගෙයි. කොතැනද මට වැරදුණේ? එන්ජිමේ මහලාම්පුවේ එළියට මළසිරුර දිස්වෙන්න ඇති. ඒ ගැන සැකයක් නෑ. කවුරු හරි මාව දුටුවාවත්ද? ඔවුන් මා පසුපස මේ ගෙදරට ඒවිද?

මං වහාම ගෙට ඇතුළුවී දොර වසා දැම්මා. සණ්ඩුවක සලකුණු ගේ තුළ දැකිය හැකිද කියා විමසිල්ලෙන් බැලුවා. ලේ ඉවත්කිරීම නිසා මේස රෙද්දේ තිබුණේ පෙඟී ගිය පැල්ලමක්. ඒ නිසා මේස රෙද්ද ඉවත්කර, එය සාලය කෙළවර පුටුවක් මතට දැම්මා. ලොම්බාඩිගේ හිසෙන් ගලා ගිය ලේ එකතුවීමට තිබූ කඩදාසි හා ලේ තැවරුණු අනික් සුන්බුන්, ගිනිඋදුනට දමා පුලුස්සා දැම්මා.

ලන්ඩන් දුම්රිය අල්ලා ගැනීම සඳහා ගෙදරින් පිටත්වී යාමට, මටත් වෙලාව ඇවිත් බව මං දුටුවා. මගේ ගමන් බඩු සාලයේ කෙළවරක එලෙසම තිබුණා. ඒ ගමන් බෑගයට පටියකින් ඇමිණූ කුඩය සහ මගේ හිසට දමන සැහැල්ලු තොප්පිය. එය හිසේ දමාගෙන, බෑගය අතින් අරගෙන මං ගියේ ප්‍රධාන ගෑස් කරාමය වෙත. ඒ ලාම්පු සියල්ල නිවා දැමීමට.

දෙවියනි! මට එය ඇස ගැසුණේ අහම්බෙන්. ඒ එස්රා ලොම්බාඩිගේ අළුපාට ෆෙල්ට් තොප්පිය! ඒක තිබුණේ විසිත්ත කාමරයේ පුටුවක් උඩ. ඔහු ගෙට ඇතුළුවුණු වෙලේ එය තැබූ තැනම. මළසිරුර ගෙන යාමට පෙර දුටුවා නම්, මට එය හිසේ දමාගෙන ගිහින්, රේල්පාර අසල දමන්න ඉඩ තිබුණා. නමුත් දැන් ඒ සඳහා වෙලාවක් තිබුණේ නෑ. මේකෙ ඇතුළත පැහැදිලි අකුරෙන් "එස්රා ලොම්බාඩි" කියා ලියා තිබුණා. කවුරු හරි මා පසුපස ඇවිත් නිවසට කඩා වැදුණා නම්? එහෙනම් ඒකම ඇති මාව එල්ලුම් ගස් යවන්න. දැන් මොකක්ද මේකට කළ යුත්තේ? මං කල්පනා කළා.

දුම්රිය පොළට යන අතරේ කැලේට විසිකරගෙන යන්න? ඒක අවදානම් වැඩක්. කෝච්චියට බෙල්ල තියන්න යන අතරේ ඔහු තොප්පිය කලින් විසිකර ගියේ ඇයි කියන ප්‍රශ්නය මතුවෙනවා. මෙය තීරු තීරුවලට කපා ගිනිඋදුනේ පුලුස්සා දැම්මොත්? හොඳින්

දර කැබලි දමා පිලිස්සුවොත් එය විනාශ කරන්න පුළුවනි. ඒත් මට ඒකට වෙලා තිබුණේ නෑ. ලන්ඩන් ගමන නොතිබුණා නම් මට එය කරන්න තිබුණා. නමුත් ගෙදර රැඳී සිටීම වඩාත් අවදානම්. තොප්පියේ කැබලි උදුනේ පිලිස්සෙන්න ඉඩහැර මං ගියොත්? හඳුනාගත හැකි කොටසක් නොපිලිස්සී ඉතිරිවුණොත් ඒකත් ප්‍රශ්නයක්. හොඳම දේ මං ආපසු එනතුරු මේක නිවස තුළ හංගා තැබීමයි. මගේ තොප්පියක් මිලට ගෙන ආ පෙට්ටියකට ලොම්බාඩිගේ තොප්පිය දමා, මං එය අමුත්තන්ගේ කාමරයේ රාක්කයක ඈත මුල්ලකට දැම්මා. මේ තරම් ඉක්මනට ඒක හොයාගන්න හැකිවුණේ කොහොමද කියන එක පුදුමයක්.

අටට මිනිත්තු විස්සක් තිබියදී නිවසෙන් පිටවී යාමට මට හැකිවුණා. දුම්රියට යටවී තිබූ ලොම්බාඩිගේ මළසිරුර දුම්රිය ස්ථානය වෙත ගෙන ආ ආකාරයත් මට දකින්න ලැබුණා.

ඉතින් මහත්වරුනි. මට කීමට තිබෙන්නේ එපමණයි. මේ විනාශය සිදුවුණේ මගේ සිතේ ඇතිවූ දැඩි තණ්හාව නිසයි. මෙවර නම් මට පෝරකයෙන් ගැලවීමක් නොමැති බව, මං හොඳාකාරවම දන්නවා."

අපරාධකරුගේ දීර්ඝ පාපෝච්චාරණය පොලිස් නිලධරයා සටහන් කරගත්තේය. තවත් පොලිස් නිලධරයන් එහි පැමිණ අපරාධකරු හිරභාරයට ගත්පසු අපි එතැනින් පිටවී ආවෙමු.

මෙයට අදාළ අවසන් සිදුවීම වූයේ හැරී පෝට්මන් හෙවත් ඇන්ඩ්‍රෑ ෆ්ලෙචර් කෙටි නඩු විභාගයකින් පසු පෝරකයට නියමවීමයි. හෝම්ස් වූණු පොරොන්දුව පරිදි සිද්ධිය ගැන සම්පූර්ණ වාර්තාවක් මම කර්නල් හේටර්ට භාරදුන්නෙමි.

# රුසියානු ඔත්තුකාරයා
# සහ
# තවත් ෂර්ලොක් හෝම්ස් කතා




අභිරහස් මිනිමැරුම් සහ අද්භූත ගැටලු
විද්‍යානුකූලව විසඳූ සුප්‍රකට රහස්
පරීක්ෂක ෂර්ලොක් හෝම්ස්ගේ සුවිශේෂ
පරීක්ෂණ හතක් (7) ඇතුළත් ග්‍රන්ථය

අසංක්ෂිප්ත පරිවර්තනය
**චන්දන මෙන්ඩිස්**
පිටු 255

මෙම ග්‍රන්ථයට පහත සඳහන් කථාවල පරිවර්තන අඩංගුය.

| | |
|---|---|
| 1. ලතින් ගුරුවරයාගේ ගැටලුව | *The Case of the Latin Tutor* |
| 2. හචිංසන් චතුරශ්‍රයේ මිනිමැරුම | *The Adventure of the Hutchingson Square* |
| 3. මරකත මැණික | *The Green Emperess* |
| 4. රොබින්සන් පවුලේ අවුල | *Amateur Mendicant Society* |
| 5. නාඳුනන මළසිරුරක් | *An Un-identified Corpse* |
| 6. රුසියානු ඔත්තුකාරයා | *The Adventure of the Russian Spy* |
| 7. සෝල්ට්මාෂ් අභිරහස | *The Singular Affair of Saltmarsh* |

## රාජ්‍ය සාහිත්‍ය සම්මාන ලැබූ පරිවර්තන කෙටිකතා කෘති




පරිවර්තනය - **චන්දන මෙන්ඩිස්**

හොඳම පරිවර්තන
කෙටිකතා කෘතිය
රාජ්‍ය සාහිත්‍ය සම්මාන
2008

### ශ්‍රේෂ්ඨ ලේඛකයන්ගේ විශිෂ්ට කෙටිකතා




හොඳම පරිවර්තන
කෙටිකතා කෘතිය
රාජ්‍ය සාහිත්‍ය සම්මාන
2009

### සොඳුරු සිතුවම්




### මුතු ඇටය

**ශ්‍රේෂ්ඨ ලේඛකයන්ගේ විශිෂ්ට කෙටිකතා** - 4

හොඳම පරිවර්තන කෙටිකතා
රාජ්‍ය සාහිත්‍ය සම්මාන
2011



# මර උගුල

සහ තවත් ෂර්ලොක් හෝම්ස් කථා

- රුසියානු කුමරිය
- අභිරහස් මරණය
- රක්ෂණ අභිරහස
- මර උගුල
- දුම්රිය අනතුර
- එක් නිමේෂයකදී

ISBN 978-955-1262-19-8

මිල රු. 350/-

චන්දන මෙන්ඩිස් ප්‍රකාශන